

# බුදුගුණ අලංකාර
# ප්‍රදීපය.

# බුදු ගුණ අලංකාර
# ප්‍රදීපය

පදවිතර, දැන්නීම, අතිරේකයකින් හා
වදන් වැළින් ද යුතුවෙයි.

::

සකසුවෝ:

ර. තෙන්නකෝන්

::

පළකැරවූවෝ:

ශ්‍රී ලංකා ප්‍රකාශක සමාගම
කොළඹ.

::

2504
1961

# දැන්නීම

බුදු ගුණ අලංකාරය පිණිසැ ‘ප්‍රදීපයක්’ සැපැයෙන් බව මීට පළමු බුදුගුණ අලංකාරයේ මුල් පැදි තුන් සිය විසි නවය පළ කරත් දී දන්වා ඇති. ඒ පැදි තුන් සිය විසි නවය පළ කරන්නට සිදු වූයේ එ කොටස ඉස්කෝලෙ සිසුන් හට හදාරන්නට නියම වැ පැවැති හෙයිනි. කෙසේ හෝ වේවා පැරැණි පොතෙකැ කොටසක් පමණක් පළ කිරීම මගේ සිත රිදවන්නෙකි. එය අමුතු වැ පිළියෙළ කරන ලද්දෙක් නො වේ, එ වකට පිළියෙළ වෙමින් පැවැති මේ පොතේ මැ වැඩි විතර කපා දමමින් වෙන් කොටැ ගන්නා ලද මෙහි මැ කොටසක් මිසැ.

බුදු ගුණ අලංකාරයේ බස ලිහිල් බවත් එහෙයින් යම් තම් පද පෙළ ගසා දුන් පමණින් සිසුන් හට එය වටහා ගන්නට පමණක් නො වැ රස විඳින්නට ද හැකි බවත් අයෙක් කියති. එයින් ඇඟැවෙන එක් මැ ඇත්ත නම් ඔවුන් හට බුදු ගුණ අලංකාරය වැටැහී නැති බවයි. කවෙකැ අරුත් වටහා ගැනීමේ අසීරු බව රඳා පවත්නේ බසෙහි ගැඹුරු බව පිටැ නො වෙයි ඉඟියෙහි සියුම් බව පිටැ මිසැ. බසෙහි රළු බව හුදු ගැට පද විවරණයෙකින් මඟ හරවා ගත හැකියි. ලිහිල් බසින් කියන ලද්දෙකැ වදන් අරුත වටහා ගැන්ම අසීරු නො වෙතත් ඉන් අදහස් කැරුණු අරුත වටහා ගැනීම අසීරු වෙයි. කවක් වටහා ගන්නවා යැයි කියන්නේ වදන් අරුත් තේරුම් ගැන්මට නො වේ.

‘අයකු පිළිකුල් වත
අයකු සිතැ රා වඩවත
ලිඟු සටහන් රැගෙන
කළැයි පුද පල කීම් ද ඉන් වත’

යන බුදු ගුණ අලංකාර පැදියේ වදන් අරුත කාට ද නො වැටැහෙන්නේ? එ හෙත් එයින් පළ කැරෙන්නේ කිමෙක් ද යනු වටහා ගන්නෝ කී දෙනෙක් ද?

කරණු එසේ වත 'යනු කි හෙයින්' පද පෙළ ගස්සා අරුත් මරා පැරැණි පොත් පළ කිරිම ගත් කරුවනට කරන දූෂි නිගාවෙකි. සිසුනට කරන දරුණු අපරාදයෙකි.

මේ 'ප්‍රදීපය' හුදෙක් ඉස්කෝල සිසුන් පිණිසැ පිළියෙළ කරන ලද්දක් නො වැ වැඩි දුරට බසත් ගත් පවතත් පිරික්සමින් හඳුරනු රිසියන් හට වැඩ පිණිසත් බුදු ගුණ අලංකාරයේ අගය ඇති ලෙසැ විබාග දැන්මට උදවු වන පිණිසත් පිළියෙළ කරන ලද්දෙකි. නො එක් පොතින් පවත් දන්නා පිණිසැ පොත් බොහෝ ගණනක් බැලීම වෙහෙස ගෙනැ දෙන වැයමෙකි. යම් යම් පොත් දුලබ හෙයින් ඒ වැයමේ වෙහෙස තව ද වැඩිවෙයි. එ හෙයින් ඒ ඒ පොතින් දක්නට අවැසි තන් සියල්ල මෙහි ගෙනැ ඇරැ දක්වා ඇති. සෙල් ලිපි ඈ පැරැණි ලිපි වලින් ගෙනැ ඇරැ දක්වා ඇත්තේ එයින් ගත යුතු, ඇවැසි මැ කොටස් පමණයි. වදන් තුන හතරකින් කට යුත්ත පිරිමසිනා සෙල් ලිපි පවතක් පිණිසැ මුළු මහත් සෙල් ලිපිය මැ ඇඳෑ පැම තික දළු ගත යුතු බෙහෙදකට පුරා තික ගසක් උදුරා දැමීම බඳු විසුළු කිරියාවෙකි.

මුලින් පළ කරන ලද බුදු ගුණ අලංකාර කොටසේ පෙළට පළමු වැ බුදු ගුණ අලංකාර 'කථාවස්තුව' වූ ගංගාරෝහණ කථාව බුත්සරණයෙන් ගෙනැ යොදන ලදී. එය එ තැනැ එ සෙයින් යොදන ලද්දේ 'වස්තු බීජය' මුලින් දක්වීම එ තෙක් පැවැති සිරිත හෙයිනි. එය එ සේ තිකම් මැ දක්වා තිබීම දුටු කිසිවකුට හැඟුණේ එය අපේ ආරේ-කුමරතුඟු ආරේ - සිරිත පරිදි සියල්ල හකුළුවා පිඬු කොටැ තිබීමක් මෙනි. ගංගා රෝහණ කතාව විබා කිරීමක් බුදු ගුණ අලංකාර විතරට ඇවැසි නො වේ. ඒ ඒ පැදිය අවසනැ ගංගාරෝහණ කතාවේ මුණුවර ඇති තන් එහි දක්වා ඇති බව ඉක්මන් කම නිසා නො පෙනුණු සෙයෙකි ඉන් පළ වන්නේ. මේ වර ඒ කොටස එ තැනින් අස් කොටැ අතිරේකයේ අගට යොදා ඇති.

එ සේ කොටසක් අස් කිරීමෙන් 'පෙර වදන' (ඇඳිත්නීම) ලුහු වෙනවා නො වැයි ආයේ ද යමකුට සිතෙනු ඇති. පෙර වදන ලුහු වුව දික් වුව එයින් ඇති වැඩය කිමෙක් ද පමණට නො සිටී. තම්. තගුට වියැ යුත්තේ සතාට පිරිමස්නා පමණට මිසැ ලුහුඬුවට හෝ දිගට හෝ නො වේ. කවර දූයත් නො තත් පත් වූ විඩැ විසුළුවට හැරෙත්තාක් මෙන් දූත් දූත් පෙර වදනුත් විසුළු බවට හැරී ඇති සේ පෙනෙයි.

මොනරා පිල් විදු ගත් විටැ එ පිල් කලඹ රුවට පෙනෙනු නියතයි. ඒ වුණාට (කතරගම් දෙවොල්) කපුවා මොනර පිල් මිටිය මොනරා සෙයින් විදහත්තට සැරසුණ හොත් එය හැරෙත්තේ විහිළුවටයි. මොනර පිල් කලඹේ හොබනා බව සලකා තයාත් තගුට විදහත්තට සැරැසුණ හොත් හොබනේ නො වේ. ඌට හැඩ පෙණය පුඹුවා ගැන්මයි. ගැරඬියාට එ දෙකමැ හැඩ නො වේ. පෙර වදන් සැපැයීමත් කළ යුත්තේ හැඩ වැඩ ඇති වැ මිසැ නිකම් මැ නො වේ. බුදු ගුණ අලංකාරය පිණිසැ සපයන පෙරවදනකට – එහි පෙළත් පසෙකැ තිබියැ දී – බුදු ගුණ අලංකාරයේ මැ පැදි සිය ගණන් යෙදීම මස් බොල්වනු නිසා ඌරා ගේ ඇඟ දර මුගුරින් තැළීම බඳු විගඩමෙකි.

මෙහි අතිරේකයෙනුත් වදන් වැළිනුත් වැඩ ගැන්ම අමතක නො කළ යුත්තෙකි. මේ සැකෙව් යෙදුම් ද සලකනු මැනැවි.

| | |
|---|---|
| අමා: | අමාවතුර |
| කව්: | කව් සේකරය |
| ගුත්: | ගුත්තිල දා කව |
| දම්: | දම් සරණ |
| දහම්: | දහම් සොඬ දා කව |
| ධම්: | ධර්ම ප්‍රදීපිකා |
| පූජා: | පූජාවලිය |
| බුත්: | බුත් සරණ |
| මුව: | මුව දෙව් දා කව |
| සද්: | සද්ධර්ම රත්නාකරය |
| සස. | සස දා කව |

සෙසු පොත් පිණිසැ සපුරා තම යොදා ඇති.

ඊ. තෙන්නකෝන්

# ඇදින්නීම

බුදු ගුණ අලංකාරය කරන ලද අවදියත් එය කරන ලද්දේ කවුරුන් විසින් ද යනුත් එහි මැ සඳහන් වෙයි (609-611). එ හෙයින් එ පවත් පිළිබඳ වැ තත් අයුරැ අදහස් පළ කැරුමෙක් හෝ අවුල් වියවුල් ඇති කොටැ ගැනුමෙක් හෝ නො වෙයි. ගත් කරුවාණන් කියන්නේ මූනිඳු පිරිනිවි වස පටන් ලද අවුරුදු දෙ දහස් පසළොසක් ගෙවුණු සඳැ' එ පොත කරන ලද බවයි. එ සේ නම් ඒ අද ලෝ පළ කිතුනු වසින් එක් දහස් සිවු සිය දෙ සැත්තෑ (2015 - 543 = 1472) වැන්නේ දී කරන ලද්දේ වෙයි. එ අවුරුද්ද බුවනෙක-බා රජුට සපිරුණු තුන් වැන්න බවත් එහි මැ කියැවෙයි. එයින් පළ වෙයි බුවනෙක බා රජු සිහසුනට පත් වූයේ කිතුනු වසින් එක් දහස් සිවු සිය සැට නව වැන්නේ දී බව. අයෙක් මූනිඳු පිරිනිවි වසින් දෙ දහස් පසළොස් වැන්න මැ බුවනෙකබා රජු සිහසුනට පත් අවදිය කොටැ සලකති, පැදියේ බස වටහා ගැන්මේ නො සමත් බව නිසා.

මේ බුවනෙකබා රජ නම් 'සිරිසඟ බෝ සිරි බුවනෙකබා' යන නමින් අඳුන්වනු ලබන සවැනි බුවනෙකබා තෙමේයි. බුදු ගුණ අලංකාර කතුවරයාණන් බුවනෙකබා රජුගේ තුන් වැන්න සඳහන් කරන්නේ ජයබා රජු ගණන් නොගන්මි-නුයි. බුවනෙකබා පිලේ දනන් කියන්නේ සවැනි පැරැකුම්බා රජු ගෙන් ඉක්බිති ලක් දිවේ නියම රජු එ නිරිඳු ගෙන් පුත් තනතුරැ ලැබැ සිටි සවැනි බුවනෙකබා යනුයෙන් පළ වූ සපු කුමරු බවයි. වංස කතා කරුවන් සවන බුවනෙකබා රජු සත් වසක් රජ සිරි විඳි බව සඳහන් කරන් දී එ රජුගේ දූදිගම සෙල් ලිපිය, එය එ රජුට නව වැන්නේ කොටවන ලද බව කියන්නේ එ හෙයිනි. එ වුවත් සවන පැරකුම්බා රජුට පසු සවන බුවනෙකබා රජුට පෙරැ අන් රජකු ද වූ බව සවන බුවනෙකබා රජු ගේ 'සිරිසඟබෝ' යන විරුදය පළ කරයි.

විදගමැ හිමියන් සවන සිරි පැරකුම්බා රජුගේ අවදියේ ද වැඩැ සිටි බව:–

ගඟ සිරි පුර උපන්
කිවි කුලැ මුදුන් මල් කඩ
කිවි ගජ කෙසර පඬිවර
අදරින් කළ අයැද' මෙන්

පසන් ලක් දිව් සඳ
මුව මඩල මෙන් හොබනා
පලරම් අරම් සිරි පිරි
විදගම වෙහර රැඳි

පසක් තුන් ලෝ සිදු
ඉදු බුදු රදුන් වදහළ
තෙවළා සයුර කුඹුයොන්
සිරිනි ගත් තිය අත්ලින්

නොයෙක් කව් තළු සඳ
වියරණ ලකර ලකරින්
වියතුන් සැරැ මෙන් මහ
නෙත් පාමුලැ මහ තෙරිඳු

මෙ ලක එක සත් කළ
සිරි පැරකුම් නිරිඳු හට
පතස් සිවු වසැ මෙ කෙලේ
කව් ලකුණු මිණි මල් නම්

යත කව් ලකුණු මිණිමල් ගී පල කරයි. එයින් එ පොත කරන ලද්දේ කිතුනු වසින් (1411 + 53) එක් දහස් සාරසිය පත් සැට වැන්නේ බව පළවෙයි. එය කිතුනු වසින් (1415 + 53) එක් දහස් සාර සිය අට සැට වැන්න යැයි ද ගත හැකි වෙයි. එ සෙයින් ගත හැකි වන්නේ සවන සිරි පැරකුම් රජු ගේ රජ තත් පත් වීම බුදු වසින් එක් දහස් නවසිය පස් පනස් වැන්නේ දී වූ බව ද සඳහන් වන හෙයිනි

සිරි රහල් හිමියෝ ඒ දෙ වස (1955,1958) මැ වදරති. කිතුනු වසින් එක් දහස් සාරසිය දෙළොස් වැන්නේ දී රජ තන්පත් වැ තම හට ජන්ම පරවෙණි වූ රයිගමැ වෙසෙමින් සතුරන් ඔබා එක් දහස් සාරසිය පසළොස් වන්නේ ජයවද්දනපුර නම හට අග නුවර කොටැ ගෙනැ අබිසෙස් ලත් හෙයිනි එ දෙ වස මැ ගණන් ගන්නට ඉඩ ඇති වන්නේ. වීදගම පිලේ ඇත්තන් ගණන් ගන්නට ඇත්තේ මුලින් මැ රජ බව ලත් අවුරුද්ද වියැ හැකියි.

මේ මහනෙත්පා මූල මහ මෙත් තෙරිඳු සිරි පැරකුම්බා රජුට රජ බව අත් කොටැ ගැනීමේ බෙහෙවින් පිටු වහල් වූ බව කියන වීදගම හිමියන් නො වන බව සැලැකියැ යුතුයි.

උතුරු වෙහෙර වැසියන් ගේ සද්ධම්මෝපායනය ඇසුරු කෙරෙමින් මේ මෙත් හිමියන් විසින් **කරන ලද ලෝවැඩ සඟරා** නම් එළු පැදි දහම් පොත **කව්ලකුණු** මිණි මාලාවට පළමු රුසැයුණු බව පෙනෙයි. එහි ගත් **කරාවාණන්** සඳහන් වන්නේ:-

'වීදගම වෙහෙරෙහි **මෙත්** තෙරිඳු සඳ'

යන්නෙනි. කව් ලකුණු මිණි මල:-

**මෙත් මහ නෙත්පා මුල මහ තෙරිඳු** යනු කියයි

බුදු ගුණ අලංකාරයේ :-

**මෙත් මහ නෙත් පා මුල මහ තෙරිඳු සඳ** යනු සඳහන් වෙයි. එ සියල්ලෙන් පෙනෙන්නේ 'ලෝවැඩ සඟරාව' අනෙක් දෙ පොතට පළමු කැරුණු බවයි.

අත්තනගලුවංශ වියකන:-

**රාජ ග්‍රාම නගරවර** කිරීටකෝටිරත්න ශ්‍රී ස්මුජ්වලිත **විද්‍රුමග්‍රාමාභිධාන මහාවිහාරාධිපති** වූ අත්‍යන්තනිර්මල

ශීල සමාධි ප්‍රඥාද්‍යනේක ගුණප්‍රබන්ධ බන්ධුර සුගන්ධයෙන් සුගන්ධී කෘත දිගන්තරාන්ත ඇති ත්‍රිපිටකසාරාර්ථ රත්න මඤ්ජුෂායමාන ශ්‍රී **මෛත්‍රෙය මහා ස්වාමි පාදයාණන් වහන්සේ**.....' යනු පළ කරයි.

එහි:-

පලරම් අරම් සිරි පිරි
විදගම වෙහෙර රැඳි,

යන්නේත්,

දනමන රඳන සැදි ගෙවුයන් සිරින් සර
වැජඹෙන පසිදු මහ රයිගම් පුර අතුර
බබළන සොඳුරු විදගම මහ වෙහෙර

යන්නේ හා,

මනරම් ලකළ මල් පලරම් රඳන නිසි
නොවැහිම් උතුම් ගෙවුයනුදුළ නිතර දිසි
රයිගම් නුවරතුරැ රැඳි පිරි ඉසුරු රුසි
විහිගුම් සොඳුරු විදගම වෙහෙර වැයි

යන්නේත් එක් මූණුවර දක්නට ඇත්තේ යැ.

විදගම වෙහෙර ඇති වූයේ දඹදෙණි කුරුණෑගල් අවදියේ බවයි 'මහා වංසය' අනුවැ පවත් විමසා බලන විටැ පෙනෙන්නේ. මුලින් මැ එහි අදිපති වැ වැඩැ වුසූයේ සොළී තෙර කෙනකුන් බව ද එහි මැ සඳහන් වෙයි.

'සුභේ විද්දුමගාමස්මිං
රාජග්ගාම පුරත්තිකෝ
වරං සිරි සනානන්දං
පරිවේණං සමායුතං
විහාරං කාරයිත්වාන
සබෝධිපටිමාඝරං
අත්තනෝ ගරු චෝළිය
මහා ථෙරස්ස දාසී' (ම. ව. xc. 98. 99)

යැයි කුරුනෑගල් පුරේ සිවු වන් පැරකුම්බා රජු රයිගම අසල් වීදගම සිරි සනානන්ද පිරිවෙන මහ බෝ පිළිම ගේ සහිත වෙහෙරක් කොට තමා ගේ ගුරු වූ සොළී මහ තෙර හට පිදූ බව 'මහාවංස'ය පළ කරයි. එ දවස්හි දී මෙ වෙහෙර වෙසෙසින් බැබැළුණු බව එ අවදියේ කැරුණු පතින් පොතින් පෙනේ. එ ද එහි වැඩෑ විසූ සොළී තෙරුන් එ පැරකුම්බා රජුට බණ දහම් පුරුදු පුහුණු කැරවීමේත් බණ දහම අතින් උවදෙස් දීමේත් නිරත වැ වැඩෑ වුසූ බව නො එක් තැනැ කියැවෙයි.

ඒ සොළී තෙරුන් මහනෙත්පා මූලට අයත් වූ බව සැලැකියැ හැකියි. එ සේ නො වී නම් පසු මෑ එ මූලේ තෙරුන් හට එය අයත් වන්නට කරුණු නැති. 'වංස කථා' කාරයෝ 'චෝළීය මහා ථෙර' යන්න මිසැ එ තෙරුන් ගේ වෙන නමක් නො සඳහන් කෙරෙති. ජාතක කතා සිය බසට නැඟීමේ දී එ මහ තෙරුන් ගෙන් උවදෙස් ලබා ඒ සියල්ල පැවැත්වීම 'මේධංකර' තෙරුන් හට පවරන ලද බව සඳහන් වෙයි. එ කතා පැවත්වීම පැවරුණු තෙර නම 'මෙධංකර' යනුයෙන් සඳහන් කැරෙන විටැදු සොළී මහ තෙරිදු ගේ නම යම් තමට හෝ සඳහන් නො වීම පාඩුවෙකි.

දඹ දෙණි අවදියේ දී වාගිරි ගල මුදුනේ වෙහෙරෙහි මහනෙත්පා මූල තෙරුන් වැඩෑ වුසූ බව නො එක් තැනැ සඳහන් වෙයි. පූජාවලී කාරයන් වාගිරි ගල මුදුනේ වූ වෙහෙරේ අදිපති සුමඟුල් තෙරුන් හට සොහොයුරු මල් වූ බව පූජාවලී කාරයෝ මැ කියති. එ වෙහෙරේ මහනෙත්පා මූල තෙරුන් ගේත් මෙ වීදගම මහ වෙහෙරේ මහනෙත්පා මූල තෙරුන් ගේත් ඇති වූ සැබැඳියාව දන්නට කෙටි මං සැලැසෙනවා ඇති සොළී මහ තෙර නම ගේ (පැවිදි) නම සඳහන් වූණා නම්. වෙහෙරේ හිමි කම් පිළිබඳ පෙරළියක් වූ බව සඳහන් නො වනුයෙන් සිරි පැරකුම්බා රජු ගේ අවදි-යේ සිටි වීදගම් හිමියනුත් බුදු ගුණ අලංකාරය කළ මෙත් හිමියනුත් එ සොළී තෙර ගේ පෙළින් ආ සෙයින් සැලැකියැ හැකියි.

දඹ දෙණි කුරුණෑගල් අවදියෙන් පසු වීදගම වෙහෙරේ නම එ තරම් දුරට සඳහන් නුවූයේයි. ගඟ සිරිපුර අවදියේ මිහුරු අසුත් කරවා:-

'වඳු වීදගම මූනිඳු උදුසන'

යනු පවසා තිහැඬි වෙයි. එයින් පසු වීදගම වෙහෙර ඉහළින් සඳහන් වන්නේ මේ බුදු ගුණ අලංකර කතුවරයාණන් ගේ පවත් පැවැසීමේ දීයි. එයට බාගෙ ද උතුරු මුළ පසැ තෙරුන් ගේ බැබැළීම කරුණු වන්නට ඇතියි සැළකියැ හැකි වෙයි. හවන සිරි පැරකුම්බා රජු ගේ අවදියේ දී ද මේ මෙත් හිමියන් බණ දහම් පත පොත කිරීමේ යෙදී වැඩැ සිටියත් වෙසෙසින් පසිදු වැ සිටි බවෙක් නො පෙනේ. එ අවදියේ දී ලක් දිවේ උගත් උසස් මැ පඬිවරයා හැටියට පළ වූයේ සිරි රහල් හිමියන් බව කවුරුනුත් ඉවසන පවතෙකි.

හවන සිරි පැරකුම්බා රජුට ඉක්බිති වැ සිහසුන් පත් ජයබා රජු නසා සෙනෙවි සපු කුමරුන් සවන බුවනෙකබා යන නමින් නැඟී සිටි ඉක්බිති සිරි රහල් හිමියන් ගේ යසස පිරිහීමත් මෙත් හිමියන් ගේ යසස නැඟී ඊමත් සිදු වූයේයි.

සවන බුවනෙකබා රජු දවසේ සිරි රහල් හිමියන් වැඩැ සිටියේ නැතියි කියැ හැකිවා පමණට එ තුමන් ගේ නම යට පත් වූයේයි. එ හෙත් එ රජු දවසේ ද ඔවුන් වහන්සේ වැඩැ වුසූ බවත් සහ රජ තන් පත් වැ වැජැඹුණු බවත් ඇදැහීමට දෙ පුවතෙක් පිළිසරණ වෙයි.

සවන සිරි පැරකුම්බා රජු ගේ දවසේ දී සිරි රහල් හිමියෝ තමන් විසින් කරන ලද පොත්හි එ කරන ලද්දේ එ රජු ගේ අවදියේ දී බව දන්නට එ බව සඳහන් කොටැ වදළ හ. අසුත් කවිහි ඒ සඳහන ඇවැසි නො වී.

පැරැ කුඹ්බා නිරිඳු
සිවු තිස් වන මෙ හවුරුදු
කව් සේකර පසිඳු
සපිරි පවසා බසින් පිරිසුදු ( x v. 31)

යන්නෙන් කව් සේකරය කරන ලද අවදිය සඳහන් වෙයි.

'රම්මේ විහාරපවරේ භුවි තිත්ථගාමේ
ථෙරෝ මහා විජයබාහු නිවාසවාසී
වාගිස්සරෝ විදිත රාහුලසාමි නාමෝ
දීපං අදාසි පඨයම්පති පංචිකාය.

රාජා පරක්කත්ති භුජෝ යසස්සී
යෝ සීහළින්දේ බහුපුඤ්ඤතේජෝ
× × × × × × × × × × × ×
× × × × ×

තස්සේව වස්සේ නවපංචකස්මිං
රජ්ජෝදයා කත්තිකපුණ්ණමායං
සකෝ අකාසිං නිධිසේලරාම
සුධාකරේ ගන්ථමිමං පසත්ථං'

යනුයෙන් පඤ්චිකා ප්‍රදීපයේ පවත පැවැසිණි.

එ හෙත් පදසාධන ටීකායෙහි අගට සඳහන් වන්නේ:-

සාරිපුත්ත මහාදිසාමි ජනතේ ජිතස්ස සම්භාවිතෝ
තත්තා උත්තරමූලරාහුලමහාථෙරස්ස සික්ඛාගරු
විඛ්‍යාතෝ පදවාක්‍යතක්කකුසලෝ වාදීභසීහෝ සුධී
සෝ වාගිස්සරසංඝරාජපවරෝ ව්‍යාකාසිටීකං ඉමං

යන්නයි. එහි රජකු පිළිබඳ සඳහනෙක් නැති. එයින් පෙනෙන්නේ පදසාධන ටීකාව එ හිමියන් නුරුස්සන සවන බුවනෙකබා රජු දවසේ කැරුණු බවයි. එය සවන සිරි පැරකුම්බා රජු දවසේ කැරිණි නම් එ බව සඳහන් කැරෙනු නියත මැයි.

සිරි රහල් හිමියන් රජු මැදහත් වන කටයුත්තේ හවුල් නූණත් සවන බුවනෙකබා රජු දවසේ ද වැඩැ වුසූ බව ඇඳූහිමට ඒ එක් කරුණෙ කි.

අනෙක් කරුණ නම් කල්‍යාණී ලිපියෙයි සඳහන් වන පුවතෙකි.

සවන බුවනෙකබා රජු දවසේ ලක්දිවේ පැවිදි උතුමන් ගෙන් උපසපත් බව ලැබැ ගෙනැ යාමට අරමණ දෙසින් (හෙවත් පීගු රටින්) පැවිදි පිරිසක් (ක්‍රි. ව එක්දස් හාර සිය හැත්තෑ හයේදී) පැමිණි පවතයි එ ලිපියෙහි සඳහන් වන්නේ. එ දවස්හි සවන බුවනෙකබා රජුට සතුරු වැ රට වැසියන් (සිංහලයන්) පෙරළි කරමින් සිටි බව ද එහි සඳහන් වෙයි. සවන බුවනෙකබා රජු ගේ දෙවනගල සෙල් ලිපිය ද එයට දෙස් දෙයි.

ඒ රාමඤ්ඤ තෙරුන් හට උපසම්පදාව දීමේ පින් කම පිළිබඳ සියලු විදි විදහන් යොදන ලද්දේ වීදාගම මෙත් හිමියන් ගේ ගුරුකම් පිටැ බව පෙනේ. එයට සුදුසු තෙරුන් පමුණුවා ගැනීමේ නායක කම ද මෙ හිමියනට පැවැරුණු බවයි ලිපියෙන් පෙනෙන්නේ. එ අයුරු පින් කමකට සඟ රජුන් නො වඩනා බව නො වෙයි පුදුමය වඩනා බවයි. සඟ රජුන් වැඩැ සිටියැ දී අන් පැවිදි කෙනකුන් එහි නායක කම් පවරමින් ආරාදනය කිරීම සවන බුවනෙකබා රජු සඟ රජුන් විසින් ගණන් නො ගෙනැ වදාළ බව පළ කරන කරුණෙකි.

උපසම්පදා කර්මය සඳහමින්:-

'.........වීදගම මහාථෙරංච මහාවිහාරවාසීපවේණී-භූතභික්ඛුසංඝතෝ'පි ගහපරූපවාදමත්තවිරහිතං ගණං උච්චිනාපේසි, තදා වීදගමමහාථෙරෝ ධම්මකිත්තිමහා-ථෙර, වනරතනමහාථෙර, පඤ්චපරිවේණවාසී මංගල මහාථෙර, සීහළරාජයුවරාජාචරියථෙරාදීනං චතුවීසති පරිමාණං උච්චිනි.........'

(......මහ වෙහෙර වැසි තෙරුන් ගේ පරපුරෙහි වූ බික් සඟන අතුරින් ගැරැහුම් පරූපවාද මත් විරහිත ගණයා වීදගම මහ තෙරුන් ලවා තෝරවී. එ කලැ වීදගම මහ තෙර, දම්කිත් මහ තෙර, වනරතන මහ තෙර, පස් පිරිවෙන් වැසි මංගල තෙර, සිංහල රජ යුවරජ ඇදුරු තෙර යන මේ තෙරුන් ඈ සූවිසි නමක් පමණ තෙර ගණයා තෝරා ගත්හ..........') යනු සෙල් ලිපියෙහි කොටවා ඇති. එයින් පෙනෙන්නේ උපසපන් කමට තෙරුන් නිල කිරීම වීදගම හිමියනට පැවැරී පැවැති බවයි.

සිරි රහල් මා හිමියන් මේ පින් කමට හවුල් නො වී වදාළ බව පෙනෙනුයෙන් ඔවුන් වහන්සේ එ දවස්හි දිවි-යෙන් වැඩැ වුසුයේ නැතැයි කෙනෙකු හට සිතනු හැකි වුවත් එයට ද මේ ලිපිය මැ ඉඩ නො තිබයි.

එ සඳහන් කැලැණි නදියේ සිදු කරන ලද උපසපන් කමින් උපසපන ලැබැ ගෙනැ ගිය තෙරුන් ගේ සීල් මඳ කලෙකින් පිරිහී ගියෙන් යළි සසුන පිරිසුදු කිරීමට සිතූ රාමඤ්ඤ රජු පිරිසුදු සිල් ඇති බැවින් පළ 'සුවණ්ණ සෝභන' නම් පැවිදි උතුමකු දැකැ එ තුමන් උපසපත ලද්දේ කොයින් දැයි දන්නට:-

'සීහලදීපං භන්තේ ගමනකාලේ කතරසීමායං කිත්තකස්ස ගණස්ස සන්තිකේ උපසම්පන්නෝසි? කෝ පන තේ උපජ්ඣායෝ? කම්මවාචාචරියෝ? සීහලදීපේ උපසම්පන්න කාලතෝ පට්ඨාය දානි කතිවස්සෝසීති.'

(හිමියෙනි, හෙළදිව් වඩනා කලැ කවර සීමායෙහි කෙතෙක් ගණ පිරිස මැද උපසපන් වූ ද, ඔබ වහන්සේ ගේ උවදූවෝ, කම් වජන් ඇදුරෝ – හෙවත් උපාධ්‍යාවෝ, කර්ම වාක්‍යාචාරීහු කවරහු දෑ'යි ...) යනු පිළිවිසි බවත්,

'කළම්බුනාමේ, මහාරාජ මහාජාතස්සරේ සජ්ජිතායමුදකුක්ඛේපසීමායං අප්පමාණස්ස ගණස්ස සන්තිකේ වනරතන නාමකං පෝරාණමහාසංඝරාජානමුපජ්ඣායං පුබ්බකාලේරාහුලභද්දනාමකම්දානි විජයබාහුසංඝරාජානං කම්මවාචාචරියං කත්වාමහපසම්පන්නතෝ, තතෝ පට්ඨාය ඡබ්බීසවස්සොම්හි .....'

(මහ රජ කොළොඹ නම් විලෙහි සදන ලද උදකෝක්ෂේප සීමායේ දී අපමණ මහණ ගණා මැද වනරතන නම් පොරණ සඟ රජු උවදු කොටැ පෙරැ රහල් බදහු නම් වූ දැන් විජයබසඟ රජු කර්මවාක්‍ය ඇදුරු කොටැ උපසපන් වීමි. එ තැන් සිටැ දැනට සවිසි වස් ඇත්තේ වෙමි.......) යි පිළිවදන් දුන් බවත් එ ලිපියේ මැ සඳහන් වෙයි.

එයින් පෙනී යන්නේ කැලැණි නදියේ සීමායේ මහලු කම් පිත් කම්ට වැඩැ වදළේ නැතත් සිරි රහල් හිමියන් එ වකට සඟ රජ වැ වැඩැ වුසු බවයි. එයට සවිසි වසකට පෙරැ සඟ රජ පදෙවිය ජයවද්දන පුර වෙහෙරේ වනරතන හිමියන් විසින් දරන ලද බව ද ඉන් මැ පළවෙයි. වීදාගම මෙත් හිමියන් ද එ අවදියේ දී සිදු කැරුණු උපසම්පදා

කර්මයට සම්බන්ධ වන්නට ඇති. එහෙත් ඒ මෑලුවම පිළිබඳ විත්ති කතා මෙතෙක් පළ වී නැත්තෙන් එ පිළිබඳ වැ කිසිත් සැක රහිත වැ අපට තො කියැ හැකියි.

ඒ ඒ මුලෙහි වූ පැවිදි උතුමන් ඒ මූල තනතුරක් විසින් සඳහන් කළා මිසැ අද පවත්නා නකා වැසියන් සේ ඒ ඒ නකයට වෙංසස් වූ වත් පිළිවෙත් හෝ මත බිඳුම් හෝ ඇති වැ විසීමට එ මූල කරුණු කොටැ ගත්තේ නැතියි සැලැකියැ හැකි කවර මුලෙහි වුව ද පැවිද්දන් මහ වෙහෙර වැසියන් ගේ පරපුරින් ආ බව සැලකුවා මිසැ මුලෙකැ පව-තක් සැලකුයේ නැති. සවන සිරි පැරකුම්බා අවදියේ ශ්‍රී චන්ද්‍ර භාරතීන් විසින් කරන ලද 'මහානේත්‍ර ප්‍රසාද මූල' චරිතය නම් වූ වෘත්තමාලාඛ්‍යායෙහි සඳහන් වන මහ නෙත්පා මූල දිවකුරු හිමියන් හික්මැවුණේ ගලතුරුමූල හිමියන් ගෙන් බව එහි මැ සඳහන් වෙයි. එ මහ නෙත්පාමූල හිමියන් ගේ සොහොවුරු මල් මංගල මහ නෙත්පා මූල හිමියන් ද පැපිළියානේ සුනෙත් මහ දෙවි පිරුවනේ අදිපති ගලතුරුමූල මේධංකර හිමියන් කෙරේ වුසූ බව මහ සමන් දේවාලය සන්නසින් පළ වෙයි. කල්‍යාණී ලිපියෙහි 'පංචපරිවේණ වාසී මංගලථෙර' යන්නෙන් සඳහන් වන්නේ ඒ මහනෙත් පාමූල මංගල තෙර වියැයුතු. එයින් පෙනී යන්නේ වීදගම මහනෙත්පා මූල මහ තෙරුන් දවසේ තව ද මහ නෙත් පාමූල තෙරුන් වැඩැ සිටි බවයි

සිරි රහල් හිමියන් ගෙන් පසු සඟ රජ බව අත් වූයේ කැලැණි ගඟේ මාලුවමට හවුල් වූ වනරතන හිමියන් හට යි. එ වනරතන හිමියන් කුරනෑගල වනරතන පෙළින් බට උතුමාණ කෙනෙකි. වීදගම මෙන් මහනෙත්පා මූල හිමියන් සඟ රජ වැ වැඩැ වුසූ බවක් පැවැසීම උමතු කතායි. එ හිමියන් ගේ අවදිය ගෙවුණේ සඟ රජුන් ගේ අවදියත් සමඟ යැ.

වෙසෙසින් සවන බුවනෙකබා පිලට- නැත් නම් පණ්ක්-ක්ර පෙළෙහි කුමරුනට - ලැදි බවක් දක්වා කිරියා කළ මේ මෙත් හිමියන් සපු කුමරු (සවන බුවනෙකබා රජු) සම-ගින් යාපා පටනට ද වැඩා වදුරා සිටි බව අරම් කැලේ සන්නස පළ කරයි.

'..... ශ්‍රීමත් සිරිසඟබෝ ශ්‍රී භුවනෛකබාහු ස්වාමීන් යාපා පටුනේ වැඩ එහි දී මැදින්දින පුර පසළොස්වක් දවස්හි වීදගම ශ්‍රී මෛත්‍රී මහ තෙත් පා මූල මහ තෙර සාමීන් ගෙන් බණ අසා මෙ කියන සාමීන්ට සන්තෝෂව වටනා පස කොට දත් දුන් දඹදෙණි කෝරළය බද මැද ගොඩ යැයි යන ගම . . . මේ කියන සාමීන්ගේ ශාසන බන්ධු පරම්පරා-වට ද හිමි වන සේ මේ දත් පත ලියවා දී නැවත කෝට්ටේ එරබත් තොට ධර්මරාජ පිරිවෙන දී මෙ ම ශ්‍රී මෛත්‍රී මහ තෙත්පා මූල මහ තෙර සාමීන් ගේ අග්‍ර ශිෂ්‍ය වූ නියඳවනේ පුස්සදේව සුමංගල සාමීන් ගෙන් බණ අසා ....... ශ්‍රී බුද්ධ වර්ෂයෙන් දෙ දස් එක් විසි වන මැදින් දින පුර පසළොස් වක් දිනයෙහි .....'

ඈ විසින් සඳහන් වන අරම් කැලේ සන්නසින් පළ වෙයි, සවන බුවනෙකබා රජු වීදගම මහතෙත්පා මූල මෙත් හිමියන් ගෙන් පෙරළ සිටැ මැ අනුශාසන ලැබූ බව.

වීදගම මෙත් හිමියන් විසින් කරන ලද පොත් අතුරින් අත්තනගලු වංශය මුත් සෙසු සියල්ල පැදියෙන් කරන ලද බව පෙනේ. එ පැදි පොත් අතුරින් වැඩි සරියක් එ නම් කව් ලකුණ මිණි මලත් හස් අස්නත් හැරළ සෙසු සියල්ල දහම් පොත් වෙයි. එයින් ලෝවැඩ සඟරව මොවුන් වහන්සේ විසින් මුලින් මැ කරන ලද එළු බණ දහම් පොත හැටියට සැලැකියැ හැකියි. එය 'සද්ධම්මෝපයන' නම් දහම් පොත ගුරු කමට ගෙනැ කරන ලද්දෙකැ යනු පළ පුවතෙකි. එ සේ වුවද එය සද්ධම්මෝපායනයේ හුදු අනුවාදයෙක් නොවේ.

සද්ධම්මෝපායනය උතුරු වෙහෙර (අබාගිරි වෙහෙර) තෙර කෙනකුන් විසින් කරන ලද්දෙකි. වීදගම මෙත් හිමියන් උතුරු වෙහෙර වැසියන් ගේ බණ දහම් පොත් ගුරු කමට ගැන්මෙන් පෙනී යන්නේ මහනෙත් පාමුළ-පැවිද්දන් උතුරු වෙහෙර වැසියන් ගේ මත ගුරුකමට ගත්තා පිලෙකැ ඇත්තන් වන්නට ඇතැයි කිසි කෙනකුන් හට සිතියැ හැකියි. උතුරු වෙහෙර වැසියන් වුණා වේ දකුණු වෙහෙර වැසියන් වුණා වේ යම් යම් පිළිවෙත් අතින් මහ වෙහෙර වැසියන් ගෙන් වෙන් වුව ද එ කවුරුනුත් ඇදූ හුයේ එක් මැ බුදු කෙනකුන් විසින් දෙසා වදරන ලද දහම හෙයින් ඔවුනොවුන් ගේ පතේ පොතේ වූ දූය පිළි-ගැන්ම ඒ ඒ පිලට බර වීමෙක් නො වේ. එ කවුරුන් ගේ වුව ද පන් සිල පන් සිල මැයි, අට සිල අට මැයි. හොඳ හොඳ මැයි, නො හොඳ නො හොඳ මැයි. මහනෙත් පාමුළු පැවිද්දන් පමණක් නොවැ උතුරු මුළු පැවිද්දන් ද උතුරු වෙහෙර වැසියන් ගේ යම් යම් අදහස් පිළිගත් බව සිරි රහල් හිමියන් ගේ කව්සේකර බණින් පෙනේ.

> ' එ කොළොස් මෙ පව් කළ
> තිරිසන් පේ තිරැ වළ
> උපදිති......'

සි සිරි රහල් හිමියන් කව්සේකරයේ සඳහන් කරනන් බෙහෙවින් මහ වෙහෙර වැසියනට හුරු 'දස අකුසල්' විසින් පව් කම් දක්වීමයි.

> ' තයෝ අපායා ආරුප්පා
> සඤ්ඤං පච්චන්ති මම්පිච
> පඤ්චින්ද්‍රියානං වේකල්ලං
> මිච්ඡාදිට්ඨී ච දුරුණා
>
> අපාතුභාවෝ බුද්ධස්ස
> සද්ධම්මාමත දායිනෝ
> අට්ඨක්ඛණා අසමයා
> ඉති ඒතේ පකාසිතා'

(තුන් අවය ද, අරූ අසත් තල ද, පසල් දෙස ද, පසිඳුරන් ගේ විකල බවද, දරුණු මිසදිටු ව ද, සදහම් අමා දෙන බුදු කෙනකුන් ගේ පහළ නො වීම ද යන මේ අට ආකාරයෝ පින් කිරීමට සමය නුවූවාහු යැයි ප්‍රකාශ කරන ලද්දාහු යැ)

යන සද්ධම්මෝපායන බණ පද හා ලෝවැඩ සඟරායේ:-

'සි ය ල් සතුනි පින් කරවයි මුනි කී
නොකල් අටෙකි පින් කම් කළ නොහැ කී' (8)

යන්නෙන් පටන් ගෙනැ පැවැසෙන පවන් ද (9-17) සම වේ. ඒ කාටත් පොදු පවතෙකි. සද්ධම්මෝපායනය නො බලා අන් කිසි බණ දහම් පොතක් බලා කිවත් ඒ මැ යි කියැවෙන්නේ.

(1) 'කාරෙන්තෝ කම්මකරණං
නිරයේ අති දරුණං
භයානකං භුසං ඝෝරං
කථං පුඤ්ඤං කරිස්සති'

(නිරයේ ඉදරුණු, බියකුරු, කුරුරු, කම් කටුලු නිරතුරු කරන්නේ කෙ සේ පින් කරයි ද)

යනු සද්ධම්මෝපායන වදනයි.

'සි තු ව ත් බිය කරවන අරනරයේ
වැටුණොත් එක් සිය සතිසක් නිරයේ
බ ල ව ත් දුක් විඳිනෙ යැ කරදරයේ
ම ඳ කු ත් පිනකට නැති අවසරයේ'

යන ලෝවැඩ සඟරා වදන එ මැ විතර විසින් පළ කරයි.

සද්ධම්මෝපායනයේ:-

(2) 'සද්ධම්මසඤ්ඤා රහිතේ
සදා උබ්බිග්ග ජීවිතේ
තිරච්ඡාන භවේ සන්තෝ
කථං පුඤ්ඤං කරිස්සසි'

(සදහම් සනක් නැති, සියලු කලැ මරණ බියෙන් සැලෙන, දිවි ඇති තිරිසන් බැවැ වූයේ කෙසේ පින් කෙරෙයි ද?)

යන්නෙහුත්, ලෝවැඩ සඟරාවේ:-

'තිරිසන් ජාතිය උපනත් පව් කොට
අව සත් තො වැ බිය පවතින පිට පිට
මඳ සත් සුත් කමකුත් නැති හැම විට
සලසත් තේ කෙ ලෙසැ ද සිත පිනකට'

යන්නෙහුත් දෙන්නේ එක් මැ අරුත වුව ද එ පැවැසූ සැටියේ එක් මුහුණුවරෙක් නැති.

(3) 'ගන්ත්වාන පෙත්තිවිසයං
සන්තාප පරිසෝසිතෝ
ඛුප්පිපාසා පරිස්සන්තෝ
කථං පුඤ්ඤං කරිස්සති'

(ප්‍රේත විසයට ගොස් සතැවුලියෙන් වියැළුණේ සා පව සින් මිරිකුණේ කෙ සේ පින් කරයි ද)

යන සද්ධම්මෝපායන වදන මැයි:-

'උ ප න ත් ප්‍රේත වැ පව් කොටැ තොපණත්
කුලෙ කත් තො ලැබෙයි සෙම් සොවු පමණත්
උ ගු ර ත් තො තෙමෙයි සුර ගඟ වැටුණත්
ම ඳ කු ත් පින් තො කලැකි මැයි සිතුණත්'

යන ලෝවැඩ සඟරා වදනත්. එ සේ වුවත් එ පවත පවසා ඇත්තේ එක් මැ බඳු රුසැයුමෙන් තො වේ.

(4) 'අච්චන්තා ධම්ම බහුලේ
මුනින්ද සුතවජ්ජිතේ
පච්චන්තවිසයෝ ජාතෝ
කථං පුඤ්ඤං කරිස්සති'

(මුනිඳු පුතුන් විසින් වරන ලද අදහම් ඉතා බොහෝ පිට දෙසැ උපනෙ කෙ සේ පින් කරයි ද?)

යන සද්ධම්මෝපායන වදනා:-

'පව් මිසැ පිනෙකැයි නො කරන හැම කල
මුනි බණ නො පවතිනා පිට දෙස්වල
තිසි ලෙසැ උපනත් ලැබැ දන මන කල
කිසි කලෙකැත් කුසලක් නො කළැකි බල'

යන්නෙනි ලෝවැඩ සඟරාව පළ කරන්නේ.

(5) 'ජළෝ මූගාදිකොවා පි
විපාකා වරණේ ඝිතෝ
ගහණෝපායරහිතෝ
තථං පුඤ්ඤං කරිස්සති'

(ජඩ ගොළු ඈ වූ විපාක වරණ අහේතුක පිළිසඳ ඇති වැ සිටියේ ගැනුම් උපා නැතියේ කෙ සේ පින් කරයි ද?)

යන සද්ධම්මෝපායන වදනා:-

'ද ද මිනිසුන් බස් ගෙනැ කිසි කලෙක ය
තද අකුසල් කොටැ කුසලින් වැළක ය
අඳ ගොළු බිහිරි වැ ලදුවත් මේ ක ය
මඳ පිනකුත් නො පිරෙයි බල නිසැක ය'

යන්නෙනි ලෝවැඩ සඟරාව පළ කරන්නේ.

(6) 'ආරුප්පාසඤ්ඤලෝකේපි
සවණෝපායවජ්ජිතෝ
සද්ධම්මසවණා හීනෝ
කථං පුඤ්ඤං කරිස්සති'

(අරූ අසන් ලොවැ දූ අසන උපා වැරුයෙන් සදහම් ඇසුම් හීන වූයෙන් කෙ සේ පින් කෙරේ ද?)

යන සද්ධම්මෝපයන වදනයි:-

'සිත මිසැ කය නැති බඹ ලෝ සතරෙකි
සිත නැති වැ මැ කය ඇති බඹ තලයෙකි
මෙ ද සත පින් කොටැ උපදින පෙදෙසෙකි
එහි උපනත් කුසලක් නො මැ කළ හැකි' යි

ලෝ වැඩ සඟරාවවිතර විසින් පවසන්නේ.

(7) 'පක්ඛන්තෝ පාපිකං දිට්ඨිං
සබ්බතා අනිවත්තියං
සංසාර ඛාණුභූතෝහි
කථං පුඤ්ඤං කරිස්සති'

(සියලු අයුරින් නො නැවැතියැ හැකි වූ මිසදිටුවට වැටුණේ-බටුයේ සසර කණුවක් බඳු වූ.යේ කෙ සේ පින් කරයි ද?)

යන්න ලෝවැඩ සඟරායේ වැඩි විතර සහිත කොටැ:-

'බල කොටු වන් තර මෙ සසර නුවරේ
මුල සැටු වන් දළ ලන පව් පඳුරේ
විස කටු වන් සග මොක් මඟ අතුරේ
මිස දිටු වන් අයටත් පින් නො පිරේ' යි

දක්වේ. එහි දහමේ මිසැ පැවැසීම කළ හැටියේ එක් බඳු බවෙක් නො පෙනේ. සද්ධම්මෝපායනයේ:-

(8) 'බුද්ධුදිච්චේ අනුදිතේ
සිද්ධිමග්ගාව භාසකේ
මෝහන්ධකාරේ වත්තන්තෝ
කථං පුඤ්ඤං කරිස්සති'

(නිවන් මඟ පහයන බුදු හිරු නො නැගි කලැ මොහඳරේ පවත්නේ කෙ සේ පින් කරයි ද?)

යන්න ලෝවැඩ.සඟරායේ පැවැසෙන්නේ:-

'බුදු. කෙනකුන් මේ ලොවැ නූපන් වර
අඳු රෙක් මැ යැ සදහම් නැති මෙ සසර
දු රැ නො දැනෙයි පව් පින් තොරතුර
සිඳු නො කළැකි ඉන් සග මොක් සිරිසර'

යන විදියටයි. එ අයුරින්, පින් නො කළැකි, නො කල් අට දුන්වූ ඉක්බිති පළමු එය පිරු සෙයින් මැ:-

‘යං භාවනාමයං පුඤ්ඤං
සච්චාභිසමයාවහං
තස්සනෝකාසභාවේන
ඒ තේ අක්ඛණා සම්මතා,

අට්ඨක්ඛණ විනිම්මුත්තෝ
ඛණෝ පරම දුල්ලභෝ
තං ලද්ධා කෝ පමජ්ජෙය්‍ය
සබ්බ සම්පත්තිසාධකං’

(-සිවු-සසුන් ගේ දැන්ම එළවන බවුන් මැ යැ වූ යම් පිනෙක් ඇත් ද එයට ඔවස් නො වන බැවින් මූ අකණයෝ යි සම්මතය හ. අට අකණින් වෙසෙසින් මිදුණු අවසරය පරම දුලබයි. සියල් සැපත් සාදා දෙනු ඒ ලදින් කවරෙක් පමා වෙයි ද?) යන්නෑ:-

‘මෙ ලෙසින් පින් නො කළැකි කල් අටෙකි’ යි පවසා නිමවයි ලෝවැඩ සඟරාව.

එ අයුරින් ‘සද්ධම්මෝපායන’ වදන් සිහිපත් කරවන තැන් ලෝවැඩ සඟරායේ ඉතා බහුල වැ ඇතත් එ දහම් නය සද්ධම්මෝපායන කරුවන් ගේ මැ නො වැ බුදුනු වූ කාටත් පොදු වූ දැයයි. වීදගම හිමියන් ලෝවැඩ සඟරාව කිරීමේ දී සද්ධම්මෝපායනය ඇසිරින් දත් දැය නිබඳ සඳහන් කළා මිසැ එ පොත සිය බසට නැඟීමෙන් මෙ පබඳ කළා යැයි සිතීමට එයින් ඉඩ නො ලැබේ. ‘නව අරහාදි’ බුදු ගුණ සඳහා පෙළ කවුරුන් කවර පොතැකැ සඳහන් කළත් ඔහු එය අනෙක් ඇදුරකු ගේ පොතෙකින් ගත්හයි පැවැසීමට අපට ඉඩ නැති. අට අකණ කවුරුන් සඳහන් කළත් මෙ සඳන් අට මැ මිසැ අනෙක් අටක් පළ නො කරනු නියත මැයි.

‘කරන කලට පව් මිහිරි යැ මී සේ
විඳින කලට දුක් දැඩි වෙයි ගිනි සේ (37)

යනු සම වන්නේ:-

'මධුවා මඤ්ඤතී බාලෝ
යාව පාපං න පච්චති
යදා ච පච්චතී පාපං
අථ බාලෝ දුක්ඛං නිගච්ඡතී'

යන යන ''ධම්මපද'' වදනටයි.

'අද මිත් ජීවත් වෙනවා විතරට
දැහැමිත් මිය යනු හො ද මැයි දන හට'(38)

යන්න කිව්වූ:-

'ජීවිතඤ්ච අධම්මේන
ධම්මේන මරණද්වයම්
මරණං ධම්මිකං සෙය්‍යෝ
යං චේ ජීවේ අධම්මිකං'

අධර්මයෙන් දිවි රක්නේ මැනැ ද ධර්මයෙන් මරණ මැනැ ද යත් අධර්මයෙන් දිවි රක්නේ නො මැනැව, ධර්මයෙන් මරණ මැනැවි'

යන 'ධර්ම ප්‍රදීපිකා' වදනටයි.

'ලොබේ සිතින් පව් කළ හැම සතටා
ස බේ කියති ගෙනැ ගොස් යම රජුටා'

යනු සිහි පත් කරවන්නේ:-

'තමේනං භික්ඛවේ නිරය පාලා නානා බාහාසු ගහෙත්ව යමස්ස රඤ්ඤෝ දස්සෙන්ති'

යන 'දේවදූත සූත්‍ර' පෙළයි.

එ අයුරින් ඇති තතු සලකා බලන විටැ පෙනී යන්නේ වීදාගම හිමියන් ලෝවැඩ සඟරාව කරන විටැ ගම් වැසි ගිහි බුදුනුවාට වැඩට සිටී යැ යි සිතුණු සිතුණු දැය තමන් වහන්සේට සිතට නැඟුණු නැඟුණු අයුරින් ඒ ඒ පොත්හි සඳහන් පරිදි සලක සලකා යෙදූ බවයි. එහි ඇත්තේ ඉතා පළ දහම් ඔවදන් යැ.

විදගම හිමියන් තකත් සතර, දෙවියන් ගේ පහන් නො පහන් බව ඇ බැඇරි ඇදගිම් ගැනැ නො තකත හුදු ලොවුතුරු මගට් මැ සිත දුන් උතුමාණ කෙතකුන් හැටියට සලකවත වියතුන් හට සරසව සිටි ඔවුන් වහන්සේ විසින් කරන ලද කව් 'ලකුණු මිණි මල. තමින් කව් ලකුණු මිණි මල වුව ද එය මෙ රට වැසියා වස් කව් සෙත් කව් විසින් සඳහන අදහන මතුරු සතරට අයත් බැඳුම් වෙසෙස් පිළිබඳ උවදෙස් මිසැ පැදි විරිත්, ලකර, යන ඇ බැඳුම් පිළිබඳ වැ නියමයන් පළ කරන්නෙක් නො වේ. තකත් සතරේත් මතුරු සතරේත් ඇසුර ලැබුවන් හට මිසැ පැදි පබඳ කරන්නවුන් හට එයින් වැඩක් ගැන්ම අසීරු සි.

'සිරි ලක් දිවැ කිවින්
ලකුණදුන්වනු වස් ගණ
වණ තකත් කල් මේ ඇ
ලකුණෙක් දෙසක් දන්වම්'

යැයි තමන් ගේ කටයුත්ත ගත් කරුවාණෝ පළ කොට එයට බසිති. 'තකත් කල්' වෙසෙසින් වස්, සෙත් මතුරු වත පැදි පිණිසැ මිසැ කව් සතරට වැඩ ඇති දැය නො වේ. එ කෙ සේ වුවත් ගත් කතු වරයාණන් එහි හොඳ දැනීමක් ඇඳිනීමක් ඇති වැ සිටි බව පොතින් මැ එළි වෙයි.

එ කටයුත්තේ යෙදෙනු නිසි කවියන් ගේ ලකුණු පවසන ගත් කරුවාණෝ:-

සිටි තිස් සැති වයසැ,
සුරු, ලෝ පසිදු වෙසෙසින්,
සිවු වණැ උපන්, දැනැ ගත්
ලක ගණක ගත් නොවළා,
පිරිසුදු වෙස්, අදර,
සම ගුණ පිහිටි මැදහත්,
ගතිතඩු වැඩි විකර නූ,
ලෙ ා සිත න, මහණ බමුණන්

වෙතැ නිති නොමඳ අදරැති,
දැමිදුරැ නිරෝගී
ලෝ වැසියන් සියන් කළ,
දත් සව් කලා කව් නළු,
අගැමි පිය බස් තෙපලත.

(මෙ බඳු කිවි කැල වති.) යනු දක්වති

කව් බැඳීමෙන් පසසනු නුසුදුසු දනන් අඳුන්වමින්:-

'මිසදිටු ගත්, පව්ටු
දුමුව, පියසුන් පිය වුණු,
සුදු, සුනු, අදමිටු කුල
උදෙසා කව් නො බඳනේ' යි එ තුමෝ වදරති.

එයින් ඉක් බිති වැ ඉටු අනිටු ගණ, අකුරු, ඒ ඒ අකුරට හිමි නකත්, අදිපති දෙව්, අරක් ගත් ගහයන් ඈ පවත් ඉතා විසිතුරට දැක් වෙයි.

වියතුන් හට මැ ඇරැණු එ පොත ලෝවැඩ සඟරාව සෙයින් පසිදු නො වී.

බුදු ගුණ අලංකාරය වීදගම හිමියන් විසින් කරන ලද තුන් වන පැදි පබඳයි. ඔවුන් වහන්සේ විසින් කරන ලද ලොකුමැ පොත ද එය මැයි. කතු නිදෙසුන් සමග මැ පැදි හසිය එකොළොසෙකින් පොත නිම වී ඇති. වීදගම හිමියන් සිටිඅවදියේ සෙසු කිවියන් පෙරැ කිවියන් සෙයින් බුදුන්ගේ පෙරැ සිරිතක් හෙවත් ජාතක කතාවක් මුල් කොටැ ගෙනැ කව් පබඳ කළත් වීදගම මෙන් හිමියෝ එ මඟින් ඉවත් වැ බුදු ගුණ අලංකාරයේ 'ගංගාරෝහණ කතාව' සිය පබඳට කතා සිරුර විසින් ගත් හ. එ කතාව මුල් කොටැ ගෙනැ පබඳ කරන්නට බට එ හිමියෝ තව ද තව ද පවත් සුදුසු යැයි සිතුණු තැනැ දී අමුතු යෙන් යොදා සිය පබඳ මහත් කොටැ ගත් හ.

ගිහි දෙවියා පිළිබඳ ජාතක කතාව, මෙහෙසුරු පවත, වෙනු. දෙව් පවත,' ඈ පුවත් එ සෙයින් අමුතුවෙන් එක් කොටැ ලත ලද කොටස් අතරේ වෙයි. බුත්සරණයේ ඇති කතා පුවත සිය පබඳට ගත් හෙයින් එහි වූ උපමා ඈ වැනුම් ලකර මෙහි දු දක්නට ලැබේ. එ හෙයින් විදගම හිමියන් බුත්සරණයෙන් වැනුම් ලකර ඇදගත් සේයි බැලූ බැල්මට අපට පෙනෙන්නේ. එ හෙත් ඇත්ත තම් බුත්සරණයේ වූ කතාව මුළුමනින් මැ ගෙනැ තව ද පුවත් යෙදීමෙන් එය මහත් කොටැ සිය පබඳ කළ බවයි. බුත්සරණයේ නැති නො එක් උපමා ඈ දූය ධර්ම ප්‍රදීපිකා, පූජාවලි ඈ සෙසු ගතින් ගෙනැ යොදු ඇති සැටි පළ වැ මැ පෙනෙයි. එක් බණ දහම් පොතෙකැ වූවක් තවත් බණ දහම් පොතක් කරන්-නකු තමාට හුරු බසින් තම පොතේ ඇතුළු කොටැ දැක්වීම බෙහෙවින් අපට දක්නට ලැබෙන පවතෙකි. විසල් පුරේ තුන් බිය සඳහන් කරන නුවරුන් ගේ බස් ඇසූ ලිච්ඡවි රජ දරුවන් කීහයි සඳහන් බස් අපි සලකා බලමු.

'ලොවට විපත්ති නම් රජ දරවන් ගේ අධර්මිෂ්ඨ කැමින් වන්නේ යැ. ඉදින් මෙ ලෙසැ විපත්ති වීමට කාරණ වූ කිසි අධර්මිෂ්ඨ කමෙක් ඇත් නම් තෙපි හැම දෙන මැ පරීක්ෂා කොටැ කියව'යි කී හැ.

යන්තෙනි බියට කරුණු ලිච්ඡවි රජ දරුවන් පැවැසූ සේ බුත්සරණයෙහි සඳහන් වන්නේ.

එ මැ පවත:-

'යම් කලෙක්හි රජ දරුවෝ අධර්මිෂ්ඨ වෙත් ද, රජුන් අධර්මිෂ්ඨ වූ කලැ රාජ පුරුෂයෝ අධර්මිෂ්ඨ වෙත්. රාජ පුරුෂයන් අධර්මිෂ්ඨ වූ කලැ බ්‍රාහ්මණගෘහපතීහී අධර්මිෂ්ඨ වෙත්. බ්‍රාහ්මණගෘහපතීන් අධර්මිෂ්ඨ වූ කලැ නිගම වාසීහු දු, ජනපද වාසීහු දු අධර්මිෂ්ඨ වෙත්. නිගම ජනපද වාසීන් අධර්මිෂ්ඨ වූ කලැ විෂම වැ චන්ද්‍රසූර්යයෝ ප්‍රවෘත්ත වෙත්. විෂම වැ චන්ද්‍රසූර්යයන් පවත්නා කලැ විෂම වැ නක්ෂත්‍ර තාරකා රූපයෝ ප්‍රවෘත්ත වෙත්. විෂම වැ නක්ෂත්‍ර

තාරකා රූපයන් ප්‍රවෘත්ත වූ කල්හි විෂම වූ රාත්‍රින්දිවයන් ප්‍රවර්තනය කෙරෙත්. විෂම වූ රාත්‍රින්දිවයන් ප්‍රවර්තනය වූ කළ කල්හි විෂම වූ මාසාර්ධමාසයෝ පරිවර්තනය කෙරෙත්. විෂමවූ වූ මාසාර්ධමාසයන් පරිවර්තනය කළ කල්හි විෂම වූ ඍතුසංවත්සරයෝ පරිවර්තනය කෙරෙත්. විෂම වූ ඍතු-සංවත්සරයන් පරිවර්තනය කල කල්හි විෂම වූ වාත හමයි. විෂම වූ වාත හැමූ කල්හි දේවතාවෝ ප්‍රකුපිත වෙත්, දේවතාවන් ප්‍රකුපිත වූ කල්හි වර්ෂා සම්‍යග්ධාරයෙන් වර්ෂ-ණය නොකෙරේ, වර්ෂා සම්‍යග්ධාරායෙන් වර්ෂණය නො කළ කල්හි සස්‍යයෝ විෂම පාකී වෙති. සස්‍යයන් විෂම පාකී වූ කල්හි විෂම පාකී සස්‍යඵල පරිභෝග කරන මනු-ෂ්‍යයෝ අල්පායුෂ්ක වෙති. දුර්වර්ණ වෙති, බහ්වාබාධ වෙත්.'

යත්නෙනි ගුරුළු ගෝමි ඇදුරුණන් 'ධර්ම ප්‍රදීපිකා' නම් පබදේ එය සඳහන් කරන්නේ. ධම්ම දින්නාචාර්ය විමල කීර්ති පාදයෝ:-

'...ලෝකපාල දේවතාවන් ගේ චිත්ත කාරුණ්‍ය මඳ වෙයි. එයින් මැ සූර්ය චන්ද්‍ර රාශි නක්ෂත්‍ර තාරකාදීහු විෂම වැ පවතිත්. එ කල්හි කලින් කලට ලෝකානුශාසක වූ පෘථිශ්වරයන් ගේ චිත්තය කැලැඹී සත්ත්ව කරුණාව මඳ වෙයි. ඔවුන් එ සේ රාජ ධර්මයෙහි නො පවත්නා කල්හි රාජ අමාත්‍යයෝ අධිකරණ ශාස්ත්‍රව්‍යවහාර ක්‍රමයෙහි නො පැවැතැ අධාර්මික වෙති. ඒ අමාත්‍යවරුන් විශිෂ්ට න්‍යාය මාර්ගයෙහි නො පැවැත්මෙන් ජනපදාධිපතීහු අධාර්මික වෙති. ඔවුන් ගේ අධර්මතාවෙන් ජනපදවාසීහු අධාර්මික වෙති. මෙ හැම දෙනා ගේ අධර්මතාවයෙන් වස්සවලාහකාදි වූ දේවතාවෝ අධර්මිෂ්ඨ වැ කලට පවත්නා මේඝ පවත්-වන්නාහු සම්‍යග්වර්තනයෙන් නො පවත්වන්නා හ. එ සේ කලට වැසි නො වස්නා කල්හි ශස්‍යරෝපණාදියට කල් වරදනේ යැ. කල් වරදවා කළා වූ හැම ශස්‍යයෝ කලට නො පැසෙති. එ සේ කල්හි රාජ්‍ය දුර්භික්ෂ වන්නේ යැ. ඒ දුර්භික්ෂතායෙන් සත්ත්වයෝ තුමූ ද කලට වේලාවට

අන්නපානාදිය ලැබැ ගත නො හී ශරීරධාතු පරිවර්තන-යෙන් ක්ලාන්ත වැ......' ඈ විසින් සද්ධර්ම රත්නාකරයෙහි සඳහන් කරත්.

මහනෙත්පාමූල මෙත් මහ තෙර හිමියන් ගුරුළුගෝමි ඇදුරාණන් ගේ පබඳ තම හට ගුරු කමට ගත් බව පෙනේ. එ හෙයින් වැනුම්හි ලා එ හිමියන් බුත්සරණය මැ ගුරු කමට ගත් සේ නො කියැ හැකියි. බුදු රදුන් ලොවැ පහළ වත් මැ ඇති වූ අසිරි වනා දැක්වීම සස ද කව් කරුවාණන් ගේත්, මුව දෙව් ද කව් කරුවාණන් ගේත් මෙත් බල වැනුමත්, සද්ධර්ම රත්නාකර කරුවාණන් ගේ අසිරි වැනුමුත් සිහි පත් කරවයි (අතිරේකය බලන්නැ.)

මහා සම්මත වංශය සැඳැහීමේ දී බුත්සරණය නො වැ පූජාවලිය මෙ හිමියන්ගේ සිතට නැඟුණු බව පෙනේ. ගිනි දෙවියා පිදීම නිසරු කොටැ දැක්වීමේ දී නංගුට්ට ජාතක පුවත බුත්සරණයෙන් නො වැ දහම් සරණයෙන් ගත් සැටියෙකි පෙනෙන්නේ. එහි දී පැවැසුණු:-

'ගිනි දෙවියා කැමති
ගෙයි ගෙයි තිබා කැරු රැති
නො නිවා රකින නිති
මෙ ලොවැ ගැනුදු දුනුදු ලෙඩ වෙති'

ඈ උවහස් යෙදුම් මෙ හිමියන් ගේ මැ සියත් පබඳ හැටියට සැලැකියැ හැකියි.

'හැම තැනැ උවිඳු ඇත
සීතාව වෙන් වනු නැත
එ නිසා යුදත් ඇත
කුමට පැවැසී ද මේ බොරු මැත'

යන වෙනු දෙවියා පිළිබඳ වැ දක්වන ලද නියාය ඉතා වැදගත් වෙයි. 'වෙනු දෙවියා සියලු තැනැ පිරී වැඩැ සිටිනවා නම් සීතාව කො තැනැ සිටිය ද ඔහු ගෙන් වෙන් වුණා, වන්නට බැරියි' කීම නය හුරුයි. ඒ තර්කය මෙත් හිමියන් ගේ මැ සේයි පෙනෙන්නේ.

ඉතිරි රුව වැනීමේ මේ හිමියන් එ තරම් බුහුටි වූ බවෙක් නො පෙනෙයි යසෝධරාවන් ගේ රුව වැනීම සලකා බලන විටැ. ඉතිරින් ගේ පා අගැ (පාදන්තයේ) පටන් කෙස් අග (කේශාන්තය) ට රුව වැනීමයි, පෙර දිගැ කිවියන් පිළිපන් මඟට එකඟ වනුයේ. මෙ හිමියන් යශෝධරාවන් ගේ රුව වනත්තේ ඉන් අනෙක් අතටයි. එ වැනීමේ දී ඇසුරු කරන ලද උපමා ආදිය ඉතා පළ බැවින් අගය අඩු වූ කොටසට අයත් වේ. මෙ හිමියන් ගේ සැකෙවි සිදුහත් පවත ගුත්තිල ද කව් කරුවාණන් ගේ එ මැ පවත පමණ හොබනේ නො වෙයි. වැනුම් පිළිබඳ සියල්ල ඒ ඒ පැදියේ අරුත් පැහැයීම හා සමඟැ සපුරා පවසා ඇති හෙයින් මෙහි එ පිළිබඳ වැ අමුතු වැ යමක් කියැ යුතු නො වේ.

මෙහි පැදි ගණන හසිය එකොළොසක් වුව ද එ පැදි පිණිසැ ඇසුරු කරන ලද විරිත් ගණන සතරකට වැඩි නො වෙයි. ඉතා මඳක් හැර සෙසු සියලු පැදි මහ පියුම් විරිතට අයත් එළි සම ගීයෙන් බඳනා ලද්දේ වෙයි. මහ පියුම් ගීයෙකැ සිවු පියේ මත් ගණන 9. 11, 9. 14 යන පිළිවෙළට සිටියැ යුතුයි. එළි සම වුවත් නුවුවත් ගීය ගීය මැ යි. ගීයේ සිවු පිය දිගින් එක් සම නො වන බවත් සිවු පැදි (සීපද) යේ සිවු පිය දිගින් එක් සම බවත් සිතට ගත්තාම ගීත් සිවු පැදිත් වෙසෙසා ඇඳිනැ ගත හැකි වෙයි.

මෙහි 1-305; 330 – 485: – 523 – 608 යන පැදි මහ පියුම් ගී විරිතින් එළි සම කොටැ බඳිනා ලද්දේ වෙයි 306-329; 502-522 යන පැදි සොළොස් මත් සිවු පැදි විරිතින් ද, 486-501 දෙළොස් මත් සිවු පැදි විරිතන් ද, 609 – 611 අට ළොස් මත් සිවු පැදි විරිතින් ද බඳනා ලද්දේ යැ. එවිටැ සියල්ල:-

| | |
|---|---|
| මහ පිසුම් ගී | 547 |
| සොළොස් මත් සීපද | 45 |
| දෙළොස් ,, ,, | 16 |
| අට ළොස් ,, ,, | 3 |
| | 611. |

ගී යොදා ඇත්තේ (305, 156, 86,) තුන් කඩකටයි. සොළොස් මත් සිපද යොදා ඇත්තේ (24, 21) දෙ කඩකටයි.

සියල්ලෙහි දී මැ එළි වැට දරුණු ලෙසැ බල පා ඇති බව පෙනේ.

'කය නම් අසාරය
බව නම් බයංකාරය
කි ය නු ව දිවා රය
කියම් බුදු ගුණ අලංකාරය' (5)

යන ගීය ගෙනැ 'රැය' යනු 'රය' යැයි යෙදී ඇති සැටි විමසා බලන විටැ පෙනෙයි එළි වැට සියලු පනත් බිඳීමේ සමත් වූ සැටි.

දද කුඩ කොඩි ගත්තෝයා
සොඳ ගඳ දුම් ලත්තෝයා
පිත් පල බල දත්තෝයා
මුනි පුදයට වත්තෝයා (486)

තද දුක් දුරැ ලත්තෝයා
සග මොක් සැප දෙත්තෝයා
මොහු මැ වෙදැ යි දත්තෝයා
වැඳැ වැඳැ බිමැ හෙත්තෝයා (493)

ඈ විදියේ එළි සිපද ළදරුවන් නැළවීමට මිසැ වැඩුණු දනන් පැහැදවීමට සුදුසු නො වේ.

සවන කිරණ දුල මුනි මෙර වැන්නේ
වඩන එ සඟ ගණ කුල ගිරි වැන්නේ
පතන තුරඟ පෙළ සිඳු රළ වැන්නේ
එයන සෙනඟ ගොඩ යන සිඳු වැන්නේ (506)

යන සිපදයේ අග එළි තුන් වැට දෙන්නේ පැසැසුම් නො වේ. මෙත් හිමියන් මෙ අයුරු යෙදුම් හි නො පැකිලෙන බව හඟ අස්නේ:-

'සයුරට දිවෙන මහ ගං නැවැති තැන් නැත
අඳුරට බිය වැ හිරු සඳු සිටැපු තැන් නැත
විදිනට බැරි වැ විදුරුවි පැකිලි තැන් නැත
යුදයට පැමිණැ මෙ නිරිඳු පැරැදි තැන් නැත,

යන්නෙන් ද පෙනේ.

ඒ එ සේ වතුදුඃ-

ලෙසැ සරද ඳේනා
යසසින් ලොව සුඳේනා
සිතැ කිලුටු ඳේනා
තමින් ඒ රජ වී සුඳේනා (353)

'රූ සයුරේ පතුල්
නො පැ උත්ගේ දෙ පතුල්
කෙරෙයි සත ලොබ තුල්
කුමක් කියමු ද මෙ ලොවැ කැරැ තුල් (301)

'මුනි යන මහ ගෙතැ පිරිබඩ
ගෙතැ දරුවන් ගෙන් පිරි බඩ
සල් පිල් වෙතැ සිටැ මග බඩ
වඳිති ලියෝ සිටැ මග බඩ (496)

ඈ විසින් විසිතුරට එළි වැට පිහිටුවා බැඳි පැදි ද මෙහි දක්නට ලැබේ.

මෙත් හිමියන්ගේ බස පිළිබඳ වැ අපට යමක් කීමට ඇති ඉඩ වැඩට ගත හැකි වන්නේ මෝඩයනට ඇඳෑ සැරැසීමෙනි.

'නුවණැතියෙනි මෙ මා
බසැ දෙස ඇතත් එ දමා
දෙ සවන් පුට තමා
පමා නො වැ ගනුව මුනි ගුණමා' (9) යි

[illegible] ඇතිඵුත් හට බසෙහි දෙස දක්නට අනවසර ක්ළ හ එ හිමියෝ මැ. එ හෙයින් අපට කළ හැක්කේ එහි දෙස් ගණන් නො ගෙනැ හැටිය සලකා බැලීම පමණෙකි. සිරි රහල් හිමියන් වැනි:-

‘සව් සත කෙළ පැමිණී
ගුරු වත් දෙරණ සපැමිණී’

මහ වියතුන් වැජැඹුණු අවදියෙකැ බුදු ගුණ අලංකාර කරුවාණන් ගේ බසෙහි දෙස් දක්නවුන් සිටිනු අරුම නො වේ. එ හෙත් කවර වියතකු ගේ වුව ද බස එළි වැට නිසා එහා මෙහා වන්නට ද ඉඩ ඇති. මෙ හිමියෝ:-

‘කය නම් අසාරය
බව නම් බයංකාරය’

යැයි ‘භයංකාර’ යනු මහ පණ හඩ මැකීමෙන් එළුවට හුරු කෙරෙති. එ සෙයින් මැ ‘ලිච්ඡවි’ යනු. ‘ලිච්චවි’ යැයි. එළු කෙරෙති. ‘ප්‍රේමය’ යනු පෙරේමය යැයි යොදති. කුඝද්වතාදය, විජ්ජාචරණ’ යන වදන් එ වූ සැඞීයෙන් මැ යොදති. එහෙත්:-

‘කියති සමහරු යුක්ති දස්සේ’
‘එයින් ගෙට ගිය තසී ගුරුඝිණී’ (කව්: සේ)

ඇ මහ වියතුන් ගේ යෙදුම් හා සමයා බලන විටැ මෙන් හිමියන් හට එ එ සෙයින් යෙදීමට සරසක් නො ඇති වියැ යුතු සේ පෙනෙනු ඇති එයින් වියරණ නං බිඳීමෙක් හෝ පැනැ යාමෙක් හෝ නො සිදු වෙයි.

‘නෙ තැති වැ. උපන්ජන
කරවන මනෝරංජන
මුනිඳු ගෙ නිරංජන
අසු වෙකි ඇහෙහි අනුවැංජන’ (305)

ඇ යේදුම් ද එ අයුරු යි.

• එළි වැට කවර කිවියාටත් වදන්හි සැබැවි රුව
නො සඳහන් වන පමණට සිඟිය වෙනස් වීමේ මතුරක් වූ බව
පෙනෙනුයෙන් එළි නිසා වූ විකර අප විසින් ගණන් ගත යුතු
නො වේ. එහෙත් වියරණ නය සිඳුණු තන් ඇත හොත්
කවුරුන් ගේ වුව ද ඒ නො තකා හරින්නට ඉඩෙක් නැති.
මෙහි එළි නිසා විකර වූ පද කො තෙකුත් ඇසුත් වියරණ නය
අමතක වූ සේ පෙනෙන තන් හිගයි. සිරි රහල් හිමියන් ගේ
නන්හි එකින් එකට ඔවුන් වහන්සේ ගේ බසෙහි මූ කළ
බව පළ වැ මැ පෙනෙතත් මෙත් හිමියන් ගේ ගත්හි ඒ
ඒ තරම් පළ වැ මැ නො පෙනේ. බුදු ගුණ අලංකාරයේ බස
ලෝවැඩ සඟරායේ බසට වැඩියෙන් මූ කළ බවක්
පෙනෙන්නට නැති.

‘නවත් වත් වත් (නවත්වත් නවය්වත්)
‘පවත් වත් වත් (පවත්වත් පවත්වත්)
‘විසුරු වත් වත් (විසුරුවත් විසුරුවත්)

යන යෙදුම් වියරණ නය පමණක් නො වැ ගැමි වහර ද
තකා කළ සේයි පෙනෙන්නේ. මෙ දිවයිනේ පැවිදි
න් තමන් බස රැකැගෙනැ ආ බවක් පවසමින් නිකම්
ත් දැපෙතත් ඔවුන් සකු මගද දෙ බසේ වැදගත්
කිමින් එළු බසේ සැඩල පවත මිසැ අන් පවතක්
කූ බවයි •කවර අතින් බැලුවත් පෙනෙන්නේ. ‘සකු
බඳ වියරණ නය අනුවැ මැ කළ යුතු, එළු පබඳ
පියෙන් යෙදුවත් කම් නැති’ යන හැඟීම යි ඔවුන්
වැති බව පෙනෙන්නේ. ඒ හරියට මැ ‘හිඟන්නාට
ණු බත් ද?’ යන කියමන මෙනි.

වියරණ නය සිදී ඇති තන් ඒ ඒ තන්හි දී මැ
නි හෙයින් ආයේ ද සඳහන් කිරීම වැඩකට නැති
මෙකි.

වීදගම මෙත් හිමියන් ගේ පබඳ අතුරින් උසස් මැ එකා වන්නේ හස් අස්නයි. එය බුදු ගුණ අලංකාරයට පසු වැ කරන ලද්දක් හෙයින් ඒ පිළිබඳ වැ වෙසෙස් පවත් මෙහි ලා දැක්වීම ඇවැසි නො වේ. දහම් ගැට මාලය නම් වූ සුළු පබදෙක් ද වෙයි වීදගම හිමියන් විසින් කරන ලදැයි පැවැසෙත. එ ද දහමට හුරු කොටැ ගැමියන් ගේ වැඩ සලකා කරන ලද්දෙකි.

දෙව් නුවර දෙවොලේ පත්තිස් කෝල් මුර පැදි පෙළ කිහිපයක් ද, තවත් සුළු පැදි පොත් තුනක් පමණ ද වීදගම හිමියන් ගේ නම සඳහන් කරතත් ඒ කවර නම් වීදගම හිමියන් සඳහා ද එ නම යොදා ඇත්තේ යනු ඉඳුරා නො දන්නා තුරු එ පබඳ පිළිබඳ වැ යමක් පැවැසීම සුදුසු නො වේ.

ඊ. තෙන්නකෝන්

# බුදු ගුණ අලංකාරය

1 කුලුණු මෙත් සත් — වෙත
පතළ නැණ සව් — පදරුත
එළි කළ ලොවට — සෙත
නිතර නමදිම් මුනිඳු — සරණත

2 ළං කැරූ සසර — හිම්
දුරු කරූ කෙලෙස් බිය — ගිම්
සිදු කළ සුතු — උතුම්
වඳිම් නව ලොවුතුරු — සදහම්

3 කිසි කෙනකුන් — පමණ
නො කළැකි ගුණැති — අපමණ
සත හට — පිළිසරණ
වඳිම් අදරින් අරී සඟ — ගණ

4 බව සිඳු — පසුරු වන්
අව බියු අදුරු — හිරු වන්
මුනි පෙර — මහරුවන්
මෙ සේ නම කැරූ පුද තෙ — රුවන්

5 කය නම් — අසාරය
බව නම් — බියංකාරය
කියනුව — දිවාරය
කියම් බුදු ගුණ — අලංකාරය

6 මහ කිවි වරත්   පෙර
පවසා තො පත් පර   තෙර
සුගතිඳු ගුණ   ගැඹර
මෙ මා කියමි යි සිතත   වැරසර

7 සුවාසූ   දහසක්
යොදුන් ගැඹුරැති   මුහුදක්
ගොඩ කෙරෙමැයි   උදක්
ලෙහෙනු කළ තැන් වැන්නැ   දවසක්

8 එතෙකුදු වත්   සොඳින්
පුරමි පිතක්   තොමඳින්
මුනිඳු ගුණ   මුහුදින්
බිඳක් දක්වමි උදක්   ඔකඳින්

9 නුවණැතියෙති මෙ   මා
බසැ දෙස ඇතත් එ   දමා
දෙ සවන් පුට   තමා
පමා තො වැ ගනුව මුනි   ගුණ'මා

10 සග සිරි   අසාලා
කළ පුරැ සොඳුරැ   සාලා
සිරින්   සුවිසාලා
පවර නුවරෙක් වී   විසාලා

11 සත් සමුදුර   අගල
සත් ගිරි පවුරැ වට   කළ
සක් පුර මිසැ   උදුළ
එ පුර සරි කො ද පුරෙක්   සක්වළ

12 බබලන පැහැ ගිහිණි
වෙන වෙන දෙසින් සැපැමිණි
පබළු රන් මුතු මිණි
නොයෙක් සල්පිල් සියෙන් පුසැදිණි

13 ගන රන් කොත් පැලැඳි
බිතු සිතුවමින් සිත් බැඳි
මිණි පහ පැහැ විහිදි
කො වේ මා වේ සියෙන් සිය සැදි

14 පුර වැසියන් තිළී
කෙළින කෙළි මෙන් තියැළී
දද ඉන් ඉන් වෙළී
කෙළී පුරඹරු රුසින් බැබැළී

15 මනහර රැසිරි සර
දෙවියන් ලෙසින් සුර පුර
උරයෙන් උර පැහැර
නිතර මහ සෙන් සිටිති එ නුවර

16 සෙණ හෙන සේ කිපෙන
තවසුන් ලෙසින් නික්මෙන
හැම රුපු සෙන් දිනන
මහත් ගජ සෙන් සිටිති තැන තැන

17 හසළ පස් දහරේ
කිසි දෙස් නො වැකි සිරුරේ
යනෙන නිති එ පුරේ
තුරඟ සෙන් වැනි තරඟ සයුරේ

18 එ පුර රජ මහමත
බත් රත් දෙදෙන් පැහැපත
සක් සත් ගත් දිගත
තිතර රත සෙත් විතර වනු තැත

19 සුර තුර මෙන් කැමැති
දෙය යැදිතට දෙන නිති
ලොවැ පරසිඳු පිතැති
නොයෙක් මහසල් කුලත් ගෙත් යුති

20 සුරඟන සිරිසිලු
වරඟන කෙළිත සඳලු
ළිය ගී කන් කලු
ඉමෙක් නැති තරඟ රඟ මඬුලු

21 ඇම තැනැ ඇති සැපත්
එක තැනැ මැ වූ සිරි ගත්
දූකැ දූකැ රිසි නුමූත්
තැතැයි යත සම්පතෙක් එහි නැත්

22 තන් වෙස් තන් බරණ
සැපතින් පිරුණු අපමණ
සිටි වයසෙහි තරුණ
කෙ සේ මෙ තෙකැයි යෙත් ද තර ගණ

23 සිහිල් දිය පිරුණු
පිය ගැට පෙළින් දිලුණු
බිඟු දූල් විසුරුණු
වී යැ තැනැ තැනැ පියුම් පොකුණු

24 තල‘ඹල රත් කෙහෙළි
බත් මිණි කිකිණි මුතු රැළි
රත් වැට පහන් දිළි
දෙරිත් දෙරු දත් දෙවත දත් හළි

25 අසුර සෙන් තරමින්
තැතැ තැතැ පණ අතරමින්
රුපු මත් උපුරමින්
සරත මහ සෙතතැ අවි සරමින්

26 ගිජිඳුන් තිමද ගිළි
තුරඟුන් ලෙසින් තොහැකිළි
තබා බත් රතැකිළි
කෙළිත තත් තත්හි බිහි අලි කුළි

27 දූතැ ගෙතැ විදු සියල්
උතුනට වෙමින් පිළිමල්
කියත රු දවල්
සැදිණි වෙත වෙත තොයෙක් විදු හල්

28 විහිදි මිණි කිරණය
දෙර දෙරෙහි රත් තොරණය
තිති සතොස කරණය
සිරිත් පිරිතිරි එ පුර දෙරණය

29 සතුරත් කැරු තිහඩ
එහි රිය සක්හි සක් හඩ
වැජැඹෙයි දසත මැඩ
ලෙසින් රළ ගළ සයුරු ගත් හඩ

30 පුර දෙරණතැ පිරී
කුර රෙත් සමඟැ ඉනිරී
දිගතැ ගොස් පැතිරී
පවති හය මිණි කිකිණි ගිගිරී

31 පසඟ තුරු තාදේ
ගජ සෙන් කුංච නාදේ
සමඟැ තුති නාදේ
එ පුරැ දිව රැ එක නිනාදේ

32 එව කව බොව කියන
තෙපුලෙන් පිරුණු ඇම තැන
උතුරු කුරු දිවයින
වැත්තැ ඉසුරින් එ පුර ඇම තැන

33 සුරත් පහ සදිසිය
දිලි සත් රුවන් බිතු සිය
සත් දහස් සත් සිය
සතක් රජ මඟ පහය ගැවැසිය

34 කෙළිත පුර වැසියන්
ලොබ වන තරම් දෙවියන්
සව් සිරිනි සැදියන්
සැදිණි එ පමණ පොකුණු ගෙ ඌයන්

35 තිරිඳුන් පෙම් බැඳී
උනුන් වෙතැ සිත් පැහැදී
ඉදිනෙත් එහි සැදී
බියෙන් මෙන් කිසි දුකෙක් නො වදී

36 රැ දෙවෙහි — තිතොරේ
මිණි පහ පැහැය — පැතිරේ
දුරු වන — ගතඳරේ
ලොවැති සව් සිරි සපිරි එ — පුරේ

37 සත් සිය දහස් — සත්
සත් තරනිඳුහු සම — ගොත්
සත් වග කෙරෙහි — මෙත්
යුත් වැ පවතිත් සිතිත් — මැදහත්

38 දුසිරි සිත — නැවති
රද නීති දත් ගුණ — ඇති
මැදහත් ලෙසැ — පැවැති
එ රජ ලිච්වවි නිරිඳු තම් — වෙති

39 කුල දෙටුවන් — පැවැති
සෙබෙහි තෙදණින් නො — දිලෙති
වෙත් වූ සඳැ — දිලෙති
රසින් මුසු නුමුසු රත් සේ — වෙති

40 නො බලා වරද — තත්
නො නැමී බසට — මහතත්
විලසින් පිය — සුතත්
සතත් රකිනු යැ බලා — ඇම තත්

41 නො මකා කුල — සිරිත්
නො තබා මැ දෙන දත් — වත්
නො වඩා අය බදු — ත්
නැගු සිත් සේ මැ දියැ දිය — කොත්

42 ගත උත් ස බා මැ යැ
බස උත් ගේ ස බැ මැ යැ
ඉසුරින් ස බා මැ යැ
සබා තම් උත් උත් ස බා මැ යැ

43 අවා බිය ඇවුරු
සිත් සත් ගුණෙන් සපිරු
දිගු බිතැ කිවියරු
ඔවුන් ගුණ සිතුවමින් තැවැරු

44 රත් රු සදි සි ය හ
දුකැ දුකැ නො යත රි සි ය හ
කත් කලු සුබැ සි ය හ
ඔහු මැ තර දෙව් තමට නි සි යහ

45 රුසිරින් ලොවැ ග රු
අයුරු සුරිඳුත් පිළි රු
දස රජ දම් දු රු
ඔවුන් සරි වෙති මෙ ලොවැ කවු රු

46 . සක බිමැ පෙරළෙ මි ත් ,
ගැලැ බඩු නිසල කෙරෙ මි ත්
පවතින මෙත් නො මි ත්
තුඹූ දුක් විඳිති සත රකි මි ත්

47 රෙත් ඇරැගෙනැ පෙ මි ත්
යන බිඟු ලෙසින් කුසු මි ත්
ලොවට දුක් නො දෙ මි ත්
ගනිති අය පඹුරු පෙර තිය මි ත්

48 ලුව ද සිදු පෙදෙසේ
දිය නො ගෙනැ සිටි නැව සේ
දත නො ගෙනැ මැ තොසේ
සිටිති දතවත් දනන් සිත සේ

49 පල ගත් අතු තසා
මොර කත්තවුත් විලසා
දත ගැතුමක් තිසා
දහම් නො තසති දනන් වනසා

50 සවතින් අසත බස
නුවනින් අසව යත ලෙස
කෙරෙති තමා බස
යමක් නො යොදති මිසක් තිසි ලෙස

51 දෙන'තුල් සේ ඉස ට
සතින් වැළැකෙත වැස්ස ට
යෙදෙත මහතුන් හට
දෙයක් නො යොදති හිතයන් හට

52 පර අඟනන් දෙසේ
බලත ලෝ වැඩ පිණිසේ
ගිම් රිවි මඬල සේ
බලති ඇස හකුළුවා දුක සේ

53 පුතු වෙත සතහසේ
පසව දුක් ඉවසත සේ
ලොව රැකුම'දහසේ
විඳිති දුක් සරු නො කොටැ සැප සේ

54 බබලන තුරු වසා
වලා ලන මරු විලසා
අනුන් ගුණ කෙලෙසා
නුගුණ නො මැ පතුරුවති වෙසෙසා

55 ඇත් ගොවුවන් මරු
තුටු වන ගජන් අසුරු
දුක් ගත්තන් මරු
එසින් තුටු සිත් නො වෙති ඉදුරු

56 නුවඳ හැල් උදුරු
රකිනෙව් වරු ඉදුරු
අදහම් රුකැ පුරු
දහම් නො නසති සිතින් නිතොරු

57 පස් ඉඳුරන් රුගත්
අරමුණු පසින් සැප ලත්
විලසින් ජවන් සිත්
ලෙවන් ලද සැපතින් මැ තුටු වෙත්

58 වතුරු වැලි බිම් පෙත්
නො හැර මැ කරන මෙත් නෙත්
දුක් පත් සතුන් වෙත්
කෙරෙති නිති මහ කුලුණු මෙත් සිත්

59 කළ පිරුණු තෙල් ඇති
රකිනෙව් නිසල කොටැ නිති
මහතුන් ගුණ නැණැති
නිතර රුක බැති සිතින් පවතිති

60 හමන පවනක් සේ
ගවර වලා පුල් සරසේ
කුල නුකුලන් දෙසේ
සම වැ පවතිති සිතින් සොඳ සේ

61 හිරු නැංග ද කෙ සේ
රකිත'දුරු ගිරි ලෙණ සේ
සැඩ දනැතත් කෙ සේ
දුගී සත රැකැ සිටිති සිත සේ

62 දත් මැඳලා දමති
දූනැටි දඹු මෙන් දිත දිත
මෙහෙ ගෙනැ දතත් ගෙන
පසු වැ නො දමති නො දත්තත් මෙන

63 වෙත වෙත කරලැ දුටු
වී ගෙනැ පුරන මෙන් අටු
හැම සත සිතැ සතුටු
තමා ලෙසි ලා නො පී අක පටු

64 කුස ගිනි විතර මිස
නො කරන ලෙසින් බත් කිස
නො කරවති දන රැස
සතන් රකිනා විතරකට මිස

65 පියුමෙහි මී විලෙහි
තබා බොන හස මෙන් එහි
දන දනවතුන් ගෙහි
තබා වැඩැ විඳැගනිති නිතියෙහි

66 ඇතු රකිනා පිණිස
දෑ ලන අනුන් සස් ලෙස
එකකුට වැඩ පිණිස
නො දෙති උදුරා එකකු ගේ යස

67 මෙ වැනි දස් කම් කොට
ලබමි දෙයක් ආ හට
නො මැ දී ඒ ඔහුට
නො යා දෙති දෙම්නසින් ඔහු ගෙට

68 මල සිඳෙන පමණ ට
දවන රත් යේ ගිනි කොට
කළ වරද පමණ ට
දෙවති සන්තාප ඔහු දන හට

69 සිදු වඩ දිය නො වන
කළපුව සිඳෙන දිය මෙන
සැපෙන් දුරු වූව දන
තුමූ නො ඉඳිති සිතින් සැප ගෙන

70 දුන්නෙහි දැඩි කමෙ න්
විදි සරය දුරු යන මෙ න්
තම කළ දැඩි කමෙ න්
සතුන් දුරු නො කරවති නිය මෙ න්.

71 මූල තිර වැ සිටි සේ
සලෙළ වන තුරු සිර සේ
සන සුව විඳින සේ
තුමූ සලෙළ වැ සිටිති හිත සේ

72 නුවර රකවරණට
කරතෙව් පවුර තිර කොට
ලොවට රකවරණ ට
තමා තර කොටැගනිති හැම විට

73 බොන මෙන් මුවරුගෙන
ඇතු සොඬිනු'කා ගත් පැන
ලෝ වැස්සන් පොවන
තමා ලත් සැපත'මා නිතියෙන

74 මල් නො ගෙනැ පල දෙන
දිඹුල් තුරු සේ ඇම, නැ ත
කිසි කරුණක් නො ගෙන
දනන් සුවපත් කෙරෙති නිතියෙන

75 සඟිති නොප පුහුදුන්
නුදුටුයෙන් සඟැ සුරිඳුන්
බලව යි තෙල රදුන්
බුදුන් වදකළ බැවින් සෙත දුන්

76 සැබැවින් තිදස පුර
සුර සෙන් ලෙසින් මනහර
තුටු කළ ලොව් නො හැර
කෙ සේ වනමු ද ඔවුන් සිරි සර

77 සුර සිරි මෙන් නොමඳ
රජ සිරි යෙහෙන් විඳ විඳ
ඔවුනොවුන් පෙම් බැඳ
මෙ සේ එ රජුන් රජ කරන සඳ

78 දෙවියන් ගතෙහි     දිලි
දිසි මෙන් ජරා විලි     පිලි
එ පුරෙහි පවා     කලි
කලෙකැ දුක්බික් දුකෙක්     වියකලි

79 නැති තිත්ත     වත්තේ
සව් සැප ලොවැ     සතුත්තේ
පාතෙව් මෙ     තැත්තේ
රෝග බියෙකුත් අවුත්     වත්තේ

80 ඉසුරින් තමා     පුර
සරි යැයි සිතිත් බැඳැ     වෙර
දුන් මෙන් කුවෙර     වර
වත්නු යක් සෙන් අවුත් එ     නුවර

81 නුවරෙහි     විසාලා
යම් කිසිවකු     තබාලා
යම් දූයි     සිතාලා
මරැ ගොසින් උන් වැනි     වසාලා

82 ගජ තුරඟ සෙන්     හඬ
රිය සක් පසඟ තුරු     හඬ
මෙ හැම වෙසසින්     මැඩ
වැජැඹි බලු කැණහිලුන් ගේ     හඬ

83 දිය අගල     ගැඹුරු
වසා පවුරින්     අතුරු
මල මිනියෙන්     පිරු
වටා කල වැනි අමුතු     පවුරු

84 දඹදිව් තල අවට
උවදුරු තාක් එක් කොට
නො හැර ගෙනැ එ පුර ට
අවුත් මරු බට වැත්තැ එක විට

85 ගොඩැ ගොඩැ ඇට සැකිලි
තැනැ තැනැ තුබූ බලි බිලි
මඟැ මඟැ රෙදි වැරැලි
එ පුර ඇම තැන බලත් පිළිකුලි

86 දෙරැ දෙරැ මිනී බෙර
ගෙයි ගෙයි හඬ යැ බියකර
පිළැ පිළැ අඳිත මර
දුගී ගිලනුත් ගෙත් තැත'වසර

87 මූත වරලැ ඉසැ ඉසැ
හෙන කඳුළැලිය ඇසැ ඇසැ
සා ගිනි යැ කුසැ කුසැ
කියන දුකුලවූ මැ වියැ බසැ බසැ

88 කඩ කබලැ අ තැ අ තැ
ඉපිලි තඹර යැ ග තැ ග තැ
බැගැ හඬැ ව තැ ව තැ
වැඩුණු දළ සෝ ගිනි යැ සි තැ සි තැ

89 බිය තුනෙකින් රුදුරු
බලා සැපැමිණී උවදුරු
ඇදුරන් ගෙනැ තැඹුරු
ඇතුළු නුවරට වත්නු එ නුවරු

90 උනුත් වෙතැ පිය බස
යොදමින් සිතින් සහතොස
උන් රජ මැති පිරිස
නැමැඳැ ඇනි තතු කිවු යැ මේ ලෙස

91 දැඩි දුක්බික් දුකෙකි
කිසි වෙද කමක් නොකළැකි
සැඩ රෝ දුක් බියෙකි
යකුන් ගෙන් වන මහත් වනසෙකි

92 කෙත් වත් විපතැ වී
ගං හෝ දිය ගිය තැ වී
වැසි නැති වියත වී
නොයෙක් තුරු ලිය ද පතිත වී

93 තොලු ගාතා තණක්
දිය තලු තෙමත පමණක්
නැති වැ තුරු සෙවණක්
දුකෙකි සිවුපාවුන්ට දියුණක්

94 පෙර සුරඟනන් වැනි
අඟනෝ සොඳුරු රුසිරිනි
මස් ලේ නැති බැවිනි
උදක් ගෙහි ගෙයි යකින්නන් වැනි

95 නොයෙක් උක් මී රස
ගිය වැනි බියෙන් පර දෙස
සුලබ පස් ගෝ රස
දුලබ වි යැ ගෙන් ඇතැයි යන බස

96 පෙරළ සත සිත ලෙසිනි
තෙවුනං මනා සුවඳිනි
කපුරැ කස්තුරැ දූනි
මෙ පුර නපුරැයි දමා ගිය වැනි

97 නැති වැත් සිල් අටඟ
සුවඳ ගෑමෙක් නැති ඇඟ
දුරැ ලූයැ ලිය සසඟ
පිහිටි අය සේ වැ බඹ සර මඟ

98 දුසිරි මඟ නැවැති
සිල්වත් දනන් සේ තිති
කව් නළු රස නැවැති
නටන නටවන අයෙක් නම් නැති

99 දෑනෙත් එකඟ සිත
වූ මෙන් කෙළි සිනා නැත
නො සිඟන කෙනෙක් නැත
පිහිටි අය මෙන් දුහඟ පිළිවෙත

100 අයකු රට වැස්සෝ
වට ලූ යෑ දූසි දස්සෝ
උළ යැ පෙරළ තිස්සෝ
දූනුත් වටලා දුවති මැස්සෝ

101 දිය සෙ සිවු සයුරේ
මහ සෙනඟ ඇති නිතොරේ
සැපැමිණී උවදුරේ
ඔවුන් ගැණෑ ගත හැකි යැ මෙ පුරේ

102 වැඩ කැරුමෙත් ලොවට
සැපැමිණෑ මෙ රජ සැපතට
කිසි කම් නැති ලෙසට
කිමෙකැ පිහිටක් නො වනු මෙ දුකට

103 දුක්බික් දුක් මුසු
තම සිත දුකට සුදුසු
නුවරුන් බස් ඇසු
තිරිඳු මෙ ලෙසින් තෙපුල් පැවැසු

104 රජුන් අදමිටු වත්
වෙති මැතිඥෝ ද එ පවත්
දකැ උන්ගේ පවත්
බමුණු ගහපතියෝ ද එ ගතිත්

105 උන් දකැ දතවූ වැසි
දත වෙති අදහමට රිසි
රැකැ උන් වෙතැ පැහැසි
සුරන් සිතටත් අදම් අදහසි

106 එ දකැ තුරු දෙවියෝ
වෙති අදහම මැ සෙවියෝ
එසිත'හසැ දෙ වියෝ
කෙරෙති සිත අදහමින් තොවියෝ

107 මෙ ලෙසින් අදහමට
තිරිඳුන් ලොවැ පැමිණී විට
එ රජුන් තතු රටට
හමයි විසම වැ පවත් දැඩි කොට

108 එ පවත් වැදූ සැලෙත
නුබ දෙව් විමන් ගමතොත
කිපුණෙන් සුරන් සිත
නො වස්වති වැසි ලොවට කැරැ සෙත

109 රිවි සඳහු ද තොසේ
යත මඟැ නො යති පෙරැ සේ
එ සුරන් වත එ සේ
නැති වැ වැසි සස් කලට නො පැසේ

110 එක ගමෙකැ ද වැසී
වසිතත් සම වැ නො වසී
ඉත් විසම වැ පිසී
පැසුණු සස් වග ඉතා නො රිසී

111 ඒ අහර කත බොත
දත හට එයින් වෙත වෙත
රෝ දුක් වත බැවිත
ලොවට වැඩ අවැඩ තිරිඳුන් ගෙත

112 එ බැවිත් අප ලොවට
පෙර රජ සිරිත් වෙත් කොට
කළ කී දෙය තොපට
දැනෙත කියව යි කිවු තියම කොට

113 නුවරෝ එ බසසා
තිරිඳුන් නුගුණ විමසා
නැතියෙන් කිසි දෙසා
මෙ සේ පවසති ඔවුන් පසසා

114 සව් සතරෙහි පුරුදු
මහ සත් ගුණෙන් පරසිදු
මහ පින් ඇති මෙ බඳු
උපන් තිසි කැත් කුලෙන් පිරිසුදු

115 දනැ කල ගුණ වෙසෙස
නුවණැති දතත් කී ලෙස
පවතිත ඇම දවස
දුරිත් දුරු කොටැ වසත බොරු බස

116 මෙරමා වැඩ කැමැති
කීකරු ඇමැත්තත් ඇති
තො හැරැ මැ රද නීති
කැමැති දෙය සිදු කරත විකුමැති

117 තැඟෙත රිවි විලසිත්
දිනැ දිනැ උදය සිරසිත්
පෙර තිරිඳුත් විසින්
පැවැති ලෙසට මැ පැවැති වෙසෙසිත්

118 විකුමට තිබොරුවට
දෙත මහ දතට දත හට
දිවි සතර වනු කොට
රකිත සිහිපත් ඇති වැ හැම විට

119 පිරි සුසිරි මගේ
සිටි මැති වරත් සමගේ
රකිත තිති සතගේ
කවර වරදෙක් ද ඔබ ඇමගේ

120 තිරිඥේ එ — බසසා
මැතිත් වෙතැ නෙත් — සලසා
කියව කිවු — තොලසා
එ දුක් පහ වන කරුණු — විමසා

121 නිවටුන් බසැ — නිවට
දූවැරී පිවිටූ — සසරට
තට ගුණ ගත් — ගුණට
එ විට මැතිදෙක් සබෙන් තැගැ — සිට

122 තිරිඳු පද — තඹරට
නම කැරැ සෙමෙන් තැඟැ — සිට
දළැ බැඳැඳිලි වැ — සිට
මෙ සේ දත්වයි තෙපුල් — සබයට

123 සිටැ කෙලෙසුන් — පසිඳ
සැතැසුණු නිවන් පුර — වැද
බුදු කෙනෙකැත — මෙ සඳ
පවර පූරණ කසුබු නම් — ලද

124 කළ සතත — පිරිසුදු
තපෝ ගුණයෙන් — පිරිසුදු
ඇත බුදු කෙනෙක් — සිදු
කකුද කසයින් නමින් — පරසිදු

125 දුසිරි සිත — තැවැනි
තපෝ ගුණයෙන් ලද — තුති
බුදු කෙනෙකැතැ — තෙදැනි
අජිත කෙසකම්බලී නම් — ඇති

126 තුටු කළ සත සතත
දිලි තව තෙදින් ඇම තැත
බුදු කෙතෙකැති සොබත
නිගට නතපුත් නමින් බබලත

127 සඳ සෙ තරු වැලැ මැද
බබලත තවුස් ගණ මැද
බුදු කෙතෙකැති මෙ සඳ
සජය බෙලට්ටි පුත් නම් ලද

128 ලොවැ තරයත් කරත
මහ පුද ලබත නිතියෙත
බුදු කෙතෙකැනි තමිත
පසිදු මක්කලී ගෝසාල යත

129 මෙ කියත බුදුන් වැඳ
කළ හොත් මහත් නිති පුද
හිමි සඳ මෙ පුර බද
කී යැ උවදුරු දුරු වෙතී සෙද

130 ජඩ තිවටුන් තිසා
බුදුනැ යි තමක් සලසා
ඔහු කී එ බසසා
කියයි මැතිදෙක් සෙබෙහි මෙ ලෙසා

131 පව් පිත් නැතැ යි යත
තිවටෝ යැ මූ හැම දෙත
ලොවට මුත් ගෙන් වත
සෙතැත සිහිලස ලැබෙයි ගින්නෙන

132 පව් පින් දෙක මෑ | නැතු
රකිතා තපස් කම් | නැත
ඔවුන් බුදුනැ යි | යෙත
මෙ සේ අනුවණ කමෙක් නම් | නැත

133 මුන් ගෙන් වෙතී | සෙත
කරත පුද මේ ලෙව් | සත
වැලි මලු ලා | සතත
මඩිත වැනි තෙල් පතා | තෙලියත

134 බොරුවෙන් වඩත | බඩ
එ බැවින් දුරැර මුන් | ජඩ
දත් සිවු වේ | තොකඩ
ගෙනැර බමුණන් කරව ලෝ | වැඩ

135 ගහ කැන් | වළඳවා
ගිනි දෙවිය හට | පුදවා
යාග කළ | සොඳවා
ඒ යැ සෙත දුක් මුලින් | මුදවා

136 එ මැතිඳු කී | බසට
මැතිදෙක් කියයි මෙ | ලෙසට
ලෙඩ දුක් පත් | අයට
තවත් උවදුරු දෙයි ද පිටැ | පිට

137 බොරු වේ මතුරු | බැඳ
වළහත ලෙවන් හැම | සඳ
බමුණන් ගෙන් | දුලද
වැඩක් වූයේ ලොවට කී කලැ | ද

138 ගහයෝ තුම් අඹර
දෙවියෝ යැ ලූ සුර පුර
නො ගණිති අත් අහර
උදක් අම රස මිසක් මනහර

139 එසිත් උන් පෙර කල
කුසලින් තිපත තිකසළ
අනෙක් කෙනකුත් කළ
දෙයක් උදෙසා නො වෙති උ පහළ

140 සිඳු දිය ලෙස නිසග
පමණ නො කළැකි සැප සග
නර ලොවැ සැප එ රහ
රුඳුණු පිනි බිඳු වැත්තැ තණ අග

141 සිවු සිය ගවු අසල
වූ තම් තරෝ යම් කල
දෙවියෝ තමන් ගෙල
දුවැටි කුණු සේ කෙරෙති පිළිකුල

142 එ බඳු සුර ලොවැ සිට
දෙවියෝ අවුත් මෙ ලොවට
තමන් දුන් අහරට
තුටු වැ සෙත කැරැ නො යති රැකැ සිට

143 නර ලොවැ දෙන පුදට
පිසී වත දෙරින් දෙරැ සිට
සුරතැ යි යනු කුමට
දුගී යාචකයනට එ නිවට

144 ගැනුමට අත් ඉසුරු
උපමා යොදු විසිතුරු
කෙරෙති යාග බොරු
කෙසේ දුරු වේද ලොවැ උවදුරු

145 නොයෙක් දෙය රැස් කොට
කළ පුද ගිනි දෙවිය හට
සෙත වෙසී යනු ලොවට
පැවැති බොරු මායමෙකි පෙරැ සිට

146 බරණැස පෙර කලෙක
බමුණු මහසල් කුලයෙක
ගුණ නැණ යුත් තිසැක
උපන් පිත් සර බමුණු උතුමෙක

147 සව් සතර සමුදුර
දැකැ නැණ නැවින් පර තෙර
පසිදු වැ ලොවැ පතර
තමා බිහි වන දිනෙහි ගුරුවර

148 නො නිවා තබා රැක
දුන් ගිනි රැගෙනැ වනයෙක
වැසැ අවුරුදු නොයෙක
පුදන ගිනි දෙවිය හට දවසෙක

149 සිඟා ගිය තැනැ ලද
ගොනකු ගෙනවුත් ගසැ බැඳ
කෙරෙමි මසින් පුද
සිතා ගිනි දෙවිය හට මහ පුද

150 ලුණු නැති මස්   පුදට
නපුරැයි සිතා   ගමකට
යා දී ඔහු   ලුණට
අවුත් වලැ වැදි දතත් එ   තැනට

151 එ ගොනා මරු   මස්
පලඟා කමින්   තොසරස්
උන් ගිය සඳැ එ   ගොස්
බලා ගොස් තඟුට කුර ඇට   රැස්

152 අප රකිනා   තබා
තොප සතු ගොනා නො   තබා
කන තෙක් වෙතැ   තබා
බලා උන් කෙතෙකි තෙපි   අත බා

153 එයින් ගිනි දෙව්   නැත
උන් නැත පුදෙන් පල   නැත
බොරු බස් ලොව   පැවත
කරන පුදයෙකි නුවණ නැති   සත

154 ගොන් මස්   නො ලදිනී
මෙ පමණ කව යි   ඉතිනී
කියමින්   වල'ගිනී
ගසා දියවර නිවි යැ එ   ගිනී

155 උපන් බමුණන්   කුල
නුවණැතියවුන් පෙර   කල
තිසරු කොටැ හැරි   කල
එ වැනි ගිනි පුද කළැයි කිමැ   පල

156 ගිනි දෙවියා කැමැති
ගෙයි ගෙයි තබා කැරැ රැති
නො නිවා රකින නිති
මෙ ලොවැ ගැනු ද දූනුදු ලෙඩ වෙති

157 කලකින් බමුණු දන
උදෙසා තම ලබන දන
ගිනි දෙවියා පුදන
පුදෙන් පල කිමැ ලොවට සිදු වන

158 ගෙනැ බමුණන් කතා
කරවන යාග මෙ සතා
සුවඳැල් වී පතා
අකුරු වපුරන වැන්නැ තියතා

159 තිසුලවි ගත් කරින්
කළු පැහැ රැගත් උගුරින්
හත් සළු ගත'ඹරින්
අඩක් උමයඟන ගත් සිරුරින්

160 දලු අඬ සඳ බඳින
ගොර සැප් හරක් පළඳින
රඟ කරන දින දින
මහලු ගොන් වාහනෙන් ඇවිදින

161 ලත් මහ පදෙවියා
සිර සුර ගඟින් දෙවියා
අනඟ රුව දූවියා
යෙකෙකි පුද කරන මඟ දෙවියා

162 එමැ මහ දෙවිඳු හෝ
තොහොත් සිව ලිංගය හෝ
වැදැ පිදුවොත් බොහෝ
එති කී ලොවට සෙත ඇම හෝ

163 එමැතිඳු බස් අසා
මැතිදෙක් කියයි මෙ ලෙසා
ඇති දුක් මඳ තිසා
තවත් දුක් ගෙනැ ලයි ද එවසා

164 දෙවියෝ තම සගය
පැලැඹෙත අයෙකි සසගය
උත් රූ මතරභය
විසුළු වෙස් ඇති තො වෙති මෙ රභය

165 උතුමෝ ලියත් වෙත
තො ඉඳිති විලිත් දූකැ සත
මෙහෙසුරු උමා කත
තබා රකිති කියයි සිය ගත

166 පවතිත මෙ ලොව රූකා
නැති කලැ හිරි ඔතප් දෙකා
ඔහු වැදැ පුද තොයෙකා
කළැයි වැඹ සිදු වේ ද කි කලෙකා

167 අවි අත් වැතැසුමට
නැත වෙයි තමා රූකුමට
එසිත් තිසුලවි හට
ඇතැයි රූ දෙස් දූතෙයි මොතවට

168 රූ දෙස් පව් මිඳී
නිසි උතුමනට නො බැඳී
සිටි බවයෙන් බැඳී
ඔහුට පුද කොටැ කිම් ද පැහැදී

169 සසරෙහි සබව දත්
සිල්වත් දනෝ නැණවත්
තුමූ රඟ නො කෙරෙත්
අනුන් රඟන රඟකුත් නො බලත්

170 තළු වෙස් ගෙනැ එ සේ
නටන කලැ හැම දව සේ
උන් පිදුවයි කෙ සේ
වැඩෙක් සිදු වෙ ද ලොවට සිත සේ

171 දද දන බස් අසා
කරන පුද ඔහු උදෙසා
දිඹුලෙහි මල් නිසා
දියැදූ දුක් විඳින වැනි තොලසා

172 අයකු පිළිකුල් වන
අයකු සිතැ රූ වඩවන
ලිහු සටහන් රූගෙන
කලැ සි පුද පල කිම් දූ ඉන් වන

173 සිත දූසිරී කිලුට
පින් කෙත් නො වන මෙ ලොවට
පුද කරනු ඉසුරැට
ගලෙකැ වපුරන වැත්න බිජුවට

174 ගත් යගද අතට
පත් දිව ගුරුළු යාතට
වැදූ සමුදුර දියට
සැතැපී තත නා දරණ වැළ පිට

175 තෙ දියතැ උවිදු මය
තැත වෙත කෙනෙක් එ සමය
පුදයට තිසි එ මය
කී යැ පුද කරන ලෙසැ මහිමය

176 උවිදුත් ගුණ වෙසෙස
පළ කරා කියත මේ බස
සිටැ තිරිඳු අබියෙස
කියයි මැතිදෙක් සෙබෙහි මේ ලෙස

177 ඇති හට පැත් පවස
ලුණු දිය ගෙනැ පොවත ලෙස
වදිනා මේ වෙහෙස
මඳ වැ තව සලසයි ද දුක් රුස

178 තො බා ලොව තිත්ද
තකිවත් අන්ද මත්ද
පුද කරා උවිත්ද
ඇද්ද ඇසුවා වැඩක් විත්ද

179 ඇම තැත උවිදු ඇත
සීතාවී වෙත් වනු තැත
එ තිසා යුදත් ඇත
කුමට පැවසී ද මේ බොරු තත

180 වඳුරකු පිනු  මුහුද
එ තෙරැ වැ යා නො හී  ඉඳ
ගියෙ ල රම් ගේ  බැඳ
මෙ සේ වෙ ද මෙ ලොවැ දෙවියන්  තෙද

181 අස ම බස  සත්තේ
නො දනී මෙ තෝ  තත්තේ
ඔහුට බිය  ඇත්තේ
එසිනැ යගදසුදය  ගත්තේ

182 සක් බෙල්ලකු  පිඹිය
රු දෙස් සිතින් නො  නිබිය
ඔහුට ඇති කලැ  බිය
කෙ සේ දුරැ ලසි ද නරයන්  බිය

183 ලබමී සෙත  ඉදිරි
ඔහුට කරනා පුද  සිරි
ලබනුව තෙල්  මිහිරි
තබා අලළන වැත්තැ ඔටු  කිරි

184 පෙරැ බුදු බණ  අසා
බුදු ගුණ උගත්  සකසා
මැතිදෙක් එ  විගසා
එ රද සබ මැදැ මෙ සේ  පවසා

185 අප මුනි  තිලෝ නා
හැරැ කියන බස් මෙ  දිනා
හැරැ කිරි පිරි  තනා
වැත්තැ අඟ රැගෙනැ කිරි  දේනා

186 ලැබැ දිවැස නිකසළ
බැලුවත් සියලු සක්වළ
මුනිඳුන් මිසැ උදුළ
කෙනෙක් නැති සත් ලොවට සෙත් කළ

187 මෙර ගිරි සරි ගිරෙක්
රිවි සඳ සදිසි පහනෙක්
නැති සිඳු සරි සරෙක්
එ මෙන් නැති මුනිඳු සරි උතුමෙක්

188 ඔහු නො වැඹි දෙස් දෙස්
ඔහු දෙසැ නො නැමි ඉස් ඉස්
ඔහු නුදුටු ඇස් ඇස්
නො වෙයි ඔහු ගුණ නො වැකි බස් බස්

189 සිහි නො කළ සිත සිත
ඔහු ගුණ නො කී වත වත
ඔහු නො වැඳි අත අත
නො වෙයි එ සරණ නොගත් සත සත

190 සිහි නො කළ දින දින
ඔහු බස් නො වත් කත කත
නො දත් ගුණ පැත පැත
නො වෙයි ඔහු මුල් නො කළ පින පින

191 මුනිඳුන් නුදුටුවෝ
වෙති බව දුකට බටුවෝ
එ මුනි සඳ දුටුවෝ
ඔහු මැ වෙති මොක් සැපත දුටුවෝ

192 මුනි බණ නො ඇසුවෝ
වෙති සසර බැසැ විසුවෝ
ඔහු ගෙ බස් ඇසුවෝ
ඔහු මැ වෙති සසර දුක් නැසුවෝ

193 ඔහු මැ යැ නො දන්නෝ
මුනි බසැ රස නො දන්නෝ
ඔවුන් ගුණ දන්නෝ
උ මැ යැ සග පවග සැප දන්නෝ

194 කිමෙකින් කුමන්ඳෙ
නො දනිති අන්ද මන්ඳෙ
මුනි සරණ වැන්ඳෙ
උ මැ යැ මොක් සැප වැදූ කිමින්ඳෙ

195 බඹ සුර තිරින්ඳෙ
මුනි පද තඹර වැන්ඳෙ
මුදුනැඳිලි බැන්ඳෙ
උ මැ යැ අත් බැවෙහි පල වින්ඳෙ

196 දිටු කිලුටු වන්නෝ
වෙති පසු තැවිලි වන්නෝ
ඔහු සරණ වන්නෝ
උ මැ යැ බව පර තෙරට වන්නෝ

197 තම බස වන් සවන්
සතපා රූ වන් දෙ නුවන්
සැදූහෙන් වන් ලෙවන්
බඟයි මහ සැපත වන එ නිවන්

198 බව දුක් ගිනි නිවන
සත මඟපෙලෙන් පිනවන
නැතැ සරි වන දෙවන
කෙනෙක් මුනිඳුට තිලෝගුරු වන

199 සඟ මොක් සැප දෙවති
අවා බිය දුක් නවතති
පිරි මෙත් කුලුණු ඇති
ලොවට උතුමෝ ඔවුන් මුත් නැති

200 උන් උන් තැන් පුද
උන් වන දෙසට නැමඳ
යෙති බව දුක් මුද
කියනු කිමැ උන් මහිම පහද

201 උන් වැළැඳූ පය ද
උන් පද ලසැති පහණ ද
උන් පිට දුන් රුක ද
පුද මොක් සැප ලබති දුක් සිඳ

202 එ මොක් පුර වන්දූයි
සෙත දෙන්ට පිළිවන්දූයි
තො කියව කුමන්දූයි
තමා පද ගිරිතුරුදු වන්දූයි

203 තම රුව දුටු නෙතට
තම ගුණ සිතූ සතතට
දුක් නොවදින ලෙසට
දෙසි යැ නිසි මහ දහම් මෙ ලොවට

204 මිස දිටු මුලුපුලේ
අටඟ මඟ බීජු වපුලේ
දහම් ගඟ දියලේ
ඔවුන් ගෙනැ සෙත දියත පතලේ

205 දියැ සේ බිම ගිලෙන
බිමැ සේ දියෙහි ඇවිදින
අහසත් එ මැ කරන
සමත ඒ මුනි මිසක් වෙන නැත

206 දිනැ දිනැ දිනිඳු මෙන්
කර රස නො වන සිඳු මෙන්
නොනැසි විඳු කිඳු මෙන්
වැජැඹි අඩු නො වන පුන් සඳු මෙන්

207 ලෙඩට දිව ඔසු සේ
මරු කතරැ පුල් විල සේ
දුකෙහි පිහිටෙක සේ
පිහිටි දෙර දෙරෙහි කප්තුරු සේ

208 ලං වැ සිටැ මරණට
වැදැ හොත් එ සක් දෙවිඳුට
තෙකෙළ සුවහස් සැට
ආයු දිනි එක බසිත් එ මැ විට

209 තබා තුන් පියවර
වැඩි කලැ තිදස පුර වර
මුනි සඳු ගේ පවර
කෙ සේ පැවැසියැ හැකි ද සිරිසර

210 දසට රියතක් ගත
රැගෙනැ අබළුව අතුලත
යත සැතැපෙත ඉඳිත
සමත ඒ මුනි මිසක් වෙන නැත

211 සවතක් රසිනුදුඉ
තිල බිජු පමණ ගනිතල
ඇම තැන එකෙළි කළ
අනන්ත'පිරියත් සියලු සක්වළ

212 දෙසන බණ එක විට
එක මගද බසිනෙළි කොට
සිය බස ලෙස කනට
ඇසෙයි මුළු ලොවැ සියලු සත හට

213 ඔහු බණ දෙසන විට
වත් සඳ දහම් මඬලට
මිසැ පිරිස විතරට
නො යයි එක අඟලකුත් බැහැරට

214 වඩිමි යි සිතූ විට
දෙරගුළු ඇරෙයි එක විට
දිගු කළ කළ පයට
පිපෙයි සත් බුමු පියුම් මුනිඳුට

215 වළ ගොඩ එ විගසේ
සම වේ යැ බෙර ඇස සේ
දිව මල් වැසි වැසේ
සෑදෙයි මුනි වඩන මඟ දෙ පසේ

216 මුනි සඳ යත උසේ
වුවත් මෙර ගිරි සිර සේ
හිවූ වේ බඹ'ගසේ
නැමී පිළි ගති යැ පද එ මැ සේ

217 බඹ ලොවැ ගොස් ඉඳිති
කප් සිය දහස් තරඹති
රිවි සඳ සිරි මදිනි
මෙ සේ ඔහු සඟ ගණ ද වැජැඹෙති

218 සක්වළ ගිරි සුතෙර
දෙරණ සල්වා එක වර
කරත මහ පෙළහර
පවර සඟ ගණ යැ මුනි පිරිවර

219 මෙ සසරැ පෙර දවස
නොයෙක් කප් කෙළ සුවහස
කඳ පිළිවෙළ වෙසෙස
දකිත සඟ පිරිවර යැ නිසි ලෙස

220 ලක් තබතත් දෙරණ
පස් මඳ ශැ. යත අපමණ
ලැබැගෙනැ මහ නුවණ
එ මුනි වෙතැ සිටිති මහ සඟ ගණ

221 මුළු ලොවැ ඇම දෙසේ
දකිත සත සිත සිත සේ
ලැබැගෙනැ දිව ඇසේ
සිටිති මහ සඟහු ඔහු දෙ පසේ

| | | |
|---|---|---|
| 222 | සුර බඹ ලොවැ | සතත |
| | කියන බස් හැම තැන | තැන |
| | දිවැ කන් ලැබැ | අසන |
| | එ මුනි වෙතැ සඟ ගණ යැ | වැජඹෙන |
| 223 | කෙලෙසුන් දුරැර | සිත |
| | විදසුන් මගින් ලැබැ | සෙත |
| | පින් කෙත් වන | දියත |
| | පසිඳු සඟ ගණ යැ මුනි සඳු | වෙත |
| 224 | පහදා තමන් | සිත |
| | මුදුනැඳිලි බැඳැ වැඳි | සත |
| | ලන සගමොක් | සැපත |
| | එ මුනි වෙතැ මෙ වැනි සඟ ගණ | ඇත |
| 225 | මහ බඹහු | මුනිඳුට |
| | සේසත් තඟති | මුදුනට |
| | එ මුනි සඳු | පුදයට |
| | පිඹිති සක් සක් දෙවින්දෙ | සිට |
| 226 | ගමනොත | මුනිඳුනා |
| | සුරිඳු රජ සිරි | විඳුනා |
| | සිසිල් තල | විඳුනා |
| | සලති සුදු සිනිඳු වල් | විඳුනා |
| 227 | මුනි සඳු වඩින | තැන |
| | දිව මල් දිව පහන් | ගෙන |
| | පුද කෙරෙති වෙත | වෙත |
| | දහස් සුවහස් පමණ | දෙවඟන |

228 සිතු මිණි මෙන් ලොවට
සැපැමිණි මෙ අප මුනිඳුට
සුර සෙන් සිටැ දෙපිට,
සලති පැහැ විහිදි මිණි තල් වැට

229 දෙව්යෝ දිව මලින්
අසුර සෙන් සිත් පලොලින්
දිව තයි කඩුපුලින්
පුදති ගිරිතුරු දු පුල් කමලින්

230 සවණක් රස් දිගත
පැතිරෙයි බුදුන් ගේ ගත
බඹ ලොවැ සිටැ බලත
අනෝකිලෝකිත යැ උන් මුදුනත

231 සැදි මුළු තුන් දියත
විසිතුරු පෙනෙයි සරණත
රු සිරි සර එ සුගත
බලත අම රස වැත්තැ නෙත නෙත

232 එළි පත ම්ව වැ යෙයි
උඩෙලි පත හෝ උඩැ යෙයි
සත සිත තුටු වැ යෙයි
මුනිඳු නො නැමී මැ ගෙට වැදැ යෙයි

333 තරඹා එක් දිගත
මුනිඳුන් දහම් පවසත
සිටි අය දැස දිගත
දකින් අප මුනි සඳුන් වුවනත

234 සදහම් දෙසන සඳ
නිකුත් කට හඩ මුනිසඳ
පුරවි වෙණ නදට ද
වඩා දහසක් ගුණෙන් වෙයි නද

235 සක්වළ නුබ දෙරණ
පිරුණු දිය කඳ සතරණ
කිය හැකි දැනෑ පමණ
පමණ නො කළැකි එ මුනි සඳු ගුණ

236 මෙ තැනට මේ ව ඊ
කියන උතුරක් නො දිඊ
එ ගතින වැදෑ වැඊ
එ මුනි මැ යැ මුළු ලොවට බුහුඊ

237 සේ නො සේ කම් පල
ඈ ඇම් තන්හි ඇම කල
පවතී නුවණ බල
එ මුනි දසබල යැ ඉන් එම්බල

238 කිසිවකුට ලොවැ ඇති
දුකක් නො කරනු මිසැ නිති
එ මුනි සඳ රුව ඇති
ඇතුන් කෙළ දහසකට බල ඇති

239 දිවකුරු බුදුන් කල
පටන් වන නෙක් දසබල
මෙ සතර අසෙකි කල
නො කෙළෙ එක උපනකුත් නිස්පල

240 දිසි ඇම තැන අහස
පමණ කළ හැකි තුරු රැස
මුනි සඳු පෙර දවස
පමණ නැති යදියනට දුන් ඇස

241 පරයා පොළොවැ පස්
දුන් යැදියනට ඇසැ මස්
ඔහු දනට දුන් ඉස්
වේ යැ මහ මෙර ගිරි සිරට උස්

242 දිවකුරු මුනි කෙරේ
පටන් බුදුවන අතරේ
දුන් ලෙසට සිරුරේ
මඳ යැ දිය කඳ මෙ සිවු සයු රේ

243 අප මුනි සඝ කලේ
දුන් දනට නො වැ සසලේ
දෙවිඳු ඈදි සඝලේ
දැනුත් පවතී යැ සිසි මඩලේ

244. බුදු බල මින් දුනේ
නො කීවත් බොහො මෙ තැනේ
වටු වැ ද උන් තැනේ
මෙ කපැ ගිනි නො ගනී යැ එ වනේ

245 වඳුරු වැ උපන් කල
කළ අදිටනින් දසබල
පුරුක් බට දඬුවල
දැනුත් නැත්තේ යැ උන් උන් වල

246 වදුරු වැ මහ ඕතත
මිනිසකු වළින් ගොඩැ ලත
එමෙකා තම මරත
ඔහුට මඟ පෑ කෙළේ මහ මෙත

247 පිය රද යෙදූ වද
කම්කරු කරත ඉස සිඳ
මව වලපුත් වැලැඳ
කෙළේ සම මෙත මැ සත් මැසි වැ ද

248 ගුණයෙකැ බුදුන්තේ
සිවි නිරිඳු වැ උපන්තේ
ඇස් උපුට දුන්තේ
සිතෙහි පිරි සන්තොස මැ දුන්තේ

249 පුණ්ණ යකු ගෙනැ දමත
විදුරු පබ් කලැ එ සුගත
ගල සැව යොදුනුසැත
වැටෙත අතුරෙහි ගණන් දැනැගත

250 ගිජිඳු වැ මුනි සෙතළ
විදි වැද්දවුට සිටැ වළ
සියතින් කපා දල
දුන්තෙ සතොසින් සවන් පැහැදුල

251 දිව නය් වැ ද තොමඳ
වද කරා රුගත ගත විද
ඇත ද දිව විස තෙද
රුහැණි තො වැ සිල් මැ රක්කේ වෙදු

252 මහජනක වැ පවර
නැසුණු තුරු දූකැ පල බ්ර
සපිරි රජ සිරි හැර
ගොසින් වන වැදූ කෙළේ තවසර

253 මුව රද වැ මුනි විරු
විදූ විදූ දිවෙන නරවිරු
වැටුණා වළැ ගැඹුරු
බලා ගොඩැ ලා කෙළේ බිය දුරු

254 වඳුරු වැ එ තෙර ගඟ
පැනැ වේ වැලක් බැඳැ ඉඟ
වානර සෙන් සමඟ
ගඟින් එ තෙරැ වැ යන්ට කෙළෙ මඟ

255 මැස්සකු බොන විතර
ලෙහෙයක් නො සල්වා වෙර
මඟඹසු පඬි වැ පෙර
දිනී යැ දඹ දිවැ රජුන් එක වර

256 සීලව රද වරැඳු
නුවර ගෙනැ රුපු නරනිඳු
මහත් වද කරතුදු
කෙළේ තම සිත සිල් මැ පිරිසුදු

257 බලා සත සිත රඟ
පැවැසූ දහම් මත රඟ
සිදු කැරැ සැප ස සඟ
සිරී පස්වා දහස් එක රඟ

258 බව දුක් විඳෑ තදිති
සිටින සත දුකෑ නොමඳිති
ගොඩෑ ලම් යත සඳිති
දතට අඹුදරුවන් ද බැදෑ දිති

259 මහ පල තියම කොට
පැහැදූ ඔහු කී දහමට
වත් සත මොක් පුරට
කියත් සුවිසි අසංඛයකට

260 දූඩි බැල්මක් නෙතින්
මඳ දෙම්නසක් සිතතින්
කිසි අවියක් අතින්
නො ගෙනෑ මර සෙන් දිනියෑ එ මෙතින්

261 ගණිත දත් අනෙකින්
නො ඉගෙනෑ දෙයක් පොනෙකින්
නො අසා ඉවනෙකින්
මේ ලොව දූනෑ නිමැවී යෑ මනෙකින්

262 රහසත් පව් නො කොට
කෙලෙසරයනුත් දුරු කොට
තිසි වූයෙන් පුදට
අරහ යෑ සි නම කියති මුනිඳුට

263 තුන් කල්හි මෑ පැවැති
පදරුත් සියල් ලොවෑ ඇති
අතැඹුල සෙ දූනගති
එයින් සම්මා සම්බුදුනෑ යෙති

264 විද්දූ නැණ — අට ද
පසලොස් සරණ — ගුණය ද
ඇතියෙන් එ මුනි — සද
**සිරුණු විජ්ජා චරණ** නම් — ලද

265 යහපත් කොටැ — යෙතැයි
සුන්දර තැනට — සැපතැයි
සොඳුරු බස් — කියතැයි
කියති ඒ මුනි රජුට — **සුගතැයි**

266 තුන් ලොව තතු — ලෙසට
දැනැගෙනැ නො ගත් මෙ — ලොවට
දෙසුයෙන් නියම — කොට
**ලෝකවිදූ** යැයි කියති — මුනිඳුට

267 හැම ගුණයෙන් — නඳ
සම වැඩි සතකු — ඇමඳ
දියතෙහි නැති — සඳ
**අනුත්තර** යැයි කියති — මුනිඳ

268 බඹ සුර යකුන් — තද
දමනය කරා තමන් — ලද
සෙත් දී මුනිඳු — සද
**පුරිසදම්සාරථී** නම් — ලද

269 බව කතරින් එ — තෙර
ලනුයෙක් සතන් හැම — වර
තිලෝ ගුරු — මුනිවර
වී යැ **සත්ථා** නමින් — පුවතර

270 සියු සත් සිය තැණින්
දුනැ දුක්වී යැ කුලුණින්
දුරු ලයි අනුවණින්
එ බුදු නම් වී යැ නැණ පමණින්

271 බෙදුයෙන් දහම් කද
බජතය කෙලෙන් ගුණ කඳ
බග දහමින් සසඳ
බැවින් භගවත් වී යැ මුනි සඳ

272 රත් මිරිවැඩි ලෙසට
වල ගොඩ නො වී එක විට
වැදූ නැගෙත මිහි පිට
මෙ වැනි දෙපතුල් යැ අප මුනිඳුට

273 නැබ නිම් දිසි නිමල
අර දහසෙකින් මතකල
සියටක් රුවිනුදුල
මෙ වැනි රිය සක් දෙකෙකි දෙ පතුල

274 පතුල සතරක් කොට
බෙදුණෙන් එකක් විලුඹට
දිලි රත් පලස් වට
ලෙසින් දිගු විලුඹැ අප මුනිඳුට

275 අඩු වැඩි නූ විතර
ඉඟුල් පලු සේ පැහැසර
රතැඟිලි යැ මුනි වර
මොලොක් දික් අක් සිහින් මනහර

276 පිටි පසැ ඉදිරි    පිට
බැලුවත් දෙ අත්වර    සිට
යටි පතුල    පෙනෙතට
උස් වැ සිටි බොලට වෙයි    මුනිඳුට

277 මුලින් දළ    සිහිතග
වට වැ සිටි මස් එක    රඟ
සොඳුරු ඇල් ගප්    රඟ
කෙරෙයි මත දඟ මුනිඳු යුග    දඟ

278 දිලි මුනි දිව    තෙතින්
කුඩු මිටි නොවී    නියතින්
නොතැමී සිටැ    ගතින්
දෙ දණ පිරිමදිනේ යැ දෙ    අතින්

279 ඇඳුරකු විසින්    කළ
දූල් කවුළු සේ    නිකසල
අතැ පයැ මුනි    ලකල
ඇඟිලි සම අතුරු වෙයි    පැහැ දුළ

280 පොළමිත් සියක්    වට
පහන් ගිතෙලෙකැ ලූ    යට
කපු පුලුතක්    ලෙසට
මොලොක් අත් පා යැ අප    මුනිඳුට

281 පියුම් පෙති    ඇතුලට
වැදූ සිටිත කෙමි    විලසට
වැදූ සිටි කය    තුළට
පුරිස් ලකුණැත්තේ යැ    මුනිඳුට

282 දූ හිඟුලින් මැදූළු
ඔප් ලා බඟා දිවි දළු
ගුරු පිරියම් ලකළු
මුනිඳු රුව රත් රුවෙව් නිකසළු

283 අල පතා දිය ලෙසට
දලී තෙල් රජස් හැම විට
ගත නොරඳන ලෙසට
සියුම් සිවි ඇත්තේ යැ මුනිඳුට

284 දුට වෙයි පෙරේමය
දූකැ දූකැ රිසි නොයේමය
මුනිඳු ඇඟැ රෝමය
දෙකෙක් එක තැනැ නො සිටිනේ මය

285 නිල් මිණි රස් තරඟ
විහිදුවා සිටි මතරඟ
හැම ලොම් මුනිඳු ඇඟ
වළලු ගී උඩ බලා සිටි අග

286 නෙතැ නෙතැ පියකරු ව
තිර සර ගුණෙන් විදුරුව
ලෙසින් මහ බඹ රුව
මුදු වැ ඉරිදු වැ සිටී මුනි රුව

387 දෙ අත් පිටැ පා පිට
දෙ වුරෙහි කදෙහි නහරට
නො පැනෙන ලෙස උසට
පිරුණු මස් ඇත්තේ යැ මුනිඳුට

288 සී රදුගෙ හිම දඩ
පිරුණු වත් වෙයි පෙර කඩ
පෙර කඩ ද පසු කඩ
පිරුණු වනැ මුනිඳු ගේ දිය වැඩ

289 කටියෙහි පටත් කොට
කඳට දක්වා සම කොට
රත් පලඟක් ලෙසට
පිහිටි මස් ඇත්තේ යැ මුනිඳුට

290 මුළු තුන් ලෝ වියත්
දනයත් කරන නොවියත්
මුනිඳුන් ගේ කයත්
දිගින් එක පමණ වෙයි බඹයත්

291 සදහම් දෙසන වර
නො ඉපිලි නහර පැහැ සර
මෙත් රන මිහිගු බෙර
වට වැ මොනවට සිටී මුනි කර

292 මුනි සඳු ගෙ උගුරු
සත් සියක් රස නහරු
සිටියෙන් තුඬු පුරු
යැපෙයි මඳ අහරෙකින් සිරුරු

293 දෙලොස් වකැ සඳු ගේ
මඬල හනු සී රජු ගේ
පරයා එක ර ගේ
පිරුණු හනු දෙක යැ මුනි සඳු ගේ

294 පිහිටි දත් දෙ    තිකට
දෙ තිසෙක් වේ යැ දත    හට
උස් මිටි නො වැ    රුවට
පිහිටි දත් සතළිසෙකි    මුනිඳුට

295 ගා ඇතුළත්    පිටත්
සම කොටැ තුබූ සක්    පත්
විලසිත් මුනිඳු    දත්
සිටි යැ උස් මිටි නො වී    මඳකුත්

296 තෙලි තුඩෙකින්    සොඳුරු
ඇඳි හිරි ලෙසින්    පැ'තුරු
මඳකුත් නො වැ    සිදුරු
විදුරු සේ සිටි යැ දත් මුනි    විරු

297 සුදු රස්    මතරගේ
ලෙසින් සුර ගනැ    තරගේ
විහිදන දස    දිගේ
සතර දළ ද යැ මුනි    සඳුගේ

298 දිග පැ. දෙකත්    සිල
මෙලෙක දක්වා නැහැ    සිල
පලලින් මුළු    තළල
වසත දිවැ මුනි සඳු ගෙ    පැහැ දුල

299 පුරවී කෙවිලි    හඬ
මියුරැ යි කියන බස    මැඬ
දෙවා තුති තුඩැ    තුඬ
පවතිතෙ යැ මුනි සඳු ගෙ කට    හඬ

300 ඉඳුනිල් මැණික   රස
සරි කොටැ නො කියැ හැකි   ලෙස
වඩවන සත   සතොස
පහන් තිල් පැහැ යැ මුනි   යුවළැස

301 එ කෙණෙහි   මතරගේ
උපන් රතු   වස්සකුගේ
ඇසි පිය ගුළි   රගේ
පහන් ඇස් ගුළි යැ මුනි   සඳුගේ

302 ඇඳූ රියනක්   දිගට
හළු සඳ මඬල සේ   වට
බැම මැඳූ තළල්   පිට
දිලෙන උණ්ණ ලොම් යැ අප   මුනිඳුට

303 දිය බුබුලක්   ලෙසේ
වට වැ ගෙනැ සිටි   සොඳ සේ
තිල් මිණි රස්   ලෙසේ
බැබැළි අප මුනි සඳු ගෙ   සිරසේ

304 මෙ ලෙසින් බුදුන්   බඳ
දෙ තිසෙකැ ලකුණු   මතතද
එ බැවින් මුනිඳු   සඳ
පහන් තුරු සේ දිලෙයි හැම   සඳ

305 නෙතැති වැ උපන්   ජන
කරවන   මනෝරංජන
මුනිඳු ගෙ   නිරංජන
අසුවෙකැ ඇඟෙහි   අනුවැංජන

306 තම වත දෙස තැම ඉස කෙතකුත්තේ
දෙසැ වඳිනා ලෙස නො තැමියැ දෙත්තේ
තම යස තුති කළ වතට දනත්තේ
කලෙකැත් පිරිදෙව් වැද්ද නො දෙත්තේ

307 ත ම තම සිහි කළ සිතට සතුත්තේ
හැ ම දෙම්තස් දුක් වැද්ද නො දෙත්තේ
හැ ම ලෙඩ සුව වත ලෙසග දනත්තේ
ත ම උපත මැ බෙහෙදක් කොටැ දුත්තේ

308 තම වෙතැ දික් කළ අත පැදේයා
සිහමතකට දික් කරනු නො දේයා
තම වෙතැ යෙම් එසැවූ පාදේයා
නිරයට වැදූ දුක් විඳිනු නොදේයා

309 සි හි ලැ ල් පවතින් ගිම් මඬවාලියැ
මෙ සි ය ල් ලොවැ පිය බස් දෙඩවාලියැ
වි ය වු ල් සත සිතැ තොස් වඩවාලියැ
ගත බොල් බිම මහබිත් හඬවාලියැ

310 මුහුදූ ද පුප් රත් පඬෙර ගැවැස්වියැ
නුබ තල පිපි මල් වියතින් වැස්වියැ
මුළු ලොවැ සුවඳැති මල් වැසි වැස්වියැ
සතර අපා සත සුව සේ වැස්වියැ

311 අට තුරු සිය සුබ ලකුණෙන් සිරිමත්
යට කැරැ බව දුක් එ බුදුන් බුදු වත්
වට සිය යොදනෙකැ ගත ගිනි දූල් ගත්
අට මහ නරකය විය'වුල් සියපත්

312 ගෝත ම තම් එ බුදුන් බුදුවනූ සඳෑ
ජේ ත ලොවේ සා ගිනි දුක් මුල්. සිඳෑ
බී ත කරන ලෝ දිය උන් මුව වැදෑ
සි ත අමා මියුරස වි යෑ එ මෑ සඳෑ

313 අ වි ග ත් යම පල් කෙළි තත්දතවත
බ ල ව ත් කම් කටුලින් තත්දතවත
අ සි ප ත් වත බිය පත් තත්දතවත
සි රි ග ත් සුර සෙන් කෙළි තත්දතවත

314 සත් වග වෙත් මහ මෙතට අමාවට
පත් වතොවුන් බුදු බවට අමාවට
පත් වත නිරි සත් මුවට අමාවට
පත් වියෑ දිලි රත් යවට අමාවට

315 බි ය ක රු ගිනි දූල් විසිරු තුමුල්වත
නි ර තු රු කටු සොළොසඟුලින් තුල්වත
නි ර තු රු ඔසුපත් පිහිටි ඉඹුල්වත
සු ර තු රු වියෑ සත සතොස උපුල්වත

316 කර වැල් අවුලින් නිරි සත් වත දඟ
යම පල්· බිළියෙන් අදනා ළඟ
ඇම කල් දලවුල් වේතරණී ගඟ
සිහි ලැල් දිය වියෑ විලසින් සුර ගඟ

317 ගතබොල් යකබල් නිති ගිනි ගෙනෑ රත්
ඇම ක ල් සිලිලොත් මෙත් සිහිලැල්· වත්
ගි නි දූ ල් ලෝ දිය ලෝකුඹු නිරයත්
ම ත ක ල් මලවුල් පිරි කුඹු සිරි ගත්

318 ද රු ඥු වැ දස දහසක් සක්වළතුර
දු රු තො වැ සිටි එක රඟට මැ ඇම වර
දූ රු විසැ ලොවැදිරි නිරයේ ගනඳර
ඉ රු සදු සුවහස් පැවු මෙත් එක වර

319 හි ම වතැ මෙර ගිරි කුල ගිරි සිරසේ
හැම දිවසිතැ සක්වළැ දස දහසේ
බි ම සිටැ තුරු සිරට මැ එක බදසේ
හැම තැනැ හැම මල් පිපුණේ යැ එ මැ සේ

320 උ ර ගු න් ගේ ගත දුහුලින් රැස්වූ
මොනරුන් ගේ පිල් කලඹින් පිස්වූ
දි වි ය ත් ගේ කෙළි මඬලෙහි රැස්වූ
වෙහෙලූත් අං දළයෙන් කර කැස්වූ

321 උ ර ගු ත් සතපා මුගටින් අරණේ
මැ ඩි ය ත් නිදි ගැත්වූ උන් දරණේ
හි ව ලු ත් කෙළිමින් සිටි තුරු සෙවණේ
ස හ වු ත් පෙම් කෙළි කෙළැවූ එ කෙණේ

322 උ ර ගු ත් ගේ පෙණ මඬලට වණවූ
ගු රු ළු ත් පිය තෙපුලෙන් ඔසු ඇණවූ
ත ර ය ත් මෙත් සෙනෙහසැ එක පණවූ
තු ර ගු ත් මිහිවුත් පිය බස් බැණවූ

323 බ ළ ලු ත් ගේ වෙතැ තිති අරතරවූ
මි හි ය ත් ගේ සිතැ ඇති බිය ඇරවූ
දි ව දු ත් ගේ වෙතැ පෙරැ තර වෙරවූ
ක පු ට ත් ගේ සිත සෙනෙහස කැරවූ

324 කෙසරුන් ගෙනැ ඇරැ දුන් තිය පඳුරින්
ගිජිඳුන් සතහා ලූ රස ගොදුරින්
ගිජිඳුන් ගෙනැ වත්කළ කර පොකුරින්
කෙසරුන් ගිම් දුරැ ලූ දිය දහරින්

325 ගොළුවන් කී මියුරස ගී ලෙසටා
බිහිරන් දෙන අත්තල තාළමටා
දූයදුන් ඇස දුන් රසඳුන් ලෙසටා
පිළුනන් දත රඟ කැරැවූ රුවටා

326 මිනිසන් බව නිරිසන් අත් බව ලද
හැමසත් වග විඳිනා හැම දුක් තද
බැලූවන් දස දහසක් සක්වළැ වැද
මඳකුන් නැතැ එ බුදුන් බුදු වන සඳ

327 දස දෙස මැදූ හළ මෙන් නිකසළිවී
නිසල වැ සිවු සයුර'ම රසැතිළිවී
තොසැ කැරැ මුළු ලොව ගත් පුද කෙළිවී
දස දහසක් සක්වළ එක හෙළිවී

328 මුළුතුන් ලොවැ ගෙයැ ගෙයැ හළ දෙරවී
දතකැන් වද බන්දනයෙන් තොරවී
හැමතැන් දිව සුවඳින් මනහරවී
මෙලෙසින් මුළු ලොවැ මහ පෙළහරවී

329 එබසින් බසට මැ කරවා තුති තද
වෙසෙසින් තම නැණ පමණින් පිරිසිඳ
අහසින් බානා මෙන් එක පිති බිඳ
මෙලෙසින් එ මැනිඳු බුදු ගුණ කී සඳ

330 ඔහු තෙපුලෙන් සුබැසි
අසා මුනිඳුන් ගුණ නිසි
නැවැතත් අසත රිසි
තිරිඳු ගෙණෙ මේ ලෙසින් පිළිවිසි

331 උතුමැ යි යත ලොවට
බඹ සුර නරන් පසු කොට
පැවැසූ නියම කොට
මෙ තෙක් ගුණ ඇද්ද ඒ මුනිඳුට

332 මුනිඳුන් ගුණ වෙසෙස
දූතැ ගත තො ගී තතු ලෙස
තිරිඳුන් කී එ බස
අසා එ මැතිඳු කියයි මේ ලෙස

333 බඹ සුර ලොව දෙරණ
හැම තැනැ දතත් අපමණ
කියතත් ලැබැ නුවණ
පමණ නැතැ අප බුදුන් ගේ ගුණ

334 නිතොර පැරුමන් දස
සාර සැකි කප් සුවහස
නුපුරා ඔවුන් ලෙස
කෙ සේ පැවැසියැ හැකි ද ගුණ රස

335 උන් රුසිරි දූකැ නෙතැ
ඔවුන් සදහම් වැදූ සිතැ
නොපහන් කෙනෙක් නැතැ
එසින් උන් ගුණ කියත් හිම් නැතැ

336 බුදු ගුණ මහ මුහුද
තුදුටු පර තෙර හැම සඳ
මං කී ගුණ මෙ සඳ
එයින් ගත් වැන්නැ එක දිය බිඳ

337 පොළොවෙහි පස් රැගින්
දිසි බුදු ගුණ යැ සමගින්
ම කී ගුණ මෙ රැගින්
එයින් ගත් පස් වැන්නැ තියගින්

338 බුදු ගුණ මහ අහස
නුදුටු නිම්මක් දස දෙස
ම කී බුදු ගුණ ලෙස
වැන්නැ මැසි පියෙනි සෙවි තුබ කුස

339 මුනිඳුන් ගුණ මහත්
අසං තිරිඳෙු තුටු සිත්
ඔහු පුර කුල පුවත්
කෙ බඳු දූයි ඔහු අතින් පුළුවුත්

340 එ සඳැ කුල පරපුර
පුර ඉසුරු පිරි පිරිවර
වරගත රැසිරු සර
සරු මෙ ලෙසින් කියයි මැතිවර

341 බඹ උපතින් සැපත
පෙරළ නර ලොවට කැරැ සෙත
නරන් කළ සම්මත
වි යැ තිරිදෙක් මහා සම්මත

354 මුනිඳුට තිලෝ ගුරු
ලබන ලෙස පිය තනතුරු
දස පැරුමත් එ පිරු
පුරා කප් සුවහසක් නිරතුරු

355 සුර බඹ සතුටු කොට
හැම නරනිඳුන් පසු කොට
එ පින් පල දෙනු කොට
පැමිණී මහ රජ තුමෙකු එ පුරට

356 මවු තනතුරු පතා
බුදු කෙනකුනට නියතා
දන් සිල් ගුණ ඉතා
පුරා කප් සුවහසක් සතතා

357 සිරින් සුරිඳුවූ
යසසින් පුන් සඳුවූ
තෙදින් දිනිඳුවූ
අදුන්සක් නරනිඳුට දුවූ

358 රූසිරින් තමායා
සරි කළ ලෝ අමායා
වන් නෙතට මායා
රදූ යුත් වූ නමින් මායා

359 සුදෙවුන් රජු පිණිසැ
එ මායා බිසොවුන් කුසැ
පිළිසඳ ගෙනැ සකසැ
බිහි වැ මැදි පෝ දා වෙසක් මසැ

360 දුටු දුටුවන් සිතට
සක්විති සැපත් අඩු කොට
සැපැමිණෑ ඉඳු ලෙසට
කිඹුල්වත් පුරෙහි රජ සැපතට

361 යසසින් සුපිරිසුදු
කල තුන් ලොව මැ සව් සුදු
රජ උතුමෙක් මෙ බදු
වී යැ සිදුහත් නමින් පරසිදු

362 අසුර සුර බඹ හැම
තුටු කැරැ නරන් නො හැරැම
දක්වා ලොවැ මහිම
එ හිමි සඳ තම උපන් දිනෙහිම

363 මිහි පිටැ සිටැ තොසින්
දිගත නරඹා දිගැසින්
සක්විති රජ වෙසින්
ගොසින් සත් පියවරක් වෙසෙසින්

364 සුර බඹ මහ සබව
පුදන දූනැ බුදු වන බව
ඉතපුලෙන් හෙන සබව
කී යැ තම මුළු ලොවට අග බව

365 සිටැ සත් මැසි වයස
පලක් බැඳැ ඉඳැ නුබ කුස
නම්මා පිය සිරස
දියතැ කියවියැ තමා යසරැස

366 ලොවැ හැම සතන් නිති
ඇරැ ගෙනැ යතත් අඩු නැති
නිදන් සතරෙක් ඇති
ගවු දෙතුන් ගවු යොදුන් වට ඇති

367 හිම ගිම් වසන් කල්
විසුමට සුදුසු සුවිසල්
තුන් පස් සත් මහල්
එ තුන් පහ කුසෙහි විසි මතකල්

368 තෙසු කුලඟනන් හැර
රජ කුලැ උපන් මනහර
සුරඟනසුරු පවර
ලියන් සතලිස් දහස් පිරිවර

369 දිලි රුව මෙන් කසුන්
ගමනින් හසුන් මන් සුන්
වුවොවුහට සුදසුන්
යසෝදර නම් කතක් මෙහෙසුන්

370 මුන් වරලස කලබ
සරි වන වතක් නො මැ ලැබ
නුදුටු නො ඇසූ සුබ
මුහුල කෙලෙසින් මැවී දේ බඹ

371 ඉදු නිල් ඉඳුවරට
තැනැ මෙ වැනි පැහැ මුළු රට
මොවුන් ඇස් මැවුමට
කුමන පැහැයක් ගති ද එක් කොට

372 දුටුදුටුවත් ඔකඳ
වත මූත් වුවත් පුත් සඳ
මවන කලැ නුඹ මැඳ
අනේ කුමකට මැවී දේ සඳ

373 වට මට සිලුටු කොට
ගත හැකි ලීමෙකින් වට
මූත් කරැ හිරි තුනට
කුමන උපදෙස් ලදි ද ඇඳුමට

374 ගත රන් කුඹු අයුරු
දුටුදුටුවනට පියකරු
කලොත් මූත් පියොවුරු
බඹා බඹ සර වේ ද තහවුරු

375 මොලොක් සිහිලැල් වත
එක් කොටැ අඹා පැහැපත
අයුරු මූත් කොමළත
බලව උවමක් සොයත අත් නැත

376 සඳත් කුඹු අයුරු
උපුලත පිත් පියොවුරු
ඉඟැ සිහිත තිබොරු
කිවත් අදහා ගනිති කවුරු

377 කැරැ තුනු තුනු රුවට
කල කමැ වෙසෙස එළිකොට
දුන් කළ හුය ලෙසට
වසා රොදැ මූත් වැජැඹි මොතවට

378 රඹ කඳ ගදැත් — කර
පෙරු කළ බඹහු — මෙහෙවර
නපුරුයි හැම — දුරුර
මැවූ වැනි මැය වටොර — මනහර

379 දනත් කල — උන්මතු
දණ උතු යුගට රත් — තුතු
සරි නො වන දූත් — යුතු
උවම් නැතැ දුට කියම් මින් — මතු

480 නුබ මැද පන — පනඟ
නො දිලෙන පහන් සිළු — රඟ
උවම් නො කළැකි — ළඟ
කෙසේ වනම් ද මොවුන් යුග — දඟ

381 රූ සයුරේ — පතුල්
නො පෑ මුත්ගේ දෙ — පතුල්
කෙරෙයි සත ලොබ — තුල්
කුමක් කියම් ද මෙ ලොවැ කැරු — තුල්

382 නො වසා — සුවළැසේ
දැකැ දැකැ රිසි නො යන — සේ
රුව ඇති කලැ — මෙසේ
කිම්ද නර සුර ලොවැ යි — වෙනසේ

383 නම ඇසූ — පමණට
ලොබ වන මතුරැ — විලසට
මුත් රුව වන — නෙතට
ලැබේනු සග මොක් ඉතා — උගහට

384 සුරඟන සිරි සිරිත්
බබළන මොවුන් රැසිරින්
බැඳුණෝ පෙම් බරින්
කෙසේ ගැලැවී යෙද්ද සසරින්

385 මෙ ලෙසින් ලොවැ මහත්
වියතුන් බසින් තුති ලත්
පවර රිවි කුල කොත්
රැවින් මුළු දඹදිවට අග පත්

386 දැකැ රැව මේ රඟින්
තෝරු ගනෙව් ස සඟින්
බබළන තුනුවඟින්
පවර එ බිසෝ ළඳුන් සමඟින්

387 තො හැරැ මැ දස දිගෙහි
පෙන්වා යසස බවගෙහි
අඩු කළ සිරි සගෙහි
විසී විසි තව වසක් ගිහි ගෙහි

388 සක කුලඹරැ ළ සඳ
එ යසෝදරු නම් ළඳ
පිත් සිරි පිරි තොමඳ
පවර රාහුල කුමරැ ලත් සඳ

389 දැකැ සිවු පෙර තිමිති
හැරැ රජ සැපත සිත රැති
ලැබෙන මතු සක්විති
සැපත් නො තකා සිතින් නො නැවැති

390 ඉසෝරු මැදුරට
දිගු කල පයැදූ එමැ විට
සත් මැතිඳු පසු කොට
තැගී කන්තක මඟුල් අසු පිට

391 නික්මෙනු දකා එවර
හල සඳැ සුරන් පුර දොර
පසු පෙර දෙ අත් වර
සුරන් සැට සැට දහස් පිරිවර

392 දිගු බිත කැරැ පහන්
ගත මිණි දඬු වැට පහන්
එ හිමි ද සිත පහන්
ගෙවා තිස් යොදන රැ නො පහන්

393 අරුණු රස් පතරව
සහ තඹසිළුන් මතරව
රිවි එන රත තරව
අනෝමා නම් ගඟින් එතරව

394 දස පැරුමන් බුහුටි
පිරුණෙන් සිතෙහි නොකිලිටි
කෙලෙසෙව් හල දිගැටි
මඟුල් කඩුයෙන් කපා කෙස් වැටි

395 ලොවට පිය කරණව
මහ බඹහු දුන් පමණව
සිවුර ගෙනැ මහණව
එතෙර වන ලෙස සසර මහණව

396 පිළිවෙත කැරැ — තදින්
හවුරුදු සයක් — පබඳින්
ගත් වෙතැ වෙත — ලදින්
නිවත් මගවත සොයා නො — ලදින්

397 මැඳුම් පිළිවෙතැ — සිට
සැප දී මඳක් — සිරුරට
සේනානී — ගමට
ගොසින් අජපාල නුග — සෙවණට

398 සුජාතා නම් — ලඳ
ගත රන් තළියෙකින් — සොඳ
දිව ඔද ලූ — නොමඳ
මියුරු කිරි පිඬු ගෙනත් දුන් — සඳ

399 කිරි පිඬු නො අඩු — කොට
එකුන් පනසක් පිඬු — කොට
වළඳා උඩු — ගඟට
තළිය හැරැ සුබ නිමිති — දක්මට

400 බමුණකු දුන් — අතට
ගෙනැරැ කුස තණ අට — මිට
ගොස් බෝ තුර — මූලට
සලා පැල දිග බලා වැඩැ — සිට

401 මිහිරු තැගි — රුවට
තුදුසත් විදුරසුන් — පිට
පිට ලා බෝ — තුරට
සෙහෙත් ඉඳැ සිවු ඉටත් දැඩි — කොට

402 ආ මරසෙන් රොසේ
දස බිම්බරක් එ මැ සේ
බිඳැ හැරැ දස දෙසේ
තුමූල් තල පත් පුලුන් රළ සේ

403 පෙර යමැ පෙර දවස
නොඑක් කප් කෙළ සුවහස
කඳ පිළිවෙළ වෙසෙස
පැවැති මොහඳුරැ දමා මුල් පිස

404 මැදි යමැ ලැබැ දිවැස්
සැවපිළි සඳෙහි දත රැස්
දැකැ මතු වන දවස්
පැවැති මොහඳුරැ දමා නො වැ ලස්

405 සු විසි පසාකර
විමසා නැණින් සැක හැර
වත්මන් කල් අතර
වැසුණු මොහඳුරැ පටල දුරැ කැර

406 පෙර බුදුවරන් ඇම
දුටු ලෙස දකින නො හැරැම
නුවණින් අසම සම
බුදු වැ සව් නේ ගෙවා අලු යම

407 වැළැඳූ අම රසින්
කිරි පිඬු එකුන් පනසින්
වෙන අහර් දහසින්
නො ගොස් සත් සතියක් මැ වෙසෙසින්

408 දෙසූ මේ සදමින්
මූදමි යි සතුන් අදමින්
සවන් රස් විදමින්
ගොසින් බරණැසට බඹ යැදමින්

409 විහිදු බඹ ගොසා
සිවු සස් දෙසා සකසා
නිවන් පුර සලසා
බඹුන් අටළොස් කෙළක් නොලසා

410 තුටු කැරැ සත සතන්
දෙසව යි දහම් ඈම තන්
සිතැ කෙලෙසුන් මූතන්
යවා මුළු ලොවැ සැටක් රහතන්

411 නො දැනැ බුදු බල පෙර
තවුසන් කරත අතදර
දක්වා වරින් වර
තුන් දහස් පන්සියක් පෙළහර

412 තුන් තවුසන් එදු
පිරිවර සඹඟැ සමුදු
බව බැදුමෙන් මූදු
යොදු මහ පල රසෙහි නොමදු

413 එ සහ පිරිවර කොට
බඹ සුර නරන් තුටු කොට
සක් රුවන සේ බට
එසින් වැඩැ රජගහා නුවරට

414 මුනි සඳ සඳ මෙනේ
දහසක් සඟුන් රැගෙනේ
විසල් තල් උයනේ
වැඩි ඉඳිති යනු අසා එ දිනේ

415 මහ සෙන් පිරිවරු
පිරි ඇතුළු මහ නුවරු
බිම්සර නරවරු
අවුත් වැඳැ මුනි සරණ තඹරු

416 උන් සඳැ තමන් වෙත
සදහම් දෙසා උන් සිත
කෙලෙසුන් ඇරැ ඉවත
ලොවට දක්වා නිවන් මහවත

417 නරනිඳු සඳ තොසේ
මහ සෙනඟ ගෙනැ එ මැ සේ
එ නුවරැ අබියෙසේ
නිවන් පුර නම් මෙ යැ යි යන සේ

418 මල් වතු පලොල් සල්
පුල් විල් පොකුණු සිසිලැල්
පන් හල් ද දම් හල්
පවුරු පළ ගෙල විසල් වාසල්

419 බඹ විමනෙව් ඉහිල්
ලඹ කිකිණි දැල් මුතු ලැල්
සුවිසල් මතු මහල්
තුඹුල් පැහැ පහ පෙළින් මත කල්

420 නුඹ මෙත් සතාරය
දිලිහෙන මිණි දිවා රය
අයුරු අමතාරය
වේළුවන නම් කැරූ විහාරය

421 දුත් සඳැ නිරිඳු සඳ
පිලිගෙනැ මුනිඳු මතනඳ
දිය පොළොව පිරිසිඳ
ගුගුරුවා මුළු පොළොව එකබඳ

422 දහම් වැසි වස්වා
තුන් දෙස් ගිමන් නස්වා
සත සිත සතොස්වා
කුසල් බිජු පින් කෙතෙහි ඉස්වා

423 දහම් සක පුම්බා
පද සුර බඹුන් සුම්බා
රූපැ ගුණ බිම්බා
දෙ සැට මිස දිටු සිළු කලම්බා

424 අවා බිය අවරණ
දක්වා ලොවට තිසරණ
පහළ කැරූ අපමණ
තමා නව අරහාදි බුදු ගුණ

425 දුසිරි සිත පත්වා
දහම් ජය කොත නංවා
මහත ගුණ පෙන්වා
තමන් දළ මෙත ලොවට දන්වා

426 ලෙසින් සිහිලඹයා
තෙපුලෙන් සතත් පොබයා
පර වැඩ අරබයා
දියතැ සිටුවා දහම් වැඹයා

427 සසරට සතුරුවා
කෙලෙසඳරට මිතුරුවා
සම මෙත් පතුරුවා
දහම් මහ ගඟ ලොවැ උතුරුවා

428 තමන් තම අස්වා
දහම් ජය බෙර ගස්වා
පිරිසුදු පසස්වා
සොඳුරු සග පවග මහ සස්වා

429 දහම් සිතැ පුරවා
නිවන් පුර දොර හරවා
මරු මන් දෙදරවා
තමා තම නිතොර සිහි කරවා

430 සමවත් සුවැ යෙදී
එ සුව සහටන් ගෙනැ දී
මහ කුලුණින් බැඳී
ලෙවන් කළ'මිස පුදෙහි නො බැඳී

431 උස් කැරැ සිල් පවුර
තර කැරැ දහම් කඳවුර
සහ සවු මැති පවර
වෙසේ දම් රජ වැ මුනි එ වෙහෙර

432 ගොතිත් ගෝතම නම්
ගුණෙන් සැදි සම්බුදු නම්
මුළු ලොවැ තමා නම්
මිතුරු කල එ බුදු වැඩියෝ නම්

433 අප ගේ රටැ මෙබඳු
ඇති උවදුරින් මදකුදු
අල පතහි දිය බිඳු
ලෙසින් තො තිබෙයි කී යැ මැති සඳු

434 එ මැතිඳු බස් අසා
නිරිඳෝ වෙමින් සතොසා
යන ලෙසැ තො වැ ලසා
තමන් අතුරින් රජකු විමසා

435 තිලෝ ගුරු මුනිඳුට
වඩනා ලෙසට මෙ පුරට
අයදිනා ලෙසැ එ විට
යව යි බිම්සර නිරිඳු නුවරට

436 බිම්සර රජුට සොඳ
මා ඇගි වත් පඬුරු බැඳ
මහාලී නම් ලද
නිරිඳු නිරිඳෝ යැවූ එ මැ සඳ

437 එ නිරිඳු සඳ එ විට
මහ සෙනඟ පිරිවර කොට
පරසිඳු මගද රට
ගොසින් වැදූ රජගහා නුවරට

338 බිම්සර තුර ඉසුරු
දැකැ රැගෙනැ ගිය විසිතුරු
දක්වා දී පඬුරු
කියා පිළිසඳර බස් පියකරු

439 තම නුවරෙහි පැමැති
ලෙඩ දුක් කියා ඉක්බිති
මුනි වඩනා කැමැති
අඳුත් දක්වා රැගෙනැ අනුමැති

440 දිය හිමි මුනි වෙතට
ගොස් වේළුවන වෙහෙරට
වඩනුව තම පුරට
කෙළේ ආරාධනා මුනිඳුට

441 අසා එ නිරිඳු බස
විමසා නැණින් තතු ලෙස
වන ලෝ වැඩ පිණිස
මුනිඳු දැක්වී වඩන අදහස

442 සමගින් මුනි පවර
පන්සිය රහත් පිරිවර
වඩිති විසල් පුර
අසා බිම්සර නිරිඳු පින්සර

443 වඩන සුගතිඳු හට
මඟ සරහමැයි නිසි කොට
සිතා වැදූ වෙහෙරට
මෙ සේ දැත්වූ එ මුනි සඳු හට

444 හිමි සඳ මෙ පුරැ       සිට
පස් යොදනෙකැ ගං       තෙරට
එ මඟ සරහනු       හට
මඳක් බලව යි කියා       මුනිඳුට

445 යොදන       යොදනතරු
කරවමිනි මහ       වෙහෙරු
බඹ විමනෙව්       සරු
නොයෙක් පුද පෙරහරින්       සපුරු

446 අට ඉස්බක්       දෙපස
මඟ කණු කටු ද සැසැ       පිස
තනා බෙර ඇස       ලෙස
වනා සුදු වැලි අයුරැ සඳ       රස

447 පිරි කුඹු       සුවහසේ
රඹ තුරු සඳ දෙ       පසේ
දණ පමණක්       උසේ
පුරා මහ වත මලින්       සකසේ

448 බඳ පට       වැරැල්ලෙන්
යත ලෙසට       සෙවණැල්ලෙන්
දිලි රන්       කෙහෙල්ලෙන්
සඳ මඟ දිගට මෙ       සියල්ලෙන්

449 පුද පෙරහර       මහත
සිටුවා දෙ පසැ       මහවත
බැඳැ මුදුනතැ       දෙහොත
මුනිඳු වඩනට කලැ යි       දන්වත

450 සිතෑ බිය නොවෑ තොසින්
දක්වන විකුම් වෙසෙසින්
රන් ගිරි ලෙණ ඝුසින්
නිකුත් වන සී රජකු විලසින්

451 එ මුනි සඳ ගමනට
දික් කරන පය දෙරණට
මිහිරු තැගි රුවට
සුපිපි සත් බුමු පියුම් පිටෑ සිට

452 ලා රසිනි රුදු හුදු
බදු වද කුසුම් පට බදු
දෙපට අඳනය මුදු
වඩා තෙ මඬුලු වසා මුනි සඳු

453 බඳින රන් දමිනේ
පබළු කලබක් ලෙසිනේ
බබළන හැම දිනේ
පටී දතුවෙනි බැඳෑ අඳනේ

454 සක්වළ ගිරි අවධා
සිව් සඟ සුනෙර ගිරි පිට
දිය පොළොව හිම් කොට
රුගත් මිහි මඬල කම්පා කොට

455 නුග පල සේ සුරත්
පැකෑයෙන් කරන දිගු බිත්
කිසි කිලුටක් නො ගත්
සුගත් මහ සිවුර ගෙනෑ එ සුගත්

456 රත් පලසෙකින් මෙර
වට කරත මෙන් මනහර
දිලි රන් වන් සිරුර
වසා ගෙනැ පෙරවැ මුනි සිටි වර

457 තුවන් ලද පල විඳ
ලෙවන් තුටු වන ලෙස සොඳ
සවන් සිරිරින් තද
මෙ සේ නික්මිණි සවන් රස් කඳ

458 ඉඳු නිල් මිණි රුසිත්
තවහම් කරන විලසිත්
නික්මුණු නිල් රුසිත්
සැදිණි හැම සක්වල මැ වෙසෙසින්

459 කිණිකිරි පෙති සමඟ
සඳන සපු මල් පෙති රඟ
රන් වන් රස් තරඟ
විඳ දිවැ ගති දියතැ එක රඟ

460 බඳු වද පෙති නිසරු
සඳැ වෙළු සිරි කැරැ දුරු
රත් පැහැ සර සොඳුරු
දිවි රත් කැරැ දියත නිරතුරු

461 තරු වැළු පැහැ පැහැස
කැරැ සඳ රසට අපහස
නිකුත් සුදු බුදු රස
රිදී රස සේ දිවී දස දෙස

462 හැම තැනැ සක්වළේ
සළා ගෙනැ ගෙනැ උතුලේ
ලොව තම පැහැ කෙලේ
මදට වත් රස් කඳක් පතලේ

463 සොඳුරු සිතියම් පට
විදු ලත සේ දිගු කොට
පබසර රස් රැවට
දිවි ලොවැ තවරමින් පිට පිට

464 සක්වළ ගිරි සිරස
පැතැ ගෙනැ පැතිරැ දස දෙස
දිවි සවතක් රස
තඟා හැලි සිය දහස් සුවහස

465 බෙර සිය ගොස කරත
වීණා තාද නික්මෙත
වස් දඬු තද ගනුත
තො පිඹි සක් හඬ දිගත මැඩැ යත

466 මොතරුන් තද කරත
ගිජිඳුන් කුංච තද දෙත
තුරඟුන් හෙසරවත
ගමන් තොවැ රියෙහි සක් හඬ ලත

467 පවතක් මහ පිසිත
පවතක් සුවඳ මල් ලත
පවතක් සම කරත
වලා පොද විසිරැ මල් පොබයත

468 බුදු රස් වැදූ දිගත
තුරු ලිය නොයෙක් පැහැ වත
දියැ ගොඩැ මල් පිපෙත
වරල් විදහා මසුන් ඉපිලෙත

469 අඹි වග සිටැ දිලෙත
පළුන් අබරණ තද දෙත
දිව සෙත් තුඹැ සැදෙත
වුහුටු දිව මල් දෙරණ විසිරෙත

470 උරඟුන් පෙණ විදත
මුවත් පෙම් කෙළැ කෙළැ එත
ළිහිණි ගණ තුඹ පත
පියා විදහා සැදී සිටැ ගත

471 විතරට තම සැපත
සඳු සළු බරණින් ගත
මුනි වඩත මහවත
දෙ පසැ තරයත් අවුත් රැස් වත

472 කණු කටු මුල් ඉවත්
වීමෙන් සිතිඳු ගුණ ගත්
මුනි වඩත මහවත්
දෙරණ බෙර ඇස සේ මැ සම වත්

473 වසා ගෙතැ දිගු බිත්
සුදු නිල් වලා දිවැ ගත්
බඳ වියතෙව් මහත්
දිනිඳු මැඩැ රස් තවත්වත් වත්

474 මුනි දැකුමට මහත්
තුටු පිතිතවුත් වෙතැ පත්
සුර සෙන් තම රැගත්
පසඟ තුරු ඝොස පවත්වත් වත්

475 පිපි තුරු වත මහත්
සොල්වා කුසුම් රද ගත්
සිහිලැල් ගුණ නුමුත්
සුවඳ ගෙනැ මඳ පවන් එන් එන්

476 එකලු කැරැ දිගු බිත්
රුසිරින් දන නුවන් ගත්
සුරඟන සිටැ දිමුත්
සුවඳ සුනු ගෙනැ විසුරුමත් වත්

477 බුදු සිරිරින් නිකුත්
රිවි රස් මකා දිවැ ගත්
බුදු රස් දැකැ දිමුත්
බලා සිටි සෙනඟ වැදැ හෙත් හෙත්

478 මහ රැටි ගණ අබිත්
පිළිවිසැ නිරිඳු මහවත්
සඳනුව වඩා නැත්
බුදුන් වඩිනී කියා යත් යත්

479 සුර පුරයෙන් අවුත්
අතුරු නොවැ නුබැ සිටැ ගත්
බුදු පුදට කළ සිත්
සුරඹ ගණ සුවඳ දුම් ලත් ලත්

480 වුවත් එක සතකුට
වන වැඩ තකා දූරකට
වඩනා බැනෙවිට
නික්මැ ගත් සඳැ මුනිඳු ගමනට

481 මහ බඹ ඉදිරි කොට
නික්මැ යන බඹ පිරිසට
නො හොත් සඳ මඩලට
පසු වැ පෙළ සැදුණු තුරු විලසට

482 සක් දෙව් රජ පෙරට
කැරැ සැදුණු සුර සෙනඟට
නො හොත් මිණි රුවනට
පසු වැ යන මිණි රුවන් වැළයට

483 සදත් ගජ රජ හට
පසු වැ යන ගජ සෙනහට
වෙසෙසින් නිසරු කොට
නිකුත් සඟ ගණ පසු වැ මුනිඳුට

484 රජ දරුවෝ මහත්
ආදර ඇති වැ බලවත්
මුනිඳුට ලෝවග පත්.
තැඟු සේ සත් පිටැ මැ සේ සත්

485 මිනිසත් බවට දිඩ
මෙ මැ යැ යි දනෝ වන වැඩ
සඟ ගණ හට තොකඩ
තැඟු පන්සියයක් මැ සුදු කුඩ

486 දද කුඹ කොඹි ගත්තෝයා
සොඳ ගඳ දුම් ලත්තෝයා
පිත් පල බල දත්තෝයා
මුනි පුදයට වත්තෝයා

487 අතිත් රැගත් කුසුම් දමිත්
සිතිත් රැගත් මුනි සදමිත්
බැතිත් අයෙක් ඇති පදමිත්
තිතිත් මුනිඳු යෙති පුදමිත්

488 රැළී රැගෙනැ හෙත ගිරි පිට
දුළී ගගුල් හැලි විලසට
තිළී අයෙක් මුනි පුදයට
පිළී සිසාරති ඉස වට

489 මුනි පුදයට සතොසේයා
පුද බඩු ගෙනැ එමැ සේයා
ඔද වැඩි සිඳු රළ සේයා
රැස් වෙති මහ දෙ පසේයා

490 තැවැති ගඟක් සේ සිඳු වැද
කැමැති වැ සිටි රජ සෙන් මැද
රුවැති ලියන් සහ ළඳ සොඳ
තටති අයෙක් බහු රූ බැඳ

491 තැණැති දනෝ සිටැ වෙත වෙත
විමති නො වී අදහා ගෙත
කැමැති ලෙඩිත් කව් බැඳැ ගෙත
කියති බුදුන් ගුණ තැනැ තැත

492 තද දුක්දුරැ ලත්තෝයා
සග මොක් සැප දෙත්තෝයා
මොහු මැ වෙතැයි දත්තෝයා
වැඳැ වැඳැ බිමැ හෙත්තෝයා

493 බුදු ගුණ දස දිගැ වීදේ
තුටු වූ සත සිත පැදේ
තො අසත ලෙස අපවාදේ
කෙරෙති පසග තුරු තාදේ

494 අප මුනිඳුන් ගේ අපමණ
ගුණ දැනැ ගෙනැ රැගෙනැ සරණ
බව දුක් වේවයි නිසරණ
දමති අයෙක් පලත් බරණ

495 ලොලා වඩන සිත ලදරු
ප ලා තොයත ලෙස සොඳුරු
ක ලා සපිරි සඳ අයුරු
බ ලා ගෙනැ මැ යෙති මුනි රු

496 මුනි යත මග ගෙනැ පිරිබඩ
ගෙනැ දරුවත් ගෙන් පිරි බඩ
සල්පිල් වේනැ සිටැ ම'ග බඩ
වඩිති ලියෝ සිටි මඟ බඩ

497 වෙ නි ත් වෙත මැ පිපි මල් සිඳ
රෙ නි ත් රෙත මැ ගෙතවුත් සොඳ
තැ නි ත් තැ ත මැ අඟතෝ ලද
වෙ නි ත් වෙත මැ කොලෝ යැ පුද

498 බුදු මහිමය දැකැදූවෝ
නැත සිරි වන සිටැදූවෝ
වැඳැ වැඳැ අත සැතැපූවෝ
නැතැ බුදු බව නො පැතුවෝ

499 දැකැ මුනි රුව රස විත්දේ
වැඳූ වෙතැ සිරි පද වැන්දේ
බව සැපතැයි නොසිඹින්දෝ
තම සිතැ කෙලෙසුන් සිත්දෝ

500 අ ද මදකුත් නොකිළිටියෝ
ම ඳ ළද කිරි බොන පැටියෝ
ත ඳ මුනි රුව දැකැ අටියෝ
බැ ඳ මුදුනත වැඳැ සිටියෝ

501 දෙ ත දතට මැ රට රටිනී
දූ ත තිසි බඹු ගැල් පිටිනී
වෙ ත වෙත රඟ නැව් පිටිනී
ගෙ ත එති සමහරු වටිනී

502 වෙ ත් ප ත් සුරඹුන් නො මැ නරඹත්තෝ
නෙත් සි ත් මුනි රූ රසෙහි තබත්තෝ
ග ත් ග ත් කුඩ කොඩි හැම නො තබත්තෝ
ය ත් ය ත් රජ සෙත් මුනිදු පුදත්තෝ

503 මෙතොවට දිලි මිණි කිරුළු පැලැන්දේ
මෙ ර ව ට ලූ කුල ගිරි සිරි විත්දේ
මු නි ඳු ට වැඳැ මුදුනතැදිලි බැන්දේ
පු ද කොට කැපි වැ මැ යෙති නරනින්දේ

504 ය ත් ය ත් සෙත් මුනි විද්දේ තමිනේ
ග ත් සි ත් යු ත් පුද වද්දේ අතිනේ
කැ ත් ගොත් යු ත් පර සිද්දේ තමිනේ
නෙත් සි ත් ල ත් පල ලද්දේ එ දිනේ

505 දූ න ගෙන මුනි සිරි සෙනඟ බළෝයා
තැ න තැ න මුනි දූකුමට ඔසළෝයා
ම න පි න වන දසනෙහි හසළෝයා
වෙ න වෙ න දෙයකට ලොබ නො කොළෝයා

506 ස ව න කිරණ දුළ මුනි මෙර වැන්නෝ
ච ඩ න එ සඟ ගණ කුල ගිරි වැන්නෝ
ප න න තුරඟ පෙළ සිදු රළ වැන්නෝ
එ ය න සෙනඟ ගොඩැ යන සිඳු වැන්නෝ

507 සු ර පා මෙත් දිළි වෙහෙරින් වෙහෙරු
ස න පා සඟ ගණ සහ මුනි පවරු
පෙ ළ පා ළිය දූනැ කෙරෙමින් අදරු
න ර පා දත් දී පුද කෙළෙ නිතොරු

508 සතොසින් පුද කෙරෙමින් මුනි සඳුටා
තොලසින් ගොස් වැදූ මහ ගං තෙරටා
වෙසෙසින් මුනි පුද කරවන ලෙසටා
මෙලෙසින් දින'සුත් එ විසල් පුරටා

509 අ ප අපගේ බල පමණින් මුනිඳුට
සැ ප සපයා කළ පුද ලැබැ තිසි කොට
සැ ප මිණියේ මුනි සඳ ගඟ මෙ තෙරට
තො ප තොප ගේ බල පමණින් පුද කොට

510 කැ ද වා ගේනැ ගොස් මුනිඳුන් නුවරට
සො ද වා මහ පුද කරවා නිසි කොට
මු ද වා උවදුරු කරව සි සෙත රට
යො ද වා අස්නක් මෙහෙයා එ මැ විට

511 සො ද වා මහ තැව් බැඳැ ගලපායා
සි ටු වා එහි දිලි පෙළ පෙළ පායා
න ද වා සුර පහ සිරි වෙලපායා
ක ර වා දිගු පුළුලැති මහ පායා

512 බ ද වා සුර සිඳු බඳු සුදු වියනේ
අ ද වා වට පට තිර සරහමිනේ
ස ද වා ලඹ ඉඳුවර මල් දමිනේ
සි ටු වා වට රත් වැට මිණි පහනේ

513 කොත් කොත් විලැ මිණි මුතු ලැල් එල්ලා
බ ත් න ත් රත් දද තෙලෙනි වෙවුල්ලා
ග ත් මි ත් පිරිබඩ සුවඳ කලල්ලා
න ත් ව ත් රත් මිණි කිරණිනුදුල්ලා

514 බැ ද රත් මිණි මුතු දිගැ රැස් වනවා
සොද පට ඇතිරිලි මා ඇගි වනවා
ස ද මඩලෙව් පිරි සත සිත පිනවා
මැ ද මුනිඳුට නිසි අස්නක් පනවා

515 බි ම ව ස වා දසමත් මල් ඉස්නේ
වැඩැ හි ඳු වා මුනිඳුන් මැඳ අස්නේ
ව ට හි ඳු වා රහතන් සිත තොස්නේ
සි න පි නවා ලියැ ඉන් බුදු සස්නේ

516 රත් පලසින් වට කළ රත් වැඹ සේ
රත් පියුම්ළු මැදූ පත් රත් නැව සේ
රත් පිළි මිණී මැදූ දිලි ගිනි කඳ සේ
රත් තුරු වැල මැදූ දිසි පුන් සඳ සේ

517 පියුම්ළු වට කළ රත් පියුමක් සේ
පෙති මැදූ වැදූ සිටි කෙසුරු සළා සේ
කෙසුරින් පිරිවැරු රත් කෙමියක් සේ
බබලයි සඟ පිරිවැරු මුනි සොඳ සේ

518 පුළුලත් මිණී කිරුළින් සුරිඳුන්තේ
විහිදෙත් සවණක් රස් මුනිඳුන්තේ
පලබිත් පහ එමැ වැදූ දිලියෙන්තේ
තොකළත් සත් රුවනින් කළ වැත්තේ

519 සොඳවා රත් පලු විදුලි සහස්සේ
බඳවා දද ඉඳු දුනු සුවහස්සේ
වැසුවා මෙත් ගඟ නොවැ සිදුරස්සේ
යොදවා ලීයැ තිසි තැව් පස්සේ

520 මෙලෙසින් සුදමින් නැව් එක රහටා
රජ සෙන් හැම සලසා පිරිවරටා
බසිමින් කර පමණක් ගඟ දියටා
මුනිඳුන් වැදෑ රජ කී මේ ලෙසටා

521 හැම උවදුරු දුරු කැරැ එ රදුන් රට
සම මෙත මුනි වඩනා තෙක් මෙ තැනට
පෙම වඩමින් ඔබ ගුණ සිහි කොටැ කොට
මම නොගොසින් ඉඳිමැයි කී නුවරට

522 ස ග පිරිවර මුනි දකුමට එ කෙණේ
ළ ග දිව් තය් කැල පෙණ කැල පෙනුණේ
ද ග වන මන සුරගන රඟ සැදුණේ
ග ඟ සුදු රත් පිපි පියුමින් සැදුණේ

523 කරනුව ලොවට සෙත
වඩිති අසා එ සුගත
සක්විති රජ සැපත
සැපත් වූ මෙන් සතොස්වා සිත

524 කප් කෙළ සුවහසේ
බුදුනැ යන නම මෙ ලෙසේ
නො ඇසෙයි අප මෙ සේ
සිටිනු නො යෙදෙයි සිනා එ මැ සේ

525 මුනි සඳ වඩින්නේ
සිතැ මෙත් කුලුණෙකින්නේ
මෙ අප නරයන්නේ
මහත් කළ පිනෙකැ පල දුන්නේ

526 අපි යැ දුක් මුත්තෝ
උතුමෝ යැ දුරු ලත්තෝ
බුදුහු යැ වඩින්තෝ
කවුරු පෙර ගමන නො කරන්තෝ

527 එ බැවින් අප වෙතට
වඩනා තිලෝ ගුරු හට
අප ගෙ බල පමණට
කරම්හ යි මහ පුදත් තිසි කොට

528 තුන් සිය යොදුන් රට
නුවරැ උන් දන රැස් කොට
කරන මුනි පුදයට
යොදු මඟ සරහන්ට නිසි කොට

529 අප හිමියෝ අපට
සැරැහූ යැ මඟ නිවනට
එ වැනි සුගනිඳු හට
සඳනු මඟ අරුම කිම මෙ අපට

530 එ පුරෙහි පටන් කොට
තුන් යොදුන ගං අතරට
දමා කඬු මුල් කැට
තනා බෙර ඇස සේ මැ සම කොට

531 වැලි එවැ බිමැ අතුට
රිදී පට සේ සුදු කොට
ඇම තැනැ මඟැ දෙ පිට
පහන් ලා රන් රිදී මිණි වැට

532 බිගු දැල් ගත් මුමණ
සුවඳැ'ති කුසුම් අපමණ
පුරවා මඟ දෙරණ
තනා ඇම තැනැ මැ කැරැ අතරණ

533 තන් පුන් කුඹු තබා
බඹා දිගු කැන් ඔලඹා
සිටුවා රන රඹා
ලඹා මල් කැන් අතුරු නො තබා

534 ඇඳූ පට ව්ට සුඳේ
බැඳැ කේහෙළි රන් කලඳේ
මඟ සරසා සොඳේ
දහස් සත් සත් සියක් තිරිඳේ

535 මිහි වදයෙහි ගඳට
දිවෙන බිඟු මෙන් ඉව කොට
තද ගිම් කල දියට
දිවෙන ගජ සෙන් ලෙසින් විලකට

536 ගැසූ මස් ගොදුරට
දිවැ එන මසුන් විලසට
යාගෙහි කිරි බතට
දිවෙන බමුණන් ලෙසින් එක විට

537 පිරි සත් රුවන් ගෙට
දෙර හළ ද දන් දීමට
ඔවුනොවුන් පසු කොට
දිවෙන දිළිඳුන් ලෙසින් ලොබ කොට

538 තුන් යොදුන මෑ තොසේ
තුන් පියවරින් යන සේ
සමඟැ මහ පිරිසේ
ගොසින් වැදූ ගං තෙරට එ මෑ සේ

539 එන බුදු රස් බලා
පිපෙන මෙන් විල් කමලා
වෙසෙසින් තුටු වැ ලා
නැමඳැ මුනි සිටි දෙසට ඉස ලා

540 මහ පුද සැටැපියෝ
රුසිරින් සුරන් සැපියෝ
බුදු ගුණ දුවැපියෝ
වඩන මුනි දෙස බලා සිපියෝ

541 අහසැ සිටි විදු මෙන්
සුර සෙන් කරන පිදුමෙන්
නැම් සෙනඟ පැදුමෙන්
එ තෙරු සිටි නරනිඳුන් යෙදුමෙන්

542 රස් වතුරේ දුවැපි
තරත් කැරු රත් රූ සැපි
නැව මුනිඳුන් පිහිටි
නිවන් පුර සේ මෑ වුත් ගොඩ දිපි

543 ගල පමණක් දියට
බැසැ නරනිඳුහු එ මෑ විට
නැව ඇදූ ගෙනැ ගොඩට
බුදුන් බාවා ගත් හ එ ගොඩට

544 පිය නිරිඳු සිරසට
මිණි බර කිරුළු විලසට
පත් මල් වට බවට
කාලුදේවල රුසින් මුදුනට

545 කොසොල් රද රද හස
තුටු කළ පිපි පියුම් ලෙස
දනපල් ඇතු සිරස
එ ගෑ කිරි සිදුරු පා පෑ ඇස

546 උසින් තම් හට මැඩි
කෙනෙකුත් නැති කල එඩි
රිවි සඳ කිරණ මැඩි
එ බඳු රු අසුරිඳු ගෙ මත් මැඩි

547 මොලොක් ගුණයෙන් දුරු
ගලට ද තමා සත් දුරු
උදක් සිත් පිත් දුරු
පවා වඳවන නොයෙක් ගිරිතුරු

548 දික් කල හොත් මෙරට
උසුලන නැමී ගෙනැ සිට
සක් ලකුණෙන් ලොවට
රුපෑ සක්විති බව මෑ දිසනට

549 ගලැ වුව එරී යන
පුලුනැ වුව රල තො මඩන
සෑම ලකුණෙන් සොබන
සුපිපි සත් බුමු පියුම් පිටැ යන

550 බඹ සුර නර මුදුන්
විලැ පිපි පියුම් සිරි දුන්
සියුමැලි වන තඳුන්
තබන සිරි පා දෙරණැ මුනිඳුන්

551 බව ගිම් හැරැ එ රට
වස්වන දහම් වැස්සට
සැක දුරු කැරැ ලොවට
පාන පෙර නිමිති සේ එ මෑ විට

552 මුල දුබ්බික් දුකට
තද රිවි කිරණ මැ යෑ බට
එ බැවින් ඒ මෙ විට
වැද්දූ නො දෙමැයි යනු සෙ දෙරණට

553 නිල් පැහැ කවද ගෙන
මහ ගිරි දුදුළු පැතැ ගෙන
මහ සෙන් මෙන් දිවෙන
වසා නුබ ගන අඳුරු කොටැ ගෙන

554 අප මුනිඳු වැඩි දෙස
නො තිබියැ යුතු යැ කුණු රැස
දමව යි කියන ලෙස
පුරා ගෙනැ ගන ගොසින් දස දෙස

555 විදිනට යක් සෙනඟ
දෙවියන් රැගත් දුනු රඟ
ගත් තන් පැහැ තරඟ
සඳ ඉඳු දුනු රැසින් සුර මඟ

556 අප තිම් මුනි පුදට
සිකි තළ රඟන රැඟුමට
හළ මලැඳිලි ලෙසට
සඳ කොක වැළ නැඟෙන අහසට

557 එළි කැරැ විදුලි දළ
පළා ගෙනැ හෙන ගන කුළ
මුනි පුදයට ලකුළ
විදා පත් කරන සේ දිව සළ

558 හිම වත පෙතැ තැඹුළු
ඉපිලැ නැඟි මෙත් හිරි කුළු
අඳුන් කුළු සේ කළු
වසා නුබ පතලේ යැ ගන කුළු

559 වැසි වැසැ වතුරු වියැ
කුණප කුණු හැම දුරු වියැ
එ පුර පිවිතුරු වියැ
එ වරැ හැම තුරු ලිය ද'කුරු වියැ

560 නො හැරැ විල් වාපී
ගං හෝ ද පුරවාපී
මහ ගිම් නිවාපී
සතුන් සිත සතොස කරවාපී

561 තම තම බල පමණ
සෙනඟ සහ මහ රජ ගණ
මුනිඳු සහ සඟ ගණ
පුදැ තත් පුදැ වතින් අපමණ

562 සුර බඹ සෙත් සමඟ
පුද යොදයොදා මතරඟ
සැතැපී අතර මඟ
වූ යැ තුන් දවසෙකින් පුර ළඟ

563 වත මුනිඳු පුර වෙත
පුද කොටැ මර සෙනඟ එත
උන් දුකැ බිය වැ සිත
දිවූ යක් සෙත් නො සිටැ දස අත

564 හැම රෝ දුක් පසුත්
වත යත යකුත් පිසසුත්
මුනිඳුත් බුදු සසුත්
තිසා සුව පත් වැ යත මිනිසුත්

565 පත් මෙත් එ පුර මැද
දහස් සුවහස් රිවි සඳ
දිගු එළි කැරැ එ සඳ
පැමිණැ පුර දෙරට සුගතිඳු සඳ

556 තම හට මෙහෙ පතා
කළ පින් කමින් සැපතා
වෙතැ සිරි නිති පතා
අනඳ මහ තෙරිඳු සඳ අමතා

567 යක් බූ පිසස් කළ
උවදුරු දුරින් දුරු කළ
අණ සක නිති පතළ
නො හැරැ කෙළ සුවහසක් සක්වළ

568 පවතින සත සෙතට
මෙ ලොවැ පස් වා දහසට
කියා පුර පිරිතට
රුවන් මහ සුතුර ඒ තෙරිඳුට

569 මිණි පයැ දිය පුරා
මෙ පිරිත දෙසා සපුරා
එ දිය ඉසැ මෙ පුරා
පිරිත් කරව යි කියා ඉදුරා

570 සිරි සඳැ මුනිඳු සඳ
තිරිඳේ වෙමින් මත තඳ
සිවුරඟ සෙත් නොමඳ
රූගෙනැ එ පුරෙහි යොදූ මහ පුද

571 නොනැගෙන ලෙස රජස
බිමැ නො ගෙන ලෙස රිවි රස
සිතියම් කළ දෙ පස
සොයා මා ඇඟි වනින් තිසි ලෙස

572 ලඹ මල් විදු ලෙසට
සඳ බිමැ සුදු මල් පට
පුර මහ වේ දෙ පිට
පහන් ලා රන් රිදී මිණි වැට

573 පුර පෙරහර සකස්
සැරූ සරහමින් නොසරස්
බුදුන් සඟ සඟ රූස්
ඇතුළු නුවරට වඩා ගෙනැ ගොස්

574 දහස් සිය සත් සත්
තිරිඳුන් ඉඳිත මැති යුත්
දිගු පුළුලැති මහත්
සුරිඳු විජයොත් පායැ සිරි ගත්

575 සුරන් ලෙස මෙරගේ
රන් දද ලෙළෙන පලගේ
නුබැ සිතියම් රගේ
පැතිරි මිණි කොත් කිරණ තරගේ

576 හිර සඳ මුදුනැ දුන්
රන් කිරුළු මිණි සිරි දුන්
සත සිත කළ නඳුන්
නුවරැ මැද මහ පාය නිරිඳුන්

577 සිටි සුර සිඳු සෙ වැද
පිරිසුදු සුදු වියන් බැඳ
දිලෙන රන් තරු මැද
මලෝලඹු මුතු ලැලින් කැරැ තඳ

578 දුරැ ලන ගනදුරු
ගත් රිවි රසෙව් උදුරු
රැගත් තෙත් පැහැරු
අවට රන් පට තිරෙන් අඳුරු

579 සිවු දෑ ගඳ කලල්
පිරිබඩ රැගෙනැ බිමැ තිල්
සිතියම් කළ නිමල්
අනැගි බුමුතුරුණු ලා මත කල්

580 ලෙළ මුතු ලැල් නොමඳ
බඳ සේ සතින් මතනඳ
අසුනක් එ ම්ඬු මැඳ
සඳ වැඩැ ඉඳින ලෙස මුනි සඳ

581 සක් රුවන ලදුවා
ලෙස තම සිත පුබුදුවා
ගුණෙන් පිරිසුදුවා
මුනිඳු අස්නෙහි වඩා හිඳුවා

582 ඉදිරි කැරැ සිතු මිණ
පෙළ සදන මෙත් මිනි ගණ
සත සිත පිය කරණ
වඩා හිඳුවා රහත් සඟ ගණ

583 තම මිණි කිරුළඅගේ
සිලිලින් සරණ කැරැ අගේ
තබා මුදුනත අගේ
මුනිඳු වැඳැ උන්නෝ යැ තිරිදෝ

584 රන් මිණි මුතු පබළු
අබරණ පැළැඳැ සුලකුළු
ඇඳැ තිසි කසී සළු
පසෙකැ උන්නෝ යැ රජ මැති මුළු

585 සව් සතර නිපුණෝ
සුරුදුරු ලෙසින් දපුණෝ
කුල සිරිනැ දමුණෝ
මුනිඳු වැඳැ උන්නෝ යැ බමුණෝ

586 දෙනෙත් සුපිහිටියෝ
සිටු තනතුරෙහි සිටියෝ
යෙසෙන් නොකිළිටියෝ
බුදුන් වැඳැ එක් පසෙකැ සිටියෝ

587 තැනෙකැත් තොලස් වූ
මුනි රූ දකුමැ තොස් වූ
නො කොටැ තැන් හිස් වූ
සෙනඟ මහ වතුරැ සේ රැස් වූ

588 අහසැත් අට දිගැත්
සක්වළ ගිරිත් ඇතුළත්
නො හැර'තුරු මදකුත්
අවුත් රැස් වූ යැ දිව සෙනඟත්

589 සියුම් ඉඳි කටු මූන
පමණක් ඔබා ලන තැන
සැට සැත්තෑ බැගින
එ මුරැ සිවිය හ සියුම් වෙස් ගෙන

590 එ පුර පිරි පිරිවට
කළ තුන් පවුරෙකින් වට
යතිඳුන් ගොස් අවට
පිරිත් පැන් ඉසි සදෙහි මොනවට

591 එ පිරිත් පැන් ඇහට
වැදූ ලෙඩ රෝග එ මැ විට
දුරු වන කිසි නො සිට
නිඳු පුබුදිත ලෙසින් තැගැ සිට

592 දනයෝ එ පුරවර
සැරැහී රැගෙනැ පිරිවර
තෙරිඳුන් සඟ එ වර
ගොසින් වන්නු යැ ඇතුළු පුරවර

593 නුවරුන් සමඟ වැද
මුනිඳුන් සිරි සරණ වැඳ
අනඳ තෙර හිමි සඳ
එ සබ තුළැ එක් පසෙකැ උන් සඳ

594 රැස් වූ මහ පිරිස
වෙත වෙත මැ සිතැ අදහස
යොදමින් තම දිවැස
සොළොස් රහෙකින් බලා තතු ලෙස

595 රැඳි දත් කෙසුරු බර
දිලි දිව් කෙමින් මනහර
පොබයා මුව තඹර
සුවඳ කැරැ මුළු දෙරණ'ඹර තුර

596 සලා මහ දඹ ගස
අවුළා සියලු පල රස
යොදා ගෙනැ අම රස
බෙදා දෙන මෙන් ලොවට තිසි ලෙස

597 දෙරණ පෙරළා යට
මතු කොටැ එ රස රැස් කොට
වැඩි වන මිහි රසට
එ මිහි රස දෙන ලෙසින් ලෙව් හට

598 වන් සවනැ මිහි බිඳු
සත සිතැ අමා රස බඳු
බඹ ගොස කැරැ සිනිඳු
රුවන් මත සුත දෙසන මුනි සඳු

599 බඹ සුර නර එ විට
පැහැදී දෙසූ දහමට
පැමිණිය හ එක විට
සුවාසූ දහසක් මැ නිවනට

600 මෙ මැ සුතත සතියෙක
මුනි සඳු දෙසත ලොව රැක
තුටු සත තිවත් දැක
අටාසූ පත්සියක් දහසෙක

601 මෙ ලෙසින් මුනි ලොවට
පිහිට වැ සිටිය දෙ ලොවට
සැබැවින් ඉත් තොපට
එමුනි මැ යැ පිළිසරණ හැමවිට

602 ඉත් එ බුදුන් වඳුව
උත් ගුණ කඳට පහදුව
උත් සරණට වදුව
ඔවුන් සදහම් අසව පුරුදුව

603 උන් කළ වැඩ සිතව
සසරැ දුක් දැකැ විරතව
උන් දැකුමට පතව
නො ගොස් මිස දිටු කිලුටැ පතිතව

604 පේ වව පෝ දවස
පන්සිල් රකුව දිවි ලෙස
නො කොටැ අකුසල් දස
පුරව නිති පින් කිරිය වත් දස

605 තුන් සිත මැ පිවිතුරු
කැරැ පුද වතින් විසිතුරු
කරව පුද නිරතුරු
දතු දළ ද පිළිම බෝ තුරු

606 හිත අහිත සත මෙත
වඩමින් කුලුණු මෙත් සිත
දෙස සග මොක් සැපත
පවතු මුනිඳුන් දෙසූ පිළිවෙත

607 මෙ ලෙසින් හැම දවසැ
හැම පින් පුරා තිසි ලෙසැ
බුදු වන එත දවසැ
මෙතේ මුනි රජ තුමන් දැකැ තොසැ

608 පුද කෙරෙමින් නොමඳ
බණ'සා උන් සඳුන් වැද
හැම් කෙලෙසුන් පසිඳ
වසව සැනැහී නිවන් පුර වැද

---

609 ස ම තැ ස් මුනිඳු පිරිනිවි වස පවන් ලද
දෙ ද හ ස් පසළොසක් හවුරුදු පිරුණු සඳ
දි ය ගො ස් පැතිරි බුවනෙකබුජ නිරිඳු සඳ
පි රි ව ස් තුනෙහි සිරි ලකැ රජ බිසෙව් ලද

610 දි න දි න නොඅඩු දින පුද පැවැති ය [illegible] මන හර
ද න ම න රඳන සැදි ගෙ උයන් සිරින් සර
වැජැඹෙන පසිඳු මහ රයිගම් පුර අතර
බ බ ල න සොඳුරු වීදගම මහ වෙහෙර

611 කි ත් යස කොත් දස දික් දිගු යටනැ බඳ
මෙ ත් මහ තෙත් පා මුළ මහ තෙරිඳු සඳ
සෙ ත් කළ මුනිඳු සඳු ගුණ කව් පෙදෙන් බැඳ
ස ත් වැඩ පණිස මෙ ද කෙළෙ මෙත් සිතින් තඳ

---

# බුදුගුණ අලංකාර ප්‍රදීපය

## 1. කව් මුව

### 1—9

කව් මුව (කාව්‍ය මුඛය) නම් කවකට පිවිසෙන තැනයි. කතාවට බසිනු පිණිසැ මුල පිරීම එයින් අදහස් කරනු ලැබේ. ජයවද්දන පුර අවදියේ අසුන් කව් කරුවන් මිසැ සෙසු පැදි පබඳ කරුවන් සිය කටයුත්ත පිරුයේ තෙරුවන වැඳැ පුද සුරන් යැදීමෙනි බෙහෙවින් මැ. එ වුවත් මෙ පබඳ කරුවාණෝ තෙරුවන නැමැදීම මිසැ සුරන් යැදීමක් නො කෙරෙති.

### (අ) තෙරුවන නැමැදීම.

ගී තුනෙකින් තුනුරුවන වැඳැ පුද- බුදුන් මුල් කොටැ (මුනි පෙර, බුද්ධ පමුඛ) තෙරුවන නැමැදීමෙන් පුද බුදු ගුණ අලංකාරය කියමි'යි- තව ද ගී දෙකෙකින් පවසා, තව ද ගී දෙකෙකින් තමන්ගේ වැයමේ දුබුල් බව පල කරන පබඳ කරුවාණෝ, දුබුල් බව එ සේ වතුදු පිනට ඇති ආසායෙන් බුදු ගුණ බිඳක් දක්වන බවත්, නැණ ඇත්තවුන් බසැ දෙස් නො ගෙනැ මුනි ගුණ මැ ගත යුතු බවත් තව ද ගී දෙකෙකින් පවසා එ සේ ගී නවයෙකින් කව් මුව සපුරයි.

1. **සත වෙතැ කුළුණු මෙන් නැණ සව් පද්රැතැ පතල, ලොවට සෙත එළි කල මුනිඳු සරණත නිතර නමදිම.**

යන්නෙනි බුදුන් වැඳීම කැරෙන්නේ.

**සරණත නමදිම්.** යනු එහි සැකෙව් වැකිය වේ (සරණත නම් පාද තලය යි) කවුරුන් ගේ සරණත ද (නමදින්නේ) යනු අඟවයි 'මුනිඳු' යන්න. මුනිවරනට ඉදු

(නායක) වූයේ නුයි මුනිඳු (මුනි ඉඳු) යනු බුදුනට නමෙකි. බුදුන් ගේ පා තලය නමස්කාර කෙරෙමි යනුයි ඉන් කියැවෙන්නේ.

(i) 'සත වෙතැ කුලුණු (පතළ) මෙන් සව් පදරුතැ නැණ පතළ යන්නත්,'

(ii) 'ලොවට සෙත එළි කළ'

යන්නත් 'මුනිඳු' යන්න වෙසෙසයි (හෙවත් කෙබඳු මුනි ඉඳු ද යනු පැහැදිලි කරයි).

බුදුන් ගේ කරුණා ගුණය (සියලු) සතුන් කෙරේ පැතිර පවත්නේ වෙයි. එ කරුණා ගුණය (සියලු) සතුන් කෙරේ පැතිර පවත්නා සේ මැ (බුදුන් ගේ) නුවණ සියල්ල කෙරේ පැතිරියේ වෙයි. එ හෙයින් 'සත වෙතැ කුලුණු මෙන් සව් පදරුතැ නැණ පතළ' යනු මුනිඳු යන්නට වෙසෙසුනි.

**සෙත** (ශාන්තිය) නම් දුකින් මිදුණු බවයි. ලොව දුකින් මිදෙන්නේ නිවන් දුටු විටැ යැ. එ හෙයින් ලොවට සෙත එළි කිරීම නම් නිවන් දක්වීමයි. ලොවට සෙත එළි කළ (හෙවත් නිවන් දක්වූ) යනුත් මුනිඳු යන්නට වෙසෙසුනි.

'එ බඳු එ බඳු වූ මුනිඳු සරණත නමදිම්' යනුයි ඉන් පැවැසෙන්නේ. 'නිතර' යනු වදින්නේ කවර විටැ ද යනු සඳහනුයෙන් 'නමදිම්' යන කිරියාව වෙසෙසයි 'නිතර' යනු සියලු විටැ යන අරුත දෙයි.

මුනිඳු = (මුනි ඉඳු)

මුනීන් හට ඉඳු (රජ) වූයේ මුනිඳුයි.

'මුනි' යන්නෙන් මියෙන් නො බැණැ එකඟ සිතින් හිඳිනා උතුමන් සඳහනු සිරිති. 'මෞන ව්‍රතය' (මුනීන් ගේ පැවැත්ම) යන්නෙන් මියෙන් නො බැණැ හිඳීම සැදැ හේ. එ හෙත්:-

'මෞන' යන්නෙන් නුවණ ද සැදැ හේ. එ හෙයින් නුවණින් යුත් වූයේ 'මුනි' යි. ඒ මුනින් ගේ ඉඳු මුනිඳුයි.

'මුනීති මෝනං වුච්චති ඤාණං, යා පඤ්ඤා පජානනා විචයෝ පවිචමෝ සල්ලක්ඛණා උපලක්ඛණා පච්චුපලක්-ඛණා පණ්ඩිච්චං කෝසල්ලං තේ පුඤ්ඤං වේ භව්‍යාචින්තා උපපරික්ඛා භූරිමේධා පරිණායිකා විපස්සනා සම්පජඤ්ඤං පතෝදේ පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං පඤ්ඤාසත්ථං පඤ්ඤාපාසාදේ පඤ්ඤා ආලෝකෝ පඤ්ඤාඕභාසෝ පඤ්ඤාපජ්ජෝතෝ පඤ්ඤාරතනං අමෝහෝ ධම්මවිචයෝ සම්මාදිට්ඨි තේන ඤාණේන සමන්නාගතෝ භගවා මුනි මෝනප්පත්තෝ'යි එයින් කීහ.

'කාමෞනේය
වාක්මෞනේය
මනෝමෞනේය'

යැයි මෞනේය ධර්මයෝ තිදෙනෙක් වෙති.

'අගාරමුනිනෝ
අනගාරමුනිනෝ
සේඛමුනිනෝ
අසේඛමුනිනෝ
පච්චේකමුනිනෝ'

යි සය මුනි කෙනෙක් වෙත්.

(1) යේතේ අගාරිකා දිට්ඨපදා විඤ්ඤාතසාසනා ඉමේ අගාරමුනිනෝ,
(2) යේතේ පබ්බජිතා දිට්ඨපදා විඤ්ඤාතසාසනා ඉමේ අනගාරමුනිනෝ,
(3) සත්තසේඛා සේඛමුනිනෝ,
(4) අරහන්තෝ අසේඛමුනිනෝ,
(5) පච්චේකබුද්ධා පච්චේකමුනිනෝ,
(6) මුනිමුනිනෝ වුච්චන්ති තථාගතා අරහන්තෝ සම්මාසම්බුද්ධෝ'

යැයි සය මුනිහු දැක්වෙත්.

සියලු මුනිනට ඉඳු (රජ) වූයේ මුනිඳු (මුනි ඉඳු) යි.

රූ, අරූ සියල්ල 'පදරුත' (පදාර්ථය) යන්නෙන්අඟව යි

පද පෙළ ගැස්මේ දී යෙදුණු 'වෙතා, පදරුතා' යනු ගී පැදියේ ඇත්තේ 'වෙත, පදරුත' යන පෙරැළි රූවිනි.

ඒ බුදු රුවන නැමැදි හැටියි.

2. **සසරහිම් ලං කැරැ, කෙලෙස් බිය හිම් දුරැ කැරැ සිදු කළ යුතු- උතුම් නව ලොවුතුරු සදහම් වඳිම්.**

ඒ බුදු රුවන නම කල ඉක්බිති දමු (දම්) රුවන නැමැදි හැටියි.

**'සදහම් වඳිම්'** යනු සැකෙවි (කොටින්) වැකි යයි.

(1) සසර හිම් ලං කැරැ කෙලෙස් බිය හිම් දුරැ කැරැ සිදු කළ යුතු.

(2) උතුම්,

(3) නව ලොවුතුරු,

යනු 'සදහම්' යන්න වෙසෙසයි.

මතා වූ දහම (නැත් නම් සුදනන් පවත්නා දහම) සදහම නම් එය (1) සිදු කළ යුත්තෙක්, (2) උතුම් එකෙකි, (3) ලොවින් උතුරු නව පවතෙකින් යුතු එකෙකි.

(1) දහමක් සිදු කිරීම නම් එය වටහා ගැනීමයි (හෙවත් අවබෝධ කිරීමයි). මේ සදහම් ද වටහා ගත යුතු වෙයි මෙ වටහා ගත යුත්තේ සසර හිම් (සංසාරයේ ඉම) ලං කිරීමෙත් හා කෙලෙස් බිය හිම් (කෙලෙස් නිසා ඇති වන බියේ ඉම) ඇත් කිරීමෙනුත් යැ.

සසර නම් ඉපැදීම් නැසීම් විසින් දිගින් දිගට මැ පැවැතීමයි.

'සංසුතපපුතං සරතීති සංසාරෝ'

යැයි ද,

'ඛන්ධානං පටිපාටි
ධාතු ආයතනානි ච
අබ්බොච්ඡින්නං වත්තමානං
සංසාරෝති පවුච්චති'

යැයි ද කියත් සසර අඳුන්වන පෙර ඇදුරෝ.

එහි ඉම (එහා කෙළවර) නිවනයි. ඒ නිසා සසර හිම් ළං කිරීම නම් නිවන ළං කොටැ ගැනීම යි.

කෙලෙස් නම් සිත කිලිටි කරන රා, දෙස් ඈ පව් යැ. එයින් පැමිණෙන බිය නම් සසරැ සැරි සරමින් විඳිනට සිදු වන නිරැ දුක් බියයි. එහි ඉම නිරයයි. එය දුරු කිරීම නම් නිරැ දුක් ඈත් කිරීමයි .

නිවන් ළං කිරීමෙනුත් නිරැ ඈත් කිරීමෙනුත් තේරුම් ගත (අවබෝධ කළ) යුත්තෙකි මේ සදහම.

'සිවු අවයේ හෙන සතුන් එහි නො හියැ දී දරනුයේ දහමැ' යි:-

'චතූසු අපායේසු පතමානේ සත්තේ අපතමානේ කත්වා ධාරේතීති ධම්මෝ'

යනු පවසයි.

සපුරිස් වූ බුද්ධාදීන් ගේ දහම් සදහම් යැ.

බුදුනුවන් දහම තමදිනත් එය වේදිතව්‍ය මිසැ පූජිතව්‍ය නො වේ.

'.........පච්චත්තං "වේදිතබ්බෝ" විඤ්ඤූහී'ති යි පැවැසෙනු එ හෙයිනි.

'සුනාථ, (අසව)
ධාරේථ (දරව)
චරථ' (සරව)

යැයි දහමට කළ යුත්ත දැක්වේ. ඒ අවිදුවනට විෂය නො වන බව:-

'පඤ්ඤවතස්සායං ධම්මෝ, නායං ධම්මෝ දුප්පඤ්ඤ-වතස්ස' යැයි බුදුහු මැ වදළ හ.

(2) එ හෙයින් ඒ **'උතුම්'** එකෙකි.

(3) ලොවින් උතුරු (එහා) යි සදහම. එ හෙයින් එය ලොව පිළිබඳ (ලෞකික) නො වේ. ලොවින් එහා නිවනයි. එ හෙයින් ලෝ උතුරු (ලොව්තුරා) සියල්ල නිවන් පිළිබඳ වේ. ඉන් මොබැ ලොව පිළිබඳ (ලෞකික) වේ.

සෝවාන්,
සෙදගැමි, (සකෘදගාමි)
අනගැමි (අනාගාමි)
රහත් (අර්හත්)

යන සතර මඟ යැ, එ මැ සතර ඵලය යැ යන අටත් නිවනත් නව ලොවුතුරා සදහම් වේ.

**3 කිසි කෙනකුන්, පමණ නො කළ හැකි ගුණ ඇති, අපමණ සත හට පිළිසරණ, අරී, සඟ ගණ අදරින් වඳිම්.**

සදහම් නම කළ ඉක්බිති (හෙවත් දම් රුවන නැමැදි පසු) සඟ රුවන් නම කළ සැටියි ඒ

**'සඟ ගණ වඳිම්'** යනුයි එහි සැකෙවි වැකිය.

(1) කිසි කෙනකුන් පමණ නො කළ හැකි ගුණ ඇති,
(2) අපමණ සත හට පිළිසරණ,
(3) අරී,

යනු 'සඟ ගණ' යන්න වෙසෙසයි.

(i) අදරින්, යනු 'වඳිම්' යන්නට වෙසෙසුන් වැ සිටී.

සඟ ගණ නම් (බුදුන් සවු) පැවිදි උතුමන් වැළයි.

මේ සඟ ගණ (මෙ තෙකැයි) කිසි කෙනකුන් හට පමණ කොටැ නො කියැ හැකි මහ ගුණ කඳක් ඇතියෝ යි, (එ සෙයින් මැ) මෙ තෙක් දෙනා හට යැයි පමණ කොටැ නො දැක්වියැ හැකි සතුන් මහත් රැසකට පිළිසරණ වැ සිටිනෝ යැ, අරී ජනයෝ ද වෙති.

අරි (ආර්ය = උතුම්) යන්නෙන් සිවුරින් මතු සැදුණෝ නො සැඳැහෙති. සතර මහට, සතර ඵලයට පත් උතුමෝ මැ වෙති අරි සඟ ගණ

'සුපටිපන්නෝ
උජුපටිපන්නෝ
ඤායපටිපන්නෝ
සාමීචිපටිපන්නෝ
ආහුනෙය්‍යෝ
පාහුනෙය්‍යෝ
දක්ඛිණෙය්‍යෝ
අඤ්ජලිකරණීයෝ
අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං'

යන ගුණ ඇති 'සතර මඟ සතර ඵලයට පත්' (චත්තාරි පුරිස යුගානි) පුඟුලෝ අට දෙන (අට්ඨ පුරිස පුග්ගලා) වෙති 'අරි සඟ ගණ'.

'ආර්ය අෂ්ටාංගික පුද්ගල මහා සංඝරත්නය' නම් ඒ අට අරි සඟණ.

එ අරි සඟ ගණ වඳින්නේ සිතේ ඇල්මෙන් බව 'අදරින්' යන්නෙන් ඇඟැවේ.

කළ හැකි, ගුණ ඇති, යනු ගීයේ ඇත්තේ 'කළැකි ගුණැති' කියායි.

එ සෙයින් තෙරුවන නැමැදී ගත් කරුවාණෝ එ බව ද සඳහමින් තමන් කරන දූය තව ද ගී දෙකෙකින් සඳහති.

(ආ.) කටයුත්ත සැඳැහීම

4. **බව සිඳු පසුරු වන්, අව බිය අඳුරු හිරු වන් මහ රුවන් මුනි පෙර තෙරුවන් මෙ සේ නම කර පුද-**

('බුදුගුණ අලංකාරය කියමි' යන මී ළඟ ගීයේ සිවු වන පිය හා සබඳි)

'බව' නම් සසරයි. තෙරක් නැති සසර, තෙරක් නැති සයුර (සිඳු) වැනිනුයි 'බව සිඳු' (සසර සයුර) යන්නෙන් ඒ හැඳෑගේ.

සයුරින් එතෙර වීමට පිහිට වන්නේ පහුරයි. බවයෙන් (සසරින්) එතෙර වීමට පිහිට වනුයේ මුනියි එ හෙයින් මුනි තෙමේ සසර සයුරින් එතෙර වීමට පහුර වැනියි. (වන් = වැනි).

('සංසාර සේතු' යනු පූජාවලී කාරයෝ නිති කියති)

අව බිය (අපා දුක් බිය) අඳුරු බඳුයි. අඳුරු නසන්නේ හිරුයි. අව බිය නසන්නේ මුනියි. එ හෙයින් මුනි තෙමේ අව බිය නැමැති අඳුරු නසන හිරු වැනියි.

මුනි තෙමේ රුවනෙකි. මුනිඳු හට වැඩි රුවනක් නව ද නැතියෙන් එ තුමා මහ රුවනයි

සසර සයුරට පහුර වැනි වූ ද, අපා බිය නැමැති අඳුරට හිරු වැනි වූ ද, මහ රුවන වූ ද, මුනි පෙරටු කොටැ ඇති තුනුරුවන මෙ අයුරින් නැමැදීමෙන් පුද- (බුදුගුණ අලංකාරය කියම් යන්න හා සබඳ කරන්නේයි)

5. **කය නම් අසාර යැ, බව නම් බයංකාර යැ, දිවා රැයැ, කියනුව බුදුගුණ අලංකාරය කියම්.**

**'බුදු ගුණ අලංකාරය කියම්'** යනු මෙහි සැකෙවි වැකියයි. ඒ කුමට කියම් ද?

කය නම් අසාර යැ (යි ද), බව නම් බයංකාර යැ (යි ද) දිවා රැයැ (දවාලේත් රැයෙත්) කියනුව (බුදු ගුණ අලංකාරය කියම්)

මේ බුදුගුණ අලංකාරයේ සඳහන් වන විසල් පුරේ තුන් බිය සලකන කය නම් ගත යුතු සාරයක් නැති එකෙකැයි ද, බව (හෙවත් සසර) නම් බියකුරු එකෙකැයි ද දිවා රැ දෙකේ කියන්නට සිදු වේ.

(කයෙහි නිසරු බව මෙ හිමියෝ ලෝවැඩ සඟරායෙහි වෙසෙසි දක්වති. 52 44)

'අසාර යෑ, බයංකාර යෑ, දිවා රුය, යනු ගීයේ ඇත්තේ 'අසාර ය, බයංකාර ය, දිවා රයෑ, යන්නෙනි.)

'දිවා රුය' යනු යවහන් (ය ව හ න්) නිසා 'දිවාරය' යැයි සැකැසීම අසබාසි.

(ඇ) නැණැතියන් අයැදුම

එ අයුරින් තමන් කරන දූය සඳහන් කළ පබඳ කරුවාණෝ එ කටයුත්තේ බරත්, තම නැතෙහි දුබුල් බවත් පළ කෙරෙමින් බස ගැනැ නො සලකා මුනි ගුණ මැ සිතට ගන්මින් එ අසන සේ නැණ ඇතියන් හට ඇරියුම් කෙරෙති.

'මුනි ගුණ වෙනුවෙන් බසැ දෙස් ඉවසන්නැ'යි කීමෙකි ඒ.

**6. පෙරු මහ කිවිවරන් (පවා) පවසා පර තෙර නො පත්. සුගතිඳු ගුණ ගැඹර නොබා කියමියි මා මෙ වැර සැර සිතනු-**

ආදි (= ඉහතැ සිටි මහ කිවි උතුමන් (පවා) කියා එ තෙරට නො පැමිණි (අවසනක් නුදුටු) මුනි උතුමා ගේ ගුණ-යෙහි ගැඹුර කියමි යි මගේ මෙ එඩි නො බා සිතීම-

**'වැරසැර'** (=වීර සාරය) යන්නෙන් නො බිය බව අඟවයි. **සුගතිඳු** යනු 'සුගත් ඉදු' යි බිඳී සිටී.

**7. සුවාසූ දහසක් යොදුන් ගැඹුර ඇති මුහුදක් උදක් ගොඩ කොෂරමි යි දවසක් ලෙහෙනු කළ තැත් වන්නැ.**

අසූහාර දහසක් (සිවූ අසූ දහසක්) යොදුන් ගැඹුර ඇති මුහුදක් 'ගොඩ මැ කෙරෙමි' යි දවසක් ලෙහෙනු කළ උසා වැඩීම (වැයම) වැනියි.

**ගැඹුර ඇති** යනු ගීයෙහි **'ගැඹුරැති'**යි සිටී.

මේ සඳහන් වූයේ **'කලන්දක ජාතකයේ'** කතා පුවතයි.

## ලෙහෙනු කළ තැත් වැන්නැ

යට ගිය දවසේ ලෙහෙන දෙමහලු කෙනෙක් මුහුදු තෙරැ ගසෙකැ කදල්ලක් කොටැ ගෙනැ පැටියන් වඩමින් සිටියෝ යැ. දවසෙකැ මාං පිය ලෙහෙන දෙ මහල්ලන් අහර සොයා බැහැරැ යා දී දැඩි සුළඟෙක් හමා බැසැ පැටියන් සහිත ලෙහෙන කදල්ල බිමැ හෙළී යැ. වෙරළ මතැ හුණු ඒ කදල්ල රළ පහරට අසු වැ මුහුදු වැදී දියඹට ඇදී ගියේයි. එ කෙණෙහි එහි පැමිණි ලෙහෙන දෙ මහල්ලෝ තම දරුවන් කදල්ලෙන් මැ මුහුදු බත් වැ නස්නා සේ දක්මින් බිමැ හැපි හැපී වලපිත්නට වූ. දැඩි දරු සොව දුරිය නො හැකි වූ පිය ලෙහෙන් තෙමේ පැටියන් දියේ ගැලෙන්නට පළමු එ සා මහ මුහුදු දිය කද ඉසැ උන් ගලවා ගනිමියි කළ නො පසු බස්නා දැඩි අදිටනින් මුහුදට පැනැ වලග මුහුදු දියෙන් තෙත් කොටැ ගොඩට පැනැ වලගැ රැඳුණු එ දිය ගසා දමා යළි මුදට පැනැ වලග දියේ ගල්වා ගොඩට පැනැ එහි රැඳුණු දිය ගසා දමමින් එ පිළිවෙ- ළින් මූද ඉසීමේ යෙදුණේ යි. උගේ ඒ දරු සොව නිසා වූ නො පසු බස්නා වෙර උපදවා බට කිරියායෙන් සක් දෙව් රජු ගේ පඬු ඇඹුල් සලසුන උණු වූයේයි. කරුණු කිමැයි ලොව බැලූ සක් දෙව් රජ තෙමේ දරු සොවින් තැවෙමින් මූද ඉස්නා ලෙහෙනු ගේ ඒ කිරියාව දැකැ පැටියන් සහිත ලෙහෙන කදල්ල ගොඩට ගෙනවුත් තිබා ලෙහෙනු ගේ විරිය පසසා ගියේයි. ඒ ලේනා අපේ බෝසත් තුමා යි.

(කලන්දක දුව පන්සිය පණස් ජාතක පොතේ ඇතුළු වැ නැති)

8. **එ තෙකුදු වත් නො මදින් පිනක් සොඳින් පුරමි මුනිඳු ගුණ මුහුදින් බිඳක් උදක් ඔසැඳින් දක්වමි.**

එ තෙකුදු = එ තෙක් දු (එ තරම් දු)

එ සේ ද වන නමුත් මඳ නො වන පරිදි පිනක් සොඳ සේ පුරාගනිමි යන සිතින් බුදුන් ගේ ගුණ සාගරයෙන් බින්දුවක් හුදු මහත් තොසින් දක්වමි.

බුදුන් ගේ ගුණ සයුරක් සේ අනන්ත වෙයි. එයින් මා දක්වන්නේ බින්දුවක් පමණයි. ම ගේ මේ කිරියාව ලේනකු සයුර හුදු ගොඩ බිමක් කිරීමට තැත් කළා වැනි චෙතස් මා මෙය කරන්නේ මහත් පින් පුරා ගන්නා කැමැත්තෙනි. බුදු ගුණ බිඳක් දැක්වීම ද මහත් පිනක් පිරීමට කරුණුයි. එ හෙයින් මා බුදු ගුණ මහ මුහුදින් බිඳක් දක්වන්නේ හුදු මහත් සතුටිනි.

**9. නුවණැතියෙනි, මා මෙ බසැ දෙස ඇතත් එ දමා, පමා නො වැ දෙ සවන් පුම නමා මුනි ගුණ'මා ගනුව.**

නුවණ ඇත්තෙනි, ම ගේ මේ බසෙහි වැරැදි ඇතත් එ (පැත්තකට) දමා පමා නො වී දෙ කන නැමැති (කොළ) ගොටු යොමු කිරීමෙන් බුදු ගුණ නැමැති අමාව (අමෘතය) ගනිව්.

එ ද ත් වියත් වහර කෙලෙසන්නවුන් ගැරැහුම් ලද බව මෙයින් පළ වෙයි. බසෙහි වියත් වහර මට නුහුරු වෙතත් මට හැකි වහරින් මා කියන්නේ බුදු ගුණයි ඒ නිසා 'මා ගේ බස් වහරේ දෙස් ඇතත් එ ගණන් නො ගෙනැ ඉවතැ ලා "අප්පමාද පදයෙන්" යෙදී බුදු ගුණ අසව්' යැයි බුදු ගුණයට මුවා කොටැ වැරැදි වහර නො හමු කැරැවීමේ පෙරැදු ගත් කරුවන් නැමුණු බවෙක් මින් පෙනෙයි.

ආදි අවදියේ:-

'හඟිම් **මං මෙනෙන්** (මහ මානයෙන්)
ගුණ හිමියා කියන්නට
පොහොම් **නෙළුඹැසිනවුණං** (නෙළුම්දඹු හුයින් අවුණා)
පළදුන් හොත් **තුසර හර** (පිනි බිඳු ඇට පොට)
ඉතිදු **හොතෙ කියම** (හොත් එ කියම්)
ගුණ ලොබිනි ලෝ හිමියා
මෙතෙහි වරද නො බජව්

ගුණෙකැත් තම් මෙහි බජව්' (ගුණෙක් ඇත්තම්......) යැයි මුව දෙව් ද කව් කරවා කියේ ද මෙවැත්තෙකි.

'ඉත් මුනිඳු සිරිතිත්
රුදී ම බසමා සතතිත්
නුවණැතියෙනි බැතිත්
බිබි තුටු වව් සවත් දේතිත්'

යන ගුත්තිල ද කව් කරු ගේ ඇරියුම ද මඳක් මෙයට සරියි.

'නුවණැතියෙනි, ගුණමා' යනු 'නුවණ ඇතියෙනි, ගුණ අඹා'යි බිඳී සිටී.

## 2. විසල් පුර වැනුම්

10—35

ගී තවයෙකින් කව් මුව පුරලා ඉක්බිති කතා පුවතට බස්නා පබඳ කරුවාණෝ පුර වැනුමට බස්මින් විසල් පුර පවත් මහ ඉහළින් පවසති.

10. **සගැ සිරි අසාලා කල අයුරු සාලා සොඳුරු, සිරින් සුවිසාල, විසාලා (යි) පවර නුවරෙක් වී.**

සගෙහි හෙවත් දෙව් ලොවේ සිරි අසාලා – ඒ අයුරින් – කළා වැනි වැ හල් හෙවත් ශාලා මතා වැ ඇති, සැපතින් ඉතා මහත් වූ, විශාලා යන නම ඇති උතුම් වූ නුවරෙක් වූයේ යි.

මෙ නුවර දෙව් ලොවින් බට භාගයක් වැනි යැයි පූජාවලි කාරයෝ ද කියති.

විශාලා නුවර උතුම් එකෙකි. එහි සැපත් ඉතා මහත් යැ. එහි ඇති හල් මහත් වේ. එ හල් දෙව් ලොවේ (හල්හි) හැටි අසා කළා වැනියි (දෙව් ලොවේ ඇති පසිදු හල සුදම් සබා මඬුවයි).

'**සුවිසාල**' යනු ගීයෙහි ඇත්තේ 'සුවිසාලා' කියා යි.

මෙ නුවර විසල් නම් වූ පරිදි පූජාවලිකාරයෝ මෙ සේ දක්වති:-

'එ කලැ එහි නුවරක් තිමවා එ කුමරුවා සොළොස් හැවිරිදි කලැ රජ කොටැ එ කුමරිය අග මෙහෙසිත් කළහ. ඒ ලිච්ඡවීන් දෙ දෙනා මෙසේ ප්‍රිය වාසයෙන් වසන කලැ ප්‍රථම සංවාසයෙහි මැ ඒ ලිච්ඡවි කුමාරිකා දරු ගබ් ලදින් දුවක හා පුතකු හා එක විටැ මැ වැදූහ. මෙ සේ මැ දූත් පුතුත් බැගින් යමක දරුවත් සොළොස් වාරයෙකැ දෙ තිස් දෙනකු වැදුව. මෙ සේ මැ ක්‍රම ක්‍රමයෙන් සොළොස් සොළොස් යමක දරුවන් ලදින් දරු මුනුබුරෝත් වැදූ හ. මෙ සේ ඒ වංශය බොහෝ වූ වූ සේ ගම අවකාශ නැති හෙයින් මහත් මහත් වැ ගවුවක් සා වි යැ. දෙවන වාරයෙහි දෙ ගවුවක් සා වි යැ. තුන් වන වාරයෙහි තුන් ගවුවක් පමණ වටා මහ පවුරු ලා මහා රජ නුවර වි යැ. මෙ සේ කලින් කලැ විශාල විශාල වැ ගිය හෙයින් විශාලා මහ නුවර යැයි මෙ නම් ප්‍රසිද්ධ වි යැ.

× × × × ×

මේ දශ විධ වූ සෝභාවෙන් මැ එ නුවර විශාල වූ හෙයිනුත් විශාලා මහ නුවර යැයි නම් ලද හෝ යි කියාත් සිතමි. විශේෂ වූ විශාල ශාලායෙන් අලංකෘත වූ හෙයිනුත් විශාලා නමැයි කියාත් සිතමි. දහස් ගණන් උද්‍යානවලැ විශාල වූ ශාල වෘක්ෂ, රජ සමූහයන් විරාජමාන හෙයිනුත් විශාලා නමැයි සිතමි.'

11. **සත් සමුදුර අගල, සත් ගිරි පවුරු වට කළ, උදුල සක් පුර මිසැ එ පුර සරි පුරෙක් සක්වළැ කො ද?**

(සීදන්) සයුරු සත තමැනි අගළින් ද, (කුල) ගිරි සත තැමැති පවුරින් ද වට කරන ලද්දා වූ, උදුලත සක් පුර මිසැ එ පුර බඳු (අනෙක්) පුරෙක් වේ නම් ඒ සක්වළැ කවර තම් එක ද?

මෙ සක්වලේ මෙ පුරට සරි වත්තේ සක් දෙව් රජු ගේ පුර පමණයි. සෙසු කෝක වත් මේ හා සරි නො වේ (ආදි) පුරක් අගළ පෙළින් හා පවුරු පෙළිනුත් වට කරනු ලැබ පැවැතියැ යුතුයි.

මෙ පුර අගළින් වට වූයේයි, පවුරින් වට වූයේයි. මහ මෙර මුදුනේ ඇති සක් පුර ද අගළින් හා පවුරිනුත් වට කරනු ලැබැ පවතී. එය වට කළ අගළ නමා සීදත් සයුරු ගන, පවුරු නමා කුල පවු සත. සීදත් සයුරු සතින් ද කුල පවු සතින් ද වට වූ සක් පුර පමණයි මේ විසල් පුරට සරි වත්තේ මෙ සක්වලේ.

යුගන්ධර, ඊශධර, කරවීක, සුදර්ශන, නේමින්දර, විනතක, අශ්වකර්ණ යැයි සත් කුල පවු පිණිසැ වෙසෙස් නම් ඇතත් ඒ පවු අතරේ ඇති සීදත් සයුරු පිණිසැ වෙසෙස් නම් නැති.

'පෙර සුර පුරට පවුරෙව් මෙර වටා සිටි
යු ග ඳු ර පටන් අඩෙකින් එකිනෙකට මිටි
ස මු ද ර තරඟ සෙමෙරට ලූ කිරණ මිටි
ම න හ ර රුවන් සත් කුල පවු වළලු දිටි'

යැයි 'ගුත්තිල ද කව් කරුවෝ ද කුල පවු සක් පුරට පවුරු සේ සිටිනා බව කිහ. 'පෙර'සුර (පෙරැ අසුර) 'පුර' නම් දූත් සක් පුර යි.

'මෙර ගිර සර ලකළ කළ දල විලස් ලද
යු ග ඳු ර පටන් දිසි සත් කුල ගිරි පෙළ ද
එ හි න ර' තර සුසැදි සීදත් සමුදුර ද
පු ර ද ර සමහැ ගොස් දූකැ එ තම සිතු ලෙද'.

යැයි අලගියවන්න මුකවෙට්ටි රාලහාමියා ද කුල පවු හා සීදත් සයුරු හා සඳහති.

12. **වෙන වෙන දෙසින් සැපැමිණි පබළු, මුතු, මිණි බබලන, සැහැ ගිනිණි නොයෙක් සල් පිල් සියෙන් සුසැදිණි.**

(එ පුරය) වෙත වෙත රචිත් පැමිණියා වූ පබළු, රත්, මුතු, මිණි (යන දූය) බබළන්නා වූ, පැහැය ගැවැසී ගත්තා වූ නොයෙක් විදියේ සිය ගණන් වෙණෙඳ පිළිත් මතා සේ සැදුණේ වෙයි.

එ පුරේ බඩු තිබා වෙණෙඳහම් කරන නත් අයුරු පිල් තල (සල් පිල්) ඇති. එ පිල් මතැ වෙණෙඳහමට තිබූ, පබළු, රත්, මුතු, මැණික් යන දූය වෙයි. එ දූය එ පුරේ උපන් බඩු නො වේ, වෙණෙඳහම් පිණිසැ වෙත වෙත රටින් පමුණුවන ලද දූයයි. එ දූයේ පැහැයෙන් එ සල් පිල් ගැවැසියේ වෙයි. එ අයුරු සල් පිල් සිය ගණනින් එ පුර සැදුණේ වෙයි.

'පට පිළි, දේවාංග, රත්රන්, රිදී, මුතු, මැණික් ආදි නොයෙක් සාර වස්තුවෙන් පරිපූර්ණ යැ' (බුත්:).

ආදි 'පිළ' (පීඨය) යනු අද වහරේ පිල් යැයි සිරී. එහෙත් 'පිළ' යනු මැ පෙනේ මහ වියතුන් ගේ වහරේ.

13. **ගන රන් කොත් පැළැඳි, බිතු සිතුවමින් සිත් බැඳි, මිණි පහ පැහැ විහිදි කො වෙ, මා වෙ සියෙන් සිය සැදි.**

වෙ තම් වීදියි කොවෙ කුඩා වීදි, මාවෙ මහ වීදියි. ඒ පුරය (විසල් පුර) කුඩා වීදි, මහ වීදි සිය ගණන් ගැවැසීමෙන් සැරැසුණේ වෙයි. ඒ පුළු, මහ වීදි මිණි පහ (මැණික් බිතුයෙන් බැඳි මහ මැඳුරු කෙරෙන් නික්මුණු) පැහැය විහිදී සැදුණේ වෙයි. ඒ මිණි පහ හෙවත් මැණික් යොදා කරන ලද මහ මැඳුරු, බිතු මතැ කරන ලද සිතියමින් (දනන් ගේ) සිත් බැඳි ඒවායි. පියැසි මුදුනේ ගන රනින් කරන ලද කොත් හා පළඳවන ලද ඒවායි. අද රන් අලෙව් දී කරන රන් කොත් පළඳවනු වෙනුවට එ දා ගන රනින් කරන ලද කොත් යැ පළඳවන ලද්දේ.

14. **පුර වැසියන් තිළි නියැළි කෙළි කෙළින මෙන් පුර අඹර දද, රැසින් බැබැළි ඉන් ඉන් වෙළී කෙළී.**

(එ විසල්) පුරේ වසන දනන් (දුක් නැතියෙන් සතුටට පැමිණ) වෙසෙසින් ඇලී (හෙවත් ඔවු නොවුන් වැලඳැ ගෙනැ) කෙළි කෙළින්නා සේ පුර අහසේ දෙ පා කොඩි (ඉන් ඉන් විහිදෙන) රැසින් බබළමින් එකිනෙක එකිනෙකින් වෙළෙමින් කෙළී.

එ විසල් පුරේ දනෝ (දුකක් නැතියෙන්) තොස් වෙති. පුර අහසේ දද ඉන් ඉන් නික්මෙන රැසින් බබලයි. පුර වැසියෝ නියැළෙති, හෙවත් වෙසෙසින් ඇලෙති. පුර අහසේ දද ඉන් ඉන් වෙළේ. පුර වැසියෝ කෙළි කෙළිති. පුර අහසේ දද රඟ පාන්නා සේ සැලෙයි. 'දද' නම් දෙ පා (දෙ බළ) කොඩියි.

'පුරැ අඹරැ' යනු පැදියේ ඇත්තේ 'පුරඹරැ' කියා යි.

15. **සුර පුරැ දෙවියන් ලෙසින් මනහර රූසිරි සර මහ සෙන් එ නුවරැ උරයෙන් උර පැහැරැ නිතර සිටිති.**

දෙව් පුරේ දෙවියන් මෙන් සිත් ගන්නාසුලු රූ සැපතින් සරු වූ මහ සෙන් එ පුරේ උරෙන් උර ගැටෙන සේ ළං ළං වැ නිබඳ සිටිති.

මෙහි '**මහ සෙන්**' යන්නෙන් පුර වැසියන් නො වැ බලාමේ පුහුණු පා බල සෙබළ මුළ ගත් බවයි පසුවට පැවැසෙන පවත් අනුවැ පෙනෙන්නේ.

'**සුර පුරැ, පැහැරැ, නුවරැ**' යනු ගීයෙහි ඇත්තේ **සුර පුර, පැහැර, නුවර**, යැයි එළි වැටට යෙදී යි.

16. **සෙණ හෙන සේ කිපෙන, තවසුන් ලෙසින් නික්මෙන, හැම රුපුසෙන් දිනන, මහත් ගජ සෙන් තැනැ තැනැ සිටිති.**

ඒ කීයේ සිවු රඟ සෙන් අතුරින් ඇත් (ගජ) සෙනඟ ගැනැයි. (එපුරේ) තන්හි තන්හි මහත් වූ ඇත් සේනාවෝ සිටිති. උඹ තුමූ හෙණ වැටෙන්නා (හෙණ ගහන්නා) සේ වහා කිපෙන්නෝ යැ, (යළි) තවසුන් සේ (නිවී) කීකරු වන්නෝ යැ, සියලු සතුරු සෙන් (පරදවා) ජය ගන්නෝ යැ.

'විනීත කම්න් තපස්වීන් වැනි වූ, කෝපයෙන් අශනිපාතයන් සේ තොවලකා ගත හැක්කා වූ ......හස්තීන් ගේ' (බුත්:).

'තැතැ තැතැ' යනු ගීයේ ඇත්තේ 'තැතැ තැත' කියා යි.

**17. පස් දහරේ හසළ, සිරුරේ කිසි දෙස් නො වැකි එ පුරේ නිති යන එන තුරග සෙන් සයුරේ තරග වැනි (යැ).**

එ පුරේ තිබඳ වැ මැ අස් සේනාවෝ යති එති, එ අස්හු පස් අයුරු වූ ගමනේ පුහුණු වූවෝ යි. ඔවුන් ගේ ඇගේ කිසිදු දෙසක් (අව ලකුණක්) ගැවීත් නැති. ඔවුන් යත එන විටැ පෙනෙන්නේ මූදේ ගසත රළ මෙනි.

'ප්‍රකෘතියෙන් කිසි දෝෂයක් නැත්තා වූ, පඤ්චධාරායෙහි ඉතා ශික්ෂිත වූ, එ පුරු සම්පත් නැමැති මහා සාගර මධ්‍යයෙහි බිඳෙන්නා වූ රළ සේ අනවරතයෙන් දිවෙන්නා වූ, පතන්නා වූ අශ්වයන් ගේ...' (බුත්:).

**යන එන = යනෙන**

**දහර** නම් ගමනයි. **පස් දහර** යනු අසුන් ගේ ගමන් විදි පසක් හැහැවීමට යොදනු ලැබේ.

අඩි ගමන, සෙල්ලම් ගමන, හැල්ම, බලු හැල්ම, දිග පිනුම යනුයෙන් මෙහි ගම් වැසියෝ ගමන් විදි සඳහති. දඹ දිවේ අසුන් හික්මවන්නෝ:—

ධෝරිත, වල්ගිත, ප්ලුත, උත්තේජිත, උත්තේරිත යැයි ('පස් ධාරාව) සඳහති. පසු වැ සඳහන් දෙක වෙනුවට ආස්කන්ධිත, රේචිත යත නම් දෙක යොදති. කිසි අස් ඇදුරෙක්.

**18. බන් රන් දෙදෙන් පැහැපත, සක් සන් දිගත ගත් රත සෙන් එ පුරු රජ මහවතැ නිතර විතර වනු නැතැ.**

**එ පුරු රජ මහවතැ** (ඒ පුරේ ප්‍රසිද්ධ මහ පාරේ) **නිතර රත සෙත්** විතර වනු නැතැ (**නිබඳ** මැ රිය **සෙත්-මෙ පමණැයි-ගණන් පමණ** වීමෙක් හෙවත් ප්‍රමාණයක් වනු නැති) යනුයි සැකෙවින් කියැවෙත්තේ.

(1) **බත් රත් දෙදෙන් පැහැ පත** (බඳිනා ලද රත් දද නිසා පැහැ පත් වූ),

(2) **සක් සත් දිගත ගත්** (රෞද්‍රයෙන් තඟිනා හඬ දිසා කෙළවරට ගියා වූ) යනු රිය වෙසෙසනුවට යෙදිණි.

'නඟන ලද ධ්වජ පතාක ඇති......නොයෙක් රථයෙහි චක්‍රනාදයෙන් නිරන්තර වැ' (බුත්:)

**'එ පුරු'** 'මහවතැ' යනු පැදියේ 'එ පුර, මහවත' යැයි යෙදී ඇති. දිගත (දිගු අත) නම් (දස) දිශා අන්තය හෙවත් කෙළවරයි.

19. **සුර තුරු මෙන් කැමැති දෙය යදියනට නිති දෙනා, ලොවැ පරසිඳු, පින් ඇති නොයෙක් මහ සල් කුලන් ගෙන් යුති.**

(එපුර) බොහෝ මහ සල් කුලන් ගෙන් යුතු වේ. ඒ මහ සල් කුලවත්හු පින් ඇත්තෝ යැ, ලොවේ පසිදු වූවෝ යැ, ඉල්ලූ දනන් හට (ඉල්ලු ඉල්ලූ දෑය) නිතින් දෙත්තෝ යැ. ඔවුන්, ඉල්ලූ දනන් හට උන් (ඉල්ලූ දනන්) කැමැති දෑය දෙන්නේ සිතූ පැතූ සැපත් දෙන දෙව් තුරු මෙනි.

මහ සල් (මහා සාර) කුලෝ නන් පත් ධනය ඇති පොහොසත් වෙළෙඳ දනෝ යි.

'පින් ඇති' යනු 'පිනැති'යි පැදියේ ඇති.

20. **සුර අඟන සිරි ඉසිලු වර අඟන කෙළිනා සඳලු-ලිය ගි කාන්තලු. නරඟ රඟ මඬුලු ඉමෙක් නැති.**

(එ පුරෙහි) සුර අඟනන් ගේ (හෙවත් දෙව් ලියන් ගේ) පදවිය ඉහිලූ වැදූගත් ගෑනුන් (එනම්, උතුම් අඟනන්) සෙල්ලම් කරන සඳලු (තල) ඇත්තේ යි. (එහි) ලය නො සිඳැ ගයන ගී කත ඇදූ ගන්නාසුලු යි (හෙවත් කනට මිහිරියි). එ හෙයින් අනඟ රැඟුම් මඬුලු (එහි) ගණනට සීමාවෙක් නැත්තේයි.

සඳලු (සඳ අලු) නම් සඳ එළිය වැටෙන පරිදි කළ මහල් තල යැ. ලය, නම් ගීයේ කැටි ගැයැවෙන කාල සීමා යැ. 'තරඟ' නම් අනඟා යි.

සැඳැල්ලේ කෙළිනා ලියන්ගේ රුවත්, ගැයුමේ මිහිරත්, අනඟ රඟ පහළ කරනු අසිරි යැ?

'තන්හි තන්හි, ගෙහි ගෙහි, දොරු දොරු, දේවාලයයෙහි දේවාලයයෙහි නටන්නා වූ ස්ත්‍රීන් ගේ නාට්‍යයෙන් පුරුෂ-යන් ගේ සිත් ගන්නෝ යැ, පුරුෂයන් ගේ නෘත්‍යයෙන් ස්ත්‍රීන් ගේ සිත් ගන්නෝ යැ...' යනු බුත්සරණයේ එන සැටියි.

'සුර අඟන, වර අඟන' යනු 'සුරඟන, වරඟන' යැ යි පැදියේ ඇති.

21. (i) **ඇම තැනැ ඇති සැපත් එක තැනැ මැ වූ සිරි ගත්** (ii) **දූකැ දූකැ රිසි නුමුත්**

**එහි,**

**නැතැයි යන සම්පතෙක් නැත්.**

සියලු තන්හි ඇති සම්පත් එක් තැනැට මැ වූ හැටි ගත්තා වූ, දූකැලා දූකැලා ඇති විමක් නො වන එහි (එ නම්, ඒ පුරේ) නැතැ කියන සැපතෙක් (ලොවේ තව කොහි හෝ) නැත්තේ යි.

එහි නැති දූයෙක් නැති, ලොවේ සියලු තැනැ ඇති සම්පත් එහි ගොඩ ගැසී ඇති හෙයිනි.

වීදගම හිමියෝ:-

'මුළු ලොව්‍ැ ඇති සැපත්
සැපත් තත් මෙත් තෙවුනා
මත හදනා මහ දනා
රඳන සිරි සර මෙ පුරේ' යි.

හස් අස්නේ ද මෙ වැන්නක් සඳහති.

22. නන් වෙස්, නන් බරණ, අපමණ සැපතින් පිරුණු තරුණ වයසෙහි සිටි නර ගණ මෙ තෙකැ යි කෙ සේ යෙත් ද?

නො සෙක් විදියේ ඇඳුම් ඇති, නොයෙක් විදියේ පැළැඳුම් ඇති, පමණ කළ නො හැකි සේ බොහෝ වූ සම්පත්තින් පිරුණු, තුරුණු වියේ සිටිනා වූ මිනිස් සමූහයා මෙ තෙක් ඇතියි (දනෝ) කෙ සේ කියත් ද?

එහි දනෝ බොහෝ වෙති, මෙ පමණ ඇතියි කියන්නට බැරි පමණට බොහෝ වෙති, ඌ තුමූ තුරුණු වියේ සිටිනෝ යි, ගණින් හෝ පමණ හෝ නො කියැ හැකි පරිදි පිරුණු සැපත් ඇත්තෝයි, ඌ නො එක් අබරණ ලා සැදෙත්තෝ යි, නොයෙක් හැටි ඇඳුම් ලා සැදෙත්තෝ යි.

'සියලු දේශයෙහි සමෘද්ධි සාරය තාක් එක් තන්හි මුළු වූවාක් සේ අසෝ වස්තුව මෙහි තැතැයි නො කියන පරිද්දෙන්......' යනු බුත්සරණ වදන යි.

"වෙස්' යන්නෙන් අඟවන ලද්දේ ඇඳුම් ලන හැටියි.

23. සිහිල් දිය පිරුණු, පිය ගැට පෙළින් දිලුණු, තිඟු දූල් විසුරුණු පියුම් පොකුණු තැනැ තැනැ වි යැ.

(එ නුවරේ) තන්හි තන්හි මනඑම් පොකුණු වූයේයි. එ පොකුණු සිසිල් වූ දිය පිරුණු ඒවායි, (පොකුණට බස්නා) පඩි පෙළින් දිලුණු ඒවායි, (රෝනට බස්නා) මී මැසි සමූහයා දූල් දිග හැරැ දූමුවා සේ විසිරී ගිය ඒවා යි.

'......පියුම්හි මී බී මත් බමර පිය රැවින් මධුර වූ, අනවරතයෙන් පිපි සිටිනා පස් වනක් පියුම් ඇති,...... නොයෙක් පොකුණකින් හා විලින් ගැවැසී ගත්තේ යැ' යනු බුත්සරණය කියන හැටියි.

24. **දෙපින් දෙරැ-රන් කෙහෙලි, නලැ අඹල මිණි කිකිණි මුතු ලැල් බන්, රන් වැට පහන් දිලි, දන් දෙවන දන් හලි.**

(එ නුවරේ) **ගෙ** දෙරක් ගෙ දෙරක් පාසා දන් **දෙවන** දන් හල් යැ. එ දන් හල් සුළගේ ඇඹැරුණු රන් කෙහෙලි සහිතයි. මැණික් රසු ද, මුතු ලැල් ද බඳනා ලද ඒවායි, රන් පහන් බබළන්නා වූ ඒවායි.

එ නුවරැ මිනිසුන් තම තමන් ගේ මැඳුරැ දෙර අසැ දන් හල් ඉදි කොටැ ගෙනැ දන් දෙවන බව එයින් පැවසිණි. සුළඟට ඇඹැරැවුණු රන් කෙහෙලින්, මැණික් රසු (මිණි ගෙඩි) ත්, මුතු ලැලුත් රන් වැට පහනුත් සැදැහුණේ එ දන් හල් සරසා ඇති සැටි සලකවන්නට යි.

කේලි නම් කෙසෙල් පත් වැනි කොඩියි. රන් වන් වතින් කරන ලද හෙයින් රන් කේලියි. ලැල් නම් පියැයි අගැ, ඇඳ වියන් අගැ සැරැසිල්ලට බඳනා පබළු, මුතු ඈ දූය අවුණමින් දූල් කමින් නිමවන පුළුල් පටි යි.

'නලැ අඹළ' යනු **'නලඹල'** යැයි ගැළැපේ. 'ලැල්' යනු පැදියේ ඇත්තේ **'ලැලි'** කියා යි.

**'දන් දෙවන දන් හල්'** යනු 'බණ කියවන බණ මඩු' යන්නට වෙනස් නොවේ. **එ හෙත්:-**

'බසැ දෙස ඇතන් එ දමා' (9)

මුනි ගුණ අමා ගන්නට නො වැ පබඳ කරුවාණන් කියේ? අපි එ මැ කරමු.

25. **අසුර සෙන් තරමින්, පණ අත් අරමින්, රුපු මන් උපුරමින්, අවි සරමින් තැනැ තැනැ සරන මහ සෙනඟැ.**

අසුර සෙන් පමණින් (හෙවත් සෙයින්) පණ අතට ගෙනැ, සතුරන් ගේ එඩිය උදුරා, අවි සරම (හරඹ) යේ සෙදී තැනැ තැනැ හැසිරෙන මහ සෙනඟ යැ.

මෙහි 'මහ සෙනඟ' යනු සෙබළු මුළු පිණිසැ යෙදූ බව සෙනගේ ලකුණින් පෙනේ. අවි සරම, රුපුන් මන් උදුරා ලීම, පණ අතට ගෙනැ (හෙවත් දිවි නො තකා) සැරීම සෙබළන් මිසැ පුර වැසි මහ දනා අයත් නො වේ.

දිවි නො තකා සටන් කිරීමෙහි නම් දූරුවෝයි අසුරයෝ. 'අත් අරමින්' යනු **'අතරමින්'** යැයි ද **'සෙනග යැ'** යනු 'සෙනඟැ' යි ද ගැළැපේ.

26. **තිමද ගිලි ගිජිඳුන් බන් රන් ඇකිලි තබා නො හැකිලි තුරඟුන් ලෙසින් තන් තන්හි කෙළිත බිහි අලි කුල යැ.**

තුන් මද ගලන්නා වූ ඇත් රජුන් (තමන්) බඳිනා ලද රන් ඇකිලි තිබා ඇකිලි නැති අසුන් සෙයින් තැනැ තැනැ කෙළනා විටැ, බැහැරින් (මී) මැසි සමූහයෝ යි.

ඇකිලි නම් දම් යැ.

ඇතුන් ගේ මද සුවඳට මී මැස්සන් එතියි යෙති.

වදුරති සිරි රහල් හිමියෝද,

'ගිජිඳුන් සත් මදේ
සත්පත් කුසුම් සුවදේ
නො මැ හැඳිනැ ඇවිදේ
බමර මුළු විඳි වෙහෙස නොමදේ'

(කා. සේ. vii. 18) යැයි.

'මමන මද තද රෙත්
ගනසා සන්දල දුමත්
දඹැත් කැල සන්හිඳුවා
සගසක් වැ ළෙන් නැරුඹු'

(97) යනු සසද කාවේ එයි.

තිම ද (තුන් මද) මෙසේ සඳහති උමංද කාරයෝ:-

......දෙ කපෝලය හා කෝෂය යන **තුන් තැනින්** වැහෙන්නා වූ එක් මදයෙකින් ද, යථෝක්තස්ථාන තුන හා දෙ කන් සිදුර හා දෙ ඇස් සිදුර හා යැයි යන **සප්තස්ථාන-යෙන්** වැහෙන්නා වූ එක් මදයෙකින් ද, එ මැ සප්තස්ථානය හා දෙ නාසාපුටය හා ගුද මාර්ගය යන **දශස්ථානයෙන්** වැහෙන්නා වූ එක් මදයෙකින් දැ යි මෙසේ ගිලිහෙන්නා වූ තුන් මදයෙකින්......'

'රන් ඇකිලි' යනු රනැකිලියි ද, 'කුල යැ' යනු 'කුලි' යි ද පැදියේ (සත්හි වී) යෙදී ඇති.

27. **සියල් විදු දැනැණෙනැ, උන් උන් හට පිළිමල් වෙමින් රු දවල් කියන වෙන වෙන නොයෙක් විදුහල් සැදිණි.**

සියලු විද්‍යාවන් දැනැ ගෙනැ ඔවුනොවුන් හට තරක් වී රෑ දවල් දෙකේ (පාඩම්) කියන්නා වූ වෙනස් වෙනස් වූ නො එක් විද්‍යා ශාලා සැදුණේ වෙයි.

බුත්සරණය කියන්නේ:-

සත්ගුරුන් ගේ උපදේශයෙන් මනා වැ පවත්නා වූ ක්ෂුද්‍රවිද්‍යාවන් හා මහා විද්‍යාවන් ගේ පැලැඹුම් ඇති නොයෙක් විද්‍යා ශාලා ඇත්තේ යැ' කියා සි.

විද්‍යා නම් සිප් සතර යන දෙකයි. සිප් පුරුදු වියැ යුත්තේ යැ, සතර හදළ යුත්තේ යැ.

උන් උන් හට' යනු '**උණුනම**' යැයි පැදියේ සිටී.

28. **දෙර දෙරෙහි රන් තොරණ මිණි කිරණ විහිදි, සිරින් පිරි ඉතිරි එ පුර දෙරණ නිති සතොස කරණ යෑ.**

දෙරක් දෙරක් පාසා (ඇති) රන් තොරණේ මැණික් කැල්ම විහිදියා වූ, සම්පතින් පිරී ඉතිරී ගිය එ පුරේ බිම නිතර සතුටට කරුණු (හේතු) යෑ.

'කිරණ, තොරණ, දෙරණ' යනු උනු මත් පුරනු පිණිසැ 'කිරණ ය, තොරණය, දෙරණ ය' යි පැදියෙහි යෙදී ඇති. 'කරණ යෑ' යනු ද එළි නිසා 'කරණය' යි යෙදී ඇති.

'ම ත හ ර සුවඳ විහිදෙන තිසි දසනුදස
හැ ම ව ර සුසැදි විසිතුරු සල් පිල් සගස
පි ය ක ර ලියන් උන් විඳැ ගී නැටුම් රස
බි හි දෙ ර සියෙන් සිය සැදි පුර වේ දෙ පස

පි ළි න් පි ල සැදුණු මිණි කිකිණි. දිදුලිය
ප ළි න් ප ල අඹර පවනඹල කෙහෙළිය
කු ළි න් කු ල රුවන් රස් විහිදි කැරලිය
පෙළින් පෙළ උදුළ පහ අඳුරු දුරලිය

දෙරින් දෙරැ පසඟ තුරු සිඳු ගොස රඟ ය
ස රි න් ස රැ නඟන ලිය ගී මනරඟ ය
ක රි න් ක රැ ලෙළවි රස් විදෙන තරඟ ය
උ රි න් උ රැ පැහැරැ නිති සරන සෙනඟ ය

උ ය න් වතු කමල් විල් අවට උදුලිය
රු වි න් බැබැලී සුරඟන අයුරු පියලිය
ලෙව න් සතුටු වන සව් සිරි මැ ඉසිලිය
මෙයින් මෙ පුර පුරඳර පුරැ සිරිසිලිය

(හංස 23-26)

යන වැනුම පෙන්වන්නේ මේ (20, 22, 24, 28,) වැනුමේ මූ කළ මුහුණුවරෙකි.

29. **එකි රිය සක්හි සක් හඬ සතුරන් නිහඬ කැරැ සයුරැ රළ ගළ ගත් හඬ ලෙසින් දස අත මැඬැ වැජැඹෙයි.**

එ පුරේ රිය සමූහයේ රෞද්‍ර හඬ සතුරන් නිශ්ශබ්ද කරවා මුහුදේ රළ සමූහය ගත්තා වූ හඬ සෙයින් දස දිග මැඬැ ලා (හෙවත් දස අතේ සෙසු හඬ යට පත් කොටැ) පවත්තේ යි. 'දස අත' යනු **'දසත'** යැයි යන්ධි වැ සිටී.

එ පුරේ රිය සක්හි සක් හඬ සතුරන් නිහඬ කිරීමැයි කියේ මෙ රිය සමූහයේ සක් (රෞද්‍ර) හඬ ඇසෙත් මැ සතුරන් ඉන් මැ බිය පත් වැ නිශ්ශබ්ද වීමට යි.

30. **හය මිණි කිකිණි ගිගිරි කුර රොන් සමගැ පුර දෙරණතැ පිරී ඉතිරී දිගතැ පැතිරී ගොස් පවතී.**

අසුන් ගේ මැණික් රසු ගොස, කුර ගැටීම නිසා නගිනා දූලි සමඟැ (එක් වැ) පුරේ බිමැ පිරී ඉතිරී දිගුන් කෙළවර තෙක් පැතිරැ ගොස් පවත්තේයි.

(අසුන් ගේ මිණි කිකිණි ගොස පුර දෙරණේ පිරේ, පිරී උතුරා යෙයි. උතුළ එ හඬ දිගුන් කෙළවරට මැ පැතිරැ ගොස් පවත්තේයි. අසුන් ගේ කුර ගැටීමෙන් නගිනා දූලි ද එ සෙයින් මැ පුර දෙරණේ පිරී ඉතිරී දිගුන් කෙළවරට පැතිරැ පවත්තේයි).

(25, 26, 29, 30, යන පැදි 15, 16, 18, 17 යන පැදි සමගින් සසඳා බලනු යෙදේ, වැඩියෙක් පෙනේ දැ යි දක්නට)

'දිගු අතැ' යනු පැදියේ ඇත්තේ 'දිගතැ' කියා යි.

31. **පසඟතුරැ නාදේ ගජ සෙන් කුංච නාදේ සමඟැ තුති නාදේ. එ පුර දිව රැ එකා නිනාදේ.**

පසඟ තුරැ නාදය, ගජ සේනාවේ කුංච නාදය සමඟැ තුති නාදය වෙයි. (එ නිසා) එ පුරැ දවාලේත් රැයේත් ඒකා-නිනාදය (ඒක කෝලාහල) යැ

පස් අඟ තුරු නාදයත් ඇත් සේනාවේ කුංච නාදයත් සමඟැ තුති නාදයත් දිවා රැ දෙක්හි වෙයි. එ හෙයින් දිවා රැ දෙක්හි ඒක කොලාහල වේ.

**නාදේ = නාදය.**

**පසඟ = පස් අඟ.**

අතත, විතත, ආතතවිතත, සුසිර ඝන යැයි පස් අඟ තුරු දක්වේ. එක් තල තූර්ය අතතයි, උභය තල තූර්ය විතතයි. සර්වප්‍රකාරවතද්ධ තූර්ය ආතතවිතතයි. පිඹිනා තලා සක් ආදිය සුසිරයි. තාලම් තැටි ඝනයි. අදත් මේ පස් අඟ තුරු ගොස පන්සල් වැසියන් කෙරේ අමුත්තෙක් නො වේ.

32. **එව! කාව! බොව! යන තෙපුලෙන් ඇම තැන පිරුණු එ පුර ඇම තැන ඉසුරින් උතුරු කුරු දිවයින වැන්නැ.**

එන්නැ! කන්නැ! බොන්නැ! යන වදන් බිණීමෙන් සියලු තැන් පිරී ඇති එ පුරේ සියලු තන් සම්පතින් උතුරු කුරු දිවයින වැනි යැ.

**වැන්නැ** = වැනි යැ.

උතුරු කුරු දිවයින නම් සතර මහ දිවයිනින් එකෙකි. එහි සතට සව් සැපත් සැපැයෙන්නේ, යිතු පැතු දූය එළවන කප් තුරුවලිනි. එහි වැසියෝ යක්කු වූ.

'මේ මධුරාහාර අනුභව කරව, මේ මධුර වූ පානීයය බොව යි. මෙ සේ හඬ ගහන වචනයෙන් සා පිපාසා ඇත්තවුන් ගේ කන්හි දරිද්‍රිය හරනේ යැ'

යනු මූත්සරණ වදති.

33. **සුරන් පහ සදිසි, සත් රුවන් බිතු සිය දලි, රජ මහ පහ සත් දහස් සත් සිය සතක් ශැවැසි යැ.**

(එ පුරේ) රජ මහ පහය, එ නම් රජුන් වසන මහ මැදුරු සත් දහස් සත් සිය සතෙක් ගැවසියේ වෙයි. ඒ රජ මහ පහය සිය ගණන් බිතු සහිත යි එ බිත් සත් රුවනින් කොටැ ඇති. එ හෙයින් දිලෙන්නේ යැ. එ රජ මහ පා සුරන් ගේ හෙවත් දෙවියන් ගේ මැදුරු හා සම වැ පෙනෙයි.

'සදිසි' යනු පැදියේ 'සදිසිය' යැ යි යෙදී ඇති. 'ගැවැ සි යැ' යන්න ද ඇත්තේ 'ගැවැ සිය' යනුයෙනි.

සත් රුවන් හැටියට රන්, රිදී, මුතු, මැණික්, වෙරළු, පබළු, දියමන්ති යන සත ඇදුරෝ සඳහති එ හෙත් රන් රිදී දෙක රුවන් හැටියට දැක්වීම සුදුසු වන්නේ ද යනු සලකා බැලියැ යුතු.

තව රුවනෙහි දී රන් රිදී දෙක නො ගැනේ.

**34. දෙවියන් ලොබ වන තරම් සව් සිරිනි සැදි, පුර වැසියන් කෙළින එ පමණ පොකුණු ගෙ උයන් සැදිණි.**

දෙවියන් ගේ සිතේ ආශාව වැඩෙන පමණට සියලු සිරින් තැනුණු, පුර වැසි දනන් කෙළනා එ පමණ (එනම් හත් දහස් හත්සිය හතක්) පොකුණුත් ගෙවතුත් සැදුණේ වෙයි

'සැදි' යනු පද පිරුම් විසින් 'යන්' යන්නක් ද සහිත වැ **'සැදියන්'** යැයි පැදියේ යෙදී ඇති.

**35. නිරිඳුන් උන් උන් වෙතැ පැහැදී පෙම් බැදී, සැදී ඉඳිනෙන් බියෙන් මෙන් එහි කිසි දුකෙක් නො වදී.**

රජුන් ඔවුනොවුන් කෙරේ පහන් සිතින් පෙමින් බැදී සැදී සූදානම් වැ ඉඳිනා හෙයින් බියෙන් මෙන්, එහි (එ නම් එ පුරට) කිසි දුකෙක් නො වදී.

එක් සිත් වැ සූදානමින් සිටීම රුපුන් ජය ගැන්මට ඇවැසි වෙයි. මෙහි රජුන් එ සෙයින් සූදානම් වැ සිටිනා නිසා ජය නො අත් වනු දන්නා හෙයින් බියේ මෙන් එහි කිසි දුකෙක් නො වදින්නේයි.

(මෙහි නිරිඳෙ නම් පාරලිමේන්තු කරුවෝ යි. විසල් පුරේ පැවැත්තේ සමූහ ආණ්ඩුවෙකි).

'උන් උන්' යනු 'උනුන් යැයි' සන්දි වී සිටී.

## 3. ලිච්ඡවි රජුන් වැනීම

36—76

සවිසි පැදියෙකින් විසල් පුර වැනුම් කළ පබඳ කරුවාණෝ ඉක්බිති වැ එක් සාලිස් පැදියෙකින් එ පුරේ රජුන් පසසිමින් වැනුමක් කෙරෙති.

36. **රු දෙවෙහි නිතොරු මිණි පහ පැහැය පැතිරු ගන අඳර දුරු වන, ලොවැ සව් සිරි සපිරි එ පුරේ.-**

රූ දුවල් දෙකේ තොරක් නැති වැ (හෙවත් තිබඳවැ මැ) මැණික් (බිතු ඇති) මැඳුරු පැහැය පැතිරීමෙන් ගන අඳර දුරු වන, ලොවේ ඇති සියලු සැපතින් සම්පූර්ණ වූ ඒ (විසල්) පුරෙහි-

නිතොරු, පැතිරු, ගන අඳර, යනු ගීයේ ඇත්තේ **'නිතොරේ, පැතිරේ, ගනඳරේ'** කියා යි. 'ලොවැ ඇති' යනු 'ලොවැති' යි සන්දි වෙයි.

37. **සත් දහස් සත් සිය සත්, සම ගොත් නරනිඳුහු සත් වග කෙරෙහි මෙත් යුත් වැ මැදහත් සිතින් පවතිත්.**

සම කුලයේ, සත් දහස් සත් සිය සත් රජහු සත්ත්ව වර්ගය කෙරේ මෛත්‍රී ඇති වැ මැදහත් සිතින් පවතිති. මෙත් (මෛත්‍රී) නම් දරුවනට මෙන් ඇති සනාව යි.

'එහි වාරයෙන් වාරයෙහි රජ කරන රජ දරුවෝ සත් දහස් සත් සිය සත් දෙනෙකැ. ඔවුන් වසන්නා වූ එ තෙක් මැ ප්‍රාසාද ඇත්තේ යැ 33. එතෙක් මැ කූටාගාර ඇත්තේ යැ. එතෙක් මැ පුෂ්පාරාම එළාරාම ඇත්තේ යැ. එතෙක් මැ පොකුණු ඇත්තේ යැ.' 34 (බුත්:)

38. **දුසිරි සිත නැවැති, රජ නීති දත්, ගුණ ඇති, මැදහත් ලෙසැ පැවැති එ රජ ලිච්ඡවි නිරිඳු නම් වෙති.**

එ රජහු තුමූ 'ලිච්ඡවි නිරිඳු' නම් වෙති. ඒ රජුන් ගේ දුශ්චරිත සිත නැවැත්තේ වෙයි. උඟ තුමූ රජ නීති දත්තෝ යැ, ගුණ ඇත්තෝ යැ. (පසකට නැදී) මැදහත් වැ පවත්නෝ යි.

ලිච්ඡවී රජුන් ගේ උපතත් ඔවුන් 'ලිච්ඡවි'යි නම් ලද පරිදිත් මෙ සේ වදූරති මයූරපාද පිරිවෙන් හිමියෝ:-

'ගිය දවසැ බරණැස් නුවරැ බ්‍රහ්මදත්ත රජු ගේ අගං මෙහෙසිත් බිසොවුන් කුසැ දරු ගබෙක් වියැ. එ බිසොවු කුස බර වූ සේ දැනැ රජ හට කීහ. රජ්ජුරුවෝ දරු ගබ් මඟුල් කොටැ ගබ පෙරහර තබා දුන් හ. මෙ සේ මහත් වූ සත්කාර ලදින් දස මසක් ගිය කලැ එ බිසොවු දවසෙකැ අලු යම් වේලෙහි ලා රෙසෙන් තෙත් වූ බඳු වද මල් දමක් සේ ඉතා සුරක්ත වූ මස් වැදූල්ලක් වැදූ හ. "සෙසු බිසෝවරු රන් පිළිම සේ දරුවන් වදති. අග මෙහෙසිත් බිසොවු මස් වැදූල්ලක් වැදූ හ යි රජු ඉදිරියෙහි සිටැ කියා බොහෝ දෙන මා ගේ නුගුණ කියන්නාහු යැ"යි බිසොවු ලජ්ජා ඇති වැ ඒ මස් වැදූල්ල තවමූ සැළියෙකැ ලා, පිධානයෙකින් වසා බැඳැ, රාජ මුද්‍රිකාවෙන් ගස් ඔබා දිය නො වදිනා සේ ලා කඞින් මේ කොටැ ගඟ දියෙහි ලැවූහ.

'එ වේලෙහි එ දරුවන් ගේ පින් බලයෙන් ගඟ අරක් ගත් දෙවියෝ රළ පහරින් වේවයි, දණ්ඩෙකින් වේවයි, ගලෙකින් වේවයි සළාවෙකින් වේවයි එ සැළට අන්තරායක් නො දී ආරක්ෂා ගෙනැ "බරණැස් රජ්ජුරුවන් ගේ අග මෙහෙසින් බිසොවුන් දරුවෝ යැ"යි රන් පතෙහි දැ හිඟුලෙන් ලියා සැළ මතු පිටැ බැන්ද හ. ඉක්බිත්තෙන් මෙ සේ ඒ භාජනය නො නැසී මැ දෙවියන් ගේ ආරක්ෂාවෙන් යටි ගං බලා යෙයි.

'එ සමයයෙහි එක් තාපස කෙනෙක් ගව පාලයන් වසන ගමක් නිසා ඒ ගං බඩ පන්සලක් කරවා එහි වාසය කෙරෙති. ඒ තාපසයෝ එ ද උදසනැ දැවැටි කන නිසා ගං තොටට බැසැ ගං මධ්‍යයෙහි එන ඒ සැළ දැකැ දියෙන් යන පාංශුකූලයෙකැයි දිය පිනා ගෙනැ ගොස් සැළ අල්වා ගෙනැ බලා රත් පතැ ලියා තුබූ අකුරු දැකැ "මේ දරු මලෙකැ, කුණප ගතියෙකුත් නැතැ, බරණැස් රජු ගේ දරුවෝ යැයි පතැ ලියා තුබූයේ. රැකැ තබමි"යි සිතා ලා පන්සලට ගෙනැ ගොස් සතා සතුන් නො වදනා සේ ක්ෂේම කොටැ තුබූ හ. දවසින් දවසැ බලත් බලත් පසළොස් දවසක් ගිය කලැ ඒ එක මස් වැදූල්ල දෙකක් වී බෙදී ගිය. නැවතැ පසළොස් දවසක් ගිය කලැ එකී එකී මස් කැටියෙහි දෑත යැ, දෙ පය යැ, ඉස යැයි පස් පස් පළක් සේ පෙනී ලා පසු වැ දෙ තුන් දවසක් ගිය කලැ දෑස යැ, දෙ නාසා සිදුරු යැ, දෙ කන් සිදුරු යැ, දෙ කන යැ, මුඛය යැ යන අවයව හා මල වටන් දිය වටන් තව දොර පෙනී විසි ඇඟිලි විසි නිය ආදී වූ සටහන් අට ගෙනැ රන් පිළිම සේ කුමරියක හා කුමරුවකු හා දෙදෙනෙක් වූහ.

'එ දරු දෙදෙන දුටු වේලෙහි තාපසයනට දරු ප්‍රේම හටගත. එ කෙණෙහි තාපසයන් ගේ දෑතැ දස ඇල්ලෙන් කිරි ධාරා වැගිරෙන්නට පටන් ගත. ඇඟිලි දරුවන් මුඛයෙහි තබා ලූ වේලෙහි මවුන් තනයැ එලී ගෙනැ කිරි බොන දරුවන් සේ එ දරුවෝ දෙදෙන තාපසයන් දැකැ ඔවුනොවුන් පරයා එලී ගෙනැ තලු ගස ගසා කිරි බොන්නාහු යැ. දරුවන් ගේ පිනින් තාපසයන්ට ද එ තැන් පටන් බාද්‍ය භෝජ්‍ය සුලභ කොටැ ලැබේ මැ යැ. මෙ සේ වැඩෙන දරුවන් අනුභව කළ යම් මැ භෝජනයෙක් දූවාණ කරඬුයෙකැ තුබූ වස්තු-වක් සේ බඩ යටැ පෙනේ මැ යැ. මෙ සේ එ දරුවෝ, අනුභව කළ කළ දෑ පිටතට පෙනෙන හෙයින් ඡවි නැතියවුන් වැනියාහු නු'යි කියාත් ලිච්ඡවි නම් වෙති. ඔවුනොවුන් හා වෙනසක් නැති වැ 'සමාන වූ ඡවි වර්ණ ඇතියහු නු' යි කියාත් ලිච්ඡවි කුමරුවෝ නම් වෙති.

'......... ......... ......... ......... තාපසයන් දවස් පතා ......... ඇවිදූ ගත්තා දුක් දැකැ එ ගමැ ගව පාලයෝ ......... ......... "ස්වාමීනි තපස්වීවරුනට දරුවන් වැඩීම නම් මහා පලිරෝධ යැ. එ දරුවන් අපට පාවා දුන මැනැවැ. අපි උන් වඩම්හ. තුඹ වහන්සේ මහණ ධම් පුරාගත මැනැවැ"යි කීහ. තාපසයෝ "මැනැවැ"යි ගිවිස්සහ.

'......... ......... ......... "ආදරයෙන් වඩව. වැඩුණු කලැත් මේ කුමරුවාට අනෙක් කුමරියක පාවා නො දෙව. මේ කුමරිය අනෙක් කුමරුවක් හට පාවා නො දෙව. දෙන්නා ඔවුනොවුන් හා ආවාහ විවාහ කරව. පසුව කිරි, යොද, දී, තෙල්, වෙඬරු යන පස් ගෝ රසයෙන් තොප ගේ රජ්ජුරුවන් පහදවා ගෙනැ බිමක් ලවා ගෙනැ එහි ගමක් කරවා තෙලෙ කුමරුවා රජ කොටැ ගන්ව"යි කියා දරු දෙදෙනා පාවා දුන්හ. ඔහු "මැනැවැ"යි ගිවිසැ එ දරු දෙදෙනා ගෙනැ ගොස් වැඩූහ.'

39. **කුල දෙවුවන් පැවැති සෙබෙහි තෙද අණින් නො දිලෙති. වෙන් වූ සඳැ දිලෙති. රසින් මුසු නුමුසු රන් සෙ වෙති.**

(ඒ රජහු තුමූ) කුල දෙටුවන් ගෙවත් වැඩි හිටියන් හිඳිනා සබයේ තෙදින් අණින් නො දිලෙති. (ඔවුන්) වෙන් වූ විටැ දිලෙති. එ හෙයින් රස දියෙන් මිශ්‍ර රන් සේත් අමිශ්‍ර රන් සේත් වෙති.

රස දිය මුසු රන් නො දිලෙයි, ඉන් මුසු නුවූ රන් දිලෙයි. එ සෙයින් මේ රජහු තුමූ ද වැඩි හිටියන් හිඳිනා සෙබේ දී තමන් ගේ තෙදත් අණත් නො දක්වා යටත් වැ හිඳිති. එ වැඩි හිටියන් නැති විටැ තෙද අණ පතුරුවමින් බැබැළෙති.

**තෙදණින්** = තෙද අණින්

40. **අවරද තන් නො වළා, මහතන් බසට නො නැමි, ඇම තන් බලා සතන් පිය සුතන් විලසින් රකිනු යැ.**

පහත් කුල උපන්නවුන් ඇත් නො කොට, හෙවත් මඟ හරවන්නේ නැති වැ, උසස් දනන් ගේ කීමට නැමෙන්නේ නැති වැ සියලු දෙන එක් හැටියෙන් බලා, ප්‍රිය වූ දරුවන් (රක්නා) සේ සත්ත්වයන් රක්ම කැරේ.

මෙහි 'තන්' යනු දනන් ඇඟැවීමට යෙදුණේ වේ. අදත් ඒ තැන, මේ තැන, අර තැන, කුඩා තැන ඈ වහර වෙහෙර වැසියන් කෙරේ ඇති. ගම් වැසියා 'තන් ඇත්තා'යි තැනැත්තා, ඒ තැනැත්තා, මේ තැනැත්තා, අර තැනැත්තා ඈ විසින් එ වහර කරයි.

'වළා, අවරද' යනු වළා වරද යැයි පැදියේ යෙදිණි. අවරජයෝ නම් හීන ජන්ම ඇත්තෝ යැ.

**41. කුල සිරිත් නො මකා දන් වත් නො තබා මැ දෙන අඟ බඳුන් නො වඩා, සිත් සේ මැ දියැ දිය කොත් නැගු.**

කුල සිරිත් නො වනසා, නො කඩ කොට, දන වස්තු දෙන, ආදායම් බදු ද වැඩි නො කොට, සිතේ හැටියට මැ ලොවේ ජය කොඩි එසැ වූ

**42. උන් ගත සබා මැ යැ, උන් ගේ බස සබා මැ යැ, ඉසුරින් සබා මැ යැ උන් උන් සබා මැ යැ සබා නම්.**

ඔවුන් ගේ සිරුර කාන්තිමත් මැ යි, ඔවුන් ගේ වදන ඇත්ත මැයි. (උන තුමූ) සම්පතින් භාග්‍ය සහිතයෝ මැ යි. (එ හෙයින්) සබා නම් වනුයේ- ශෝභාමත් වනුයේ ඔවුන් උන්නා වූ සභා මැ යැ.

**43. අවා බිය ඇවුරු, සිත් සත් ගුණෙන් සපිරු ඔවුන් ගුණ සිතුවමින් කිවියරු දිගු බිතු තැවැරු.**

අපා (ගත වීමේ) බිය මුවා කළ, සිත් සත්පුරුෂ ගුණයෙන් සපුරා ලූ ඔවුන් ගේ ගුණ, කිවියෝ සිත්තමින් දිශා නැමැති බිත්තියේ ආලේප කළහ (හෙවත් ඇන්දෝ යැ).

(කවීන් ඔවුන් ගුණ දිශා නැමැති බිත්තියේ ඇඳීම නම් කවි කිරීමෙන් එ ගුණ දිගු අතේ (දිශාන්තයේ) පැතිර වීමයි.

44. (එ රජහු) **රන් රූ සදිසිය හ, දූකෑ දූකෑ නො යන පිසිය හ, කන්කළු සුබැසිය හ.** (එයින්) **ඔහු මැ නර දෙව්** (යන) **නමට නිසිය හ.**

(ඒ ලිච්ඡවී නිරිඳෝ) රනින් කළ රූ සමානයෝ යි, දූකැලා දූකැලා ඇති නො වන ආශාව වඩන්නෝ යි. කනට ප්‍රිය වූ යහපත් වදන් ඇත්තෝ යැ (ඒ නිසා) උඹ තුමූ මැ 'නර දේව' යන නමට නිස්සෝ යි

('ලිච්ඡවී' යන්නේ අරුත ද 'දිලෙන සිවිය ඇත්තෝ' යනු යි. රන් පැහැ ඇතියෝ සුදු නර ගණයට වැඩියෙන් කහ -මොංගෝල- නර ගණයට නෑ කම් ඇත්තෝ නො වෙත් ද?)

45. **මෙ ලොවැ කවුරු - සුරිඳුන් පිළිරූ අයුරු රුසිරින් ලොවැ ගරු, දස රජ දම් දුරු ඔවුන් සරි වෙති.**

මෙ ලෝකයේ කවරහු, දෙව් රදුන් ගේ (සක් දෙවිඳුන් ගේ) ප්‍රතිරූප (පිළිම) වැනි රූ සැපතින් ලොවට ගරු වූ, රජුන් විසින් පිළිපැදි යැ යුතු දස දහම දුරුවා වූ ඔවුනට සම වෙත් ද?

දස අයුරු වූ රජ දහම:-

දානං සීලං පරිච්චාගං
අජ්ජවං මද්දවං තපං
අක්කෝධෝ අවිහිංසා ච
ඛන්තී ච අවිරෝධතා

(දීම යැ, සීල යැ, පරිත්‍යාග යැ, ඍජු බව යැ, මෘදු බව යැ, තපස යැ, ක්‍රෝධ නැති බව යැ, අවිහිංසාව යැ. ඉවැසීම යැ, අවිරෝධ බව යැ) යි පෙර ඇදුරෝ දක්වූ හ.

**46. සක බිමැ පෙරළෙමින් ගැලැ බඩු නිසල කෙරෙමින් පවතිනා මෙන් සත රකිමින් තුමූ නොමින් දුක් විඳිති.**

(කරත්ත) රෝදය බිමැ පෙරළී පෙරළී කරත්තයේ (පටවා ඇති) බඩු නො සැලෙන සේ පවත්නා නියායෙන් සත රැකැ රැකැ (මෙ රජහු) තුමූ බෙහෙවින් දුක් විඳිත්.

'ගැල යෙහෙන් තබා තමා පෙරළී දුක් ගන්නා ගැල් සක සේ සත්ත්වයා යෙහෙන් සිටුවා තුමූ දුක් ගත්හැ' යනු බුත් සරණය යෙයි.

**47. බිඟු කුසුමින් පෙමින් රොන් ඇරැගෙනැ සත ලෙසින් ලොවට දුක් නො දෙමින් පෙර නියමින් අය පඬුරැ ගනිති.**

මී මැස්සා මලින් (එ මලට) ප්‍රේමයෙන් (නො තළා) රොන් ඇරැ ගෙනැ යන්නා සේ (මෙ රජහු) ලෝ වැසියාට ගහට නො පමුණුවා පෙරැ රජුන් ගේ නියමය ලෙසට ආදායම් බදු ගනිති.

'මල්පෙති නො බිඳැ මිහි බොන බමරක්හු සේ යෙහෙන් ලෝ වැස්සන් නො මිරිකා අය ගත්තාහැ' යනු යෙයි බුත් සරණය.

**48. සිඳු පෙදෙසේ ලුව ද දිය නො ගෙනැ නැව සිපි සේ දනා නො ගෙනැ මැ තොසේ දනවත් දනන් සිත සේ සිපිති.**

මුහුදු පෙදෙසෙහි දැමූයේ වුවත් දිය නො ගෙනැ (එ දිය පිටැ මැ) නැව සිටි හැටියට දනය නො ගෙනැ මැ දනවත් දනන් ගේ සිත මෙන් සතුටින් සිටිති

මුහුදේ නැව දිය නො ගෙනැ එ දිය පිටැ මැ සිටිනා සෙයින් දනවත් දනන් කෙරේ වී ඔවුන් ගෙන් දන නො ගෙනැ මැ ඔවුන් ගේ සිත බඳු වැ සතොසින් සිටිනා බව යි එ කීයේ.

'දියෙහි ලූ නැව දිය නො උකා රැකෙන්නා සේ ධනීන් කෙරෙහිත් උන් ගේ ධනය නො ගැනැ පැවැත්තා හැ' යනුයි බුත්සරණය පවසන්නේ.

49. **පල ගත් අතු නසා මොර කන්නවුන් විලසැ දන ගැනුමක් නිසා දනන් වනසා දහම් නො නසති.**

(උඹ තුමූ) පල අට ගත් අතු නැති කොටැ මොර කන දනන් මෙන් දන ගැනීමක් පිණිසැ මිනිසුන් විනාශ කිරීමෙන් (රජ) දහම් නො නසත්.

**'විලසැ'** යනු ගීයේ ඇත්තේ **'විලසා'** යනුවෙනි

**"පලගත් අතු නසා**
**පල කන්නවුන් විලසා"**

යනුත් අයෙක් කියති. බුත්සරණය කියන්නේ

**'අතු කපා මොර කන්නා සේ ලෝ වැස්සා නසා ප්‍රයෝජන නොගන්නා.........'**

යනුයි.

සිරි රහල් හිමියෝ ද:-

'අතු පතර කපමින
**මොර කන්නවුන්** විලසින
ඇත්තැයෙන් **කරන**
නසා රට තොට නෘපයන් දන'

යනු වදරති.

50. **තමා බස කෙරෙතිසි යමක් නිසි ලෙසැ මිසක් සවනින් අසන බස නුවනින් අසව යන ලෙසැ නො යොදති.**

(මිනිස්සු) තමා කිවං කෙරෙත් යැයි (ඒ වූ පලියට) යමක් සුදුසු පරිද්දෙන් (යොදනවා) විනා කනින් අසන බස ඇසින් අසවයි කියන්නා සේ (නොතිසී ලෙසැ) නො යොදති.

බස ඇසියැ යුතු වත්තේ කනින් යැ එය ඇසින් අසවයි කිම නිසි ලෙසැ යෙදීමෙක් නො වේ. මිනිසුන් තමන් කිශන කියන එක කරන පළියට එ අයුරැ ඇණැවීම් සුදුසු නො වේ.

'ඇසින් දක්නා රූ කනින් දක්නට නියම කරන්නා සේ' යනුයි බුත්සරණය කියන්නේ.

'ලෙසැ' යනු ගීයෙහි ඇත්තේ 'ලෙසා' කියා යි.

51. **සතින් වැළැකෙන වෑස්සට හිසට අතුල් දෙන සේ මහතුන් හට යෙදෙන දූයක් හීනයන් හට නො යොදති.**

කුඹයෙන් මුවා වන වැස්සේ දී හිසට අතුල් දෙන්නා සෙයින් උතුමන් හට සුදුසු වන යමක් පහත් දනන් හට නො පවරති.

'ඡත්‍රයෙන් වැළැකෙන්නා වූ වැස්සට අතුල් හිසැ තබන්නා සේ මහතුන් කළමනා කටයුතු ක්ෂුද්‍රයන් ලවා නො කරවන්නා හැ' යන්නෙනුයි බුත්සරණය මේ කියන්නේ.

(මහතුන් හට නිසි නිසි කටයුත්තක් පහත් දන හට පැවැරීම වැස්සේ කුඩය වෙනුවට අත්ල හිසට දීමක් බඳුයි)

'**දෙනතුල්**' යනු දෙන අතුල් යැයි බිඳේ.

52. **ලෝ වැඩ පිණිසේ පර අඟනන් දෙසේ බලන ගිම් රිවි මඬල සේ ඇස අකුළුවා දුක සේ බලති.**

අනුන් ගේ ගැනුන් දිහැ ලෝ වැඩ සලකා බලන කල්හි ගිම්හාන අව්දියේ හිරු බලන්නා සේ ඇස අකුළුවා අමාරුයෙන් බලති.

මේ නිරිඳෝ පර අඹුවන් දෙසැ නො බලති. එ හෙත් දහම් අදිකරණය පසිදීම් ඇ ලොවට වැඩ වන දූය කිරීමේ දී ඔවුන් දෙසැ නො බලා සිටිනු බැරි වෙයි. එ සේ විටැ ඔවුන් දෙසැ බලන්නේ ඇස අකුළුවා ඉතා අමාරුයෙන් ගිම් අවදියේ හිරු මඬල දෙසැ බලන්නා මෙනි.

'සරත් සමයයෙහි දිලියෙන්නා වූ සූර්ය මණ්ඩලය ඇස හකුළුව හකුළුවා බලන්නා සේ ලෝකාර්ථයක් තකා ද පරස්ත්‍රීන් බලත් නම් ඇස හකුළුව හකුළුවා මැ බලන්නා හැ' (බුත්:).

**53. පුතු වෙතැ සනහසේ පසව දුක් ඉවසනා සේ ලොව රැකුම් අදහසේ දුක් සරු නො කොටැ සැප සේ විඳිති.**

දරුවා කෙරේ ඇති සතායෙන් වැදීමේ දුක ඉවසන්නා සේ ලොව රැකීමේ අදහස නිසා දුක් ගණන් නො ගෙනැ සැප හැටියට ඉවසති.

'පුත්‍ර ප්‍රේමය ඇති මව ප්‍රසව වේදනාව ඉවසන්නා සේ සත්ත්වයා කෙරෙහි කළ ස්නේහයෙන් තමන් ගන්නා ආයාස සරු නො කළහ' (බුත් ).

'පුත්‍රයා කෙරෙහි කළ ස්නේහයෙන් ප්‍රසව වේදනායෙහි සරු නැති මවක සේ' යනු ද එහි මැ එයි.

'රැකුම් අදහසේ' යනු ගීයෙහි ඇත්තේ සන්දි වී 'රැකුමදහසේ' කියා යි.

**54. බබළනා තුරු වසා වලා ලනා මරු විලසැ අනුන් ගුණ කෙලෙසා නුගුණ වෙසෙසා නො පතුරුවති.**

දිලෙන්නා වූ තාරකා වැසෙන පරිදි වලා රොද පමුණුවන සුළඟ සෙයින් අනුන් ගේ ගුණ කිලිටි කෙරෙමින් නුගුණ (දෙස්) විශේෂ කොටැ පැතිරවීම කරන්නේ මැ නැති

'ආකාශයෙහි තරු වසා වලා කුළු හිඳුවන පවතක් සේ අනුන් ගේ ගුණ වසා නුගුණ නුදූහ' (බුත්:).

'විලසැ' (විලසින්) යනු ගීයෙහි ඇත්තේ 'විලසා' කියායි.

55. **ඇත් ගොවුවන් මරා තුටු වන ගජන් අයුරින් (තමන් උදෙසා) දුක් ගත්තන් මරා එසින් ඉඳුරා තුටු සිත් නො වෙති.**

ඇතුන් රැකැ බලා ගත්තවුන් මැරීමෙන් සතුටට පත් වන ඇතුන් සෙයින් (ඇතුන් සතුටට පත් වන්නා සේ, තමන් ගේ වැඩට) වෙහෙස වූ දනන් මරා එකනින් එයින් සතුටු සිත් ඇතියෝ නො වෙති.

'පිරිවැසූ තැනැත්තහු මැරූ ද යෙහෙන් නිදන මතැනක්හු සේ තමනට දුක් ගත්තවුන් මරා සුව නො විත්ද හැ' යනු බුත්සරණය කියන හැටි යි.

56. **සුවඳ හැල් උදුරා ඉඳුරා වරා රකිනා එව් අදහම් පුරා රැකැ නිතොර සිතින් දහම් නො නසති.**

සුවඳ ඇල් ගොයම උදුරා වරා තණ හරි හැටි රක්නා සෙයින් අධර්මය එ හැම පිටින් මැ රක්මින් නිතර සිතින් දහම් නො නසත්.

(සිතේ පුරා අදහම ඇති කොටැ ශෙනැ එය රක්මින් දහම සිතින් බැහැර කිරීම කෙතේ සුවඳැල් ගොයම උදුරා ඇටවරා ඇ තණ හරි හැටි රැකීම බඳු යි).

'වරා අතුරෙහි නැගි හැල් පත උදුරන්නා වූ මලය වැස්සන් සේ අධර්මය රක්ෂා කොටැ ධර්මයට හිංසාවක් නො කරන්නා හ' යි බුත්සරණය කිය යි.

රකිනා එව් යනු සන්දි වී 'රකිනෙව්' යැයි පැදියේ යෙදී ඇති.

**57. පස් ඉඳුරන් ඇරැගත් අරමුණු පසින් සැප ලත් ජවන් සිත් විලසින් (එ රජහු) ලෙවන් ලද සැපතින් මැ තුටු වෙත්.**

ඉඳුරන් (ඉන්ද්‍රියයන්) පස් දෙන ඇරැ ගත් අරමුණු පසින් සැප ලැබූ ජවන් සිත් මෙන් (එ රජහු තුමූ) ලෝ වැසියා ලැබූ සැපතින් මැ සතුටට පැමිණෙති.

ඇස, කන, නාසය, දිව, කය යන මූ පස් ඉඳුරෝ යි. ඔවුන් ගන්නා අරමුණු නම් රූ, සද, ගඳ, රස, පහස යන පසයි. ඇසට රුව, අරමුණට ලත් විටැ සැප විඳිනේ සිතයි. කන මිහිරි හඬ අරමුණට ගත සුවය විඳිනේ සිතයි. නැහැය සුවඳ අරමුණට ගත් විටැ තොස ඇති වන්නේ සිතටයි. සෙසු ඉඳුරන් පවත ද එ සැටියි. එ අයුරින් ලෝ වැසියා සැපත ලද විටැ එයින් තුටු වන්නෝ මෙ නිරිඳෙ යි.

'පඤ්චේන්ද්‍රියයන් වෙත වෙතම ගන්නා ආලම්බනයෙහි රස විඳුනා සිතක් සේ සත්ත්වයන් වෙත වෙත මැ ලද්ද වූ සම්පත්තියෙන් තුමූ සුව වූන්හ' (බුත්:)

'අරමුණු රස විඳිනු වෙයින් සඳ' යැයි විවරණය කෙරෙති සිරි රහල් හිමියෝ.

'ඇරැගත්' යනු ගීයේ 'රැගත්' යැයි සිටී.

**58. වතුරැ වැලි බිම් පෙත් නො හැර මැ තෙත් කරන මෙන් දුප්පත් සතුන් වෙත් මහ කුළුණු මෙත් සිත් කෙරෙති.**

ගලා බස්නා දිය දහර වැලි සහිත බිම් පියෙස් (වැලි බිම් යැයි) හරින්නේ නැති වැ මැ තෙත් කරන්නා සේ දුකට පත් සතුන් කෙරේ (එ රජහු තුමූ) මහා කරුණා සහගත මෛත්‍රී සිත් ඇති කෙරෙති.

'වෙහෙල්ල තෙමා ගෙනැ බස්නා ජලප්‍රවාහය සේ අනාථයන් තෙමා කරුණා වතුරැ පැවැත් වූ හැ' යනුයි මෙ අරුතෙහි බුත් සරණය කියන්නේ.

**59. පිරුණු තෙල් ඇති කල නිති නිසල කොට රකිනා එව් ගුණ නැණ ඇති මහතුන් නිතර බැති සිතින් රැකැ පවතිති.**

තෙල් පිරී ඇති කළ ගෙඩි නිබඳ නො සැලී පවත්නා පරිදි කොටැ රක්නා සෙයින් ගුණ නැණ ඇති උතුමන් නිබඳ වැ මැ ඇල්ම ඇති වැ රක්මින් පවතිත්.

එයින් කියැවුණේ ගුණ නැණ ඇති මහත්මයන් ගරු බුහුමන් ඇති වැ රක්නා බවයි.

'පැන් පිරුණු කළය නො සොල්වා තබන්නා සේ ගුණියෙන් පිරුණු ධීරයන් නො සොල්වා මැ රක්ෂා කළ හැ' (බුත්:)

'රකිනා එව්,' 'නැණ ඇති' යනු සත්දි විමෙන් 'රකිනෙව් නැණැති'යි පැදියේ යෙදී ඇති.

**60. නවර වළැ, පුල් සරසේ හමනා පවනක් සේ කුල නුකුලන් දෙසේ සිතින් සම වැ සොඳ සේ පවතිති.**

'අසුචි වලේත්, පිපුණු නෙළුම් විලේත් (වෙසෙසක් නැති වැ) හමා බස්නා සුළඟක් සෙයින් කුලීනයන් කෙරේත්, කුලීන නුවූවන් කෙරෙහිත් සම සිතින් යුතු වැ සුදුසු පරිදි පවතිති.

'අශුචි භූමියත් පියුම් වනයත් නො හැර හමන්නා වූ පවන් සේ රජපුත්‍රයන් කෙරෙහි ද චණ්ඩාලයන් කෙරෙහි ද සම වැ සිත් පැවැත් වූහැ.'

යනු බුත්සරණයේ වදති.

**61. කිරු කො සේ නැංග ද අඳුරු රකිනා ගිරි ලෙණ සේ කො සේ සැඩ දන ඇතත් දුගී සත සිත සේ රැකැ සිටිති.**

ඉර කවර හැටියට නැගුණත් අඳුරු රක්නා ගල් ගුහාව මෙන් කවර තරම් සැඩ දනන් ඇතත් දුප්පත් දනන් සිත් සේ රක්මින් පවතිත්.

'තිරූ තැංග ද ගුහාවට වන්නා වූ අන්ධකාරය නො තස්නා සේ ලොවැ වණ්ඩ වූ බලවතුන් බොහෝ වුව ද මොවුන් ආශ්‍රය කළා වූ අනාතයෝ නො තැසි මැ සිටිය හැ' (බුත්:).

'අඳුරු රකිනා' යනු 'රකිනා අඳුරු'යි මාරු වැ 'රකිනඳුරු' යි සන්දි වී යි ගීයේ යෙදී ඇත්තේ. 'දන ඇතත්' යනු **'දනෑතත්'** යැයි සන්දි වැ ඇති.

62. **දනන් ගෙන් මෙහෙ ගෙනැ පසු වැ නො දන්නාන් මෙන් දිනැ දිනැ දත් මැදලා දමන දූහැවි දඬු මෙන් නො දමති.**

මිනිසුන් ගෙන් මෙහෙ ගෙනැ හෙවත් මිනිසුන් ලා කටයුතු කරවා ගෙනැ පසුවට (එ බවක්) නො දන්නවුන් සෙයින් (ඔවුන්) දින පතා දත් මැදලා (ඉවතැ) දමන දූහැවි කූරු වාගේ අස් නො කෙරෙති.

'දත් මැදූ අන්තයෙහි දූවටු දඬු නිරපේක්ෂ වැ දමන්නා සේ පුරුෂයා ලවා ප්‍රයෝජන කරවා ගෙනැ නිරපේක්ෂ වැ අත් හැර නො පියන්නා හැ'

යනු බුත්සරණය කියන සැටියි

'දිනැ දිනැ' යනු 'දින දින'යි ද, 'ගෙනැ' යනු 'ගෙන'යි ද 'දනන් මෙන්' යනු 'දනන් මෙන'යි ද පැදියේ යෙදී ඇති

63. **වෙන වෙන කරලැ දුටු වී ගෙනැ අටු පුරන මෙන් හැම සත සිතැ සතුටු තමා ලෙයි ලා අසා පටු නො වී.**

වෙන වෙන කරලෙහි දක්නට ලැබුණු වී ගෙනැ අටු පුරන මෙන් සියලු සතුන් ගේ සිතේ සතුටු තම ලයේ ඇතුළු කොටැ කුඩා හෝ පටු හෝ නො වී.

(කරලෙකැ ඇත්තේ මිඳ වියෙකි. එ හෙත් වෙන වෙන කරලේ ඒ මඳ විය අටු පුරයි. එක් මිනිසකු ගේ සිතේ සතුට

හක -කුඹා- වෙයි, පටු වෙයි. එහෙත් ඒ ඒ මිනිසා ගේ සිතේ වූ සතුට තම ලෙහි ගැන්නූ විටැ ඒ මහත් වේ, පුළුල් වේ).

'වෙන වෙන කරලෙහි තුබූ වී එක් කොටැ ගෙහි රැස් කොටැ බොහෝ කරන්නා සේ හැම සත්ත්වයන් සිතැ ඇති සන්තෝෂ තමන් ලෙහි බහා ලා බොහෝ කළහැ'

යනු බුත්සරණය කියන හැවිසි.

ලෙයි= ලෙහි. අක= හක (කුඹා)

64. **කුස ගිනි විතර මිසැ බත් කිස නො කරන ලෙසින් සතන් රකිනා විතරකට මිසැ දන රැස් නො කරවති.**

බඩ ගිනි පමණට විනා (ඉන් වැඩි වැ) බත් බිදීම නො කරන්නා සේ සත්ත්වයන් රක්නා (පිණිසැ ඇවැසි) පමණට මිසැ (ඉන් වැඩි වැ) දන රැස් නො කරවති.

'කුස පිරෙනු පිණිසැ මුවෙහි අහර තබන්නා සේ ලෝ වැස්සන් සමෘද්ධ කරනු පිණිසැ තුමූ මැ ධන සඤ්චය කළ හැ' (බුත්:).

'මිසැ' යනු එළි නිසා 'මිස' යැයි යෙදී ඇති.

65. **විලෙහි පියුමෙහි මී එහි තබා බොන හස මෙන් දන දනවතුන් ගෙහි තබා නිතියෙන් වැඩ විඳැගනිති.**

(ඒ රජහු තුමූ) විලේ අවගත් නෙළුම් මලේ පැණී ඒ විලේ නෙළුම් මලේ මැ තිබියැ දී බොන හංසයා සෙයින් දනය දන වතුන් ගේ ගෙයි තිබියැ දී මැ තිබැ (ඉන්) ප්‍රයෝජන විඳැගතිත්.

'විලෙහි පියුමෙහි මී බොන රාජ හංසයකු සේ ධන ඇති ඇත්තවුන් ගේ ගෙහි මැ තබා තුමූ මැ එයින් ප්‍රයෝජන වින්ද හැ' (බුත්:).

66. **ඇතු රක්නා පිණිසැ අකුන් සස් ද ලන ලෙසැ එකකුට වැඩ පිණිසැ එකකු ගේ යස උදුරා නො දෙති.**

(එ තිරිඥෝ) ඇතු රැකීම සඳහා අනුන් ගේ ගොයම කපා දමන්නා සේ එකකු ගේ ප්‍රයෝජනය සලකා (අන්) එකකු ගේ සැපත උදුරා නො දෙත්.

'පිණිසැ, ලෙසැ' යනු එළි නිසා 'පිණිස, ලෙස' යැයි යෙදිණි.

'ඇත් හව ගොදුරු පිණිසැ කුඹුරු ඇත්තවුන් හඬව හඬවා ගොයම් ද ගන්නා සේ එකකු හට ඉෂ්ට පිණිසැ එකක් හු ගේ ධනය හැරැ එකකු හට නො දෙන්නා හැ'

යනුයි බුත්සරණය කියන්නේ.

67. **ඔහු 'මෙ වැනි දස් කම් කොටැ දෙයක් ලබම්'යි ආ හට ඕ නො දී දෙම්නසින් ඔහු ගෙට නො යා දෙති.**

ඌ තුමූ (ඒ රජහු) 'මෙ අයුරු සමත් කමක් කිරීමෙන් යම් කිසිවක් ලබම්' කියා ආ තැනැත්තහුට එය නො දී නො සතුටු සිතින් ඔහුට ගෙට යනු නො දෙත්.

(ඒ දූය දී ඔහු සතුටු සිත් ඇතියකු කොටැ මැ යවති)

'මෙ දස් කම් කොටැ ලා අද මා ගේ දුරිද්‍රය හැරැ ගන්-මි යි ආ තෙතැත්තවු හඬව හඬවා ගෙට නො යවන්නා හැ'යි බුත්සරණය කිය යි.

'කොටැ' යනු එළි නිසා 'කොට' යැයි යෙදිණි.

68. **ඔහු, ගිනි කොටැ මල සිඳෙන පමණට රන් දවනා සේ දනා හට කළ වරද පමණට සන්තාප දෙවති.**

ඌ තුමූ ගිනි කවා (ගිනියම් කොටැ) මල හෙවත් දිරාපත් අපිරිසුදු කොටස සිඳී යන පමණට රන් දවන්නා සේ දනන් හට (ඔවුන් කළ) වරදේ පමණට දඬුවම් පමුණුවති.

'ශුද්ධ කරන පිණිසැ මල සිඳෙන පමණක් රත් රන් දවන්නා සේ සත්ත්වයා ගේ දෝෂ පමණක් මැ සන්තාප කරන්නාහැ'

යනු බුත්සරණය වදනි.

'කළ වරද පමණට
දවන රන් සේ ගිනි කොට'

යනු රහල් හිමියෝ ද කියති. ඒ ඇම ඇයි?

**69. සිඳු වඩ දිය නො වන කලපුව දිය සිඳෙන මෙන් දන සැපෙන් දුරු වුව තුමූ සිතින් සැප ගෙනැ නො ඉඳිති.**

මූදු වඩ දිය නො පැමිණුණොත් කලපුව දිය සිඳෙන්නා සේ දනන් සැපෙන් ඈත් වුව හොත් (උඹ) තමූ සිතට සැප ගෙනැ නො ඉඳිති.

'මුහුද වඩ දිය නැති විටැ මැ කලපුයෙහි දිය නැති වන්නා සේ සත්ත්වයා හට සුව නැති ද මැ තමන් සිතැ සුව නැති කළහැ'

යනු බුත්සරණය පවසයි.

'මුහුදු දිය වැදූ පිරී ගිය කලපුවක් සේ'යි බුත්සරණය එහි අනෙක් පිට ද පළ කරයි.

'මෙන්' යනු 'මෙන' වැ ඇති ගීයේ.

**70. විඳි සරය දුන්නෙහි දැඩි කමින් දුරැ යන මෙන් තම කළ දැඩි කමින් නියමින් සතුන් දුරු නො කරවති.**

විදිනා ලද ඊය දුන්නේ තද බව නිසා ඈතැ යන්නා සේ තමන් කළ තද කම් නිසා එ කතින් මැ සත්ත්වයන් ඈත් නො කරවති (හෙවත් පිටැ නො යවත්).

'දුන්නෙහි දැඩි කමින් සරය දුරැ ගෙන්නා සේ තමන් ගේ දැඩි කමින් සත්ත්වයන් දුරු නො කළහැ.' (බුත්:)

'කමින්, නියමින්' යනු 'මෙන්' යන්න හා එළි වැටට සිටැවීමේ දී 'කමෙන්, නියමෙන්' යැයි විරූ විණි.

**71. මුල තිර වැ සිටි සේ සලෙල වන තුරු සිර සේ සත සුව විඳිනා සේ තුමූ සලෙල වැ සිත සේ සිපිති.**

(ගසේ) මුල ස්ථිර වැ සිටි සිටි හැටියට සැලීම ලෙළීම වන ගස් මුදුන මෙන් දනන් සැප විඳිනා විඳිනා හැටියට (උඟ) තුමූ විනෝදය ලබමින් සිත් නියා සිටිති.

'වෘක්ෂයෙහි මූලය ස්ථිර වැ පිහිටි පිහිටි සේ ගසැ අග සලෙල වන්නා සේ සත්ත්වයා ස්ථිර වැ පිහිටි සේ තුමූ සලෙළ වූ හැ' (බුත්:)

'විඳිනා' යනු පැදියේ 'විඳින' යැයි යෙදී ඇති.

72. **නුවර රක් අවරණට තිර කොටැ පවුර කරන එව් ලොවට රක් අවරණට හැම විටැ තමා තර කොටැ ගනිති.**

පුර රක්ෂාවරණයට තිර වැ සිටුනා සේ පවුර කරන්නාක් මෙන් ලෝක රක්ෂාවරණය පිණිසැ සියලු කල්හි තුමූ ස්ථිර වැ සිටිත්.

| | | | |
|---|---|---|---|
| 'රක් අවරණට' | = | (පැදියේ) | රකවරණයට |
| කරන එව් | = | ,, | කරනෙව් |
| කොටැ | = | ,, | කොට |
| විටැ | = | ,, | විට |

'නුවර රක්ෂාවට පවුර ස්ථිර කරන්නා සේ ලොවට රක්ෂා පිණිසැ තමන් ස්ථිර කළ හැ'

යනු යි බුත්සරණය බස.

73. **ඇතු සොඬින් උකා ගත් පැන මුව ඇරැ ගෙනැ බොන මෙන් තමා ලත් සැපත් අමා නිතියෙන් ලෝ වැස්සන් පොවන-**

ඇතා සොඬින් උරා ගත් දිය (උගේ) මුඛය ඇරැ ගෙනැ බොන්නා සේ තමන් ලැබූ සම්පත් නැමැති අමෘතය ලෝ වැසියන් හට නිබඳ මැ බොන්නට සලස්වන-

අලියා සොඬිත්: දිය උරාගනී. උගේ කට ඒ දිය බොයි. මේ රජහු සම්පත් නැමැති අමාව ලබති. ලෝ වැසියෝ නිතින් එය බොති.

'ඇතු සොඬින් ඉකැ වූ පැන් මුඛය අනුභව කරන්නා සේ තමන් සඤ්චය කළ ධනය ලෝ වැස්සන් ලවා අනුභව කැරැවූ හැ' යනුයි බුත්සරණයෙහි එන්නේ.

| | | | |
|---|---|---|---|
| 'සොඬින් උකා' | = | (පැදයේ) | **සොඬිනුකා** |
| 'සැපත් අමා' | = | ,, | **සැපතමා** |
| 'ඇරැ ගෙනැ' | = | ,, | **රැගෙන** |

**74. මල් නො ගෙනැ ඵල දෙන දිඹුල් තුරු සේ ඇම තැනැ දනන් කිසි කරුණක් නො ගෙනැ නිතියෙන් සුවපත් කෙරෙති.**

මල් අටගන්නේ නැති වැ ඵල දෙන්නා වූ අත්තික්කා ගස් මෙන් සියලු තන්හි දනන්, කිසි හේතුවක් නො සලකා නිතර සුවයට පමුණුවති.

| | | | |
|---|---|---|---|
| ගෙනැ | = | (පැදියේ) | **ගෙන** |
| තැනැ | = | ,, | **තැන** |
| නිතියෙන් | = | ,, | **නිතියෙන** |

'මල් නො ගෙනැ පල දෙන්නා වූ දිඹුල් රුක් සේ කාරණ නිරපේක්ෂ වැ මැ ලෝ වැස්සනට සුව දෙන්නාහු යැ' (බුත්සරණය)

**75. 'සඟිනි පුහුදුන් නොප සගැ සුරිඳුන් තුටුවුයෙන් තෙල රඳුන් බලව' සි සෙත දුන් බුදුන් වදහළ බැවින්-**

'මහණෙනි, සතර මඟ සතර ඵලයට නො පැමිණියා වූ (හෙවත් ආර්ය ධර්මයන් ගෙන් වෙන් වූ) තොප දෙව් ලොවේ දෙවියන් තුටුවූ හෙයින් ඒ රජුන් බලව් යැ' යි නිර්වාණය දුන් බුදුන් වදාළ හෙයින්-

බුදුහු "මහණෙනි, යම් කෙනකුන් විසින් තව්තිසා වැසි දෙවියෝ පූර්වයෙහි නො දක්නා ලද්දහු ද දුන් මේ ලිච්ඡවි රජ පිරිස් බලනු මැනැව්"යි වදාළෝ.

"යේහි කේහිචි භික්ඛවේ භික්ඛූහි දේවා තාවතිංසා අදිට්ඨා පුබ්බා, ඕලෝකේථ භික්ඛවේ ලිච්ඡවිපරිසං, අව ලෝකේථ භික්ඛවේ ලිච්ඡවිපරිසං, උපසංහරථ භික්ඛවේ ලිච්ඡවිපරිසං, තාවතිංසපරිසං."

මොහු යැ වජ්ජීහු තම්' (ධර්. ප්‍ර)

'තව්තිසා වැසි දෙවියන් නො හඳුනන්නවුන් ලිච්ඡවි රජුන් බලා හැඳිනැගන්නේ යැයි බුදුන් විසිනුත් වදාරන ලද මැයැ' (පූජා:)

පුහුදුන් = පෘතග් ජන. (ආර්ය ධර්මයන් ගෙන්) වෙන් වූ දනෝ. සෘද්ධි නැති පෘතග් ජනයනට දෙව් ලොවේ දෙවියෝ නො පෙනෙත්.

76. **සැබැවින් තිදස පුරැ සුර සෙන් ලෙසින් මන හර ලොව නො හැරැ තුටු කළ බවුන් සිරි සර කො සේ වනමු ද?**

ඇත්තෙන් (මැ) තව්තිසායේ දෙව් සෙන් සෙයින් සිත් ඇදගන්නා වූ, (එකකුත්) නැරැ (මැ,) ලෝ වැසියා තුටු කළා වූ ඔවුන් ගේ සිරියේ සාරය කවර සෙයින් වර්ණනය කෙරෙමු ද?

තිදස පුර (තුන් වන යොවුන් විය ඇතියවුන් ගේ පුරය) සක් දෙව් රදු සිටිනා දෙව් ලොවයි.

හැරැ = (පැදියේ) හැර.

## 4. තුන් බිය

(77 — 88)

එක් සාලිස් පැදියෙකින් විසල් පුරේ ලිච්ඡවි රජුන් වැනූ ගත් කරුවාණෝ· ඉන් ඉක්බිති වැ එ රජුන් දවසැ එ පුරට පත් බිය තුනෙකැ පවත් ගී පැදි දෙළොසෙකින් පවසත්.

**77. මෙසේ සුර සිරි මෙන් නො මද රජ සිරි යෙහෙන් විඳෑ විඳෑ ඔවුන් ඔවුන් පෙම් බැඳෑ එ රජුන් රජ කරන සැඳෑ,**

මේ (කී පරිද්දෙන්), දෙව් සැපත් බඳු, බොහෝ වූ රජ සැපත් සුව සේ විඳිමින් උන් උන් කෙරේ ආදරයෙන් බැඳී ඒ රජුන් රජ කම් කරන කල්හි-

විඳෑ විඳෑ = (ගීයේ) විඳ විඳ
සඳෑ = සඳ
ඔවුන් ඔවුන් = ඔවුනොවුන්

## (අ) පළමු වන සා දුක් බිය

**78. දිලි දෙවියන් ගනෙහි ජරා විලි පිලි දිසි මෙන් කලි එ පුරෙහි පවා කලෙකෑ අකලි දුක් බික් දුකෙක් වියෑ.**

දිලියෙන්නා වූ දෙවියන් ගේ ඇඟේ දිරා පත් වීම නිසා ඇති වන රැළිත් පැසුණු කෙසුත් පෙනුණා සේ ප්‍රිය (කාල්‍ය) වූ එ පුරෙහි ද කලෙක්හි දී අප්‍රිය (අකල්‍ය) වූ සා දුකෙක් (ඇති) වූයේ සි.

පැදියේ ඇති '**විය කලි**' යනු 'වියෑ අකලි' සි බිඳැගතයුතු.

## (ආ) දෙවැනි වූ රෝදුක් බිය.

**79. ලොවැ සතුන්නේ සව් සැප නික්ත වන්නේ නැති (සි) මෙ තැන්නේ පානා එව් රෝග බියෙකුත් අවුත් වන්නේ.**

ලෝ වැසි සත්ත්වයන්ගේ සියලු සුව සඳ කාලික වන්නේ නැති යි මෙ තැනැ දී පෙන්වන්නාක් මෙන් රෝග බියෙක් ද ඇවිත් (එහි) වැදුණේ සි.

'......බුදුරජාණන් සියලු සංස්කාරධර්මයෝ මැ ඒ ඒ ආකාරයෙන් නො පවත්වනාහු යැ. අනිත්‍ය යැ සි වදරන්නා වූ අවවාදවචනය සබා මැ යැයි දෙස් කියන්නා සේ.........' (පූජා:)

'පානා එව්' = (පැදියේ) පානෙව්.

## (ඇ) තුන් වැනි වූ යක් බිය

80. **ඉසුරින් තමා පුර සරි යැයි සිතින් වෙර බැඳැ කුවෙර වර දුන් මෙන් යක් සෙන් අවුත් එ නුවර වන්නු.**

සැපතින් (සම්පත් අතින්) තමා ගේ පුරට සමාන යැයි සිතින් වයිර බැඳැ කුවේරයා වර දුන්නා සෙයින් යක්ෂ සේනාවෝ අවුත් එ නුවරට වැදුණෝ යි.

කුවේරයා යකුන් ගේ රජ යැ. තපුරු වෙරක් හෙවත් අප්‍රිය සිරුරක් ඇත්තේයි ඔහුට එ නම වේ. හෙ තෙමේ දන සැපතින් ලොවේ අග වෙයි. එ හෙයින් කෙලෙස් කැළු පා මුලැ ඇති ඔහු ගේ පුර වූ ආලකමන්දව ඉසුරින් අග නුවරයි. දැන් මේ විසල් පුර ද ඉසුරින් ඒ සම වෙයි. එයින් ඉසාව ඇති වූ කුවේරයා ගේ සිතේ මෙ පුර කෙරේ වයිර-යක් බැඳුණු සැටියි.

කුවේරයා යක් සෙන් පතියා යි. යක්කු මිනිසුන් ගොදුරට තසත්තෝයි. එ හෙත් එ පිණිසැ ඔවුන් සිය රජු වූ කුවෙරයා උදෙසා දුක් ගෙනැ ඔහු සිත පහදවා වර ලැබියැ යුතු. ඒ දුෂ්කර ක්‍රියාවෙකි. මෙ විටැ තම සිතේ විසල් පුර කෙරේ බැඳි වයිරයක් ඇති හෙයින් ඔහු යකුනට නිකම් මැ වර දුන්නා වැනියි, එහි වැද මිනිසුන් ගන්නට යක් සෙන් අවුත් එහි වැදුණේ එ සැටි පාමිනුයි.

**වන්නු** = වන්හු

81. **විශාලා නුවරෙහි යම් කිසිවකු තබාලා යම් දැයි සිතාලා මරු ගොසින් වසාලා උන් වැනි.**

විසාලා නුවරෙහි එකකුත් ඉතිරි කොටැ යම් ද (තොයම්) යි සිතා ගෙනැ මරුවා ගොස් (නුවර) වසා ගෙනැ උන්නා බඳුයි.

මරුවා දැන් විසල් පුර තුළට වී එය පිටතින් වසා ගෙනැ හිඳී. ළඟ යළි පුර ඇරැ බැහැරැ වත්තේ පුරෙහි එකකුත් ඉතිරි නො වී මළ පසුයි.

'මර තෙමේ විශාලා මහා නුවරැ මිනිසක්හු තබාලා ඔබ්බෙහි මිනිසුන් අල්වමි දූයි ප්‍රතිඥ කළාක්හු වැන්නැ' යනු බුත්සරණය වදතයි.

82. **ගජ, තුරග සෙන් හඬ, රිය සක්, පසග තුරැ හඬ මෙ ගැම වෙසෙසින් මැඬැ බලු කැණැහිලුන් ගේ හඬ වැජැඹි.**

ඇත් සෙනගේ හඬ යැ, අස් සෙනගේ හඬ යැ, රිය සෙනගේ රිය සකින් නඟිනා හඬ යැ, (බෙර තම්මැට, දවුල්, කසිතාළම්, හොරනෑ යන) අස් අයුරු තුරු (තූර්ය) හඬ යැ යන මේ සියල්ල විශේෂයෙන් මැ යට පත් කොටැ බල්ලන් ගේත්, හිවලුන් ගේත් හඬ පැවැතිණි.

(බල්ලන් ගේ උඩුබුරලනුත් හිවලුන් ගේ හූ හඬ නාදයත් වනස අඟවන ලකුණු හැටියට අදත් මේ දිවි වැසියෝ සලකති. වසංගතයෙන් මිනිසුන් මැරෙන විටැ ඔවුනට ගොදුරු සැපයෙනු නියතැයි දූනැ හඬ නඟන එ සත්හු වසංගත පැමිණීම ඉවෙන් දනිති.

මැඬැ = ගීයේ මැඩ.

## (ඈ) තුන් බිය විපා

83. **ගැඹුරැ දිය අගල පවුරු ඉස් අතුරැ වසා පිරූ මළ මිනිසෙන් වටා අමුතු පවුරැ කළ වැනි.**

ගැඹුරු වූ දිය අගළත් පවුරේ මුදුනත් අතර වසා පුරවන ලද මළ මිනිස් කඳින් (පුර වටා) අමුතු පවුරක් කළා. වැනියි.

'පවුරින් පිටතැ සියලු භූමිය මිනී මත්තෙහි මිනියෙන් පවුර හා සම වැ උස් වියැ' (බුත්:)

පවුරු ඉස් = (ගීයේ) **පවුරිස්**

84. **දඹ දිව් තල අවට උවදුරැ නාක් එක් කොමැ නො හැරැ ගෙනැ අවුත් මරු එ පුරට එක විටැ බට වැන්නැ.**

දඹ දිව් තලය හාත් පසැ ඇති තාක් උවදුරැ එක් රැස් කොටැ (එකකුත්) බැරි නොං කොටැ ඇරැ ගෙනැ අවුත් මරුවා එක පාරට (මැ) එ පුරට බැස්සා (පිනුවා) වැනි යැ

'සියලු ජම්බුද්වීපයෙහි උපද්‍රව තාක් හැම හැකිළී මෙ පුරෙහි රැස් වූවාක් වැන්නැ' යනු එයි බුත්සරණයේ.

'කොටැ, විටැ' යනු එළි නිසා 'කොට, විට' යැයි ගීයේ යෙදී ඇති

85. **ගොඩැ ගොඩැ ඇට සැකිළි, තැනැ තැනැ තිබූ බලි බිලි, මඟැ මඟැ රෙදි වැරැලි, බලත් එ පුරැ ඇම තැන පිළිකුලි.**

ගොඩක් ගොඩක් පාසා ඇට සැකිලි යැ. තන්හි තන්හි තබන ලද බලී යැ, බිලී යැ. මඟක් මඟක් පාසා රෙදි වැරැලි යැ (එහෙයින්) බලන විටැ එ පුරේ සියලු තැන් පිළිකුල් යැ.

86. **දොරැ දොරැ මිනී බෙර, ගෙයි ගෙයි බියකර හඬැ යැ. පිළැ පිළැ මර අදිනා දුගී ගිලනුන් ගෙන් අවසර නැතැ.**

දොර කඩක් දොර කඩක් පාසා මළ බෙර යැ. ගෙ තුළක් ගෙ තුළක් පාසා බිය උපදවන වලාම යැ. පිළක් පිළක් පාසා පණ අදිනා දුකට පත් ලෙඩුන් ගෙන් ඉඩෙක් නැත්තේ යි.

අදිනා = (ගීයේ) අදින

87. **ඉසැ ඉසැ මුත වරළැ, ඇසැ ඇසැ හෙන කඳුළු ඇලියැ, කුසැ කුසැ සා ගිනි යැ, බසැ බසැ කියන දුකුලවූ මැ වී යැ.**

ඉසක් ඉසක් පාසා මිදුණා වූ (හෙවත් ලිහුණු) කෙස් වැටිය යැ. ඇසක් ඇසක් පාසා වැටෙන්නා වූ කඳුළු දහර යැ, කුසක් කුසක් පාසා සුදඟ ගිනි (සා ගිනි) යැ, වදනක් වදනක් පාසා (කියන්නා වූ) දුක් උලවු මැයි.

'දෙරැ දෙරැ මිනී යැ. ගෙයි ගෙයි වලාමැ. ඇසැ ඇසැ කඳුළු යැ. සිතැ සිතැ ශෝක යැ. ගෙයි ගෙයි කණ්ඨගත ප්‍රාණා වැ හොත්තා වූ අනාථ සත්ත්වයන් ගේ බැගැ පත් හඬ යැ. පවුරින් පිටතැ සියලු භූමිය මිනී මත්තෙහි මිනියෙන් පවුර හා සම වූ උස් වී යැ. × × × සියලු ජම්බු ද්වීපයෙහි උවදුරු තාක් හැම හැකිළී මෙනුවරෙහි රැස් වූවාක් වැන්නැ'යි බුත් සරණය 83. 84 86. 87 යන පැදිවලින් අඟවන පවත පළ කරයි.

දුක් උලවු = (ගියේ) දුකුලවූ

88. **අතැ අතැ කඩ කබලැ, ගතැ ගතැ ඉපිලි නහර යැ, වතැ වතැ බැඟෑ හඬැ, සිතැ සිතැ වැඩුණු දල සෝ ගිනි යැ.**

අතෙක්හි අතෙක්හි කැඩී ගිය හිඟන කබල් යැ, ඇඟෙක්හි ඇඟෙක්හි ඉල්පුණු (මතු වුණු) නහර යැ, මුඛයෙක්හි මුඛයෙක්හි බැගෑ බව අඟවන (දුක් මුසු) හඬ යැ, සිතෙක්හි සිතෙක්හි දියුණු වූ දැඩි ශෝක ගිනි යැ.

අතෙක්හි අතෙක්හි කැඩී ගිය හිඟන කබල් යැ, ඇඟෙක්හි ඇඟෙක්හි ඉල්පුණු (මතු වුණු) නහර යැ, මුඛයෙක්හි මුඛයෙක්හි බැගෑ බව අඟවන (දුක් මුසු) හඬ යැ, සිතෙක්හි සිතෙක්හි දියුණු වූ දැඩි ශෝක ගිනි යැ.

## 5. බිය රජුනට සැළ කිරීම

88—102

89. **එ නුවරැ රුදුරු බිය තුනෙකින් සැපැමිණි උවදුරු බලා, නැඹුරු ඇදුරන් ගෙනැ ඇතුළු නුවරම වන්නු.**

එ නුවරෝ රෞද්‍ර වූ බිය තුනෙකින් සැපැමිණියා වූ උවදුරු බලා (තමන් ගෙන් වැඩක් නුවූයෙන් බිඳුණු මාන ඇති හෙයින්) නැමුණා වූ ඇදුරන් ගෙනැ ඇතුළු නුවරට වැදුණෝ යැ.

90. **උන් උන් වෙතැ පිය බස යොදමින් සහ තොස සිතින් උන් රජ මැති පිරිස නමැදැ ඇති තතු මේ ලෙසැ කිවු යැ.**

(එ නුවරෝ) ඔවුනොවුන් කෙරේ පිය බස් කියමින් (හෙවත් ඔවුනොවුන් පිය වදන් බෙණෙමින්) සතුටු සිතින් උන් රජ මන්ත්‍රි පිරිසට නමස්කාර කොටැ ඇති පවත් මෙ සෙයින් කිවාහු යැ.

'මේ ලෙසැ' = (ගීයේ) **'මේ ලෙස'**

91. **දැඩි දුක් බික් දුතෙකි, කිසි වෙද කමක් නො කළැකි සැඩ රෝ දුක් බියෙකි, යකුන් ගෙන් වන මහත් වනසෙකි.**

තද සාගත බියෙක් යැ, කිසි වෙද පිළියමක් නො කළ හැක්කා වූ, දරුණු රෝග දුකින් පැමිණෙන බියෙක් යැ, යකුන් ගෙන් සිදු වන්නා වූ මහත් වනසෙක් යැ.

නො කළ හැකි = (ගීයේ) **නො කළැකි.**

92. **වැසි නැති වියත වී කෙත් වත් විපතැ වී, ගං හෝ දිය තැවී ගිය, නොයෙක් තුරු ලිය ද පතිතවී.**

වැසි නැති අහස ඇති වීමෙන් කුඹුරු නැසුණේ යැ, ගඟේ තොයේ දිය සිඳී ගියේ යැ, නොයෙක් ගස් වැල් ද වැටුණේ යැ.

93. **තොාදු ගානා තණක්, තදු තෙමෙන පමණක් දිය, තුරු සෙවණක් නැති වැ සිවුපාවුනට දියුණක් දුකෙකි.**

තොලු ගාත පමණකට තණක්, තලු තෙමන පමණට දියක්, ගස් සෙවණක් නැති වීම නිසා සිවුපාවුනට දෙගුණ- දුක් යැ.

'මෙ නුවරැ දුර්භික්ෂ භය යැ, අමනුෂ්‍ය භය යැ, රෝග භය යැ යි යන මේ මහත් වූ තුන් භයෙක් ඇති වියැ......... ක්ෂේත්‍රයෙහි ශස්‍ය නැති වියැ. වැව් අමුණුවලැ දිය නැති වියැ. අහසෙහි වැසි නැති වියැ. කොටු ගෙවලැ පිරූ ධාන්‍ය සඤ්චය නැති වියැ. බිමැ තණ නැති වියැ. තලු තෙමන පමණක් පැන් නො ලබන්නා වූ, තොලු ගානා පමණක් තණ නො ලබන්නා වූ සියලු චතුෂ් පදික ජාතීහු මියැ වැගිරැ ගිය හැ.' යන බුත්සරණයේ පවත 91, 92, 93 යන පැදි- වලින් පැවැසෙන පවත් හා එක් මූණුවර ඇති සෙයක් පෙන්වයි.

94. **පෙරැ සොඳුරු රුසිරින් සුර අඟනන් වැනි අඟනෝ මස් ලේ නැති බැවින් උදක් හෙසි හෙසි යකින්නන් වැනි.**

'දිව්‍ය ස්ත්‍රීන් හා සමාන වූ ස්ත්‍රීන් ගේ ශරීරයෙහි ලේ මස් නැති වැ ඇට සම් මාත්‍රයක් තුබූ හෙයින් ඔහු හැම ගෙයි ගෙයි යකින්නන් වැන්නැ' (බුත්:).

ආදි මනා වූ රූ සිරිත් දෙව් ලියන් බඳු වූ ගෑනු (අඳ, ඇගේ) මස් ලේ නැති හෙයින් තනි කැරැ මැ ගෙවල යැකිනියන් බඳු වෙත්.

සුර අඟනන් – (ගීයේ) සුරඟනන්

95. **නොයෙක් උක් මී රස බියෙන් පර දෙසැ ගිය වැනි. සුලබ පස් ගෝරස ඇතැයි යන තෙන් බස දුලබ වියැ.**

නො එක් විදියේ උක් රස, මී රස (උවදුරු) බියෙන් පිට රට ගිය වැනී සි. (පෙරැ) සුලබ වූ (කිරි, දී, වෙඩරු, ගිතෙල්, මෝරු යන) පස් ගෝ රස ඇතැයි කීම ද දුලබ වූයේ සි.

96. **පෙර සත සිත ලෙසින් මනා සුවඳින් නෙවුනා කපුරු කස්තුරු දුන් මෙ පුර තපුරුයි දමා ගිය වැනි.**

ගිය දවස්හි මිනිසුන් සිත් සේ හොඳ සුවඳින් (යුතු වැ) පවත්නා කපුරු, කස්තුරු දුන් මෙ පුර තපුරු යැ කියා (එ) දමා ගිය සේයි.

ලෙසින් = (ගීයේ) ලෙසිනි
සුවඳින් = ,, සුවඳිනි
දුන් = ,, දුනි

තපුරුයි (තපුරු යැ යි) (1) තපුරු යැ කියා (2) (පුරෙක් නො වේ කියා) හෝ.

97. **අට අඟ සිල් නැති වැත් ඇගැ සුවඳ ගැමෙක් නැතැ.** බඹ **සර** මඟැ **පිහිටි අය සේ වැ ලිය සඟ දුරු ලූ යැ.**

අට අඟින් යුතු සිල් (අට සිල්) නැති වැ දූ ඇගේ සුවඳ ගැමෙක් නැති බඹසර මඟැ පිහිටි අය බඳු වැ ස්ත්‍රී සංසර්ගය දුරු කළහ.

(අට සිලෙහි දී සත් වැනි වැ 'නච්ච ගීත වාදිත විසූක දස්සන මාලා **ගන්ධ විලේපන** ධාරණ මංඩන විභූසණ' වැරියැ යුතු හෙයින් එ සිල් රක්නෝ ඇගේ සුවඳ නො ගල්වති).

අට අඟ = (ගීයේ) අටඟ
ඇඟැ = ,, ඇඟ
ලූ යැ = ,, ලූයැ

98. **නිති සිල්වත් දනන් සේ දුසිරි මඟ නැවැති. කව් නළු රසින් ඉවති. නටන නටවන අයෙක් නම් නැති.**

නිබඳ සිල්වත් දනන් ගේ සෙයින් දුශ්චරිත මාර්ගය නැවැත්තේ යැ. කව් නළු දෙක රසින් ඉවත් යැ (හෙවත් නීරස යැ). (එ නිසා) නටන අයෙක් නම්, නටවන අයෙක් නම් නැත්තා හ.

නටන්නෝ නටයෝ යි. නටවන්නෝ නච්චකයෝ යි. ('නටා නාම රංගනටා, නච්චකා ලංඝකාදයෝ' වි: මා: ටී).

99. **දූනෙන් සිත එකඟ වූ මෙන් කෙළි සිනා නැතැ. දුහඟ පිළිවෙතැ පිහිටි අය මෙන් නො සිඟන කෙනෙක් නැතැ.**

ධ්‍යානයෙන් සිත එක් අරමුණෙකැ පිහිටියා සේ කවට සිනා නැත්තේ යි. ධූතාංග ප්‍රතිපත්තියෙහි පිහිටි තැනැත්තන් සෙයින් සිඟන්නේ නැති කෙනෙක් නැත්තා හ

දූහැනය නම් සිත එකඟ කිරීමෙහි අරමුණෙකැ එල්ලීමයි. ධූතාංගයෝ තෙළෙසෙකි:—

පංසුකූලික
තේචීවරික
පිණ්ඩපාතික
සපදාන චාරික
ඒකාසනික
පත්තපිණ්ඩික
ඛලුපච්ඡාභත්තික
ආරඤ්ඤික
රුක්ඛමූලික
අබ්භෝකාසික
සෝසානික
යථා සන්ථතික
නේසජ්ජික

යැයි.

එයින් මෙහි සැදැහෙන්නේ සිඟීම අයත් පිණ්ඩපාතිකාංගය වේ. එ අංගය රක්නවුන් පිඬු සිඟා ගෙනැ මැ අනුභව කළ යුතු.

100. **රට වැස්සෝ දූසි දස්සෝ අයකු වට ලූ යැ. පෙරැ තිස්සෝ ඌ යැ. දූනුත් මැස්සෝ වට ලා දිවෙති.**

රට වැසි දසි දසයෝ අයකු වට ලූහ. ගිය ද (එ සෙයින් වට ලැමට) පුදුස්සෝ ඔහු යැ. දනුත් මැස්සෝ උත් වට ලා දිවෙත්.

101. **සිවු සයුරේ දිශ සෙ නිතොරැ මහ සෙනග ඇති මෙ පුරේ සැපැමිණි උවදුරේ ඔවුන් ගැණැගත හැකි යැ.**

සතර සාගරයේ දිය සෙයින් තොරක් නැති වැ මහා සේනාව ඇති මේ පුරේ සැපැමිණි (මේ) උපද්‍රවයේ දී ඔවුන් ගැණැගත හැකි සි.

'මේ තුන් උපද්‍රවය අසා සියලු දෙශාන්තර වාසීන් ගේ උප සර්පණයක් නැති වැ ගිය හෙයින් දේශාන්තරයෙන් එන්නා වූ අමුතු පඩුරෙකැ රස නො දනුම් හැ. "අද මර යැ, හෙට මර යැ" යන භයින් ආතුර වූ චිත්තයෙන් කාමානුභව තෘෂ්ණාවෙක් නම් දුරින් දුරැ වියැ. කාමාස්වාද විගමනයෙන් අප ගේ දරු මුනුබුරු පරම්පරාව පිරිහෙන්නට වනැ. එ හෙයින් මැ මේ රාජධානියෙහි එ සේ ගහන වූ මිනිස්සු දුන් ගැණැගත හැක්කා සේ ඉතා විරල යැ' යන බුත්සරණයේ පවතට 96 වැන්නේ සිටැ 101 වැන්න තෙක් පැදිවලින් පළ වන පවත සබඳ කම් දක්වයි.

නිතොරැ = (ගීයේ) නිතොරේ.

102. **ලොවට වැඩ කැරුමෙන් සැපැමිණි මෙ රජ සැපතට කිසි කම් නැති ලෙසට මෙ දුකට පිහිටක් නො වෙනු කිමෙකැ.**

ලෝකයාට වැඩ කිරීමෙන් පැමිණියා වූ මේ රාජ සම්පතට කිසි ප්‍රයෝජනයක් (කමක්) නැතුවා වාගේ මේ දුකට පිහිටක් නො වන්නේ කිමෙක් ද?

(ලොවට වැඩ කිරීමෙන් ලෝ වැසියා පහදවා ගෙනැ තම රිසි පුරා ගත හැකියි අදත්. මේ රජහු තුමූ තම අදහස සිදු කොටැ ගත්තෝ වෙති. අත් පත් වූ (පැමිණියා වූ) රජ

සැපත් ඇත්තෝ වෙති. රජ සැපත් පැමිණි හෙයින් තව දුරවත් ලොවට වැඩ කිරීමෙන් කිසි කමෙක් නැති යි සිතා මෙන් මෙ දුකට පිහිටක් නොවන්නේ ඇයි දැයි විතාළ හැටියි ඒ).

## 6. උවදුරු බියට කරුණු

103—112

**103. තම සිතැ දුකට සුදුසු, දුක් බික් දුක් මුසු නුවරුන් බස් ඇසූ නිරිඳු මෙ ලෙසින් තෙපුල් පැවැසූ.**

තමන් ගේ සිතේ දුක් ඉපැදවීමට ප්‍රමාණවත් වූ, දුර්භික්ෂ දුකින් මිශ්‍ර, නුවරුන් ගේ වදන් ඇසූ රජහු තුමූ මේ අයුරින් බස් කීහ.

(මේ හේතුන් පිණිසැ පෙරවදන බලනු යෙදේ).

**104. රජුන් අදම්වූ වත් මැතිඳො ද එ පවත් වෙති. උන් ගේ පවත් දැකැ බමුණු ගහපතියෝ ද එ ගනිත්.**

රජ දරුවන් අධර්මිෂ්ඨ වත් මැ මහ ඇමැත්තෝ ද එ පැවැතුම් ඇත්තෝ වෙති. උන් ගේ පැවැත්ම දැක්මෙන් බමුණෝත් ගෘහපති දනෝත් ඒ (පැවැත්ම) ගනිති.

**105. උන් දැකැ දනවු වැසි දන අදහමට රිසි වෙති. උන් රැකැ වෙතැ පැහැසි සුරන් සිතටත් අදම් අදහසි.**

ඔවුන් දැකැ ජනපද වාසි දනෝ අධර්මයට රුචි (ඇත්තෝ) වෙති. ඔවුන් රක්මින් සමීපයේ පැහැසුණු (සම්බන්ධ වූ) දෙවියන් ගේ සිතටත් අධර්මය අභිමත වෙයි.

**106. එ දැකැ තුරු දෙවියෝ අදහම මැ සෙවියෝ වෙති. එසින් අහසැ දෙවියෝ සිත අදහමින් නොවියෝ කෙරෙති.**

එ (පවත්) දක්මින් වෘක්ෂ දේවතාවෝ අධර්මය මැ සේවනය කළාහු වෙති. එ යින් ආකාශයේ දේවතාවෝ සිත අධර්මයෙන් නොවෙන් කෙරෙත්.

එසින් අහසැ = (ගීයේ) එසිනහසැ.

**107. මෙ ලෙසින් ලොවැ නිරිඳුන් අදහමට පැමිණි විටැ එ රදුන් නතු රටට විෂම වැ දුඩි කොට පවත් හමයි.**

මෙ ආකාරයෙන් ලොවේ රජුන් අධර්මයට පැමිණි කලැ එ රජුන් හට යටත් රටට සුළං විෂම වැ දැඩියේ හමයි.

108 **එ පවන් වැදූ නුබ ගමන් ඔත දෙව් විමන් සැලෙත සුරන් සිත කිපුණෙන් ලොවට සෙත කැරැ වැසි නො වස්වති.**

ඒ සුළං වැදී අහසේ ගමන් පත් වූ දිව්‍ය විමානයන් සැලීම වන කල්හි දෙවියන් ගේ සිත කෝප වූයෙන් (එ දෙවියෝ) ලෝකයට සෙත් කොටැ (සෙත් වන පරිදි) වැසි නො වස්වති.

ගමන් ඔත = (ගියේ) ගමනොත

109. **හිමි සඳගු ද පෙරැ සේ තොසේ යන මගැ නො යති. එ සුරන් එ සේ වන වැසි නැති වැ කලට සස් නො පැසේ.**

හිරු සඳු දෙදෙනා ද පළමු දවස්හි සෙයින් සතුටින් යුතු වැ, යන්නා වූ මාර්ගයේ නො යත්. එ දෙවියන් එ අයුරු වන කල්හි වැසි නැති වීම නිසා ශස්‍ය (ධාන්‍ය) නිසි කලට නො පැසෙයි.

110. **එක ගමෙකැ ද වැසි වසිනක් සම වැ නො වසී. ඉන් විසම වැ පිසී පැසුණු සස් වග ඉතා නො රසි.**

එක් ගමෙක්හි වුව ද වැසි වසිනත් එක් විදියකට (එතම් සුදුසු කල්හි) නො වසී. එ හෙයින් ඉන් විෂම වැ වැඩීමෙන් පැසී තුබූ ධාන්‍ය වර්ග ඉතා නො රස යැ (හෙවත් රස නිසා යැ).

පිසී = පෝෂ්‍ය වැ

**111. ඒ අහර කන බොන දන හට එසින් වෙනා වෙන රෝ දුක් වන බැවින් ලොවට වැඩ අවැඩ නිරිඳුන් ගෙනෑ.**

ඒ ආහාර කන්නා වූ බොන්නා වූ ජනයාට එයින් නොඑක් නොඑක් ලෙඩ දුක් පැමිණෙන නිසා ලොවට හොඳ නොහොඳ (පැමිණීම) රජුන් ගෙන් යෑ.

උවදුරු බියට කරුණු පිළිබඳ පවත පිණිසැ හැඳින්වීමේදී පැවැසුණු විතර බලනු යෙදේ.

බැවින් = (ගීයේ) බැවින.
ගෙනෑ = ,, ගෙන.

'ගෙන් යැ' යනු 'ගෙනැ'යි කැටි වී සිටී.

---

## 7. රජුන් පැසැසුම්

112—119

**112. එ බැවින් අප පෙර රජ සිරිත් වෙන් කොටැ ලොවට කල කී දෙය තොපට දුනෙන කියවයි නියම කොටැ කිවු.**

එ නිසා අප පූර්ව රජ චාරිත්‍ර වෙනස් කිරීමෙන් ලොවට කළ කී දෑය තොපට හැඟෙනවා නම් කියව යි අණ කොටැ කිවූ යෑ.

කොටැ = (ගීයේ) කොට.

**113. නුවරෝ එ බස් අසා නිරිඳුන් නුගුණ විමසා කිසි දෙසක් නැතිසෙන් ඔවුන් පසසා මෙ සේ පවසති.**

නුවර වැසියෝ (රජුන් කී) එ වදන් අසමින් (එ) රජුන් ගේ නුගුණ විමසා බලා කිසි දෝෂයක් නැති හෙයින් ඔවුනට ප්‍රශංසා කිරීම් විසින් මෙ අයුරු කියත්.

දෙසක් = (ගීයේ) දෙසා.

**114. සව් සතරෙහි පුරුදු, මහසත් ගුණෙන් පරසිදු, මහ පින් ඇති, මෙ බඳු පිරිසුදු නිසි කැත් කුලෙන් උපන්.**

සියලු ශාස්ත්‍රයෙහි හසළ (හෙවත් පුහුණු වූ), මහා සත්ත්ව ගුණයෙන් ප්‍රසිද්ධ වූ, මහත් පින් ඇත්තා වූ, මෙ අයුරු අමිශ්‍ර නියම ක්ෂත්‍රිය කුලයෙන් පහළ වූ–

මහා සත්ත්වයෝ නම් බෝධි සත්ත්වයෝයි. මහා සත්ත්ව ගුණය බෝධි සත්ත්ව ගුණය යි.

**115. කල ගුණ වෙසෙස දැනැ, නුවණ ඇති දනන් කි ලෙසැ ඇම දවසැ පවත්නා, බොරු බස දුරින් දුරු කොටැ වසන–**

කළා වූ ගුණ විශේෂය දැන, නුවණ ඇත්තවුන් කී පරිදි ඇම ද පවත්නා වූ, බොරු බස දුරින් මැ දුරු කොටැ වසන්නා වූ–

පවත්නා = (ගීයේ) පවතින.
ලෙසැ = ,, ලෙස
දවසැ = ,, දවස

**116. මෙරමා වැඩ කැමැති කිකරු ඇමැත්තන් ඇති රද නිති නො හැර මැ කැමැති දෙය සිදු කරන විකුම් ඇති–**

පර වැඩ (හෙවත් පරාර්ථය) රිසි, කී දෑය කරන අමාත්‍යයන් ඇත්තා වූ, රාජ නීතිය නො හැර මැ රිසි දෙය සිද්ධ කිරීමේ වික්‍රමය ඇත්තා වූ–

**117. දිනැ දිනැ උදය සිරසින් නැඟෙන රිවි විලසින් පෙර නිරිඳුන් විසින් පැවැති ලෙසට මැ වෙසෙසින් පැවැති–**

දවසක් දවසක් පාසා උදය ගිරි මුදුනින් නඟින්නා වූ සූර්යයා සෙයින් ගිය දවසේ රජුන් විසින් පැවැත්තා වූ අයුරින් මැ විශේෂයෙන් පැවැති–

දිනිඳු කවර දත් උදු ගිරි මුදුනින් නගී. ඒ සිරිත කිසිදු දිනෙකැ වෙනස් නො කරයි. මෙ නිරිඳුත් පෙරැ රජුන් පැවැති ලෙස වෙනස් නො කිරීම ද එ අයුරුයි.

බුත්සරණයේ ඇති:-

'මහ නැව පස්සේ යන ගල් වන සේ පූර්ව රාජ ධර්මය පෙර දූරි කොටැ තුමූ ඒ අනුවැ පැවැත්තා හැ' යන්නේත්

'දවස් පතා උදය රේඛාව නො හැරැ නැඟෙන හිරු සේ තමන් ගේ ධර්ම රේඛාව නො හැරැ පැවැත්තා හැ' යන්-නේත් උවමේ බිඳුමෙක් මෙහි පෙනේ.

'අප ගේ ස්වාමි මහා කුලීන හෙයින් හා දෛවය, බුද්ධිය, සත්‍යය යන මෙයින් සම්පන්න හෙයින් හා ඥාන වෘද්ධයන් කී පරිද්දෙන් පවත්නා හෙයින් හා ධර්මිෂ්ඨ හෙයින් හා සත්‍යවාදී හෙයින් හා අවිහිංසා වාදක හෙයින් හා කෙලෙහි ගුණ දන්නා හෙයින් හා බොහෝ අවගුණයන් අතුරෙහි ගුණ මාත්‍රයක් මැ ගන්නා හෙයින් හා උත්සාහ සම්පන්න හෙයින් හා අභිමත වූ කාර්ය සාධා ගැන්මෙහි දක්ෂ හෙයින් හා කීවා කරන අමාත්‍යයන් ඇති හෙයින් හා ඉන්ද්‍රිය විජයයෙන් යුක්ත හෙයින් හා කිසි රජ දරුවනට සුදුසු වූ ගුණයෙකින් හීන නො වෙති' යන බුත්සරණයේ රජ ගුණ හා මෙහි 114, 115, 116, 117 යන පැදි පළ කරන රජ ගුණන් සමයා බලනු යෙදේ.

118. **විකුමට, නිබොරුවට, දන හට දෙන මහ දනට දිවි සතර වනු කොටැ හැම විටැ සිහිපත් ඇති වැ රකිනා-**

වික්‍රමයට ද, සත්‍ය වචනයට ද, ජනයාට දෙන්නා වූ මහා දනයට ද ජීවිතය සතර වනු කොටැ සියලු කල්හි සිහි ඇති වැ රකින්නා වූ-

(මෙ රජුන් පණ ගැනැ සිතන්නේ සතර වනු කොටැ යැ. ඇමට මුල් කොටැ ඔවුන් සලකන්නේ වික්‍රමයයි. ඒ ළඟට ඔවුනට ලොකු සත්‍ය වචනයයි. තුන් වනුව ජනයනට මහත් වස්තු දීම සිහිපත් කිරීම වෙයි. ඉනුත් පසුවයි ඔවුන් පණ ගැනැ සිතන්නේ.

උඟ තුමූ දිවි නො තකා විකුම් දක්වති, දිවි යතත් බොරැ-වක් නො කියති, පණට වඩා දීම අගය කොටැ සලකති.

'ත්‍යාග යැ, සත්‍ය යැ, ශෞර්ය යැ යන මහ ගුණ තුනට ජීවිතය සතර වනු කොටැ රක්ෂා කරන්නාහැ' යනු බුත්සරණයේ එයි.

**119. සිරි සුසිරි මගේ සිපි මැතිවරන් සමඟැ නිති සතඟ රකිනා ඔබ ඇම ගේ කවර වරදෙක් ද?**

සම්පූර්ණ සුචරිත මාර්ගයෙහි පිහිටි මන්ත්‍රීවරයන් සමඟැ නිරතුරැ සප්තාංගය රක්නා ඔබ ඇම දෙනා ගේ කවර වරදෙක් ද?

(1) ස්වාමි
(2) අමාත්‍ය
(2) මිත්‍ර
(4) කෝශ (බඩ හල)
(5) රාෂ්ට්‍ර
(6) දුර්ග
(7) බල (සෙනඟ)

යැයි රජුන් ගේ සප්තාංගය දැක් වේ.

'සුසිරි' යනු මත් පිරැවීම පිණිසැ ගීයේ 'සුසිරී' යැයි යොදා ඇති. 'මැතිවරන් සමඟැ' යනු 'මැතිවරන් සමගේ'යි එළි වැටට සිටුවා ඇති.

## 8. දුක් පහවන කරුණු.

(මිස දිටු) 120—183

120. **නිරිඳෙහු එ බස් අසා මැතින් වෙතැ නෙත් සලසා නො ලසැ එ දුක් පහ වන කරුණු විමසා කියව (යි) කිවු.**

රජහු තුමූ (නුවරැත් පැවැසූ) එ වදන් අසමින් මන්ත්‍රීන් හට ඇස් යොමු කොටැ නො පමා වැ දුක් දුරැ වන කාරණ විමසා කියව (යි) කීහ.

**නිරිඳෙහු** = නර ඉඳු + හි (විබත)
නො ලසැ යනු එළි නිසා 'නොලසා'යි යෙදිණි.

### (අ) නිවට බුදුහු

121. **නිවටුන් නීවට බසැ දුවැපි සසරට පිවිවු, නට ගුණ ගුණට ගත් මැතිඳෙක් එ විටැ සෙබෙන් නැගැ සිටැ–**

නිගණ්ඨයන් ගේ නිසරු බස්හි පටලැවී සංසාරයට ඇතුළු වූ, ගුණ නැති බව ගුණය හැටියට ගත් මන්ත්‍රීන්ද්‍රයෙක් එ විටැ සභායෙන් නැඟී සිටැ -

මැතිඳෙක් = මැති ඉඳු එක්.

නට = (නෂ්ට) නැසුණු

122. **නිරිඳු පද තඹරම නම කර සෙමෙන් නැගැ සිටැ දලැ බඳ ඇඳිලි වැ සිටැ මෙ සේ තෙපුල් සබයට දන්වයි.**

රජු ගේ පා පියුමට නමස්කාර කොටැ සන්සුන් ලෙසින් නැඟී ජටායේ බඳනා ලද ඇඳිලි ඇති වැ සිටැ මෙ අයුරින් වදන් සබයට දන්වයි.

නිරිඳු = නර ඉඳු

බඳ ඇඳිලි යනු 'බඳැඳිලි'සි සන්ධි වී ඇති.
රජු ගේ (නිරිඳු ගේ) පා (පද) නිරිඳු පද යි.
තඹර (නෙළුම්) වැනි වූයේ තඹර යි.
පද මැ තඹර වූයේ **පද තඹර** යි.
'සිටැ' යනු එළි වැටේ දී 'සිට' සි සිටියේ යි.

123. **කෙලෙසුන් පසිඳැ සිටැ නිවන් පුර වැදූ සැනැහුණු 'පුරණ කසුබු' නම් ලද පවර බුදු කෙනෙක් මෙ සඳැ ඇතැ.**

ක්ලේශයන් (පව්) සුන් කොටැ සිටීමෙන් නිර්වාණ පුරයට වැදී නිවුණු පූරණ කසුබු (හෙවත් පෝරාණ කාශ්‍යප) යන නම ලැබුවා වූ උතුම් බුදු කෙනෙක් මෙ දවස්හි ඇත්තාහ.

පසිඳැ = (ගීයේ) පසිඳ
වැදූ = ,, වැද
සඳැ = ,, සඳ

'ඒ පූරණ කාශ්‍යපයා තම් දඹ දිවැ එක්තරා එක් නවානුවක් මෙල්ලාකවරුන් ඇති කෙලෙඹි පුත්‍රයාණ කෙනකුන් ගේ කෙල්ලක කුසින් කොල්ලක් හට දැ වැ උපන. සිටාණෝ "නුඹ ගේ අසුවල් මිඩි පුතකු ලදහ"යි කී බස් අසා සතුටු වැ "මා ගේ නවානුවක් මෙල්ලාකවරුන් ඇති කුලයෙහි සියය පුරා උපන් හෙයින් පූරණ යැ"යි කී යැ. එ බස ගෙනැ ශේ තෙමෙ **පූර්ණ** නම් වියැ. තබන ලද නමින් **කාශ්‍යප** න්ම් වි යැ එ සේ හෙයින් පූරණ කාශ්‍යප යැයි මෙ නමින් ප්‍රසිද්ධ වී යැයි දත යුතු.

'ඔහු බුදු වූ පරිදි **කවර** යත්:- ස්වාමි දරුවෝ ඔහු සියය පුරා උපන් හෙයිනුත් මඟුල් වහල මෙල්ලාකියා පුත්‍ර හෙයිනුත් ඔහු වෙහෙසා මෙහෙ නො ගත්තාහ. ශේ තෙමේ කර්මාන්තයක් නැති වැ, ස්වච්ඡන්දික වැ වැඩී වර්ධනය වූ කාලයෙහි දු ස්වාමි දරුවනට වැඩක් නො කෙරෙයි දවසෙකැ ස්වාමි දරුවෝ මොහු ගෙන්වා

"මෝහට ගැසිනි මෙහෙයක් නැති වැ සුව ලත මෙහෙයක් සොදමි"යි සිතා "තෝ මා ගේ වහසල් දොර කඩ රකුව"යි නියෝග කළහ. හේ තෙමේ කීප දවසක් වාසල් දොර කඩැ හිඳැ ඔබිතොබැ පෙරළ සේ ඇවිදූපියත්තට, කෙළි මොළ කම් කොටැ ස්වච්ඡන්දික වැ දවස් යවා පියත්තට බැරි බව් දැනැ "මොවුනට වැඩක් මැ නො කෙරෙමියි, දුරු රටකට මා පැලැ ගිය මැනැවැ" යි සිතා දවසෙකැ පැලැ ගියෙ.

එ කලැ ඔහු මහ වන මැදකට පැමිණි කලැ වල් සොරු ඔහු කඩ උදුරා ගෙනැ මරන්නට අල්වා ගත් හ. හෙ තෙමේ තමා ඇඟැ බල ඇති හෙයින් අත ගළවා ගෙනැ සෙලු වැ මැ ගැලැවී දිවැ මහ වනය පීරා ගෙනැ එක්තරා එක් දනවුවකට ගොස් ගම් මැදෙකැ කර බා ගෙනැ සිටියේ යැ. ගම් වැසියෝ ඔහු දැකැ "තෙපි කවර" දැයි විචාළ හ. "මෙ තෙනැ මම අනෙකක් කීම් නම් මට රක්ෂා නැතැ"යි සිතා "මා ගේ බඩ සියලු ශාස්ත්‍රයෙන් සම්පූර්ණ හෙයින් මට පූරණ යැ යි කියති. ගෝත්‍ර වශයෙන් බ්‍රාහ්මණ වංශයෙහි උපන් හෙයින් කාශ්‍යප නමි. දැන් මම රහත් වීමි "පූරණ කාශ්‍යප බුද්ධ නම් මම වේ දැ"යි කී යැ. එ වේලෙහි ගම් වැසියෝ ඔහු සෙලු බව දැකැ අනේක ප්‍රකාර වූ වස්ත්‍ර ඔහු කරා ගෙනැ ගොස් "හිමි මෙ හඳුව"යි කියති. හෙ තෙමෙ "පිළි හැන්දෙම් නම් සත්ත්වයෝ මා කෙරේ සරු නො කෙරෙති"යි සිතා "සත්ත්වයෙනි, පිළි හැඳීම නම් ලජ්ජා වැසී මැ යැ. ලජ්ජා නම් පාප ධර්මයෙකැ ඒ පාප ධර්මය සැඟැවීම රහතනට සුදුසු නො වෙයි. එ සේ හෙයින් අපි පිළි නො හඳුම් හ"යි කියා පිළි ගෙනැ නො හඳනේ යැ. එ කලැ මනුෂ්‍යයෝ ඔහු කෙරේ ඉතා පැහැදැ වඳිති, පුදති, සත්කාර කෙරෙති. බොහෝ වූ ඛාද්‍ය භෝජ්‍ය ගෙනෙති. එ කලැ පන්සියයක් දෙන ඔහු හා එක් වැ ලාභය නිසා පිළි ගලවා හැරැ ඔහු කරා තපසට වත් හ. එ තැන් පටන් හෙ තෙමේ පූරණ කාශ්‍යප නම් බුදු කෙනෙකැයි දඹ දිවැ ප්‍රසිද්ධ වියැ (පූජා:)

124. **සතන පිරිසිදු කළ, සුදු තපෝ ගුණයෙන් පිරි, සිදු කකුද, කසැයින් නමින් පරසිදු බුදු කෙනෙක් ඇත.**

සන්තානය (හෙවත් සිත) පිරිසුදු කළා වූ, ශුද්ධ වූ තපෝ ගුණයෙන් පිරුණා වූ, (සියලු ගුණ දම්) සිද්ධ කොට ගත් **කකුද කාත්‍යායන** (යන) නමින් ප්‍රසිද්ධ වූ බුදු කෙනෙක් ඇත්තාහ.

'කකුධ කාත්‍යායනයා ගේ ද උත්පත්තිය කවර යත්:- එසිදු කුල පුත්‍ර යැ. පියන් නැති වැ වැන්දඹු එකක කුසින් උපනැ. මව දුක්ඛිත හෙයින් ගෙයක් දෙරක් නැති හෙයින් ඔහු කුබුක් ගසක් මුලැ වදා හෙළා යන ලදු වි යැ. එක්තරා එක් බ්‍රාහ්මණයෙක් ඔහු දැකැ ගෙනැ ගොස් කුබුබ මුලැ දී උපන් හෙයින් කකුධ නම ලා ව්‍යවහාර නාමය හා සමහැ කකුධ කාත්‍යායන යැ යි නම් තබා වැඩී යැ. හෙ තෙමේ බමුණා මළ කලැ අනෙක් රක්ෂාවක් නැති හෙයින් තෙමේ මැ තපසට වැදැ මිථ්‍යාදෘෂ්ටි ගෙනැ "හැල් දිය නම් ප්‍රාණ යැ යි. හැල් පැන් පූවාහු බින්දු ගණනාවෙන් ප්‍රාණඝාත කළාහු නම් වෙති"යි දෘෂ්ටි ගෙනැ හැල් පැනින් අතක් පයක් නො සෝධ යි. ඇළක්, දිය වළක්, හොයක්, ගඟක් පැනැ පයැ පැන් ගා ගෙනැ එ තෙරැ ගියේ නම් "බොහෝ ප්‍රාණීන් නසා පීමි. බොහෝ දෙනාට ගහට කොටැ පීමි. මා ගේ සිල් බිඳී ගියේ යැ" යි හඬා "දඬුවම් කෙරෙමි" යි එ තෙනැ වැලි ගොඩක් රැස්, කොටැ එ තෙනැ දී නැවැතැ සිල් ඉටා ගෙනැ යෙයි. ඒ දුටු මනුෂ්‍යයෝ ද ඔහු කෙරේ පැහැදැ රහත් හයි බොහෝ සත්කාර කෙරෙති. එ සේ හෙයින් එබුදු පන්සියයක් ශිදනා ඇති කොටැ දඹ දිවැ ප්‍රසිද්ධ වියැ.' (පූජා:)

125. **දුසිරි සිත නැවැති, තපෝ ගුණයෙන් තුති ලද, අජිත කෙස් කම්බලී නම් ඇති නෙද ඇති බුදු කෙනෙක් ඇත.**

දුශ්චරිත සිත නැවැත්තා වූ හෙවත් දුසිරිත් පිළිබඳ හැඟීම් ඇති සිත අවසන් වූ, කෙලෙසුන් නැවීම පිළිබඳ ගුණයෙන් පැසැසුම් ලැබූවා වූ, තේජස් ඇත්තා වූ අජිත කේශ කම්බලී යන නම ඇති බුදු කෙනෙක් ඇතැ.

'අජිත කෙස් කම්බලයා ගේ ද උත්පත්තිය කවරයත්:- හේ තෙමෙ කුල දරුයැ. බොහෝ දෙනා ණය එල්වන හෙයින් පසිඳැ ගත නො හී තමා ගේ රට හැරැ පසල් දනවුවකට ගොස් රක්ෂාවක් නැති හෙයින් තපස් කෙරෙමි යි සිතා සියලු වස්ත්‍ර ජාතියෙන් කෙස් මුවා පලස් නම් හීන වස්ත්‍ර ජාතියෙකැ. හීනයන්ට මැ නිබී ආ දෙයෙකැයි හේ තෙමේ කෙස් මුවා පලසක් දරා, හිස මුඬු කොටැ අතැ කර වළලු ලා අජිත කේශ කම්බල නම් රහතුම්හයි ප්‍රතිඥා කොටැ "මත්ස්‍ය මාංස මැරුවතටත් පව් සරි නැ. ගස කපුවාහු, වැල කැපුවාහු මිනී මැරුවහු නම් වෙති" යනාදි දෘෂ්ටි ගෙනැ බොහෝ අඥානයන් පහදවා පන්සියයක් නිවටුන් ඇති කොටැ එයිදු ඒ ඒ තන්හි ප්‍රසිද්ධ වියැ.' (පූජා:)

කෙනෙක් ඇතැ = (ගීයේ) කෙනෙකැත.
තෙද ඇති = ,, තෙදැති

126. **දිලි තව තෙදින් ඇම තැනැ සත සතන තුටු කළ නිගට නත පුත් නමින් බබළන බුදු කෙනෙක් ඇතැ.**

දිලියෙන්නා වූ තපස් තේජසින් සියලු තන්හි සත්ත්ව-යන් ගේ සිත් සතුටු කළා වූ නිර්ග්‍රන්ථනාථ පුත්‍ර යන නමින් බබළන්නා වූ ශෝභන බුදු කෙනෙක් ඇතැ.

'නිගණ්ඨනාථ පුත්‍රයා ගේ ද උත්පත්ති කවර යත්:- එබුදු එක්තරා එක් නාථ නම් ගොවියකු ගේ පුත්‍රයෙකැ. එ සේ හෙයින් නාථ පුත්‍ර නම් වියැ. හේ ද කෛරාටික ඥාන ලදින් නක්ෂත්‍ර ගණිත නෛමිත්තිකාදි නොයෙක් පර ශාස්ත්‍ර ඉගෙනැ පන්සියයක් අතැවැස්සන් රැස් කොටැ "මම ද රහතිමි"සි නැති ගුණ කියා "මා ගේ ලෙහි කෙලෙස් ගැටෙක් නැතැ. මට නො දනෙන ශාස්ත්‍ර ගැටයෙකුදු

නැත. එ සේ හෙයින් නිගණ්ඨිමි"යි කියයි. එ කල ඔහුට "නිගණ්ඨනාථ පුත්‍ර නම් බුද්ධ යැ"යි අඥානයෝ පැහැදිය හ. යම් සැකයක් ඇති කෙනෙක් කමා කරා ගොස් විචාළෝ නම් හේ තෙමේ තමාට නො දතෙන හෙයින් කියා ගත නො හී පළමු කොට ඔවුන් හා වාදාරෝපණය කොට සැක විචාරා ගැන්මට අවකාශ නො දෙනුයේ වඤ්චිත වූ ඥානයෙන් දඹ දිව ප්‍රසිද්ධ වියැ. (පූජා:)

කෙනෙක් ඇති = (ගීයේ) කෙනෙකැති.

127. **තරු වැල මැද සඳ සෙ මෙ සදා තවුස් ගණ මැද බබළන සජය බෙලට්ටි පුත් නම් ලද බුදු කෙනෙක් ඇති.**

තාරකා පෙළ මැද්දේ සඳ (බබළන්නා) සේ මෙ දවස්හි තවුසන් සමූහය මැද්දේ බබළන්නා වූ සංජය බෙලට්ටි පුත්‍ර යන නම ලැබූ බුදු කෙනෙක් ඇති.

'සඤ්ජය බෙලට්ඨි පුත්‍රයා ගේ ද උත්පත්තිය කවර යත්:- එසිදු නමින් සඤ්ජය නම් වියැ. බෙල් ඇටක් බඳු ඉසක් ඇති හෙයින් බෙල්ලට්ඨි නම් වූ අනුන් ගේ දැසියක් හුගේ මැ පුත්‍රයෙකැ. එසිදු ස්වාමි දරුවන් විසින් නිදහස් කරන ලදුව තොයෙක් ශාස්ත්‍ර ඉගෙන මහ නුවණ ඇති වැ තර්ක වාද දැන තපසට වැද "මෙ ලෝ නැත. පරලෝ නැත. කම් නැත. කම් පල නැත. මවු නැත. පියෝ නැතැ"යි දෘෂ්ටි ගෙනැ "අපාදකයෝ මළ කල අපාදක වැ මැ උපදිති ද්විපාදකයෝ ද්විපාදක වැ මැ උපදිති. චතුෂ්පාදකයෝ චතුෂ්පාදක වැ මැ උපදිති. බහුප්පාදකයෝ බහුප්පාදක වැ මැ උපදිති. හීනයෝ හීන වැ මැ උපදිති. උත්තමයෝ උත්තම වැ මැ උපදිති. මනුෂ්‍යයෝ මනුෂ්‍ය වැ මැ උපදිති." යනාදි වශයෙන් ලෝක වාසිනට මිථ්‍යාදෘෂ්ටි කියති.ඒ අසා සමහර කෙනෙක් ගිවිසැ ඕ හට සත්කාර කෙරෙති හෙ ද පන්සියයක් රහතුනැයි නිවටුන් ඇති කොට "රහතිමි"යි කියා වඤ්චාවෙන් ඇවිද්දි' (පූජා:)

මැදූ = (ගීයේ) මැද

මෙ සඳැ = ,, මේ සඳ

**128. නිතියෙන් ලොවැ නරයන් කරන මහ පුද ලබන මක්ඛලී ගෝසාල යන පසිදු බුදු කෙනෙක් ඇති.**

නිබඳ වැ මැ ලෝ වැසි මිනිසුන් කරන්නා වූ මහා පූජා ලබන මක්ඛලි ගෝසාල යැයි කියන ප්‍රසිද්ධ වූ බුදු කෙනෙක් ඇත් යැ.

මක්ඛලී ගෝශාලගේ ද උත්පත්තිය කවර යත්:- එසිදු දඹ දිවැ එක්තරා එක් කෙළෙඹියාණ කෙනකුන් ගේ ගෙයි දසයෙකැ. හේ තෙමෙ නමින් මක්ඛලී නම් වියැ. මව ස්වාමිදරුවන් ගෙන් උදහස් අසා ගෝ ශාලයෙකැ වැදූ හොත් දවස් ඔහු වැදූ හෙයින් ගෝශාල නම් ලද හේ තෙමේ එක් දවසෙකැ ස්වාමි දරුවන් පස්සෙහි තෙල් කළයක් හිසැ තබා ගෙනැ යෙයි. එ කලැ ස්වාමි දරුවා දිය මඩ මිශ්‍ර වූ කලල් බිමක් දූකැ “දරුව සිහි ඇති වව, තෙල් කළය රකුව”යි කිය කියා යන කල්හි හෙ තෙමේ අලස වැ ඔබිනොබ බල බලා යනුයේ කණුයෙකැ පැකිලැ අනෙක් පය ඉදිරියට දමා එ පය මඩෙහි පැලැ ගොස් උඩ බලා හී තෙල් කළය බිඳැ ස්වාමි දරුවා ආ පස්ස බලන ඇසිල්ලෙහි පැනැ නැඟී මරති යන හයින් වලට දිවැ පී යැ. එ වේලෙහි ස්වාමිදරුවෝ ඔහු දිවන්නාවූ දූකැ පසු පස්සෙහි ලුහු බඳවා දිවැ පිටි මූල ගත. හෙ තෙමේ පිළිය ගලවා ස්වාමි දරුවා අතට හැරැ උපන් වන මැ ගැළැවී දිවැ වල් පිහිරා දුරැ දනවුවකට ගොස් එසේ මැ වඤ්චා කොටැ මක්ඛලී ගෝශාල නම් රහතුම්හයි බොහෝ අඥනයන් පහදවා පන්සියක් පිරිස් ඇති කොටැ ඒ ඒ තැන්හි ප්‍රසිද්ධ වියැ ’ (පූජා:)

**129. හිමි සඳ මෙ කියන බුදුන් වැඳැ මහත් නිතිපුද කළ හොත් මෙ පුර බඳ උවදුරු සෙද දුරු වෙතිසි කියැ.**

හිමි තුමෙනි මෙ කියන්නා වූ බුදුන් වැදැ නො කඩ වැ පවත් වන මහා පූජා කළොත් මේ පුරයට වැදුණා වූ උපද්‍රව වහා දුරු වනු ඇතියි කීයේ යි.

'......**කකුද කාත්‍යායන** නම් එක් සර්වඥ කෙනෙක් ඇතැ. ඔවුන් අව හොත් මේ උපද්‍රව සන්හිඳෙයි කිහ. සමහර කෙනෙක් ඔවුන් වළකා අඳුරු හැර පහන් අවුළුවන්නට තෙල් ගන්නා පිණිසැ වැලි මලු තෙල් යන්හි ලන්නා සේ "මේ උපද්‍රව සන්හිඳ වනු පිණිසැ **අජිත කේශ කම්බලි**හු මෙයට ගෙන්වුව හොත් යහපතැ"යි කී හැ. එසේ කියන්නවුන් වළකා සමහර කෙනෙක් වසත් කෙළියට සාවුන් හං පෙර මඟ බලා හිඳිනා සේ "**මක්ඛලිගෝසාල** නම් බුදුන් මෙයට වැඩිය හොත් උපද්‍රව සන්හිඳෙයි" කීහැ. එසේ කියන්නවුන් වළකා සමහර කෙනෙක් හැල් බත් පතා හකුරු වපුරන්නා සේ **නිගණ්ඨ-නාථ පුත්‍ර** නම් සර්වඥ කෙනෙක් ඇතැ. උන් මෙයට ගෙනාව හොත් මේ උපද්‍රව සන්හිඳෙයි" කීහ. ඔවුනුදු වළකා සමහර කෙනෙක් ගිතෙල් පිණිසැ ඔටු කිරි අළලන්නා සේ "**සඤ්ජය බෙලට්ඨි පුත්‍ර** නම් සර්වඥ කෙනෙක් ඇති ඒ බුදුන් මෙයට ගෙනාව හොත් මේ උපද්‍රව සන්හිඳෙයි" කී හැ' (බුත්:)

'එ කලැ දඹ දිවැ "අපි බුදුන්හ. අපි බුදුන්හ"යි කිය කියා මිථ්‍යාදෘෂ්ටි ගෙනැ ලෝ වැසියන් මුහුණැ වැලි ගසන්නා සේ වඤ්චාවෙන් ඇවිදුනා වූ, පූරණ කාශ්‍යප යැ, මක්ඛලි ගෝශාල යැ, අජිත කේශ කම්බල යැ, කකුධ කාත්‍යායන යැ, සඤ්ජය බෙලට්ඨි පුත්‍ර යැ, නිගණ්ඨනාථ පුත්‍ර යැ යි ලොව ගසා කා ඇවිදුනා වූ, සොරහු සදෙනෙක් ඇතැ. ගිනි අඟුරෙහි රස දන්නා ඔටු කුකුළන් සේ උන් උන් ගේ ගුණ ගත් මිථ්‍යාදෘෂ්ටි ගතුවෝ ඔවුන් සදෙනා ගේ ගුණ කීහ.' (පූජා:)

130. **ජඩ නිවටුන් නිසා බුදුන් යැයි නමක් පවසා ඔහු කී එ බස් අසා සෙබෙහි මැති ඳෙක් මෙ ලෙසැ පවසා.**

මෝඩ තිගණ්ඨයන් සඳහා 'බුදුන්' යැයි නමක් යොදා ඔහු කි එ වදන් අසමින් සබයේ ඇමැති තුමෙක් මෙ අයුරින් කියයි.

බුදුන් යැ යි= (ගීයේ) බුදුනැයි
එ බස් අසා = ,, එ බසසා
මැතිදෙක් = මැති ඉඳු + එක්

**131. මූ හැම දෙන පව් පින් නැත් යැයි යන නිවටෝ යැ. ලොවට මුන් ගෙන් වන සෙත ඇත ගින්නෙන් සිසිලස ලැබෙයි.**

පව් පින් නැත් යැ කියා කියන මූ සියල්ලෝ මෝඩයෝ යි. ලෝ වැසියාට මුන්ගෙන් සිදු වන ශාන්තියෙක් ඇත් නම් ගින්නෙන් ශීතලද ලැබෙයි.

'මහ රජ මෙ කී සදෙනා බුදු බවට උසුළු ගත්වන නිවටුන් බව මුත් තුමූ බුදු නො වෙති' යනු බුත්සරණයේ වදති.

නැත් යැ යි = (ගීයෙ) නැතැ යි
සෙත ඇත = ,, සෙතැත
ගින්නෙන් = ,, ගින්නෙන

**132. පව් පින් දෙක මැ නැතැ, රකිනා තපස් කම් නැතැ, ඔවුන් බුදුන් යැයි යෙත්. මෙ සේ අනුවණ කමෙක් නම් නැතැ.**

පව යැ පින යැ යි යන දෙක මැ නැත් නම් රකිනා තපස පල (කමක්) නැත්තේ යැ. ඔවුනට බුදුනැ යි කියති. මෙ හෙ මැ මෝඩ කමෙක් නම් නැත්තේ යි.

නැතැ = (ගීයේ) නැත
යෙත් = ,, යෙත
නැතැ = ,, නැත.

**133. මුන් ගෙන් සෙත වෙතියි මේ ලෙව් සත සුද කරනු වැලි මදු තෙලියතැ ලා සතත තෙල් පතා මඩිනා වැනි.**

මොවුන් ගෙන් ශාන්තිය සිදු වෙති මෙ ලෝ සතුන් (මුන්) පුද කිරීම පැහැ කදේ වැලි මලු දමා තිබද තෙල් ලබා ගනු පිණිසැ මිරිකතවා වැනි.

න ද ත මුනිඳු හැර අන් සුරනට පැවත
නි ව ත පතා අනුවණ සත කරත තැත
ල බ ත පිණිසැ තෙල් ලොබ වඩවමිනි සිත
ම ඞ ත වැත්තැ වැලි මලු ලමිනි තෙලියත

යැයි අලගියවන්න රාලහාමියා ද මෙ සරණ යයි.

'අඳුරු හැර පහන් අවුළුවන්නට තෙල් ගන්නා පිණිසැ වැලිමලු තෙලියත්හි ලන්නා සේ' (බුත්:).

තෙලියතැ = (ගීයේ) තෙලියත

**134. එ බැවින් බොරුවෙන් බඩ වඩන ජඩ මුන් දුර ඇර සිවු වේ නො ඤඩ දත් බමුණන් ඇර ගෙනැ ලෝ වැඩැ කරව.**

එ නිසා බොරුවෙන් උදර පෝෂණය කරන්නා වූ මෝඩ වූ මොවුන් දුරැ කොටැ සිවු වේදය නො බිඳැ දත්තා වූ බමුණන් පමුණුවා ගෙනැ ලොවට සෙත කරවන්නැ.

දුර ඇර = (ගීයේ) දුරැර
ඇර ගෙනැ = ගෙනැර

ඍක්, යජුස්, ශාම, අථර්ව යනු සතර වේදයේ නම් යැ.

**135. ගහ කැන් වලඳවා, ගිනි දෙවිය හට පුදවා සොඳ වැ යාග කල, දුක් මුලින් මුදවා සෙත ඒ යැ.**

ග්‍රහ සමූහයාට (අහර) අනුභව කරවා (හෙවත් ග්‍රහ පූජා කොටැ), ගිනි දෙවියා උදෙසා පූජා පවත්වා, හොඳින් යාග කළ හොත් දුක් සහමුලින් නැති කොටැ ශාන්තිය පැමිණෙයි.

සොඳ වැ = (ගීයේ) සොඳ වා.

**136. එ මැතිඳු කී බසට මැතිදෙක් මෙ ලෙසට කියයි. ලෙඩ දුක් පත් අයට පිටැ පිටැ තවත් උවදුරු දෙයි ද?**

ඒ ඇමැතිවරයා කී වදනට (අනෙක්) ඇමැතිවරයෙක් මෙ අයුරින් කියයි. ලෙඩ දුකට පැමිණි දනන් හට ආයේ ආයේ උපද්‍රව පමුණුවයි ද?

මැතිඳු = මැති ඉඳු
මැතිදෙක් = මැති ඉඳු + එක්.

**137. බොරු වේ මතුරු බැඳැ හැම සඳැ ලෙවන් වළහන, දුලද බමුණන් ගෙන් ලොවට වැඩක් වූයේ කි කල ද?**

බොරු වේධ මන්ත්‍ර බැඳැ (ගෙනැ) නිතින් ලෝ වැසියා රවටන, මිථ්‍යා දෘෂ්ටි ගත් බමුණන් ගෙන් ලෝකයාට සෙතක් සිදු වූයේ කවර කල්හි ද?

බැඳැ = (ගීයේ) බැඳ
සඳැ = ,, සඳ

**138. අඹර ගහයෝ නම් දෙවියෝ යැ. එව් සුර පුර උදක් මන හර අම රස මිසක් අන් අහර නො ගනිති.**

අහසේ ග්‍රහයෝ නම් දේවතාවෝයි. එ දෙවියෝ දිව්‍ය ලෝකයේ හුදෙක් මනෝහර අමෘත රසය විනා අන්‍ය ආහාර නො ගනිත්.

අඹර = (ගීයේ) අඹර
සුර පුර = ,, සුර පුර

**139. එසිත් උන් පෙර කල නිකසල කුසලින් නිපන! අනෙක් කෙනකුන් කල දෙයක් උදෙසා එව් පහල නො වෙති.**

ඒත් ඔවුන් ගිය දවසේ කළ පිරිසුදු කුසලින් උපන්නෝයි. අනෙක් කෙනකුන් කළ දෙයක් උදෙසා එව් පහළ නො වෙති.

'ඒ ද' යනු 'එයින්' යැයි සිටී.

ඌ යනු මත් ගණිත නිසා 'උ' යැයි කොට වේ.

140 **සගැ නිසග සැප සිඳු දිය ලෙසැ පමණ නො කළ හැකි. එ රග නර ලොවැ සැප තණ අගැ රැඳුණු පිනි බිඳු වැන්නැ.**

ස්වර්ගයෙහි ස්වභාවික සම්පත්තිය මුහුදු ජලය සේ (මෙ තෙකැයි) ප්‍රමාණ කරනු බැරියි ඒ හැටියට මිනිස් ලොවේ සැපත තණ කොළ අගැ රැඳුණු පිනි බිඳු වැනි යැ.

141. **යම් කලැ නරෝ සිවු සිය ගවු අසලැ වූ නම් දෙවියෝ තමන් ගෙලැ දූවැටි කුණු සේ පිළිකුල කෙරෙති.**

යම් කිසි විටෙකැ මිනිස්සු යොදුන් සියයක් දුර සරියේ ද වූ නම් දෙවියෝ තමන් ගේ බෙල්ලේ ඔතන ලද කුණු සෙයින් (ඔවුන්) පිළිකුල් කෙරෙති.

'පකතියා පඤ්චාසං යෝජන සතප්පභූති මනුස්ස-ලෝකෝ දුග්ගන්ධතාය පටික්කූලෝ හෝති. (පියෙවියෙන් වතාහි මොවුනට සියක් යොදුනැ පටන් මිනිස් ලොව දුගඳ බැවින් පිළිකුලැ) යනු අටුවා යි.

'ඇසෙන විගඳ යුත් ඇඟැ සිය විතර යොදුන් තරත්......' (නිසර 29).

142. **එ බඳු සුර ලොවැ සිටැ දෙවියෝ මෙ පුරට අවුත් තමන් දුන් අහරට තුටු වැ රැකැ සිටැ සෙත කැරැ නො යති.**

එ අයුරැ වූ දෙව් ලොවේ සිටැ දෙවියෝ මෙ පුරට අවුත් රැකැගෙනැ සිටැ ලා තමන් දුන්නා වූ භෝජනයෙන් තුටු වී ශාන්තිය පමුණුවා නො යන්නා හ.

'සිටැ' යනු එළි වැට නිසා 'සිට' යැයි යොදා ඇති.

**143. දෙරින් දෙරැ සිටැ නර ලොව දෙන පුදට රිසි වන ඒ නිවට දුගී යාචකයනට සුරනැයි යනු කුමට?**

දෙරක් දෙරක් පාසා සිටිමින් මිනිස් ලෝ වැසියා දෙන පූජාව ලැබීමට කැමැති වෙනවා නම් ඒ පහත් දිළිඳු හිඟන්නනට දෙවියනැයි කියන්නේ කුමට ද?

(මිනිසුන් දෙන පුදට රිස්සෙන් දෙරක් පාසා සිටිනෝ නිවට දිළිඳු යාචකයෝයි. ඔවුනට දෙවියනැයි කියන්නේ ඇයි?)

**144. අන් ඉසුරු ගැනුමට විසිතුරු උපමා යොදා බොරු යාග කෙරෙතියි ලොවැ උවදුරු කෙසේ දුරු වේ ද?**

අනුන් ගේ සැපත් ගැනීම පිණිසැ නානාප්‍රකාර උපමා යොදමින් බොරු යාග කෙරෙතියි ලොවේ උපද්‍රව කවර අයුරින් දුරු වේ ද? (දුරු වන්නේ කෙ සේ ද?)

**145. නොයෙක් දෙය රැස් කොටැ ගිනි දෙවියාහට පුද කළ ලොවට සෙත වෙති යනු පෙරැ සිටැ පැවැති බොරු මායමෙකි.**

නො එක් නො එක් දේ එක් කොටැ ගිනි දෙවියාට පූජා කළාම ලෝකයට ශාන්තිය පැමිණෙතියි කීම ආදි සිටැ මැ පැවැති බොරු රැවටිල්ලෙකි.

(ඇ) **ගිනි දෙව් පවත්.**

**146. පෙර කලෙකැ බරණැසැ බමුණු මහසල් කුලයෙකැ නිසැක ගුණ නැණ යුත් පින් සර බමුණු උතුමෙක් උපන.**

යට ගිය දවසෙකැ බරණැස් නුවරැ බ්‍රාහ්මණ මහාසාර පවුලෙක්හි ගුණ නුවණ තිසැකින් මැ යුත් පිනින් සාර වූ බ්‍රාහ්මණ උත්තමයෙක් උපන්නේ යැ.

කලෙකෑ, කුලයෙකෑ, උතුමෙක් යන සියල්ල එළි වැට නිසා කලෙක, කුලයෙක, උතුමෙක යැයි යෙදුණේ යි.

147—154. **නැණ නැවින් සව සතර සමුදුරැ පරතෙර දැකැ, පතර ලොවැ පසිදු වැ, තමා බිහි වන දිනෙහි ගුරුවර—**

148. **නොනිවා රැකැ තබා දුන් ගිනි රැගෙනැ වනයෙකැ වැසැ, නොයෙක් අවුරුදු ගිනි දෙවිය හට පුදා දවසෙකැ—**

149. **සිහා ගිය තැනැ ලද ගොනකු ගෙනැ අවුත් 'අද මහ පුද ගිනි දෙවිය හට මසින් පුද කෙරෙමි'යි ගසැ බැඳැ—**

150. **ලුණු නැති මස් පුදට නපුරැ යි සිතා ඔහු ගමකට ලුණට යා දී වලැ වැදි දනන් එ තැනට අවුත්—**

151. **එ ගොනා මරා මස් පලහා කමින් උන් නො සරස් ගිය සඳැ එ ගොස් ගොන් නගුට, කුර, ඇට රැස් බලා—**

152. **'තෙපි අප රකිනා තබා තොප සතු ගොනා නො තබා වෙතැ තබා කන තෙක් අත බා බලා උන් කෙනෙකි—**

153-154. **එසින් ගිනි දෙවි නැතැ. උන් නැත පුදෙන් පල නැතැ. බොරු බස් ලොවැ පැවැතැ නුවණ නැති සත කරන පුදයෙකි. 'ගොන් මස් නො ලදින් ඉතින් මෙපණ කව' යි වල් අගින් දියවර ගසා එ ගිනි නිවි යැ.**

නුවණ නැමැති නැවින් (යාත්‍රා කොටැ) සකල ශාස්ත්‍ර නැමැති සාගරයේ එ තෙර දැකැ- මහත් වූ ලොවේ ප්‍රසිද්ධ වැ- තමා (මවු කුසින්) බිහි වන්නා වූ දවසේ මවු පියන් විසින් (148) නො නිවා රැකැ තබා දුන් ගිනි ඇරැ ගෙනැ වනයෙකැ

වාසය කෙරෙමින් නො එක් (බොහෝ) අවුරුදු ගණනක් ගිනි දෙවියාට පුද, එක් දවසක් (149) සිඟා ගිය තැනැ දි ලැබූ ගොනකු ගෙනැ අවුත් 'අද මහා පූජ්‍ය වූ ගිනි දෙවියාට මසින් පුද කෙරෙමි' යි ගසේ බැඳැ, (150) ලුණු නැති මස් පූජාවට නො මැනැවැයි ඔහු ලුණට ගමකට යන්නට හැරැ (ගිය පසු) වන වැසි වැදි දනන් එ තැනට අවුත් (151) එ ගොනා මරා මස් පුලුස්සා කා වහා උන් ගිය කල්හි ඒ බමුණා ගොස් ගොන් නගුට, කුර, ඇට ගොඩවල් බලා (152) 'තෙපි අප රකිනවා නිබා තොප අයත් ගොනා ළඟැ (මැ) තබා ගෙනැ ඉතිරි නො කොටැ ඝාත තෙක් අත බා (අත පහත හෙළා ගෙනැ) බලා උන් කෙනෙකි. එ නිසා ගිනි දෙවියෝ නැති, උන් නැත් නම් පුදෙන් පල නැත්තේ යි. බොරු කතා ලොවේ පැවැතී (එයින්) නුවණ නැති මිනිසුන් විසින් කරනු ලබන පූජාවෙකි. 'ගොන් මස් නො ලත් හෙයින් ඉතින් මෙ විතරක් කව' යි කියමින් වල් අගින් දියර හසා එ ගිනි නිවී යැ.

'යට ගිය දවසැ බරණැස් නුවරැ බඹදත් රජු රජය විතාරමින් සිටියැ දී මහසත් තෙමේ උතුරැ දෙසැ බමුණු කුලයෙකැ උපනි. එ දිනෙහි ඔහු ගේ දෙ ගුරුහු හුතනග (හෝමාග්නිය) දල්වා නො නිවා රැකැ තිබා ඔහු සොළොස් වියට පත් සඳැ "පුතැ තොප උපන් ද අපි තොප උදෙසා ජාතවේදය දල්වා රැක්කෙමු. තොප ගේ රිස්ස ගිහි වැසි වැ වසන්නට නම් තුන් වේදය උගනුව, නැත බඹ ලෝ වැද පරමාත්මයා හා එක් වන්නට නම් රිස්ස මෙ ගිනි රැගෙනැ වන ගත වැ බඹු ගේ සිත් පහන් වන පිරිදි එය රකුව" යි කීහ.

ගිහි වැසි බව තම සිත් නො ගන්නා බව ඔවුනට පැවැසූ හෙ තෙමේ වන ගත වැ අසපුවෙක්හි වෙසෙමින් ගිනි දෙවියා රක්නට වී. ඔහුට අසල් ගමෙකින් සිඟමන් පිණිසැ ඇරකෙක් ලැබිණි. ඌ දක්වා ගෙනැ අසපුවට එන ඔහුට ගිනි දෙවියා හරක් මසින් පුදන රිසියෙක් ඇති විණි. ඔහු කෙරේ ලුණු

නො වී. ලුණු නැති මස් ගිනි දෙවියනට බුදිනු බැරියි සිතූ හෙ තෙමේ හරකා ගසෙකැ බැඳැ ලුණු සිඟා එනු පිණිසැ ආයේ ගම් පියෙස බලා ගියේ ය.

ඔහු යා දී එ තැනට වන් වැදි රළෙකැ දනෝ හරකා මරා මස් පලහා කමින් නඟුටත් හමත් කුරත් පමණක් හැරැ ඔවුන් බිඳූ ඉතිරි සියලු මස් ගෙනැ ගියහ. පෙරළා වත් බමුණා ඒ ඉතිරි දූය දැකැ "මේ ගිනි දෙවියා තමා සතු දූය රැකැ ගත්මෙහි අපොසත් නම් මා රක්නේ කෙසේ ද? සෙතක්, වැඩක් කළ නො හැකි ඔහු උදෙසා දුක් ගැන්ම කල් නැසීමෙකි" යි පැවැසී. මෙ සෙයින් ගිනි දෙවියා පිදීමේ කැමැත්ත සියලු අයුරින් හුන් වූ හෙ තෙමේ "ගිනි දෙව් තුමෙනි, ඔබ සතුව රැකැගන්නට අසමත් ඔබ කෙ සේ මා රකිති ද? මස් නැති වැ ගියෙන් සෙස්සෙන් සැනැහෙන්නැ" යි කියමින් සොරුන් හැරැ ගිය නඟුටත් සෙසු දූයත් ගින්නට දමා:-

'කුදිටු ජාතවේදය! ඔබ සඳහා මෙන්නැ නඟුටු. එ පමණක් ද ලැබීම ඔබේ පිහිත් යැයි සලකන්නැ, නොඉඳුල් මස් අද සුන් අද නඟුටින් සැනැසෙන්නැ' යි කියා දිය එවැ ගින්න නිවා ගියේයි'. (නංගුට්ඨ ජාතකය 146)

රැකා, වනයෙකා, දවසෙකා, බැඳැ, නැනැ, පැවැනැ, නො ලදින්, ඉතිනු, වලඟින් යනු එළි වැට නිසා, රැක, වනයෙක දවසෙක, බැඳ, නැන, පැවැන, නො ලදිනි, ඉතිනි, වලගිනි යි යොදා ඇති.

**155. බමුණන් කුලැ උපන් පෙරැ කලැ නුවණ ඇතියවුන් නිසරු කොටැ හැරි කලැ එ වැනි ගිනි පුද කලැ යි කිමැ පල?**

පෙරැ මිනිස් රැසේ බමුණු කුලයේ උපන් නුවණ ඇතියවුන් නො සලකා හැරිය විටැ එ අයුරු ගිනි (දෙව්) පූජා කළා යැ කියා කිම් ද සිදු වන වැඩය?

**156. කැමැති ගිනි දෙවියා රූතී කැරැ ගෙයි ගෙයි තබා නෙ‍ාෙ නිවා රකිනා මෙ ලොවැ ගැනු දු දැනුදු ලෙඩ වෙති.**

රිසි වූ ගිනි දෙවියා රුචි කොටැ ගෙහි ගෙහි තබා ගෙනැ නො නිවා නිබඳ වැ රක්නා වූ මෙ ලොවේ ගැනුත් දූත් පවා ලෙඩ වෙති.

**157. කලෙකින් බමුණු දන තම උදෙසා ලබන දන ගිනි දෙවියා පුදනා පුදෙන් ලොවට සිදු වන පල කිම් ද?**

බොහෝ කලෙකින් බ්‍රාහ්මණ දනන් තමන් සඳහා ලබන්නා වූ ධනය ගිනි දෙවියාට පුදන පිදීමෙන් ලෝකයට සිදු වන්නා වූ ඵලය කිමෙක් ද?

**158. බමුණන් කතා ගෙනැ මෙ සතා කරවන යාග නියතැ සුවඳ ඇල් වී පතා අකුරු වපුරනා වැන්නැ.**

බමුණන් ගේ වචන අදහා මෙ දනා යාග කැරැවීම ඒ කාත්තයෙන් ඇල් වී ලබනු සඳහා ගල් කැට වපුරන්නා වැනියි.

'හැල් බත් පතා හකුරු වපුරන්නා සේ' යනු බුත්සරණයේ එයි.

(ඉ) මහ දෙව් පවත්.

**159-161. කරින් තිසුල් අවි ගත්, උගුරින් කළු පැහැ අරැගත්, අඹරින් ගත් සළු හත්, අඩක් සිරුරින් උම අඟන ගත්,-දලැ අඩ සඳ බඳිනා, ඝොර සප් හරක් පලඳිනා, දිනැ දිනැ රඟ කරනා, මහලු ගොන් වාහනෙන් ඇවිදිනා, මහ පදෙවිය ලත්, සිර සුර ගඟින් දෙවි, අනඟ රුව දුවි මහ දෙවියා පුද කරන යෙහෙකැ.**

අතින් ත්‍රිශූලායුධය ගත්, උගුරින් කළු පාට ඇරැගත් අහසින් ගත් සළු ඇඳි, අඩක් සිරිරින් හෙවත් අඩ කයින්—ඇගේ බාගෙන්— උමා අඟන ගත්තා වූ, ජටාගේ අඩ හඳ

බඳීන්නා වූ, දරුණු වූ සර්ප මාලයක් පලඳිනා, දවස ගණනේ නටන, මහලු ගොනු පිටින් ඇවිදින්නා වූ, මහ දෙව් පදෙවිය ලැබූ, හිස අහස් ගඟින් ස්ේදූ, අනංගයාගේ රූපය දැවූ මහ දෙවියා පූජා කරත් හොත් හොඳයි.

(මහ ඉසුරු ගේ අතේ තුන් හුල් අවියෙකි. එ හෙයින් ඔහුට 'තිසුලවියා' යන නම වේ. අමෘතය පිණිසැ සුරයනුත් අසුරයනුත් කිරි මුහුද කැලැඹීමෙ දී ඉන් නැඟුණු හලා හල නම් දරුණු වස ලොව නසන හෙයින් ලෝ වැඩ නිසා මහ ඉසුරු ගිල්ලේ යැ. එයින් ඔහු ගේ උගුර කළු පැහැ වූයේ යි. එයිනැ ඔහුට 'නිල් ගෙලෙ' යන නම. අහසේ සළු නැත්තේ යි. එ හෙයින් අහසින් ගත් වස්ත්‍ර ඇඳීම නම් නිර්වස්ත්‍ර වැ සිටීමයි. මහ ඉසුරු ගේ ජටා වේ අඩ සඳ බැඳැ ඇති. එ හෙයින් 'චන්ද්‍රශේඛර' යනු ඔහුට නමෙකි. මහ ඉසුරු මාලයක් සෙයින් කරේ ලා සිටින්නේ නයකු වෙතියි යෙති. ඇම ද සවසැ මහ ඉසුරු බහුරි රඟ නම් නැටුමක් කෙරේ ලු. මහ ඉසුරු ගේ වාහනය 'නන්දි' නම් මහලු ගොනා යි. මහ ඉසුරුට 'මහ' යනු යෙදෙන්නේ ඔහු ඇමට වැඩියෙන් බලවත් හෙයිනි, 'මහ' පදෙවිය ලැබූ හෙයිනි. අහස් (සුර) ගඟ බිමට බස්නේ මහ ඉසුරු ගේ ජටා මඬුල්ල වටා තුන් යලක් ගමන් කිරීමෙන් වේගය බාල කොටැ ගත් පසු ලු. දළ ඇසැ ගින්නෙන් මල්සරු දවන ලද්දේ මහ දෙවියා විසිනි).

162. **එ මහ දෙව් ඉඳු මැ හෝ, නො හොත් සිව ලිංගය හෝ වැඳැ පිදුවොත් ලොවට බොහෝ සෙත, ඇම හෝ එතී කී.**

ඒ මහ දෙව් උතුමා හරි, නැත් නම් ශිව ලිංගය හරි වැඳැ පිදුවොත් ලොවට බොහෝ ශාන්තිය, බාගෙ ද සියලු ශාන්තිය එනු ඇතැයි කී යැ.

(හැඳිනැවීම බලා මෙහෙසුරු ආදීන් හඳුනන්නැ)

**163. එ මැතිඳු බස් අසා මැතිදෙක් මෙ ලෙසැ කියසි. 'ඇති දුක් මද නිසා එ වසා තවත් දුක් ගෙනැ ලසි ද?'**

එ ඇමතිවරයා ගේ වචන අසා ඇමැතිවරයෙක් මෙ ලෙසැ කියයි. 'ඇති දුක් මද හෙයින් එ මතු පිටට තවත් දුක් ගෙනැ දමයි ද?'

'මොවුන් හැම දූන් වූයේ අපට මේ තුන් උපද්‍රවය මද යැයි කියා නැවැතැ මෙකී සදෙනා විසින් මේ මත්තෙහි උපද්‍රව ගණනක් වචන පිණිසැ යැ' (බුත්ඃ).

'ලෙසැ' යනු එළි නිසා 'ලෙසා' යි වී

මැතිඳු = මැති ඉදු

මැතිදෙක් = මැති ඉදු + එක්

**164. 'සගය, දෙවියෝ නම් සසගැ පැලැඹෙන අයෙකි. උන් රූ මන රඟ යැ. මෙ රඟැ විසුළු වෙස් ඇති නො වෙයි.'**

සගය (බාලය), දෙවියෝ නම් සදෙව් ලොවේ (හෙවත් දිව්‍ය ලෝක සයේ) හැසිරෙන්නා වූ කෙනෙකි. ඔවුන් ගේ රූප චිත්තානුකූල වෙයි. මෙ හැටි විකාර වේශ ඇත්තේ නො වෙයි.

(සසගැ, මතරඟ යැ, මෙ රඟ යැ, යනු එළි නිසාත් පද පිරීම නිසාත් 'සසගය, මත රඟය, මෙ රඟය' යි යෙදිණි.

චාතුර් මහා රාජික, තාවතිංස, යාම, තුසිත, නිර්මාණරතී, පරනිර්මිත වසවර්ති' යනු සය දෙව් ලොවයි.)

**165. උතුමෝ විළින් සත දූනැ ලියන් වෙතැ නො ඉඳිති. මෙමහෙසුරු සිය ගතැ තබා උමා කත රකිතියි කියසි.**

උත්තමයෝ ලජ්ජාව නිසා මිත්‍රුතට පෙනෙන පරිද්දෙන් ගෑනුන් කෙරේ නො ඉඳිති. මෙමහෙසුරු සිය ගතැ තබා උමා කත රකිතියි කියයි

**වෙතැ, ගතැ යනු එළි නිසා 'වෙත, ගත' සි විණි.**

166. **මෙ ලොව රැකැ පවතිනා හිරි ඔතප් දෙක නැති කලැ ඔහු වැඳැ මනා යෙක් පුද කළෑසි කි කලෙකැ වැඩ සිදු වේ ද?**

මේ ලෝකය රක්මින් පවත්නා හිරි ඔතප් (විළි බිය) දෙක නැති විටැ ඔහු වැඳැ තො එක් පූජා කළා යැ කියා කවර කලෙක්හි යහපත සිද්ධ වේ ද?

ලොව රැකි පවත්නේ හිරි ඔතප් දෙක නිසා යැ යනු බුද්ධ මතයයි. එ හෙයින් එ දෙක බෞද්ධයන් ගේ 'ලෝක පාලන ධර්මයෝ' යි. පවට ලජ්ජාව 'හිරි'යි. පවට බිය වනු 'ඔතප්' නම්.

167. **අවි අන් වැනසුමට, නැත තමා රැකුමට වෙයි. එයින් නිසුලවි හට රා දෙස් ඇතැසි මොනවට දනෙයි.**

ආයුධ අනුන් වැනැසීමට (වෙයි), නැත් නම් ආත්මා-රක්ෂාව පිණිසැ වෙයි. එයින් ඊශ්වරයාට රාග ද්වේෂ ඇතැ යනු මනා සේ දනෙයි.

ආත්මාරක්ෂාව රාගය ඇති හෙයිනි අනුන් වැනැසීම ද්වේෂය ඇති නිසා යි.

168. **රා දෙස් පව් මිදී, නිසි උතුමනට නො බැඳී, බවයෙන් බැඳී සිටි ඔහුට පැහැදී පුද කොටැ කිම් ද?**

රාග ද්වේෂ (ආදී) පාපයන් ගෙන් මිදී (එ හෙයින් පූජාවට) නිසි වූ උත්තමයකට බැඳෙන්නේ නැති වැ සංසාර පවතින් බැඳී සිටි ඔහුට පැහැදී පුද කළා යැයි (ඇති ඵලය) කිම් ද?

රාග ද්වේෂ ක්ලේශයන් ගෙන් මිදුණෝ භවයෙන් (හෙවත් සංසාරයෙන්) මිදුණෝ යැ රාග ද්වේෂාදි කෙලෙස් ඇති මේ දෙවියා සසරින් බැඳුණේ යැ. සසරින් මිදුණු උත්තමයකට නො බැඳී සසරින් බැඳුණු මොහුට පැහැදී පුද කිරීමෙන් කවර වැඩෙක් ද?

169. **සසරෙහි සබව දත්, නැණවත් සිල්වත් දනෝ තුමූ රඟ නො කෙරෙත්. අනුන් රඟන රඟ කුත් නො බලත්.**

සංසාරයේ ස්වභාවය දත්තා වූ, නුවණ ඇති ශීලවන්ත ජනයෝ තුමූ (ද) නැටුම් නො කරති, අනුන් නටන නැටුමක් ද නො බලති.

170. **එ සේ, නම් වෙස් ගෙනැ, ඇම දවසේ නටන කලැ උන් පිදුවයි ලොවට සිත සේ වැඩක් කො සේ සිදු වේ ද?**

එ අයුරින් නට වේශය (හෙවත් නටන්නකු ගේ වේශය) ගෙනැ ඇම ද නටන කල්හි ඔවුන් හට පූජා කළා යැ කියා ලෝ වැසියාට හිතේ හැටියට පලක් කෙ සේ සිද්ධ වෙයි ද?

171. **දද දන බස් අසා ඔහු උදෙසා පුද කරනු දිඹුලෙහි මල් නිසා නො ලසා දිය ඇදැ දුක් විඳිනු වැනි.**

මෝඩ මිනිසුන් ගේ කීම් අසා ඔහු (එ නම් මෙහෙසුරු) පිණිසැ පූජා කිරීම අත්තික්කා ගසේ මල් බලාපොරොත්තු-වෙන් (ගස මුලට දමනු පිණිසැ) දිය ඇදීමෙන් වෙහෙස විඳීම වැනි සි.

'ස ක ල සුර තරන් මුදුනතැ සැදූ පද
වි පු ල මුනි සරණ හැර අන් සුරන් වැද
නි ම ල මොක් පිණිස සත රකිතා දුලද
දි ඹු ල මල නිසා වෙහෙසෙන වැනි දියැද'

යැයි අලගියවන්න් රාලහාමියා ද මේ උපමායෙන් වැඩක් ගනී.

172. **අයකු පිළිකුල් වන, අයකු සිතැ රා වඩවන ලිඟු සටහන් අරැගෙනැ පුද කළැයි ඉන් වන පල කිම් ද?**

(කිසි) අයකුට පිළිකුල උපදවන්නා වූ ද, කිසි අයකු ගේ සිතේ රාගය වඩවන්නා වූ ද ලිංගයෙකැ අයුරු දක්වන සටහන් ඇරැගෙනැ (එයට) පූජා කළා යැ කියා ඉන් සිදු-වන්නා වූ ඵලය කිමෙක් ද?

අරැගෙනැ = (ගීයේ) රැගෙන.

173. **සිත දුසිරි කිලුට, මෙලොවට පින් කෙත් නො වන ඉසුරුට පුද කරනු ගලෙකැ බිජුවට වපුරන වැන්නැ.**

(සිත දුශ්චරිතයෙන් කිලිටි වූ, මෙ ලොවට පුණ්‍යක්ෂේත්‍ර නුවූ ඊශ්වරයාට (පුද) පූජා පැවැත්වීම ගලක් පිටැ (වී ආදී) බිජුවට (ඇට වර්ග) වපුරන්නා වැනි යි.

**(ඡ) වෙණු පවත්:-**

174. **යගඳ අතට ගත්, දිව ගුරුළු යහනට පත්, සමුදුර දියට වැද නත නා දරණ වැල පිටැ සැතැපී-**

යකඩින් කළ ගදා යුධය අතට ගත්තා වූ, දිව්‍යගරුඬ යානට පැමිණියා වූ, මුහුදු දියට වැදී අනන්ත නාග රජයා ගේ දරණ වැළ මත්තේ සැතැපුණා වූ -

පිටැ = (ගීයේ) පිට.

175. **තෙ දියතැ උවිඳු මැ යැ, එ සම වෙන කෙනෙක් නැතැ, පුදට නිසි ඒ මැ යැ, පුද කරන ලෙසැ මහිමය කී යැ.**

තුන් ලොවේ (පුරා සිටිනෝ) උපේන්ද්‍රයා මැ යි, ඔහු සමාන වූ වෙන කෙනෙක් නැතැ, පූජා කරනු පිණිසැ අනුභාවය කීයේ යි.

(සග, මිනිස්, පාතාල යනු තුන් දියතයි. විෂ්ණු දෙවියා එ තුන් දියත පුරා වැඩැ සිටිතියි වෛෂ්ණවයෝ කියති. ඉන්ද්‍ර (ශක්‍ර) යා ගේ මලා යැයි විෂ්ණු හට උප ඉන්ද්‍ර (උපේන්ද්‍ර) යනු පැවැසේ. ඒ ඇමැතියා විෂ්ණුහු ගේ අනු-භාවය කියේ එ පුද කරනු නිසි බව දැක්වීමට යි.

176. **උවිඳුන් ගුණ වෙසෙස පළ කැරැ මේ බස කියත, සෙබෙහි මැතිඳෙක් නිරිඳු අබියෙසැ සිටැ මේ ලෙස කියයි.**

උපේන්ද්‍රයන් (වෙන් දෙවියන්) ගේ ගුණ විශේෂය (වෙසෙස් බව) පළ කරමින් මෙ වදන කියන විටැ සබයේ ඇමැති වරයෙක් රජුන් ඉදිරියේ සිටැ මෙ අයුරු කියයි.

අබියෙසැ = (ගීයේ) අබියෙස.

177. **පැන් පවස ඇති හට ලුණු දිය ගෙනැ පොවන ලෙසැ විඳිනා මේ වෙහෙස මඳ වැ තව දුක් රැස සලසයි ද?**

දිය තත්තෙ ඇත්තා හට ලුණිජ්ජ ගෙනැ පොවන්නා සේ විඳින්නා වූ මේ පීඩාව මඳ වී තවත් දුක් ගොඩක් සලසයි ද?

ලෙසැ = (ගීයේ) ලෙස.

178. **අන්ද මන්ද! ලොව නින්දු නො බා, තා කිවත් උවින්දු පුද කැරැ වැඩක් වින්දු ඇසුවා ඇද්ද?**

අඳ බාලය! ලෝකයා ගෙන් ලැබෙන නින්දාවට බිය නැති වැ තා කිවත් උපේන්ද්‍රයා පුද කොටැ යහපතක් විඳි බවක්ඇසුවා ඇති ද?

අන්ද මන්ද = (ගීයේ) අන්ද මන්ද

179. **ඇම තැනැ උවිඳු ඇත සීතාව වෙන් වනු නැතැ. එ නිසා යුදත් ඇතැ? මේ අනත බොරු කුමට පවසයි ද?**

සියලු තන්හි උපේන්ද්‍රයා ඇත් නම් සීතාව ගේ වෙන් වීමෙක් නැතියි. ඒ නිසා යුද්ධත් ඇත් ද? මේ අනන්ත (ඉතා මහත්) බොරු කුමට පවසහි ද?

උවිඳු පොදියත පුරා සිටී නම් සීතාව කොහි සිටිය ද ඔහු කෙරේ මැ වෙයි. එ හෙයින් ඇගේ වෙන් වීමෙක් නැත්තේයි. ඉදින් ඒ එසේ නම් ඇගේ වියොවින් වන යුදත් ඇතැ?

නැතැ = (ගීයේ) නැත
අනත බොරු = ,, බොරු තත

'පවසති' යනු 'පවස ඉ, පවසයි, පවසයි' යන අයුරින් ද සිටී.

**180. වඳුරකු පිනූ මුහුදඑ තෙරු වැ යා නොහි ඉඳැ, රම් සේ බැඳැ ගියේ ල. මෙ ලොවැ දෙවියන් තෙද මෙ සේ වේ ද?**

වඳුරකු පිනුවා වූ මූදින් එ තෙර වී යනු නො හැකි වැ ඉඳැ රාමයා පාලමක් බැඳැ ගියේ ල. මෙ ලොවේ දෙවියන් ගේ තේජස් මේ අයුරු වේ ද?

(සීතාව දක්නා පිණිසැ ලක් දිවට එන හනුමතා මූදින් මෙ තෙර වූයේ එ තෙරේ සිටැ මෙ තෙරට පිනීමෙනි. වඳුරාට ද පිනීමට හැකි වූ මූදින් එ තෙර වීමට නො හැකි වී ඉඳැ-විෂ්ණු අවතාරයක් වූ-රාමයා පාලමක් බැඳැ ඒ මත්තෙන් ගියේ ලු.)

**181. මා සත්තෙන් බස අස. මෙ තෝ තක්තෙන් නො දනී. ඔහුට බිය ඇත්තේ. යගඳු යුදය ගත්තේ එසිනැ.**

මගේ ඇත්තේ වචනය (සත්‍ය බස) අසව. මේ තෝ ඇති තතුව නො දනී. ඔහු කෙරේ ද භය පවතී. යකඩින් කළ ගඳයුදය ගත්තේ එ හෙයිනි.

මා = (ගීයේ) මූ

'යා, ගඳ, ආයුදය' යනු 'යගඳයුදය' යැයි කැටි වේ.

**182. රා දෙස් සිතෙහි නො තිබිය සක් බෙල්ලකු පිඹි යැ? ඔහුට බිය ඇති කලැ නරයන් බිය කො සේ දුරු ලයි ද?**

රාග ද්වේෂ සිතේ නො තිබී නම් හක් බෙල්ලකු පිඹි යැ? ඔහුට භය ඇති කලැ නරයන් බිය කෙ සේ දුරු ලයි ද?

(සකක් පිඹින්නේ ශබ්දයට සිතේ ආශාව ඇතියෙන් වියැ යුතු. ඒ තමා රාගය. නැත් නම් සතුරනට ද්වෙෂයෙන් හෝ වියැ යුතු. එ සක පිඹීම. උවිදු සකක් පිඹිනා හෙයින් ඔහු සිතේ රාග ද්වෙෂ ඇති).

(උවිදු පවත් ද හැඳිනැවීමෙන් දත යුත්තේ යි).

පිඹි යැ = (ශීයේ)පිඹීය.

183. **ඉදිරි සෙත ලබමිසි ඔහුට කරන පුද සිරි මිහිරි තෙල් ලබනුව තබා අලලන ඔබු කිරි වැන්නැ.**

මත්තේ (අනාගතයේ) යහපතක් (ශාන්තියක්) ලබමි කියා ඔහුට කරන පූජා ශ්‍රීය (පූජා සම්පත) මිහිරි තෙල් (ගිතෙල්) ලබනු පිණිසැ තිබා ගෙනැ කළඹන ඔටු කිරි වැනියි.

'ගිතෙල් පිණිසැ ඔටු කිරි අලලන්නා සේ' යනු බුත්සරණයේ වදන් යැ.

## 9. මුනිඳුන් පවත්

### (අ) බුදු බල

### 184—216

184. **පෙරැ බුදු බණ අසා, සකාසා බුදු ගුණ උගත් මැතිඳෙක් එ විගසැ එ රද සබ මැඳැ මෙ සේ පවසා.**

ඉගනැ දී බුදු බණ (බුද්ධ ධර්මය) අසා, මනා කොටැ බුදු ගුණ ඉගෙනැ ගත් ඇමැතිවරයෙක් එ රජ සබය මැද්දේ මෙ අයුරින් කියයි.

මැතිඳෙක් = මැති ඉඳු + එක්

185. **තිලෝ නා අප මුනි හැරැ මෙ දනා කියන බස් කිරි පිරි තන හැරැ අග ඇරැ ගෙනැ කිරි දෙනා වැන්නැ.**

තුන් ලෝවට නායක වූ අප ගේ මුනි හැරැ මෙ මිනිසුන් කියන වදන් කිරි පිරි තන හැරැ අඟ ඇරැගෙනැ කිරි දේනවා වැනියි.

'කිරි පිරුණු බුරුලු තිබි යැ දී හහ ගෙනැ කිරි දෙනා සේ' (බුත්:).

තත (ගීයේ) තතා

186. **නිසසල දිව ඇස ලැබැ සියලු සක්වලැ බැලුවත් උදුල මුනිඳුන් මිසැ සත් ලොවට සෙත් සාල කෙනෙක් නැති.**

පිරිසුදු වූ දිව ඇස (දිව්‍යාක්ෂිය) ලැබී ඇම සක්වලැ මැ බැලුවත් (ඒ කොහිත්) බබළත්තා වූ මුනිඳුන් මිසැ සත්ත්ව ලෝකයට ශාන්තිය කළා වූ (අන්) කෙනෙක් නැත්.

187. **මෙර ගිර සරි ගිරෙක්, රිවි සඳ සදිසි පහනෙක්, සිඳු සරි සරෙක් නැති. එ මෙන් මුනිඳු සරි උතුමෙක් නැති.**

(මහ) මේරු කන්ද සම කන්දෙක් (නැත්තේයි), ඉර සඳ සම වන එළියෙක් (නැත්තේ යැ), මුහුදට සම විලෙක් නැත්තේ යැ. එ සෙයින් මුනිඳු සමාන උත්තමයෙක් නැත්තේ යැ.

188. **ඔහු නො වැඩි දෙස් දෙස් (නොවෙයි), ඔහු දෙසැ නො නැමි ඉස් ඉස් (නොවෙයි), ඔහු නුදුටු ඇස් ඇස් (නො වෙයි), ඔහු ගුණ නො වැකි බස් බස් නො වෙයි.**

ඔහු වැඩැ වදළේ නැති දේශ දේශ නො වේ, ඔහු දෙසට නො නැමුණු ඔළු ඔළු නො වෙයි, ඔහු නුදුටු ඇස් ඇස් නො වෙයි, ඔහු ගේ ගුණ වැකුණේ නැති වදන් වදන් නො වේ.

189. **(ඔහු) සිහි නො කළ සිත සිත (නො වෙයි), ඔහු ගුණ නො කි වත වත (නො වෙයි), ඔහු නො වැඳි අත අත (නො වෙයි), එ සරණ නො ගත් සත සත නො වෙයි.**

(ඔහු) සිහි නො කළා වූ සිත සිත නො වෙයි, ඔහු ගේ ගුණ නො කී මුඛය මුඛය නො වෙයි, ඔහු වැන්දේ නැති අත අත නො වෙයි, ඔහු සරණ නො ගිය සත්ත්වයා සත්ත්ව-යෙක් නො වෙයි.

(කට හෙවත් මුඛය යන අරුත්හි 'වත' යනු යෙදීමත්, 'සත නො වෙයි' යන යෙදීමත් එ තරම් සුදුසු යැයි නො පෙනේ.)

**190. (ඔහු) සිහි නො කළ දින දින (නො වෙයි), ඔහු බස් නො වන් කන කන (නො වෙයි), ඔහු ගුණ නො දත් පැන පැන (නො වෙයි), ඔහු මුල් නො කළ පින පින නො වෙයි.**

(ඔහු) සිහි නො කළ දවස දවස නො වෙයි, ඔහු ගේ වදන් නො වැදුණු කන කන නො වෙයි, ඔහු ගේ ගුණ නො දත්තා වූ ප්‍රඥව ප්‍රඥව නො වෙයි, ඔහු මුල් කොට නො කළ පින පින නො වෙයි.

**191. මුනිඳුන් නුදුටුවෝ බව දුකට බවුවෝ වෙති. එ මුනි සඳ දුටුවෝ ඔහු මැ වෙති මොක් සැපත දුටුවෝ.**

බුදුන් නුදුටු දනෝ සංසාර දුකට බැස්සෝ වෙති. ඒ මුනි උතුමා දුටුවෝ (වෙත් නම්) නිවන් සැපත දුටුවෝ ඒ තැනැත්තෝ මැ වෙති.

**192. මුනි බණ නො ඇසුවෝ සසර බැසැ විසුවෝ වෙති. ඔහු ගෙ බස් ඇසුවෝ, සසර දුක් නැසුවෝ ඔහු මැ වෙති.**

බුදුන් ගේ බණ නො ඇසූ දනෝ සසරට බැසැ වුසුවෝ වෙති. එ තුමා ගේ වදන් ඇසුවෝ (වෙත් නම්) සසර දුක් නැසුවෝ (හෙවත් නිවන දුටුවෝ) ඒ තැනැත්තෝ මැ වෙති.

**193. මුනි බසැ රස නො දන්නෝ (වෙත් නම්) නො දන්නෝ ඔහු මැ යැ. ඔවුන් ගුණ දන්නෝ (වෙත් නම්) සග අපවග සැප දන්නෝ උහු මැ යැ.**

බුදුන් ගේ බණෙහි රස නො දන්නෝ (වෙත් නම්) අවිද්‍යායේ ගැලුණෝ එ තැනැත්තෝ මැයි. උන් වහන්සේ ගේ ගුණ දන්නෝ වෙත් නම් දෙව් සැප දන්නෝ එ තැනැත්තෝ මැයි.

ඌ මැ යැ = (ගීයේ) උම යැ.

සග අපවග = සග පවග.

194. **අන්ද මන්දෙ කිමෙකින් කුමන්දෙ නො දනිති. මුනි සරණ වැන්දෙ (වෙත් නම්) සැප සිඳු වැද කිමින්දෙ ඌ මැ යැ.**

අඳ බාලයෝ කිමෙකිත් කිමෙක් දැයි නො දනිති. බුදුන් ගේ පා වැන්දේ (වෙත් නම්) සැප නැමැති සාගරයට වැදී (එහි) කිමිදියෝ එ තැනැත්තෝ මැ වෙති.

195. **බඹ සුර නිරින්දෙ මුනි පද තඹර වැන්දෙ, මුදුනැඳිලි බැන්දෙ, අත් බැවෙහි පල වින්දෙ ඌ මැ යැ.**

බ්‍රහ්මයෝ යැ, දෙවියෝ යැ, නරනාථයෝ (රජහු) යැ යන මූ බුදුන් ගේ පා පියුම වැන්දේ යැ. මුදුනේ ඇඳිලි බැන්දේ යැ (හෙවත් දෙහොත් මුදුනේ බැඳැ වැන්දේ යැ), ආත්ම භාවයෙහි (සිරුරක් ලැබූ උපතෙහි) ප්‍රයෝජනය වින්දේ ඒ තැනැත්තෝ මැයි.

නිරින්දේ (= නිරිඳෙ) නර ඉන්ද්‍ර + ඕ.
මුදුනැඳිලි = මුදුනැ ඇඳිලි.

196. **දිමු කිළුටු වන්නෝ පසු තැවිලි වන්නෝ වෙති. ඔහු සරණ වන්නෝ (වෙත් නම්) බව පර තෙරට වන්නෝ ඌ මැ යැ.**

දෘෂ්ටිය කිලිටි වත්තෝ (හෙවත් මිථ්‍යාදෘෂ්ටි වත්තෝ) පශ්චාත්තාප වත්තෝ වෙත්. ඔහු (එනම්, මුනිතුමා) ශරණ පරායණ වත්තෝ (පිහිට කොටැ පැමිණියෝ) ඌ මැ වෙති.

197. **තම බස වන් සවන්, රූ වන් දෙනුවන් සතපා සැදූහෙන් වන් ලෙවන් මහ සැපත වන ඵ නිවන් බහසි.**

(ඵ උතුමා) තමා ගේ වදන් වැදුණු කන් (සතප්පා) රූව වැදුණු ඇස් සතප්පා (තමා වෙතට) සැදූයෙන් පැමිණි ලෝ වැසියා මහ සැපත වන ඵ නිවනේ ලයි.

රූ වන් = (ගියේ) රූ වන්.

198. **බව දුක් ගිනි නිවන, සත මග පෙලෙන් පිත-වන තිලෝ ගුරු මුනිඳුට සරි වන දෙවන කෙනෙක් නැත.**

සසර දුක් නැමැති ගිනි නිවන්නා වූ, සතුන් (සතර) මග (සතර) පලයෙන් පිනවන්නා වූ, තුන් ලොවට ඇදුරු වන මුනිඳු හට සරි වන තවත් කෙනෙක් නැති.

මුනිඳු = මුනි + ඉඳු

199. **සග මොක් සැප දෙවති, අවා බිය දුක් නව තති. ඔවුන් මුත් ලොවට පිරි මෙත් කුලුණු ඇති උතුමෝ නැති.**

ස්වර්ග මෝක්ෂ සම්පත් දෙවති, අවා බිය නැමැති දුක් නවතති, (ඵ හෙයින්) ලෝ වැසියා කෙරේ පිරුණු මෛත්‍රී කරුණා ඇති උතුමෝ ඔවුන් මිසැ (වෙන) නැත්තා හ

200. **උන් උන් තැන් පුදා, උන් වන දෙසට නැමැදැ (සත) බව දුක් මුදා යෙති. උන් මහිම පහදා කියනු කිමැ?**

ඔවුන් ඉඳැගත් ස්ථානයට පූජා කොටැ ඔවුන් සිටිනා දෙසට නමස්කාර කොටැ (දනෝ) සසර දුක් මුදා යෙත්. (ඵ හෙයින්) ඔවුන් ගේ අනුභාවය විස්තර කොටැ කියන්නේ කුමට ද?

201. **උන් වැළැඳූ පය ද, උන් පද ලස් ඇති පහණ ද, උන් පිට දුන් රුකා ද පුදා (සත) දුක් සිඳැ මොක් සැප ලබති.**

ඔවුන් (දත්) වැලැඳූ පාත්‍රය ද, ඔවුන් ගේ පාද ලාඤ්ඡනය ඇති ගල ද, ඔවුන් පිට දුන් ගස ද පූජා කොටැ (දනෝ) දුක් තසා නිවන් සුව ලබති.

පද ලස් ඇති = (ගීයේ) පද ලසැති.
සිදැ = ,, සිද

102. **ඒ මොක් පුර වන් දූසි, සෙත දෙන්ට පිළි-වන් දූසි කුමන් දූසි නො කියව. තමා පද ගිරි තුරුදු වන්දසි.**

හෙ තෙමේ නිවන් පුරට වැදුණේ ද සි, සෙත දීමේ සමත් වේ ද සි කිමෙක් ද සි (සැකින්) නො කියව (හෙ තෙමේ) තමා ගේ පා ගල් ගස් ලා ද වඳ ව සි.

203. **තම රුව දුටු නෙතට, තම ගුණ සිතු සතනට දුක් නො වදින ලෙසට නිසි, මඟ දහම් මෙ ලොවට දෙසි යැ.**

තමා ගේ රූපය දුටු ඇසට, තමා ගේ ගුණ සැලැකූ සන්තානයට දුක් නො වදිනා පරිද්දෙන් උත්තම වූ ධර්මය ලෝ වැසියාට දෙසුයේ සි.

දෙසි යැ = (ගීයේ) දෙසි යැ

204. **මිස දිටු මුල් උපුළෙල්, අට අඟ මඟැ බිජු වපුළෙල්, දහම් ගඟ දිය අළෙල්. සෙත දිශත පතළෙල් ඔවුන් ගෙත් යැ.**

(හෙ තෙමේ) මිථ්‍යාදෘෂ්ටි මූල් ඉදිරි යැ, අෂ්ටාංගික මාර්ග නැමැති බිජුවට වැපිරී යැ, ධර්ම නැමැති ගංගා ජලය පැමිණැ වී යැ. ශාන්තිය ලොවේ පැතුරුණේ ඔවුන් ගෙන් යැ.

මූල් උපුලේ = (ගීයේ) මූලුපුලේ
අට අඟ = ,, අටඟ
දිය අලේ = ,, දියලේ
ගෙත් යැ = ,, ගෙතැ

අටඟ මඟ යැයි කියේ අට අරී මඟට සි.

සම්මා දිට්ඨි (දිටු)
,, සංකප්ප (විකප්)
,, වාචා (තෙපල)
,, කම්මන්ත (කම)
,, වායාම (වැර)
,, සති (සිහි)
,, සමාධි (එකඟ)

යැයි අරි මඟ අට අඟ දක්වේ.

(හේ) මුල් උපුලේ
,, බිජු වපුලේ
,, දිය අලේ'යි පවසා යළි 'ඔවුන්' යනු යෙදීම එ තරම් මත රම් නො වේ. එ හෙත්:—

'මෙ මා බසැ දෙස ඇතත් එ දමා......මුනි ගුණ අමා ගනුව'යි මුලින් කි හෙයින් අපට එ ගැනැ කතා නැති.

205. **දියැ සේ බිමැ ගිලෙත, බිමැ සේ දියෙහි ඇවිදිත, අහසැත් එ මැ කරත සමත ප් මුනි මිසක් වෙත නැතැ.**

·දියේ මෙන් බිමැ ගිලෙත් හොත්, බිමැ සෙයින් දියේ ඇවිදිත් හොත්, අහසේත් ඒ මැ කරත් හොත් සමතෙක් ඒ මුනි හැර වෙතැ නැත්තේ යි.

206. **දිනැ දිනැ දිනිඳු මෙන්, ඛර රස නො වන සිඳු මෙන්, නො නැසි විඳු කිඳු මෙන් අඩු නො වන පුන් සඳු මෙන් වැජැඹි.**

දිවා කලැ හිරු මෙන් ද, ලුණු රස නො වන්නා වූ මුද මෙන් ද, නො මැකෙන විදුලි කාන්තිය මෙන් ද, අඩු නො වන්නා වූ පුර හඳ මෙන් ද (එ මුනි තෙමේ) පැවැත්තේ යි.

'......ඛර රස නැති... මහ මුහුදක් සේ... නො නැසී සිටිනා විදුලියක් සේ...' (බුත්:).

දිනිඳු = දින + ඉඳු

267. **ලෙඩට දිව ඔසු සේ, මරු කතර පුල් විල සේ, දෙර දෙරෙහි පිහිටි කප් තුරු සේ දුකෙහි එක සේ පිහිටා.**

ලෙඩෙහි දී දිව්‍ය ඖෂධයක් මෙන් ද, වාලුකා-කාන්තාරයෙහි පිපුණු විලක් මෙන් ද, දෙරක් දෙරක් පාසා පිහිටි කප් රුකක් මෙන් ද දුකෙහි එක් අයුරු පිහිටි යෑ (එ මුනි තෙමේ).

එක සේ පිහිටා = (ගීයේ) පිහිටෙක සේ.

268. **මරණට ළං වැ සිටැ වැඳැ හොත් එ සක් දෙව්ඳුට එ මැ විටැ එක බසින් තෙ කෙළ සැට සුවහස් ආයු දිනි.**

මරණයට ළං වී සිටැ වැඳැ ගෙනැ හොත්තා වූ ශක්‍ර දිව්‍ය රාජයාට එ වෙලේ මැ එක් වදනින් තුන් කෝටි හැට ලක්ෂයට ආයු දුන්නේ යි.

සක් දෙව් රජුට මිනිස් ගණනින් අවුරුදු තුන් කෙළ සැට ලක්ෂයකට ආයු ඇති. එ ද සිටි සක් දෙව් රජ තෙමේ ආයු පිරිහුණු බව පළ වන පස් පෙර නිමිති දුටුයේ පුරය, විජයත් පාය, සුදම් සබය, පරසතු රුක, පඬුඇඹුල් සලසුන, අඩු තුන් කෙළක් දෙව් අඟනන්, දෙදෙව් ලොවේ දෙව් සෙන්, නඳුන් උයන ඈ සක් සැපත් සඳහනින් 'මෙ සා සැපතෙකින් පිරිහෙමි'යි වෙවුලා තමා මරණින් මුදවන්නට සමත් කෙනකුන් නැති බව සිතා බලා දැනැ බුදුන් දක්නා රිසියෙන, අවසර කොටැ ගන්නා පිණිසැ දෙවියනුත් කැඳවා ගෙනැ පන්සිළුවා පෙරදැරි කොටැ ගෙනැ ගොස් එ දවසැ රජගහා නුවරට පැදුම් දෙසෙහි මහ අඹ වනයක් අසැ වූ අඹ සැඩ නම් බමුණු ගමට උතුරු දිගැ වේදිස පවුයේ ඉන්ද්‍රශාල ගුහායේ වැඩැ වසන බුදුන් දක්නට අවසර කරවා ගෙනැ එහි ගොස් බුදුන් වැඳැ හිඳැ ආයු ගෙවා සැවැ (ච්‍යුතවැ) නො නැඟෙයි. බුදුහු ඔහු මළ සේ දැකැ ආයු වැඩෙන පිනක් ඇත් දැයි ජාති දහසක් බලා එක් ජාතියෙකැ මලස්නෙකැ

මලා ගිය මලෙහි පැන් අතලොස්සක් මොහු ඉසැ ලූ පිනක් දැකැ ආයු ලබන පින් ඇති සේ යැයි දැනැ 'ශක්‍රය සහ පිරිවරින් ආයු බොහෝ වව' යි වදාළහ. ඒ හා සමග මැ තුන් කෙළ සැට ලක්ෂයක් අවුරුද්දට ආයු ලදින් නැගී සිටියේ යැ. තමා මැරී යළි උපන් බව දෙව් රජ දත්තේ යි. බුදු රජ ද දත්තේ යි. සෙස්සෝ නො දත් හ.

ඒ සක් දෙවිඳු ආයු ලත් පරිදි යි. එයින් ඇඟෙන්නේ සක් දෙව් රජු මැරී එ සැණේ එ කයේ මැ යළි උපන් බවයි. (විතර පුවත් පූජාවලියේ දෙවිසි වන පරිච්ඡේදයෙන් දත්තේ යි).

'ආයු බොහෝ වේවයි වදාළ බස් පමණෙකින් වැදැ ගෙනැ හෙවැ මළ සක් දෙව් රජ හට තුන් කෙළ සැට ලක්ෂයක් හවුරුද්දට ආයු දුන්' යනු බුත්සරණය කියන හැටියි.

දෙවිඳු = දෙව් + ඉඳු.

209. තුන් පියවර තබා තිදස පුරවර වැඩි කාලැ පවර මුනි සඳු ගේ සිරි සර කො සේ පැවැසියැ හැකි ද.

තුන් පියවර තිබීමෙන් (පියවර තුනින්) දෙව් පුරවරයට වැඩිය කොටැ උතුම් වූ මුනි උතුමා ගේ ශ්‍රී සාරය කී සෙයින් කියනු හැකි වේ ද?

(තිදස පුර නම් දෙව් පුරයි. තුන් වන යොවුන් දසාව ඇම කලැ පවත්නා හෙයින් දෙවියෝ 'ත්‍රි දශයෝ' යි).

ගණ්ඩඹ රුක් මුල්හි යමා මහ පෙළහර පෑ බුදු රදුන් ඉක්බිති පෙර බුදුවරුන් පිළිපන් සිරිත් පරිදි පඬු ඇඹුල් අස්නේ වස් වැසැ බිදම් වළා (=අභිධර්ම පිටකය) දෙසනු පිණිසැ එහි වැඩැ වදාළ පරිදියි මේ කීයේ.

'...දෙව් ලෝ නැගෙමි'යි තවුතිසා භවනය බලා දක්ෂිණ ශ්‍රී පාදය, එළිපතැ මුදුනට පයක් තඟන්නා වූ පුරුෂයකු ආයාසයක් නැති වැ ස්වල්පයක් පය ඔසොවන්නා සේ මුවිඳිරනත ප්‍රමාණයක් ශ්‍රී පාදය ඔසොවා වදාළ සේකැ.

'එ කෙණෙහි ස්වාමි දරුවන්, පූර්ව බුදුවරයන් දක්නා නො එක් වාරයෙහි දන් දුන්නා වූ, සයනාසන උපාහනාදී වූ නො එක් පින් බලයෙන් සුවාසූ දහසක් යොදුන් උස ඇති යුගන්ධර පර්වතය හුයාපූ වෙයග බඹක් සේ, සක්විති රජකු දුටු චණ්ඩාලයකු සේ නැමි නැමී අවුදින් ස්වාමිදරුවන් ගේ ශ්‍රී පාදය මුදුන් මල් කඩක් සේ තමා මුදුනින් පිළිගත. දෙ වනු වැ වාම ශ්‍රීපාදය ද එ සේ මැ මුව්සීරතනක් තැන් ඔසොවා වදාළ සේක. එ කෙණෙහි එක් ලක්ෂ අට සැට දහසක් යොදුන් උස ඇති මේරු පර්වත රාජයා ද එ සේ මැ ආදරයෙන් නැමී ඒ ශ්‍රීපාදය ද පිළිගත. මෙ සේ මිනිස් ලොවැ පියවරෙකැ, යුගඳුරු මුදුනේ පියවරෙකැ, මෙර මුදුනේ පියවරෙකැයි ශක්‍රයා ගේ භවනයට තුන් පියවරෙකින් වැඩි සේක' (පූජා:).

(මුව්සීරතන නම් එබූ පා ඇඟිලි අගත් නැඟූ පා විලුම් මුලත් අතර දුරයි- විතර පූජාවලියේ සූවිසි වන පරිච්ඡේදයෙන් දත්තේ යි).

210. **දස අට රියනක් ගත ඇරගෙනැ අබ අළුව ඇතුළතැ යත, සැතැපෙත, ඉඳිත සමත ඒ මුනි මිසක් වෙන නැතැ.**

දහ අට රියනක් වූ ශරීරය ඇරගෙනැ අබ පිංල්ල ඇතුළේ ගමන් කරන් හොත්, සැතැපෙත් හොත්, ඉඳින් හොත් සමර්ථයෙක් ඒ මුනි තුමා මිසැ වෙන එකෙක් නැත්තේයි.

දස අට =(ගීයේ) දසට
අබ අළුව = ,, අබළුව
ඇරගෙන = ,, රැගෙනැ

(සෙසු ගත්හි සඳහන් වන්නේ අබළුව ඇතුළතැ සිවු ඉරියව්වෙන් වැජැඹෙන බවයි. මෙහි එක් ඉරියව්වෙක් අඩුයි).

**211. තිල බිජු පමණ ගතින් අළ, අනත් අපිරියත් සියලු සක්වල ඈම තැන් එක් එළි කළ සවනක් රැසින් උදුළ.**

තල ඇටයක් පමණ සිරුරු පෙදෙසින් නික්මැවූ කල්හි අනන්ත වූ අපර්යන්ත වූ සියලු චක්‍රවාටවලැ සියලු තැන් ඒකාලෝක කළා වූ ෂඩ්වර්ණ රශ්මියෙන් උසස් වැ දිලෙයි.

| | | |
|---|---|---|
| ගතින් අළ | = | (ගීයේ) ගතිනළ |
| එක් එළි | = | ,, එකෙළි |
| අනත් අපිරියත් | = | ,, අනතපිරියත් |
| රැසින් උදුළ | = | ,, රැසිනුදුළ |

නීල (නිල්), පීත (කහ), ලෝහිත (ලේ), ඕදාත (සුදු), මාඤ්ජිෂ්ඨ (මදට), ප්‍රභාස්වර යැයි සවනක් රස් සැදැහේ.

**212. එක් මගද බසින් එළි කොටැ (ඔහු) බණ දෙසනු මුළු ලොවැ සියලු සත හට සිය බස ලෙසට එක විටැ සනට ඇසෙසි.**

හුදු මාගධි භාෂායෙන් (ඔහු) දහම් පහදා දේශනා කරන විටැ සියල් ලොවේ සත්ත්වයා හට තම තමාගේ බස ලෙසින් එක් වරැ මැ ඇසෙයි.

'......එක මගද බසින් වදරන බණ දෙමළුන් දෙමළු බසින්, යොනුන් යොන් බසින්, බබුරන් බබුරු බසින්, අරමණයන් අරමණ බසින්, කාම්බෝජයන් කාම්බෝජ බසින්, ජීනයන් ජීන බසින්, මලයූරයන් මලයූර බසින්, කාකයන් කාක බසින්, නක්කවාරයන් නක්කවාර බසින්, සහවාසින් සහවාසි බසින්- ඇත්, අස්, වලස්, තරස්, ගවර, සෙමෙර, ආදි සිවු පා සතුන් තමන් තමන් ගේ බසින්- කොවුල්, බොකල, ගිරා, මොනර, ගුරුළු, කැහැරෙළු, සැදිකුළු, විලිකුළු ආදි පියා ගත් සතුන් තමන් තමන් ගේ බසින්- පණු පැණි, කුහුඹු කිහිඹි, සිනි සකසිනි, හිණිකුණු, උකුණු, මකුණු ආදි

කුඩා සතුන් තමන් තමන් තමන් ගේ බසින් - තා, පොළොං, කරවැල්, පිඹුරු, තෙලිසප්, කළ සපු ආදි දීර්ඝ ජාතීන් තමන් තමන් ගේ බසින් වෙන වෙන මැ, අකුරෙන් අකුර, පදයෙන් පදය, පිල්ලෙන් පිල්ල තෝරා වදරන බණෙහි රස විඳුනාඃ පරිද්දෙන්......' (බුත්ඃ).

බසින් එළි කොටැ = (ගීයේ) බසිනෙළි කොට.

213. **ඔහු බණ දෙසන විටැ දහම් මඬලට වන් සද පිරිය විතරට මිසැ එකා අඟලකුත් පිටතට නො ගේ.**

ඒ බුදු රජු ධර්ම දේශනා කරන කල්හි ධර්ම මණ්ඩලයට පැමිණි ශබ්දය පිරිසේ ප්‍රමාණයට විනා (ඉන්) එක් අඟලක් ද පිටතට නො යයි.

දහම් මඬලැයි කියන්නේ බණ අසන්නවුන් රැස් වැ හිඳිනා සබා පෙදෙස යි.

214. **වඩිමි යි සිතූ විටැ මුනිඳුට එක් වට දෙර අඟුළු ඇරෙයි. දිගු කල කල පියට සත් බුමු පියුම් පිපෙයි.**

වඩින්නෙමි යි සිතූ කල්හි මුනිඳුට (සියලු) දෙර අගුළු එක් වට (එක පාරට මැ) ඇරෙයි. (වඩිනා පිණිසැ) දිගු කල කල පත්ලට තව්වූ හතේ නෙළුම් මල් පිපෙයි.

දෙර අඟුළු = (ගීයේ) දෙරගුළු

215. **ඒ විගසැ වල ගොඩ බෙර ඇස සේ සම වෙ යැ. දිව මල් වැසි වැසැ මුනි වඩනා මඟ දෙ පස සැදෙයි.**

(වඩින්නට වූ) ඒ ක්ෂණයේ මිටි තැන් උස් තැන් බෙර ඇස මෙන් සම තල වෙයි. දිව මල් වැසි වැසැ (දිව්‍ය පුෂ්ප වර්ෂා වැටිමෙන්) මඟ දෙ පැත්ත සැරැසෙයි.

විගසැ = (ගීයේ) විගසේ
වැසේ = ,, වැසැ
පසේ = ,, පස.

216. **මුනි සඳ උසේ යත මෙර ගිරි සිරස වුවත් තිවු වේ බඩ අඟ සේ නැමි එ මැ සේ පද පිළිගනී.**

මුනි උතුමා උසෙහි (උස් තැනකට) යත කල්හි මේරු පර්වත මුදුන ද්‍රිවත් ලෙලී ගැසූ වේ බඩ අඟ සෙයින් නැමී (බුදුන්ගේ) පත්ල එබූ සෙයින් මැ පිළිගනී

සිරස = (ගීයේ) සිරසේ
බඩ අග = ,, බඩ'ග

---

## (ආ) මුනි සඟ ගණ

## 217—224

217. **බඹ ලොවැ ගොස් ඉඳිති, සිය දහස් කප් නරඹති, රිවි සඳ පිරිමදිති, මෙ සේ ඔහු සඟ ගණ ද වැජැඹෙති.**

බ්‍රහ්ම ලෝකයට ගොස් (එහි) ඉඳිති, කල්ප ලක්ෂ ගණන් ඈත (දිව ඇසින්) දකිති, ඉර සඳ අතගාති, මේ අයුරින් ඔහු ගේ සඞ්ඝ සමූහයා ද පෙනී සිටිත්.

218. **මුනි පිරිවර-සක්වළ ගිරි, සුනෙර, දෙරණ එක වර සල්වා මහ පෙළහර කරන, පවර සඟ ගණ යැ.**

සර්වඥවරයා ගේ පිරිවර නම් චක්‍රවාට පර්වතය, මහා මේරු පර්වතය, මහ පොළොව (යන සියල්ල) එක් විටැ සල්වා මහා ප්‍රාතිහාර්ය පවත්වන සංඝ සමූහයා යි.

219. **මෙ සසර පෙර දවසැ නොයෙක් කප් කොළ සුවහස කඳ පිළිවෙළ වෙසෙස නිසි ලෙසැ දකිනා සඟ පිරිවර යැ.**

මේ සංසාරයේ යට ගිය දවස්හි අනේක කල්ප කෝටි ලක්ෂ ගණන්හි ස්කන්ධ පරම්පරයේ විශේෂය (පෙර විසූ ජාති පිළිවෙළේ විශේෂය) නිසි පරිද්දෙන් දක්නා සංඝ පරිවාර යැ.

දකිනා = (ගීයේ) දකිත

ඒ ඒ ආත්මයේ ලැබූ පඤ්චස්කන්ධයේ විශේෂ විභාග දැකීම කඳ පිළිවෙළ දැක්මයි.

220. මහ සඟ ගණ 'ලක් තබතත් දෙරණැ පස් මද යැ' යන අපමණ මහ නුවණ ලැබැ ගෙනැ එ මුනි වෙතැ සිටිති.

මහා සංඝ සමූහයා, අලගු තබතත් (එ පිණිසැ දූ) පොළොවේ පස් මද යැ යන මහ නුවණ ලැබැ ගෙනැ එ මුනි කෙරේ සිටිත්.

(මේ කීයේ:—

'ගංගාය වාලුකා ඛීයේ
උදකං ඛීයේ මහණ්ණවේ
මහියා මත්තිකා ඛීයේ
ලක්ඛේත මම බුද්ධියා'

යන සැරියුත් තැණ ගැනුම සලකායි.

221. මුළු ලොවැ ඇම දෙසේ සත සිත සිත සේ දකිනා දිව ඇස් ලැබැ ගෙනැ මහ සඟනු ඔහු දෙ පසේ සිටිති.

සියල් ලොවේ සියලු දිසාවේ සතුන් ගේ සිත සිත් වූ නියා දක්නා දිව ඇස් ලැබැ ගෙනැ මහා සඞ්ඝයා ඔහු ගේ දෙ පාර්ශ්වයේ සිටිති.

දිව ඇස් = (ගීයේ) දිව ඇසේ.

222. සුර බඹ ලොව හැම තැනැ සතන කියන බස් දිව කන් ලැබැ අසනා, එ මුනි වෙතැ වැජැඹෙන සඟ ගණ යැ.

දෙව් ලොව, බඹ ලොව හැම තැනැ සතුන්ං කියන වදන් දිව කන් ලබා ගෙනැ (ඉන්) අසන, එ මුනි කෙරේ සිටිකා සංඝ සමූහයා යැ.

**223. මුනි සඳු වෙතැ, සිතැ කොලෙසුන් දුරැ ඇැරැ විදසුන් මඟින් සෙත ලැබැ දිසතැ පින් කෙත් වන පසිදු සඟ ගණ යැ.**

ඒ බුදු උතුමා කෙරේ (වසතුයේ) සිතේ කෙලෙසුන් දුරැ හැරැ, විදර්ශනා මාර්ගයෙන් නිවන ලැබැගෙනැ ලොවට පින් කෙත් වන, ප්‍රසිද්ධ සඞ්ඝයා යි.

දුරැ ඇැරැ = (ගීයේ) දුරැරැ

(විදසුන් නම් ඇති සේ දැකීම යි)

**224. තමන් සිත පහද මුඳුනැ ඇඳිලි බැඳැ වැඳි සත සඟ මොක් සැපතැ ලනා, මෙ වැනි සඟ ගණ එ මුනි වෙතැ ඇතැ.**

තමන් ගේ හිත පහද ගෙනැ දෙහොත් මුදුන් දී වැන්ද වූ සතුන් දිව්‍ය ලෝක සම්පත්තියෙහි, මනුෂ්‍ය ලෝක සම්පත්තියෙහි, ළන්නා වූ මෙ බදු සඞ්ඝ සමූහයා එ මුනි කෙරේ ඇතැ.

සැපතැ = (ගීයේ) සැපත
ඇතැ = ,, ඇත

——— ———

## (ඇ) බුදු බල

## 225—238

**225. මහ ඔඹු මුනිඳුට මුඳුනට සේසත් නගති. එ මුනිසඳු පුදයට සක් දෙවින්දෙ සිටැ සක් පිඹිති.**

මහා බ්‍රහ්මයෝ මුනිඳු ගේ හිස් මුදුනට සුදු කුඩ නංවති. එ මුනි උතුමාට පුද පිණිසැ සක් දෙව් රජ හු සක් පිඹිති.

මුනිඳු = මුනි ඉඳු
දෙවින්දේ = දෙව් ඉන්දු + ඕ

226. **මුනිඳු නා ගමන් බත සිරි විඳුනා සුරිඳු රජ සිහිල් නල විඳුනා සුදු සිනිඳු වල් විඳුනා සලති.**

මුනින්ද්‍ර නාගයා (මුනි උතුමා) ගමනේ වැටුණු විට, සම්පත් විඳින්නා වූ දිව්‍ය රජයෝ සිහිල් පවන් විඳින්නා වූ, සුදු සිනිඳු, (වාල වීජනී නම් වූ) සෙමෙර වල් විදුනා සලති.

**සුරිඳු = සුර ඉඳු**

සුරිඳු රජ යනු ගුරු කමට ගත යුතු යෙදුමෙක් නො වේ.

227. **මුනි සඳු වඩින තැනැ දිව මල් දිව පහන් ගෙනැ දහස් සුවහස් ගණන් දෙව් අඟන වෙන වෙන පුද කොරෙති.**

මුනි උතුමා වඩින්නා වූ තන්හි දී දිව මල් දිව පහන් ගෙනැ (අවුත්) දහස් සිය දහස් ගණන් දිව්‍යාංගනාවෝ වෙන වෙන මැ පූජා කෙරෙත්.

**දෙව් අඟන = දෙවඟන**

228. **ලොවට සිතුමිණි මෙන් සැපැමිණි අප මෙ මුනිඳුට සුර සෙන් දෙ පිටැ සිටැ පැහැ විහිදි මිණි තල් වැට සලති.**

ලෝකයාට චින්තාමාණික්‍යක් පහළ වෙන්නා සේ සපැමුණුණු අපේ මේ මුනි රජුට දිව්‍ය සේනාවෝ දෙ පැත්තේ සිටැ ගෙනැ ප්‍රභාව පැතිරෙන්නා වූ මැණික් වටාපත් සලති.

229. **දෙවියෝ දිව මලින්, අසුර සෙන් සිත් පළොලින්, දිව නය් කඹුපුලින්, ගිරි තුරුළු පුල් කමලින් පුදති.**

දෙවියෝ දිව්‍ය පුෂ්පයෙන් ද, අසුර සේනාවෝ චිත්‍ර පළොල් මලින් ද, දිව්‍ය නාගයෝ කඹුපුල් මලින් ද ගල් ගස් පවා පිපුණු නෙළුම් මලින් ද (බුදුන්) පුදති.

('ගිරි තුරු පුල් කමලින් පුදනී පැවැසීම ද සුදුසු මඳ සේ පෙනේ. දිව මල් දෙවියන් අයත් යැ. චිත්‍ර පලොල් අසුරයන් ගේ යි. කඹුපුල් නා ලොවේ ඇති. පුල් කමල් ගිරි තුරු අයත් නො වේ.)

230. **බුදුන් ගේ ගත සවනක් රස් දිගනැ පතුරයි: බඹ ලෝ සිටැ බලත උන් මුඳුනත අනෝලෝකිත යැ.**

බුදුන් ගේ සිරුර සය වර්ණයෙකැ රස් දිශා කෙළවර තෙක් පතුරුවයි. බඹ ලොවේ සිටැ බලත් මුත් ඔවුන් (වහන්සේ) ගේ (හිස්) මුදුන නො දක්නා ලද්දේ වෙයි (හෙවත් කිසිවකු විසිනුත් නො බැලියැ හැක්කේ වෙයි )

දිගත = දිගු අත
න අවලෝකිත
( = අන් අවලෝකිත)
අනව ලෝකිත
අනෝලෝකිත

231. **මුළු තුන් දියතැ සැදි විසිතුරු භූගන සරණනැ පෙනෙයි. රූ සිරි සර බලත අම රස වැන්නැ.**

මුළු මහත් තුන් ලෝ තෙලේ සැරැසී ඇති විචිත්‍ර බුදුන් ගේ පත්ලේ පෙනෙයි. රූප ශ්‍රී සාරය බලන විටැ (මිහිර) අමා රස වැනියි.

232. **එළි පත මිහි වැ යෙයි. උඩ එළිපත හෝ උඩැ යෙයි. මුනිඳු නො නැමී මැ ගෙට වැදැ යෙයි. සත සිතැ තුටු වැ යෙයි.**

එක්කෝ එළිපත පහත බසී, නැත් නම් උඩ එළිපත හෝ ඉහළ ඇදී යයි. එ හෙයින් මුනිඳු නැමෙන්නේ නැති වැ මැ ගෙට වැදී යයි. (එ දක්නා) දනන් ගේ සිත සතුටු වී යයි.

උඩෙළි පත = උඩැ එළිපත.

*233.* **එක් දිගු අත නරඹා මුනිඳුන් දහම් පවසත දස දිගු අතැ සිටි අය අප මුනිඳුන් වුවනත දකිත්.**

එක් අතක් බලාගෙනැ බුදුන් දහම් දෙසන විටැ දස අතේ සිටිනා අය අප මුනි උතුමන් ගේ මුහුණ දකිත්.

මුනිඳුන් = මුනි ඉඳු + උන්
දිගත = දිගු අත

**234.** **මුනි සඳ සදහම් දෙසන සඳැ නික්මුණු කට හඬ පුරවි, වෙණ නදට ද වඩා දහස් ගුණෙන් නද වෙයි.**

මුනි උතුමා සද්ධර්මය දේශනා කරන විටැ නික්මුණු කට හඬ පුරවි කොවුලන් ගේ හඬට ද වීණා නාදයට ද දහස් වාරයෙකින් වැඩි මිහිරි වේ

**235.** **සක්වල, නුබ, දෙරණ, සතර අණ පිරුණු දිය කඳ පමණ දනැ කියැ හැකි. අප බුදුන් ගේ ගුණ පමණ නැති.**

සක්වලේ පමණ ද, අහසේ පමණ ද, පොළොවේ පමණ ද, සිවු සයුරේ ඇති දිය කඳේ පමණ ද දනැ කියැ හැකි. අපේ බුදුන් ගේ ගුණයට ප්‍රමාණයෙක් නැත්තේ යැ.

සතරණ = සතර අණ

**236.** **මෙ තැනට මේ වපී කියන උතුරක් නො දිපි. එ වැඳැ වැපී ගනිත මුළු ලොවට බුහුවි එ මුනි මැ යැ.**

(ඒ බුදු රජ) 'මෙ තැනට මේ වරී' යැයි කියත් මැ උත්තරයක් (එයට් වඩා මෙය හොඳ යැ යි කියන්නක්) නුදුටුයේ යි. (ලෝ වැසියා) එ වැඳැ වැරී ගන්නා කලැ සියලු ලෝකයට විශාරද වූයේ එ මුනි තෙමේ මැ යි.

**237.** **සේ නොසේ කම් පල ඇ ඇම තන්හි ඇම කලැ නුවණ බල පවති. එම්බල ඉන් එ මුනි දස බල ය.**

ස්ථාන අස්ථාන කර්ම ඵල ආදි සියලු තන්හි සියලු කල්හි නුවණ බල පැතිර පවත්නේ යි. එම්බා, පින්වත්නි, ඉන් ඒ මුනි දස බල යැ.

ස්ථානාස්ථාන දන්නා නුවණ, කාලත්‍රයවර්ති වූ කර්ම සමාදානයන් ගේ යථාභූත විපාක දන්නා නුවණ, සර්වත්‍ර ගාමිනී වූ ප්‍රතිපත්ති දන්නා නුවණ, අනේකධාතු නානා ධාතු ලෝක දන්නා නුවණ, සතුන් ගේ නානාධිමුක්තිකත්ව දන්නා නුවණ, ඔවුන්ගේ මැ ඉන්ද්‍රිය පරාවරතා දන්නා නුවණ, ධ්‍යානවිමෝක්ෂසමාධි සම්පත්තීන් ගේ සංක්ලේශ ව්‍යවදාන ව්‍යුත්ථාන දන්නා නුවණ, ආශ්‍රවක්ෂය දන්නා නුවණ යන මේ දශවිධ ඥාන බල යි. (ධර්: ප්‍ර:)

238. **ලොවැ ඇති කිසිවකුට නිති දුකක් නො කරනු මිසැ රුව ඇති එ මුනි සඳ ඇතුන් කොළ දහසකට බල ඇති.**

ලෝකයෙහි ඇත්තා වූ කිසිවකු හට නිත්‍යයෙන් දුකක් නො කරන නමුත් රූපයෙන් යුක්ත වූ එ මුනි උතුමා ඇතුන් කෝටි දහසකට (කාය) බල ඇත්තේ යැ.

මේ නාරායණ බල නම්.

කාළාවක, ගඞ්ගෙය්‍ය, පණ්ඩර, තම්බ, පිංගල, ගන්ධ, මංගල, හේම, උපෝෂථ, ඡද්දන්ත යන දස කුලෙහි ඇත්තු එක එකාට දස දස ගුණෙන් බල ඇත්තෝ යැ. ඡද්දන්ත ඇතුන් දස දෙනෙකුට බල ඇත්තෝ යැ බුදුහු ඒ කාළාවක ඇතුන් කෝටි දසයෙකැ බල යැ.

---

## (ඈ) බෝසත් සිරිත්

239—256

239. **දිවකුරු බුදුන් කාලැ පටන් දස බල වන තෙක් මෙ සතර අසෙකි කාලැ එක උපතකුත් නිස්පල නො කෙලෙ.**

දීපංකර බුදුන් ගේ කාලයෙහි පටන් බුදු වන තෙක් මෙ සතර අසංඛ්‍ය (කල්ප ලක්ෂයක්) කාලයෙහි එක උත්පත්තියකුත් නිෂ්ඵල නො කෙළේ යි.

කලැ = (ගියේ) කල.

(උපත නිෂ්ඵල නො කිරීම තම් පැරුම් දම් පිරීමෙන් ජන්මය සඵල කිරීම යි.)

240. **අහස ඇම තැනැ දිසි තුරු රැස පමණ කළ හැකි. මුනි සඳ පෙර දවසැ යැදියනට දුන් ඇස පමණ නැති.**

අහසේ සියලු තන්හි පෙනෙන තාරකා සමූහය (මෙ පමණ යැ යි) ප්‍රමාණ කොටැ කියැ හැකි. මුනි උතුමා පසු ගිය දවස්හි ඉල්වූවනට දුන් ඇස් අපමණ යි.

241. **ඔහු යැදියනට දුන් ඇඟ මස් පොළොවැ පස් පරයා. දනට දුන් ඉස් මහ මෙර ගිරි සිරට උස් වේ යැ.**

එ තුමා ඉල්ලූවනට දුන් ඇඟැ මස් පොළොවේ පස් පරදවයි. දනට දුන්නා වූ ඉස් මහා මේරු පර්වත මුදුනට උස් වෙයි.

242. **දිවකුරු මුනි සොරේ පටන් බුදු වන අතරේ දුන් සිරුරේ ලෙයට මෙ සියු සයුරේ දිය කඳ මඳ යැ.**

දීපංකර බුදුන් සමීපයෙන් පටන් ගෙනැ බුදු වන තෙක් මෙ දෑතුරේ දෙන ලද ඇඟැ ලෙයට මේ සතර මහා සාගරයේ දිය කඳ මඳ වේ.

(දුන් ලේ වැඩියි, සියු සයුරේ දිය අඩු යි).

243. **අප මුනි සස කලේ සසලේ නො වැ දුන් දනට දෙව්ඳු සිසි මඬලේ ඇඳි සස ලේ දැනුත් පවතී යැ.**

අපේ මුනි තුමා සාවකු වැ සිටි දවස්හි නො සැලී දුන්නා වූ දනය (නිසා) දෙව් රජු සඳ මඩලේ ඇඳි සා රුව දැනුත් පවතී.

(මේ කීයේ සස ද පවත යි. 319 ජා:)

කලේ = කලැ
සසලේ = සසල

**244. මෙ තැනෝ බොහෝ නො කීවත් බුදු බල මින් දුනෝ. වටු වැ ද උන් තැනෝ එ වනෝ මෙ කපැ ගිනි නො ගනී යැ.**

(මේ කීයේ පළමු වත වටු දූ පවත යි. 35 ජා:)

මෙහි බොහෝ කොටැ නො කීවත් බුදු බල මෙයින් දූනේ. වටු වැ පවා උන් එ වනයේ තැනැ මෙ කපේ දී ගිනි අටගන්නේ නැති.

**245. දස බල වඳුරු වැ උපන් කලැ කල අදිටනින් උන් උන් වලැ බට දඬුවලැ දූනුත් පුරුක් නැත්තේ යැ.**

බුදු රජු වඳුරකු වී උපන් අවදියේ දී කළා වූ අධිෂ්ඨාන- යෙන් ඔවුන් උන්නා වූ වනයේ බට දඬුවලැ දූනුත් පුරුක් නැත්තේ යැ.

(නළපාන දූවයි මේ සඳහන් කෙළේ. 20 ජා:)

කලැ = (ගීයේ) කල
වලැ = ,, වල

**246. වඳුරු වැ මහ වනතැ මිනිසකු වළින් ගොඩැ ලත, එ මැ එකා තම මරත, ඔහුට මග පැ මහ මෙත කෙළේ.**

වඳුරු වැ ඉපැ දී මහ වනයේ දී මිනිසකු වළින් ගොඩ දමත විටැ ඌ මැ තමාට පහර දෙත් දී ඌට පාර පෙන්වමින් මහත් මෛත්‍රිය මැ කෙළේ යැ.

(මේ දෙවන මහා කපි ජාතකයයි. 516 ජා:)

වනතැ = (ගීයේ) වනත

**247. පිය රද සෙඳූ වද කම් කරැ ඉස සිඳ කරත, මව වැලැඳැ වලපුත් සත් මැසි වැ ද සම මෙත මැ කෙළේ.**

පිය රජ්ජුරුවන් නියම කළ වධය කම් කරුවා ඉසු සිඳීමෙන් කරන කල්හි, මව වැලැඳැගෙනැ වලපිනා විටැ සත් මස් වියේ සිටැ දු (එ තුන් දෙන හට එක්) සම මෛත්‍රිය මැ කෙළේ යි.

(සුළු දම්පල් ද පුවත යි. 358 ජා:)

248. **සිවි නිරිඳු වැ උපන්නේ ඇස් උපුට දුන්නේ සිතෙහි පිරි සන්තොස මැ දුන්නේ බුදුන්ගේ ගුණයෙකැ.**

සිවි රජ වැ උපන්නේ ඇස් උදුරා දුන්නේ ද, සිතෙහි පිරුණා වූ සන්තෝෂය මැ දුන්නේ යැ. මේ වනාහි බුදුන්ගේ ගුණයෙක් යැ.

(සිවි ජාතක පුවතයි. 499 ජා:)

249. **එ සුගත විදුරැ පඬි කාලැ පුණු යකු ගෙනැ දමන ගල සැට යොදුන් උස ඇතැ (සි) වැටෙන අතුරෙහි ගණින් දනැගත.**

එ සුගත් තෙමේ විදුරැ පණ්ඩිත කාලයේ දී පූර්ණක නම් යක්ෂයා තමා ගෙනැ (ගලින්) දමන කල්හි වැටෙන අතරතුරේ ගල සැට යොදුන් උස ඇතැයි ගණින් දැනැ ගත්තේ යැ.

යොදුන් උස = යොදුනුස

(විදුර ජාතකය ඉතා පසිදුයි. 545 ජා:)

250. **සෙන අල මුනි ගිජිඳු වැ වළැ සිටැ විදී වැද්දවුට සවන් පැහැ දුළ දළ සීය අතින් කපා සතොසින් දුන්නෙ.**

ශාන්තිය පැමිණැ වූ සර්වඥ තෙමේ ඇත් රජු වැ වලේ සිටැ විදි වැද්ද හට සවනක් පැහැයෙන් බබළන දළ සිය අතින් කපා සතොසින් දුන්නේ යැ.

සෙත අල = සෙතල
වළැ = (ගීයේ) වල

(මේ කීයේ ඡද්දන්ත ජාතක පුවතයි. 514 ජා:)

251. දිව නග් වැ ද, නො මඳ වද කරා ගත විදූ රාගත, දිව විස තෙද ඇත ද රාහැණි නො වැ සිල් මැ රැක්කෙ වෙ ද?

දිව්‍ය නාග වැ පවා බොහෝ පීඩා කොටැ ඇඟ විදූ ඇරා ගත් කල්හි පවා විෂ තේජස් ඇතත් උරණ නො වී ශීලය මැ රැක්කේ වේ ද?

(මෙ සැඳැහුණේ සක්පල් ද පුවතයි. 524 ජා:)

252. පවර මහ ජනක වැ, නැසුණු පල බර තුරු දුකැ සපිරි රජ සිරි හැරා ගොසින් වන වැදූ තවසර කෙළේ.

උතුම් වූ (ප්‍රවර වූ) මහා ජනක රජ වැ, නැසුණා වූ ඵල හරිත වෘක්ෂය දුකැ රජ සැපත් හැරා ගොසින් වල් වැදී තපස් රැකීම කෙළේ යැ.

(මහ ජනක ජාතක පුවත. 539 ජා:)

253. මුනි විරු මුව රද වැ විදූ විදූ දිවෙන නර විරු ගැඹුරු වළැ වැටුණා බලා ගොඩැ ලා බිය දුරු කෙළේ.

සර්වඥ වීරයා මුව රජ වැ, (මුවන්) විදිමින් දිවැ එන්නා වූ නර වීරයා හෙවත් රජු ගැඹුරු වළේ වැටුණා දුකැ (ඔහු) ගොඩැ ලා බිය දුරු කෙළේ යැ.

(මේ සැඳැහුණේ සරභ මිග ජාතකයයි. 483 ජා:)

254. බඳුරු වැ වේ වැලක් ඉගැ බැඳැ ගඟ එ තෙරා පැනැ වානර සෙන් සමගැ ගඟින් එ තෙරා වැ යන්ට මග කෙළේ.

වඳුරු වැ (ඉපැදී) වේ වැලක් ඉගේ බැඳැගෙනැ ගඟේ එ තෙරට පැනැ (තමා ගේ) වඳුරු සේනාව හා ගඟින් එ ගොඩ වී යාමට මඟ සැලැසුයේ යැ.

(පළමුවන මහා කපි ජාතක පුවතයි. 407 ජාඃ)

255. **පෙරැ මහ ඔසු පඬි වැ මැස්සකු බොන විතර වෙර ලෙහෙයක් නො සල්වා දඹ දිවැ රජුන් එක වරැ දිනී යැ.**

යට ගිය දවසේ මහෞෂධ නම් පණ්ඩිතයා වැ මැස්සකු බොන පමණට ද ඇඟැ ලේ නො සල්වා දඹ දිවැ රජුන් එක් වට ජය ගත්තේ යැ.

**පෙරැ** = (ගීයේ) **පෙර**
**වෙරැ** = ,, වෙර
**වරැ** = ,, වර

(උමංදාව; උම්මග්ග ජාතකය යැයි පසිදු මහා උම්මග්ග ජාතක [546 ජාඃ] පවත ඉතා පසිදු යි).

256. **සීලව රද වරැ දු රුපු නරනිඳු නුවර ගෙනැ මහත් වද කරතුදු තම සිතැ සිල් මැ පිරිසුදු කෙළේ.**

සීලව රජ වූ වාරයෙහි දී පවා සතුරු රජු නුවර අත් කොටැ ගෙනැ මහත් පීඩා කරත් දීත් තමා ගේ සිතේ සීලය මැ පිරිසුදු කෙළේ යැ.

(මහා සීලව ජාතක පවතයි. 51. ජාඃ)

---

## (ඉ) වෙසෙස් ගුණ

257—261

257. **සත සිත රඟ බලං පැවැසූ, මහ අනැගි දහම් සසඟැ සැප සිදු කැරැ පස් වා දහස් එක රඟ සිපී.**

සතුන්ගේ (ආශය අනුශය විමැසීම් විසින්) සිතේ සැටි බලා (ඊට සුදුසු වත පරිදි) දේශනා කළා වූ, මහත් අගය ඇති ධර්මය අවුරුදු පන් දහසක් සදෙව් ලෝ සැප සිද්ධ කොටැ දෙමින් නො වෙතස් වැ පවත්තේ යි.

258. **නො මඳින්, තඳින් බව දුක් විඳැ සිටිනා සත දැකැ ගොඩැ ලම් යන සඳින් දනට අඹු දරුවන් ද බැඳැ දිනි.**

බෙහෙවින් දැඩියේ සසර දුක් විඳැ විඳැ සිටින්නා වූ සතුන් දැකැ (උන්) ගොඩැ ලම් යන සිතින් අඹුවන් දරුවන් ද දනට බැඳැ දුන්නේ යැ.

259. **මග පල නියම කොටැ බනු කී දහමට පැහැද මොක් පුරට වන් සත සුවිසි අසංඛයට කියත්.**

මාර්ග ඵල නියම කොටැ එ තුමා දෙසූ ධර්මයට පැහැදී මෝක්ෂ පුරයට (හෙවත් නිවනට) වැදුණා වූ සත්ත්වයන් ගේ ගණන විසි හතර අසඞ්ඛ්‍යයකට කියත්.

260. **එ නෙතින් දැඩි බැල්මක්, සිත අතින් මඳ දෙම්නසක් අතින් කිසි අවියක් නො ගෙනැ මෙතින් මර සෙන් දිනි.**

එ (තෙමේ) ඇසින් රළු බැල්මක් හෝ සිත තුළින් මඳ වූ දෙම්නසක් හෝ අතින් කිසි ආයුධයක් හෝ නො ගෙනැ මෛත්‍රියෙන් මාර සේනාව ජය ගත්තේ යි.

261. **දත් අතෙකින් ගණිත, පොතෙකින් දැයක් නො ඉගෙනැ, ඉවතෙකින් නො අසා මත එකින් මෙ ලොව දැනැ නිමැවී යැ.**

ගණිත් දත්තවුන් අතින් (ගණිත්) හෝ, පොතෙකින් දැයක් හෝ ඉගෙනිමක් නො කොටැ බැහැරෙකින් අසා දැන්මකුත් නැති වැ එක් මතයෙන් මෙ ලොව දැනැ අවසන් කෙළේ යැ.

## (ඊ) නව අරහාදිය

262. **රහසත් පව් නො කොටැ, කෙලෙස් අරයනුත් දුරැ කොටැ, පුදට නිසි වූයෙන් මුනිඳුට අරහ යැ සි නම කියති.**

රහසින් පවා පව් නො කොටැ, ක්ලේශ නැමැති දූවිත් දුරැ කොටැ පුද ලැබීමට නිසි වූයෙන් මුනිඳුට 'අරහ' (යන) නම කියති.

අර (දූවි) නම් අද වහරේ 'ගරුදි' යන නමින් සඳහන් වන දූයයි, ගරුදි ඇත්තේ රෝදයෙකැ යැ. සංසාරය චක්‍රයක් හෙවත් රෝදයක් හැටියට සැලකූ විටැ කෙලෙස් ඒ රෝදයේ ගරුදි හැටියට සැඳැහෙයි.

263. **තුන් කල්හි මැ පැවැති සියල් ලොවැ ඇති පද අරුත් අතැ ඇඹුල සෙ දනැගති. එයින් 'සම්මා සම්බුදු නැ' යෙති.**

(අසු, වත්මන්, අනා යන) තුන් කාලයට මැ ඇතුළත් සියලු මැ ලෝක ධාතුයේ ඇති පදාර්ථයන් අතේ ඇති තෙල්ලි ගෙඩියක් සේ දත්තේ යැ. එ හෙයින් 'සම්මා සම්බුදුන්' යනු කියති.

'ඇඹුල' යනු 'තෙල්ලියක් නො වැ මිණි රුවනෙකි' යි අයෙක් කමක් පලක් නැති උමතු දෙඩවති. තෙල්ලිය වේවා, මැණික වේවා, ඉලපත වේවා මෙහි ඇති දූයෙන් වැඩෙක් නැති. 'තමා අතේ ඇත්තේ කිමෙක් ද?' යනු එය අතැ ඇත්තා ආයේ නො බැලුවාට කියන්නට දන්නා බවයි මෙහි පල කැරෙන අරුත. ආදි දනන් තිති සැපීමට ගන්නා කවර විටැ දු සැපීමෙන් දියෙහි මිහිර වඩා ගන්නා දූයෙකි තෙල්ලි පල. බුලත් සැපීම, දුම් ඉරුවීම ඈ පුරුදු ඇති වන්නට පෙරැ මිනිසුන් කවර විටැ දු දූන් බුලත් විටක් දුම් වැටියක් තමා කෙරේ ඇති වැ යන්නා සේ තෙල්ලියක්

අතේ ඇති වැ රිසි විටැ ඒ සපම්නුත් යනු දක්නට ලැබෙත්-තෙකි. ඒ කිමෙක් ද යනු එ මිනිසා කිසි සැකක් නැති වැ දනී. එ හෙයිනි ඒ යෙදුණේ. මිණි රුවන් අතේ ඇති වැ යාම් ඊම එ ද මෙ ද පමණට දු ගුණ නො වී.

පදරුත් = පද අරුත්
ඇතැඹුල = ඇතැ ඇඹුල
බුදුනැ = බුදුන් යැ

264. විද්දු නැණ අට ද, පසලොස් සරණ ගුණය ද ඇතියෙන් එ මුනි සඳ පිරුණු විජ්ජා චරණ නම ලද.

විද්‍යාඥාන අටත් පසළොස් චරණ ගුණයත් ඇති හෙයින් එ මුනි උතුමා 'විජ්ජාචරණ සම්පන්නෝ' යන නම ලැබුයේ යි.

විදර්ශනාඥාන
මනෝම සෘද්ධිඥාන
සෘද්ධිප්‍රභේදඥාන
දිව්‍යශ්‍රෝත්‍රඥාන
පරචිත්තවිජානනඥාන
පූර්වේනිවාසානුස්මෘතිඥාන
දිව්‍යචක්ෂුර්ඥාන
ආශ්‍රවක්ෂයකරඥාන

යන අටයි විද්‍යා ඥාන (අට) නම්.

ශීලය,
ඉන්ද්‍රියසංවරය,
පමණ දැනැ වැළැඳීම,
නිදි දුරු කිරීම,
ශ්‍රද්ධාව,
පාපයට භය,
පාපයට පිළිකුල,
බහුශ්‍රැත බව,

වීර්යය,
ස්මෘතිය,
ප්‍රඥව,
ප්‍රථම ධ්‍යානය
ද්විතීය ,,
තෘතීය ,,
චතුර්ථ ,,

යනු පසළොස් චරණ ගුණ යෝ යි.

265. **යහපත් කොට යෙතැයි, සුන්දර තැනට සැපතැයි, සොඳුරු බස් කියතැයි ඒ මුනි සඳුට සුගතැ යි කියති.**

යහපත් සේ යතියි ද, මනා වූ තැනට සම්ප්‍රාප්ත වූ හ යි ද, සුන්දර වූ වදන් කියතියි ද ඒ මුනි උතුමාට 'සුගතෝ' යනු කියති.

'සෝභන ගමනත්තා, සුන්දරං ඨානං ගතත්තා, සම්මා ගතත්තා, සම්මා ච ගදත්තා සුගතෝ (හොබනා ගමන් ඇතියෙන්, සොඳුරු තැනට ගියෙන්, මනා වැ ගියෙන්, මනා තෙපුල් ඇතියෙන් සුගත යැ' වි. ම.)

266. **තුන් ලොව තතු ලෙසට දනැගෙනැ, නො ගත් මෙ ලොවට නියම කොට දෙසුයෙන් මුනිඳුට ලෝකවිදූ යැ යි කියති.**

තුන් අයුරු (කාම, රූප, අරූප විසින් හෝ සත්ත්ව සංස්කාර, අවකාශ විසින් හෝ) ලොව දනැගෙනැ (එ) දනැ නො ගත් මේ ලෝ වැසියාට තතු පරිදි දෙසූ හෙයින් (අවධාරණයෙන් වදළ නිසා) මුනි රජුට 'ලෝක විදූ' යැයි කියති.

267. **තඳ හැම ගුණයෙන් සම, වැඩි, සතකු දියතෙහි ඈම ද නැති සඳ මුනි ද අනුත්තර යැයි කියති.**

සතොස ඇති කරන්නා වූ සියලු ගුණයෙන් (තමන් හට) සම (හෝ) වැඩි තරම් වත (හෝ) අන් සතකු ලොවේ නැති හෙයින් මුනි රජුට 'අනුත්තරෝ' යි කියත්.

268. **තද බඹ සුර යකුන් දමනය කැරැ තමන් ලද සෙත් දී මුනිඳු සඳ පුරිස දම් සාරතී නම් ලද.**

රළු වූ බඹුන්, සුරන්, යකුන්, හික්මවා (ඔවුනට) තමන් ලද සෙත් (එ නම් 'නිවන්) දී මුනි රජ තුමා 'පුරිසදම්ම-සාරථි' යන නම ලැබී.

(අමා වතුරුයෙන් එපවත් දන්නේ යි)

269. **හැම වර සතන් බව කතරින් එ තෙරැ ලනුයෙන් තිලෝ ගුරු මුනිවර සත්තා නමින් පුවතර වි යැ.**

සියලු විටැ සත්ත්වයන් සංසාර කාන්තාරයෙන් එ ගොඩට දමන හෙයින් තුන් ලොවට ඇදුරු මුනි උතුමා 'සත්තා' (ශාස්තෘ) යන නමින් පසිද්ධ වූයේ යි.

270. **සිවු සස් සිය නැණින් දනැ කුලුණින් දන්වි යැ, අනුවණින් දුරැ ලයි. එ ගුණ පමණින් බුදු නම් වි යැ.**

චතුස්සත්‍යය තමා ගේ නුවණින් අවබෝධ කොටැ ගෙනැ කරුණායෙන් (අනුන්) දැන්වී යැ, අවිද්‍යායෙන් (සතුන්) දුරැ ලයි. එකී ගුණ පමණින් 'බුදු' (බුද්ධෝ) යි නම් වූයේ යි.

271. **දහම් කඳ බෙදුයෙන්, ගුණ කඳ බජනය කෙලෙන්, බග දහමින් සඟද බැවින් මුනි සඳ බගවත් වි යැ.**

ධර්ම සමූහය බෙදූ හෙයින්, ගුණ සමූහය සේවනය කළ හෙයින්, භග ධර්මයෙන් යුක්ත බැවින් මුනි උතුමා බගවත් (භගවා) යි නම් වී යැ.

ඓශ්වර්යය,
පුණ්‍යය,
යශස්,
ශ්‍රී,
සංකල්ප සිද්ධි,
ප්‍රයත්න,

යන සය භග ධර්මයෝ යි

---

## (ඇ) දෙතිස් මහ පුරිස් ලකුණු

272—304

272. **අප මුනිඳුට රන් මිරි වැඩි ලෙසට වළ ගොඩ නො වී. එක විටැ මිහි පිටැ වැඳ නැගෙන මෙ වැනි දෙ පතුල් යැ.**

අපේ මුනි රජුට රන් සෙරෙප්පු සෙයින් වළ ගැසීම් ගොඩ ගැසීම් නැති වූ, පොළෝ මත්තේ එක විටැ වැදී එක විටැ නැගෙන මෙ අයුරැ දෙ පතුල් යැ.

215. 216 යන පැදිත් ධර්ම ප්‍රදීපිකාවේ:—

'මොවුන් පතුල් වූ කලැ ස්වර්ණ පාදුකා සෙයින් එක පැහැරැ භූමි ස්පර්ශ කෙරෙයි. එක පැහැරැ නැගේ...... වළ තැන් භස්ත්‍රා සෙයින් පිරෙයි. ගොඩ තැන් භේරි තල සෙයින් සම වේ. .........පර්වතයෙකු දු හුයා පී වෙයග බඩක් සෙයින් නැමී පාද සමීපයට උපගත වේ.'

යන්නත් මේ හා සසඳා බලනු

**මේ සුප්පතිට්ඨිත පාද ලකුණයි. (1)**

273. **දෙ පතුල, නැබ නිම නිමල දිසි, අර දහසෙකින් මන කල, සිය අටක් රුවින් උදුල මෙ වැනි පිය සක් දෙකෙකි.**

(මුනිඳුන් ගේ) දෙ පත්ලේ නාභිය (බොස් ගෙඩිය), නිම් වළල්ල (පට්ටම) ද, පිරිසුදුවට (පැහැදිලි ව) පෙනෙන, දූවී (ගරාදි) දහසෙකින් සිත් කලු වූ, එක් සිය අටක් රුවින් බබළන්නා වූ, මෙ අපූරු කරත්ත රෝද දෙකෙකි.

මේ **'චක්ඛු'** ලකුණයි. (2)

274. **අප මුනිඳුට පතුල සතරක් කොටැ එකක් විලුඹට බෙදුමෙන් දිලි රන් පලස් වට ලෙසින් දිගු විලුඹැ,.**

අපේ බුදු රජුට, පතුල සතර කොටසක් කොටැ ඉන් එකක් විලුඹට බෙදීම නිසා බබළන රන් ලෝම පන්දු වැනි දික් විලුඹ ඇත්තේ ය.

මේ **'ආයතපණ්හි'** ලකුණයි. (3)

275. **විතර අඩු වැඩි නූ, ඉඟුල් පළ සේ පැහැ සර,. මොලොක්, දික්, අග් සිහින්, මන හර, රත් ඇඟිලි යැ මුනිවර.**

ප්‍රමාණය අඩු වැඩි නැති සාදිලිංගම් කරල් සෙයින් පැහැයෙන් සරු වූ, මොලොක් වූ, දික් වූ, අග සිහින් වූ, සිත්කලු රත් ඇඟිලියි මුනි උතුමා ගේ ඇත්තේ.

නූ = නුවූ
රතැඟිලි = රත් ඇඟිලි

මේ **'දීඝාඞ්ගුලි'** ලකුණයි. (4)

276. **පිටි පසැ, ඉදිරි පිට, දෙ අත් වැරැ සිටැ බැලුවත් යටි පතුල පෙනෙනට උස් වැ සිටි බොලට වෙයි මුනිඳුට.**

පිටි පසැ හෝ ඉදිරි පිටැ හෝ දෑත් වරැ (දෙ ඇලයේ) හෝ සිටැ බැලුවත් යටි පතුල පෙනෙන පරිදි උස් වැ පිහිටි බොලට ඇත්තේ යි මුනි උතුමාට.

මේ **'උස්සංඛපාද'** ලකුණයි. (5)

277. **මුලින් දල, අග සිඟින්, මස් එක රග වට වෑ සිපි සොඳුරෑ හැල් ගප් රග මුනිඳු යුග දග මන-දග කෙරෙසි.**

'මුල සරියෙන් මහත් වූ, අග සිහින් වූ, මස් එක් අයුරින් වට වැ සිටියා වූ, සුන්දර ඇල් ගොයම් බණ්ඩි වැනි බුදු රජු ගේ දෙ දඟ සිත බඳී.

'ඔවුන් ගේ ජඞ්ඝා හාත් පස්හි සම වැ සිටි මසින් පරික්ෂිප්ත වැ මතා කොටැ වඩන ලද හැල් ගබ් සෙයින් පරිපූර්ණ......' යනුයි ගුරුළු ගෝමි පඬි වදත.

මේ **'එණී ජඞ්ඝා'** ලකුණයි. (6)

278. **දිව නෙතින් දිලි මුනි, ගතින් නියතින් කුදු මිපි නොවි නො නැමී සිටෑ දෙ අතින් දෙ දණ පිරි-මදිනෝ යෑ.**

දිව ඇසින් බබලන්නා වූ මුනි තෙමේ, ඒ කාන්තයෙන් මැ සිරුරින් මිටි නොවී, නො නැමී සිටැ දෙ දණ පිරි-මදිතේ යැ.

මේ **'දීඝ හත්ථ'** ලකුණයි. (7)

279. **මුනි අතෑ පයෑ ලකල පැහෑ දුල ඇඟිලි ඇඳුරකු විසින් කල නිකසල දැල් කවුළු සේ සම අතුරෑ වෙසි.**

මුනි තුමා ගේ අත්හි ද, පා හි ද, අලංකෘත වූ, පැහැයෙන් බබලන ඇඟිලි වඩුවකු විසින් කරන ලද නිදොස් දැල් කවුළු සෙයින් සම අතර ඇත්තේ වෙයි.

මේ **'ජාලහත්ථපාද'** ලකුණයි. (8)

280. **අප මුනිඳුට, සියක් වට පොලමින් පහන් ගිතෙලෙකෑ සටෑ ලූ කපු පුලුනක් ලෙසට මොලොක් අත් පා යෑ.**

අපේ මුනි රජුට ඇත්තේ සියක් වර පොලා සැදුණා වූ ගිතෙලකැ යටැ දැමූ කපු පුලුනක් බඳු මොළොක් අතුල් පතුල් යැ.

මේ **'මුදු තරුණ හත්ථපාද'** ලකුණයි. (9)

**281. මුනිඳුට පියුම් පෙති ඇතුලට වැදු සිටිනා කෙමි විලසට කය තුළට වැදු සිටි පුරිස් ලකුණ ඇත්තේ යැ.**

අපේ බුදු රජුට නෙළුම් මල් පෙති ඇතුළට වැදී සිටිනා කෙමිය මෙන් සිරුර ඇතුළට වැදී සිටි පුරුෂ ව්‍යඤ්ජනය ඇත්තේ යැ.

සිටිනා = (ශීඝ්‍රයේ) සිටින

ලකුණු ඇත්තේ යැ = ලකුණැත්තේ යැ.

මේ **'කෝසෝහිතවත්ථ ගුය්හ'** ලකුණයි. (10)

**282. මුනිඳු රුව ල දැඟිගුළින් මැදූ, දිවි දල බහා ඔප් ලා, ගුරු පිරියම් ලකළ නිකසළ රන් රුව එව්.**

මුනි රජු ගේ රූපය අලුත් සාදිලිංගමින් මැදූ, කොටි දත් ලා ඔප් තගා ගුරු ගැමෙන් අලඞ්කෘත රන් රුව වැනියි.

රුව එව් = රුවෙව්

මේ **'සුවණ්ණ වණ්ණ (කඤ්චනසන්නිභත්තච')** ලකුණයි. (11)

**283. මුනිඳුට අල පතැ දිය (නො රඳන) ලෙසට හැම විටැ දූලි තෙල්, රජස් ගතැ නො රඳනා ලෙසට සියුම් සිවි ඇත්තේ යැ.**

මුනි රජුට අල කොළයේ දිය නො රඳන්නා සේ සියලු කල්හි දූලි, තෙල්, දූලි ඇගේ නො රුඳෙන හැටියට සියුම් වූ සිවිය (කුඩු හම) ඇත්තේ යැ.

මේ **'සුඛුමච්ඡවි'** ලකුණයි. (12)

284. **දුට පෙරේමය වෙයි, දුකැ දුකැ රිසි නො ගේ මැ යැ. මුනිඳු ඇඟ රෝම දෙකෙක් එක තැනැ නො සිටිනේ මැ යැ.**

දුටුව හොත් ප්‍රේමය වෙයි. දුකැලා දුකැලා ආසාව නො යයි (හෙවත් ඇති නො වෙයි) මුනි රජු ගේ ඇඟේ රෝම දෙකෙක් එක තැනැ නො සිටිතේ මැයි.

මේ '**ඒකේක ලෝම**' ලකුණයි. (13)

285. **මුනිඳු ඇඟැ නිල් මිණි රස් තරඟ විහිදුවා සිටි, මන රඟ හැම ලොම් වළලු හි උඩ බලා සිටි.**

මුනි රජු ගේ ඇඟේ නිල් මැණික් රස් රළ විහිදුවා සිටියා වූ මනෝරම්‍ය වූ සියලු රෝම වළලු වැටී උඩ බලා සිටී

ඇඟැ = (ගීයේ) ඇඟ
සිටී = ,, සිටි.

මේ '**උද්ධග්ග ලෝම**' ලකුණයි. (14)

286. **මුනි රුව නෙතැ පියකරු වැ, තිර සර ගුණෙන් විදුරු වැ මහ බඹ රුව ලෙසින් මුදු වැ, ඉරිදු වැ සිටි.**

මුනි උතුමා ගේ රූපය ඇසක් ඇසක් පාසා ප්‍රියකරු වී, ස්ථිර වූ සාර ගුණයෙන් වජ්‍ර (බඳු) වැ, මහා බ්‍රහ්මයා ගේ රූපය මෙන් මෘදු වී ඍජු වී සිටී. (තිර සර ගුණය නම් සවිය යි.)

වැ = (ගීයේ) ව

මේ '**බ්‍රහ්මුජ්ජු ගත්ත**' ලකුණයි. (15)

287. **මුනිඳුට දෙ අත් පිටැ, පා පිටැ දෙ උරෙහි, කඳෙහි නහර ඇට නො පැනෙන ලෙසට පිරුණු මස් ඇත්තේ යැ.**

මුනි රජුට දෙ අත් පිටැ ද, (දෙ) පා පිටැ ද, දෙ උරෙහි ද, කදෙහි ද තතරත් ඇටත් නො පෙනෙන සේ උස් වැ පිරුණා වූ මස් ඇත්තේ යැ.

පා පිටැ = (ගීයේ) පා පිට

තහර ඇට= ,, තහරට

මේ **'සත්තුස්සද'** (සත් තුනකින් උස්) ලකුණයි. (16)

288. **හිම දඩැ සී රජු ගෙ පෙර කඬ පිරුණු වන් වෙයි, දිය වැඩ මුනිඳු ගේ පෙර කඬ ද පසු කඬ (ද) පිරුණු වනැ.**

හිමාලය වනයේ සිංහ රාජයා ගේ (ශරීරයේ) පූර්ව භාගය පිරුණු වන් වෙයි. ලෝකනාථ සෙත (සලසන) මුනි රජු ගේ (සිරුරේ) පූර්ව භාගය ද පසු භාගය ද පිරුණු වන් වෙයි.

දඩැ = (ගීයේ) දඩ.

මේ **'සීහපුබ්බද්ධකාය'** ලකුණයි. (17)

289. **කපියෙහි පමන් කොටැ කඳට දක්වා රන් පලගක් ලෙසට සම කොටැ පිරුණු මස් මුනිඳුට ඇත්තේ යැ.**

ඉහෙන් පටන් ගෙනැ බෙල්ල දක්වා රන් පලිහක් සේ (වළ ගැසුණු තැන් ගොඩ වූ තැන් නැති වැ) සම කොටැ පිරුණා වූ මස් මුනි රජුට ඇත්තේ යි.

**රන් පලගක් ලෙසට:-** රන් පුවරුවක් සෙයින් (බර්: ප්‍ර)

මේ **'චිතන්තරංස'** ලකුණයි. (18)

290. **මුළු තුන්ලෝ වියත් දනයන් නොවියත් කරන මුනිඳුන් ගේ කයත් බඹයත් දිගින් එක පමණ වේ.**

සියල් තුන් ලොවේ ව්‍යක්ත ජනයන් අව්‍යක්ත කරන්නා වූ මුනිඳුන් ගේ ශරීරයත් බඹයත් දිගින් එක ප්‍රමාණ වෙයි.

**මේ 'නිග්‍රෝධපරිමණ්ඩල'** ලකුණයි. (19)

(මෙහි වියතුන් නො වියතුන් කිරීම දූෂ්‍ය කමක් සේ පෙනෙතු ඇති. මෙයින් අදහස් කරන ලද්දේ වියතුන් නො වියතුන් බවට පෙරළීම නො වැ බුදුනට සමාන කැරැ බලන විටැ සෙසු වියතුන් නො වියතුන් සේ පෙනෙන බවයි.)

291. **සදහම් දෙසනා වරැ නහර නො ඉපිලැ, පැහැ සර මුනි සර රන මිහිඟු බෙර මෙන් මොනවට වට වැ සිපී.**

සද්ධර්මය දේශනා කරන විටැ නහර මතු නුවූ, පැහැයෙන් සරු වූ බුදුන් ගේ බෙල්ල රන් මිහිඟු බෙරයක් සේ මනා වැ වට වී සිටී.

**මේ 'සමවත්තක්ඛන්ධ'** ලකුණයි. (20)

292. **මුනි සඳු ගෙ උගුරැ සත් සියක් රස නහර තුඩු පුරා සිටියෙන් සිරුැර මඳ අහරෙකින් යැපෙයි.**

මුනි තුමා ගේ උගුරේ සත් සියයක් රස නහර තුඩු පුරා ගෙනැ සිටියෙන් සිරුැර මඳ අහරෙකින් පෝෂ්‍ය වෙයි.

උගුරැ = (ගීයේ) උගුරු
නහර = ,, නහරු
සිරුැර = ,, සිරුැරු

**මේ 'රසග්ගසග්ගි'** ලකුණයි (21)

293. **මුනි සඳු ගේ, දෙලොස් වකැ සඳු ගේ මඬල, සී රදු ගේ හනු පරයා එක රගේ පිරුණු හනු දෙක යැ.**

මුනි උතුමා ගේ වනාහි දෙලොස් වක් සඳේ මඬල (ද) සිංහ රාජයා ගේ හනු ද පරදවා එක් හැඩි පිරුණා වූ හනු දෙකැ යැ.

**මේ 'සීහහනු'** ලකුණයි. (22)

294. **දන හට දෙ නිකටැ පිහිටි දත් දෙතිසෙක් වේ යැ. මුනිඳුට උස් මිටි නො වැ රුවට පිහිටි දත් සතලිසෙකි.**

(සෙසු) ජනයාට දෙ ඇත්දේ පිහිටි දත් තිස් දෙකෙක් වෙයි. මුනි රජුට වනාහි උස් මිටි නො වී මනා සේ සිටියා වූ දත් සතලිසෙක් වේ

නිකටැ = (ගීයේ) නිකට.

මේ **'චත්තාලිසදන්ත'** ලකුණයි. (23)

295. **ඇතුලත් පිටත් ගා සම කොටැ තුබූ සක් පත් විලසින් මුනිඳු දත් උස් මිටි නො වී සිටි යැ.**

ඇතුළු පැත්තත් පිට පැත්තත් (හණ ගල් ආදියෙහි) ගාමින් සම කොටැ තුබූ හක් පත්‍ර සේ මුනි රජු ගේ දත් මදක් වත් උස් මිටි නො වී සිටී යැ.

මේ **'සමදන්ත'** ලකුණයි. (24)

('ය පතින් සිදුනා ලද සක් පතක් සෙයින්' යනු ධර්ම ප්‍රදීපිකා වදනයි.)

296. **මුනි විරු දත් සොඳුරු තෙලි තුඩෙකින් ඇඳි හිරි ලෙසින් අතුරු පෑ, මඳකුත් සිදුරු නො වැ විදුරු සේ සිටි යැ.**

සර්වඥ වීරයා ගේ දත් මනා වූ තෙලි තුඩෙකින් (පින්සල තුඩෙකින්) ඇඳි අකුරු සෙයින් මදකුත් සිදුරු නැති වැ වජ්‍ර (දියමන්ති) සෙයින් සිටිතේයි.

මේ **'අවිවරදන්ත'** ලකුණයි. (25)

('තෙලි තුඩින් දක්වන ලද පරිච්ඡේද බඳු' යනු ධර්ම ප්‍රදීපිකා වදනයි.)

297. **සුර ගඟැ තරඟ ලෙසින් මන රඟ සුදු රස් දස දිගේ විහිදනා සතර දල ද යැ මුනි සඳු ගේ.**

අහස් ගඟේ රළ සෙයින් මනෝඥ වූ සුදු රශ්මිය දස දිශායෙහි විහිදුවන්නා වූ දළ ද සතර යැ මුනිතුමාට.

තරඟ = (ගීයේ) තරඟේ
මත රඟ = ,, මත රඟේ

මේ **'සුක්කදෘඨ'** ලකුණයි. (26)

298. **මුනි සඳු ගේ, දෙ කන් සිලෑ දිග පෑ,' නෑහෑ සිලෑ මෙළෙක දක්වා, පළලින් මුළු නළල වසන පෑහෑ උදුල දිවෑ.**

මුනි උතුමා ගේ වනාහි කන් සිදුරු දෙකෙහි දී දිග පෙන්වා, නාස් සිදුරෙහි දී මොළොක් බව පෙන්නා, පුළුලින් මුළු නළල වසන, පැහැයෙන් බබලන දිව යැ.

සිලෑ = (ගීයේ) සිල
පෑහෑ උදුල = ,, පැහැදුල

**'නෑහෑ තුල'** යැයි ද කිසි පිටපතෙකැ ඇති. ඇතුළ යන අරුතැ 'තුළ' යන්නක් මිසැ 'තුල' යන්නෙක් නො ලැබේ.

'මෙළෙක් වන බැවින් දිව කෙළින් සිදක් සෙයින් වටා ගෙනැ දෙ නාසිකා **'ඡිද්‍ර'** පිරිමදිති, දික් වන බැවින් දෙ කර්ණ **'ඡිද්‍ර'** පිරිමදිති. පළල් වන බැවින්......සියලු ලලාටය ප්‍රච්ඡාදනා කෙරෙති' යනු ධර්මප්‍රදීපිකා වදනයි).

මේ **'පහූතජිව්හා'** ලකුණයි. (27)

299. **මුනි සඳු ගෙ කට හඬ පුරවි කෙවිලි හඬ මියුරැයි කියන බස මැඬැ තුඬැ තුඬැ තුති දෙවා පවතිනෙ යැ.**

මුනි උතුමා ගේ කට හඬ පුරවී කෙවිල්ලන් ගේ හඬ මියුරැයි කියන වචනය යට පත් කොටැ හෙවත් ඔබා තුඬින් තුඬින් තුති දෙවමින් පවත්නේ යි.

මැඩෑ = (හීයේ) මැඩ
තුඩෑ තුඩෑ = ,, තුඩ තුඩ

මේ **'බ්‍රහ්මස්සර'** (කරවිකභාණී) ලකුණයි. (28)

300. **මුනි යුවළ ඇස ඉඳුනිල් මැණිකැ රස සරි කොටැ නො කියැ හැකි ලෙස සත සතොස වඩවන පහන් නිල් පැහැ යැ.**

මුනිහු ගේ දෑස ඉඳුනිල් මැණිකේ රශ්මිය සමාන කොටැ කියැ නො හැකි වන පරිද්දෙන් දනන් ගේ සන්තෝෂය වැඩි කරවන, ප්‍රසන්න වූ නිල් පැහැය වේ.

යුවළ ඇස = යුවළැස.

මේ **'අභිනීලනෙත්ත'** ලකුණයි. (29)

301. **මුනි සඳු ගේ එ කෙණෙහි උපන් මන රග රතු වස්සකු ගේ ඇසි පිය ගුළි රගේ පහන් ඇස් ගුළි යැ.**

මුනි උතුමාට එ කෙණෙහි උපන් මන රඟ රතු වස්සකු ගේ ඇසි පිය ගුළි මෙන් ප්‍රසන්න වූ ඇස් ගුළි යැ.

මේ **'ගෝපඛුම'** ලකුණයි. (30)

302. **අප මුනිඳුට රියනක් දිනට ඇඳූ හළ සඳ මඬල සේ වට බැම මැඳ නළල් පිටැ දිලෙනා උණු ලොම් යැ.**

අපේ මුනි රජුට රියනක් දිගට ඇඳූ හළ කල්හි සඳ මඬල සෙයින් වට (වත්නා වූ) බැම (දෙක) මැද්දේ නළල මතුයෙහි දිලෙන්නා වූ ඌර්ණ රෝමය යැ.

ඇදි කලැ රියනක් දික් වෙයි. හළ කලැ වළලු ගැසී වට වැ සිටි.

මේ **'උණ්ණ ලෝම'** ලකුණයි. (31)

**303. අප මුනි සඳු ගෙ, දිය බුබුලක් ලෙසේ සොඳ සේ වට වැ ගෙනැ සිටි නිල් මිණි රස් ලෙසේ බැබළි සිරසේ.**

අප ගේ මුනි උතුමා ගේ වතාංහි දිය බුබුළක් ලෙසින් මනා වැ වට වැ ගෙනැ සිටියා වූ, නිල් මිණි රස් ලෙසින් බැබැළියා වූ හිස යැ.

ලෙසේ = ලෙසට
සිරසේ = සිරස යැ.

මේ **'උණ්හීසසිස'** ලකුණයි. (32)

**304. මෙ ලෙසින් බුදුන් බඳැ මන නඳ ලකුණු දෙ තිසෙකැ. එ බැවින් මුනිඳු සඳ හැම සඳැ පහන් තුරු සේ දිලෙයි.**

මේ ආකාරයට බුදුන් ගේ සිරුරේ සිත් පහදන්නා වූ ලකුණු තිස් දෙකෙකි. එ නිසා මුනි රජ තුමා සියලු විටැ පහන් රුකක් අයුරින් බබළයි.

බඳැ = (ශීයේ) බඳ
සඳැ = ,, සඳ

දෙතිස් මහ පුරිස් ලකුණු විතර (විස්තර) කිරීම බෙහෙවින් 'ධර්මප්‍රදීපිකාව' ඇසිරින් බව පෙනෙයි.

**305. නෙත ඇති වැ උපන් ජන මනෝ රංජන කරවන, නිරංජන මුනිඳු ගෙ ඇඟෙහි අනුවැංජන අසූවෙකැ.**

ඇස ඇති වැ උපන් දනන් ගේ සිත ඇලවීම කරන්නා වූ, වීතරාගී වූ මුනිඳු ගේ සිරුරේ අනුව්‍යඤ්ජන හෙවත් කුඩා ලකුණු අසූවෙක් යැ.

නෙතැති = (නෙත ඇති)

1. චිත්තඞ්ගුලිතා
2. අනුපුබ්බඞ්ගුලිතා
3 වට්ටඞ්ගුලිතා
4. තම්බ නඛතා
5. තුංග ,,
6. සිනිද්ධ ,,
7. නිගුළ්හ ගොප්ඵකා
8. සමපාදතා
9. ගජ සමානක්කමතා
10. සීහ ,,
11. හංස ,,
12. උසභ ,,
13. දක්ඛිණාවත්තගතිතා
14 සමන්තතෝචාරු ජාණුමණ්ඩලතා
15. පරිපුණ්ණ පුරිසව්‍යඤ්ජනතා
16. අච්ඡිද්ද නාභිතා
17. ගම්භීර ,,
18 දක්ඛිණාවත්ත ,,
16. ද්විරදකරසදිස ඌරු-භුජතා
20. සුවිභත්ත ගත්තතා
21. අනුපුබ්බ ,,
22. මට්ට ,,
23. අනුස්සන්තානුස්සන්ත-සබ්බගත්තතා
24 අලීන ,,
25. තිලකාදි රහිත ,,
26. අනුපුබ්බරුචිර ,,
27. විසුද්ධ ,,
28. කෝටිසහස්ස හත්ථිබල-ධාරණතා,
29. තුංගනාසතා
30. සුරත්තද්විජමංසතා
31. සුද්ධ දන්තතා
32. සිනිද්ධ ,,
33. විසුද්ධින්ද්‍රියතා
34. වට්ටදාඨතා
35. රත්තොට්ඨතා
36. ආයතවදනතා
37. ගම්භීරපාණිලේඛතා
38. ආයත ,,
39. උජුක ,,
40. සුරුචිරසණ්ඨාන ,,
41. පරිමණ්ඩලකායප්පභවත්තතා
42. පරිපුණ්ණ කපෝලතා
43. ආයත විසාල නෙත්තතා
44. පඤ්චපසාදවත්ත ,,
45. ආකුඤ්චිතග්ගජවිබ්‍රමතා
46. මුදුතනුක රත්තජිව්හතා
47. ආයත රුචිර කණ්ණතා
48. නිග්ගණ්ඨි සිරසතා
49. නිගුළ්හ ,,
50. ඡත්තනිභචාරු සීසතා
51. ආයත පුථුල ලලාට සෝභතා
52. සුසණ්ඨාන භමුකතා
53 සණ්හ ,,
54. අනුලෝම ,,
55. මහන්ත ,,
56 ආයත ,,
57. සුඛුමාල ගත්තතා
58. අතිවිය සෝම්ම ,,
59. ,, උජ්ජලිත ,,

60. විමල ගත්තතා
61. කෝමළ ,,
62. සිනිද්ධ ,,
63. සුගන්ධ තනුතා
64. සම ලෝමතා
65. කෝමළ ,,
66 දක්ඛිණාවත්ත ,,
67. භින්නඤ්ජන සදිස නීල ලෝමතා
68. සිනිද්ධ ,,
69 අතිසුඛුම අස්සාසපස්සා–සධාරණතා
70. සුගන්ධ මුඛතා
71. ,, මුද්ධතා
72. සුනීල කේසතා
73. දක්ඛිණාවත්ත ,,
74. සුසණ්ඨාන ,,
75 සිනිද්ධ ,,
76. සණ්හ ,,
77. අලුළිත ,,
78 සම ,,
79 කෝමල ,,
80. කේතුමාලාරතන–රඤ්ජිතතා

යැයි ඇසූ අනුවියදුන් (අශීති අනුව්‍යඤ්ජන) සඳහන් වෙයි ධර්මප්‍රදීපිකාවේ.

1 පිරී තිබෙන්න වූ ඇඟිලි ඇති බව යැ
2 ක්‍රමයෙන් සිහින් වැ ගිය ,, ,, ,,
3 වට වූ ,, ,, ,,
4 රත් වැ තිබෙන්නා වූ නිය ,, ,,
5 උස් ,, ,, ,, ,, ,,
6 සිනිඳු,, ,, ,, ,, ,,
7 සැඟැවී තිබෙන්නා වූ බොලට ,, ,,
8 වළ ගොඩ නැති වැ සම වැ තිබෙන්නාවූ ශ්‍රී පාද ඇති බවයැ,
9 හස්ති රාජයකුට බඳු වූ ගමන් ,, ,,
10 සිංහ ,, ,, ,, ,, ,,
11 හංස ,, ,, ,, ,, ,,
12 වෘෂභ ,, ,, ,, ,, ,,
13 දක්ෂිණාවර්ත වූ ,, ,, ,,
14 නාත් පසින් හොබනා වූ දණ මඬුලු ,, ,,
15 පරිපූර්ණ වැ තිබෙන්නා වූ පුරුෂ ව්‍යඤ්ජන ,, ,,
16 සිදුරු නැත්තා වූ පෙකණි ,, ,,
17 ගැඹුරු වැ තිබෙන්නා වූ පෙකණි ,, ,,

18 දකුණු දිසාවට ඇඹරී තිබෙන්නා වූ පෙකණි ඇති බව යෑ
19 හස්තිරාජයකුගේ අතක් වැනි වූ අත් හා කලවා ,, ,,
20 වෙත වෙත මනා වැ තේරී තිබෙන්නා වූ
ශරීරාවයව ,, ,,
21 ක්‍රමයෙන් පිරිහිඳී යහපත් වැ
තිබෙන්නා වූ ,, ,, ,,
22 මට සිලුටු වැ තිබෙන්නා වූ ශරීර ,, ,,
23 උස් නො වැ මිටි නො වැ තිබෙන්නා වූ
සියලු ශරීර ,, ,,
24 නො හැකිළී තිබෙන්නා වූ ශරීර ,, ,,
25 තල කළුවක් මාත්‍ර කැළලක් නැත්තා වූ ,, ,, ,,
26 ක්‍රමයෙන් යහපත් වැ තිබෙන්නා වූ ,, ,, ,,
27 විශුද්ධ ,, ,, ,, ,, ,,
28 කොළ දහසක් පමණ ඇතුනට බල ,, ,, ,,
29 උස් වැ තිබෙන්නා වූ නාසා ,, ,,
30 රත් වැ තිබෙන්නා වූ විදුරු මස් ,, ,,
31 කොඳ කැකුළු සේ ඉතා සුදු වැ
තිබෙන්නා වූ දත් ,, ,,
32 ඉතා සිනිඳු වැ ,, ,, ,, ,,
33 විශුද්ධ වැ තිබෙන්නා වූ ඉන්ද්‍රියයන් ,, ,,
34 වට වැ තිබෙන්නා වූ සතර දළ දා වහන්සේ ,, ,,
35 රත් වැ තිබෙන්නා වූ ශ්‍රී මුඛ ,, ,,
36 හුදෙක් වට නො වැ මඳක් දික් වැ
තිබෙන්නා වූ මුහුණු ,, ,,
37 ගැඹුරු වූ අතුල් රේඛා ,, ,,
38 දික් වැ තිබෙන්නා වූ රේඛා ,, ,,
39 නො හැද වැ තිබෙන්නා වූ රේඛා ,, ,,
40 යහපත් සටහන් ඇති වැ තිබෙන රේඛා ,, ,,
41 සරත් කල්හි හිරු මඬුල්ලට බඳු වූ ශරීර ප්‍රභා ,, ,,
42 පිරී තිබෙන්නා වූ හනු ,, ,,
43 දික් වැ පළල් වැ තිබෙන්නා වූ ඇස් ,, ,,
44 පස් පැ දිස්නා ඇස් ,, ,,

45 මදක් අගින් නැමුණා වූ ඇසි පිය ඇති බව යැ
46 මොළොක් වූ තුනී වූ රත් වූ දිව් ,, ,,
47 දික් වූ මනා වූ කන් ,, ,,
48 ගැට නැත්තා වූ සිරස් ,, ,,
49 උස් නො වැ සම ප්‍රමාණ වැ හැසී
තිබෙන්නා වූ සිරස් ,, ,,
50 ඡත්‍රයක් බඳු වැ හොබනා වූ ,, ,, ,,
51 දික් වූ පළල් වූ තළල්හි ශෝභා ,, ,,
52 මනා වූ සටහනින් යුක්ත වූ බැම ,, ,,
53 සිලුටු වූ ,, ,, ,,
54 අනුලොම් වැ තිබෙන්නා වූ ,, ,, ,,
55 මහත් වැ ,, ,, ,, ,,
56 දික් වැ ,, ,, ,, ,,
57 සියුමැලි වැ ,, ශරීර ,, ,,
58 ඉතා මැ සෞම්‍ය වූ ගාත්‍ර ,, ,,
59 ඉතා මැ බබලන්නා වූ ශරීර ,, ,,
60 ඉතා මැ නිර්මල වූ ,, ,, ,,
61 කෝමල වූ ,, ,, ,,
62 සිනිඳු වූ ,, ,, ,,
63 ස්වභාවයෙන් සුවඳ වූ ,, ,, ,,
64 සම වූ ලෝමයෙන් යුක්ත වූ ,, ,, ,,
65 කෝමල වූ ලොම් ,, ,,
66 දකුණට සිසැරී තිබෙන්නා වූ ,, ,, ,,
67 අඳුනට බඳු පැහැයෙන් යුක්ත වූ ,, ,, ,,
68 සිනිඳු වූ ,, ,, ,,
69 සියුම් වූ තඟා ලන හෙළා ලන ශ්වාස ,, ,,
70 සුවඳ වැ තිබෙන්නා වූ ශ්‍රී මුඛ ,, ,,
71 ස්වභාවයෙන් සුවඳ වැ තිබෙන්නා වූ සිරස් ,, ,,
72 ඉතා නිල් වූ කේශ ධාතු ,, ,,
73 දක්ෂිණාවර්ත වැ තිබෙන්නා වූ ,, ,, ,,
74 මනා වූ සටහනින් යුක්ත වූ ,, ,, ,,
75 සිනිඳු වූ ,, ,, ,,

| | | |
|---|---|---|
| 76 | මට සිලුටු වැ තිබෙන්නා වූ | කේශධාතු ඇති බව යෑ |
| 77 | අවුල් නො වන්නා වූ | ,, ,, ,, |
| 78 | සම වූ | ,, ,, ,, |
| 79 | කෝමල වැ තිබෙන්නා වූ | ,, ,, ,, |
| 80 | කේතුමාලායෙන් හොබනා වූ | සිරස් ,, ,, |

යෑයි බුත් සරණයේ දක්වෙන්නේ ද එ මෑ බව විමසා බැලියෑ යුතු.

---

## (උ෴) මුනි අනුසස්

306—328

306. **තම වන දෙසෑ නැම ඉස කෙනකුන්නේ දෙසෑ වඳිනා ලෙසෑ නො නැමියෑ දෙන්නේ. තම යස තුති කළ දනන්නේ වතට කලෙකැත් පිරිදෙව් වැද්ද නො දෙන්නේ.**

(මුනි රජ තෙමේ) ඉස, තමා සිටිනා පැත්ත නැමැදීමෙන් පසු වෙන කිසි කෙනෙකුන් ගේ දිසාවට නැමෙන්නට නො දෙන්නේ යෑ. තමා ගේ යසස පැසැසූ දනන් ගේ මුඛයට කලෙකිනුදු හැඬීම් වැද්ද නො දෙන්නේ යෑ.

307. **තම නම සිහි කළ සතුන්නේ සිතට හැම දෙම්නස් දුක් වැද්ද නො දෙන්නේ. දනන්නේ හැම ලෙඩ සුව වන ලෙසෑ තම උපත මෑ අඟ බෙහෙදක් කොටෑ දුන්නේ.**

තමන් ගේ නම සිහි කළ සතුන්නේ සිතට සියලු දෙම්නස් දුක් වැද්ද නො දෙන්නේ සි. දනන්නේ හැම ලෙඩ සුව වන ලෙසට තම උපත මෑ අග්‍ර බෙහෙදක් කොටෑ දුන්නේ යෑ.

"හැම දෙම්නස්" යනු 'කිසි දෙම්නස්' යන අරුතෙහි යෙදුණේසි. 'හැම' යනු 'බසෑ දෙස' යෑ.

308. **පැදූ තම වෙතැ දික් කළ අත සිගමනකට දික් කරනු නො දේ. තම වෙතැ යෙම් (සි) එසැවූ පාදය නිරයට වැදූ දුක් විඳිනු නො දේ යැ.**

සැදූහය වඩා තමන් වෙතට (වැදීම් විසින්) දික් කළ අත හිඟමනකට දික් කරනු නො දෙයි. තමා වෙතට යෙම් යි නැගූ පය නිරයට වැදී දුක් විඳිනු නො දෙයි.

පැදූ - (ගීයේ) පැදේයා.

309. **සිනිල් ඇල් පවනින් ගිම් මඬවාලී යැ, මෙ සියල් ලොවැ පිය බස් දෙඩවා ලී යැ, වියවුල් සත සිතැ තොස් වඩවා ලී යැ, ගන බොල් බිම මහ අඹින් හඬවා ලියැ.**

(ඒ බුදුන් බුදු වන කල්හි) සිහිල් මැ සිහිල් හෙවත් ඉතා සිහිල් සුළඟින් ග්‍රීෂ්මය මැඬැ පවත්වා ලූයේ යි. මේ සියලු ලොව තුළැ ප්‍රිය වදන් බණවා ලූයේ යි. (දෙම්නස් ඇයෙන්) ව්‍යාකුල වූ සත්ත්වයන් ගේ සිතේ සතොස වඩා ලූයේ යි. ගන වූ ගොඩ බිම (ගන බොල් මහ පොළොව) මහ හඬින් හඬවා ලූයේ යි.

'ලී යැ' යනු ගීයේ ඇත්තේ 'ලියැ' යන්නෙනි.

310. **මුහුදද රත් පඬෙර පුප් ගැවැස්වි යැ, නුබ තල පිපි මල් වියනින් වැස්වී යැ, මුළු ලොවැ සුවඳ ඇති මල් වැසි වැස්වී යැ, සතර අපා සත සුව සේ වැස් වි යැ.**

මුහුදේත් රත්, සුදු මල් ගැවැස්වී යැ, අහස් තලය පිපුණු මල් වියනින් වැස්වූයේ යැ, ලොව මුළුල්ලේ සුවඳ ඇති මල් වැහි වැස්වූයේ යැ, සතර අපා සතුන් සුවයෙන් වාසය කැරැ වූයේ ය.

1. නිරය, 2. තිරිසන් අපාය, 3. ප්‍රේත ලෝකය 4. අසුර නිකාය යනු සතර අපාය යි.

පුව්ද ඈති = සුවදෑති

**311. අට උතුරු සිය සුබ ලකුණින් සිරිමත් එ බුදුන් බව දුක් යට කැර බුදු වත් වට සිය සොදුනෙකැ ගනා ගිනි දුල් ගත් අට මහ නරකය සියපත් අවුල් විසැ.**

එක් සිය අටක් මගුල් ලකුණින් ශ්‍රීමත් වූ ඒ බුදුන්' සංසාර දුක් යට පත් කොටැ බුදු වන කල්හි අවටින් සියක් සොදුනක් සරියේ සණ වූ ගිනි ජාලාවන් ගත් අට මහ නිරය නෙළුම් මලින් ගවස්වා ලූයේ යි.

> 'සංජීවඃ කාලසූත්‍රශ්ච
> සංඝාතෝ රෞරවඃ තථා
> මහා රෞරව තාපශ්ච
> ප්‍රතාපාවීචි නාමකා'

(1. සංජීවය, 2 කාලසූත්‍රය, 3. සංඝාතය, 4. රෞරවය, 5. මහා රෞරවය, 6. තාපය, 7 ප්‍රතාපය, 8 අවීචිය) යැ යි අට මහ නිරය සඳහන් වෙයි.

අට උතුරු = අමතුර

බුදුන් ගේ සිරිපත්ලේ සුබ ලකුණු එක් සිය අටක් ඇතියි යෙති. දෙ සිරි පත්ලේ සුබ ලකුණු ගණන එ විටැ දෙ සිය සොළොසෙක් වෙයි. 'මගුල් ලකුණ' නැමැති පොත සපයා ඇත්තේ ඒ ලකුණු සඳහම් ති. (අතිරේකය බලන්නැ).

**312 ගෝතම නම් එ බුදුන් පේත ලොවේ සා ගිනි දුක් මුල් සිඳැ බුදු වන සඳැ, බීත කරන ලෝදිය උන් මුවැ වැදූ එ මැ සඳැ සීත අමා මියුරස විසැ.**

ගෞතම නම් වූ එ බුදුන් ප්‍රේත ලෝකයේ සුදහ ගිනි දුක් මුලින් මැ නසා බුදු වන විටැ බිය පමුණුවන්නා වූ ලෝදිය උන්ගේ මුඛයට වැදී එ විටැ සිහිල් වූ අමෘතය බඳු මිහිරි රස වූයේ යි.

'තමන් පිළිසඳගත් මඟුලෙහි අට මහා නරකය චිත්ත සුඛය පුරාලූ මහා නිධානයක් සේ සුවයෙන් නිරන්තර කළ හැ ' (බුත්:).

313. **අවි ගත් යමපල් නන්දන කෙළි වන, දන වන නන් බලවත් කම් කවුලින් බිය පත් නන්දන වන අසිපත්වන සුර සෙන් කෙළි නන්දන වන සිරි ගත්.**

ආයුධ ගත්තා වූ නිරය පාලකයන් ගේ පියකරු ක්‍රීඩාව වන, උපදවන්නා වූ නො එක් විධියේ දුක් මෙහෙ කැරැවීම් වධ පැමිණවීම් ආදියෙන් බියට පැමිණි නානා ජනයා වසන අසි පත්‍ර වනය නම් නිරය දිව්‍ය සේනාවන් ක්‍රීඩා කළ නන්දන වනයේ සැටි ගත්තේ යැ.

යම පල්ලන් ගේ පිය කර (නන්දන) කෙළි නම් නිරාදුක් විඳුනා සතට බලවත් කම් කවුලු පමුණුවමින් උන් පෙළීම යි.

'ඝෝර වූ අසිපත්ත වනය නන්දන වන කළ හැ ' (බුත්:).

නන්දන (පිති ජනක) කෙළි වන
දනවන නන් (උපදවන නො එක්)
නන් දන වන (නොයෙක් දනන් වන්නා වූ)
නන්දන වන (නඳුන් වනය)

314. **සත් වග වෙත් මහ මෙතට, අමාවට උන් අමාවට බුදු බවට පත්වන, නිරි සත් මුවට අමාවට පත්වන දිලි රත් යවට අමාවට පත් වී සැ.**

සත්ත්ව වර්ගයා කෙරෙහි මහ මෙතට (ද), අමා වට (ද) උන් (හෙවත් එ බුදුන්) අමෘතය වැස්සා වූ බුදු බවට පැමිණි කල්හි නිරයැ සතුන් ගේ මූඛයට වේදනා දුක් පිණිසැ පත් වන්නා වූ ගිනියම් වැ දිලිසෙන යකඩ ගුළි අමෘතය බවට පත් විණි.

මීට පළමු පැදියේ 'තත්දත වත' යන්න සේ මෙහිදු 'අමාවට' යනු නො එක් අතට හරවා බිඳැ නො එක් අරුත් ගන්නට සිදු වේ. ඒ මෙසේයි.

**අමාවට** (අමායාවට)

**අමා වට** (අමෘතය වැස්සා වූ)
**අමාව ට** (ආමය පිණිසැ)
**අමාවට** (අමෘතය බවට)

**උන් අමා වට බුදු බවට පත් වන**:- ඔවුන් අමෘතය වැස්සා වූ බුදු බවට පැමිණෙන විටැ. අමා වැස්සා වූ යනු 'නිවන් ගෙනැ දුන්' යන අරුතෙහි යෙදිණ.

උන් බුදු බවට පත් වූයේ මහ මෙතට (ත්) අමාවටත් යැ. (සත්ත්වයා කෙරේ වූ 'මහා මෛත්‍රිය' නිසාත්, ඒ සත්ත්වයා 'තොරොවැටියැ දෙනු' නිසාත් යැ).

ඒ බුදු බව **අමා වට** – අමෘතය වර්ෂණය කළ – (එ නම් නිවන් ගෙනැ දුන්) එකෙකි. අමා යන්නෙන් නිවන් අදහස් කරනු ලැබේ අපමණ සතුන් හට නිවන් ගෙනැ දුන් එ බුදු බව අමා වට (අමෘතය වැස්සා වූ) එකෙකි.

'නරකයෙහි සත්ත්වයන් මුවෙහි ලා ලූ යවට අමා වට කළ හැ.' (බුත්:).

නිරි සත්තු නම් නිරයේ දුක් විඳින්නෝයි නිරිසන් මුවට අමාවට' සිටීම නම් නිරයේ දුක් විඳින්නවුන් ගේ මුඛයට වේදනා දුක දීමයි. අමව (ආමය) නම් වේදනා දුකයි. ගිනි ගෙනැ දිළියෙන යකඩ ගුළි නිරයේ සතුන් ගේ මුඛය දවයි. 'යවට' නම් යකඩ ගුළියි.

315. **තුම්ල් වන ගිනි දැල් විසිරැ බියකරු, තුල් වනා සොලොස් අඟුලින් කමු නිරතුරු, ඔසුපත් නිර අතුරු පිහිමි ඉඹුල් වන සත සතොසැ උපුල්වන සුර තුරු වියැ.**

විශාල වන්නා වූ ගිනි දැල් ඉඟිරී මෙන් බිය ඇති කරවන මහත් වන්නා වූ දහසය අඟලේ කටුයෙන් අතරක් නැති සේ ගැවසුණු, ඔසුපත් (උත්සද) නිරය ඇතුළේ වූ ඉඹුල් වනය සත්වයා සන්තෝෂයේ ඉපිලී යන්නට සලස්වන දිව්‍ය වෘක්ෂ වූයේ යි.

'සොළොසඟුල් කටු ඇති හිඹුල් රුක නරක සත්ත්ව-යන්ට කප් රුක් කළ හැ' (බුත්:).

**316. ඛරවැල් අවුලින් දග වන නිරි සත් යම පල් බිළියෙන් ලගැ ලගැ අදනා, ඇම කල් දල අවුල් වේතරණී ගඟ සුර ගඟ විලසින් සිහිල් ඇල් වියැ**

කියත් දත් වැනි කටු ඇති වැල් ඇතුළේ පටලැවෙන නිරි සතුන් (නිරේ පැසෙන සතුන්) යම පල්ලන් ලං ලං කොටැ බිළියෙන් අදිනා වේතරණී ගඟ සුර ගඟ විලසින් සිහිල් ඇල් දියැ වියැ.

'ඛාපක් මුළුල්ලේ තැවී ගියා වූ ලෝදියෙන් පිරුණු වේතරණී ගංගාව පස් වනක් පියුමෙන් ගැවැසී ගත්තා වූ ආකාශ ගංගාව කළ හැ.' (බුත්:).

**317. නිති ගිනි ගෙනැ රත් ඝන බොල් යකබල් ඇම කල් සිළිලැ ඔත් මෙන් සිහිල් ඇල් වත් ගිනි දුල් ලෝ දිය ලෝ කුඹු නිරයත් මනකල් මල් අවුල් පිරිකුඹු සිරිගත්.**

නිබඳ ගිනි ගෙනැ රත් වූ තද ගත කම ඇති යකඩ බිම් බිතු ඇති සියලු ද දියෙහි දැමුවා සේ ඉතා සිහිල් වත් මැ, ගිනි දැල් ඇති ලොහො දිය සහිත ලෝහ කුම්භී නිරයත් සිත් අදින්නා වූ මල් කලප් පිරුණු කළයෙකැ සැපි ගත්තේ යැ.

'ලෝ දියෙන් පිරුණු ලොහොකුඹු නරකය අභිමතාර්ථ-සාධන්නා වූ භද්‍ර කුම්භ කළ හැ.' (බුත්:).

**318. දස දහසක් සක්වල අතුරු ඇම වරු දුරු නො වැ එක රගට මැ දරුණු වැ සිටි ලොවැදිරි නිරයේ ඝන අඳර ඉරු සඳු සූවහස් එක වර වත් මෙන් දුරු වියැ.**

දස දහසක් සක්වළ අතරේ සියලු කල්හි දුරු නො වී එක හැටියට මැ දැඩි වැ සිටියා වූ ලෝකන්තරික නිරයේ ඝන අඳුර ඉරු සඳු සිය දහස් ගණනක් එක් විටැ වැදුණා සේ දුරු වූයේ සි.

'කපක් මුළුල්ලේ ආලෝකයෙක්හි රස නො දන්නා වූ ලෝ ඇදිරි මහ නරකයෙහි අන්ධකාර විජයට දස දහසක් සක්වලැ හිර සඳ එක විටැ මැ වැදූ ගියා සේ එහි එක විටැ මහා ආලෝක පැවැත්වූ හැ' (බුත්:).

සක්වළතුර = සක්වළ අතුරු
ගනඳර = ගන අඳර

**319. හිමවතැ, මෙරගිරි (සිරසේ), කුල ගිරි සිරසේ, දස දහසක් සක්වලැ හැම දිවයිනැ හැම තැනැ බිමැ සිටැ තුරු සිරට මැ එක බඳ සේ එ මැ සේ මල් පිපුණෝ යැ.**

හිමාලයයෙහි ද, මහ මෙර මුදුනේ ද, කුල පවු මුදුනේ ද, දස දහසක් සක්වළේ සියලු දිවයිත් හි ද, බිමැ සිටැ ගස් මුදුනට මැ එකට බැඳුණා සෙයින් ඒකාකාර වැ මල් පිපුණේ යැ.

දස දහස් යනු එළි වැට නිසා 'දස දහසේ' යි වී.

**320. උරගුන් ගේ ගතැ රුස් වූ දුහුලින් මොනරුන් ගේ පිල් කලඹින් පිස්වූ, දිවියන් ගේ කෙළි මඬලට රුස් වූ ඓවෙහෙළුන් අං දළුයෙන් කර කැස්වූ.**

තසින් ගේ ඇගේ රුස් වූ දූලි මොනරුන් ගේ පිල් කලබින් පිස්වූ හ. දිවියන් ගේ සෙල්ලම් පිටියට රුස් වූ මූවන් ගේ අං දළුයෙන් (ඒ දිවියන් ගේ) කර කැස්වූ යැ.

මෙ තන්හි පිස්වූ, කැස්වූ, ඈ විසින් බුහු බසින් ක්‍රියා පද යෙදීම පළමු පවත්වා ගෙනැ එන ලද වහර නය සිදීමෙකි.

'වෙහෙලු' නම් (පිරිමි) මූවෝයි.

321. **අරණෝ උරගුන් මුගපින් සතපා උන් දරණෙ මැඩියන් නිදි ගැන්වූ. සිවලුන් කෙළිමින් සිපි තුරු සෙවණෙ එ කොණෙ සහවුන් පෙම් කෙළි කෙළැවූ.**

වනයේ මුගටියන් සමගින් නයින් සතප්වා ඒ නයින්ගේ දරණෙහි මැඩියන් නිදිගැන් වූ යැ. සිවලුන් සෙල්ලම් කරමින් සිපි ගස් සෙවණේ එ විටැ මැ හාවුන් පෙම් කෙළි කෙළැවූ හ.

322. **උරගුන් ගේ වණ වූ පෙණ මඬලට පිය තෙපලින් ගුරුළුන් ඔසු ඇණෑවූ. සනහසැ එක පණ වූ නරයන් මෙන් තුරගුන් මිඟිවුන් පිය බස් බැණෑ වූ.**

නයින් ගේ තුවාල ඇත්තා වූ පෙණ මඬුල්ලට ගුරුළුන් ලා පිය බසින් බෙහෙත් නියම කැරුවූ හ. සතායෙන් එක පණ වැනි වූ මිනිසුන් සෙයින් මියුවනුත් අසුනුත් පිය වදන් දෙඩීමෙහි නියුතු කැරුවූ හ.

323. **බලලුන් ගේ වෙතැ මිඟියන් ගේ සිතැ අරතර වූ නිති බිය ඇරුවූ. දිවා අඳුන් ගේ වෙතැ කපුටන් ගේ සිතැ පෙරු වූ තර වෙර සෙනෙහස කැරුවූ.**

මීයන් ගේ සිතේ බළලුන් කෙරේ නිබඳ වැ පැවැති මහත් බිය ඇරු වූහ. බකමූණන් කෙරේ කපුටන් ගේ සිතේ පෙරු සිටැ දැඩි වැ පැවැති වයිරය සතාව කැරුවූ හ.

**දිවඳුන්** = දිවා අඳුන් (දවාලට අන්ධයන්) බකමූණන්.

324. **නොසරුන් නිය පඳුරින් ඇරැ දුන් ෆෙස ගොදු-රින් ගිජිඳුන් සනහා ලූ. ගිජිඳුන් කර පොකුරින් ගෙනැ වත් කළ දිය දහරින් නොසරුන් ගිම දුරැ ලූ.**

සිංහයන් නිය පදුරින් ගෙනැ ඇවිත් දුන්නා වූ රසවත් ගොදුරින් ඇතුන් සනහා ලූ හ. ඇතුන් සොඬ අගින් ගෙනැ වත් කළ දිය ධාරාවෙන් සිංහයන් ගේ ග්‍රීෂ්මය දුරු කැරැ වූ හ.

**ගිජිඳුන්** = ගජ ඉදු + උන්

(ඇඳිනැවීම කියවා 320, 321, 322, 323, 324 යන පැදි පිළිබඳ පවත් දත්තැ.)

325. **ගොළුවන් කී මියුරස ගී ලෙසට බිහිරන් දෙන අත්තල තාළමට දැ අඳුන් ඇස දුන් රස අඳුන් ලෙසට නන් පිළු දන රුවට රඟ කැරුවූ.**

ගොළුවන් ගැයූ මිහිරි රස ගී අනුවැ බීරන් අත් තල ගැසීමෙන් දුන් තාළම තො සිඳැ උපතින් මැ අඳ වූ දනන් ගේ ඇසට ලූ රස අඳුන් බඳු සුවය දනවන නැටුම් නො-යෙක් කොරුන් ලා කැරුවූ.

**ගොළුවන් ගී ගැසීමත්, එ අස අසා බිහිරන් අත් තලින් තාළම දීමත්, එ අනුවැ කොරුන් නැටීමත් එ නැටුම් උපතින් මැ අඳ වූවන් නැරැඹීමත් එ ; අසිරි ගොඩේ ලා දක්විණි. දෙ තිස් පෙර නිමිති ගොඩෙහි දැ මේ අසිරි සඳහනි.**

(ඇඳිනැවීම කියවා අදුනත්තැ).

**'ට' යනු සඳැස නිසා 'වා' යි යෙදිණි.**

**326. මිනිස් අත් බව, තිරිසන් අත් බව ලද හැම සත් වග විදිනා හැම තද දුක් දස දහසක් සක්වල වැදූ බැලුවත් එ බුදුන් බුදු වන සඳ මද කුත් නැති.**

මිනිස් ජන්මය, තිරිසන් යෝනිය ලැබූ සියලු සත්ත්ව වර්ගයා විඳිනා වූ සියලු (විදියේ) දැඩි දුක් දස දහසක් සක්වළැ වැදී බැලුවත් ඒ බුදුන් බුදු වන විටැ මඳක් වත් නැති.

වැදූ, සඳැ = වැද, සඳ.

**327. දස දෙස මැද හළ මෙන් නිකසල වී, සියු සයුර නිසල වැ අම රස ඇතිළි වි, තොස කැරැ මුළු ලොව ගත් පුද කෙළි වි, දස දහසක් සක්වල එක හෙළි වි.**

දස දිග මැ මැදූ හැරියා (මැදූ ලා හළ) මෙන් කිලිටි රහිත වූ යේයි. සතර සාගරය නිශ්චල වැ අමා රස ඇතිළි වූ යේයි. දස දහසක් සක්වළ ඒකාලෝක වූ යේයි.

'ලුණු කර වූ මහා සාගර තලය සර්කරා බහා ලා කකාරා ගත් කිරි ඇළියක් සේ මිහිරි කළ හැ.' (බුත්:)

සියු සයුරම = සියු සයුර අම
රසැතිළි = රස ඇතිළි

**328 මුළු තුන් ලොවැ ගෙයැ ගෙයැ හළ දෙර ඇති වි, දන සැන් වද බන්දනයෙන් තොර වි, හැම තැන් දිව සුවඳින් මන හර වී, මෙ ලෙසින් මුළු ලොවැ මහ පෙළහර වී.**

සියල් තුන් ලොවේ ගෙයෙක්හි, ගෙයෙක්හි හරිනා ලද දොර ඇති වැ ජන සමූහයත් වධ බන්ධනයෙන් මිදී (හෙවත්) තොර වැ, සියලු දිව්‍ය ම ය වූ, සුවඳින් මනෝ හර වැ, මේ මේ අයුරු සියල් ලොවේ මහා ප්‍රාතිහාර්ය වූයේයි.

'වී' යනු 'වූයේයි' යන අරුත ද දෙයි. එහෙත් මුල් තුන් පියේ දී 'වැ' යනු පිණිසැ ඒ යෙදුණු සේ ගනුයි වදන් නිරුයට එකඟ වත්තෝ.

329. **එ බසින් බසට මැ තුති නද කරවා, වෙසෙසින් තම නැණ පමණින් පිරිසිඳැ, අහසින් එක පිනි බිඳ බානා මෙන් එ මැතිඳු මෙ ලෙසින් බුදු ගුණ කී සඳැ—**

ඒ (කියූ) වචනයෙන් වචනයට ස්තුති පූජා කරවා, විශේෂයෙන් තමා ගේ නුවණ ඇති පමණට පරිච්ඡේද කොටැ ගෙනැ අහසින් එක් පිනි බින්දුවක් බාන්නා සේ මේ විදියට එ ඇමති වරයා බුදු ගුණ කී කල්හි-

ඒ ඇමතිවරයා බුදු ගුණ කියත් කියත් ඔහු ගේ වදනක් වදනක් පාසා අසා සිටියවුන් තුති නද පැවැත් වූ බවයි 'එබ සින් බසට මැ තුති නද කරව' යනු ඇඟැවූයේ-

ඔහු කීයේ අනන්ත වන බුදු ගුණයෙන් ඉතා මඳ කොටසක් බව ඇඟැවීමට යි 'අහසින් එක පිනි බිඳ බානා මෙන්' යනු යෙදූයේ.

---

## (ඒ) බුදු ගුණ පමණ

330—338

330. **ඔහු සුබැසි තෙපුලෙන් මුනිඳුන් නිසි ගුණ අසා, නැවැතැත් අසනා රිසි නිරිඳු ගෙණෙ මේ ලෙසින් පිළිවිසි.**

ඔහු ගේ යහපත් කොටැ කියන ලද වදන් ඇසිරින් මුනි රජුන් ගේ -ඇසීමට වුව ද කීමට වුව ද- සුදුසු වූ ගුණ අසා ආයේ ද අසනු කැමැති වූ රජ සමූහය මෙ අයුරින් පෙරළා පැන තැඟූ ය.

මනා කොටැ කියන ලද්දේ 'සුබස්' නම්. සුබස් ඇතියේ නු යි ද 'සුබැසි' වේ. සුබස් මැ වූයේ නු යි ද සුබැසියි.

ඒ රජ සමූහයා (නිරිඳු ගණ) විසින් අසන ලද්දේ මුනිඳුන් ගේ 'නිසි' ගුණයි. එ ගුණ පැවැසීමට ද නිසියි, ඇසීමට ද නිසියි.

'ගණ' යනු සුමු (සමූහ) යන අරුත දෙයි.

'පිළිවිසි' යනු 'එක' 'බුහු' දෙ බසට සම යි.

331. **ලොවට උතුමැයි යන බඹ සුර නරන් පසු කොටැ, නියම කොටැ පැවැසු මෙ තෙක් ගුණ ඒ මුනිඳුට ඇත් ද?**

ලෝකයට උතුම් යැ කියා කියන බ්‍රහ්මයන්, දේවියන්, මිනිසුන් පහත් කොටැ (හෙවත් පසු ගත්වා) නියත කරමින් කීවා වූ එ තරම් මැ ගුණ එ මුනි රජුට ඇති ද?

ලොවේ උතුමෝ යැයි දතත් කියත්තා වූ බඹහු වෙති. (එ හෙත්) බඹුන් ගැනැ කතාවෙක් මේ විසල් පුරේ තුන් බියට පිළියම් විමැසීමේ දී නො වී දෙවියෝ ද වෙති. මෙහි ඔවුන් අතුරින් මහ දෙවියා, වෙන් (විෂ්ණු) දෙවියා, ගිනි දෙවියා යන මූ සඳහන් වූහ. උතුමන් හැටියට සඳහන් වූ නරන් අතුරෙහි පස් නිවට බුදුන් ලා ගිනියැ හැකියි. සෙස්සවුන් බඹුන් සඳහන් නො කළත් බුදු ගුණ වැනු ඇමැත්තා:–

'බඹ සුර නිරින්දේ

මුනි පද තඹර වැන්දේ' යි

බඹුන් සඳහන් කෙළෙන් නිරිඳුන් ගේ බඹුන් සඳහනට ඉඩ ඇරෙයි.

'මෙහි නියම කොටැ' යනු 'නිර විසින් මැ' යන අරුත දෙයි.

'කොටැ' යනු එළි වැට නිසා 'කොට' යැයි යෙදිණි.

**332. මුනිඳුන් වෙසෙස ගුණ තතු ලෙසැ දනැ ගත නොහී නිරිඳුන් කී එ බස අසා එ මැතිඳු මේ ලෙසැ කියයි.**

මුනි රජුන් ගේ වෙසෙස් (ඔවුන් වහන්සේට මැ ඇරුණු) ගුණ ඇත්තේ හැටියට දනැ ගන්නට නො හැකිවී මෙන් රජුන් පැවැසූ ඒ කතාව අසා ඒ ඇමති තුමා (මැතිඳු = මැති ඉඳු) මෙ අයුරින් කියයි.

(ගත් කරුවාණන් තව හුස්මක් බුදු ගුණ වැනීමට ඉඩ කඩ සලසාගත් සැටියි ඒ. එ තෙක් ඇමතියා පැවැසූ බුදු ගුණ අසා සිවි රජුනට බුදුන් ගේ ගුණ මහිම දන්නට බැරි විණියි සිතනු බැරි වෙයි).

'ලෙසැ' යනු එළි වැට නිසා 'ලෙස' යි යෙදිණි.

**333. බඹ සුර ලොවැ, දෙරණ හැම තැනැ දනන් අපමණ නුවණ ලැබ කියතත් අප බුදුන් ගේ ගුණ පමණ නැතැ.**

බ්‍රහ්ම, දිව්‍ය (යන දෙ) ලොවේ (ද), පොළොවේ ද යන සියලු තන්හි ජනයන් (මෙ තෙකැයි) පමණක් නැති නුවණ ලබා ගෙනැ (එක් වැ) කියතත් අපේ බුදුන් ගේ ගුණ අපමණ යැ.

'බඹ, සුර ලොව, දෙරණැ' යනු තුන් ලොව ඇඟැවීමට යෙදිණි. 'බඹ, සුර ලොව දෙරණැ දනන්' යනු තුන් ලෝ වැසියන් යන අරුත දෙයි.

'දෙරණ = දෙරණැ (එළි)'

**334. ඔවුන් ලෙසැ කප් සාර සැකි සුවහසැ දස පෙරුමන් නිතොරැ නුපුරා ඔවුන් ගුණ රැස කෙසේ පැවැසියැ හැකි ද?**

ඔවුන් (එ නම් එ මුනි රජුන්) පරිද්දෙන් සතර අසංඛ්‍ය කල්ප ලක්ෂයක් (මුළුල්ලේ) නො කඩවා මැ දස පාරමිතාවන් පුරන්නේ නැති වැ ඔවුන් (වහන්සේ) ගේ ගුණ සමූහය කවර අයුරින් කියන්නට හැකි වේ ද?

මුනි රජහු පැරුම් දසයක් පිරූහ. එ ද නො කඩවා, මැ (එක් අත් බැවෙකු දු අත නැරැ) පිරූ හ. ඒ පිරීම ද සතර අසංඛ්‍ය කල්ප ලක්ෂයක් මුළුල්ලේ වී. එ තෙක් කල් පැරුමන් පිරීමෙනි මුනිඳුන් 'බුදු' බව ලැබූයේ.

'දානං සීලඤ්ච නෙක්ඛම්මං
පඤ්ඤා විරියේන පඤ්චමං
ඛන්ති සච්ච මදිට්ඨානං
මෙත්තුපෙක්ඛාතිමේ දස'

(දාන, සීල, නෛෂ්ක්‍රම්‍ය, ප්‍රඥා, වීර්ය, ක්ෂාන්ති, සත්‍ය, අදිට්ඨාන, මෛත්‍රී, උපේක්ෂා) යැයි දස පාරමිතාවෝ සඳහන් වෙත්.

'දාන, දාන උප, දාන පරමත්ථ' ඈ විසින් එක් එක් පාරමිතාව තුනක් තුනක් කොටැ පැරුම් 'සම තිසක්' විසින් ද පෙරැ ඇදුරෝ දක්වති.

ලොව මැවී, වැඩී යළි නැසෙන තෙක් කල් කපෙකි. එහි පමණ නො එක් උපමායෙන් මිසැ අවුරුදු ගණනින් නො දක් වූ යැ පෙරැ ඇදුරෝ.

'කපෙක් නම් බොහෝ කාලයෙකැ. යොදුනක් උස කොටුවෙකැ අබ පුරා ලා හවුරුදු ලක්ෂයක් ගිය කලැ අබ ඇටයක් බැගින් හරිතොත් අබ ගෙවී යේ ල, කපෙකැ අවුරුදු නො ගෙවේ මැයි.........' (පූජා:) ඈ විසිනි ඒ දැක්වීම.

'සුවහස' යනු සිය දහස අඟවයි. එ නමා ලක්සය. කප් සාර සැකි 'සුවහස' නම් කප් සතර අසැකි (අසංඛ්‍ය) ලක්සය' යි. අසැකිය (අසංඛ්‍යය) මෙ සේයි ඇදුරන් දක්වන්නේ:-

| | | | |
|---|---|---|---|
| දස | දසයෙක් (10 × 10) | නම් | සියයෙකැ |
| ,, | සියයෙක් | ,, | දහසෙකැ |
| සියක් | දහසෙක් | ,, | ලක්ෂයෙකැ |
| ,, | ලක්ෂයෙක් | ,, | කෝටියෙකැ |
| කෝටි | කෝටියෙක් | ,, | ප්‍රකෝටියෙකැ |

| | | | |
|---|---|---|---|
| ප්‍රකෝටි කෝටියෙක් | | නම් | කෝටිප්‍රකෝටියෙකැ |
| කෝටි ප්‍රකෝටි කෝටියෙක් | | ,, | නහුතයෙකැ |
| නහුත කෝටියෙක් | | ,, | නින්නහුතයෙකැ |
| නින්නහුත | ,, | ,, | හුත නහුතයෙකැ |
| හුත නහුත | ,, | ,, | කම්භයෙකැ |
| කම්භ | ,, | ,, | විස්කම්භයෙකැ |
| විස්කම්භ | ,, | ,, | අහහයෙකැ |
| අහහ | ,, | ,, | අබබයෙකැ |
| අබබ | ,, | ,, | අටටයෙකැ |
| අටට | ,, | ,, | සෝගන්ධිකයෙකැ |
| සෝගන්ධික | ,, | ,, | උප්පලයෙකැ |
| උප්පල | ,, | ,, | කුමුදයෙකැ |
| කුමුද | ,, | ,, | පුණ්ඩරීකයෙකැ |
| පුණ්ඩරීක | ,, | ,, | පදුමයෙකැ |
| පදුම | :, | ,, | කථානයෙකැ |
| කථාන | ,, | ,, | මහා කථානයෙකැ |
| මහා කථාන | ,, | ,, | අසංඛ්‍යයක් නමි. |

'දස පෙරුමත්.........ඔවුන් ලෙසැ නුපුරා.........ගුණ රැස කෙසේ පැවැසියැ හැකි ද'

යනු පැවැසීමෙන්

'දස පෙරුමත්.........ඔවුන් ලෙසැ පුරා......' ගුණ රැස පැවැසියැ හැකි බවෙක් ඇඟවෙයි ඒ සුදුසු පැවැසීමෙකියි නො කියැ හැකි. බුදු ගුණ අනන්ත වන බැවින් බුදු කෙනකුන් හට ද පවසා නිම කළ නො හැකි බවයි පිළිගත් පවත නම්.

'(නමච්) නොමින් අන්

බුදුනුදු වනත ගුණ ගණ...'

යනු කියති සස ද කව් කරුවෝ ද?

335. **උන් රුසිරු නෙතැ දුකැ, ඔවුන් සදහම් සිතැ වැදූ. නො පහන් කෙංනක් නැතැ, එසින් උන් ගුණ කියන් කිම් නැතැ.**

ඔවුන් (වහන්සේ ගේ) රූ සැපත (රූප සම්පත්තිය) ඇසින් දුකැ ලා, උන් වහන්සේ ගේ මනා වූ දහම (සද්ධර්මය) සිතට වැදී පැහැදුණේ නැති කෙනෙක් නැත්තා හ. ඒ නිසා ඔවුන් වහන්සේ ගේ ගුණ කියනවා නම් සීමාවෙක් (කෙලවරෙක්) නැත්තේ යැ.

බුදුන් ගේ රුව ඇසින් දුකැ, බුදුන් දෙසූ සදහම අසා සිතට ගෙනැ එයින් බුදුන් කෙරේ නො පැහැදුණු කෙනෙකු නැති බවත් එ කරුණින් බුදුන් ගේ ගුණ මෙ තෙකැයි දක්වීමට ඉමක් නැති බවත් එයින් පැවැසිණි.

336. **බුදු ගුණ මහ මුහුද හැම සඳැ නුදුටු පර තෙරැ. මෙ සඳැ මා කී ගුණ එසින් ගත් එක දිය බිඳ වැන්නැ.**

බුදුන් ගේ ගුණ නැමැති මහ මුහුද සියලු කල්හි නො දක්නා ලද එ තෙර ඇත්තේ වේ. මෙ විටැ මා පැවැසූ ගුණ එසින් ගන්නා ලද එක දිය බින්දුව වැනි වේ.

'මා දුන් පැවැසූ බුදු ගුණ මහ මූදින් ගන්නා ලද දිය බින්දුවක් වැනියි පමණින්' යනුයි එ පැවැසුයේ.

මහ මුහුද එ තෙරක් නුදුටු දිය කඳෙකි. බුදු ගුණ ද සීමාවක් නැති එකෙකි. එ හෙයින් සීමාවක් දක්නට නැති බුදු ගුණ කඳ එ තෙරක් නො දක්නා ලද මහ මුහුද බඳුයි. දුන් මේ ඇමතියා කීයේ එ තෙරක් නො දක්නා ලද මහ මුහුද ඇඳින්නීමට එයින් දිය බිඳක් පෙන්නුවා මෙන් සීමාවක් නැති බුදු ගුණ කඳින් බිඳෙකි.

'හැම සඳැ, මෙ සඳැ' යනු 'හැම සඳ, මෙ සඳ' යැයි එළි වැට නිසා යෙදිණි.

337 . **බුදු ගුණය සැම ගින් පොළොවෙහි පස් රහින් දිසි. මෙ රහින් ම කි ගුණ එසින් නිය අගින් ගත් පස් වැන්නැ.**

බුදුන් ගේ ගුණය (බුද්ධ ගුණය) සියලු ආකාරයෙන් පොළොවේ පස් වැනි වැ පෙනේ. මේ විදියට මා කියූ බුදු ගුණය එ පොළොවේ පසින් නිය අගින් ගත් පස් වැනියි.

බුදුන් ගේ ගුණය මහ පොළොවේ පස් රැස වේ නම් මා කී බුදු ගුණ එ මහ පොළොවේ පස් රැසින් නිය අගට ගත් පස් සෙයින් ඉතා සුළුයි.

කී බුදු ගුණ ඉතා මඳ බවත් නො කී සරිය ඉතා බොහෝ බවත් පැවසූ සැටියි ඒ.

නියගින් = නිය අගින්.

(සැම) **ගින්. '**ගී' ගින් යනු 'ආකාරාර්ථයෙහි' වැටේ මෙ බෙහෙවින් වහර වූයේ ජයවද්දන පුර අවදියට පෙරැයි.

'පරණල ගින් බෙමේ සත්
අවිදු හේති පුත පුතා'

යනු පඬු ඉදු වදනයි. (කා: සි: ii. 24)

388. **බුදු ගුණ මහ අහසැ නිම්මක් නුදුටු දස දෙසැ. ම කි බුදු ගුණ ලෙස මැසි පියෙනි සෙවි නුබ කුස වැන්නැ.**

බුදුන් ගේ ගුණ නැමැති මහා ආකාශයේ කෙළවරක් නො දක්කා වූ දස අත යැ. මා කීවා වූ ගුණ ටික මැසි පියා පතින් සෙවිලි කරන ලද අහස් කුසය වැනි යැ.

අහස මහත් යැ, එහි දස අතෙකි. කවර අතැ ද ඉමෙක් නො දක්නා ලද්දේ වේ. එ බඳු අහස් කුස මැස්සෙකු ගේ පියා පතෙකින් සෙවිලි කළ සරිය බඳු වෙයි මා කී ගුණ ටික. නො කී සරිය සෙසු අහස් මඬුල්ල බඳුයි.

**'ලෙස'** (ලේශය) යනු ඉතා මඳ යන අරුත දෙයි.

කළ බුද්ධ රක්ඛිත හිමියන් තමන් වහන්සේ දෙසූ දහම ඉතා මඳ බවත් නො දෙසූ දහම් කඳ ඉතා මහත් බවත් සැදෑතිස් රජුට ඇඟැවීමට දැක්වූයේ ද මේ අයුරු පමණ කිරීම යැ. (පූජා:)

## 10. මහා සම්මත වංශය

339—351

339. **මුනිඳුන් මහත් ගුණ අසා සිත් තුටු නිරිඳෙ ඔහු පුර කුල පුවත් කෙ බඳු දැයි ඔහු අතින් පිළිවිස්.**

මුනි රජුන් ගේ මහත් වූ ගුණ අසා සිත් සතුටු වූ රජහු උන් වහන්සේ ගේ පුරය ද, කුලය ද පිළිබඳ ප්‍රවෘත්ති කවර අයුරු දැයි (කෙ සේ ද කියා) ඔහු ගෙන් පිළිවිසියෝ යි.

රජහු තුමූ බුදු රජුන් ගේ ගුණයෙහි මහත් බව ඇසූඑයින් ඔවුන් ගේ සිත් සතුටට පත් වී. එ ලඟට ඒ බුදු රජුන් ගේ පුරය කිමෙක් ද, එ උතුමන් බටුයේ (පැවැතැ ආයේ) කවර නම් කුලයෙන් ද යනු දන්නට උණ රිසි වූහ. එ හෙයින් එ ද කියන සේ එ ඇමැත්තාට පැවැ සූ.

**නිරිඳෙ** = නර ඉඳු + ඕ.
**මුනිඳුන්** = මුනි ඉඳු + උන්

340. **එ සඳ මැතිවර කුල, පරපුර, ඉසුරු සිරි පුර, පිරිවර, රූසිරු සර වරගන සරා මෙ ලෙසින් කියයි.**

එ කල්හි ඇමැති උතුමා, (බුදුන් ගේ) කුලය ද, පරම්පරාව ද, ඉසුරිත් (හෙවත් සැපතින්) පිරුණා වූ පුරය ද, පිරිවර ද රූ සැපතින් සරු වූ උතුම් අඟනන් ද සරහා (හෙවත් වනා) මෙ අයුරින් කියයි.

බුදු රදුන් උපන් කුලයත්, ඔවුන් වහන්සේ පැවැතැ ආයේ කවුරුන් කවුරුන් ගෙන් ද යනුත්, ඔවුන් වහන්සේ උපන් පුරත්, ඔවුන් වහන්සේ ගේ පිරිවරත්, (ගිහි කලැ) ඇසුරු කළ උතුම් අඟනනුත් එක ගොඩේ වනා දැක්වීමෙකි මෙහි කළ යුත්තේ. එ හෙත් වැනුමෙහි ලා එ සියල්ල සපිරූ බවෙක් නො පෙනේ.

**341. බඹ උපතින් සැපත්, පෙර නර ලොවට සෙත් කැර නරන් සම්මත කළ මහා සම්මත නිරිඳෙක් වී යෑ.**

බඹුන් ගේ උපතින් සම්ප්‍රාප්ත වූ (හෙවත් පැවැතැ ආවා වූ) ද, ආදි අවදියේ මිනිස් ලොවට (එ නම් ලෝ වැසි මිනිසුනට) සෙත් කිරීම නිසා මිනිසුන් විසින් සිය කැමැත්තේ නියම කළා වූ මහා සම්මත නම් රජෙක් වී.

'බඹ උපතින්' යනු බඹු ගේ පරපුරින් පැවැතැ ආ බව ඇඟැවීමට යෙදිණි. මගදයන් ගේ මේ උපත් පුවත ආදි යුදෙව්වන් ගේ ලොව මැවීමේ පුවත බඳු එකෙකි. 'ස්වායංභූ' (තෙමේ මැ තම හට හටගත්) නම් වූ බඹු, ලොවත් මවා ගෙනැ තමාත් මැවී ලෝ වැසියාත් පහළ කළ අයුරු මානව ධර්ම ශාස්ත්‍රයෙහි (4-13) දක්වෙයි.

'මහා සම්මත' යන්නෙන් එ රජු සියලු දනන් ගේ එක් සැදින් රජ බව්හි පිහිටුවන ලද බව ඇඟවෙයි.

බඹ උපතින් සැපත් බව කීමෙන්, මෙහි සැඳැහෙන්නේ 'ස්වායම්භූ' නම් පළමු වන මනු රජු බව ඇඟෙයි එ හෙත් බොහෝ ගත් කරුවන් මේ මහා සම්මත රජුත් හිරු පුත් (වෛවස්වත) මනු රජුත් වෙසෙසා නො ගෙනැ අවුල් පැවැසුම් කෙරෙති. ඒ අවුලින් මෙ ගත් කරුවන් ද නො මිදුණු බවයි මී ළඟැ පැදියෙන් පළ වන්නේ.

'සැපත්, සෙත්' යනු එළි නිසා 'සැපත, සෙත' යැයි යෙදිණි.

**342. රිවි කුලෙහි මන නඳ, බඹු සොඳ දරු මුනුබුරු වැ සක් විති ඉසුරු ලද උතුම් නිරිඳුන් ගෙන් සැදුම් ලද-**

සූර්ය වංශයෙහි වූ, සිත් තුටු කරන්නා වූ, බඹු (එ නම් ඒ මහා සම්මත රජු) ගේ දරු (වැ), මුනු බුරු වැ සක් විති සැපත් ලැබුවා වූ, උතුම් වූ රජුන් නිසා සැරසුණු—

මෙහි නම් කියැවෙත්තේ පළමු සඳහන් මහා සම්මත රජු බඹ උපතින් සැපත් බව නො වැ 'රිවි කුලෙහි' වූ බවයි. රිවි කුලෙහි වූයේ මනු රජ තෙමේ යි. තුදුස් මනු රජුන් කෙරෙහි සත් වැන්නායි 'රිවිකුලෙහි' පසිදු මනු රජ තෙමේ. එ හෙයින් 'වෛවස්වත (විවස්වත්) මනු' යි ඔහුට වෙසෙස් නමෙකි.

'වෛවස්වතෝ මනුර්නාම
මාතනීයෝ මනීෂිණාම්
ආසීත්මහික්ෂිතාමාද්‍යඃ
ප්‍රණාවච්ඡන්දසාම්වඃ' (රඝු i. 11)

(පඬියන් විසින් බුහුමන් කටයුතු වූ, වේදයනට 'ඕං' කාරය සෙයින් මිහි පලුනට පළමු වැනි වූ වෛවස්වත, නම් මනු තෙමේ වී). යැයි කාලිදාසයන් සඳහන් කරන්නේ ඒ මනු රජ යි.

1. ස්වායංභුව
2. ස්වාරෝචිව
3. උත්තම
4. තාමස
5. රෛවත
6. චාක්ෂුෂ
7. වෛවස්වත
8. සාවර්ණ
9. දක්ෂ ,,
10. බ්‍රහ්ම ,,
11. ධර්ම ,,
12. රුද්‍ර ,,
13. දේව (රෞච්‍ය) ,,
14. ඉන්ද්‍ර ,,

යැයි තුදුස් මනුහු දැක්වෙත්.

සක්විත්තෝ නම් සක් රුවන (චක්‍රරත්නය) නැඟී සිවු මහ දිවයින නතු කොටැ දැහැමින් ලොව රක්නෝ යි චක්‍ර රත්නයේ නමින් මොවුන් 'චක්‍රවර්තීහු යැ' යි සඳහන් වතුදු

| | |
|---|---|
| චක්‍ර | රත්නය, |
| හස්ති | ,, |
| අශ්ව | ,, |
| මාණික්‍ය | ,, |
| ස්ත්‍රී | ,, |
| ගෘහපති | ,, |
| පරිණායක | ,, |

යැයි සත් රුවනක් ඔවුනට පහළ වන බව බණ දහම් දතුවෝ කියති. ධම්මදින්න විමල කිර්ති (ධර්ම කීර්ති) හිමියෝ මේ කියති:-

'චක්‍රවර්ති රජහු නම් පූර්වයෙහි සමුපචිත අප්‍රමාණ කුශල සම්භාරයන් ඇති වැ පෞෂධාඞ්ගශීලාදිය රක්ෂා කිරීමෙන් ද ධ්‍යාන භාවනාදිය කිරීමෙන් ද පූර්වයෙහි රැස් කොටැ තුබුවා වූ කාමාවචර රූපාවචර කුශල අපරාපර්යවේද්‍ය කර්ම ආදීන් බොහෝ කොටැ එක විටැ විපාක දෙන්නට සුදුසු කලෙක්හි, උභයකුලපරිශුද්ධ ලෝකපූජ්‍ය වූ රජ කුලයෙකැ ඉපැද, කුමර පෙරහරින් වැඩි විය පැමිණැ, යුව රජ පද ප්‍රාප්ත වැ, සකල ජම්බුද්වීපයෙහි ද්වීපචක්‍රවර්ති රජ වැ, දශ රාජ ධර්මය නොවරදවා පිළිපැද, චතුස්සංග්‍රහ වස්තුයෙන් ප්‍රජා පාලනය කෙරෙමින්, දානාදි වූ දශවිධ සක්විති වත් පුරා, දැහැමින් රජ සිරි විඳිමින් කල් යවන සඳ, දවසෙකැ පුර පසළොස් වකැ තරුණ සූර්යෝදයයෙහි............... මහ දන් පවත්වා, පෞෂධාඞ්ගශීල සමාදානයෙන්............ දානශීලාදි කුශල ධර්මයන් ආවර්ජනා කෙරෙමින් උන් කල්හි, ඔවුන් ගේ පූර්වෝපචිත කුශලානුභාවයෙන් චක්‍ර රත්නය පහළ වෙයි

කෙසේ ද යත්:— සර්වාකාර පරිපූර්ණ වූ ඉන්ද්‍රනීලමය නාභියක් ඇති වැ, ඒ නාභි මැද්‍ද, රිදීමය වූ කර්ණිකා වටැ

සුදු සිනිඳු වූ දන්ත පන්ති ඇති වැ, මැද සිදුරැ චන්ද්‍ර මණ්ඩලයක් මෙන් වෘත්ත වැ, ශුභ්‍ර වූ එහි දෙ පසැ බහිරන්තයෙහි, රජත පට්ටයෙකින් පරික්ෂේප කළාක් මෙන්, විභාග වූ ඒ නාභි ප්‍රණාලිය ගේ පරික්ෂේප පට්ටයෙහි යුක්ත යුක්ත ස්ථානවලැ පරිච්ඡෙද රේඛාවෝ විභාග වැ දක්නා ලැබෙති. සර්වාකාර පරිපූර්ණ වූ නාභියෙන් මත්තෙහි නිම් වළලු වෙයි. ඒ නාභි කෙළවරැ සිටැ නිම් වළල්ල දක්වා, සප්තරත්නමය වූ දහස් ගණන් අරයෝ සූර්ය රශ්මි මෙන් ප්‍රභාස්වර ස්වභාවයෙන් ලීලෝපේත වැ සිටුනා හ. එහි අතුරතුරැ නීල පීත ලෝහිතාවදාත මාඤ්ජිෂ්ය ප්‍රභාස්වර වූ ෂඩ්වර්ණ දූවියෙන් හා, එහි අතරතුරැ දිව්‍යමය වූ නා නා වර්ණ රේඛා දහස් ගණනින් හා ශෝභමාන වෙයි. ඒ රේඛා මිශ්‍ර වර්ණ රශ්මියෙන් හා ඒ රශ්මි අග මුතු පබළු රන් රිදී බින්දු එ පමණ මැ වෙයි. නිම් වළලු වටැ පෙළින් පෙළ, දිව්‍යමය වූ නොයෙක් පැහැ ඇති පූර්ණ ඝට පඞ්ක්තියක් මෙන් ද, තෝඩුවෙකැ වටින් වට ගසා කෙවිනි තබා එබූ ගල් පන්තියක් මෙන් ද, වෘත්තායත ත්‍රිකෝණ චතුරස්‍ර මාණික්‍ය-යෝ උන්නත වැ නිම් වළලු අතුරතුරැ පෙළින් පෙළ සැදී සිටිති. ඒ දිව්‍යමය වූ නේමි මඬුලු හැම, බාලාර්ක රශ්මි කලාප පන්තීන් මෙන්, අතිරක්ත සිනිඳු ජෝතීන් නෙත් බමවා කඳුළු ගන්නා තරම් ප්‍රභාසම්පන්න වූ විද්‍රැමම යැ. එහි අතුරැ ජාම්බූනදකනවර්ණ වූ භාස්වර රන් රේඛාවෝ මොනොවට විභාග කොටැ පෙනෙන්නාහු යැ. සර්වාකාර පරිපූර්ණ වූ නේමි වෘත්තය පිටැ, දසයකට අතුරෙහි එකක් එකක් බැගින්, ස්වභාවයෙන් මැ පිඹිනා වස් කුලල් මෙන්, ඇතුළතින් සිදුරැ වැ විචිත්‍ර වූ ඡිද්‍ර මණ්ඩලිකායෙහි පටන් ගෙනැ, පඤ්චාඞ්ගික තූර්ය නාදයක් මෙන්, මධුර ධ්වනි පවත්නා වූ මනහර පබළු දඹු සියයෙකින් හා, ඒ ප්‍රවාල යෂ්ටි මස්තකයෙහි ක්ෂීරාර්ණව මථනයෙන් උද්ගත වූ දුග්ධ බුද්බුද ශ්‍රේණියක් මෙන් අතිධවල වූ ධවලාතපත්‍ර ශතයෙකින් හා, ඒ සේ සත් දෙ පසැ දිව්‍යමය වූ නානාවර්ණ පුෂ්ප-දමානුබඩ වැ ලීලෝපේත වූ රන් කොන්ත දෙ සියයෙකින්

හා සැදුම් ලද්දේ යැ. මැද්දෑ නේමියෙන් පරික්ෂේප වූ නාභි ප්‍රණාලිය ගේ අන්තෝභාවයෙන් උභය පාර්ශ්වයෙහි සිංහ මුඛ දෙකෙක් වෙයි. ඒ සිංහ මුඛ දෙකින් තරුණ තාලස්කන්ධ ප්‍රමාණ චන්ද්‍ර මරීචි ස්කන්ධ මෙන් ප්‍රභාසම්පන්න වූ මුතු ලැල් කඳු දෙකෙක් නික්මැ ලඹ දෙයි. ඒ මුක්තා ලතිකාග්‍රයෙහි ලු හිරු මඬල දෙකක් මෙන් අතිරක්ත වූ පලස් හු වට දෙකක් බබළයි මෙ සේ ඒ පංචානනානන ද්වයයෙන් නිර්ගත වූ මුතු ලැල් කඳු දෙක චක්‍ර රත්නය පරිවර්තනයෙන් නික්මුණු කල්හි, දෙ පිටින් චක්‍ර රත්න දෙකක් සේ ආවර්තනය වෙමින්, එක් වැ දිවෙන රථ සක් තුනක් සේ, දුටු දුටු දනන් සිත් පහදවන්නේ යැ. මෙ සේ ඒ චක්‍රවර්ති මහ රජුන් සක්විති වත් පිරූ පොහෝ දවස්, නගරවාසීන් රාත්‍රි භෝජනානුභව කොටැ ස්වකීය ස්වකීය වූ ගෘහද්වාරවලැ සාමීචි කථායෙහි නියුක්ත වැ හිඳැ, තමතමන් ගේ ප්‍රේමකර තරුණ පුත්‍රාදීන් වීපිවතුෂ්කාදියෙහි කෙළෙනවුන් බලබලා හිඳිනා කල්හි, උදය ගිරි පර්වතයෙන් ශර්වරී ප්‍රමදා ප්‍රලෝභ කරවන්නාක් මෙන්, මදින් මඳ චන්ද්‍ර කාන්ති විහිදෙන්නට වන් කල්හි, ඒ චන්ද්‍ර බිම්බය හා සමඟ චක්‍ර රත්නය ද උද්ගත වෙමින් සත්ත්වයනට දෘශ්‍යමාන වැ දීප්තිමත් වෙයි.

එ කල්හි පූර්වදිශා භාගය බැලූ ජනයෝ, 'එම්බා, සබඳිනි, මේ කවර ආශ්චර්යයෙක් ද? නෙල බලා ගනු. පින්වත්නි, පෙරැ එක මැ පූර්ණ චන්ද්‍රයෙක් උද්ගත වෙයි අද දවස් පූර්ණ චන්ද්‍රයෝ දෙ දෙනෙක් පාණ්ඩර තිසර මිථුනයක් මෙන්, ඉදිරි පසු නො වැ වියත්පථෝද්ගත වූ හ'යි නෙපලත් සමහර කෙනෙක්, 'කුමක් කියවු ද? මන්දයෙනි, කවර කලෙක්හි එක විටැ චන්ද්‍ර බිම්බ දෙ දෙනකුන් ගගන තලයෙහි පැනැ නැංගා දුටු ද? එ නම් කවර බසෙක් ද? මෙ තෙමේ තපනීය ප්‍රභා සමූහයන් දේවානුභාවයෙන් මෘදුත්වයට පමුණුවා ගෙනැ, චන්ද්‍රයා මෙන් අමෘත රශ්මීන් මුළු ලොව සිහිල් කළ මැනැවැ යි කියා ඡේහෝ වෙස් වළා පැමිණි සූර්ය මණ්ඩලයෙකැ' යි කියති. හෙ ද අනෙකෙකැයි කියා කිසි

කෙනෙක් කියනුවෝ, ‘කොල, උමතු වූ ද? දැන් මැ හිර අස්ත ගිරි ප්‍රාප්ත වූයේ වේ ද? මෙ මැ ඇසිල්ලෙහි මැ ශීඝ්‍ර ගමන් ඇති චන්ද්‍ර බිම්බය පසු පස්සෙහි ගොස් එක් වැ ගති ද? හේ කවර නම් බසෙක් දැ?’ යි යෙති. සමහරු, ‘නො වෙයි, බල. ඒ හැම කුමන බස් ද? මේ තෙමෙ කිසිවක්හු ගේ කුශලානුභාවයෙන් පහළ වූ සත් රුවන්මය දිව්‍ය විමානයෙකැ’ යි කියති. ඒ හැම දෙනා කියන්නා වූ වචනයනට අපහාස කොටැ ප්‍රඥාවන්තයෝ කියන්නාහු, ‘තෙපි බොහෝ කොටැ ප්‍රලාප නො දෙඩව්, මේ තෙමේ ඒකාන්තයෙන් දෙ වන පූර්ණ චන්ද්‍රයෙකුත් නො වෙයි, ප්‍රභා මෘදු වූ ධාමේන්ද්‍රයෙකුත් නො වෙයි, ශ්වේත හංස මිථුනයෙකුත් නො වෙයි, දේව විමානයෙකුත් නො වෙයි, මෙ පුරවරාධීශ්වර වූ අප මහ රජාණන් වහන්සේ විසින් බොහෝ පින් රැස් කරන ලද. එ සේ හෙයින් උන් වහන්සේ ගේ කුශලානුභාවයෙන් පාරාවාරාභ්‍යන්තරයෙන් මැ අම්බරෝද්ගත වැ මෙ තන්හි පැමිණෙන්නා වූ චක්‍ර රත්නය වියැ යුතු යැ’ යි කියති.

මේ සේ ඔවුනොවුන් හා බොහෝ අල්ලාප සල්ලාපයෙන් යුක්ත වැ පුර් දිශාව බලබලා සිටි කල්හි, එක් වැ නැඟි චන්ද්‍ර බිම්බය හැරැ, චක්‍ර රත්නය වෙන් වැ, නුවරට අභිමුඛ වැ, ඉතා උස් නො වැ ඉතා මිටි නො වැ, වන මුදුනට ආසන්නයෙන් පුෂ්පඵලපල්ලව ස්පර්ශ කෙරෙමින්, දෙළොස් යොදනකට ප්‍රකාශ වන තරම් පඤ්චාංගික තූර්ය ඝෝෂය පවත්වා එනුයේ, යොදනෙකැ පටන් ස්වකීය ප්‍රභා ශ්‍රේණීන් සත්ත්ව නයනාකර්ෂණය කෙරෙමින්, චක්‍රවර්ති රජුන් ගේ ධර්මානුභාවය භුවනාභ්‍යන්තරයෙහි ප්‍රකාශ කරන්නාක් මෙන්, ඔවුන් වසන රාජධානියට අභිමුඛ වැ අවුත්, පුරා නිමවන ලද සක්විති වත් ඇති පෘථිවීශ්වරයන් ගේ කුශලානුභාවයෙන් ආ බව ප්‍රකාශ කරන්නාක් මෙන්, සත් විටෙකැ එ නුවර ප්‍රාකාර මස්තකයෙහි ප්‍රදක්ෂිණා කොටැ, ඇතුළු නුවරට වැදැ, රජහු ගේ අන්තඃපුරය ද එ සේ මැ

ප්‍රදක්ෂිණා කොටැ, උත්තර දිශා භාගයෙහි සීහ පඤ්ජර-සත්ත වැ, සත්ත්වයන් දීප ධූප ගන්ධ මාලාදීන් පූජාවට සැපයෙන් හැකි වූ, ඉතා උස් මිටි නො වූ අහස් කුසැ, අකුරග බුත්තාක් මෙන්, නිශ්චල වැ සිටැ ගත්තේ යැ. එ සේ සිටියා වූ චක්‍ර රත්නයෙහි දිව්‍ය ප්‍රභා සමූහය, රජහු ගේ ප්‍රාසාදයෙහි සිංහ පඤ්ජර, ගජ පඤ්ජර, ව්‍යාල පඤ්ජර, කපි පඤ්ජර, මෘග පඤ්ජර, පක්ෂි පඤ්ජර, ලීය පඤ්ජර, ශාල පඤ්ජරාදී වූ හැම කවාටවලින් ප්‍රාසාදය අභ්‍යන්තරයට ප්‍රවිෂ්ට වෙමින්, සියලු ප්‍රසාද කුක්ෂිය එක හෙළා ප්‍රභායෙන් ජ්‍යෝතිෂ්මත් කොටැ සරහා සිටැ ගත්තේ යැ.

එ කල්හි පෞෂධාඞ්ග ශීල සමාදානයෙන් ශ්‍රී යහන් මස්තකයෙහි පලක් බැඳැ හුන් මහ රජහු චක්‍ර රත්නයෙහි ප්‍රභාව දැකැ, ප්‍රමුදිත වැ, චක්‍ර රත්නය දක්නා කැමැති වෙති. එ තෙකුදු වුවත් රාජ අමාත්‍යාදී වූ පරිවාර ජනයෝ, රජහු සමීපයට චක්‍ර රත්නය පහළ වූ බව්, ප්‍රිය පඬුරු මෙන්, ගෙනවුත් සිටැ, 'දේවයන් වහන්ස, නුඹ වහන්සේ ගේ ප්‍රාසාදයෙහි සිංහ පඤ්ජරයට නුදුරු වැ චක්‍ර රත්නය අහසැ සිටුනේ යැ' යි කියති. චක්‍රවර්ති රජ තෙමේ එ පවත් අසමින් මැ. බලවත් වූ ප්‍රීතිප්‍රමෝදයෙන් පූරිත වූ ස්වකීයාත්මය ඇත්තේ, බඩ පර්යඞ්කය හැරැ හුනස්නෙන් පැනැ නැඟී සිංහ පඤ්ජරය සමීපයට ගොස්, ඒ චක්‍ර රත්නය දැකැ, 'මා විසින් පළමු චක්‍ර රත්නයක් ඇතැයි යනු ඇසීමි. දැන් ප්‍රත්‍යක්ෂයෙන් මැ දිටිමි' යි මහත් සොම්නස් බවට පැමිණෙති. මේ චක්‍ර රත්නය පහළ වීම යැ.

හස්ති රත්නය නම් කවරැ යත්:— මෙ සේ චක්‍ර රත්නය පහළ වූ කල්හි, චක්‍රවර්ති රජහු ගේ වැඩ පසස්නා අමාත්‍ය-වරු රැස් වැ, පළමු සිටි මඟුලැතු සිටි තැනින් ඉවත් කොටැ ඔහු සිටියා වූ ස්ථානය.........සරහා, ඇමැති වරහු චක්‍රවර්තීන් කරා එළැඹැ, දෙහොත් මුදුන් දෙමින්, 'දේවයන් වහන්ස, හස්ති රත්නය පහළ වන ලෙස සිතුව මැනැවැ' යි කියා යාච්ඤා කෙරෙති. එ කලැ චක්‍රවර්ති රජහු පළමුයෙන් මහ

දත් දී, පෙවස් සමාදන් වැ, එ මැ කුශලය සිහි කෙරෙමින්, මතු මහල් තෙලෙහි ශ්‍රී යහන් ගබඩාවට වැදූ, ශ්‍රී යහන් මස්තකයෙහි පෙරළු සේ මැ පලක් බැදැ හිඳිති.

එ කල්හි ඔහු ගේ කුශලානුභාවයෙන්, උපෝසථ කුල-යෙන් හෝ ඡද්දන්ත කුලයෙන් හෝ, ......කරිවරේන්ද්‍රයෙක් අවුත්, එ තන්හි සිටුනේ යැ. එ කල්හි ඇත් ගොවුවන් ආදී වූ ඇමැත්තෝ තුටු පහටු සිත් ඇත්තාහු වහා අවුත් එ පවත් චක්‍රවර්ති රජු හට කියති. රජහු නො පමා වැ එ තන්හි ගොස්, ඒ හස්ති රත්නය දක්, පහන් සිතින් එ තන්හි සිටැ, ඇතරුවනට කියන්නාහු, 'එම්බල, පින්වත්නි, මේ විරශ්‍රේෂ්-තමයා වැඩකරු දූ?' යි පුළුවුසිති. එ කල්හි හස්ති ගෝපක-යන් මුවින් නො බැණැ සිටි කල්හි, මහ රජහු ඒ සින්ධුරේන්-ද්‍රයා දිශාවට අත දිගු කෙරෙති. ඒ පෂිද අභිප්‍රාය දැනැ, ඒ නාගේන්ද්‍රයා රන් පොරොදු මුතු දැල් ආදි වූ හස්ත්‍යලංකාර-යෙන් සරහා ලති. එ කල්හි සත් රුවන් හිණින් ඉහ මස්තකයට පැනැ නැගී, චක්‍රවාලාන්තරයෙහි සපිරිවරින් අහසින් ගොස්, එ දවස් පෙර වරු මැ අවුත්, රාජ භවනයට වැදූ, දහවල් බත අනුභව කරන්නාහ. .........

අශ්ව රත්නය නම් කවරැ යත්:— මෙ සේ ප්‍රාදුර්භූත වූ ඒ විපාධිප රත්නයට අනතුරු වැ, අශ්ව රත්නය, පළමු ලෙස පූජී මඞ්ගල තුරග ස්ථානය තිදසාලය සාලාවක් මෙන් සරහා, චක්‍රවර්ති නරෝත්තමයාණනට දැන්වූ කල්හි,......... වලාහක කුලයෙහි ජාතාජානේයේශ්වරයෙක් පැමිණැ, සකස් කළ මඞ්ගල අශ්ව ස්ථානයෙහි සිටුනේ යැ. එ කල්හි එ පවත් චක්‍රවර්ති රජුට දැන්වූ කල්හි, රජහු අවුත්, පෙරළු සේ මැ අමාත්‍යවරුනට කියා, ඔවුන් විසින් සරහා මෙහෙයන ලද හයවරාරූඪ වැ, සහපිරිවරින් අහසින් දිග් විජය කොටැ, පෙර බත මෙහෙ වඩන්නට සිය නුවරට මැ එන්නාහ..........

මාණික්‍ය රත්නය නම් කවරැ යත්:— අශ්ව රත්නයට අනතුරු වැ, චක්‍රවර්ති නෘපතීන් ගේ කුශලානුභාවයෙන්, සුවාසූ දහසක් මැණික් පිරිවරා......... සතර රියන් දිග ඇති,

අටස් වූ, දෙ පස සක් තැබක් වැනි වෘත්ත වංශාභ්‍යන්තර කර්ණිකාග්‍රයෙන් විනිර්ගත අතිශුභ්‍ර නිර්ඣර ධාරා මෙන් ලීලෝපේත වැ ලම්බමාන වූ මුක්තා ලතිකාග්‍රයෙහි ස්වර්ණ මුකුලයෙන් අලංකෘත වූ මාණික්‍ය රත්නය වෛපුල්ල පර්වතාභ්‍යන්තරයෙන් නික්මැ, රජුනට ප්‍රාප්ත වෙයි. .........

ස්ත්‍රී රත්නය නම් කවරැ යත්:— මෙ සේ ප්‍රාප්ත වූ මාණික්‍ය රත්නයට අනතුරු වැ චක්‍රවර්ති රජුන් ගේ කුශලානුභාවයෙන්, මෘදු වූ ඡවිවර්ණ ප්‍රභා භාස්වර, තමාල-කලාපනිභ ශිරෝරුහාභිරාම, වක්ත්‍ර පයෝධරෝරු කටී ප්‍රදේශාදි වූ ස්ථූල ස්ථාන ප්‍රභාවත් වැ ස්ථූල වූ, ග්‍රීවාංගුලී මධ්‍ය ප්‍රදේශ මණි බන්ධ ආදි වූ කෘශ ස්ථාන මනෝඥ වැ කෘශ වූ, හස්ත පාද පෘෂ්ඨ ගලවාට ශ්‍රෝණ්‍යාදි වූ උන්නත ස්ථාන විශේෂයෙන් උස් වැ ශෝභාවත් වූ, නාභි පර්රේඛා මුඛාන්ත කරරුහ කර්ණචූලිකාදි වූ නිම්න ගම්භීර ස්ථාන විශිෂ්ට වැ නිම්න වූ, ජංඝා බාහු කර්පර ස්කන්ධාස්ථි ග්‍රීවාදි වූ ස්ථාන අතිදීර්ඝ නො වැ සම ප්‍රමාණ හෙයින් ආයතවිරහිත වූ, උභයාඞ්ග සම ප්‍රමාණ හෙයින් උභය වාමනක නො වැ සමෝත්සේධ ප්‍රමාණ වූ, අත්‍යවදාත අතිකෘෂ්ණ නො වැ ශ්‍යාම වර්ණයෙන් ශෝභමාන වූ, අතිස්ථූල අතිකෘශ අත්‍යුච්ච අතිනීච නො වැ සම ප්‍රමාණ වූ, සකලාඞ්ගයෙන් බැහැරැ ප්‍රමාණයක් නික්මැ ආසන්න වැ බබළන්නා වූ ප්‍රභා ඇති, මනුෂ්‍යරූපය ඉක්මුණා වූ, දිව්‍ය රූපයට නො පැමිණියා වූ, .........මෙ බඳු වූ ගුණානුභාවරූපශෝභාසම්පන්න ස්ත්‍රී රත්නයක්, මද්‍ර රටැ රජ කුලයෙන් හෝ, උතුරු කුරු දිවින් හෝ, තොමෝ මැ පැමිණෙන්නී යැ. මේ ස්ත්‍රී රත්නය ප්‍රාදුර්භූත වීම යැ.

ගෘහපති රත්නය නම් කවරැ යත්:— මෙ සේ පැමිණියා වූ, ස්ත්‍රී රත්නයට අනතුරු වැ, රජහු ගේ කුශලානුභාවයෙන් මහ පොළොව ඇතුළෙහි යොදුනක් පමණ තැනැ තුබූ නිධාන දක්නා තරම් අනුභාවසම්පන්න දිවැස් ඇති, ගෘහපති රත්නය ප්‍රධාන කොට ඇති දහස් ගණන් සිටුවරු පහළ වන්නාහ. මේ ගෘහපති රත්නය පහළ වීම යැ.

පරිණායක රත්නය නම් කවරැ යත්:— මෙ බඳු ගෘහපති රත්නයට අනතුරු වැ, චක්‍රවර්ති රජු ගේ ධර්මානුභාවයෙන්, සතිස් යොදනෙකැ පැතිරැ සිටි මහ සෙනඟ සමඟ චක්‍රවර්ති රජහු ගේ අභිප්‍රායය දැනැ, ඒ වූ පරිද්දෙන් පිළිපදනට සමර්ථ වූ, පර සිත් දන්නා දිව්‍ය ඥාන ඇති, කාර්යාකාර්ය දැන්මෙහි දක්ෂ වූ, ජ්‍යෙෂ්ඨ පුත්‍ර රත්නය ප්‍රධාන කොටැ ඇති දහස් ගණන් සේවක රජහු පහළ වෙති. මේ පරිණායක රත්නය පහළ වීම යැ. ............

මෙ බඳු වූ චක්‍රවර්ති රජහු පරාක්‍රමය පිණිසැ, දෙ දහසක් කොදිව් පිරිවර කොටැ ඇති සතර මහාද්වීපය ඇතුළු වූ චක්‍රවාලාන්තරයෙහි සපිරිවරින් දිග් විජය කොටැ එනු කැමැති වැ, ප්‍රාසාදයෙහි සිංහ පඤ්ජරයට නුදුරු වැ මහිත ස්ථානයෙහි ප්‍රතිෂ්ඨිත වූ චක්‍ර රත්නය සමීපයට ගොස්, ස්වර්ණ භෘඞ්ගාරයෙන් සුගන්ධෝදකය, තරුණපල්ලවා-කාර අරුණවර්ණ කර තලයෙන් ගෙනැ, 'පවත්තතු භවං චක්කරතනං, අභිවිජිනාතු භවං චක්කරතනං' යනාදීන් තුන් විටෙකැ වාග්නිච්ඡාරණ කොටැ, චක්‍ර රත්නයට දිය වැඩූ කල්හි, චක්‍ර රත්නය පළමු අහසට පැනැ නැඟී නික්මෙන්නේ යැ එ කල්හි, චක්‍රවර්ති මහ රජහු රාජාභරණයෙන් සැරැහී, හස්ති රත්නය අශ්ව රත්නය යන දෙකින් අභිප්‍රේත වාහනයකට පැනැ නැඟී, එ සේ මැ සර්වාභරණයෙන් සැරැ-හුණා වූ දෙවඟනන් හා සදෘශ වරඟනන් හා, එ සේ මැ අනේකාලංකාරයෙන් විභූෂිත වැ තල් වැට චාමර විජිනි පත් පුන් කලස සේසකෙහෙළි පිල් කලඹ කුඩ කොඩි සේ සත් මඟුල් කඩු ආදි නොයෙක් මඟුල් පෙරහර ගත්තා වූ පරිවාර ජනයන් ද පිරිවරා සිටැ, තව ද නගර වාසි වූ හැම ජනයා කෙරෙහි කරුණායෙන්, තමන් දිග්විජය කරන බව ප්‍රකාශ කොටැ, නුවර බෙර පියෙවි කරවති.

එ කල්හි නුවර වාසීහු තුටු පහටු සිතින්, 'සබඳිනි, අප ගේ මහ රජාණන් වහන්සේ අද දවස් සතර මහා ද්වීපයෙහි සමස්තසත්ත්වානුශාසනා කරනු පිණිසැ නික්මෙන සේකැ.

එ සේ හෙයින් හැම දෙන මැ තමතමන් ගේ ශ්‍රී විභූතියට අනුරූප ලෙස මැ සැරැහී වහා නික්මෙව' යි උතුන් හට ඇසෙන සේ කියමින්, නික්මුණා වූ චක්‍ර රත්නයෙහි මධුර ධ්වනිය ද ශ්‍රවණය කොටැ, 'එම්බල, කොල, චක්‍ර රත්නය හා සමඟ අප ගේ මහ රජ නික්මිණ. දූත් දූත් අපි පසු ගැසෙම්හ' යි බසින් සමහරක් කියා ගත තො හී, ඉහි පෑ, අත් සත් කෙරෙමින්, අනේකවිධ කර්මාන්ත විශේෂයෙන් විචිත්‍ර කුප්පායම් ආදි වූ නානාවර්ණ සන්නාහසන්නද්ධ වැ, බහා පළඳනා ලද අනේක ප්‍රකාර ආභරණයෙන් දිලියෙමින්, අතින් ගන්නා ලද අසි ශක්ති තෝමර භින්දිපාල අර්ධචන්ද්‍ර චක්‍රාදී විවිධායුධ ප්‍රහරණ ප්‍රභායෙන් ඒකාලෝක කෙරෙමින් තමතමන් ලත් කුඩ කොඩි නංවා, විරිදු බණවමින්, ස්වකීය පරිවාර ජනයන් හා සමඟ අහසින් අවුත්, චක්‍රවර්ති රජහු පිරිවරා සිටැ ගන්නා වූ යුව රජ සෙනෙවිරත් ඇපා මාපා ආදි වූ මාණ්ඩලිකවරුන් හා, එ පරිද්දෙන් මැ පිළිවෙළින් සැරැහී අවුත් සතිස් යොදනක් පමණ තැන් අතුරු නො හැර දිව්‍ය සේනාවක් මෙන් සැරැහි සිටැ ගන්නා වූ අවිකලාඞ්ග මහ සෙනඟ පිරිවරා, තරු පිරිවැරූ පූර්ණ චන්ද්‍රයා සේ දිලිහි දිලිහී, පුරඬ්ජසයෙන් නික්මෙන්නා හ............

මෙ සේ සතිස් යොදනෙකැ පැතිරැ සිටුනා වූ චක්‍රවර්ති පෂීද පිරිවරා නික්මෙන්නා වූ චක්‍රවර්ති රජහු, චක්‍ර රත්නය ඉදිරි කොටැ ඊට අනතුරු වැ ප්‍රයාණය කරන්නාහ. එ කල්හි චක්‍ර රත්නය තෙමෙ ඉතා උස් වූ අහසින් නො ගොස්, යම් සේ භූමියෙහි සිටියවුන් විසින් 'තෙලෙ යනුයේ චක්‍රවර්ති මහ රජ යැ, මොහු යුව රජහු යැ, මොහු අමාත්‍යවරහු යැ, තුලු සෙනෙවි රද්දු යැ, මොහු මෙ නම් පිරිවර යැ' යි ඇඳිනැ ගන්නා තරම් උස අහසින්, වෘක්ෂ ශාඛාග්‍රයට නුදුරු වැ, එහි පුෂ්ප ඵල පල්ලව කැමැත්තවුන් විසින් අත දිගු කොටැ සැපයෙන් සිඳැගත හැකි පමණ උසින්, අහසින් නික්මෙන්-නාහ. ඒ නික්මෙන්නා වූ හැම පෂීදින්, යමෙක් හිඳුනා අභිප්‍රාය ඇත්තේ ද, යමෙක් සිටුනා අභිප්‍රාය ඇත්තේ ද, ඔහු ඒ ඒ ඉරියාපථයෙන් මැ නික්මෙති. තවද, කිසි කෙනෙක්

චිත්‍ර කර්මාන්ත ස්වර්ණ මණි කර්මාන්ත ආදි වූ ඒ ඒ කර්මාන්තයෙහි නියුක්තයෝ ද, ඒ හැම තම තමන් කරන කර්මාන්ත කෙරෙමින් මැ නික්මෙන්නාහ.

මෙ සේ චක්‍රවර්ති පෘථිවීශ්වරයාණන් නික්මුණු කල්හි චක්‍ර රත්නය තෙමේ මහා මේරු පර්වතය වට කොට, මහා සමුද්‍රය මුදුනින් අට දහසක් යොදුන් අයම් විතර ඇති පූර්වවිදේහ දිවයිනට වදනේ යැ. ඒ පූර්වවිදේහයෙහි අයම් විතරින් දෙලොස් දෙලොස් යොදුන් පමණ හා වටින් සතිස් යොදනක් හා පැතිරැ සිටුනා වූ මහ සෙනඟ හා සමඟ සක්විති නර ඉසුරුණන් සැතැපීමට ඉඩම් ඇති ජලෝදක සම්පන්න වූ සමතල රමණීය භූමි භාගයෙක් ඇද්ද, එ තන්හි අහස චක්‍ර රත්නය අක්ෂාහත ස්වභාවයෙන් පිහිටන්නේ යැ. එ සඳැ සක් රුවන සිරි සංඝයෙන් සතිස් යොදනෙකැ, පැතිරැ සිටුනා වූ මහ සෙනඟ නිර්ජරාඤ්ජසයෙන් අවනී මණ්ඩලයට අවතීර්ණ වැ, ස්නාන පානාදිය කොටැ, එ තන්හි මඳක් සැතැපී ඉඳුනාහු යි.

එ කල්හි ඒ පූර්වවිදේහයෙහි අධිපති වූ රජහු තම තමන් විභවානුරූප වැ සැරැහී, සේනා වාහන සන්නද්ධ වැ, 'පර රාෂ්ට්‍රයෙන් යුද්ධයට රුපු සෙනඟෙක් ආවාහු යැ' යි කියා, යුද්ධයට සැරැහීමට ආයුධ ගැන්මට උත්සාහ කළත්, අතට ආයුධ නො පැමිණෙන්නේ යැ. එ කල්හි පූර්වවිදේහයෙහි වසුධාධිපතීහු ස්වකීය පරිවාර සහිත වැ මඟුල් වෙස් ගෙනැ, තම තමන් ලත් රාජ්‍ය සම්පත්තියට සුදුසු ලෙස දක්නා පඬුරු ආදි වූ පූජනීය වස්තු ගෙන්වා ගෙනැ, මහත් උත්සව-යෙන් චක්‍රවර්ති රජහු කරා අවුත්, වැඳැ වැතිරැ තමතමන් ගේ උත්තමාංගයෙහි පළන් මෞලි මාණික්‍ය කාන්තිජල-ධාරායෙන් ශ්‍රී චරණ ප්‍රක්ෂාලනය කොටැ, කර කමල කැකුළු තළල් තෙලෙහි තබා පුදමින්, 'දේවයන් වහන්ස, අප ගේ නුවරට වැඩිය මැනැවැ. අප විසින් කළ මනා කාරිය කිම් දැ?' යි පිළිසඳර කථා කෙරෙමින් සිටි කල්හි, සක්විති වසුමතීපතීහු.........දැහැමින් රාජ්‍ය ශ්‍රී විඳුව' යනාදීන් අවවාද

කොට, ඔවුනට අවසර දී, උන් ගේ රාජ්‍ය සම්පත්තියෙහි මැ පිහිටුවමින්, නැවැතැ පූර්ව ක්‍රමයෙන් මැ චක්‍ර රත්නයට ස්වර්ණ භෘඞ්ගාරයෙන් ආමෝද ජලය වඩවමින්, ඒ ක්ෂණයෙහි උද්ගත වැ ආකාශ පථයෙන් නික්මුණු චක්‍ර රත්නය හා සමග සපිරිවර මහ සෙනඟ අහසට පැනැ නැඟී ගොස්, පූර්ව පාරාවාර පර්යන්තයට ප්‍රාප්ත වන්නා හ.

එ කල්හි චක්‍රවර්ති ක්ෂිතිපතිහු ගේ කුශලානුභාවය ප්‍රකාශ කරනු පිණිසැ චක්‍ර රත්නය පූර්ව සමුද්‍රයට බසින්නේ යැ. එ කල්හි දිව්‍ය ඖෂධ ගන්ධයක් ආඝ්‍රාණය කළා වූ උරගේන්ද්‍රයක්හු පතල පෙණ ගබක් අකුළන්නා සේ, මහත් රළ පතරින් නිරතුරු වූ සමුද්‍ර ජලය සංකුචිත වෙමින් යොද-නක් පමණ තැන් පසු බැසැ, උභයපාර්ශ්වයෙහුදු යොදුන් ගණන් තැන් දිය කඳ දෙවනත් වැ, මැදැ රුවන් වැල්ල බබළ-මින්, වටින් පිළී මිණි බිත්තියක් මෙන් දිය කඳ උද්ගත වැ සිටින්නේ යැ. ඒ ක්ෂණයෙහි චක්‍ර රත්නය මුහුදට බැසැ පළමු වැ නික්මෙන්නේ යැ. මහ රජ චක්‍ර රත්නයට අනතුරු වැ සෙනඟට ඉදිරි වැ නික්මෙන්නේ යැ. චක්‍රවර්ති මහ රජ හට අනතුරු වැ පසු පස්සෙහි මැ මහ සෙනඟ නික්මෙන්නාහ. එ සඳැ සාමුද්‍රික හැම රත්නයෝ, චක්‍රවර්ති රජහු ගේ සමෘද්ධිය දක්නා පිණිසැ හාත්පසින් රැස් වන්නාක් මෙන්, සමස්ත සරිත්පති අභ්‍යන්තරයෙහි විස්තෘතාභිඥත සර්ව රත්නයෝ සර්වතෝමුඛාවකාශප්‍රදත්ත ස්ථානයට ප්‍රාප්ත වැ සජ්ජිත වන්නාහ. එ සඳැ සක්විති මහ සෙනඟ නොයෙක් රත්නයෙන් සම්පූර්ණ වූ රුවන් වැලි තලාව දැකැ තම තමන් අභිප්‍රායානුකූල වූ පරිද්දෙන් උතුරු සළු පිළී පට හිණවල් පුරා රුවන් උකා ගත් කල්හි, චක්‍ර රත්නය නැවැතැ එනු පිණිසැ සමුද්‍රතීරාභිමුඛ වන්නේ යැ. එ කල්හි, මහ සෙනඟ ද චක්‍රවර්ති රජ ද සිටි තැනැ මැ සිටැ ගොඩට අභිමුඛ වැ කරකැවී ආ පසු එන්නා හ. එ සඳැ තීරාභිමුඛාරිත්දම මහ රජ හට පසු වැ ගලා එන දිය කඳ වළකන්නාක් මෙන්, ස්වකීය ප්‍රභායෙන් සමුද්‍රාභ්‍යන්තරය ජ්‍යෝතිෂ්මත් කෙරෙ-මින්, නේමි මණ්ඩලය පැහැරැ එන ජලස්කන්ධය වළකා

වළකා චක්‍ර රත්නය පසු බස්නා කල්හි, මහ සෙනඟ පළමු වැ ගොඩ නැඟෙති. අනතුරු වැ මහ රජ තීර ප්‍රාප්ත වන්නේ යැ. පස්සෙහි චක්‍ර රත්නය ගොඩ නැඟැ අහසට පැනැ නැඟෙයි.

මෙ සේ චක්‍රවර්ති නරපතීහු සමුද්‍රය කෙළවර කොටැ ඇති පූර්වවිදෙහයෙහි දිග්විජය කොටැ ජය ගෙනැ, දක්ෂිණ සමුද්‍රය පර්යන්ත කොටැ ඇති දස දහසක් යොදුන් ජම්බුද්වීපය ජය ගන්නා පිණිසැ, චක්‍ර රත්නය හා සමඟ දක්ෂිණ දිශා භාගයට අවුත්, ජම්බුද්වීපයෙහි ද සතිස් යොදනෙකැ පැතිරැ සිටින්නා වූ චක්‍රවර්ති සේනාවට වාසයට සුදුසු ප්‍රදේශයෙක් හි චක්‍ර රත්නය අහසැ සිටි කල්හි, පෙරැ සේ මැ ඒ ස්ථානයෙහි භූමියට සක්විති සෙනඟ බැසැ ස්නානපානාදි චිත්තානුකූල කෘත්‍ය සම්පාදනයෙන් එ තන්හි සැතැපී හිඳුනා හ. එ සඳැ චක්‍රවර්ති නරේන්ද්‍රයාණන් හා මහ සෙනඟ එ තන්හි පැමිණී බව අසමින් මැ ඒ ජම්බුද්වීපයෙහි රජහු සපිරිවරින් සතුටු පඬුරු ගෙනවුත් පුද වැදැ, බණ අසා, පන්සිල් ගෙනැ, අවවාද පිළිගනිමින්, තමතමන් ගේ නිවාසස්ථාන වූ රාජධානිවලට මැ නික්මෙන්නා හ.

ඉක්බිති චක්‍රවර්ති රජහු හා මහ සෙනඟ හා අහසට පැනැ නැඟී දක්ෂිණ සමුද්‍රය සමීපයට ගොස්, පූර්ව සමුද්‍රයෙහි කී ලෙස මැ රත්නාකරාවතීර්ණ වැ, රුවන් පොදි බැඳැගෙනැ, චක්‍ර රත්නය හා සමඟ අහසට පැනැ නැඟී, සත් දහසක් යොදුන් අපරගෝයානය ජය ගෙනැ එනු පිණිසැ මහ මෙර දකුණට කොටැ සමුද්‍ර මුදුනින් චක්‍ර රත්නය හා නික්මෙති. සපිරිවර මහ රජ අහසින් ගොස්, අපරගෝයාන දිවයිනට පැමිණැ, චක්‍ර රත්නය සුදුසු වූ ස්ථානයෙක්හි, අකුරඟ බුන්නාක් මෙන්, අහසැ සිටි කල්හි, රජු සහිත මහ සෙනඟ ඒ ස්ථානයෙහි භූමියට බැසැ සැතැපී උන් කල්හි, අපරගෝයාන ප්‍රධාන රජහු, පූර්වයෙහි සෙසු දිවයින්වලැ රජුන් මෙන්, පුද පඬුරු සරහා ගෙනැ සපිරිවරින් අවුත්, චක්‍රවර්ති

රජු හට පූජා කොට, ඔවුන් කී අවවාදයෙහි පිහිටා, කුශල සම්භාරයන් රැස් කෙරෙමින්, ස්වකීය වූ රාජ්‍ය සම්පත් අනුභව කරන්නා හ.

එ කල්හි නැවැතත් චක්‍ර රත්නය අහසට පැන නැඟී පළමු වැ නික්මෙයි. එ සඳැ සරජ පම්ද සක් රුවන හා සමඟ ගොස් පශ්චිම සමුද්‍රයට බැසැ, පෙරැ සේ මැ සත් රුවන් ඇරැගෙනැ අහසට පැනැ නැඟී, අට දහසක් යොදුන් උතුරු කුරු දිවයින ජය ගන්නා පිණිසැ ගොස් පූර්වෝක්ත ක්‍රමයෙන් මැ ජය ගෙනැ, ඔවුනට අනුශාසනා කෙරෙමින්, කුශලයෙහි පිහිටුවා, උතුරු සමුද්‍රයට ගොස් රුවන් උකා ගෙනැ අහසට පැනැ නැඟී, චක්‍රවර්ති රජු සහිත සතිස් යොදනෙකැ පැතිරැ සිටුනා වූ මහ සෙනඟ චක්‍ර රත්නය හා සමඟ, දෙ දහසක් කොදිව් පිරිවර කොට ඇති සතර මහා විපයෙහි දිග්විජය කොට, සක්වළ තුළැ සියලු සත්ත්වයනට දෙ ලොවින් මැ වැඩ සිද්ධ කොට, නැවැතැ හැම දිවයින් එක විටැ මැ දක්නා කැමැති වෙත්. එ කල්හි පරමතර විචිත්‍ර චක්‍ර රත්නය අහසට ඍජු වැ පැනැ නගී. එ කල්හි සපිරිවර චක්‍රවර්ති මහ රජ ද චක්‍ර රත්නය හා සමඟ අහසට පැනැ නැඟී, දෙ දහසක් කොදිව් පිරිවර කොට ඇති සතර මහා විපය, පද්මෝත්පලපුණ්ඩරීකාදීන් ප්‍රතිමණ්ඩිත වූ පියුම් විල් සමූහයක් මෙන් දැකැ, මහත් ප්‍රීතීන්, චක්‍ර රත්නය පෙරටු කොට, ප්‍රථමයෙන් ස්වකීය නුවරින් නික්මුණාක් මෙන්, නැවැතැ සිය නුවරට මැ අවුත් වදනේ යැ. එ කල්හි චක්‍ර රත්නය පළමු සිටියා වූ සී මැදුරු කවුළුව සමීපයෙහි අහසැ, සුගන්ධ දීප ධූප පුෂ්පාදීන් පූජා විදීමට සුදුසු වූ නිර්මල ස්ථානයෙහි මැ සිටුනේ යැ. .........(සඃ රඃ)

343. දෙවියනට කුල දෙව් වූ සක් දෙව් පදෙව් ලත් මන්දතු නර දෙව් පසන් කිත් දිය කඳින් කුල දෙව්-

දෙවියන් ගේ කුල දෙව් වූ සක් දෙවියා ගේ පදෙවිය ලැබුවා වූ (මහා) මන්ධාතු රජු ගේ යසස් නැමැති පහන් දිය කඳින් කුලය සේදූ-

කුල දෙවි නම් කුලය (සමූහය) රක්නා වූ දෙවියායි. දෙව් සමූහයා (=දෙ දෙව් ලොවේ දෙව් සමූහයා) රක්නේ ඔවුන් ගේ රජ වූ සක් දෙවියායි එ හෙයින් හෙ තෙමේ දෙවින් ගේ කුල දෙවියායි. එ අයුරු වූ සක් දෙව් තනතුරු ලැබුවෙකි මන්දතු රජ තෙමේ. තරතට දෙව් වූයේ තර දෙව් යැ, ඒ රජ යි. මන්දතු තර දෙවි නම් මන්දතු රජ යි. සක් දෙව් පදෙවි පවා ලත් එ රජු ගේ යසස (කීර්තිය) ඉතා මහති. ඒ දිය කඳක් බඳුයි. එ රජු ගේ යසස තො කිලිටියි. එ හෙයින් පහන් දිය කඳක් බඳුයි. පැහැදිලි දිය කඳෙකින් යමක් සේදුණා සේ මන්දතු රජු ගේ තො කිලිටි කීර්තියෙන් ඒ මහා සම්මත රජ කුලය පිරිසුදු වූ බවයි ඒ කීයේ. (මන්දතු පවත මතු පැවැසේ).

344. අව ගුණෙන් නො කැලැඹි, බෝසත් ගුණෙන් දැබි සිත මුළු සක්වළැ වැජැඹි. මහා සුදසුන් රජුන් ගෙන් හෙබි–

මහා සුදසුන් රජු බෝසත් කෙනකුන් ද වූ බව එයින් පළවෙයි.

එ රජු ගේ සිත මුළු සක්වළැ (එ නම් සක්වළ පුරා) මහ ඉහළින් සඳහන් වැ පැවැති බව 'මුළු සක්වළැ වැජැඹි' යන්නෙන් පළ කැරෙයි. එ සිත දුගුණෙන් නො කැලැඹු–ණේයි. එය බෝසත් ගුණෙන් බැඳුණේ වෙයි.

එ බඳු ගුණෙන් යුතු මහා සුදසුන් රජුන් ගෙන් හෙබුණේ (ශෝභන වූයේ) යි මෙ රජ කුලය.

(මහා සුදසුන් පවත ද මතු සැදැ හේ).

345 පද නිය කිරණ මලි නිරිඳුන් මුඳුන් මලි කළ, ලොවැ ජය කෙහෙලි බඳ, පසිඳු මුව දෙව් රජුන් ගෙන් දිලි–

පයේ නිය රස් (නැමැති මල්) දම් රජුන් ගේ හිස් මුදුන් මල් දම් බවට පත් කළා වූ, ලොවේ ජය කොඩි බැන්ද වූ, පසිදු වූ මුව දෙව් රජුන් නිසා බැබැළුණු–

'පද නිය' නම් පා ඇඟිලි අගැ නිය පොතුයි. කිරණ යනු 'රස්' යන අරුත දෙයි.

මලි (=මාල්‍ය) නම් මල් අවුණා කළ දම යැ. 'පද නිය කිරණ මලි' යි කීයේ පයේ නියෙන් නික්මෙන රස් මල් දම සේ පෙනෙන බව ඇඟැවීමටයි. 'නිරිඳුන් මුදුන් මලි' නම් රජුන් හිස් මුදුනේ පළඳනා හැටියට ඔතන මල් දම් යැ.

රජහු තුමූ තළල බිමැ ඔබා මෙ රජු ගේ පා වඳිත්. එ විටැ ඔවුන් ගේ හිස් මුදුන් සිටිනේ මෙ රජු ගේ පයේ නිය කෙළින් යැ. එ නියෙන් නික්මෙන මල් දම් බඳු රස් කඳු ගොස් මෙ රජුන් ගේ හිස් මුදුනේ ගැටී රැඳේ. එ විටැ ඒ මැ හිස්හි පළන් (මුදුන්) මල් දම් බවට යේ.

මෙ රජු සෙසු නිරිඳුන් ගෙන් වැඳුම් ලබන බව ඒ ඇඟැ වූ හැටියි එ සේ නම් ජය කොඩි බැඳීමක් ගැනැ කතා ඇවැසි යැ? කෙහෙලි නම් කෙසෙල් පත් බඳු කොඩියි. ජය පළ කිරීමට බඳිනු ලබන කෙහෙලි ජය කෙහෙලියි.

මෙ රජු පසිදු වූ පරිදි මුවදෙව් දුව පළ කරයි එ බඳු මුවදෙව් රජු නිසාත් බැබැලුණු එ කෙකී මේ කුල පර පුර.

346. **දිගු යම් රඳනා යස ලිය බඹ තලැ දූවැටි, ලොවැ නුගුණ පැවි කළ, පවර නිමි නිරිඳු ගෙන් සුපිහිටි–**

දිශා නැමැති රිටිවලැ රැඳී පවත්නා යස ලිය බඹ තලැ ගෝස් දූවැටි, ලොවේ අව ගුණ අඩු කළා වූ, උතුම් වූ නිමි රජු ගෙන් මනා වැ පිහිටියා වූ–

මේ කුල පරපුර 'නිමි' රජු ගෙන් නිසි පරිදි පිහිටියේ වෙයි. ඒ නිමි රජ උතුම් වූ තැනැත්තෙකි. ලොවේ දුර්ගුණ අල්ප (පැවි= කුඩා) කළ තැනැත්තෙකි. එ රජු ගේ

යසස බඹ ලොවේ ද පැතිර වැලක් පැටලුණා සේ රුඳුණේ වෙයි. රිවි දිගේ වැල් තගින්නා සේ දිසාවන්හි පැතිර රුඳී පවත්නා යසසෙකි ඒ බඹ ලොවට ද නැගී එහි රුඳුණේ.

එ රජු ගේ යසස ඇම දෙසැ පැතිර එහි දු නො නැවැතී බඹ ලොවට ද නැගී පළ වැ පැවැති බවයි ඉන් පැවැසුණේ. (මෙ රජු ගේ පවත් 'නිමි' දයෙන් දන්නේයි).

**347. ගිහිණි රුපු සෙන් බිඳැ, දෙවිඳු ගෙන් අග මිණි ලත්, සව් සිප් කෙළ පැමිණි කුසා රජ පරපුරින් සැපැමිණි–**

බොහෝ වූ සතුරු සෙන් පරදවා, දෙව් රජු ගෙන් උතුම් මැ වූ මැණික ලැබූ, සියලු කලාවන් අවසන් කොටැ දත් කුසා රජු ගේ පෙළපතින් නිසි සේ පැමිණියා වූ.

සත් රජ කෙනකුන් ගේ සෙන් හෙයින් වනැ 'බොහෝ (ගිහිණි) රුපු සෙන්' යනු කීයේ.

දෙව් රජ (දෙවිඳු= දෙව් ඉඳු) නම් සක් දෙවියායි. කුසා රජු කලාවන්හි කෙළ පත් බව එ රජු කළ මල් කම්, පිසමන් ඈයෙන් පළ වේ.

'අග මිණි' යි කීයේ පසිදු අට වක් මිණ සඳහා යි.

(කුසදයෙන් එ රජු පවත් දන්නේ යි).

**348 අව බිය නැවැත් වූ, දස රජ දම් පැවැත් වූ, විකුමෙන් මහත් වූ, එ රම් රජු ගෙන් සසිරිමත් වූ.**

අපා ගත වීමේ බිය නැවැත් වූ, රජුන් ගේ දස දම් පැවැත් වූ, සපත් කම් දක්වීමෙන් මහත් වූ, පසිදු රාම රජු නිසා මනා ශ්‍රීයෙන් යුත් වූ–

මේ කුල පරපුර සිරි සැපතින් යුත් වූසේයි, රාම රජු එ කුල පරපුරේ වූ යෙන්.

රාම රජ තෙමේ සුපරසිදුයි. මහත් වූ විකුම් ඇත්තේයි.

'දානං සීලං පරිච්චාගං
අජ්ජවං මද්දවං තපං
අක්කෝධෝ අවිහිංසා ච
ඛන්තීසු අවිරෝධතා'

යැයි කියන ලද රජ දහම් දසය පැවැත් වූ යේයි. එ රජු දවසේ මිනිස්සු 'අපා' බිය රහිත යෝයි ඔවුන් පවිත් වැළැකී සිටිනා බැවින් ඔවුනට අපා ගත වීමේ බියෙක් නැති.

**349. පුන් සඳ කිරණ බඳු යසසින් දියත සුදු කළ, සිවු සඟරා පුරුදු, ඔකාවස් පරපුරින් පරසිදු.**

පුරා හඳේ එළිය වැනි වූ කීර්තියෙන් ලොව සුදු කළා වූ, සතර සංග්‍රහ වස්තුවෙන් දනන් තුටු කිරීම පුරුදු වූ, ඔකාවස් රජු ගේ පෙළපත නිසා පසිදු වූ-

ඔකාවස් රජු මේ පරපුරේ වූවකු නිසා මෙය පසිදු වූයේයි. ඔකාවස් රජ දාන, ප්‍රියවචන, අර්ථ චරියා, සමානාත්මතා යන සිවු සඟරා පුරුදු උතුමෙකි.

මේ රජු ගේ යසස ඉතා පිරිසුදුයි, නිකැළැල් යැ හරියට පුරා හඳේ කාන්තිය වැනියි පුරා හඳේ කාන්තිය (හඳ එළිය) වැටුණාම ලොව සුදු වැ පෙනේ. මෙ රජු ගේ කීර්තිය පැතුරුණාමත් ලොව දෙසින් දුරු වැ පහන් වෙයි.

## 11. ශාක්‍ය පරපුර

**350 මෙ ලෙසින් ලොවැ පැවැතැ ආ රජ පරපුරින් පත්, ජය සේන නම් යුත් පවර නිරිඳෙක් කිඹුල්වතැ වී.**

මේ විදියට ලොවේ පැවැතී ආ රජවරුන් ගේ පරම්-පරායෙන් පැමිණි, ජයසේන යන නම යුත් උතුම් වූ රජෙක් කිඹුල්වතෙහි වූයේ යි.

මහා සම්මත රජ වූයේ කිඹුල්වතැ (කපිල වාස්තුයෙහි) නො වේ. මේ ජය සේන රජ පමණක් කිඹුල්වතැ වූ බව කීමෙන් මෙ තෙක් රජුන් පිණිසැ නො කළ අමුත්තක් එ රජු උදෙසා කළ බව ඇඟෙයි ඒ අමුත්ත නම් ශාක්‍ය පරපුර දැක්වීමයි.

'පැවැතැ, පත්, යුත්' යනු 'පැවත, පත, යුත' යැයි වූයේ එළි බෙලෙනි.

351. **ඔහු පුත් වූ, සීහ හනු නම් ලද රජෙක් විකුමෙන් රජුන් මන් බිඳැ එ පුරෙහි මැ රජ සිරි ලද.**

ඔහු (එ නම් ඒ ජය සේන රජු) ට පුත් වූ, සීහ හනු (යන) නම ලැබූ රජෙක්, විකුමෙන් රජුන් මත් බිඳැ ඒ පුරේ මැ රජ සැපත් ලැබූ යේයි.

මේ සීහ හනු රජු ගේ විකුම් ඉතා මහති. සෙසු රජුන් ගේ විකුම් ඒ හා සම කොටැ බලන ඉතා සුළු වැ පෙනෙයි. එ හෙයින් එ රජුන් හට තමන් ගේ විකුම් ගැනැ මානයක් ඇති කොටැ ගන්නට ඉඩෙක් නැති. මෙ රජු ගේ මහත් විකුම් නිසා සෙසු රජුන් ගේ විකුම් පිළිබඳ මත් බිඳේ.

352. **රිවි කුල සුර තුරේ ගත් අම පල එකා අයුරැ, පිය තනතුරේ සිටි ඔහු පිත් රජෙක් එ පුරේ වි යැ.**

සූර්ය වංශය නැමැති දෙව් රුකෝ (අට) ගත් අමෘත ඵලයක් හා එක් බඳු වූ, (බුදුනට) පිය තනතුරේ සිටි, ඔහු (එ නම් සීහ හනු රජු) ගේ පුත් වූ රජෙක් ඒ (කිඹුල්වත්) පුරේ වූයේයි.

මෙ කියන රජ තෙමේ බුදුනට පිය තනතුරේ සිටියේ වෙයි. සීහ හනු රජු ගේ පුතායි. සූර්ය වංශය දෙව් රුකෙක් නම් මෙ රජ තෙමේ එ රුකේ අටගත් අමා ඵලය හා එක් සැටියි.

'අම පල' යන්නෙන් ඉතා මිහිරි පල අදහස් කළා මිසැ 'අමෘත' නම් ද්‍රව්‍ය උපදවන පල අදහස් කළා නො වියැ හැකි.

'අමෘතය' නම් දෙවියන් බොතියි යෙත, කිරි මුහුදින් පහළ වූහයි. පල ඉම්හිරි දූයෙකි. ඒ පල වෙසෙසෙක් නො වේ. සුරතුරු නම් පසිදු දූයෙකි. එ හෙත් එ රුක්හි මල් ගැනැ මිසැ පල ගැනැ අසත්නට නො ලැබේ. දෙවියන් ද පරසතු රුක කරු මල් කෙළියට මිසැ පල බුදුනට යත එත බවෙක් නො ඇසේ.

පලෙක (අයුරේ) = පල එක (අයුරේ)

'අයුරු' යනු 'අයුරේයි' එළි නිසා යෙදිණි.

353. **සරද ඡෙ නා ලෙසැ යසසින් ලොව සුදවනා සිතැ කිලිටි ඡෙනා ඒ රජ නමින් සුඡෙනා වි.**

සරු සඳ සෙයින් කීර්තියෙන් ලොව සුදු කරවත්නා වූ, සිතේ කිලිටි (එ නම් රාගාදි කෙලෙස්) සෝදත්නා වූ ඒ රජ නමින් 'සුද්ධෝදන' (යැයි) වී.

'ඡෙ' යනු තරු (ජ්‍යෝතිශ්) සඳහන නමෙකි. ඡෙ නා (තුරුනා) නම් තාරකාවන් ගේ නායකයායි. තාරකාවන් ගේ නායකයා යනු හඳට නමෙකි. 'සරත්' නම් වලා රහිත අවදියයි (වප්, ඉල්) සරද ඡෙ නා යනුවෙන් සරු සඳ (එ නම් වලා රහිත අවදියේ සඳ) ගැනෙයි. මෙ රජු ගේ යසස සරු සඳ එළිය මෙන් ලොව සුදු කරන බවයි 'සරද ඡෙ නා ලෙසැ යසසින් ලොව සුඡෙනා' යත්තෙන් කීයේ. සුඡෙනා යනු 'සුද ඕනා' යි ගෙනැ ලොවැ සුද ඕනා (ලොවේ සුද ඔවින්නා වූ) යැයි ද කියැ හැකි. එ හෙත් ලෙව් ලැකියෙහි 'අ, ව' දෙක 'ඕ' යි සිටිනු දහමි.

කරවත 'කරෝත'
බලවත 'බලෝත'
මරවත 'මරෝත'

ඈ විමසත්නැ. පළමු (349 වැත්තේ) පුත් සඳ කිරණ බඳු, යසසින් දියත කළ සුදු' යත්ත හා ගැළැපෙත්තේ ද ඒ මැයි.

'සුශ්‍රේත, ශ්‍රේත' යනු 'සුශ්‍රේතා, ශ්‍රේතා' යි සිටියේ එළි වැට නිසා යි.

354. **තිලෝ ගුරු මුනිඳුට පිය තනතුරු ලබන ලෙසැ එ පිරු දස පැරුමන් නිරතුරු කප් සුවහසක් පුරා.**

තුන් ලොවට ගුරු වූ මුනි රජුට පිය තනතුරු ලබන පරිද්දෙන් ඔවුන් වහන්සේ පිරූ දස පාරමිතාවන් නො කඩවා කල්ප ලක්ෂයක් පුරා.

බුදු රදුන් විසින් බුදු බව පිණිසැ සිවු අසැකි කප් සුවහසැ පුරන ලද පාරමිතාවන් ඔවුන් වහන්සේට පිය තනතුරු ලබන පිණිසැ කප් ලක්ෂයක් මෙ රජු පිරූ බවයි ඒ කීයේ.

දස පැරුමන් (334 බලන්නැ)

355. **හැම නරනිඳුන් පසු කොටැ සුර බඹ සතුටු කොටැ, එ පින් පල දෙනු කොටැ එ පුරට පැමිණි මහ රජ උතුමෙකැ.**

සියලු රජුන් පසු ගන්වා දෙවියන් බඹුන් සතුටට පමුණුවමින් ඒ (පැරුම් පිරූ) පින් පල දෙන්නට සැලැස්සී-මෙන් එ (කිඹුල්වත්) පුරට පැමිණි රජ උතුමෙකි (හෙ තෙමේ).

'කොටැ' යනු එළි වැට නිසා 'කොට' යැයි යෙදී ඇති.

(341-355) කිඹුල්වතැ සුදෙවුන් රජු මහ සම්මත පෙළින් ආ පරිදි මෙ සේ දක්වති මහ තෙත්පා මුළැ තව ද ඇදුරු කෙනෙක්:-

'ප්‍රථම අන්තඃ කල්පයෙහි සූර්ය පුත්‍ර මහා සම්මත නම් ඕපපාතික රජෙක් වී යැ. ඒ රජ මහා ජනයා ගේ සම්මත-යෙන් පළමු වන අභිෂේකයට පැමිණි හෙයින් මහා සම්මත නම් වී යැ..............................................

පසු වැ ඒ මහා සම්මත රජු ගේ පිත් රෝජ නම් රජ ද .........රාජ්‍යය කෙළේ යැ. ඔහු පිත් වර රෝජ නම් රජ ද .........රාජ්‍ය කෙළේ යැ. ඔහු පිත් කල්‍යාණ නම් රජ ද .........රාජ්‍ය කෙළේ යැ. ඔහු පිත් උපෝසථ නම් රජ ද .........රාජ්‍ය කෙළේ යැ. ඔහු පිත් මහා මන්ධාතු නම් චක්‍රවර්ති රජ...............එ මැ ආත්මභාවයෙන් දෙව් ලොව නැඟී......... සතිස් ශක්‍ර කෙනකුන් ගේ ආයු පමණින්......... දිව්‍ය සම්පත් විඳැ.........එ මැ ආත්මභාවයෙන් මිනිස් ලොවට බැසැ.........රාජ්‍යය කෙළේ යැ. ඔහු පිත් වර මන්ධාතු රජ ද.........ඔහු පිත් උපවර නම් රජ ද......... ඔහු පිත් චේතිය නම් රජ ද.... ...නුවර ද තට .........

ඔහු ගේ පුත්‍රයෝ පස් දෙනෙක් වූ හැ. ......එක් කෙනෙක් බරණැසට පූර්ව භාගයෙහි හස්ති පුරය කරවා විසූ හැ. .........දක්ෂිණ දිග් භාගයෙහි අශ්ව පුරය කරවා විසූ හැ. .........පශ්චිම දිග් භාගයෙහි සිංහ පුරය කරවා විසූ හැ......... පශ්චිමෝත්තර දිග් භාගයෙහි දද්දර පුරය කරවා විසූ හැ. .........උත්තර දිග් භාගයෙහි පඤ්චාල නුවර කරවා විසූ හැ. ...විභාග චේතිය ජාතකය බලා දත යුතු.

......... ඇමැතියෝ මල් රජ කුමරුවන් සතර දෙනකු අරක් ගෙනැ සිටුවා මූවලයන් අභිෂේක කළ හැ. ඔවුන් සතර දෙන ගේ දරු මුනුබුරෝ සුවහස් ගණන් ඇති වැ මහා ගඞ්ගී වැ වැසැ......... දූන් දක්වා ගණවාසී රජ හ යි පැවැත්තැයි දත යුතු.

ඒ චේතිය රජු මහලු පිත් මූවල නම් රජ............ ඔහු පිත් මූවලින්ද නම් රජ ද......... ඔහු පිත් සගර නම් රජ ද ......... .

ඔහු ගේ සැට දහසක් පමණ පුත්‍රයෝ ......... මහා සම්මත වංශය.........අසංඛ්‍ය ගණන් වර්ග කළ හැ. ......... වර්ග විභාග නො දූනැ වෙන වෙන රජ වංශ ව්‍යවහාර කළ හැ..........සියලු රජහු මැ මහා සම්මත වංශිකයෝ යැයි දත යුතු.

සැට දහසක් රජුන් අතුරෙන් සාගර නම් මහලු පිත් ......... රාජ්‍යය කෙළේ යෑ. ඔහු පිත් භරත නම් රජ ද ......... ඔහු පිත් භගී රථ නම් රජ ද ......... ඔහු පිත් රුචි නම් රජ ද ......... ඔහු පිත් සුරුචි නම් රජ ද ......... ඔහු පිත් ප්‍රතාප නම් රජ ද ......... ඔහු පිත් මහා ප්‍රතාප නම් රජ ද ......... .

ප්‍රාණ ඝාතය ලොවැ පහළ වියැයි දත යුතු.

ඒ මහා ප්‍රතාප නම් රජහු පිත් පනාද නම් රජ ද......... ඔහු පිත් මහා පනාද නම් රජ ද ......... ඔහු පිත් සුදර්ශන නම් රජ ද ......... ඔහු පිත් මහා සුදර්ශන නම් රජ ද......... ඔහු පිත් නේරු නම් රජ ද ......... ඔහු පිත් මහා නේරු ......... ඔහු පිත් අච්චිමත්ත නම් රජ ද.........

කුසාවතී නුවරැ යැ රජගහා නුවරැ යැ, මියුලු නුවරැ යැයි ......... නුවරැ මැ රාජ්‍යය කළාහු යැ.

......... අච්චිමත්ත රජහු ගේ දරු මුනුබුරෝ ......... ලක්ෂයක් රජහු මැ රාජ්‍ය කළ හැ ඔවුන් කෙළවරැ සගර නම් රජහු පිත් මඛාදේව නම් රජෙක් වියැ ......... මියුලු නුවරැ හිඳැ ......... පළමු වන තර කෙස ඕ හට පහළ වියැ. ......... නර කෙස පෑ කපුවාට ගම්වර දී මඛාදේව නම් පුතුට රාජ්‍යය දී ......... තපස් කොටැ බ්‍රහ්ම ලෝකයෙහි උපන. ......... එ රජහු පටන් මහා සම්මත වංශ නම පෙරැළී මඛා-දේව වංශ නම් වියැ. ඒ වංශයෙහි ......... සුවාසූ දහසක් මඛාදේව රජහු මැ ......... තපස් කොටැ .........උපන් හැ. ............ තපසට නො ගිය හැ. එ සේ හෙයින් මඛාදේව වංශ නම පෙරැළී......... කෙළවරැ කාළාරජනක රජහු පිත් අශෝක නම් රජෙක් වියැ. ඔහු පිත් ඔක්කාක නම් රජෙක් වියැ. එ තැන් පටන් මඛාදේව නම් පෙරැළී ඔක්කාක වංශ නම් වියැ, ඒ වංශයෙහි කුසා රජ යැ, දිලීප යැ, රඝු යැ, අජ යැ, දශරථ යැ, රාම යැ යනාදි ලක්ෂයක් ඔක්කාක රජ දරුවෝ මැ......... වැළැඳූ හැ.

......... කෙළවර ද්විතීය ඔක්කාක නම් රජෙක් වියැ. ඔහු ගේ පරම්පරායෙහි උදය යැ, භද්ද යැ, ධනඤ්ජය යැ, කෝරව්‍ය යැ, වේදේහ ය, සඤ්ජය යැ, වෙස්සන්තර යැ, ජාලිය යැ, සිංහ වහාන යැ යනාදි ලක්ෂයක් රජහු ......... රාජ්‍යය කළ හැ. ......... කෙළවර සුජාත නම් රජහු පින් අම්බට්ඨ නම් තෘතීය ඔක්කාක රජෙක් පහළ වියැ. එ රජහු ගේ හස්තා යැ, චිත්‍රා යැ, ජන්තු යැ, ජාලනී යැ, විශාඛා යැයි .........අග මෙහෙසුන් බිසෝවරු පස් දෙනෙක් වූ හැ ......... හස්තා නම් බිසොවු උල්කාමුඛ යැ, කලණ්ඩුක යැ, හස්තිනීක යැ, සිරිනිපුර යැ යන පුතුන් සතර දෙනකු හා ප්‍රියා යැ, සුප්‍රියා යැ, නන්ද යැ, විජිතා යැ, විජිත සේනා යැයි දූන් පස් දෙනකු හා ......... ......... නව දෙනකු වදා ......... පර ලොව ගිය හැ.

එ කලැ රජ අනෙක් යෞවන ස්ත්‍රියක අග මෙහෙසින් කළ හැ. ඒ බිසෝ ද රජ හට ජන්තු නම් පුතකු වදා......... රජු අතට වඩා ලූව ......... ගිය යොවුන් කලැ ලත් පුත්‍රයා හෙයින් මහත් වූ ප්‍රේමයෙන් ......... '......... වදා දුන් තිට ......... වරයක් දෙමි, .........හැර ගනැ'යි කී යැ. ......... බිසෝ......... 'මා කැමැති විටෙකැ ඉල්වාගන්මි' යි ......... පුතු වැඩුණු පසු ......... 'ම පුතුට රජය දෙව' යි කිව. ......... ......... බොරු කිවයි යන බසට පිළිකුල් කරනුයේ තමා ගේ මාලු පුතුන් සතර බෑයන් ගෙන්වා 'දරුවෙනි ......... ජන්තු නම් මල් කුමරුවාට නො සලකා රජය දිනිමි. මා ඇති සමයයේ ඒ ජන්තුවා මැ රජය කෙරෙයි. මා නැති කලැ තොප ගේ රජය තොපට මැ දිනිමි. ස්ත්‍රී නම් මායම් දනිති. තෙපි මෙ නුවර නො රඳා ......... මෙයින් ගොස් අනෙක් තෙනැකැ වසව' යි ......... සමු දිනැ.

එ කලැ රජ කුමරුවෝ පිය රජහු වැඳැ සමු ගෙනැ ......... පිරිස් ගෙනැ නික්මුණා හැ. රජහු ගේ දූ පස් දෙන ද ......... 'අප මල් කුමරුවන් රවින් යන කලැ අපි කවුරුන් බලා රඳමෝ දැයි ......... නික්මුණා හැ.

......... ......... ......... ......... .........

රජ කුමරුවෝ ......... නුවරින් නික්මැ බරණැසට අග්නි දිග්භාගයෙහි යොදුන් ගණනක් ගොස් ......... ......... ......... නුවරකට සුදුසු බිම් බලන්නාහු යැ.

එ කලැ ......... බෝධිසත්ත්වයෝ කපිල නම් තාපස වැ එක් විලකට නුදුරු තැනැ බොහෝ ශාඛා ද්‍රැමයෙන් යුක්ත වූ වන මධ්‍යයෙකැ පන් සලක් කරවා ඝෝර වූ තපස් කරන දැ යැ. වලැ ඇවිදුනා රජ කුමාරයෝ බෝධිසත්ත්වයන් දැකැ වැඳැ එකත් පස් වැ සිටියා හැ. එ කලැ බෝසතාණෝ 'මොහු ඔක්කාක රජ දරුවෝ යැ' යි හැඳිනැ ගෙනැ 'දරුවෙනි, මේ කෙ සේ වූ අසරණ ගමනෙක් ද කුමක් සොයා වලැ ඇවිදු දැ' යි විචාළ දැ යැ. රජ කුමරුවෝ තමන් රටින් ආ පවතුත් නුවරක් කැරුවාගන්නට සුදුසු බිම් බලන පරිදිත් බෝසතුනට කී හැ.

......... බෝධිසත්වයෝ ......... ......... ......... ......... 'දරුවෙනි, නුවරක් කැමැතියා නම් මා ගේ මේ පන් සල් භූමිය ගනුව' ......... 'තොප මට කරන උපකාර නම් මෙ නුවර නිමි කලැ මා ගේ කපිල නම තබවයි කී දැ යැ. ......... ......... රජ කුමරුවෝ ......... නුදුරු තෙනැකැ පන් සලක් නිමවා බෝසතුනට පිළිගන්වා ඒ මහ වනය මුල් සිඳුවා......... එ නුවර නිමවා කපිලවාස්තු නමැයි තාපසයන් නමින්......... නම් තබා ......... '......... ඥාති සම්භේදයට වඩා ජාති සම්භේදයක් නො වීම උත්තම යැ' යි හැම දෙනාට වැඩි මාලු ප්‍රියා නම් බූනැණියන් මවු තනතුරෙහි තබා සතර බැයෝ තමනට කුඩා නඟුන් අග මෙහෙසියන් කොටැ රක්ෂා කළ හැ. ඒ බිසෝවරු සතර දෙන මැ දූන් අට අට දෙනා හා පුතුන් අට අට දෙනා බැගින් සූ සැටක් දරුවන් වැදූ හැ. එ කලැ පිය මහ රජ්ජුරුවෝ මෙ පවත් අසා 'ම දරුවෝ රටින් ගොසිනුත් ජාති සම්භේදයක් නො කළාහු යැ' යි සාධු නාද පවත්වා,

'සක්‍යාවත හෝ රජ කුමාරෝ! පරම සක්‍යාවත හෝ රජ කුමාරෝ'යි ප්‍රීතීන් තුන් යලක් උදන ගායනා කළ හැ.

අම්බට්ඨ ඔක්කාක රජු කළා වූ ප්‍රීති උදනය ගෙනැ එ තැන් පටන් ඔක්කාක වංශය නම් පෙරළී අම්බට්ඨ ශාක්‍ය වංශ යැයි මෙ නමින් ප්‍රසිද්ධ වියැ.

මෙ සේ ඒ ශාක්‍ය වංශයෙහි රජුන් එ මැ කිඹුල්වත් නුවර දෙ ලක්ෂ තෙවිසි දහස් සත් සිය එකුන් සැත්තැවක් රජ පරම්පරා ගිය කලැ ......... ජය සේන නම් රජු පින් සිංහ හනු නම් රජෙක් වියැ. ඔහු ගේ කසයින් නම් අග මෙහෙසින් වැදූ දරුවෝ, ශුද්ධෝදන යැ, අමිතෝදන යැ, ධෝතෝදන යැ, සුක්කෝදන යැ, සට්තෝදන යැයි පුතුන් පස් දෙනකු හා අමිතාවෝ යැ, පාරලී යැයි යන දූන් දෙදෙනකු හා මෙ සේ සත් දෙනෙක් වූ හැ.........සුද්ධෝදන නම් කුමරු වැඩී පිය රජහු අයාමෙන් කපිලවාස්තු පුරයෙහි දශ රාජ ධර්මයෙන් රාජ්‍යය කෙරෙයි. (පූජා:)

බුදුගුණ අලංකාරයේ සඳහන, මෙහි නො සඳහන් නිමි රජ තෙමේ මුවදෙව් පෙළේ අවසන් තැනැත්තා බව නිමි ජාතකය කියයි.

## 11. සිදුහත් සිරිත

356. බුදු කෙනකුනට නියතැ මවු තනතුරු පතා කප් සහසක් සතතැ ඉතා දන් සිල් ගුණ පුරා.

බුදු කෙනකුන් හට නො වරදවා මැ (ඒකාන්තයෙන් මැ) මව වීමේ තනතුරු පතා කල්ප ලක්ෂයක් නො කඩවා දන්, සිල් (ඈ) ගුණ බොහෝ සෙයින් පුරා.

මෙහි 'දන් සිල් ගුණ' ය යි කියේ 'දාන, ශීල' ආදි පාර මිතාවන් සඳහා වියැ යුතු. බෙහෙවින් මැ පුරනු පැරුම් වියැ යුතු.. පිය තනතුරු පතා කල්ප ලක්ෂයක් පැරුම් පිරීම කැරිණි නම (354) මවු තනතුරු පතා ද එ මැ කැරෙනු නිසි නො වැ?

'නියතැ, සතතැ' යනු 'නියතා, සතතා' යි වූයේ එළිවැට නිසා යි.

'දන් සිල්' පැරුම් 'දන් සිල් ගුණ' යැයි පැවැසීම වියත් වහරට හොබනේ නො වේ.

357. **සිරින් සුරිඳු වූ, යසසින් පුන් සඳු වූ, තෙදින් දිනිඳු වූ, අඳුන් සක් නරනිඳුට දූ වූ-**

ඉසුරින් (හෙවත් සම්පතින්) දෙව් රජ වූ (ද), කීර්ති-යෙන් පිරුණු සඳු වූ (ද), තේජසින් හිරු වූ (ද), අඤ්ජන ශාක්‍ය රජුට දූ වූ-

මෙ කියන්නේ 'මහා මායා' බිසොවුන් අඤ්ජන ශාක්‍ය රජුට දූ වැ උපන් (එ රජු ගේ දූ) බවයි. එ අඤ්ජන ශාක්‍ය රජ තෙමේ සම්පත් ඇත්තෙකි. සම්පතින් හෙ තෙමේ දෙව් රජ යැ. (දෙව් රජ නම් සක් දෙවියා යි). යසස (එ නම් කීර්තිය) පුරා හඳේ එළියට තො වෙතසි. එ හෙයින් යසසින් මෙ රජ තෙමේ පුරා හඳයි. තේජසින් හිරුට වැඩි තරම් වන්නෙක් නැති. මෙ අඤ්ජන ශක්‍ය රජ තෙමේ එ අතින් හිරුයි. දෙව් රජ යැ, පුන් සඳ යැ, දිනිඳු යැ යන තිදෙන එක් ගොඩෙකැ රුඳුණා වැනියි තනි මේ රජ. සුරිඳුට මෙ රජුට සරි සිරි (සැපත්) ඇතත් යසස හෝ තෙද හෝ මෙ රජුට පමණ නැති. පුන් සඳුට මෙ රජුට සරි යසස් ඇතත් සිරි හෝ තෙද හෝ නැති. දිනිඳු තෙදින් මෙ රජු සරි වෙතත් යසසිනුත් සිරිනුත් මෙ රජුට අඩු තරම් වෙයි. මෙ එක් රජ එ තුන් දෙනා ගේ තුන් ගුණෙන් මැ යුතුයි.

සුරිඳු = සුර ඉඳු + ආ,
දිනිඳු = දිනැ ඉඳු + ආ.

එක් මැ අරුතැ 'වූ' යන්න සිවු පියෙහි අගැ යෙදුණු හැටි මන රම් නො වේ.

358. **තමා රුසිරින් ලෝ අමා සරි කළ, නෙතට මායා වන් රදූ මායා නමින් යුත් වූ.**

තමා ගේ රූ සිරියෙන් (එ නම් රූප සම්පත්තියෙන්) ලොවට අමා (එ නම් අමෘතය) සැපැ යූ, ඇසට මායා වැනි රජ දුව 'මායා' (යන) නමින් යුත් වූ යැ.

මායාව නම් ඇස් රැවටීම හෙවත් ඇස් බැන්දුමයි. ඊට මැ අයෙක් ඉන්ද්‍රජාල යනු පවසති. මේ මායා නම් වූ රජ දූ ද දුටන් ගේ ඇස් ඇදූ බඳිනුයෙන් ඇස් බැන්දුමක් හෙවත් ඉන්ද්‍රජාලයක් බඳුයි.

ඕ තොමෝ තමා ගේ රූසිරින් ලොවට අමා (අමෘතය) සැපැයූ. සරි කිරීම නම් සැපැයීමයි. මැ ගේ රූ සිරිය අමෘතය මැ වන බවයි ඒ කීයේ.

'තමා' යනු තමා යා, යැයි ද, 'අමා' යනු අමායා යැයි ද විරිතත් එළි වැටත් නිසා සිටී.

මේ අඤ්ජන ශාක්‍ය තෙමේ කිඹුල්වතැ ශාක්‍යයන් ගෙන් බෙදුණු අනෙක් අත්තෙකැ උපනේයි. කෝළිය යනු ඔහු ගේ පෙළට කියන නමයි. කෝළිය ශාක්‍යයන් ගේ උපත මෙසෙයින් දක්වේ:-

'තුන් වන ඔක්කාක රජු ගේ දරු වූ සිවු බෑ රජුන් තඟුන් රක්ෂා කොටැ ජාති සම්භේදයක් නො කොටැ රජය කරන කලැ හැම දෙනාට මැ බූන් වූ ප්‍රියා නම් බිසොවුන්ට ශ්වේත කුෂ්ඨ නම් රෝගයක් ඇති වැ සකල ශරීරය සුදු වැ කොබලීල මල් පෙත්තක් සේ වියැ. එ කලැ මල් රජ දරුවෝ ඔවුනොවුන් හා සමඟැ මන්ත්‍රණය කරන්නාහු 'මොවුනට ඇති වූයේ පාප රෝගයෙකැ. මේ රෝගය නම් කැවී වැ කැවත් කරන් යෙයි. දුටුවන් කරන් යෙයි. එක ගෙයි වසනුවන් කරන් යෙයි. මතු අප හැම දෙනාටත් මෙ රෝගය බෙදී යෙයි' කියා තමන් තමන් කෙරේ භය ඇති වැ දවසක් 'උයන් කෙළියට යම හ'යි කියා බූනැණියන් රථයකට නංවා කඩතුරාවෙකින් වසා ගඟ ඔස්සේ ගොසින් එක් වන මධ්‍යයෙකැ මහත් කොටැ වළක් බිඳුවා; වළ යට යානක් අතුරුවා දිය, දර, ලුණු, ඇඹුල්, වලන්, සාල්, ගිනි ආදිය වළ

යට පටවා බූතැණියන් ඒ යානේ ලවා වළ මතුයෙහි පුවරු අතුරුවා පස් මේ කරවා කඳුළු මුසු මුහුණින් ගිය හ. එ කලැ දේවී වළ යටැ දී මැ පිසැ කා ජීවිතය රකියි.

මෙ සේ වසත කලැ රම නම් රජකුට ද ඒ කුෂ්ඨ රෝගය ඇති වියැ. ............ රජ මහත් වූ ලජ්ජා ඇති වැ .........පුත් කුමරුවාට රජය දී තෙමේ ‘වලැ හෙවැ එකලා වැ මියෙමි’යි සිතා ඒ වලට වැදැ ඒ ඒ තැන්හි ඇවිදුනේ ක්ෂුධාව ඉවසා ගත නො හී දුටු යම් මැ ගසෙකැ පොතු යැ, මුල් යැ, මල් යැ, කොළ ය, එල යැ යනාදීන් අනුභව කෙළේ යැ· එ කලැ ඒ ඖෂධ බලයෙන් කුෂ්ට රෝගය සන්හිඳී රජු ගේ සර්වාංගය මැ රන් කඳක් සේ වියැ.

ඉක්බිත්තෙන් ඒ රජ වාසයට සුදුසු තැනක් බලනුයේ එක් තෙනෙකැ මහ සිදුරු ඇති කොළොම් ගසක් දැකැ මෙහි යටැ වෙසෙම් නම් වගුත් ගෙන් භය නැතැයි සිතා ඉණක් ලා ගෙනැ ගස උඩට සොළොස් රියනක් තැගී කවුළු දෙරක් කපා ගෙනැ එ තැනැ උඩ මැස්සක් බැඳැ ගිනි කබලක් තබා ගෙනැ ඒ ගස් බිලයේ වාසය කොටැ නො එක් සතුන් කැ තැනින් මස් ගෙනවුත් පලහා කා ජීවත් වැ රාත්‍රියෙහි සිංහ ව්‍යාඝ්‍ර ආදීන් ගේ නාද ද සෙසු සතුන් ගේ රාවු පිළිරාවු ද අස අසා වාසය කෙරෙයි. එ කලැ එක් දවසක් පාන් වරා ව්‍යාඝ්‍රයෙක් ගොදුරු සොයා ඇවිදුනේ ඒ බිසොවුන් වසත වළ මුදුනට පැමිණැ මනුෂ්‍ය ගන්ධයෙකැයි ආඝ්‍රාණය කොටැ දෙ පයින් පස් පිරා පුවරු ඔසොවා ඒ බිසොවුන් දැකැ භයංකාර කොටැ නාද කෙළේ යැ. එ සඳැ බිසොවු උඩ බලා ව්‍යාඝ්‍රයා දැකැ භයින් වෙවුලා බැගෑ පත් වැ මහත් කොටැ හඬක් ගැසුව. මනුෂ්‍ය ශබ්දයෙහි සියලු සතුන් මැ භය ගන්නා හෙයින් ව්‍යාඝ්‍රයා මැ බා දිවැ පී යැ. ඉරු නැගි කලැ ඒ රම රජ්ජුරුවෝ සිතන්නාහු ‘අලුවල් දිගැ ව්‍යාඝ්‍රයෙක් හැඬී යැ. ස්ත්‍රියකගේ,හැඬූ හඬෙකැ. කාරණ කිම් දෝ හෝ’ යි ගසින් බැසැ ගොසින් බලන්නාහු ව්‍යාඝ්‍රයා ඔසොවාපු පෝරු දැකැ වළ යට බලා බිසොවුන්

දූකා 'තෙපි කවුරු ද' යි විචාළේ ය. බිසොවු 'මම ගැහැනියක්මි' යි කීහ. 'තෙපි ගැහැනියක් වවු නම් මම පිරිමියෙක්මි, ගොඩ නැගෙව' යි කී හ. එ බසට බිසොවු 'ඔක්කාක රජ්ජුරුවන් ගේ මහලු දූ වූ ප්‍රියාවෝ් නම් මම් ය. ජීවිතයට හානි වේ නමුත් රජ වංශයට කිලුටක් නො කෙරෙමි' යි කිවු ය.

එ බසට රජ කියනුයේ 'බරණැස රාම රජ නම් මම් ය· වැසි දිය හා ගං දිය හා සම වූවා වැන්න. වහා ගොඩ නැගෙව' යි කීය. 'ස්වාමීනි මිනිසුන් බැලියැ නො හැක්කා වූ ශ්වේත කුෂ්ට රෝගයෙක් මා ගේ සර්වාංගයෙහි ඇත. එ සේ හෙයින් ගොඩ නො නැගෙමි' යි කී හ. එ බසට රජ කියනුයේ 'මම ද එ බඳු වූ පාප රෝගයක් ඇති වැ රජය හැරැ වලැ ඇවිදැ ඖෂධ බලයෙන් දූන් සංහිඳුවා ගතිමි. එ මැ බෙහෙදින් තොප ගේ රෝගයත් කලෙකින් යපා පියමි: වහා ගොඩ නැගෙව යි කියා හිණක් බැඳැ වලට බා බිසොවුන් ගොඩ නඟා ගෙනැ තමන් ගේ වාසස්ථානයෙහි මැ ගෙනැ ගොස් ලාලා, තමන් ඇඟට කළ බෙහෙත් බිසොවුනට කොටැ කීප දවසෙකින් කුෂ්ට රෝගය සංහිඳුවා පී ය. බිසොවුන් ගේ ද සියලඟ කිණිහිරි මල් පෙත්තක් සේ ඉතා රන් වන් විය. එ කලැ දෙදෙන ප්‍රිය වාසයෙන් ලෝකාස්වාදය කළාහු ය. ප්‍රථම වාසයෙහි මැ දරු ගබක් පිළිසඳැ දස මසක් ගිය කලැ රන් රූ දෙකක් සේ පුත් රූ දෙකක් එක විටැ මැ වැදූ හැ. මෙ සේ මැ හවුරුදු පතා සම වූ පුතුන් දෙදෙනා බැගින් සොළොස් හවුරුද්දක් ඇතුළත පුතුන් දෙ තිස් දෙනකු වැදූ හැ. එ කලැ රාම රජ්ජුරුවෝ් දරුවන් වඩා නො එක් ශිල්ප ඉගැන්නූ හ.

......... ......... ......... ......... ......... .........

......... පුත් රජ එ පවත් අසා සිවුරඟ සෙන් ගෙනැ පිය රජහු වසන මහ වනයට වැදැ ......... රජයට මා කැටි වැ වැඩිය මැනැවැයි ආරාධනා කොටැ පිය රජහු නො ගිවිස්නෙන් ......... ඒ මහ වනය මුල් සිඳුවා නුවරක් කරවා පවුරු

ආදින් සුරක්ෂිත කොටැ පිය රජ්ජු විසු කොලොම් ගස මූලින් උදුරුවා එ බිමැ මහ පායක් කරවා වැව් අමුණු බඳවා සරක් බත් බිජුවට සී වැස්සත් ලවා ......... පිය රජහු ඒ නුවරු පිහිටුවා ......... බරණැස් නුවරට මැ ගියේ යැ. එ නුවර කොලොම් වෘක්ෂය පිහිටි තැනැ කළ හෙයින් කෝළිය නම් වීයැ. ............

මෙ සේ එ නුවරු වසන කලැ ඒ ප්‍රියා නම් බිසෞවු පුතුන් දෙ තිස් බැයන් කැඳවා 'දරුවෙනි කපිල පුරයෙහි රජ කරන සිවු බෑ රජහු මා ගේ මල් බෑයෝ යැ. ඒ කාරණයෙන් තොප මයිලෝ යැ. උන් සතර දෙනා ගේ දූ දෙ තිසෙක් ඇතැ. උඟ තොප ගේ බෑදූවු යැ. තෙපි හැම සුරු වූ නම් තොප බෑදූවුන් රක්ෂා කරව' යි සිවු යැ. රජ කුමරුවෝ මෑණියන් කී බස් අසා මයිලන් කරු පඬුරු දී......... දූතයන් යවති ......... මයිලෝ ......... දූත් පාවා නො දෙති. රජ කුමරුවෝ බෑදූවුනට සොර පත් යවා සොර පඬුරු දෙවා ......... අසුවල් ද ......... එ තැනට එන්නේ යැයි අවධි කොටැ යවා ලති. රජ කුමරියෝ......... යෙති. ......... රජ කුමරුවෝ ......... බෑදූවුන් අත් අල්ලා ගෙනැ ......... කෝළිය නුවරු යෙති. ......... එ තැන් පටන් කපිල වස්තු පුරය හා කෝළිය නුවර හා දෙනුවරු රාජ දරුවන් ගේ ආවාහ විවාහ සම්බන්ධය නො නැසී පැවැත්තැ. .........

කෝලිය වංශයෙහි නො එක් දහස් ගණන් රාජ පරම්පරා ගිය කලැ......... ඇති වූ දෙව්දහ රජ්ජුහු පින් අඤ්ජන ශාක්‍ය නම් නරේන්ද්‍රයෙක් වියැ. සිංහහනු රජහු නං මහා යශෝධරා දේවී ඒ අඤ්ජන ශාක්‍ය රජ හට අග මෙහෙසින් වැ සුප්‍රබුද්ධ යැ, දණ්ඩ පානී යැයි රජ කුමරුවන් දෙදෙනා හා මහා මායා මහා ප්‍රජාපතී යැයි යන දූන් දෙදෙනා හා දරුවන් සතර දෙනකු වැදූ හැ.' (පූජා:).

359. **සුදෙවුන් රජු පිණිසැ, එ මායා බිසොවුන් කුසැ සඬසැ පිළිසඳ ගෙනැ, වෙසක් මසැ මැදි පෝ ද බිහිවැ–**

සුද්ධෝදන රජු නිසා ඒ (මහා) මයා බිසොවුන් ගේ කුසයේ නිදෙස් පරිදි ප්‍රතිසන්ධිය ගෙනැ වෙසක් මාසයේ පසළොස් වක් පොහෝ දිනැ බිහි වී.

360. **දුවු දුවුවන් සිතට සක්විති සැපත් අඩු කොටැ ඉඳු ලෙසට කිඹුල්වත් පුරෙහි රජ සැපතට සැපැමිණැ.**

දුවු දුවු (දක්ක දක්ක) මිනිසුන් ගේ සිතේ චක්‍රවර්ති සම්පත ද මීට පහත් සේ (මඳ සේ) හැඟීම ඇති කරවමින්, සක් දෙවියා පරිද්දෙන් කිඹුල්වත් පුරේ රජ සැපතට සැපැමිණී-

සිදුහත් කුමරු කිඹුල්වත් පුරේ රජ සැපතට පැමිණී-යේයි. ඔහු පත් රජ සැපත දක්ක දක්ක මිනිහා ගේ සිතට හැඟෙන්නේ 'චක්‍රවර්ති' සම්පත්තිය ඊට අඩු සේයි රජ වූ ඔහු පෙනෙන්නේ සක් දෙවියා සේයි

සිදුහත් කුමරු ලත් රජ සැපත දුටු දුටු දනන් ගේ සිතට චක්‍රවර්ති සම්පත ඊට අඩු සේ (ඒ චක්‍රවර්ති සම්පතට වැඩි සේ) ඇඟෙන්නට ඔවුන් චක්‍රවර්ති සම්පත් දකැ පුරුදු ඇත්තවුන් වියැ යුතු සතකු දුටු විටැ ඒකා අලියාටත් වැඩියෙන් ලොකු යැයි හෝ කුඩා යැයි හෝ සිතෙන්නේ අලියා දකැ පුරුදු කම් ඇති දනන් ගේ සිතටයි ඒ අතින් මේ පැවැසීම නය හුරු නො වෙයි.

රජ සැපතට පත් සිදුහත් කුමරු ඉඳු ලෙසැ පෙනෙනු හැකියි. එ හෙත් ඉඳු කිඹුල්වත් පුරෙහි රජ සැපතට නො පත්තේ යැ. එ හෙයින් 'ඉඳු ලෙසට කිඹුල්වත් පුරෙහි රජ සැපතට සැපැමිණැ' යනුත් සිත් ගන්නා පැවැසුමෙක් නො වේ.

සක් විති සැපත් පළමු (342) සැඳැහිණී.

ඉඳු (ඉන්ද්‍ර) යනු ඉන්ද්‍ර (නැගෙන හිරි) දිගට අධිපති හෙයින් සක් දෙවියාට නමෙකි.

'මට ඉඳුරු දික්පති
දතෝ සක් දෙවිඳු යැයි පවසති' යි ගුත්තිල
ද කව් කරුවෝ ඔහු ලා මැ පවසවති.

361. **සුපිරිසුදු යසසින් තුන් ලොව මැ සව් සුදු කළ, සිදුහත් නමින් පරසිදු මෙ බඳු රජ උතුමෙක් වියැ.**

ඉතා පිරිසුදු වූ කීර්තියෙන් (බඹ, දෙව්, මිනිස් යන) ලෝ තුන මැ සියලු අත්දමින් සුදු කල, සිද්ධාර්ථ යන නමින් ප්‍රසිද්ධ වූ, ඉහතැ කී පරිදි රජ උත්තමයෙක් වූයේයි.

362. **එ කිමි සඳ නම උපන් දිනෙහි මැ, අසුර සුර බඹ නරන් හැම නො හැර මැ තුටු කැරැ ලොවැ මහිම දක්වා-**

ඒ හිමි උතුමා තමන් උපන් ද මැ අසුර, දෙව්, බඹ, මිනිස් යන සියල්ලන් (එක් වගකුත් නැරැ මැ) සතුටට පැමිණෙන පරිද්දෙන් තමා ගේ මහත් බව ලොවට පෙන්වා-

363. **මිහි පිටැ සිටැ තොසින් දිගු ඇසින් දිගු අත නරඹා වෙසෙසින් සක්විති රජ වෙසින් සත් පියවරක් ගොසින්-**

බිමට බැසැ එ මත්තේ සිටැ ගෙතැ දික් වූ ඇසින් දිශා කෙළවර (තෙක්) බලා, විශේෂයෙන් මැ චක්‍රවර්ති රජකු ගේ විලාශයෙන් පියවර සතක් දුරැ ගොස්-

'දිගැසින්' යනු පිරිමි ඇස් පිණිසැ යොදනු එ තරම් මැ හොබනේ නො වේ.

364 **සුර බඹ මහ සබව බුදු වන දැනැ පුදන සබව හෙන තෙපුලෙන් තම මුළු ලොවට අග බව කී යැ.**

දෙව් බඹ (දෙවියන් ගෙත් බඹුන් ගෙත්) මහා සභාව බුදු වන බව දැනැ පුදත් මැ, ඇත්ත වැහෙන්නා වූ බසින් තමා මුළු ලොවේ අග්‍රයා බව කී යැ.

මෙහි 'සබව' (සභාව) යැයි කියේ මහත් 'සමූහය' යනු ඇඟැවීමටයි. සිදුහත් කුමරු උපදනා විටැ එ තැනට දෙවියන් ගේ බඹුන් ගේ පැමිණීමෙන් මහත් සමාගමයෙක් වියැ. ඒ රැස් වූ දෙවියෝත් බඹහුත් එ තුමා බුදු වන බව දැනැ සිටිය හ. එ හෙයින් එ තුමා පිදීමේ යෙදුණු ඔවුන් පුද පවත්වත් මැ එ තුමාៈ-

'අග්ගෝහමස්මි ලෝකස්ස' යැයි තමා මුළු ලොවට අග්‍රයා බව කීයේයි. එ තුමා ගේ තෙපුල ඇත්ත පළ කරත එකෙකි.

365. **සත් මැසි වයසැ සිටැ නුබ කුසැ පලක් බැඳැ හිඳැ පිතු සිරස නම්වා දියතැ තමා යස රැස කියැවි යැ.**

සත් මසක් වයසැති වැ සිටියැ දී අහස් කුසයේ හසරම්ණිය බැඳැ හිඳීමෙන් පියා වඳවා තමා ගේ කීර්ති රාශිය ලොවේ කියැ වී යැ.

සිරස නැම්වීම තම් වැඳැවීමයි.

මෙහි 'සත් මැසි' යනු වියැ යුත්තේ 'පස් මැසි' කියායි. සිදුහත් කුමරු උපන්නේ වෙසක් මසැ වන වප් මඟුල් සිදු කරන 'වප්' මස වන විටැ වයස පස් මස විනා සත් මස නො වියැ හැකි සත් මැසි වන විටැ පැමිණෙන්නේ උඳුවප් මසයි.

'නුබ කුසැ පලක් බැඳැ හිඳැ' යනු ද වැරැදි ඇඟීමක් දෙන්නේයි. සිදුහත් කුමරු වප් මඟුල් දා පලඟ බැඳැ හුන්නේ අහස මතැ මිසැ අහසේ නො වේ

'.........බෝසතාණන් පස් මැසි වූ කලැ ඒ ශුද්ධෝදන රජ්ජුරුවන් ගේ......... වප් මඟුලෙක් වියැ. එ දා .........මහ සෙනඟ පිරිවරා පායෙන් නික්මෙනුයේ පුතණුවන් රත් සිවි ගෙයෙකින් වඩා ගෙනැ එ කෙත් වත් කෙළවරැ ඝන වූ ඡායා හා අභිනව වූ පත්‍රයෙන් ගැවැසී ගත් මහ දඹ ගසක් මුලැ සුදු

වැල්ලෙන් තවරා අසුන් සලසා පුතණුවන් යහනට වඩා රන් තරු රිදී තරුයෙන් විසිතුරු වූ වියන් බඳවා වට තිර අද්දා රකවල් ලවා ......... කෙත් වතට වැඩ වප් මඟුල් කෙරෙති.

ඒ වප් මඟුලෙහි හැම දෙන මැ සුදු පිළී හැඳැ, සුවඳ මලින් සැරැහී කෙත් වත පුරා සිටැ ගත් හැ. ඒ වප් මඟුලෙහි දහසක් පමණ නඟුල් රිදී පතින් වසා, ගොනුන් ගේ අං වලැ රිදී කුප්පි බහා, කර සුදු මල් කඳු බැඳැ යොදා සිටුවන ලද රජ්ජුරුවන් අතට වඩනා නඟුල සත රන් පතින් වසා මංගල වෘෂභ රාජයන් ගේ අං වලැ රන් කුප්පි බහා කර රන් වන් මලින් සරසා පිට රන් සැදින් වසා යොදා සිටුවන ලද. ඉක්බිත්තෙන් රජ්ජුරුවන් රන් නඟුල වමතින් ගෙනැ දකුණතින් රන් කැවිට ගෙනැ සිටැ ගත් කලැ අටතුරා සියක් මඟුල් ඇමතියෝ මඟුල් වෙස් ගෙනැ, රිදී නඟුල් රිදී කැවිටි ගෙනැ සිටැ ගතිති. පරිවාර ජනයෝ මඟුල් වෙස් ගෙනැ දහසක් ගොන් ගේ යොදා සිටැ ගතිති. රජ්ජුරුවෝ දකුණ- තින් රන් කැවිටැ ගෙනැ නැඟෙන හිරින් බස්නාහිරට එක හී වටක් ලා ලති. එ දා ඒ මඟුලෙහි රජ්ජුරුවන් ගේ මඟුල් මහ ඇමතියෝ තුන් තුන් හී වට ලා ලති. සෙසු දහසක් පුරුෂයෝ දහසක් ගොන් ගේ ගෙනැ ඔවුනොවුන් පරයා දක්ෂ වප් මඟුල් කෙරෙති. ......... ......... ......... එ දා ඒ හැම කිරි මවුහු බෝසතාණන් පිරිවරා උන්නාහු තිරයෙන් පිටත් වැ රජ්ජුරුවන් ගේ මේ පෙළහර බලති.

•

එ කලැ මා ගේ ශ්‍රී මහා බෝධිසත්ත්වයෝ ඇතුළෙහි කිසි කෙනකුනුත් නැති සේ දැකැ යහනින් නැඟී පලඟ් බැඳැ වැඩැ හිඳැ ආනාපාන ස්මෘති භාවනා කොටැ ප්‍රථම ධ්‍යාන උපදවා ධ්‍යාන සුවයෙන් උන් සේකැ. එ වේලෙහි කිරි මවුහු ඇතුළට වැද පලඟ් බැඳැ හුන් බෝසතාණන් දැකැ ......... ......... රජ්ජුරුවන් කරා දිවැ දිවැ ගොස් 'හිමි තොප ගේ මේ මඟුල් තබා තොප පුතණුවන් සිද්ධාර්ථ කුමාරයන් ගේ මඟුලක් වයා බලව! කී හැ.

රජ්ජුරුවෝ ඒ බස් අසා වප් මඟුල් හැර දිවැ දිවැ අවුත් ......... ඇතුළට වැදැ ......... ......... පතුල් සුං පිටැ පතුල් සුං තබා ගෙනැ, අතුල් සුං පිටැ අතුල් සුං තබා ගෙනැ, දස අග් නො බලා, ඇසි පිය නො මරා නො සැලී කර බා ගෙනැ ප්‍රථම ධ්‍යාන සුවයෙන් වැඩැ හුන් පස් මැසි පුතණුවන් වහන්සේ ගේ පෙළහර බලා ......... සිරි පතුල් සුං දෙක තමන් හිස් මුදුනෙහි තබා වැදැ ......... ......... නමස්කාර පූජා කළ හැ.' (පූජා:)

යනුයි එහි පිළිගත් පවත.

'වයසැ, කුසැ' යනු එළි නිසා 'වයස, කුස' යැයි සිටී.

366. **ලොවැ ඇම සතන් නිති ඇරගෙනැ යතත් අඩු නැති, ගවු දෙ තුන් ගවු යොදුන් වට ඇති නිදන් සතරෙක් ඇති.**

ලොවේ සියලු සත්ත්වයන් නො කඩවා මැ (වස්තුව) ඇර ගෙනැ යතත් අඩු (වන්නේ) නැති, (පිළිවෙළින්) ගවුව, දෙ ගවුව, තුන් ගවුව, සතර ගවුව වට පමණ ඇති නිදන් සතරෙක් (ඒ තුමාට) ඇත්තේ යි.

යොදුනෙක් ගවු සතරෙකි. ගවුවෙක් ගොනකු නෙපුල් ලන හඬ ඇසෙන මානයේ දුරයි. ගවු සතරෙක් අද වහරේ මයිල සතකුත් තුන් කාලක් පමණ දුර වේ.

367. **හිම, ගිම්, වසන් කල් විසුමට සුදුසු, සුවිසල් තුන්, පස්, සත් මහල්, මන කල් ඒ තුන් පහ කුසෙහි විසී.**

(හිම වැටීම වන) හේමන්තය, (දැඩි උණුසුම ඇති) ගිම්හානය, (වැසි වස්නා) වසන්තය යන (තුන්) කාලයෙහි වාසය කිරීමට සුදුසු වූ, ඉතා මහත් වූ, උඩු මහල් තුනේ, පහේ, සතේ වූ, සිත් ඇදූ ගන්නා (පිය රජු විසින් කරවා දෙන ලද) ඒ ප්‍රාසාද තුන ඇතුළේ (ඒ තුමා) විසී යැ.

මෙහි 'තුන්, පස්, සත් මහල්' යන්න ද සෙසු තැනැ දක්නට ලැබෙන්නේ 'පස්, සත්, නව' විසිනි.

'එහි හිමන් පහය නව භූමක යැ......, ගිමන් පහය පඤ්ච, භූමක යැ......, වසන් පහය සප්ත භූමක යැ......' යනු ගුරුළු ගෝමි වදනයි. (ධර්: ප්‍ර:)

## (අ) සිඳුහත් මෙහෙසන

368. **සෙසු කුලැ අඟනන් හැරැ රජ කුලැ උපන්, සුර අඟන අසුරු මනහර සතලිස් දහස් ලියන් පිරිවර-**

අනෙක් කුලීන ස්ත්‍රීන් හැරැ, රජ කුලයෙහි උපන්නා වූ, දෙව් ලියන් බඳු සිත් ගත්තා සතලිස් දහස් ස්ත්‍රී පරිවාර ඇති-

'හැරැ' යනු එළි නිසා 'හැර' යි යෙදිණි.

සුරඟන පුරු = සුර අඟන අසුරු.

369. **කසුන් රුව මෙන් දිලි, ගමනින් හසුන් මන් සුන්, සුදසුන් යසෝදර නම් කතක් ඔහු හට මෙහෙසුන් වුව.**

රන් රුව සෙයින් බබළන්නා වූ, ගමන් විලාශයෙන් හංසයන් ගේ මානය සින්දූ වූ. මනා දැකුම් ඇති 'යශෝධරා' නම් කතක් ඔහුට මෙහෙසුන් වූවා යැ.

හංසයෝ අප ගේ ගමන් විලාස හොබනේ යැයි එයින් වඩනා ලද මාන ඇත්තෝයි. මේ යශෝධරාවන් ගේ ගමන් විලස ඔවුන් ගේ ගමන් විලසට වැඩියෙන් හොබනේ වෙයි. එයින් මොවුන් ගේ ගමන් විලස දක්නා ඔවුන් ගේ ගමන් විලස් මානය සිඳුණේ වෙයි. එයිනි මැය 'ගමිනින් හසුන් මන් සුන්' යැයි සැඳැහෙනු.

වුවොවුහට = වුව ඔහු හට.

'කසුන් රුව' නම් රන් රුවයි. දඹ දිවේ කිවියෝ දනන් ගේ රුව (රූපය) රන් රූ බඳු කොටැ පැවැසීමේ බෙහෙවින් පුරුදු වූවෝයි. ඔවුන් අනුවැ ගිය ලක් දිවැ කිවියෝ ද නො පැකිලී එ මැ කළ හ. මේ කිවියා මෙ තැනැ දී සේ මැ මීට පළමු වැ ද 'රන් රූ සදිසියහ' (44) යනු කීයැ. රන් පැහැය ඇත්තෝ 'මොංගෝල්' වගෙහි දනෝයි.

උතුරු හෝ දකුණු හෝ 'ආර්ය' වගේ දනෝ සුදු පැහැ ඇත්තෝයි. ඉදින් දඹදිව් වැසියෝ ආර්යයෝ මැ නම් ඇයි මේ රන් වන් බවට මැ සිරුර වැනීමෙහි පුරුද්ද?

**370. මුන් වරලස කලඹ සරි වන වතක් නො මැ ලැබැ, නුදුටු නො ඇසු සුබ මුහුල බඹ කෙ ලෙසින් මැවී ද හෝ.**

මොවුන් (මේ යශෝධරාවන්) ගේ කේශ කලාපයට සම වන්නා වූ දෙයක් නො ලබා මැ, නො දක්කා වූ, නො ඇසුවා වූ ස්වභාවය ඇති කෙස් වැටිය බ්‍රහ්මයා කවර අයුරින් මැවූයේ ද හෝ.

මොවුන් ගේ වරල් කලඹ අසමාන යැ, එයට සම වන වස්තුවක් නැති හෙයින්. එ හෙයින් එය නො දක්නා ලද නො අසන ලද ස්වභාවය ඇති එ කෙකි. බඹා වුව ද යමක් මවන්නේ දුටු හෝ ඇසූ හෝ දෑයෙකැ ස්වභාවය අනුව යැ. තමා විසින් නො දක්නා ලද නො අසන ලද ස්වභාවය ඇති ඒ කෙස් කලඹ කවර අයුරින් බඹා මැවූවා ද හෝ.

'වරලස කලඹ' යනුත් 'මුහුල' යනුත් එක් අරුත් ඇතියෙන් ඒ මෙහි යෙදූ හැටි මතරම් නො වේ.

**371. මුළු රට ඉඳු නිල් ඉඳුවරට මෙ වැනි පැහැ නැතැ මොවුන් ඇස් මැවුමට කුමන පැහැයක් එක් කොටැ ගනි ද?**

මුළු මහත් රටේ මැ ඉන්ද්‍රනීල මැණික් වලටත් මානිල් (නිල් උපුල්) වලටත් මෙ වැනි පැහැ නැත්තේයි. (එ සේ කල්හි) මොවුන් ඇස් මැවීමට කවර නම් පාටක් (බඹා) එක් කොටැ ගත්තේ ද?

ඇස් නිල් පැහැයෙන් යුතු වෙයි. ඉන්ද්‍රනීල මැණික් නිල් උපුල් යන දෙ වගේ නිල් පැහැය ඉතා මැ පසිදු යි. එ හෙයින් ඇස්හි පැහැය සැඳැහීමේ දී මේ දෙ වග සඳහන් කිරීමයි කිවියනට හුරු. මේ යශෝධරාවන් ගේ ඇස්හි නිලට සරි නිල් පැහැයෙක් මුළු රටේ ඇති ඉඳුනිල් මැණික් වලටත් නිල් උපුල් වලටත් නැත්තේයි. එ සේ කලැ මොවුන් ගේ ඇස් මැවීම පිණිසැ කවර නම් පාටක් (බඹා) එක් කොටැ ගත්තේ ද?

'රටැ, කොටැ' යනු එළි නිසා 'රට, කොට' යැයි වී.

**372. දුටු දුටුවන් ඔකඳ වන මුන් වුවන් පුන් සඳ මවන කලැ නුබ මැඳූ සඳ කුමකට මැවී ද හෝ? අනේ!**

දුක්ක දුක්ක තැනැත්තන් මහත් සතුටට පත් වන මේ යශෝධරාවන් ගේ මුහුණ නැමැති පුරා හඳ මවත් දී අහස මැද්දේ සඳ කුමකට මැවී ද හෝ, අනේ.

මොවුන් ගේ මුහුණ පුන් සඳයි. එය දුටු දුටු දනෝ සතුටින් පිනා යති. එ බඳු වූ එ සඳ මවත් දී තව අහස මැද්දේ හඳ කුමක් පිණිසැ මැවී ද හෝ, දුකෙකි (අමතර මහන්සිය ගැනැ).

මොවුන් ගේ මුහුණ නැමැති සඳ ඇති විටැ අහස මැදූ දු මවන සඳෙකින් වැඩක් නැති බව්යි එ කීයේ.

'මැදූ' යනු එළි නිසා 'මැද' වී.

**373. වට, මට සිලුටු කොමැ වට ලීමෙකින් ගත හැකි මුන් කරු හිරි තුනට ඇඳුමට කවර උපදෙස් ලදි ද?**

වට, මට සිලුටු කොටැ, වට ලීමෙකින් (වෘත්ත හෙළීමෙකින්) ගත හැක්කා වූ මොවුන් ගේ බෙල්ලේ සිරි තුන ඇඳීමට ඒ පිණිසැ කවර නම් ගුරු කම් ලද්දේ ද?

(මේ පැදියේ මුල් අඩෙහි අවුල් බවෙක් පෙනේ).

කොට = කොටැ.

374. **ගන රන් කුඹු අයුරු, දුමු දුමු වනට සිඝකරු මුන් පියොවුරු කළොත් බඹා බඹ සර තහවුරු වේ ද?**

ගන රන් කළ ගෙඩි වැනි වූ, දුක්ක දුක්ක දනන් හට සතුට ගෙන දෙන මොවුන් ගේ පියොවුරු (තන) බඹා කළ හොත් බඹ සර තිර වේ ද (අල්ලා සිටී ද)?

මොවුන් ගේ තන ගන රනින් කරන ලද කළ ගෙඩි වැනියි, දුක්ක දුක්ක මිනිසුන් හට ආසා උපදී. එ බඳු ඒ තන කරන ලද්දේ බඹා විසින් නම් ඔහුට ද ඒ දක්නට ලැබේ. එ විටැ ඔහුට ද ආසා උපදී. එ සේ කලැ ඔහු ගේ බඹ සර අල්ලා සිටී ද? (නො සිටී). බඹුන් ගේ සර (හැසිරීම) බඹ සරයි. බඹහු වනාහි අඹුවන් නැති ලොවෙකැ වසන්නෝ වෙති. එයින් උඹ තුමූ ලියන් සෙවුමෙන් දුරු වැ සිටිත්. ඒ තමා බඹ සර හෙවත් බඹුනට අයත් හැසිරීම.

'දුරැ ලූ යැ ලිය සසග
පිහිටි අය සේ වැ බඹ සර මඟ'

යැයි මෙහි මැ (97) කියැවිණි බඹසර නම් ලියන් සෙවුමෙන් දුරු වීම බව. මහණ දම් පුරන්නෝ ද බඹ සර දම් පුරන්නෝ වෙති. අඟනන් කෙරේ, ඔවුන් ගේ අවයව කෙරේ දැඩි ආසාව ඉපැදීම බඹ සර බිඳැවැටීමට කරුණු වෙයි.

375. **මොංලොක්, සිඟිල්, ඇල් වන් එක් කොටැ අඹා පැහැ පත, මුන් කොමල අත අයුරු. බලව. උවමක් සොයන අන් නැතැ.**

බුරුල් ගුණයෙන් යුතු, දැඩි සිහිල් දේ එක් කිරීමෙන් (එයින් අඹා) පැහැ ගැත්නූ විටැ එය මොවුන් ගේ මුදු ගුණෙන් යුත් අත වැනියි. (තවද විමසා) බලනු! උපමාවක් විමසත් හොත් (ඒ මැ විතා) වෙත නැත්තේයි.

(යශෝධරාවන් ගේ අත් ලා ගුණයෙන් යුතු බවත්, ඉතා සීත ගුණයෙන් යුතු බවත්, පැහැ පත් බවත් එයින් ඇඟැ-විණි. ලොවේ ඇති ලා ගුණයෙන් ද, ඉතා සිහිල් ගුණයෙන් ද යුත් වූ දෑය එක් තත් කොටැ හතා එයින් අඹමින් එ පමණෙකින් ද නො නැවැතී පැහැ පත් ද කළ විටැ ඒ මේ මුදු ගුණෙන් යුත් අත් බඳුයි. (පුදුමෙකැ හැටි) බලව්! උපමාවක් විමසත ඒ මැ මුත් වෙත නැති).

උවම යන්නෙන් 'සමාන දෑයක්' යන අරුත ගැන්වෙයි.

'සමහවියට තැකූ, කිසිවෙක් උවම් නම් වේ, ලබනුයෙ උවම් ඒ හා උවමේ තමින් පළ වේ' යි කියති සිදත්සඟරු කරුවෝ.

සිහිල්, යනුත් ඇල් යනුත් දෙන්නේ එක් මැ අරුතයි˙ එක් අරුත දෙන පද දෙකක් එක තැනැ යෙදීමෙන් 'වැඩි' යනු ඇඟැවෙයි. එ හෙයින් 'සිහිල් ඇල්' යනු ඉතා 'සිහිල්' යන අරුත දෙයි.

'වත්, නැත්' යනු එළි නිසා 'වත, නැත' යි සිටියේයි.

376. **සඳත් කුඹු අයුරු පින් පියොවුරු උසුලනා ඉඟැ සිහින නිබොරු කිවත් කවුරු අදහා ගනිති.**

දළ හයේ (ෂඩ් දන්ත) ඇතුන් ගේ ඔළු ගෙඩි බඳු (ඔවුන් ගේ) පිරුණු තන දරා සිටිනා (ඔසොවා ගෙනැ පවත්නා) ඉගේ සිහින් බව ඇත්තේ හැටියට කීවත් (ඒ) කවුරු (නම්) සැබැවියි සලකා ගනිත් ද?

(යශෝධරාවන් ගේ තන ඉතා මහත් යැ. දළ හයේ ඇතුන් ගේ ඔළු ගෙඩි මෙන් මහත් යැ. පිරී ඇත්තේයි. එ අයුරු මහ තන ඔසොවා ගෙනැ සිටිනා ඉඟ බොහෝ

සිහිත් යැ. වැනුම්හි දී කිවියත් කියන්නේ මැවූ උවම් ඇ මිසැ ඇත්ත නො වේ. එ අයුරු බොරුවක් නො මවා මොවුන් ගේ ඉගේ සිහිත් බව ඇත්තේ හැටියට කිවත් ඒ කීම කවුරු තම් විස් වස් කොටැ පිළිගනිත් ද?- නො පිළිගනිති ඒ එ පමණට සිහිත් හෙයින්).

377. **තුනු තුනු රුවට කැරු, කල කමැ වෙසෙස එළි කොටැ දුන් කළු හුය ලෙසට මුන් වසා රෝද මොනවට වැජැඹි.**

සිහිත් වූ සිරුර හැඩ ඇති අයුරින් කොටැ (තමන්) කළ දූයේ (කර්මාන්තයේ) වෙසෙස් බව එළිය වැටී පෙනෙන පරිද්දෙන් ගැසූ දූලි නූල සේ මොවුන් ගේ වසා රෙම් වැළ (=පෙළ) මනා සේ පෙනෙමින් පැවැතියේයි.

(මොවුන් ගේ සිරුර සිහිත් යැ, හීත් හිරියාවට සිරුර කොටැ එය කළ තැනැත්තා තමන් කළ දූය අන් සිරුරු හා නො සම වැ වෙසෙස් වන බව එළිය වැටී පෙන්නුම් කරනු සඳහා දූලි නූලෙන් ගැසූ ඉර සෙයින් මොවුන් ගේ වසා රෙම් පෙළ (රෝම රාජිය) මනා සේ පෙනෙමින් පවත්නේයි).

ළ මැදූ සිටැ නැබ ඔස්සේ සිරුර මැදින් විහිදූ ඇති රෙම් පෙළ වසා රෝම රාජියයි.

'තුනු තුනු' යනු 'තුනු, සිරි' යි ද දක්නා ලැබේ.

එළි කොට = එළි කොටැ (එළි).

(සිත්තමෙහි කළු හිරක් ගැසීම පැකැයේ හොබනා බව වඩතියි යෙහි සිත්තම් ඇදුරෝ)

378. **පෙරු බඹනු කල රඹ කඳ ගඳ ඇත් කර මෙහෙවර නපුරුයි හැම දුරු ඇරු මැය මන හර වට උර මැවූ වැනි.**

කලින්,(මහ) බඹා මැවූ කෙසෙල් කඳ යැ, ගඳ ඇතුන් ගේ සොඬ යැ යන නිමැවීම් (=කර්මාන්ත) හොඳ නැතියි (එ) සියල්ල දුරට දමා මැය සිත් ඇදගන්නා වට වූ කලවා මැවුවා වැනියි.

බෙහෙවින් මැ කිවියන් වට වූ කලවා පිණිසැ උපමානයට ගන්නා දෙකෙකි කෙසෙල් කඳත් ඇත් සොඬත්. එ දෙක මැ ද බඹු ගේ නිමැවුම් යැ. බඹු එ දෙක මැ මැවූයේ මැය ගේ වට වූ කලවා මැවීමට පළමුයි. මැවූ ඉක්බිති (නො එක් අඩු පාඩු දක්නට වූයෙන්) එ දෙක හොඳ නැතියි ඉවතට දමා එ දෙකේ වූ අඩු පාඩු සියල්ල සපිරීමෙන් බඹු මැය ගේ වට වූ කලවා මැවූවා වැනි බවයි මේ කීයේ.

'රන් කෙසෙල් කඳට තිගා දුන් වට මට සිලුටු වූ කලවා සඟලෙකින් හා...' යි පූජාවලිය කියයි.

'තම ගහනත සුබා
පැරැණු වටොර මහ බා
සඟලා වත රඹා
ගජහු වෙරිතෙව් බිඳිති තරඹා' යි මෙ උප-

මානය අන් අයුරෙකින් සඳහති සිරි රහල් හිමියෝ (කා: සේ: vi. 9)

ගඳ ඇත්තු පස් වන කුලයේ වරණහු වෙති. ඔවුන් ගේ සොඬ මොහොල් බඳු යැයිඃ-

'මෙ ගඳැත් තම් රුපු .
කිරිඳු සියතෙඕ බිඳුනා
මොහොලත්නි විසි නිය බොල්
කොපොල් දෙ අසුන් සම තල'

යැයි පඹු ඉඳුහු පෙත් (කා: සි: viii. 14).

මොවුන් බිඳි අහර කුසෙහි දී දිරා වූ පසු සුවඳවත් වන හෙයින් 'ගඳ ඇත්' යන නම වී ල.

(මෙ තෙක් 'මුන්, මොවුන්' ඈ විසින් බුහු බසින් සඳහන් කළ යශෝධරාවත් මෙහි දී 'මැය' යි එක් බසින් සැඳැහීම පිළිවෙළ සිඳීමෙකි).

ගඳැත් = ගඳ ඇත්.
කපුරා යි = කපුරු යැයි.
දුරාරා = දුරා ඇරා.

(දුරැරු යනු එළි නිසායි 'දුරැර' කියා සිටියේ).

වටොර = වට උර.

**379. දනන් උන්මතු කළ දණ උතු යුගට රන් තුතු සරි නො වත දූන් සුතු උවම් නැතැ. මින් මතු දුට කියමි.**

මිනිසුන් උමතු කළා වූ (ඔවුන් ගේ) දණ පොල් කටු දෙකට රන් (තරාදි) තුතු සමාන නො වත කලැ දූන් ඊට සුදුසු උපමාන නැත්තේයි. මෙයින් මත්තේ දුටුව හොත් කියන්නෙමි.

ඔවුන් ගේ දණ පොල් කටු දුටු විටැ මිනිසුන් හට (නො ලැබි යැ හැකි දූයට දැඩි ලොබ සිත් ඇති වීම නිසා) පිස්සු වැටෙයි. ඒ දණ පොල් කටු රනින් කළ තටු වැනියි කියනට ද බැරියි, රන් තටු මේ පමණ පිය කර නො වන හෙයින්. ඒවාත් මීට සම නො වන විටැ ඊට සම කිරීමට සුදුසු උපමාන වස්තුවෙක් දූන් නැති. මින් මත්තේ (හෙවත් ඉදිරියට) දුට හොත් කියන්නෙමි.

'කිරු තරුදිහි
මදන රස රූ තිවටහු
කිබිසි රන් තුතු සුදුසු
වට දණ මඬුලු කෙ වනත්'

යැයි පඬු ඉදුහු ද යෙත් (කා: සි: v. 9)

**380. පතග තුබ මැද පත පහන් සිළු නො දිලෙන රගැ උවම් ළඟ නො කළැකි මොවුන් යුග දග කො සේ වනමි ද?**

හිරු අහස මුදුනට පැමුණුණා මැ පාන් දූලි බබළන්නේ නැතුවා සේ උපමානයන් ළඟට පැමිණැවීමට නො හැකි මොවුන් ගේ දග (බත් කෙණ්ඩා) දෙක කවර අයුරින් වැනීම කරම් ද.

අහසේ මැද නම් අහස් මුදුනයි ඉර මුදුන් වේලාවට පාත් දූලි බබලන්නේ නැති. මේ යසෝධරාවන් ගේ කෙණ්ඩා දෙකට උපමානයන් ලං කලාම ඒ උපමාන පෙනෙන්නේ අහස මුදුනේ බබලන ඉරට පහන් දූලි ලං කලාම ඒ පාත් දූලි පෙනෙන්නා සෙයිනි. එ හෙයින් උපමාන වස්තුන් කිට්ටු කළ නො හැකි මොවුන් ගේ කෙණ්ඩා දෙක කවර අයුරෙකින් වනම් ද? යනුයි ඒ කියේ. බෙහෙවින් කිවියෝ අඟනුන් ගේ කෙණ්ඩා පහන් දූලි බඳු කොටැ වනත්. එ පහන් දූලි උපමාන පිණිසැ මොවුන් ගේ කෙණ්ඩා දෙකට අසල් කළ හොත් සිටිනේ අහසැ මුදුනට පැමිණි හිරුට එ පහන් දූලි අසල් කළ විටැ පෙනෙන සේ මැයි.

'මන දඟ දඟ ඇය
දුවන් විමනැත් වදනා
වියොවග හට ලූ දුලූ
පුවළ යුවළ වැටුප්පු හළ' (කා: සි: v 8)

යැයි පඬු ඉඳුහු ද,

'ම ද න දුවන් නිවෙසට වදින දින පෙර
දු ල න සොඳුරු රත් රඹ කඳ අගැ සොඳුර
ර ඳ න පහන් වැටුපෙව් දගිනි මනහර
සි ටි න දෙ තෙරැ ළද අඟනන් බල මිතුර'
(පරෙ: 66)

යැයි සිරි රහල් හිමියෝ ද ලියන් ගේ කෙණ්ඩා පහන් සිළු සරි කොටැ වනති.

381. **රූ සපුරේ පතුල් නො පෑ මුන් ගේ දෙ පතුල් සත ලොබ තුල් කෙරෙසි. මෙ ලොවැ කුමක් තුල් කැරැ කියම් ද?**

රුව නැමැති මහ මුහු දේ අඩිය නො පෙනෙන්නුවා වූ මොවුන් ගේ පතුල් දෙක සතන් ගේ ආසාව මහත් කෙරෙයි. මෙ ලොවැ කුමක් තුල් කැරැ කියම් ද?

'සාගරය හෙවත් මහ මුහුද තෙරක් නැති, පත්ල නො දක්කැ හැකි පමණට ගැඹුරු වූ දිය කඳෙකි. මේ යශෝධරා-වන් ගේ රුවට ද තිමක් නැතියෙන් සයුරක් කොටැ (සයුර බඳු වූයේ සයුරයි. රුව මැ සයුර රූ සයුරයි. එහි, රූ සයුරේයි) දක්විණි. ඒ සයුරක් වන් රුවේ පත්ල (ගැඹරින් කෙළවර) නො දක්වුවා වූ මොවුන් ගේ පතුල් දෙක සතන් ගේ ආසාව මහත් කරයි. එ හෙයින් මෙ ලොවේ ඇති කවර නම් දයක් එයට සම කොටැ කියම් ද' යන්නෙන් ඊට සම කොටැ කියැ හැකි දයක් නැති සැටියි එ අඟවන ලද්දේ.

'තුල්' යනු 'මහත්' 'සම' යන දෙ අරුත මැ දෙයි.

**382. සුවල ඇස නො වසා දකැ දකැ රිසි නො යන සේ මෙ සේ රුව ඇති කලැ නර සුර ලොවැයි වෙනස කිම් ද?**

දැහැ වහන්නේ (හෙවත් පියන්නේ) නැති වැ දකැලා දකැලාත් ආසාව නො යන හැටියට මෙ බඳු රුව ඇති විටැ නර (ලොව යැ) සුර ලොව (යැ) යි (ඇති) වෙනස කිමෙක් ද?

මේ යශෝධරාවන් ගේ රුව ඇස් දෙක පියන්නේ (ඇසි පිය හෙළන්නේ) නැති වැ බල බලාත් එය දක්මේ ආසාව නො යයි. මෙ බඳු වූ රුව (නර ලොවේත්) ඇති විටැ මිනිස් ලොව යැ, දෙව් ලො යැයි යන දෙකේ ඇති වෙනස කිමෙක් දැයි කීමෙන් ඇඟැවූයේ මොවුන් ගේ රුව ඇති විටැ එ දෙකේ වෙනසක් නැති බවයි. දැස නො පියවන දනන් සිටිනේ ද සුර ලොවේ යි.

සුවලැසේ = සුවල ඇසේ

'සුවලැස, වෙනස' යනු සුවලැසේ වෙනසේ යැයි සිටිනේ එළි වැට නිසා යි.

**383. මතුරු විලසට නම ඇසූ පමණට ලොබ වන මුන් රුව නෙතට වන සඟ මොක් ලැබෙනු ඉනා උගහට**

(විසී) මතුරක් (ඇසූ) සෙයින්, තම ඇසූ පමණින් ආසාව වන මොවුන් ගේ රූපය ඇගැට වැදුණොත් දෙව් (සැපතත්) නිවන් (සැපතත්) ලැබීම ඉතා දුඹි ගහට දෙන්නෙකි.

(මොවුන් ගේ තම දනන් සිත් විසී කරන මතුරක් බඳුයි එ තම ඇසූ පමණින් විසී මතුරක් ඇසූ කල්හි සෙයින් ආසාව වැඩෙයි. එ බඳු වූ මොවුන් ගේ රූපය ඇසින් දුටුවොත් එයට විසී වීම නිසා දෙව් සැපතත් නිවන් සැපතත් ලැබීම ඉතා බැරි දූයෙක් වෙයි).

384. **සුර අඟන සරි සිරින් බබළන මොවුන් රූසිරින් පෙම් බරින් බැඳුණෝ සසරින් කෙ සේ ගැළැවී යෙත් ද?**

දෙව් ලියකට බඳු වූ රූමත් බැවින් බබළන්නා වූ මොවුන් ගේ රූ සැපතින්, ඇල්මේ බරින් බැඳුණු දනෝ කවර නම් ආකාරයෙන් සංසාරයෙන් මිදී යති ද?

මූ තුමූ දෙව් ලියකට සම වැ සිරිමත් බැවින් බබළති. එ බඳු වූ මොවුන් ගේ රූ සැපත දැකැ පෙමින් බර වී බැඳුණු දනෝ, ලියනට විසී වීම සසරැ සැරි සැරීමට කරුණු වන හෙයින් කවර අයුරෙකින් සසරින් මිදී යෙති ද, යනුයි ඒ කීයේ.

'පෙම් බරින් බැඳුණෝ' යනු මත රම් යෙදුමෙක් නො වේ.

385. **මෙ ලෙසින් ලොවැ මහත් වියතුන් බසින් තුති ලත් පවර පිවි කුල කොත් රුවින් මුළු දඹ දිවට අඟ පත්–**

මෙ අයුරින් ලොවේ මහ වියත් දනන් ගේ වදනින් පැසැසුම් ලැබුවා වූ, උතුම් හිරු ගොතට කොත වූ, රූ සිරින් මුළු මහත් දඹ දිවට මුදුන් තන් පත් වූ–

(යශෝධරාවන් ගේ රුව ඉහතැ සඳහන් කළ පරිදි ලොවේ මහ වියත් දනන් පැසැසූ බවත්, ඔවුන් හිරු ගොතට කොත බඳු වූ බවත්, රූ සිරින් මුළු මහත් දඹ දිවේ මුල් තන් ලත් බවත් පැවැසූ සැටියි ඒ. එ හෙත් ඔවුන් හිරු ගොතින් ආ සැටි මෙ ගතේ මුලින් සඳහන් වූයේ නැති).

**386. මෙ රඟින් රුව දුකා, සසඟින් තෝරා ගත් එව්, තුනු අඟින් බබලන, පවර, එ බිසෝ ළඳුන් සමඟින්-**

මේ අයුරින් රුව දකලා සදෙව් ලොවින් වෙන් කොට ගත්තාක් මෙන්, සිහින් සිරුරින් දිලෙන්නා වූ, උතුම් වූ එ මෙහෙසි අඟන එක් ව.

('ඉහතින් කී පරිදි වූ රූපය බලා, දෙව් ලෝ සයින් මැ රූමත් තැනැත්තියන් වෙන් කොට ගත්තා සේ වූ, සිහින් සිරුරින් යුතු වැ දිලෙන්නා වූ, උතුම් වූ එ බිසෝ ළඳුන්' යනු කීමෙන් යශෝධරාවන් නර ලොවේ නො වැ දෙව් ලෝ සයේ ද රූමත් ළඳුන් තේරීමේ දී මුල් තැන් ගත්තා බවත්, ඔවුන් ගේ සිරුර සිහින් බවත් ඔවුන් උතුම් බවත් පළ කැරෙයි).

දෙව් ලෝ සය පළමු පැවැසිණි.

ගතෙව් = ගත් එව්

**387. දස දිගෙහි, බවඟෙහි නො හැර මැ යසස පෙන්වා, සඟෙහි සිරි අඹු සාල ගිහි ගෙහි විසි නව වසක් විසී.**

දස අතේ, බවයෙහි අගැත් (තම) කීත් රැස පෙන්වමින්, දෙව් ලොවේ සැපත බාල කළා වූ, බිරියක හා වසන ගෙහි විසි නව වසක් විසී.

(දස අතේ යසස පෙන්වන ලද කලැ බව අගක් අමුතු වැ සඳහන් කිරීම වැඩියෙකි. සතර දිග, සතර අනුදිග, උඩ, යට යන දස දෙසයි දස දිග. බව අග ද උඩ මැයි. මෙහි 'බව අග' -වෙසෙසින් සඳගත් කරන්නට ඇත්තේ උඩට පැතිරෙන කිසි කෙනකුත් යසස සදෙව් ලොව කෙළවරින් හෝ බඹ තල මුදුනින් හෝ ඔබට නො යා හැකි හෙයින් මෙ උතුමා ගේ යසස බවයේ අගට මැ පතළ බව සැලැකැවීමට වනැ.

ගිහි බව නම් බිරියක හා බැඳීමයි. ගිහි ගෙය (ගෘහස්ථ වාසය) වන්නේ බිරියක සහිත වැ වසන නිවහනයි.

වදාළහ සිරි රහල් හිමියෝ දැ:-

ගිහි වැසි වැ මෙ ලෙයේ
වසත බෝසත් සැප යේ (කා: ශේ: vii. 1) යැයි,

ආදි දඹදිව් වැසියෝ:-

බ්‍රහ්මචාරී
ගෘහස්ථ
වානප්‍රස්ථ
සන්‍යාසි

යැයි දිවි ගෙවීමේ සිව්‍රු පිරිසිඳුමක් දක්වති. බිරියක හා නො බැඳෙන තෙක් පැවැත්ම 'බ්‍රහ්මචාරී' වේ. ඒ හයින් 'විසි නව වසක් (එ බිසෝ ලදුන් සමගින්) ගිහි ගෙහි විසී, යනු සුදුසු වදනෙක් නො වේ.

බවගෙහි = බව අගෙහි.

## (ආ) මහ අබිනික්මන්

388. **සක කුල අඹර ලසඳ, එ යශෝදරා නම් ලද නො මඳ පින් සිරි පිරි, පවර, රාහුල කුමරු ලත් සඳ-**

ශාක්‍ය කුලය නැමැති අහ සේ නව හෙවත් අලුත් සඳ වූ එ යශෝධරා නම් ලද, නො මඳ පින් සිරි පිරි, උතුම් වූ රහල් කුමරු ලැබූ කල්හි-

යශෝධරාවෝ සැහැ (ශාක්‍ය) කුලයේ කෝලිය අත්තේ 'සුප්‍රබුද්ධ' රජු ගේ දියණියෝයි. කෝලිය දනෝ ද ශාක්‍යයෝ මැ යි එ හෙයින්.

සැහැ කුලය අහස වත් හොත් ඒ අහ සේ බබැළුම් සහිත වැ පෙනෙමින් පවත්නා අලුත් සඳ තමා යශෝධරාවෝ. අලුත් සඳ මහත් කැමැත්තෙන්, මහත් බැතියෙන් නරඹති දනෝ. පුත් සඳ එ සෙයින් බලන්නෝ නො වෙත්.

'නව සඳ වත් ලෙව් වැසි අදරින් වඳිත' යැයි සිරි රහල් හිමියන් වදාළේ ද එ හෙයිනි.

'මහිඳුහු දූ රජ
කුල අඹරේ වජඹතා
සිරි පත් සඳ කලා මෙන්
පෙබැයූ සිත් කුමුදු යූ' (කා: සි: iv. 47)

යැයි පබවතුන් සඳහතැ පඬු ඉඳුහු ද කියවත්.

'පුර දියවක් සඳ බලත්න එක් සිත් වැ එක දිසාව බලත්තවුන් මෙන්' යැයි උමංද පවතෝ ද සඳහන් වෙයි. ලෙව් වැසියන් නව සඳ බලත්නට දළ දෙළ ඇත්තවුන් බව:—

'මුහුල'ත් තඹුරු විත්
දනතගතන් වුවන් සඳ
සමහර දිසි පියුම් රු
මිණි මැදුරු සී මැදුරේ,

ඉති හව් දෙනෙ ගොස්
කිරිඳු අවරගැ රදතා
පබවත සඳ ලේනෙන්
කෙලෙ අත් තඹරත් මුහුලු (කා: සි: i. 17, vii. 50)

යන්නෙන් පෙනෙයි. නව සඳ දනන් ගෙන් වැඳුම් ලබන බව හා එ සඳේ සැටි ගත්තවුන් ද එ පමණෙකින් එ වැඳුම් විඳුනා බවත්.

සැහැ රජ කුලය අහස කොටැ ගෙනැ එහි බබළන අලුත් සඳේ සිරියෙන් දනන් ගේ නැමැඳුම් විඳුනා, පලමු මෙහි වැනුම් සහිත වැ සඳහන් කරනු ලැබූ ඒ 'යශෝධරා' නම් වූ ළඳ,

බොහෝ වූ පින් සිරි පිරී ඇති (එ හෙයින්, මැ) උතුම් වූ රාහුල කුමරු ලැබූ කල්හි–

කුලඹරා = කුල අඹරා.

'ලත් සඳැ' යනු එළි වැට නිසා 'ලත් සඳ' යැයි යෙදුණේ යි.

389. **සිවු පෙර නිමිති දැකැ, සිත රුති රජ සැපත හැරැ, මතු ලබන සක්විති සැපත් සිතින් නො තකා, නො නැවැති.**

පෙර නිමිති සතර දක්මින්, සිත රුති රජ සැපත හැරැ එන දවසේ ලැබෙන්නා වූ චක්‍රවර්ති සම්පත්තියත් සිතට ගත්තේ නැති වැ, නො රැඳී.

පෙර නිමිති නම් ගමන සපල වන නො වන බව අඟවමින් පෙරට හමුවන ලකුණුයි. ආදි මෙ දිවයින් වැසියෝ ද දඹදිව් වැසියෝ ද පෙර නිමිති තදින් ගණන් ගත් හ.

උයන් කෙළියට නික් මැ යන මහ බෝසතුන් පෙරට වරෙකැ 'ජර රුවක්' ද වරෙකැ 'වැදි' රුවක් ද තව වරෙකැ 'මළ' මිනිස් රුවක් ද අවසනට පැවිදි රුවක් ද හමු වූහයි යෙති. මිනිසුන් වයස ගෙවී දිරාපත් වන බව නො දැනැ සිටි සිදුහත් උතුමාණෝ ජර රුව දැක්මෙන් ඒ වන බව අසා දැනැ සසරට කලකිරුණෝ ල, මිනිසුන් ලෙඩ වන බව නො දැනැ සිටි එ තුමෝ දෙ වැනි වැ වැදි රුව දැකැ මිනිසුන් ලෙඩ වන බව ද අසා දැන්මෙන් සසරට තව ද කලකිරුණෝ ල, මිනිසුන් මැරෙන බව නො දැනැ සිටි එ තුමනට 'මළ' මිනියක් දැක්මෙන් එ ද අසා දන්නට ලැබී සසර මුළු මනින් එපා වී ල. එ සේ සසර එපා වූ එතුමනට පැවිදි රුව දක්නට ලැබුණෙන් ජර, වැදි, මරණ දුක් සහිත සසරින් මිදීමට මඟ ඒ යැයි අසා එ වෙස් ගෙනැ සසරින් මිදෙනු රිසි වී ල

අයෙක් යෙති ඒ සතර පූර්ව නිමිත්ත දෙවියන් විසින් මවා පෙන්වන ලද බවක්.

රජ සැපත සිතට රිසියෙන්නෙකි. සිදුහත් උතුමෝ රිසිය වඩනා එ රජ සැපත ලැබැ සිටිය හ. එ හෙත් පෙර නිමිති සතර දැක්මෙන් පසු එ තුමෝ රිසි වූ එ රජ සැපත හැරැ දමූ එ පමණෙක් නො වේ. එ තුමනට මතු සක්විති (චක්‍රවර්ති) රජ සැපත ද අත් වන බව සිරුරු ලකුණු

දැය්නවුන් විසින් කියන ලද්දේ වී. එ සෙයින් මතු අත් වන සක්විති සැපත ද සිතට නො ගත් හ. එ සේ ලද රජ සැපත ද අත් හැර, ලැබෙනට ඇති සක්විති සැපත ද සඳහන් නො කොට, රජ ගෙහි නො නැවැතී (අබිනික්මන් කල බව කියන්නට යි මේ සැදෙන්නේ)

සක්විති සැපතෝ සැටි පලමු කියන ලදී (342).

'නො නැවැතී' යනු විරිත නිසා 'නො නැවැති' යි වී.

390. **ඉසොරා මැඳුරනට දිගු කල පය එ මැ විටැ ඇදූ, සන් මැතිඳු පසු කොටැ කන්තක මගුල් අසු පිටැ නැගි-**

යශෝධරාවන් ගේ ගෙය ඇතුලට (පිවිසෙනු පිණිසැ) දික් කලා වූ පය එ වේලේ මැ (ආපසු) ඇදූ, මගුල් අසු ගේ පිටට නැගෙමින් ඡන්න ඇමැතියා පසු පසින් ඉඳුවාගෙනැ-

සසර කලකිරී තපසට යන්නට සැරැසුණු බෝසතාණන් මාළිගයෙන් නික්මෙන්නට පලමු එ මැ ද උපන් රාහුල කුමරු වඩා ගෙනැ සිපැ සතහා පියා යන අදහසින් පුතු ලඟැ හොවා ගෙනැ යශෝධරා දේවිය සැතැපෙන මැඳුර ඇතුලට (යන රිසින්) දික් කලා වූ පය (එහි නො වැදී එ වේලේ මැ) ආපසු ඇදූ කන්තක නම් මගුල් අසු පිටේ නැගෙමින් ඡන්න නම් ඇමැතියා තමා ගේ පසු පසින් හිඳුවා ගත් බවයි ඒ කීයේ.

පයැදූ=පය ඇදූ
මැතිඳු=මැති ඉඳු

'විටැ, කොටැ, පිටැ' යනු එළි නිසා 'විට, කොට, පිට' යැයි වී.

391. **නික්මෙනු දුකැ එ වර සුරන් පුර දොර හල සඳැ, පසු පෙර දෙ අත් වර සැට සැට දහස් පිරිවර සුරන්-**

(මහ බෝසතුන් නික්මෙන්නා දක්මින් දෙවියන් පුරෙහි දොර ඇරිය විටැ පිටු පස යැ, ඉදිරි පස යැ, දුලවර දෙ පසේ යැ (යන ඒ ඒ) දිගැ පිරිවර දෙවියන් හැට දහස හැට දහස බැගින්-

මහ බෝසතාණන් කන්තක මඟුල් අසු පිටේ නැගී ඡන්න ඇමතියා පිටු පසින් හිඳුවා ගෙනැ නික්මෙනවා දෙවියෝ දුට හ. එවිටැ එ දෙවියෝ පුරෙහි මහ වාසල් දොර විවර කළෝ. ඒ හා පිටු පසින් සැට දහසක් දෙවියෝ යැ, ඉදිරි පසින් සැට දහසක් දෙවියෝ යැ, දකුණත් පසින් සැට දහසක් දෙවියෝ යැ, වමත් පසින් සැට දහසක් දෙවියෝ යැයි එ නෙක් දෙන පිරිවර හැටියට සිටැ කළ දූයයි මේ කියන්නේ.

වරඇ, යනු එළි නිසා 'වර' යි යෙදිණි.

392. දිගු බිත පහන් කැරැ, මිණි දඬුවැට පහන් ගත සිත පහන් එ හිමි ද නො පහන් රැ තිස් යොදන ගෙවා-

(පිරිවර සුරන්) දිගු පියෙස් එළි කරමින් මිණි වැට පහන් දඬු වැට පහන් ගත් කල්හි සිත පැහැදුණා වූ ඒ හිමි තෙමේ ද එළි වන්නට පළමු රැයේ (මැ) තිස් යොදන ඉක්මවා-

බෝසතුන් පුර දොරින් නික්මෙත් මැ ඉදිරියෙන් සැට දහසක් දෙවියන් ද, පසු පසින් සැට දහසක් දෙවියන් ද, දකුණත් පසින් සැට දහසක් දෙවියන් ද වමත් පසින් සැට දහසක් දෙවියන් ද එ තුමන් වට කොටැ සිටිමින් මිණි වැට පහනුත් දඬු වැට පහනුත් ගත් බවත්, එ විටැ සිත පැහැදුණා වූ බෝසතුන් රැ එළිවන්නට පළමු තිස් යොදුන් මග ගෙවා ගිය බවත් ඒ සැකෙවින් කී සැටියි.

දිගු බිත නම් ඒ ඒ දිගැ පියෙස් යැ. දිගු අත හෙවත් දිශා කෙළවර අහසත් පොළොවත් එකට ගැවුණා සේ පෙනී ඒ ඉම බිතක් සෙයින් ඇසැ ඇදෙනුයෙන් 'දිගු බිත' යනු පැවැසේ.

වැවිය හැවියට එළිය පතුරුවන මැණිකක් ඇත්තේ මිණි වැට පහනි. වැවියට දඬු කඩක් ඇති බටහුළු ඈ දූය දඬු වැට පහන් යැ.

'පහන්' යන්න එළිය, ප්‍රදීප, පැහැදුණු, එළි වූ' යන සිවු අරුතැ මෙහි යෙදුණේයි.

(කපිලවාස්තු පුරත් අනෝමා නදියත් අතර දුර තිස් යොදනෙකි. ඒ මයිල දෙසිය පස් විස්සක් පමණ වේ.)

**393. තඹ සිළුන් මත රව සහ අරුණු රස් පතර වැ, පිවි රත තර වැ එත අනෝමා නම් ගඟින් එ තෙරැ වැ–**

කුකුළන් ගේ ප්‍රීති නාදය සමගින් පැතිරෙමින් අරුණාලෝකය ද, ඉරු නැඟින් රත් පැහැ වැද පැමිණෙත් මැ අනෝමා නම් වූ ගඟින් එ ගොඩැ වී.

මත රව නම් ප්‍රීති නාදය යි.

තඹ වන් සිළුවක් ඇත්තේනු යි කුකුළාට 'තඹ සිළු' යන නම වේ. උගේ සිළුව නම් කරමලයි.

එළිවෙන යාමයේ කුකුළෝ ප්‍රීතියෙන් හඬලති. ඔවුන් ගේ එ හැඩලීම් රැවුව එන්නා හා, අරුණු එළිය ද පැතිරෙමින් එයි. ඉර ද කෙමෙන් රත් පැහැය වැඩි වැඩි කොටැ ගන්මින් එයි. එ සිදු වන් මැ මහ සතුන් අනෝමා ගඟින් එ තෙරැ වූ බවයි ඒ කීයේ.

'පතර වීම' නම් පැතිරීම යි.

'පතර වැ, තර වැ, එ තෙරැ වැ' යනු පතර ව, තර ව, එතර ව' යැයි එළි නිසා පෙරැළිණි.

**394. දස පැරුමන් බුහුවි නො කිලිටි සිනෙනි පිරුණෙන් හල කෙලෙස් එවි දිගැවි කෙස් වැවි මඟුල් කඩුයෙන් කපා–**

දස වැදෑරුම් පාරමිතාව ගේ විසරුව හෙවත් බුහුටි බව කිලිටි නුවූ හෙවත් පිරිසුදු වූ සිතෙහි පිරුණු හෙයින් දුරු කරන ලද සිත කිලිටි කරන පව් වැනි, දික් වූ කෙස් වැටිය මගුල් කඩුයෙන් කපා.

දස පාරමිතාව ගේ බුහුටි බව පිරිසුදු වූ සිතේ පිරුණේ වෙයි. එ හෙයින් තව ද දූයකට එහි ඉඩ කඩ නැති එහි වූ කෙලෙස් හෙවත් රාග ආදි පව් වඩනා සිතිවිලි ඉන් බැහැරු කරනු ලැබේ. අත්ත ඒ බැහර කරනු ලැබූ කෙලෙස් බඳුයි. දික් වූ කෙස් වැටිය. එය මගුල් කඩුයෙන් කපා-

දස පැරුමන් පලමු සඳහන් විණි (334)

395. **ලොවට පිය කරණ වෑ, මහ බඹනු පමණ වෑ දුන් සිවුර ගෙනෑ සසර මහ අණව එතෙරැ වන ලෙසෑ මහණ වෑ.**

ලෝ වැසියා ගේ ප්‍රීතියට කාරණ වෙමින්, මහ බඹු අඩු වැඩි නැති වැ දුන්නා වූ සිවුර ගෙනෑ සසර මහ අණව එ තෙරැ වන ලෙසැ මහණ වැ.

සියලු ලෝ වැසියා ගේ සතුටට කාරණයක් වූයේයි මහ බෝ සතුන් ගේ මහණ වීම. එ තුමන් මහණ වන විට, සිවුරු දුන්නේ මහ බඹ තෙමේ යි. එ සිවුර එතුමන් හට හරි ගණනට සිටියේයි එ තුමන් මහණ වූයේ මහත් වූ සසර සයුරින් එ තෙරැ වන්නට යි.

සසර මහණව = සසර මහ අණව.

(කරණ)වැ, (පමණ) වැ, (මහණ) වැ යනු එළි වැට නිසා '(කරණ) ව, (පමණ) ව, (මහණ) ව' යැයි සිටී.

(සිදුහත් තුමාණන් මහණ වන ද අට පිරිකර පිරිනමන ලද්දේ මහ බඹු විසිනි).

396. **වෙන වෙන ලදින් ගත් තදින් පිළිවෙත අවුරුදු සයක් පබඳින් කෑරැ නිවන් මහවත සොයං නොං ලදින්-**

වෙත් වෙත් වූ ලබ්ධීන් ගෙන් ගත්තා ලද දුඛි ප්‍රති-පත්තිය හෙවත් දුෂ්කර ක්‍රියාව අවුරුදු සයක් නො කඩවා කොටැ නිවනට මහ මඟ සොයා (එ) නො ලත් හෙයින්-

සිදුහත් තුමාණෝ මහණ වූ ඉක්බිති ආළාර, උද්දක ආදීන් ගේ ද වෙතත් දසුන් ඇත්තවුන් ගේ ද පිළිවෙත් අත්හදා බැලීම් විසින් සිරුරට දුක් දීම් ඈ නො එක් දුඛි තව කම්හි යෙදී සය වසක් ගෙවූ හ. ඒ දුඛි පිළිවෙත් තමා මෙහි 'තදින් පිළිවෙත' යැයි සඳහන් වූයේ. දුෂ්කර ක්‍රියා හෙවත් 'පදන් වැර වැඩීම' යැයි කියන්නේ ද ඊට මැයි. එ අයුරින් ගැලැවීමේ මහ හමු නො වන බව එ තුමෝ පසු වැ දුට හ.

397. **මැදුම් පිළිවෙතැ සිටැ, සිරුරට මඳක් සැප දී සේනානි ගමට ගොසින් අජපාල නුග සෙවණට-**

සිරුර පින වන්නා වූ ('කාමසුඛල්ලිකානු යෝගය' යැයි නම්ලත්) පිළිපැදීමේ හෝ සිරුරට දුක් දෙන්නා වූ ('අත්ත-කිලමථානු යෝගය' යැයි නම් ලත්) පිළිපැදීමේ හෝ නො යෙදී එ දෙකට අතර ප්‍රතිපත්තියේ පිහිටා කයට මඳක් සැප දී සේනානී ගමට ගොසින් (එහි දී) අජපාල (නම් නුගයේ) සෙවණට-

398. **සුජාතා නම් සොඳ ළඳ, නො මඳ දිව බඳ ලූ මියුරු කිරි පිඩු ගන රන් තළියෙකින් ගෙනැ අවුත් දුන් සඳැ-**

සුජාතා නම් වූ, මනා වූ කාන්තාව, බොහෝ දිව ඕජා බහා ලන ලද, මිහිරි වූ කිරි බත් ගත රන් තළියෙකින් ගෙනැ අවුත් දුන් කල්හි-

ගෙනත් = ගෙනැ අවුත්.

'සඳැ' යනු එළි නිසා 'සඳ' යැයි යෙදිණ.

399. **කිරි පිඩු නො අඩු කොටැ එක් උනු පනසක් පිඩු කොටැ වළඳා තළිය සුබ නිමිති දක්නට උඩු ගඟට හැර-**

කිරි බත් අඩු තැති වැ සතලිස් තවයක් ගුලි කරමින් වළඳ, තලිය සුබ නිමිති දක්නා පිණිසැ උඩු ගං යවා-

එකුත් = එක් උනු (එකක් අඩු)

මහ බෝසතුනුත් සුබ නිමිති බලන බවෙක් මෙයින් පෙනී යයි.

'කොටැ' යනු 'කොට' යි වූයේ එළි නිසායි.

'කිරි පිඩු' යන තැනැ 'පිඩු' යනු බත ඇඟැවීමට ද, පිඩු කොටැ යන තැනැ 'පිඩු' යනු 'ගුලි' ඇඟැවීමට ද යෙදිණි.

400. **බමුණකු අතට දුන් කුස තණ අට මිට ඇරැගෙනැ, බෝ තුර ලගට ගොස් පැල දිග බලා වැඩැ සිටැ සලා-**

බමුණකු (තමන් වහන් සේ ගේ) අතට දුන්නා වූ කුස තණ අට මිට ඇරැගෙනැ, බෝ ගස වෙතට ගොසින් බට හිර පැත්ත බලා වැඩැ සිටිමින් (එ කුස තණ) ඉහිරවා-

මෙහි 'බමුණකු' යනු 'සොත්ථිය' නම් බමුණු සඳහනැ යෙදුණේයි.

කුස තණ නම් ආදි දඹදිවේ දනන් හිඳීම, නිදීම පිණිසැ බීම අතුරන මාන වෙසෙසෙකි.

401. **මිහි ඉරු රුවට නැඟි තුදුස් අත් විදුරු අසුන් පිටැ බෝ තුරට පිට ලා සිවු ඉමන් දැඩි කොටැ යෙහෙන් ඉඳැ-**

පොළෝ පළා ගෙනැ රුව ඇති වැ (පැනැ) නැංගා වූ දහ හතර රියන් විදුරු අස්න මත්තේ සතර අදිටන් දැඩියේ ඉටා සුව සේ (වැඩැ) ඉඳැ-

මිහිරු = මිහි ඉරු
තුදුසත් = තුදුස් අත්
විදුරසුන් = විදුරු අසුන්

විදුරු අස්න පිළිබඳ නත් අයුරු මත පල කෙරෙත් වියත්හු. අයෙක් කියති එය පොළොව පළා ගෙනැ පැනැ නැඟි දහ හතර රියන් උස් වූ දියමන්ති මැ යැ අස්නක් වෙතියි. මෙත් හිමියන් වදුරන්නේත් ඒ මැ බැව් පෙනේ.

යෝගාවචරයන් ගේ හිඳිනා අයුරු ද 'ආසන' යන නමින් සඳහන් වෙයි. යෝගීන් ඒ ඒ කටයුත්තට හිඳිනා හිඳුම් පද්මාසන, බද්ධාසන, වජ්‍රාසන, සිංහාසන ඈ නමින් හැඳින්වෙයි. එයින් වජ්‍රාසනය (නො බිඳෙන අස්න) සිද්ධාසනයේ එක් වෙසෙසෙකි. අදිටන ඉටු නො වන තුරු නො බිඳිනා හෙයින් එයට එ නම වෙතියි යෙති ධ්‍යාන වඩන්නවුන් ගේ වජ්‍රාසන දෙකෙක් වෙයි ජනක ඉන්ද්‍රියය යට භාගයේ වම් විලුඹ ද, එ ඉන්ද්‍රිය මත්තේ දකුණු විලුඹ ද පිහිටුවා හිඳිනා අසුන එක් වජ්‍රාසන යෙකි. අනෙක් වජ්‍රාසනය යැදුම්හි යෙදෙන මුස්ලිම දනන් හිඳිනා 'නිමාශ්' ආසනයට සම වෙයි.

'සිවු අදිටන ලේ මස්, වියැළී සම් නහර ඇට ශේෂ වුවත් නො නැගෙමි' යි ඉටාගැත්ම ද

'.....''ඇට සම් මස් නහර ලේ වියැළී සුනු විසුනු වේ නමුත්............බුදු නො වැ නැඟී නො සිටිම් යැ'' යි චතුරංග සමන්වාගත වීර්ය අධිෂ්ඨානය කොටැ.....' යැයි පූජාවලී කාරයෝ වදුරති.

'පිටැ, කොටැ' යනු 'පිට, කොට' යැයි එළි නිසා යෙදී ඇති.

402. එ මැ සේ රොසේ ආ දස බිම්බරක් මර සෙන් තුමුල් නල පත් පුලුන් රල සේ දස දෙසේ බිඳැ හැර-

එක් මැ බඳු රොසින් පැමිණි දස බිම් බරක් මර සෙන් මහත් වූ සුළඟට හසු වූ පුලුන් රල පරිද්දෙන් දස අතේ බිඳැ පලවා-

බිම් බරෙක් නම් පොළොවේ එක් පසෙකැ සිටැ ගත්තා මැ එ පස යට බැසැ අනෙක් පස නැඟෙන පමණයි.

**403. පෙර යමැ පෙර දවසැ නොයෙක් කප් කෙළ සුවහසැ කඳ පිළි වෙළ වෙසෙසැ පැවැති මොහො අඳුරු මුල් පිසැ දමා–**

පෙර යම්හි දී හෙවත් සඳැ යාමයේ දී අනෙක් කල්ප කෝටි ලක්ෂයක් කල්හි ජාති වෙසෙස් පිළිබඳ වැ පැවැති අවිද්‍යාව සහමුලින් දුරු කොටැ–

මෝහ අඳුරු හෙවත් අවිද්‍යාව නිසා පෙරැ විසූ ජාති වෙසෙස් දක්ම මිනිසාට බැරි වෙයි. අපේ බෝසත් තුමෝ නො එක් කල්ප කෝටි ලක්ෂ ගණන් කල් මෙ සසරේ සැරි සැරූ හ. එ හෙත් එ සෙයින් සැරි සැරූයේ කවර කවර කල්හි කවර කවර අත් බැවින් දැයි අවිද්‍යාව– නැත් නම් මෝහ අඳුර– නිසා එ තුමෝ නුදුටුව හ. මෙ හැන්දෑ යාමයේ එ තුමෝ ඒ අවිද්‍යාව සහමුලින් දුරු කළ හ. එ හෙයින් පෙර විසූ ජාති– කඳ පිළිවෙළ– දක්නා නුවණ එ තුමාට පහළ වූයේයි.

පෙර යම නම් හිර බැසැ ගිය දස පැයයි. මේ පැයෙක් රැයින් තිහෙන් කොටසෙකි. දස පැය රැයින් තුනෙන් කොටසෙකි. අප අද පැය යැයි කියන්නේ ආදි හෝරාව යැයි දන්නා ලද දෙ පැය සමාරකටයි. ඒ (හෝරා) පැය නම් රැයකට ඇත්තේ දොළොසෙකි. රැයින් තුනින් එකකට ඇත්තේ සතරෙකි. එ හෙයින් පෙර යම ඔරලෝසු මිනුමෙන් කියන විටැ සවසැ හයටත් දහයටත් අතරැ කාලයයි.

මොහඳුරු = මොහො අඳුරු

**404. මැඳි යමැ දිව ඇස ලැබැ දන රැස, සැව පිළිසඳෙහි දැකැ මතු වන දවසැ පැවැති මොහො අඳුරු ලස් නො වැ දමා–**

විසි පැය ගිය ඉක්බිති හෙවත් දෙ ගොඩ සරි යාම සේදී දිව්‍ය ඇස ලබා, ජන සමූහයා ගේ ච්‍යුති· ප්‍රතිසන්ධියෙහි පවත් දක්මින් අනාගත කාලය පිළිබඳ පැවැත්තා වූ අවිද්‍යාව නො පමා වැ දුරු කොටැ–

මැදියම තම් ඔරලෝසු පැයින් රෑ දහයේ සිටැ දෙක තෙක් කාලයයි.

දිවැස = දිව ඇස

මොහඳුරු (403)

405. **සූවිසි පස ආකාර නැණින් විමසා, සැක හැර වත්මන් කල් අතැර පැවැති මොහො අඳුරු පටල දුරු කැර-**

විසි හරක් වූ පච්ඡාන ප්‍රත්‍යය තැණින් විමසා, සැක හැර වත්මත් කල් අතැර වැසුණු මොහො අඳුරු පටල දුරු කැර-

විසි හතරක් වූ පච්ඡාන ප්‍රත්‍යය යැයි විදාගම හිමියන් වදරතත් පිළිසමුපාව (පටිච්චසමුප්පාදය) වට විවට විසින් මෙතෙහි කරන ලද බවයි බොහෝ ඇදුරන් පවසන්නේ.

| | | |
|---|---|---|
| (1) | හේතු | පච්චය |
| (2) | ආරම්මණ | ,, |
| (3) | අධිපති | ,, |
| (4) | අනන්තර | ,, |
| (5) | සමනන්තර | ,, |
| (6) | සහජාත | ,, |
| (7) | අඤ්ඤමඤ්ඤ | ,, |
| (8) | නිස්සය | ,, |
| (9) | උපනිස්සය | ,, |
| (10) | පුරේජාත | ,, |
| (11) | පච්ඡා ජාත | ,, |
| (12) | ආසේවන | ,, |
| (13) | කම්ම | ,, |
| (14) | විපාක | ,, |
| (15) | ආහාර | ,, |
| (16) | ඉන්ද්‍රිය | ,, |
| (17) | ඣාන | ,, |
| (18) | මග්ග | ,, |

(19) සම්පයුත්ත පච්චය
(20) විප්පයුත්ත ,,
(21) අත්ථි ,,
(22) නත්ථි ,,
(23) විගත ,,
(24) අවිගත ,,
යනුයි සූවිසි පට්ඨාන ප්‍රත්‍ය නම්

පිළිසමුපාවට ඇත්තේ
(1) අවිජ්ජා
(2) සංඛාර
(3) විඤ්ඤාණ
(4) නාමරූප
(5) සළායතන
(6) ඵස්ස
(7) වේදනා
(8) තණ්හා
(9) උපාදන
(10) භව .
(11) ජාති
(12) ජරා මරණ
යන දෙළොස් ප්‍රත්‍යය වේ.

'පසාකාර' යනු විරිත නිසා පසාකර වූ සේයි
(පස් ආකාර)

406. **පෙර බුදුවරන් ඇම දුටු ලෙස, නො හැර මැ දකින නුවණින් අලු යමැ සවනේ නෙවා ,අසම සම බුදු වැ-**

පෙර (වූ) බුදු උතුමන් සියල්ල දැකැ වදළ හැටි අත් නැර මැ දක්නා නුවණින් අලුයමහි දී සියලු දත යුතු දේ (දූනැ) අවසන් කොටැ අසම සම වූ බුදු බවට පැමිණැ-

අසමයනට (බුදුවරන් හට) සම වූයේ අසම සමයි.

අලු යම නම් උදයේ දෙකෝ සිටැ හය තෙක් කාලයයි.

**407. කිරි පිඩු එ කුන් පනසින් වැලැඳූ අම රසින් වෙසෙසින් සත් සතියක් මැ වෙන අහර අදහසින් නොකොස් -**

කිරි බත් පිඩු සතලිස් තවයෙන් වැලැඳුවා වූ අමා රස නිසා විශේෂයෙන් සතලිස් තව දවසක් මැ වෙන ආහාරයක් ලබන කැමැත්තේ යාම නො කොටැ-

කිරි පිඩු දෙවියන් විසින් බහන ලද දිව ඔද සහිත වූයෙන් එහි අමා රස වී.

අහරදහසින් = අහර අදහසින්

**408. 'දෙසූ මේ සදමින් සතුන් අදමින් මුදමි' සි සවන් රස් විදමින්, බඹ යැදමින් බරණැසට ගොසින්-**

'දෙසා වදළා වූ මේ මතා දහමින් (හෙවත් මේ සද්ධර්මය දෙසීමෙන්) සතුන් අදහමින් වෙන් කරමි' සිතා සවනක් රස් පතුරුව පතුරුවා බඹු ගේ ඇයැදීම පරිදි බරණැසට ගමන් කොටැ-

බුදු වූ උතුමෝ තමන් පිළිවිදි දහම ගැඹුරු සේ දැකැ, මිනිසුනට ඒ නො වැටැහෙනුයෙන් වැඩ නැතියි නො දෙසා වදරන්නට සිතූ හ. එ දත් බඹ තෙමේ:-

'දේසේථ මුනින්දෙ ධම්මං, දේසේථ භගවා ධම්මං' යැයි වැටැහෙන්නවුනට වැඩ සඳහා දහම් දෙසනට ආරාදනා කෙළේයි. එ ආරාදනාව ඉවැසූ බුදු රජ තෙමේ ආළාර, උද්දක යන පෙරැ ගුරු කම් දුන් බමුණනට දහම් දෙසන්නට සිතා, යළි ඔවුන් මෙ ලොවැ නැති බව දැනැ, පෙරැ උවටන් කරමින් සිටි පස් වග මහණුන් සඳහන් කොටැ ඔවුන් එ වකට බරණැසැ ඉසිපතනයේ මිගදයේ වසන සේ දැකැ ඔවුනට දහම දෙසනු සඳහා එහි වැඩියේයි. එ හෙයිනි:-

'ගොසින් බරණැසට බඹ යැදමින්'

යැයි කීයේ.

'යැදමෙන්' යනු 'යැදමින්' යැයි සිටියේ එළි වැට නිසායි.

**409. බඹ ඝොස විඛිඳු, සසසා සිවු සස් දෙසා, නො ලසා බඹුන් අටලොස් කෙලක් නිවන් පුරැ සලසා.**

බ්‍රහ්ම ඝෝෂාව පතුරුවමින්, සතර සත්‍යය පිළිබඳ දහම මනා සේ දෙසා වදරා විග සේ බ්‍රහ්මයන් දහ අට කෝටියකට නිවන් පුර පැමිණීම සලස්වා දෙමින්-

බුදුන් බණ දෙසන විටැ සිනිඳු වූ වැසි හඬ වන් අට අඟෙකින් යුත් 'බ්‍රහ්ම ඝෝෂා'ව පතුරුවා එ කරන බවයි එ පැවැසූයේ. බඹ ගොස දෙ තිස් මහ පුරිස් ලකුණින් එ කෙකි.

'සෙස්සෝ ජින්න ස්වර වෙත් මැ යැ, භින්න ස්වර වෙත් මැ යැ, කාක ස්වර වෙත් මැ යැ, බුදුහු වූ කලී මහා බ්‍රහ්මයා ගේ ස්වර සදෘශ ස්වරයෙන් සමන්වාගතය හැ. බ්‍රහ්මයා ගේ ස්වර පිත්ත ශ්ලේෂ්මාදීන් අපරිරුද්ධ වන බැවින් විශුද්ධ වෙයි.'

යනු ගුරුළුදැමි ඇදුරිඳුහු කියත් (ධර්:)

(1) විස්සට්ඨ
(2) මඤ්ජු
(3) විඤ්ඤෙය්‍ය
(4) සවණීය
(5) අවිසාරී
(6) බින්දු
(7) ගම්භීර
(8) නින්නාද

යන අට අඟින් යුතු වෙයි ලු බඹ ගොස.

සිවු සස් නම් දුක යැ, දුක් ඉපැදැවීමට හේතු යැ, දුක් නැසීම යැ, දුක් නැති කිරීමේ මඟ යැයි යන සතර ඇත්ත සිවු සස් නමි.

'දුක් සමුදය නිරොද
මඟ සමගින් මෙ කී පද
සැබෑ කරුණෙන් සොඳ
එ සිවු සස් නම් දනුව නිවරද'

යැයි වදුරති සිරි රහල් හිමියෝ.

කුත්සිත වන බැවින්, තුච්ඡ වන බැවින් දුඃඛ නම් වෙයි,

දුඃඛයා ගේ උත්පත්තියට කාරණ වන බැවින් සමුදය වෙයි.

සංචාරක සංඛ්‍යාත වූ දුඃඛරෝධයා ගේ අභාවය නිරෝධ වෙයි.

දුඃඛ නිරෝදයට පමුණුවන ප්‍රතිපත්ති ආලම්බන විසින් තදභිමුඛීභූත වන බැවින් මාර්ග වේ.

සංවේගය ජනවනු සඳහා දුඃඛ සත්‍යය ද, හේතු දක්වනු සඳහා සමුදය සත්‍යය ද, ආශ්වාස ජනවනු සඳහා නිරෝධ සත්‍යය ද, නිරෝධාධිගමය සඳහා නිරෝධසම්ප්‍රාප්ත මාර්ග සත්‍යය ද දෙසන ලදී.

දුඃඛ සත්‍යය බරෙකි, සමුදය සත්‍යය බර ගැනීමෙකි. නිරෝධ සත්‍යය බර හෙළීමෙකි. මාර්ග සත්‍යය බර හෙළන උපායයි.

ජාතිපි දුක්ඛා, ජරාපි දුක්ඛා, ව්‍යාධිපි දුක්ඛෝ, මරණංපි දුක්ඛං, සෝකපරිදේව දුක්ඛදෝමනස්සුපායාසාපි දුක්ඛා, අප්පියේහි සම්පයෝගෝ දුක්ඛෝ, පියේහි විප්පයෝගෝ දුක්ඛෝ, යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං, සංඛිත්තේන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා' යි දුක විසින් දෙලොස් දහමෙක් දැක්වෙයි.

'කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා' යි තුන් අයුරු තණ්හාව සමුදය විසින් දැක්වේ.

'යෝ තස්සායේව තණ්හාය අසේසවිරාගනිරෝධො චාගෝ පටිනිස්සග්ගෝ මුත්ති අනාලයෝ' යි නිරෝධයෙහි එක් මැ නිවන දක්වේ.

'අයමේව අරියෝ අට්ඨංගිකෝ මග්ගෝ. සෙය්‍යථීදං,

සම්මා දිට්ඨි
,, සංකප්පෝ
,, වාචා
,, කම්මන්තෝ
,, ආජීවෝ
,, වායාමෝ
,, සති
,, සමාධි' යි මාර්ගයෙහි අට දහමෙක් දක්වෙයි.

අටලොස් කෙලෙස් නම් කෝටි දහ අටෙකි.
'ගොස' යනු විරිත නිසා 'ගොසා' යි වී.

410. **'සත සතන් තුටු කැරැ ඇම තැනැ දහම් දෙසවයි' සිතැ කෙලෙසුන් මුත් රහතන් සැටක් මුළු ලොවැ යවා-**

සතුන් ගේ සන්තාන හෙවත් සිතිවිලි පහළ වන තැන් සතුටු වන පරිද්දෙන් සියලු තැනැ (ගොස්) දහම් දෙසව් යැ යි සිතේ කෙලෙස් මිදුණු රහත් වූවන් සැටක් සියල් ලොවැ හෙවත් ලොවේ සියලු තන්හි යවමින්-

ඒ කීයේ:-

'පරත්ථංචත්තනෝ අත්ථං
කරොන්තා පඨ්විං ඉමං
බ්‍යාහරන්තා මනුස්සානං
ධම්මං චරථ භික්ඛවෝ' යි

ලෝ වැඩ පිණිසැ රහත් පැවිදි උතුමන් පිටත් කොටැ හළ පවතයි.

රහත්හු නම්:-

(1) සක්කාය දිට්ඨි
(2) විචිකිච්ඡා
(3) සීලබ්බත පරාමාස
(4) කාමරාග
(5) පටිඝ
(6) රූප රාග
(7) අරූප රාග
(8) මාන
(9) උද්ධච්ච
(10) අවිජ්ජා

යන දස සංයෝජන මුල් සිඳැ පුදට නිසි වූ උතුමෝයි.

'ආරාද් හතත්වාදර්හන්' අරීණාං හතත්වාදර්හන්, අරාණස්ච හතත්වාදර්හන්, ප්‍රත්‍යාදිනාමර්හත්දර්හන් පාපකරණේ රහෝභවාදර්හන්'

යැයි 'අර්හත් බව' විවරණය කෙරෙති අයෙක්.

පස් වග මහණ උතුමෝ යැ

යස (කුලපුත්) තුමෝ යැ

ඔවුන් වහන්සේ ගේ පස් පනස් යහළුවෝ යැ යන සැට දෙනායි, මෙහි 'සැටක් රහතන්' යනුයෙන් සඳහන් වූ උතුමෝ.

'යස' නම් සුජාතාවන් ගේ පුත් කුමරු යි.

'මුත්' යනු විරිතන් එළිත් නිසා 'මුතන්' යැයි වී.

411. **පෙර බුදු බල නො දනැ තවුසන් අනදර කරන වරින් වරැ තුන් දහස් පන්සියයක් පෙළහර දක්වා-**

'පළමු, බුදුවරුන් ගේ බල නො දත්ම නිසා තපස්විවරයන් අනාදර (අදර නැති බව අඟවන කිරියා) කරන කල්හි, විටින් විටැ ප්‍රතිහාර්ය තුන් දහස් පන් සියයක් පෙන්වා-

මෙහි තවුසන් හැටියට සඳහන් වූවෝ නම් **උරුවෙල, නදී, ගයා** යන කාශ්‍යපයෝ තිදෙන යැ. උන් තුමූ ජටිල ගණයේ තවුසෝ යැ. බුදුනට අනාදර දක්වූයේ උන් තිදෙනා ගෙන් උරුවේල කාශ්‍යප තෙමේයි. උහු නිසා තුන් දහස් පන් සියයක් පෙලහර පෑ බව මෙහි සඳහන් වෙතත් පූජාවලියේ දක්වෙන්නේ තුන් දහස් පන්සිය සොළොසෙකි.

| | | | |
|---|---|---|---|
| දර | නො පැළී යෑ | දීමෙන් | පන් සියයෙකැ |
| ,, | පැළී යෑ | ,, | ,, |
| ගිනි | දල්වෙනු | නො දීමෙන් | ,, |
| ,, | ,, | දීමෙන් | ,, |
| ,, | නිවෙනු | නො දීමෙන් | ,, |
| ,, | ,, | දීමෙන් | ,, |
| ,, | කබල් | මැවීමෙන් | ,, |

යන තුන් දහසත්,

පළමු වන තය් දමුමෙන්, දෙවන තය් දමුමෙන්, වරමුත් ගෙන්, සක් සුරිඳු ගෙන්, බඹුන් ගෙන්, පර සිත් දත්මෙන්, පොකුණෙන්, අතළ ගලින්, අත්තෙන්, අඹයෙන්, දඹයෙන්, තෙල්ලියෙන්, අරළුයෙන්, මදුරා මලින් දිය වතුරිනැ යි සොළොසත් එහි දක්වේ.

'මෙ සේ බුදුහු.........තුන් දහස් පන්සිය සොළොස් ප්‍රාතිහාර්යයක් දක්වා ජටිල සහස්‍රයන් විනය කොට........'යි ගුරුළු දමි ඇදුරෝ ද කියති (බර්:)

'වරු' යනු එළි නිසා 'වර' වූයේ යි.

412. **එදා පිරිවර සමුදා සමගෑ තුන් තවුසන් බව බැඳුමෙන් මුදා නො මද මග පල රසෙහි යොදා-**

එ දවසේ පිරිවර සමූහයා සහිත තවසුන් තිදෙන සසර බැඳුමෙන් මුදමින්, මඳ නො වන්නා වූ මාර්ග ඵල රසයේ ගල්වා-

**එ පෙලහර පෑ දවස්හි පිරිවර සහිත උරුවේල කාශ්‍යප, නදී කාශ්‍යප, ගයා කාශ්‍යප යන තවුසන් තිදෙන සසරින් මුදවා සතර මඟැ සතර පෙලෙහි පිහිටුවා ලූ බවයි එ කියේ.**

උරුවේල කාශ්‍යපයා ගේ පන් සියයෙකි, නදී කාශ්‍යපයා ගේ තුන් සියයකි, ගයා කාශ්‍යපයා ගේ දෙසිය යෙකියි. මුළු මහත් පිරිවර හමුදැව දහසෙකින් යුත් වී. මෙ තවුසන් සොවාන් වූ බව පැවැසේ.

'නො මඳ මඟ පල රසෙහි' යනු හැඩ ඇති පැවැසුමෙක් නො වේ.

'නො මඳ' යනු එළි නිසා 'නො මඳ'සි සිටියේයි.

413. **එ සඟ පිරිවර කොටැ, බඹ සුර නරන් තුටු කොටැ බට සක් රුවන සේ එයින් රජ ගහා නුවරට වඩැ–**

**එ පැවිද්දන් පිරිවරා ගෙනැ, බඹුන් දෙවියන්, මිනිසුන් සතුටට පත් කෙරෙමින්, බැස්සා වූ චක්‍ර රත්නය පරිද්දෙන් එ තැනින් රජ ගහා නුවරට වැඩැ වදරා–**

සෝවාන් මඟැ පෙලෙ සිටියවුන් සසර බැඳුමෙන් මිදුණවුන් ගෙණෙහි ලා සැලැකියැ හැකි යැ. එ මඟ පෙලෙහි පිහිටි, පැවිදි නුවූවෝ ද වෙත්. එ හෙයින් 'බව බැඳුමෙන් මුදා, මඟ පල රසෙහි යොදා' සි කී පමණින් ඔවුන් පැවිදි වූ බව පළ නො වෙයි. එ සේ කලැ ඔවුන් සඳහා:–

'එ සඟ' යැයි කීම සියලු අතින් සුදුසු වන සේ නො පෙනෙයි. එ සියලු දෙන රහතන් වූ බව පැවැසිණි නම් සියල්ල පිරිමැසේ.

'එයින්' යැයි කීයේ 'උරුවෙල් දනවුයෙන්' යනු ඇඟැවීමටයි. මෙහි එ ද මුලින් සඳහන් නො වී.

(සක් රුවන පළමු අඳුනවා ඇති. (342)

**414 එ දිනේ මුනි සඳ දහසක් සහුන් රැනෙතැ සඳ මෙන් විසල් තල් උයනේ වැඩැ ඉඳිති යනු අසා.**

එ ද මුනි උතුමා පැවිදි උතුමන් දහසක් ඇරැ ගෙනැ (වැඩැ) සඳ මෙන් මහත් වූ යෂ්ටි වන නම් තල් උයනේ වැඩැ ඉඳිතියි අසමින්–

**415. බිම්සර නරවරා ඇතුළු මහ නුවර පිරි මහ සෙන් පිරිවරා අවුත් මුනි සරණ තඹර වැඳැ–**

බිම්බිසාර රජ තෙමේ මහත් වූ ඇතුළු මහ නුවරෙහි පිරී සිටි මහ සෙන් පිරිවර කොටැ ගෙනැ අවුදින් බුදුන් ගේ පා පියුම වැඳැ–

‘නුවරැ’ යනු ‘නුවරා’ යි ද, ‘තඹර’ යනු ‘තඹරා’ යිද එළි නිසා යෙදුණු සේ මත හර නො වේ.

**416. තමන් වෙතැ උන් සඳැ සදහම් දෙසා උන් සිතැ කෙලෙසුන් ඉවතැ හැරැ ලොවට නිවන් මහවත දක්වා–**

(ඒ පිරිස සහිත බිම්සර රජු) තමන් වහන්සේ සමීපයේ උන් කල්හි සද්ධර්මය දෙසීමෙන් ඔවුන් ගේ සිතේ වූ කෙලෙස් දුරු කොටැ, ලෝ වැසියාට නිවන් වදිනා මග දක්නට සලස්වා–

වෙතැ, සිතැ, ඉවතැ යනු එළි නිසා වෙත, සිත, ඉවත යැයි වී.

**417. නරනිඳු සඳ තොසේ එ මැ සේ මහ සෙනඟ ගෙනැ, එ නුවර අබියෙසේ නිවන් පුර නම් මෙ යැ යි යන සේ–**

රජ තුමා සතොසින් (යුත් වැ) එ සා මහත් වූ සෙනඟ ඇරැ ගෙනැ ඒ නුවර ඉදිරියේ – නිවන් පුරය නම් මේ යැ කියා පළ කරන්නා සෙයින්–

නරනිඳු = නරන් ඉඳු

'ඒ සා' යන අරුතෙහි 'එ මැ සේ' යන්න මීට පළමුත් යෙදිණි (402)

418. **සල් පළොල් මල් වතු, ඇල් සිලිල් පුල් විල් පොකුණු, පත් හල් දම් හල් ද පල හෙළ පවුරු, විසල් වාසල්–**

සල් පළොල් ගසින් යුත් මල් වතු, ඇල් දිය ඇති (මල්) පිපුණු පොකුණු, විල්, මහත් වූ සුදු පැහැ පවුරු, මහ දොර (ඇති)-

සිලිලැල් = සිලිල් ඇල් (ඇල් සිලිල්).
විල් නම් ඉබේ වූ දිය කඩ යැ
පොකුණු නම් කණිනා ලද දිය වළ යැ.
පත් හල් = පත් සල්
මාන බට ඇ පත් සෙවූ හල් පත් හල් වේ

419. **ඉඟිල් කිකිණි දැල්, මුතු දැල් ලඹ, සුවිසල් මතු මහල්, බඹ විමන් එව් තුමුල්, පැහැ පහ පෙළින් මන කල්–**

ලිහිල් (හෙවත් බුරුල්) මිණි ගෙඩි යොදා කළ දැල්, මුතු අමුණා කළ ලැල් එලෙන්නා වූ, ඉතා මහත් උඩු මහල් තල සහිත, බඹුන් ගේ විමාන පරිද්දෙන් පෙනෙන මහත් වූ, පැහැ පත් වූ මැඳුරු පෙළින් සිත් ඇදූ ගන්නා-

විමනෙව් = විමන් එව්,

420. **සතාර නුබ මෙන් දිවා රැයැ මිණි දිලිහෙන, අමතාරය් අයුරු වෙළු වන නම් විහාරය කැරැ–**

තරු සහිත අහස සේ දවාලේත් රැයේත් මැණික් දිලිසෙන්නා වූ, කිරි මුහුද වැනි වේළුවන නම් විහාරය කොටැ–

තරු (තාර) සහිත වූයේ 'සතාර' සතාරය යනු විරිත නිසා හෙළු 'ය' සහිත බැවින් වී. ඒ හොඳ යෙදුමෙක් නො වේ.

'දිවා රැයැ' යනු එළි නිසා 'දිවාරය' වී. මීට පළමු ද මේ යෙදිණි (5)

අමත ආරය යනු 'අමතාරය' යැයි බැඳිණි.

අමත (අමෘත) නම් 'අමා' වයි. ආරය නම් ආකරයයි. අමා ආකරය නම් කිරි මුහුදයි.

සතාර යන්න සේ මැ 'අමතාර' යන්න ද හැඩ ඇති සිංහල වදනෙක් නො වේ.

421. **නිරිඳු සඳ දුන් සඳැ මන නඳ මුනිඳු දිය පොළොව පිරිසිඳැ මහ පොළො එක බඳ ගුගුරුවා-**

රජ තුමා පිළිගැන් වූ කල්හි සිත් තුටු කරවන්නා වූ බුදු රජු දිය පොළොව හිම් කොටැ මුළු මහත් පොළොව එක සේ ගුගුරුවා-

පළමු 'තර නිඳු සඳ' (417) යැයි යොදන ලද හෙයින් මෙහි 'නිරිඳු සඳ' යනු අමතර සේ පෙනේ.

නිරිඳු = තර ඉඳු
මුනිඳු = මුනි ඉඳු

422. **දහම් වැසි වස්වා තුන් දෙස් ගිමන් නස්වා සත සිත සතොස්වා පින් කෙතෙහි කුසල් බිජු ඉස්වා-**

වැසි වසින්නා සේ දහම් දෙසීමෙන් (ඒ වැස්සට) ගිමන නිවෙන සේ තුන් දෙස වනසවා, සතුන් ගේ සිත සතුටු කරවා කෙතෙහි බිජුවට ඉසිනා සේ සඟන කෙරේ දන් දීමාදියෙන් පින් වගාවට කරුණු සලස්වා-

තුන් දෙස නම් රාග, ද්වේෂ, මෝහ යන දෙස් තුන යි.

පින් කෙත නම් 'අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං' යන්නෙන් ගුණ කියන ලද 'සාවක සඞ්ඝයා' යි.

බුදුන් ගේ දහම් දෙසීම් වැසි වැස්සීම බඳුයි. දහම් ඇසීමෙන් සතන් ගේ සතන්හි රාග, ද්වේෂ, මෝහ යන දෙස් දුරුවීම වැසි වට කල්හි ගිම් නැසී යාම බඳුයි. පැහැදුණු දනා කුසල් වගාවට දන් දීම බිජුවට ඉසීමක් බඳුයි. දන් ලබන සඟන කෙතක් බඳුයි.

'වස්වා, තස්වා, සතොස්වා, ඉස්වා යි එක් මැ පියදූ අරුතින් සිවු පියෙකැ එළි වැට බැඳීම පැසැසියැ හැකි තො වේ.

423. **දහම් සක පුම්බා, පද සුර බඹුන් සුම්බා, ගුණ බිම්බ ඇරැ පෑ, දෙ සැට මිස දුටු සිඳු කලම්බා-**

දහම නැමැ හක් ගෙඩිය පුඹුවා, (තමන් ගේ) පා දෙවියන් බඹුන් ලා සුඹුවා, ගුණ පිළිබිඹුව ඇරැ දක්වා, සැට දෙකක් මිස දිටු නැමැති මූද කලඹවා-

දහම හක් ගෙඩියක් බඳුයි. එය (දහම) දෙසීම සක පුඹුවා ලීම බඳුයි. මිස දිටු රුස මූද බඳුයි. ඒ මිස දිටු හෙල්ලුම් පැම මූද කැලැඹීම බඳුයි.

දෙ සැට මිස දිටු යැයි කීයේ පෙරැ දඹ දිවේ දතන් තො එක් දසුන් අනුවැ ඇදැහූ දහම් නය සැට දෙකක් සඳහා යි.

ඒ වාද

ශාශ්වත
උච්ඡේද

යැයි දෙ ගණයෙක් වී,

ශාශ්වත වාදః-

ඒකච්ච ශාශ්වත
ඒ කච්ච ,,
අන්තානන්තික
අමරාවික්ෂේප
අධිච්චසමුප්පන්න
සඤ්ඤී වාද
අසඤ්ඤීවාද
නේවසඤ්ඤී නාසඤ්ඤී වාද
දිට්ඨධම්මනිබ්බාණ වාද

යැයි නව ගණයෙක් වේ.

(1) සියල්ල සදාකාලිකයැ යි ගැන්ම කේවල **ශාශ්වතයි**

(2) ලොව අන්ත යැ, අනන්ත යැ, අනන්තානන්ත යැ, අන්ත වූයේ යැ, නුවූයේ යැයි ගන්නෝ **ඒකච්ච සස්සත** වාද ඇත්තෝ යැ.

(3) ආත්මය අනන්ත යැයි ගන්නෝ අනන්තානන්තක-යෝයි.

(4) ආද මසුන් (අමරාවන්) මෙන් එ කෙකැ නො සිටිනා වාද ඇතියෝ **අමරාවික්ෂේප** **ගණ**යෙහි වෙත්.

(5) සියල්ල හේතු රහිත උත්පත්ති ඇතියි ගැන්ම **අධිච්චසමුප්පන්න** යි.

(6) සංඥව ඇති සේ සැලැකීම **සඤ්ඤී වාදය** යි.

(7) සංඥව නැති සේ සැලැකීම **අසඤ්ඤී වාදය** යි.

(8) සංඥව නො වන්නේයි උණු දියේ **උණ** සෙයින් ගැන්ම **නේවසඤ්ඤ නාසඤ්ඤ** යි.

(9) මෙ මැ අත් බව උතුම් නිවනැයි ගැන්ම **දිට්ඨධම්ම නිබ්බාණ වාදය** යි.

මරණින් සියල්ල ඉවර යැයි ගැන්ම **උච්ඡේද** යි.

| | |
|---|---|
| සස්සත වාද | 4 |
| ඒකච්ච සස්සත වාද | 4 |
| අනන්තානන්ත වාද | 4 |
| අමරාවික්ඛේප වාද | 4 |
| අධිච්ච සමුප්පන්න වාද | 2 |
| සඤ්ඤී වාද | 16 |
| අසඤ්ඤී වාද | 8 |
| නේවසඤ්ඤී නාසඤ්ඤී වාද | 8 |
| දිට්ඨධම්ම නිබ්බාණ වාද | 5 |

යැයි සස්සත වාද පස් පනසෙකි.

උච්ඡේද වාද සතෙකි. සියල්ල හැට දෙකයි.

මෙහි ශාශ්වතවාදගත චාතුර්විධ්‍යවිභාගචින්තායෙහි ධ්‍යාන සමාපත්තියෙහි වශිතාතිශය සමාසාදිත පූර්වනිවාසානුස්මෘතිඥානයෙන් ඒක කල්පාවධික පූර්වෝෂිත ජන්ම පරම්පරාස්මරණ ප්‍රවණ වූ චිත්තචෛත්තගත ක්ෂණභඩ්ගාදර්ශනයෙන් ආත්ම නිත්‍ය යැයි දෘෂ්ට්‍යභිනිවිෂ්ට එකෙකැ පූර්වෝක්තප්‍රකාරයෙන් දශමහාකල්පස්මරණෝද්භූත මිථ්‍යාවිකල්පග්‍රාහි එකෙකැ චත්වාරිංශත් සඞ්ඛ්‍ය මහා කල්පස්මරණ වශයෙන් සමුපජාත මිථ්‍යාග්‍රාහග්‍රස්ත එකෙකැ. ශුෂ්කතාර්කික දෘෂ්ටිගතික එකෙකැයි මෙ සේ කේවලශාශ්වතිකයෝ චතුර්විධ වෙත්.

ඒකත්‍යශාශ්වතික භේදචින්තායෙහි විවර්තකල්පයෙහි උපරිතන බ්‍රහ්මලෝකයෙන් ප්‍රච්‍යුත වැ අධස්තාත් ශූන්‍ය බ්‍රහ්මවිමානයෙහි ප්‍රාදුර්භූත වැ දීර්ඝ කාලයෙහි ඒකාකීවාසයෙන් සඤ්ජනෝත්ත වැ ආත්මද්විතීයසත්ත්වෝත්පත්‍යභිලාෂ සමනන්තර කාකතාලීයන්‍යායයෙන් සමවතීර්ණ අපරසත්ත්වයා කෙරෙහි ආත්මනිර්මිතත්ව පරිකල්ප වශයෙන් "අහං නිත්‍යෝස්මි, අපරෝයමනිත්‍යඃ" යි ඒකත්‍යශාශ්වතග්‍රාහග්‍රස්ත ප්‍රථම යැ, ක්‍රීඩාප්‍රදූෂක දේවනිකායයෙන් ප්‍රච්‍යුත වැ මනුෂ්‍යභාවප්‍රාප්ත වැ පූර්වජන්මානුස්මරණයෙන් ස්වයමනිත්‍ය භාව විභාවනා කොටැ අවශිෂ්ට දීර්ඝායුෂ්ක දිව්‍යයන් නිත්‍ය කොටැ දැකැ පුනරේකත්වශාශ්වතික දෘෂ්ට්‍යභිනිවිෂ්ට ද්විතීය යැ, මනඃප්‍රදූෂක දේවනිකායයෙන් ප්‍රච්‍යුත වැ පූර්වෝක්ත ක්‍රමයෙන් දෘෂ්ටිගතික තෘතීය යැ, පූර්වජන්මස්මරණාදි රහිත වැ ස්වපරිකල්පමාත්‍රශරණ වැ චක්ෂුශ්ශ්‍රෝත්‍රාදිරූප වූ ආත්ම අනිත්‍ය යැ, තදන්‍ය. ආත්ම නිත්‍ය යැයි විපර්යස්තමතික ශුෂ්කතාර්කික චතුර්ථ යැයි මෙ සේ ඒකත්‍යශාශ්වතික දෘෂ්ටි චතුර්විධ වේ.

අන්තානන්තික විභාගයෙහි සකලචක්‍රවාලවලයාවධි සංවර්ධිත කෘත්ස්නමණ්ඩලයෙහි ප්‍රතිලබ්ධධ්‍යාන වැ තත්‍රාර්පිත චිත්තචෛත්තයන් මැ ආත්මත්වයෙන් පරිකල්ප්‍ය ආත්ම අනන්තානන්තෝභයාංශපරාමර්ශ රූපයෙන් මිථ්‍යාභිනිවේශපරවශ එකෙකැ. අවර්ධිත කෘත්ස්නමණ්ඩලයෙහි ප්‍රතිලබ්ධසමාධි වශයෙන් ආත්මගත අන්තවත්තා

ප්‍රකල්පනයෙන් කුමාර්ගාවතීර්ණ එකෙකැ. කේවල පරිකල්පමාත්‍රයෙන් අන්තානන්තෝභයාංශ රහිත ආත්ම දෘෂ්ටි පූර්වක ශාශ්වතත්වග්‍රාහී එකෙකැයි මෙ සේ අනන්තානන්තිකශාශ්වතික දෘෂ්ටි ද චතුර්විධ වේ.

අමරාවික්ෂේපකශාශ්වතික ප්‍රභේද චින්තායෙහි ස්වදර්ශන ප්‍රතිෂ්ඨාවිරහයෙන් ප්‍රශ්නව්‍යාකරණයෙහි අසමර්ථ වැ මෘෂාවාදභීතීන් පාදප්‍රසාරණා කොටැ අසත්පථප්‍රස්කන්න එකෙකැ, ඡන්දද්වෘපාදනනිමිත්ත අන්තරාය භීතීන් වාග්වික්ෂේපාපන්න ද්විතීය යැ, පණ්ඩිතජන පර්යනුයෝග භීතීන් අමරාවික්ෂේප පක්ෂනිඃක්ෂිප්ත තෘතීය යැ, මන්දමතිකත්වයෙන් ප්‍රශ්නව්‍යාකරණාක්ෂම නො වැ කුමාර්ගාවතීර්ණ චතුර්ථ යැයි මෙ සේ අමරාවික්ෂේපික ලක්ෂණ දෘෂ්ටි ද චතුර්විධ වේ.

අධිත්‍යසමුත්පන්නික ශාශ්වතික ප්‍රකාරයෙහි අසංඥ භවයෙන් ප්‍රච්‍යුත වැ මානුෂකාය ප්‍රාප්ත වැ පූර්වනිවාසානුස්මෘතිඥානයෙන් පඤ්චශත කල්පව්‍යවහිත පූර්වස්කන්ධ සන්දර්ශනයෙහි අශක්ත වැ "අහමිදානීං පූර්වෝත්පන්නඃ, තස්මාත් සර්වමිදං ජගද් යදෘච්ඡිකම්" යී විපර්යාසග්‍රාහී එකෙකැ, ගගනෝදර කුහරනිපතන් මත්ස්‍යාදි පදාර්ථ සන්දර්ශනයෙන් 'සමස්ත වස්තුග්‍රාම මැ ආකස්මික යැ' යි විපර්යාසාභිනිවිෂ්ට එකෙකැයි මෙ සේ අධිත්‍යසමුත්පන්නිකවාද ද්විප්‍රකාර වේ.

ශෝඩෂසංඥීවාදවිභාග පරිග්‍රහ කරන වරැ රූපධ්‍යානමාත්‍රලාභී වැ ධ්‍යානාලම්බන භාවනායෙන් ව්‍යවස්ථිත කෘත්ස්නමණ්ඩල රූපයා ආත්ම යැයි ගෙනැ තද්විෂය ධ්‍යානසංඥා මැ සංඥා යැයි පරිකල්ප්‍ය 'මරණින් ඌර්ධවයෙහි ආත්ම රූපී ද වෙයි, සංඥී ද වේ' යි දෘෂ්ටිගතික එකෙකැ, අරූප්‍යධ්‍යානලාභී වැ අරූපසමාපත්තියට ආලම්බන ආත්මත්වයෙන් පරිග්‍රහ කොටැ 'ආත්ම' සංඥී ද වෙයි, අරූපී ද වේ'යි දෘෂ්ට්‍යභිනිවිස්ට එකෙකැ, රූපාරූප සමාපත්තිලාභී වැ තදුභයපරාමර්ශ වශයෙන් 'ආත්ම සංඥී

දු වෙයි, රූපාරූපී දු වෙ'යි විපර්යස්තදෘෂ්ටික එකෙකැ, රූපාරූපීස්වභාවද්වය රහිත වැ 'ඒකාන්තසංඥි වෙයි ආත්ම' යැයි විප්‍රතිපන්න ශුෂ්කතාර්කික එකෙකැ, ''අන්තවා අත්තා හෝති ආරෝගෝ පරම්මරණා සඤ්ඤී තිපි තං පඤ්ඤපෙන්ති අනන්තවා අත්තා හෝති -පෙ- අන්තවා ච අනන්තවා ච අත්තා හෝති -පෙ- නේවන්තවා නානන්තවා අත්තා හෝති ආරෝගෝ පරම්මරණා සඤ්ඤීතිපි තං පඤ්ඤපෙන්ති' යනාදී ක්‍රමයෙන් දර්ශිත අනන්තානන්තික සඤ්ඤීවාද චතුෂ්ක යැයි මෙ සේ සංඥාගත විභාග රහිත සංඥීවාද අෂ්ටවිධ වේ.

ධ්‍යානසමාපත්තිසමාපන්න අවස්ථා වශයෙන් 'ආත්ම ඒකත්වසංඥි යැ' යි පරිවෘත්තදෘෂ්ටික එකෙකැ, අසමාපන්න අවස්ථා ගෙනැ 'නානාත්වසංඥි යැ ආත්ම' යැයි දෘෂ්ටිගතික එකෙකැ, අවර්ධිතාලම්බනයෙහි ප්‍රතිලබ්ධධ්‍යාන වශයෙන් 'ආත්ම පරිත්තසංඥී' යැයි කුදෘෂ්ටිපතිත එකෙකැ, වර්ධිතාලම්බනවිෂයධ්‍යාන ප්‍රතිලම්බනයෙන් 'ආත්ම අප්‍රමාණ සංඥි'යැයි දෘෂ්ටිපතිත එකෙකැ, ත්‍රිකචතුෂ්කධ්‍යාන භූමියැ සත්ත්වනිර්වෘත්තිසන්දර්ශනයෙන් 'ආත්ම ඒකාන්තසුඛිත' යැයි ප්‍රවෘත්ත ඒකීය වාද යැ, බහුදුඃඛාලය නිරයාන්තඃපාති සත්ත්වසන්දර්ශනයෙන් 'ආත්ම ඒකාන්තදුඃඛිත' යැයි ප්‍රතිපන්න වාද ද, මනුෂ්‍යාත්මභාව නිර්වෘත්තිදර්ශනයෙන් 'සුඛිදුක්ඛී අත්තා හෝති ආරෝගෝ පරම්මරණා'යි ප්‍රවෘත්තමිශ්‍රවාද ද, වෘහත්ඵලාදි බ්‍රහ්මලෝකයෙහි සත්ත්වනිර්වෘත්තිදර්ශනයෙන් 'අදුක්ඛාසුඛසමඞ්ගීයැ ආත්ම' යැයි ප්‍රවෘත්තවාද යැයි මෙ සේ සංඥානානාත්ව වේදනා නානාත්ව වශයෙන් අෂ්ටප්‍රකාර වාද හා පූර්වෝක්ත සඤ්ඤීවාදාෂ්ටකය මිශ්‍ර කළ කලැ සංඥීවාද හැම ෂෝඩශවිධ වේ.

'රූපී අත්තා හෝති ආරෝගෝ පරම්මරණා අසඤ්ඤීතිපි තං පඤ්ඤපෙන්ති' යනාදී ක්‍රමයෙන් දර්ශිත අෂ්ට ප්‍රකාර අසංඥී වාද ද, සංඥීවාදයෙහි ආදිචතුෂ්කද්වයානු -

සාරයෙන් සංඥිවාදස්ථානයෙහි අසංඥිපදමාත්‍රප්‍රක්ෂේප-ලක්ෂණ විශේෂ විනා බෝද්ධුංශකත්‍ය වී නොයි පෘථග-විභක්ත යි.

නෛවසංඥිනාසංඥිවාද ප්‍රපඤ්ච විභාගයෙහි 'රූපී අත්තා හෝති ආරෝගෝ පරම්මරණා නේවසඤ්ඤී නා සඤ්ඤීතිපි නං පඤ්ඤපෙන්ති' යනාදී ප්‍රකාරයෙන් ප්‍රවෘත්ත අෂ්ටප්‍රකාර වාද ප්‍රපඤ්චය නෛවසංඥිනාසංඥිපදමාත්‍ර ප්‍රක්ෂේප පූර්වෝක්ත සංඥිවාදෂ්ටකය හා නිර්විශේෂ යි.

උච්ඡේදවාදගත ප්‍රභේද චින්තායෙහි 'මනුෂ්‍යාත්මභාව-යෙන් ආත්ම උච්ඡින්න වෙ' යි. විපර්යස්ථමතික එකෙක. තද්වාදප්‍රතිෂේධ කොට දිව්‍යභාවප්‍රාප්ත වූ කාමාවචර වූ කබලිකාරාහාරභක්ෂ වූ 'දිව්‍යාත්මභාවයෙන් ආත්ම උච්ඡින්න වෙ' යි අභිනිවිෂ්ට එකෙක. තත්ප්‍රතික්ෂේප කොට රූපීභවප්‍රාප්ත වූ මනෝමය වූ සර්වාංගප්‍රත්‍යඞ්ග-සම්පන්න වූ අහීනේන්ද්‍රිය වූ 'රූපභවයෙන් ආත්ම උච්ඡින්න වෙ' යි විප්‍රතිපන්න එකෙක. ඒතද්වාද නිරා-කරණ කොට 'චතුර්විධ ආරූප්‍යභාවයෙන් ආත්මෝච්ඡෙද වාද' ප්‍රත්‍යෙක පරිග්‍රහ වශයෙන් චතුර්විධ යැ යි මෙ සේ උච්ඡේදවාද සප්තප්‍රකාර වේ.

දෘෂ්ටිධර්ම නිර්වාණවාද ප්‍රභේද විමර්ශයෙහි පරිපූර්ණ පඤ්චකාම ගුණ පරිභෝගමාත්‍රයෙන් 'දෘෂ්ටිධර්මනිර්වාණ වාදී එකෙක. ප්‍රථමධ්‍යානසුඛ ප්‍රතිලබ්ධියෙන් 'පරමදෘෂ්ට ධර්මනිර්වාණ වාදී' එකෙක. එ සේ මැ ද්විතීයධ්‍යාන-ව්‍යාප්තිමාත්‍රයෙන් 'නිර්වාණසාක්ෂාත්කරණාභිධායි' කුදෘෂ්ටිකත්‍රික යැයි මෙ සේ දෘෂ්ටිධර්මනිර්වාණ වාද පඤ්ච ප්‍රකාර වේ.

මෙහි ශාශ්වත වාද, ඒකත්‍යශාශ්වත වාද, අන්තානන්-තික, අමරාවික්ෂේපික, අධිත්‍යසමුත්පන්නික වාද නාමයෙන් ආයාත අෂ්ටාදශ දර්ශනය පූර්වභවාශ්‍රය කොට ප්‍රවෘත්ත වන බැවින් 'පූර්වාන්තකල්පිකදෘෂ්ටි' නම් වේ. සංඥී,

අසංඥී, නෛවසංඥී, උච්ඡේද, දෘෂ්ටිධර්මනිර්වාණවාද නාමයෙන් දර්ශිත චතුශ්චත්වාරිංශද්දර්ශනය ආගාමි භවාපේක්ෂායෙන් ප්‍රවෘත්ත විපරිතාභිනිවේශරූප වන බැවින් 'අපරාන්තකල්පික දෘෂ්ටි' නම් වේ.

මෙ සේ අන්තද්වයානත්තඃපාති දෘෂ්ටිප්‍රපඤ්ච සංකල්පනා වශයෙන් පරිග්‍රහයෙහි දෘෂ්ටිස්වරූප ද්වාෂෂ්ටි විධ වේ. මෙහි පස් පනසෙක් ශාශ්වතදෘෂ්ටිනිඃක්ෂිප්ත යැ. සතෙක් උච්ඡේදපක්ෂනිඃක්ෂිප්ත යි.

මේ යැ ද්වාෂෂ්ටි නම්.' (ධ. ප්‍ර.)

**424. අවා බිය අවරණ තිසරණ ලොවට දක්වා තමා නව අරහ ආදි අපමණ බුදු ගුණ පහළ කැරැ-**

අපාය බියට ඇවිරීමක් හෙවත් ආවරණයක් වන තුන් සරණ ලෝ වැසියාට පෙන්වා, තමා ගේ අරහ ආදි කොටැ ඇති නවය සහිත, පමණක් නැති බුදු ගුණ ප්‍රකාශ කොටැ-

අවා බිය යැයි කීයේ (1) නිරැ, තිරිසන්, ප්‍රේත, අසුර නිකාය යන සතරෙහි උපදනා බියට යි.

තිසරණ නම් (1) බුත්සරණ (2) දම් සරණ (3) සඟ සරණ යන තුනයි.

අරහ ආදි ගුණ නම් (1) අරහං, (2) සම්මා සම්බුද්ධෝ, (3) විජ්ජාචරණ සම්පන්නෝ, (4) සුගතෝ, (5) ලෝකවිදූ, (6) අනුත්තරෝ, (7) පුරිසධම්ම සාරථි (8) සත්ථා දේව-මනුස්සානං, (9) භගවා යන නවය යි. විතර මෙහි මැ වේ (262-271).

**425. සිනැ දුසිරි පන්වා, දහම් ජය කොන නංවා, මහත් ගුණ පෙන්වා, ලොවට තමන් දළ මෙත දන්වා-**

සිත්හි තො සිරිත් පලවා හැරැ, දහම් නැමැති ජය කොඩිය ඔසවා, (තමන් කෙරේ වූ) මහත් වූ ගුණ දකින්නට සලස්වමින් ලෝ වැසියා කෙරේ තම සිතේ ඇති මහත් වූ මෛත්‍රී ගුණය දැනෙන්නට සලස්වා-

426. **සිහිල් අඹ ලෙසින් තෙපුලෙන් සතන් පොබයා පර වැඩ අරබයා දියතැ දහම් වැඹ සිටුවා-**

සිහිල් දිය වන් වදනින් (දතන් ගේ) සිත් සතන් පුබුදු කරවා, අනුන් හට වැඩි දියුණුව සැලසීම උදෙසා ලොවේ දහම නැමැති කණුව සිටුවා-

'අඹ' යනු 'අඹයා' සි ද, 'වැඹ' යනු 'වැඹයා' සි ද විරිත රක්නට යෙදිණි.

'වැඹෙකින්' ලොවට ඇති වැඩය කිමෙක් ද?

සිහිලඹ = සිහිල් අඹ

427. **සසරට සතුරු වැ, කෙලෙස් අඳරට මිතුරු වැ, සම මෙත් පතුරුවා, ලො වැ දහම් මහ ගඟ උතුරුවා-**

සංසාරයට සතුරු වී, සිත කිලිටි කරන පව් නැමැති අඳරට හිරු බඳු වී, සියලු සතුන් හට එක් සම මෙත් ගුණය පතුරුවමින් දහම නැමැති මහ ගඟ ලොවේ උතුරුවා හැර-

'වධකේ දේවදත්තේ ච
චෝරේ අංගුලිමාලකේ
ධනපාලේ රාහුලේ චේව
සබ්බත්ථ සම මානසෝ' සි

සම මෙතේ සැටි දැක් වේ.

428. **දහම් ජය බෙර ගස්වා තමන් නම අස්වා පිරිසුදු පසස්වා, සොඳුරු සග අපවග මග සස්වා-**

දහම නැමැති ජය බෙරය ගැස්වීමෙන් තමන් ගේ නම ඇසෙන්නට සලස්වා, පිරිසුදුවට පැසැසුම් කරවා, මනා වූ දෙව් ලෝ, නිවන් යන මඟ උදලු ගාවා-

මෙහි පිරිසුදුව යැයි කියේ සිවු පිරිසුදු සිල් සඳහා යි

ප්‍රාතිමෝක්ෂ සංවර යැ
ඉන්ද්‍රිය ,, ,,
ආජීව පාරිශුද්ධි යැ

ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීලයෑ යෑයි යන සතර සිවු පිරිසුදු සිල් නම්.

**429. දහම් සිතෑ රඳවං, නිවන් පුර දොර හරවං, මරෑ මන් දෙදරවං, තමං නම නිතොරැ සිඟි කරවං-**

(තමං ගේ) දහම් සිත්හි රැඳී පවතින්නට සලස්වං, නිවන් පුරේ දොර අරවමින්, මරහු ගේ උඩඟු බව බිඳෑ තමං ගේ නම නිතින් සිහිපත් කරවමින්-

මෙහි 'මරෑ' යන්නෙන් වෙසෙසින් සඳහන්නට ඇත්තේ වසවතු වියෑ යුතු.

**430. සමවත් සුවෑ යෙදී, එ සුව සඟටත් ගෙනෑ දී මහ කුළුණින් බැඳී, ලෙවන් කල අමිස පුදෙහි නො බැඳී-**

සමාපත්ති සුව විඳීමේ යෙදී, ඒ (සමාපත්ති) සුව සඟනටත් ලබං දී, මහා කරුණායෙන් බැඳෙමින් ලෝ වැසියං කල අහර ඈ දනෙහි බැඳෙන්නේ නැති වෑ-

සිත එකඟ කිරීමෙන් ධ්‍යාන වඩං විඳින්නං වූ සිත් සුවය සමවත් සුවය යි.

**431. මුනි දම් රජ වෑ, සිල් පවුර උස් කැරැ, දහම් කඳවුර තර කැරැ පවර සවු මැති සහ එ වෙහෙරැ වෙසේ.**

බුදු උතුමං දහම් රජ වී, සිල් නැමැති පවුර උස් කිරීමෙන් දහම් නැමැති කඳවුර සවිමත් කොටෑ උතුම් වූ ශ්‍රාවකයන් නැමැති ඇමැතියන් සහිත වෑ ඒ වෙහෙරේ වෙසෙයි.

මුනි තෙමේ රජෙකි.

ගේ තරන් රක්නං රජෙක් නො වේ, දහම රක්නං (දහම්) රජ යෑ.

සිල් එ දහම් රජු ගේ කඳවුර වටං ඇති පවුරයි.
දහම තමං එ (දහම්) රජු ගේ කඳවුර.
ශ්‍රාවකයෝයි එ රජු ගේ ඇමැතියෝ.

කඳවුර නම් බල ඇණි හෙවත් සෙබල හමුදා ඇණි ලා සිටිනා තැනයි. එය පුරයෙකි- කඳවුරු පුරයෙකි. පවුර උස් කිරීමෙන් එය නො වැටී පවත්නා සේ තිර කොටැ ඇත්තේයි.

තුන්සිය අසූ අට වැනි පැදියෙන් පටන් ගැනුණු වැකිය අවසන් වූයේ මෙයිනි. එ හෙයින් මේ වනාහි සිවු සාලිස් පැදියෙකින් පිරෙන වැකියෙකි. වැකියක් පිණිස පැදි පසක් හෝ එයට වැඩි ගණනක් හෝ බැඳෙන විටැ ඊට 'කුලක' යන නම දඹදිවේ කිවියෝ කියති.

එක් පැදියෙන් වැකිය සපිරේ නම් ඒ 'මුක්ත' නමි.
දෙ ,, ,, ,, ,, 'යුග්මක' ,,
තුන් ,, ,, ,, ,, 'විශේෂක' ,,
සිවු ,, ,, ,, ,, 'කලාප' ,,

'ද්වාභ්‍යාන්තු යුග්මකං ඥේයං
ත්‍රිභිරස්තු විශේෂකම්
චතුර්භිස්තු කලාපං ස්‍යාත්
පඤ්චභිඃ කුලකංමතම්'

යැයි දණ්ඩී ඇදුරාණෝ කියත්.

'ඒකඃ ශ්ලෝකෝ මුක්තකං ස්‍යාත්
ද්වාභ්‍යාං යුගලකංස්මෘතම්
ත්‍රිභිඃ ගුණවතී ප්‍රෝක්තා
චතුර්භිස්තු ප්‍රභද්‍රකම්
වාණාවලී පඤ්චභිඃ ස්‍යාත්
ෂඩ්භිස්තුකරහාටකඃ'

යැයි අයෙක් අනෙක් නම් ද පවසත්.

ඒ කුමක් වෙතත් පැදි බොහෝ ගණනක් එක් වැකියක් පිණිසැ ඇදීම පැසැසියැ හැකි නො වේ.

432. **ශොතින් ශෝතම නම්, සැදි ගුණෙන් සම්බුදු නම්, තමං නම් මුළු ලොවැ මතුරැ කළ එ බුදු වැඩියෝ නම්–**

ගෝත්‍රයේ නමින් ගෞතම නම් වූ (ද), සැදුණා වූ ගුණෙන් 'සම්බුදු' නම් වූ (ද), තමා ගේ නම සියල් ලොවට මතුරක් කළා වූ ඒ බුදුහු වැඩැ වදාළ හොත්-

බොහෝ බමුණෝ 'භවත් ගෞතමයෙනි' යි බුදුන් ඇමැතීම කළ හ. ඒ බුදු වූ උතුමාණන් උපන් ගෝත්‍රයේ නමිති. ගෝතම යනු හෙළ බසෙහි 'ගොයුම්' යැයි සිටී. 'දූත් සදහම් රජ කරත්තෝ ගොයුමා' ඈ යෙදුම් විමසනු.

'සම්බුදු' යනු මුනි උතුමාට යෙදෙන්නේ එ තුමන් කෙරේ සැදී සිටිනා ගුණයෙනි. එ ගුණ පළමු සැඳැහිණි (270).

මතුරෙක් නම් උවදුරු දුරු කරනුවට දපනු ලබන්නෙකි. උවදුරෙහි දී දනෝ බුදුන් ගේ නම කියා ඉන් මිදෙති. එයින් බුදුන් ගේ නම මතුරෙකි.

433. **අප ගේ රටැ ඇති මෙ බඳු උවදුරින් මඳ කුදු අල පතෙකි දිය බිඳු සෙසින් නො තිබෙයි මැති සඳු කියැ.**

අපේ රටේ ඇත්තා වූ මෙ අයුරු උවදුරින් මදකුත් අල කොළේ දිය බිඳු සෙසින් ඉතිරි නො වේ යැයි ඇමැති තුමා කියේයි.

අල කොළේ දිය නො තැවැරේ. එ හෙයින් අල කොළයට වැටුණු දිය බිඳු එහි නො රැඳි තෙතමතයක් පවා නො තිබා හැලෙයි.

434. **එ මැතිඳු බස් අසා නිරිඳො සතොස් වෙමින් යවන ලෙසැ තමන් අතුරින් රජකු නො ලසා විමසා-**

එ ඇමැති තුමා ගේ වදන් ඇසීමෙන් රජහු තුමූ සතුටු වී ගමන පිණිසැ තමන් ගෙන් එක් රජකු නො පමා වැ පිරික්සා-

මැතිඳු = මැති ඉඳු
නිරිඳො = නර ඉඳු + ඕ

**435. එ විටැ 'තම පුරට වඩින ලෙසට තිලෝගුරු මුනිඳුට අයදින ලෙසැ බිම්සර නිරිඳු නුවරට යව' යි-**

එ කල්හි (රජකු විමසා දත් පසු) 'මෙ නුවරට වඩිනා සේ තුන් ලෝ ඇදුරු මුනි රජුට ආරාධනා කරනු පිණිසැ බින්දුසාර රජු ගේ නුවරට යන්නේ' යි—

බිම්සර නිරිඳු නුවරට යැයි කීයේ රජගහා නුවරට යි.

**436. නිරිඳෝ සොඳ බිම්සර රජුට ද මා ඇගි වත් පඬුරු බැඳැ එ මැ සඳැ මහාලී නම් ලද නිරිඳු යැවූ.**

රජහු තුමූ යහපත් වූ බින්දුසාර රජුට ද අගයෙන් මහත් දූසිත් පඬුරු බැඳැ එ විට මැ මහාලී යන තම ලැබූ රජු යැවූ.

ඒ රජුන් විසින් රජගහා නුවරට යවනු පිණිසැ තිල කොටැ ගත්තා ලද්දේ 'මහා ලී' නම් රජ තෙමෙයි. ඔහු රජගහා නුවරට යවත්තා වූ එ රජහු තුමූ බින්දුසාර රජුට ද බොහෝ අගනා දූය පඬුරු කොටැ යැවූ. බින්දුසාර තෙමේ හොඳ රජෙකි.

**437. එ විටැ එ නිරිඳු සඳ මහ සෙනග පිරිවර කොටැ (ගෙනැ) ගොසින් මගද රටැ පරසිඳු රජගහා නුවරට වැදූ—**

එ කල්හි එ රජ තුමා මහා සේනාව පිරිවරා ගෙනැ ගොස් මගද රටේ වූ පරසිදු රජගහා නුවරට ඇතුළු වී—

**438. බිම්සර නර ඉසුරු දුකැ, රැගෙනැ ගිය විසිතුරු පඬුරු දක්වා දී පියකරු පිළිසඳර බස් කියා—**

බින්දුසාර රජු දක්මින් (තමන්) ඇරැ ගෙනැ ගිය විසිතුරු වූ පුද පඬුරු දක්වා දී සිතට සතුට උපදවන සුව දුක් විතැරීමේ වදන් දෙඩා—

**439. ඉක්බිති තම නුවරෙහි පැවැති ලෙඩ දුක් කියා මුනි වඩනා කැමැති අසුන් දක්වා අනුමැති ඇරැ ගෙනැ—**

ඉන් පසු තමන් ගේ නුවරෙහි පැවැත්තා වූ ලෙඩ දුක් පවසා බුදුන් වැඩම කරවනු රිසි බව අඟවන අසුන් පෙන්වා (එ රජු) අනුදන්වා ගෙනැ—

(436—439) '............මහා ලි තම් ලිච්ඡවි කෙනකුන් හා පුරෝහිතයන් ගේ පුතණුවන් හා කැඳවා "තෙපි බොහෝ පඬුරු ද සරහා ගෙනැ රජගහා නුවරට ගොස් පඬුරු දීලා අප ගේ රාජ්‍යයට වූ තුන් උපද්‍රවයන් කියාලා සර්වඥයන් වහන්සේ වැඩිය හොත් මුත් ඒ නො සංහිඳෙන බව කියා රජ්ජුරුවන් ගිවිස්වා ගෙනැ සර්වඥයන් වහන්සේ වඩා එව"යි යවූ හැ. ඔහු ඒ පඬුරු ගෙනැ ක්‍රමයෙන් ගොස් රජගහා නුවරට වැදූ බිම්බිසාර රජ්ජුරුවන් දැකැ, ගෙනැ ගිය පඬුරු දී එ පවත් දන්වා "සර්වඥයන් වහන්සේ අප ගේ නුවරට වඩනා සේ ආරාධනා කළ මැනැවැ"යි දූන්වූ හැ.'

යනු බුත්සරණය කියන සැටි යි.

440. **වේළුවන වෙහෙරට දිය කිම් මුනි වෙතට ගොස් තම පුරට වඩනුව මුනිඳුට ආරාදනා කෙළේ.**

වේළුවන වෙහෙරේ ලෝක ස්වාමි වූ මුනිතුමා සමීපයට ගොස් තමන් ගේ පුරට වඩිනා සේ මුනි රජුට ආරාදනා, කෙළේ යි.

'වේළුවන වෙහෙරට මුනි වෙතට ගොස්.........මුනිඳුට ආරාදනා කෙළේ' යනු හැඩ ඇති වැකියෙක් නො වේ.

441. **එ නිරිඳු බස අසා මුනිඳු තතු ලෙස නැණින් විමසා වන ලෝ වැඩ පිණිසැ වඩනා අදහස දූන් වී.**

ඒ රජු කී වදන් අසමින් බුදු රජ තුමා ඇති තතු නුවණින් සලකා බලා සිදු වන්නා වූ ලෝ වැඩ නිසා වඩිනා කැමැත්ත දූන් වී යැ.

442. **මුනි පවර පන්සිය රහත් පිරිවර සමඟින් විසල් පුරැ වඩිතියි පින්සර බිම්සර නිරිඳු අසා—**

මුනි උතුමා පන් සියයක් රහතුන් පිරිවර කොටැ ගෙනැ විසල් පුරට වඩිතියි පිනිත් සරු වූ බිම්සර රජු අසමින්—

**443. වඩිනා සුගතිඳු හට නිසි කොටැ මහ සරසමියි සිතා වෙහෙරම වැඳ එ මුනි සඳු හට මෙසේ දන් වී.**

වඩින්නා වූ බුදු රජුට සුදුසු වන පරිද්දෙන් පාර සරසමි කියා සිතමින් වෙහෙරට ඇතුළු වී මුනි උතුමාට මෙ අයුරු සැළ කෙළේ යි.

**444. ‘තිමි සඳ, මෙ පුරැ සිටැ ගං තෙරට පස් යොදනෙකැ, එ මග සරසනු හට මදක් බලව’ යි මුනිඳුට කියා—**

‘ස්වාමීනි, මෙ පුරේ සිටැ ගඟ බඩට දුර යොදුන් පසෙකි. ඒ (පස් යොදුන්) මඟ සරහන්නා වූ මා උදෙසා කුඩා තමක් (ටිකක්) පමා වනු මැනැවි’ යි මුනි රජුට කියා—

පස් යොදනෙක් ඉංගිරිසි මයිල අට තිසක් පමණ වේ.

**445. යොදන යොදන අතරැ මහ වෙහෙර කරවමින් බඹ විමන් එව් සරා, නොං යෙක් පුද පෙරහරින් සපුරා—**

යොදනින් යොදනෙහි මහත් වූ විහාර කරවා, (ඒ විහාර) බඹ විමන් සෙයින් සරහා, නන් අයුරු පූජා පෙරහරින් සම්පූර්ණ කොටැ—

පුද පිණිසැ කරනු ලබන පෙරහර පුද·පෙරහරයි. පෙරහර නම් අරක් සංවිදහන් යැ.

යොදන යොදනතරා = යොදන යොදන අතරැ.

‘අතරැ’ යනු අතරා වූයේත් ‘වෙහෙර’ යනු ‘වෙහෙරා’ යි වූයේත් එළි තිසා යි.

**446. මග දෙ පසැ අට ඉස්බක් සාණු·සාවු ද සැසැ පිසැ, බෙර ඇස ලෙසැ තනා සඳ රස් අයුරැ සුදු වැලි වනා—**

පාර දෙ පැත්තේ ඉසුබු අටක් අටක් සරියේ කණු මුල් (උදුල්ලෙන්) සස්වා කටු අමඳවා බෙර ඇස සේ (සම තල කොටැ) සඳු සඳ රස් වැති සුදු වැලි අතුරුවා—

ඉස්බෙක් බඹ තිස් පසෙකි.

'පුළුලින් ඉස්බක් පමණ අවකාශය, යනුයි පූජාවලිය කියත්තේ

447. **දෙ පසේ සුවහස් පිරිකුඹු, රඹ තුරු සඳු දණ පමණක් උසේ මහවත සකසං මලින් පුරා—**

(පාර) දෙ පැත්තේ ලක්ෂ ගණන් පුන් කලස් තබා, (මුව එලෙන) කෙසෙල් ගස් සිටුවා මහ මහු දණ පමණ උසට මතා සේ, මල් අතුරුවා.

සුවහ සේ, පසේ, උසේ, සකසේ යනු එළි විකාරයි

448. **සෙවණෑල්ලෙන් යන ලෙසට බඳ පට වැරැල්-ලෙන්, දිලි රන් කෙහෙල්ලෙ න් මෙ සියල්ලෙන් මඟ දිගට සඳ—**

හෙවණේ වඩනා නිසායෙන් බඳනා ලද පට සළුයෙන් (ද) දිළියෙන්නා වූ රන් කොඩිවලින් (දූයි යන) මේ සියලු දූයින් මඟ දිගට සරහා—

449. **මහවත දෙ පැසැ මහත් පුද පෙරහර සිටුවා, මුඳුනැතැ දෙහොත් බැඳැ මුනිඳු වඩනට කලැයි දන්වත—**

මහ මඟ දෙ පැත්තේ පුද පිණිසැ පිළියෙළ කරන ලද පෙරහර (අරක් ජන සමූහයා) සිටුවා දෙහොත් මුදුනේ බැඳැ (දූත්) බුදුන් වඩින්නට සුදුසු කල් යැයි සැළ කරන කල්හි—

450. **සිතැ බිය නො වැ, තොසින් වෙසෙසින් විකුම් දක්වන, රන් ගිරි ලෙන කුසින් නිකුත් වන සි රජකු විලසින්—**

සිතේ බියක් නැති වැ, තමනට මැ ඇරුණු සපත් කම් සතුටින් පෙන්වන්නා වූ, රන් ගල් ගුහාව තුළින් එළි දක්නා සිහ රජකු ගේ අයුරින්—

451. **එ මුනි සඳ ගමනට පය දෙරණට දික් කරත මිහි ඉරා නැඟි, රුවට සුපිපි සත් බුමු පියුම් පිටැ සිටැ—**

එ මුනි තුමා වඩනා සඳහා පය පොළොවට දික් කරත විටැ පොළොව පළා ගෙනැ (පැනැ) නැගුණු, මනා පෙනීමෙන් යුතු වත පරිදි සපුරා පිපුණු සත් මාලේ නෙළුම් මල් මත්තේ සිටැ— (214)

452. **හුදු ලා රසිනි රුඳු බඳුවද කුසුම් පට බඳු මුදු දෙ පට අඳනය, මුනි සඳු තෙ මඬුලු වසා වඩා—**

තනි කැරූ ලතු දියෙන් සායම් කරන ලද බඳුවද මල් පට (බඳු වද මලින් කළ සළුව) වැනි, මුදු වූ දෙ පට අඳනය මුනි තුමා තුන් මඬුල්ල වසා ඇඳැ—

| | |
|---|---|
| 'රුඳු ලා | රසිනේ |
| බඳු වද කුසුම් | ලෙසිනේ |
| දිලෙන මත | තදිනේ |
| වසා තුන් මඬුලු ඇඳැ | අඳනේ' |

යැයි ගුත්තිල දා කවේ එයි (62)

453. **රන් දමින් පබළු කලබක් බඳින ලෙසිනේ හැම දිනේ බබලන පටී දතුවෙන් අඳනේ බැඳැ—**

රත් දම් වැලෙකින් පබළු රුසක් බඳිනා සේ පටී දතුයෙන් අඳනය බැඳැ—

| | |
|---|---|
| 'විදුලි සිරි | රඳනා |
| බැඳැ කා බාන | නොබනා |
| රත් දමෙකින් | මනා |
| පබළු කලබක් බඳින | ලෙසිනා' යි |

ගුත්තිල දා කව පවසයි (63)

දමිනේ = දමින්
ලෙසිනේ = ලෙසින්

**454. අවට සක්වල ගිරි, සුනෙර ගිරි පිටැ සිපි සග, දිය පොළොව තිම කොටැ මිහි මඬල කම්පා කොටැ ඇරැ ගත්—**

හාත් පසින් සක්වළ ගල ද, (ඉහළින්) මහ මෙර ගල මත්තේ පිහිටි දෙව් ලොව ද, (යටින්) දිය පොළොව ද ඉම් කොටැ (එ අතරේ) මිහි මඬල වෙවුල්වමින් ඇරැ ගත්—

**455. එ සුගත්, පැහැයෙන් දිගු බිත් තුග පල සේ සුරත් කරන කිසි කිලුටක් නො ගත් සුගත් මහ සිවුර—**

ඒ සුගත් තුමා පැහැයෙන් දිශා පියෙස් (ඉදුණු) තුග පල සෙයින් තද රත් පැහැ කරන, කිසි කිලුටක් නො ගත්තා වූ සුගත මහා සිවුර—

ඒ සුගත් තුමා පැහැය පතුරුවාලීමෙන් දිගුත් ඉදුණු තුග පල සේ තද රත් පැහැ කරන, කිසි කිලුටක් නො වැකි සුගත් මහ සිවුර—

'සුගත් මහ සිවුර' යනු බුදුන් ගේ සිවුරට නමෙකි.

**456. මන හර රත් පලෙසෙකින් මෙර වට කරන මෙන් දිලි, රන් වන් සිරුර වසා ගෙනැ පෙරවැ මුනි සිපි වරැ—**

සිත් ඇදූ ගත්තා වූ රත් පැ කම්බලයෙකින් මෙර ගිර අවුරන්නා සේ, බබළන්නා වූ රත් පැහැ ඇඟ වසා ගෙනැ පොරොවා බුදු රජු සිටි කල්හි—

**457. ලෙවන් නුවන් ලද පල විඳැ තුටු වන ලෙසැ සොඳ, නද සවන් සිරිරින් සවන් රැස් කඳ මෙ සේ නික්මිණි.**

ලෝ වැසියාට ඇස් ලැබීමේ පල විඳුනා පරිද්දෙන් මනා වූ, සිත් තුටු කරවන බුදු බඳින් සවනක් රැස් කඳ මෙ පරිද්දෙන් නික්මුණේ යි.

'දත මත පුබුදුවා
නුවත් ලත් පල විදුවා
ගත අඳුරැ බිඳුවා
මෙ ලෙසැ සවතක් රස් විහිදුවා' යි.

ගුත්තිල ද කව් කරුවෝ කියති (72)

## 16. විසල් පුරැ ගමන්

### අ. සවතක් රස්

458. **ඉඳුනිල් මිණි රැසින් නවහම් කරන විලසින් නික්මුණු නිල් රැසින් හැම සක්වල මැ වෙසෙසින් සැදිණි.**

ඉඳුනිල් මැණික් කැල්මෙන් අලුත් වැඩියා කරන්නාක් මෙන්, (බුදු සිරිරින්) නිකුත් වූ නිල් රැසින් සියලු සක්වල මැ විශේෂයෙන් සැරැහුණේයි.

'කරන නවහම් මෙන් මොනර පිල්' යැයි සිරි රහල් හිමියෝ වදරති (කා: සේ: i. 109)

459. **කිණිහිරි පෙති සමගැ සපු මල් පෙති සඳන රගැ රන් වන් රස් තරග දියතැ එක රගැ විදැ දිවැ ගති.**

කිණිහිරි මල් පෙති සමගින් සපු මල් පෙති යොදා සැරැසිලි කරන්නාක් මෙන් රන් පැහැ කැලුම් රළ ලොව පුරා එක් අයුරැ පැතිරී දිවැ ගත්තේ යැ.

'සපු පෙති සඳන ලෙස
කිණිහිරි මල් ඉසින ලෙස'

යැයි වදරති සිරි රහල් හිමියෝ (කව්: i. 114).

'මුළු ලො වැ කිණිහිරිමල් ඉස්නා සේ, යහපත් වැ පිපි සපු පෙත්තෙන් අහස වසන්නා සේ' යනු යෙයි බුත්සරණය.

'මුළු ලො වැ කිණිහිරි මල් ඉස්නා සේ මොනවට පිපි සපු පෙත්තෙන් වසන්නා සේ' යි ථූපවංසය ද කියයි.

460. **බඳු වද පෙති නිසරු (කැරැ) සැඳැ වෙලැ සිරි දුරැ කැරැ සොඳුරු රන් පැහැ සර දියත නිරතුරු රන් කැරැ දිවි.**

බඳුවද මල් පෙති සරු තැති සේ කොටැ, සැඳැ වලා සිරිය දුරු කැරැ මතා වූ රත් පැහැ සාරය අතරක් නො පැ ලොව රත් කෙරෙමින් දිවී.

'බඳු වද කැල බඳු වූ, සන්ධ්‍යා වලා පටල බඳු වූ' යනුයි බුත්සරණයේ එන්නේ.

'බඳු වද කුසුම් කැල බඳු වූ, සන්ධ්‍යා වලා බඳු වූ' යි ථූපවංසය ද කියයි.

'සඳැ ගත කැත් සැරි
සිඳුරු බඳු වදමල් සැරි' යි

යෙති සිරි රහල් හිමියෝ (කා: සේ: i. 113.)

461. **තරු වැලැ පැහැ පැහැස, සඳ රසට අපහස කැරැ නිකුත් සුදු බුදු රස රිදී රස සේ දස දෙසැ දිවී.**

තාරකා වැලේ පැහැයට සිනා සී, සඳේ කැල්මට නිගා කොටැ නික්මුණ සුදු පැහැ බුදු රස් කඳ රිදී දිය සෙයින් දස අතේ දිවී.

'දවගත් තරු සේ, රිදී රස ධාරා සිය දහස් සේ' යි බුත්සරණයේ එයි. ථූපවංසය ද එ මැ කියයි.

462. **මදට වන් රස් කඳෙක් සක්වළේ හැම තැනැ සලා ගෙනැ උතුළේ, ලොව තම පැහැ කෙළේ පතළේ.**

මදට පැහැ ඇති රස් කඳෙක් සක්වළ සියලු තන්හි සුළි ගන්මින් උතුරා ගියේ, ලොව තමා ගේ පාට කෙළේ පැතිරියේයි.

463. **සොඳුරු සිතියම් පට දිගු කොටැ විදූ ලන සේ පබසර රස් පිටැ පිටැ රුවට ලොවැ තවරමින් දිවී.**

මතා වූ පෙති කඩක් හෙවත් සිත්තම් කළ රෙද්දක් දිග හැරැ විසිදූ ලන්නා සෙයින් පබසර රස් නො කඩවා මැ මතා සේ ලොවේ තවරමින් දිවී.

ආදි දනන් සිත්තම් කරන්නේ දළ රෙද්දේයි. දූකුදු නළ බිම්හි තිර දළ රෙද්දේ විසිතුරු සිත්තම් කිරීමෙන් පිළියෙළ කරනු දක්නා ලැබේ. මනා වූ විසිතුරු සිත්තම් පටෙහි නො එක් පැහැ දක්නට ලැබේ. අකුළා ඇති එ අයුරු සිත්තම් පටක් දිග හැරැ දක්වන විටැ නො එක් පැහැ ඇසට හමු වෙයි. ලොවේ ඇති තාක් පැහැය එකට ඇලැලූ විටැ ඇති වන්නා වූ පැහැයයි පබසර කැල්ම. එ හෙයින් එ කැල්ම පැතිරෙන විටැ නන් පැහැ නෙතට හමු වෙයි. දිග හැරෙන්නා වූ සිතියම් පටේ නන් පැහැ පෙනෙන්නා සේ.

'ලොවැති පැහැ එක් කොට
කළ රුසිරු සිතියම් පට
විදහන මෙන් රුවට
දිවි පබසර කැලුම එක විට' යැයි

කියයි ගුත්තිල දා කව (70)

464. **සවනක් රස් දස දෙසැ පැතිරැ, සක්වල ගිරි සිරස පැනැගෙනැ සිය දහස් සුවහස් හැලි නගා දිවී.**

සය පැහැ (බුදු රස්) දස අතේ සක්වළ ගල් මුදුන පැනැ ගෙනැ සිය ගණන්, දහස් ගණන්, ලක්ස ගණන් ඇලි අට-ගන්වමින් දිවූයේයි.

රස්, දෙසැ, සුවහස් යනු එළි නිසා රස, දෙස, සුවහස යැයි යෙදිණි.

අ. අසිරි

465. **බෙර සිය ගොස කරන, විණා නාද නික්මෙන වස් දඬු නද ගනුන, නො පිඹි සක් හඬ දිගු අත මැඩැ යන—**

බෙර සිය ගණන් ගෝෂා කර මැ, වීණාවන් ගේ නාදය (ඉබේ මැ) නික්මී යන් මැ, බට දඬු නලා ඉබේ නාද ගනුන් මැ, නො පිඹිනා ලද සක්හි හඬ දිගුත් කෙළවර යට පත් කොටැ යන් මැ—

**466. මොනරුන් නද කරන, ගජ ඉඳුන් කුංච නද දෙන, තුරඟුන් හෙසරවන, ගමන් නො වැ රියෙහි සක් හඬ ලන–**

මොනරුන් නාද කරත් මැ, ඇත් රජුන් කුංච නාද දෙත් මැ, අසුන් හේසාරව කරත් මැ, ගමන් නැති වැ මැ කරත්ත රෝද හඬ දෙත් මැ–

**467. පවනක් මඟ පිසින, පවනක් සුවඳ මල් ලන, පවනක් සම කරන, වලා පොද විසිරැ මල් පොබයන–**

සුළඟක් (හමා බැසැ) පාර අමදිත් මැ, (තවත්) සුළඟක් (එ මඟැ) මල් අතුරත් මැ, (තවත්) සුළඟක් අතුළ මල් සම කරත් මැ, වලාවන් පොද ඉහිරවා මල් පුබුදු කරත් මැ–

**468. බුදු රස් වැදැ දිගු අතැ තුරැ ලිය නොයෙක් පැහැ වන, දියැ ගොඩැ මල් පිපෙන, මසුන් වරල් විදහා ඉපිලෙන–**

(සවනක්) බුදු රස් වැදී දිගුන්හි ගස් වැල් නන් පැහැ වත් මැ, දියෙහි ගොඩෙහි මල් පිපෙත් මැ, මසුන් වරල් විදහා දිය මතු පිටට එත් මැ–

**469. අවි වග සිටැ දිලෙන, පළන් අබරණ නද දෙන, දිව සෙන් නුබැ සැදෙන වුහුට දිව මල් දෙරණ විසිරෙන–**

ආයුධ ජාතීන් පැවැති ගමන් මැ හෙවත් ඉබේ මැ ලෙළී දිළියෙත් මැ, පැළැඳි අබරණ (ඉබේ) නද දෙත් ම, දෙව් සෙන් අහසේ සැරැසෙන විටැ විදුනා ලද දිව මල් පොළොවේ විසිරෙත් මැ–

**470. උරඟුන් පෙණ විදන, මුවන් පෙම් කෙළැ කෙළැ එන, ලිහිණි ගණ නුබ පතැ පියා විදහා සැදී සිටැ ග(නු)න–**

නයින් පෙණ විදහත් මැ, මුවන් පෙම් කෙළිමින් එත් මැ, කුරුළු සමූහයා අහස් පියෙසේ පියා විදහා සිටැ ගනුත් මැ·

'ගනුත' යනු විරිත නිසා 'ගත' යැයි යෙදිණි. ඒ යෙදුම හොබනේ නො වේ.

471. **තම සැපත විතරට ගත සළු අබරණින් සඳ මුනි වඩනා මහවත දෙ පස, නරයන් අවුත් රුස්වත-**

තම තමා ගේ වත් පොහොසත් කමේ තරමට සිරුර සළුයෙන්, පළඳනාවෙන් සරහා ගෙනැ බුදුන් වඩිනා මහ මඟ දෙ පැත්තේ නර දනන් අවුත් රැස් වත කල්හි-

472. **කණු කටු ඉවත් වීමෙන් සිනිඳු ගුණ ගත්, මුනි වඩනා මහවත් දෙරණ බෙර ඇස සේ මැ සම වත්-**

(ඉබේ මැ) කණු මුල්, කටු අස් වීම නිසා සිනිඳු බවට පත් වූ, බුදුන් වඩිනා මහ මඟැ බිම බෙර ඇස බඳු මැ වී සම තල වත කල්හි-

473. **දිගු බිත් වසා ගෙනැ දිවැ ගත් සුදු නිල් වලා බඳ මහත් වියත් එව් දිනිඳු මැඩැ රස් නවත් වත්-**

දිශාවන් යට කොටැ ගෙනැ දිවෙන්නට වූ සුදු වලා, නිල් වලා බඳිනා ලද (උඩු) වියන් සේ හිරු ඔබා අවුව නවත් වත් මැ-

වියනෙව් = වියන් එව්

'නවත්වත් නවත්වත්' යනු නවත්වත්වත් යැයි කියත විටැ ඒ සිංහල නො වේ.

474. **මුනි දකුමට මහත් තුටු සිතින් අවුත් වෙතැ පත් සුර සෙන් තම රැගත් පසඟ තුරු ගොස පවත් වත් වත්-**

බුදුන් දැකීමට ලොකු ආසාවෙන් අවුත් ළඟට පැමිණි දෙව් සේනාවන් තමන් ඇරැ ගෙනැ ආ පස් අඟ තුරු නද දෙවා ගොස පවත්වත් මැ-

පස් අඟ තුරු පළමු සැඳැහිණි (31)

**475.** **පිපි තුරු මහත් වන සොල්වා කුසුම් රද ගත්, සිඹිල් ඈල් ගුණ නුමුත් මඳ පවන් සුවද ගෙනැ එත් එත්-**

(මල්) පිපුණු ගස් ඇති මහ කැලෑ සලමින් මල් රොන් ගත්තා වූ, තද සිහිල් ගුණය පහ නුවූ මඳ සුළඟ සුවඳ ගෙනැ පැමිණෙත් මැ-

සිහිලැල් = සිහිල් ඇල්.

**476.** **රුසිරින් දන නුවන් ගත්, දිමුත් සුර අඟන දිගු බිත් එක් අලු කැරැ සිටැ සුවඳ සුනු ගෙනැ විසුරුවත් විසුරුවත්.**

රූ සිරියෙන් දනන් ගේ නෙත් (පැරැ) ගත්තා වූ, දිලෙන ගුණයෙන් හෙවත් බැබැළීමෙන් යුත් දෙව් අඟනෝ දිශාවන් එකට එළිය (ඒකාලෝක) කෙරෙමින් සිටැ ගෙනැ සුවඳ කුඩු ඉසිත් ඉසිත් ම.

'විසුරුවත් විසුරුවත්' යනු 'විසුරවත්වත්' යැයි විරිත නිසා හෝ යෙදූ සැටි හොබනේ නො වේ.

මෙ ද නවත්වත්වත් (473) යන්න මෙනි.

ආ. මහ පුද

**477.** **බුදු සිරිරින් නිකුත්, රිවි රස් මකා දිවැ ගත් දිමුත් බුදු රස් දැකැ, බලා සිටි සෙනග වැදැ හෙත් හෙත්.**

බුදුන් ගේ ඇඟින් පිට වූ ඉරු රස් නො පෙනෙන පරිද්දෙන් යට පත් කොටැ දිවූ, දිළිසුමෙන් යුත් බුදු රස් දක්වමින් (බුදුන් වඩිත්තා) බලා සිටි සෙනග වැදැ වැටෙත් මැ.

'බුදු සිරිරින් නිකුත් බුදු රස්' යනු 'සල් ගසේ පිපුණු සල් මල්' යන්න බඳු හැඩ නැති යෙදීමෙකි.

**478.** **මහ රැවි ගණ අවුත් නිරිඳු පිළිවිසැ මහවත් සදනුව තැන් වඩා 'බුදුන් වඩිතී' කියා යත් යත්.**

රට වැසි දෙවු ජන සමූහයා පැමිණැ රජු විතාරු මහ මහ සරහනුව (අවසර ලැබැ) තැත් කොටැ බුදුන් වැඩැ වදුරනවා යි කියා (පෙරලා) යත් මැ.

479. **සුර පුරයෙන් අවුත් අතුරු නො වැ නුබැ සිටැ ගත්, බුදු පුදට සිත් කල සුර අඹ ගණ සුවඳ දුම් ලත් ලත්.**

දෙව් පුරෙන් පැමිණැ අතර ඉඩක් නො තිබා අහසේ සිටැ ගත්තා වූ, බුදුන් පිදීමට සිත දුන්නා වූ දෙව් අඹු සමූහයා සුවඳ දුම් දමත් දමත් මැ,

සුවඳ දුම් දෙත් දෙත් යැයි යෙදිණි නම් 'සුවඳ දුම් ලත් ලත්' යන්නට වැඩියෙන් සුදුසු සේ පෙනේ. (අහසේ සිටැ දෙන දුම් පාත බැසීමත් අසිරියෙක් මැ නො?)

480. **එක සතකුට වුවත් වන වැඩ තකා දුරකට වඩනා බැවින් එ විටැ මුනිඳු ගමනට නික්මැ ගත් සඳැ-**

එක් මැ සතකු හට වුව ද සිදු වන්නා වූ වැඩ සලකා දුරකට වඩිනා හෙයින් (බොහෝ දෙනට වැඩ සිදු වන මේ) ගමනට මුනි රජු නික්මී ගත් කල්හි-

481. **මහ බඹ ඉදිරි කොටැ නික්මැ යන බඹ පිරිසට නොහොත් සඳ මඬලට පසු වැ පෙල සැදුණු තුරු විලසට-**

මහ බඹු පෙරටු කොටැ ගෙනැ පිටත් වැ යන්නා වූ බඹ පිරිසට (එ සේ) නැති නම් සඳ මඬුල්ලට පසු වී පෙළ ගැසුණු තරු හැටියට-

482. **සක් දෙව් රජු පෙරමු කැරැ සැදුණු සුර සෙනඟට නොහොත් මිණි රුවනට පසු වැ යන මිණි රුවන් විලසට-**

සක් දෙව් රජු ඉදිරි කොටැ ගෙනැ යන දෙව් සෙනඟට නැත් නැත් නම් (සක් විති) මිණි රුවනට පසු වී යන වටිනා මැණික්හි හැටියට-

**483. සදත් ගජ රජ හට පසු වැ යන ගජ සෙනඟට වෙසෙසින් නිසරැ කොටැ මුනිඳුට පසු වැ සඟ ගණ නිකුත්.**

දළ සයේ (ෂඩ් දන්ත) ඇත් රජුට පසු වී යන ඇත් සෙනඟට මදි කම් සිදු වන නියායෙන් මුනි රජුට පසු වී සඟ සමූහයා නික්මුණු-

(.........බඹ පිරිසට............තුරු විලසට............ සුර සෙනඟට ......රුවන් වැලයට.........ගජ සෙනඟට නිසරු කොටැ සඟ ගණ නිකුත්.

......බඹ පිරිසට (ත්)......තාරකාවන් ගේ හැටියට (ත්) ......දෙව් සෙනඟට (ත්)......මැණික් වැලට (ත්).........ඇත් සෙනඟට (ත්) මදි කම් වන නියායෙන් සඟ ගණ නික්මුණු'යි ගන්නේ)

**484. රජ දරුවෝ මහත් අදර ඇති වැ, බලවත්, ලොවැ අග පත් මුනිඳුට සේසත් පිටැ මැ සේසත් නැතු.**

රජහු තුමූ මහත් වූ ආදර ඇති වැ, බලවත් වූ ද, ලොවේ අග තන් පත් වූ ද බුදු රජුට සේසත් මත්තේ මැ සේසත් නැතු.

'බුදුන් වහන්සේට සේසතක් මත්තෙහි සේසතක් බැගින් දෙ සේසතක් බරු......' යි බුත්සරණයේ එයි.

ලොවග (පත්) = ලොවැ අග (පත්)

**485. ,දනෝ දිඩ මිනිස් අත් බවට වන වැඩ මෙ මැ යැයි සඟ ගණ හට නො කඩ සුදු කුඩ පන්සියයක් මැ නැතු.**

මිනිස්සු තුමූ උසස් වූ මිනිස් අත් බවට වන්නා වූ වැඩි දියුණුව මේ මැ යැ (නෙවත් මිනිසත් බව ලැබීමේ ඵලය නම් මේ මැ වෙයි) කියා සඟ සමූහයාට නො කඩ කොටැ සුදු කුඩ පන්සියයක් මැ නැතු.

'එකි එකී භික්ෂූන් වහන්සේට එකි එකී ශ්වේතච්ඡත්‍ර බැගින් ලවා' යි එයි බුත්සරණයේ.

'බුදුන් සිරසට අතැගි වූ මතු මතුයේ සේසත් දෙකක් හා පන්සියයක් රහතන් හිසට පන්සියයක් සේසත් හා ලවා' යි එ මැ කියයි පූජාවලියත්.

මිනිසත් බව = මිනිස් අත් බව

486. **පින් පල බල දන්නෝ මුනි පුදයට වන්නෝ දද කුඩ කොඩි ගන්නෝ යෑ, සොඳ ගඳ ලන්නෝ යෑ.**

පින් කම් විපාහි බල දන්නා වූ, බුදුන් පිදීමට වන්නාහු දෙ බඹ කොඩි, කුඩ, කෙහෙලි ඈ කොඩි තඟන්නෝ යැ, සුවඳ දුම් දෙන්නාහු යැ.

මෙහි 'යා' යනු විරිත නිසා වූයේයි.

487. **දමින් කුසුම් අතින් රැගත්, සදමින් මුනි සිතින් රැගත් අයෙක් ඇති පමණින් බැතින් නිතින් මුනි පුදමින් යෙති.**

(ඇවුණු) දම් විලසින් මල් අතින් ඇරැ ගත්, සදහමින් බුදුන් සිතින් ඇරැ ගත් කිසි කෙනෙක් තමා ගේ වත් කමේ හැටියට බැතියෙන් නිබඳ වැ බුදුන් පුද පුදා යෙති.

කිසි කෙනෙක් කඩ නො කොටැ බුදුන් පිදීමේ යෙදී යති. ඔවුන් බුදුන් පුදන්නේ බැතියෙනි, තමා ගේ වත් පොහොසත් කමේ හැටියට යැ, ඔවුන් ගේ අතේ මල් ඇති. එ මල් උන් ඇරැ ගෙනැ යන්නේ (මල්) මාලා හැටියටයි. ඔවුන් ගේ සිතේ බුදුහු වෙති. ඔවුන් බුදුන් සිතින් දරා ගෙනැ යන්නේ (ඔවුන් වහන්සේ දෙසා වදාල) සදහමිනි.

බුදුන් දෙසූ සදහම සිතේ රැඳී ඇත් නම් එ සිතේ බුදුන් රැඳුණා මැ වෙයි.

488. **අයෙක් තිළි රැළි රැගෙනැ කිරි පිටැ හෙන දුල ගඟුල් හැලි විලසට මුනි පුදයට තිස වටැ පිළි සිසාරති.**

කිසි කෙනෙක් සතුටට පැමිණි රැළි තගමින් කඳු මත්තේ වැටෙන, දිළියෙන්නා වූ ගං උල්හි ඇලි සෙයින් බුදු පුදට හිස වටා රෙදි කරකවති.

සතුටට පත් කිසි දන කෙනෙක් බුදු පුද පිණිසැ හිස වටා සළු කරකවති. ඒ සළු ඈතට පෙනෙන්නේ රැළි දෙමින් කඳු මත්තේ ඇදහැලෙමින් දිලෙන ගඟුල් ඇලි සෙයිනි.

ගඟුල් = ගඟ උල්.

ගංගාවන් වනුව පැනැ නැගි දිය දහර ගං උලයි.

රැළි, දුළි, පිළි යනු රැළී, දුළී, පිළී යැයි සිටිනේ විරිත රක්නා පිණිසැ යැ.

489. මුනි පුදයට එ මැ සේ පුද බඩු ගෙනැ, බඳ වැඩි සිඳු රළ සේ මඟ දෙ පසේ සතොා සේ රැස් වෙති.

බුදුන් පිදීම සඳහා එක සේ පුද බඩු ගෙනැ, ඔද වැඩුණු මුහුදේ රළ සේ (අයෙක්) පාර දෙපැත්තේ සතොසින් රැස් වෙති.

ඔද වැඩුණු විටැ මුදේ රළ පෙළ උස් වෙයි. වග වහා වෙරළ දෙසට එයි.

'එක් අයුරැ' යන අරුත් දීමට 'එ මැ සේ' යි යෙදීම මෙ ගත් කරුවාණනට බොහෝ හුරුයි (417)

පැදියේ අගැ ඇති 'යා' යන්නෙන් විරිත පිරීම මිසැ අනෙක් වැඩෙක් නැති.

490. සිඳු වැද නැවැති ගඟක් සේ, කැමැති වැ සිටි රජ සෙන් මැදූ ළද, සොඳ, රූව ඇති ළියන් සඟ බහුරැ බැඳැ අයෙක් නටති.

මුහුදට වැදී නැවැතුණා වූ ගඟක් සෙයින් සිය කැමැත්-තෙන් නැවැතුණා වූ රජ සෙනඟ මැද්දේ, තුරුණු වූ මනා රූ ඇති ගැනුන් හා අයෙක් බහුරු බැඳැ ගෙනැ නටත්.

රජ සෙතඟ අවුත් මඟ සෙතඟ රුසේ ගැහී තැවැත්තේ කැමැත්තෙනි. කැමැත්ත ඇති වූයේ නැටුම් බැලීම සඳහායි. එ විටැ එ රජ සෙතඟ මැද්දේ කිසි මිනිස් කෙනෙක් බොහෝ වූ වෙස් බැඳැ ගෙනැ නටති ඔවුන් නටන්නේ ගැනුන් ද සමඟ වැ යි. ඒ ගැනු තුරුණු වියෙහි සිටියෝ යි, මනා රු ඇත්තෝයි.

රුවැති = රුව ඇති.

491. **නැණ ඇති දනෝ විමති නො වි අදහා ගෙනැ, කැමැති ලෙසින් කව් බැඳැ ගෙනැ වෙන වෙන සිටැ තැනැ තැනැ බුදු ගුණ කියති.**

නුවණ ඇති මිනිස්සු සැක පත් නො වැ හෙවත් වැරැදි මත ඇති කොටැ ගත්තේ නැති වැ (බුදුන්) අදහා ගෙනැ (තමන්) රිසි තියා කව් බැඳැ ගෙනැ වෙන වෙන සිටැ තැනැ තැනැ බුදු ගුණ කියති.

නුවණ ඇත්තෝ සැක නැති වැ මැ බුදු ගුණ, බුදු බල දැන්මේ සමත්තු වෙති. බුදුහු දු වදාළෝ මැයි:-

'පඤ්ඤවතස්සායං ධම්මෝ, නායං ධම්මෝ දුප්පඤ්ඤ-වතස්ස' යැයි.

එ හෙයින් ඌ තුමූ වැරැදි මත ඇති කොටැ ගත්තේ නැති වැ බුදුන් අදහා ගෙනැ කව් බැඳැ බුදු ගුණ කියති.

කව් බැඳැ බුදු ගුණ කියනවා නම් ඒ කව් බුදු ගුණ කව් වියැ යුතු. කව් කරන දැයක් මිසැ බඳිනා දැයෙක් නො වේ. එ හෙයින් මෙහි 'කව්' යන්නෙන් අඟවන ලද්දේ 'රසය ආත්ම කොටැ ඇති වැකිය කව් නම් වෙ' යි කියන ගණයේ කව් නො වැ පැදි බව සැලැකියැ හැකියි. පැදි නම් පද බැඳීමෙන් නිපැදැවියැ යුතු දැයෙකි.

492. **තද දුක් දුරැ ලන්නෝ, සඟ මොක් සැප දෙන්නෝ මොහු මැ වෙත් යැයි දන්නෝ වැඳැ වැඳැ හිමැ හෙන්නෝ යැ.**

දූඕ දුක් දුරු කරන්නෝ, දෙව් සැප නිවන් සැප දෙන්නෝ මේ තැනැත්තෝ මැ වෙත් යැයි දන්නෝ වැඳැ වැඳැ බිමැ පෙරළෙති.

මෙහි දු 'යා' යනු විරිතත් එළි වැටත් රැක්මට යි.

493. **මුනි ගුණ දස දිගැ වී දේ, තුටු වූ සත සිත පැදේ, අපවාදේ නො අසන ලෙසැ පසඟ තුරු නාදේ කෙරෙති.**

බුදුන් ගේ ගුණ දස අතේ විහිදෙයි හෙවත් පැතිරෙයි. (එයින්) සතුටු වූ සතුන් ගේ සිත පහදී (හෙවත් සිතේ සැදැහැය ඇති වෙයි) වයන්නෝ දෙස් නො අසන පරිදි (නැත් නම්, නො වරදවා) පස් අඟ තුරු නද කරවයි

පසඟතුරු (31 පැදිය බලන්නැ).

494. **අයෙක් අප මුනිඳුන් ගේ අපමණ ගුණ දැනැ ගෙනැ සරණ ඇරැගෙනැ 'බව දුක් නිසරණ වේව' යි පළන් අබරණ දමති.**

කිසිවෙක් අපේ බුදු රදුන් ගේ පමණක් නැති ගුණ දැනැ (බුදුන්) සරණ ගොස් 'සසර දුක අසරණ වේවා' යි (පතමින්) පැළැඳි අබරණ පුදට මෙන් දමති.

බව දුකට සරණ නැති විටැ එය නැසී යේ.

495. **සිත ලොල වඩන ළඳරු, පලා නො යන ලෙසැ සොඳුරු, කලා සපිරි සඳ අඳුරු මුනි රූ බලා ගෙනැ මැ යෙති.**

සිතේ ලොල් බව වඩන්නා වූ ළඳරුවෝ, (එ දමා) ඉවත් වැ නො යන පමණට මනා වූ, (සොළොස්) කලා සපිරුණු සඳ ආකාර බුදු රුව බලා ගත් වන මැ යෙති.

යමකට ආසාව ඇති වූ විටැ එ දමා යාමේ ළඳරුවෝ අසමත් වෙති, ඔවුන් එයට ඇති ලොල් බව වඩවන නිසා. බුදුන් ගේ රුව දුටු දුටු විටැ ළඳරුවනට එ දමා බැහැර නො යා හැකි පමණට එය සොඳුරු හෙයින් උඹ ඒ රුවේ නෙත් අලවා ගත් වන මැ යෙති.

කලාවෙක් නම් සඳ මඬලින් දහසයෙන් කොටසෙකි. කලා සපිරි සඳ නම් 'පුරා හඳ' යි

ලොලා = ලොල්
පලා = පැලැ

496. **ලියෝ දරුවන් ගෙන් පිරි බඩ ගෙනා, මුනි ගන මඟ පිරි බඩ ගෙනැ මඟැ බඩැ සිපි අඟ බඩ සල් පිල් වෙතැ මැ සිටැ වඳිති.**

ගෑනු දරුවන් ගෙන් පිරුණු බඩ (න් උහුලා ගෙනැ) බුදුන් වඩිනා පාර (සුවඳ කලල් ඈ දූයින්) පිරිබඩ ගත්වා, මන මඟ අද්දර ඇති වටිනා බඩු ඇති සල් පිල් ළඟැ මැ සිටැ (බුදුන්) වඳිති.

'දරුවන් ගෙන් පිරි බඩ ගෙනැ' යන්නෙන් ඇඟෙයි ඒ ගෑනුන් දරු ගප් සහිත බව. ඒ බඩ දරු ගෑනු බඩන් උස්සා ගෙනැ අවුත් බුදුන් වඩනා මඟ සුවඳ කලලින් පිරි බඩ ගත් බවත්, එ සේ කොටැ මඟ අයිනේ වූ සල් පිල් ළඟැ මැ සිටැ ගෙනැ බුදුන් වැඳි බවත් එයින් පළ වෙයි. ගෑනුන් සිටියේ 'අග්‍ර භාණ්ඩ' යැයි සම්මත වටිනා බඩු ඇති සල් පිල් අසලැ යැ. 'අග්‍ර භාණ්ඩ' යන්නෙන් සළු අබරණ ගෑනේ ඒ ගෑනුන් ගේ සිත් අදිනා දූයයි.

'රති කෙළි යෙදීමෙන්
අබරණ ලා සැදීමෙන්
දරුවන් වැදීමෙන්
**වෙසෙති අඟනෝ නො කිත් විඳමින්**'

යැයි සිරි රහල් හිමියෝ බණ දහමක් වදුරති (කා: සේ: x. 49)

මේ ගෑනුන් බුදු පුදට ගොසිනුත් අබරණ ඈ දූය ඇති සල් පිල් වෙතැ මැ සිටැ එ කිරීමෙන් පසිදු වූ ගෑනු ගතිය පළ කළ බව දැක්වෙයි.

497. **සොඳ ළඳ අඟනෝ වෙනින් වෙනැ මැ පිපි මල් සිඳැ රෙණින් රෙන මැ ගෙනැ අවුත් තැනින් තැනැ මැ වෙනින් වෙන මැ පුද කළෝ යැ.**

මතා වූ තුරුණු ලියෝ වනයෙක්හි වනයෙක් මැ පිපුණා වූ මල් කඩා රොනක් රෙනක් පාසා මැ ගෙනැ අවුත් තැනින් තැනැ මැ වෙතින් වෙත මැ පුද කළෝ යැ.

වෙනෙන් වෙනැ මැ යනු 'වෙතින් වෙත මැ'යි එළි නිසා සිටියේයි.

රොනක් රෙනක් පාසා මැ යැයි කීයේ පුබුදු වන වන වරා මැ යනු අඟවන්නට යි.

ඔවුන් එක් තැනැ නො සිටැ උන් උන් හට හවුල් නො වී එකළ බව ඇඟැවීමටයි 'තැනින් තැනැ මැ වෙතින් වෙත මැ'යි යොදන ලද්දේ.

මෙහි 'මැ' යනු යෙදූ සැටි පියකර නො වේ.

**498. බුදු මහිමය දැකැපුවෝ, සිපි වන සිටැපුවෝ නැතැ. වැඳැ වැඳැ අත සැතැපූවෝ බුදු බව නො පැතුවෝ නැතැ.**

බුදුන් ගේ මහිමය දැකැපුවාහු සිටි වන මැ සිටැපුවෝ නැත්තා හ. වැඳැ වැඳැ අතට සැතැපුම් දුන්තෝ ද නැතැ, බුදු බව නො පැතුවෝ ද නැත්තා හ.

බුදු මහිමය දුටුවාහු සිටි වන මැ නො සිටිය හ. වඳින්නට වූ හ. වැඳීමේ ද නැවැත්මෙක් නො වී. සියල්ලෝ බුදු බව ද පැතූ හ.

**499. මුනි රුව දැකැ රස වින්ඳෙ වෙනැ වැඳ සිරිපද වැන්ඳෙ, බව සැපතැයි නො සිමින්ඳෙ, තම සිතැ කෙලෙසුන් සින්ඳෙ.**

බුදුන් ගේ රුව දක්මින් එහි රස වින්දාහු ළඟට වැදී සිරි පා වැන්දේ යැ, සසර සැපත යැයි නො සිහි කළෝ යැ, තමන් ගේ සිතේ කෙලෙස් නැසූ හ.

**500. අඳ මඳකුන් නො කිලිවියෝ, මදැ, ළඳ කිරි බොන පැටියෝ නඳ මුනි රුව දැකැ අපියෝ මුදුනැ අත බැඳැ වැඳැ සිටියෝ.**

සිත යම් තම්නුත් කිලිටි නුවූ, නුවණ මූ නො කල ඉතා බාල, කිරි බොන පැටියෝ සිත් තොස වඩන බුදුන් ගේ රූම දක්මින් එහි ආසා වූවෝ දෙහොත් මුඳුන් දී වඳිමින් සිටිය හ.

501. **අවටින් රට රටින් දෙන දනට මැ තිසි බඩු දූනැ සමහරැ තැල් පිටින්, වෙන වෙන රඟ නැව් පිටින් ගෙනැ එති.**

හාත් පසැ ඒ ඒ රටින් දෙන්නා වූ දනයට මැ, තිසි බඩු දූනැ සමහරැ කරත්තවලින් ද, සමහරැ වෙනස් වෙනස් විදියේ නැව් පිටින් ද ගෙනැ එති.

දනට මැ යි කීයේ ඒ බඩු දනට මැ මිසැ අන් කිසි වැඩකට නො ගන්නා බව ඇඟවීමටයි.

502. **වෙන් පත් සුර අඹුන් නො මැ නරඹන්නෝ, නෙත් සිත මුනි රූ රසෙහි තබන්නෝ, ගත් ගත් කුඩ කොඩි හැම නො තබන්නෝ රජසෙන් යත් යත් මුනිඳු පුදන්නෝ.**

(තමත්) වෙතට පැමිණි දෙව් ලියන් බලන්නේ මැ නැති, නෙතත් සිතත් බුදුන් ගේ රූ රසෙහි අලවා තබන, ගත් ගත් කුඩත් කොඩිත් සියල්ල (බිමැ) නො තිබන්නා වූ රජ සේනාවෝ යත ගමන් මැ යත ගමන් මැ බුදු රජු පුදන්නෝ යැ.

'කුඩ කොඩි හැම නො තබන්නෝ' යනු එක කුත් බිමැ නො තිබන බව ඇඟැවීමට යෙදිණි. එ හෙන් 'හැම නො තිබන බව කීමෙන් නො තිබන්නේ සියල්ල බවත් තුන හතරක් තිබන බවත් ඇඟෙනට ඉඩ ඇති හෙයින් ඒ යෙදුම හොබනේ නො වේ.

'සියල්ල මැ ගන්නට එපා' යන්නෙන් ඇඟෙන්නේ සියල්ල නො ගෙනැ යම් කිසි පමණක් ගන්නට වර ඇති බවයි.

503. **මොනවට දිළි මිණි කිරුළු පැළැන්දෙ, මෙර වට ලූ කුල ගිරි සිරි වින්දෙ, මුනිඳුට වැඳැ මුදුනතැ ඇඳිලි බැන්දෙ නරනින්දෙ පුද කොටැ කැපි වැ මැ යෙති.**

මනා සේ බබළන මැණික් වොටුණු පැළැඳි මහ මෙර වට ලා ගත් කුල පවුහි සිරිය වින්ද වූ, බුදු රජුට වැඳීම කොටැ හිස් මුදුනේ ඇඳිලි බැඳැ ගත්තා වූ රජහු තුමූ (බුදුනට) පූජා පවත්වමින් කැපි වැ මැ යති.

තර තිඳුන් මෙර වටලා ගත් කුල ගිරි සිරි වින්දේ මුනිරජු මහ මෙර සෙයින් පෙනුණු හෙයිනි.

මුදුනතැදිලි = මුදුනතැ ඇඳිලි
නරනින්දේ = නරන් ඉන්දු + ඕ

504. **සෙත් මුනි විද්දොතමින් යත් යත්, සිත් යුත් පුද වත් දෙ අතින් ගත්, කැත් ගොත් යුත් නමින් පරසිද්දෙ එ දිනේ නෙත් සිත් ලත් පල ලද්දෙ.**

සෙත සලසන බුදු රජු දිලි දිලී යත් මැ, හිතේ හැටියට පුද වතුත් (=පූජා වස්තු) දෝතින් ගත් කැත් කුලේ ගොත් (=ගෝත්‍ර) ඇති, නමින් පසිදු වූවෝ එ දිනෙහි ඇසුත් සිතුත් ලැබූ පල ලද්දෝ යැ.

නෙත් ලත් පල ලැබූයේ මුනි රුව දක්මෙනි සිත් ලත් පල ලැබූයේ මුනි ගුණ සිහි කිරීමෙනි.

'විද්දෝතමින්' යනු දිලි දිලී යැයි කීයේ ළදරුවකු ගේ වදනෙකැ අරුත් සලකා ගත්තා සේ සැලැකීමෙනි.

දෙව් බසැයි යෙන සකුයේ 'වි' පෙරටු, බැබැලුම්හි 'ද්‍යුත්' යන දය විකරණය සහිත වූ විටැ මර තැහෙනු පිණිසැ අංගය සැදී සිටිනේ 'විද්‍යෝත' කියායි. එය 'විද්දෝත' යැයි ගෙනැ සිය බසෙහි 'මිත්' යනු යෙදීම එළි බෙලෙන් කැරුණෙකි.

විද්දෝතමිතේ = විද්දෝතමින්
අතිතේ = අතිත්
තමිතේ = තමින්

එ සියලු තැනැ 'ඒ' යනු සඳැස රක්නා පිණිසැ ගැතිණි. 'ද්‍යේත' යනු 'දූත' නො වන බව සැලැකියැ යුතු.

505. **සෙනඟ බලෝ මුනි සිරි දූනැ ගෙනැ මුනි දැකුමට තැනැ තැනැ ඔසලෝ, මන පිනවන දසනෙකි හසළෝ, වෙන වෙන දෙයකට ලොබ නො කොළෝ සැ.**

සේනාවත්හි සෙබළෝ බුදුන් ගේ සිරිය දූතැ ගෙනැ බුදුන් දක්නා පිණිසැ තත්හි තත්හි රැස් වූවාහු සිත පින-වන්නා වූ ඒ දැක්මෙහි පුරුදු වූවෝ අනෙක් අනෙක් දූයකට ආසා නො කළ හ.

දූත ගෙත = දූතැ ගෙතැ
තැත තැත = තැතැ තැතැ

පැදියේ අගැ ඇති 'යා' යනු සඳැසත් එළියත් පිණිසැ ගැතිණි.

506. **සවන කිරණ දුල මුනි මෙර වැන්නෝ, වඩන එ සඟ ගණ කුල ගිරි වැන්නෝ, පතන තුරඟ පෙළ සිඳු රළ වැන්නෝ, එ යන සෙනඟ ගොඩැ යන සිඳු වැන්නෝ.**

සවනක් කැලුම් නිසා දිලියෙන මුනි තුමා මේරු පවුව වැනියි, (ඔවුන් වහන්සේ හා) වඩිනා පරසිදු සඟ ගණ කුල පවු වැනියි, පතින්නා වූ අස් පෙළ මුහුදු රළ වැනියි, ඒ යන්නා වූ සේනාව ගොඩැ ගමන් ගත් මුහුද වැනි යි.

'මුනි.........වැන්නෝ' යනු ගුරුකමට ගත යුතු යෙදු-මෙක් නො වේ.

507. **නරපා සුර පා මෙන් දිලි වෙහෙරින් වෙහෙරැ, සඟ ගණ සහ මුනි පවර සතපා, පෙළ පාළිය දූඝැ අඳර කෙරෙමින් දන් දී නිතොර පුද කෙළෙ.**

තරපල්ලා හෙවත් රජ දෙව් පා සෙයින් දිලෙන වෙහෙරින් වෙහෙරේ සඟ පිරිස සහිත බුදුනට ආරාධනා කොටැ සතපවමින්, (පෙරහර ගමන් කළ) පිළිවෙළ දැක්මෙන් අදර වඩා දන් දී නිතීන් පුද (සත්කාර) කෙළේ යි.

'දවසින් දවසැ එකි එකී විහාරයෙහි වස්මා පන්සියයක් පරිවාරයෙන් යුක්ත වූ ස්වාමිනට දවස් පතා මහ දන් දී පස් දවසෙකින් ගං තෙරට වඩා ගොස්.........'

යනු බුත්සරණයේ එයි.

508. **මුනි සඳුට සතොසින් පුද කෙරෙමින් නො ලසින් ගොස් මහ ගං තෙරට වැඳූ වෙසෙසින් මුනි පුද කරවන ලෙසට එ විසල් පුරට මෙ ලෙසින් අසුන් දින්.**

මුනි උතුමා හට සතුටු සිතින් පූජා පවත්වමින් හමා නො වී ගොස් මහත් වූ ගං තෙරට පැමිණැ මුනිඳුට විශේෂ පූජා කරවන පිණිසැ ඒ විසල් පුරට මෙ අයුරින් දූත් වී.

දිනසුන් = දින් අසුන් (අසුන් දීන්)

509. **අප අප ගේ බල පමණින් සෑප සපයා නිසි කොටැ කල පුද ලැබැ මුනි සඳ ගගැ මෙ තෙරට සපැමිණියේ, තොප තොප ගේ බල පමණින් පුද කොටැ–**

510. **මුනිඳුන් නුවරට කැඳවා ගෙනැ ගොස් නිසි කොටැ සොඳවා මහ පුද කරවා උවදුරු මුදවා රට සෙත කරවයි අස්නක් සොදවා මෙහෙයා එ විටැ මැ–**

'අප අපට පිළිවන් හැටියට සුව සලසා සුදුසු පරිදි සලසා අප කළ පූජා ලබමින් මුනි උතුමා ගඟේ මෙ ගොඩැ තීරයට සැපත් වූයේයි, තොප (ත්) තොප ගේ පිළිවන් කමේ හැටියට පූජා පවත්වා–

බුදු රජුන් (තොප ගේ) නුවරට වැඩම කරවා ගෙනැ ගොසින් සුදුසු වත නියායෙන් යහපත් වූ මහා පූජා කරවමින් උවදුරු දුරු කොටැ රටට සෙත සලසව'යි අසුනක් පිළියෙළ කරවා යවමින්, එ ගමන් මැ–

'සොඳවා' යනු මතා කොට යන අරුත දෙයි.

'ඔහු ම වෙතැ රඳවා
දිනිමි වෙණ සිප් සොඳවා' යි ගුත්තිලදා කවි

කරුවෝ කියති.

511. **මහ නැව් සොඳවා ගලපා බැඳැ එහි දිළි පා පෙළ පෙළ සිටුවා, නඳ සුර පහ සිරි වෙළ පා දිග පුළුල ඇති මහ පා කරවා–**

ලොකු නැව් මතා සේ එකට ඇඳ බඳවමින්, එ (නැව්) හි දිලෙන්නා වූ කණු පෙළ පෙළ සිටුවමින්, සිත් තුටු කරවන දෙවියන් ගේ පහාවලැ සැපිය ගෙනැ දක්වා දිග පළල ඇති මහ පා කරවමින්

මෙහි මහ නැව් කිවත් බුත්සරණය කියන්නේ 'ඉක්බිති බිම්සර රජ්ජුරුවෝ හොරු දෙකක් එක් කොට බැඳැ එහි මණ්ඩපයක් කරවා විචිත්‍ර වූ කුසුමයෙන් ඒ මඩුව සදා සත් රුවන්මය වූ බුද්ධාසනයක් පැනවූ හැ' කියායි.

'ඉක් බිත්තෙන් බිම්සර රජ්ජුරුවෝ අගුළු දෙකක් අලංකෘත කොට නිමවා ඒ මතුයෙහි විචිත්‍ර වූ මණ්ඩපයක් නිමවා මල් දම් ආදියෙන් සරහා මණ්ඩපය මධ්‍යයෙහි......... බුද්ධාසනයක් පනවා.........' යි පූජාවලිය කියයි.

පැදිය අවසන ඇති 'යා' යනු විරිත රක්නට මිසැ වෙන වැඩකට නැති.

වෙළපීම නැම් හැටිය ගෙනැ පෙනීමයි 'අද නම් මෙ දිවයිනේ බහුල පර දනන් වෙළපන්නෝ යි' යන වැකිය ත්

'එ උන් වෙත් වෙළපා'
බඹදත් නිරිඳු සිරිපා'

යන ගුත්තිල ද කවි කරු ගේ වදනත් විමසා බලනු.

512. **සුර සිඳු බඳු සුදු වියන් බඳවා, පට වට තිර අදවා සරහමින්, ලඹ ඉඳුවර මල් දමින් සදවා අවට රන් වැට මිණි වැට පහන් සිටුවා–**

අහස් ගඟ වැනි වූ සුදු වියන් බන්ද, පට රෙදි වට තිර අද්ද, සරහමින්, එල්ලන ලද නිල් උපුල් මල් දමින් විසිතුරු කොටැ, වටා රන් වැට මිණි වැට පහන් සිටුවමින්-

'සුර සිඳු' යනු 'අහස් ගඟ' යන අරුත සේ මැ 'දෙව් අසුන්' යන අරුත ද දෙයි. අහස් ගඟ ද සුදුයි. දෙව් අස්හු ද සුදු සි. එ හෙයින් මෙහි දී ගත යුත්තේ අහස් ගඟ ද දෙව් අසුන් ද යනු විසඳ ගත යුතු වෙයි. මේ හි දී 'සුර සිඳු' බඳු කොටැ පැවැසුණේ උඩු වියන හෙයින් 'සුර සිඳු යනු අහස් ගඟ ඇඟැවීමට යෙදුණු බව සලකාත හැකි.

'සු දු පිරිසුදු වියනුත් උඩැ බඳවා
මූ දු ඉඳුවර මල් දම් එහි රඳවා
වි දු කිදු සුරු රන් රසු දූල් යොාදවා
සැ දු සුර සිඳු බඳු වට තිර අදවා' යන

ගුත්තිල ද කව් වදනේ (230) 'සුර සිඳු' යනු දෙව් අසුන් ඇඟැවීමට යෙදිණි

වියනේ, සරහමිනේ, දමිනේ, පහනේ යනු වියන්, සරහමින්, දමින්, පහන් යැයි ගත යුතු. වැඩි 'ඒ' යන්න විරිත පිරීමට අමුතු වැ ගැනිණි.

**513. කොන් කොන්වලැ මිණි මුතු ලැල් එල්ලා, බන් නන් රන් දද නෙලෙනි වෙවුල්ලා, සුවඳ කලල් පිරිබඬ ගන් මින්, රන් නන් වන් මිණ් කිරණින් උදුල්ලා.**

කොනක් කොනක් නැරැ මිණි ගෙඩින් මුතු ලැලුන් එල්ලා, බඳිනා ලද රන් කොඩින් සුළගේ ලෙළවා, සුවඳ මඩ පිරිබඩ ගෙනැ (එ පිරිබඩ) රන් කැලුමෙනුත් නො එක් පැහැ මැණික් එළියෙනුත් වෙසෙසින් බබුළුවා.

මෙහි 'කොන්' යනු 'පල අග' පිණිසැ යෙදුණේ යි.

සුවඳ කලල් පිණිසැ සඳුන්, කපුරු, කස්තුරු, පිණි දිය ඈ දූය ගැනේ.

'කලල්' යනු 'කලල්ලා'යි යෙදීමට මෙහෙයැවෙන පමණට සැහැසි බව ලැබැ දෙත්තෙකි 'සුරා' මදයක් වන් එළි බලය.

කිරණිනුදුල්ලා = කිරණින් උදුල්ලා.
උදුල්ලා = උදුලමා

514. **දිගැ රස් වනවා රන් මිණි මුතු බැඳා, මං ඇගි, සොඳ පට ඇතිරිලි වනබා, සත සිත පිනවං, පිරි සඳ මඬල එව් මුනිඳුට නිසි අස්නක් මැඳ පනවා.**

(ඇම) අතේ කාන්තිය ඇතුරුවා සේ පැතිරෙන තියා-යෙන් රත් (කෙඳි), මැණික්, මුතු අල්ලා (සැදූ) මහත් අගය ඇති හෙවත් බොහෝ වටිනා පට ඇතිරිලි අතුරුවා, මිනිසුන් ගේ සිත පිනා යත පරිද්දෙන්, පුරා හඳ මඬුල්ල සේ, බුදු රජුට සුදුසු ආසනයක් මැද්දේ පනවමින්-

මඬලෙව් = මඬල එව්.

ඇතිරිල්ලට රත් අල්ලත්තේ කෙඳි වශයෙනි.

515. **දූසමන් මල් ඉස්නේ බිම වසවා, මැඳ අස්නේ මුනිඳුන් වැඩැ හිඳුවා, සිත තොස්නේ රහතන් වට හිඳුවා, ඉන් බුදු සස්නේ සිත පිනවා ලී යැ.**

දූ සමන් මල් ඉසීමෙන් බිම වස්වා (බිම වැසෙන සේ දූ සමන් මල් ඉස්වා), මැද (පනවන ලද) ආසනයේ බුදු රජුන් වැඩැ ඉන්දා, සිතේ සතුට ඇති වැ රහත් සඟන (බුදු රජුන්) වටා හිඳුවං, එයින් බුදු සස්නේ සිත පහන් කොටැ ලූයේ යි.

'දූ සමන්, ලී යැ' යනු දූසමන්, ලීයැ යි කොට වූයේ විරිත නිසා යි.

516. **රත් පලසින් වට කළ රන් මැඩ සේ, රත් පියුම් ඉළු මැඳ පත් රන් නැව සේ, රත් පිළිමිණි මැඳ දිලි ගිනි කඳ සේ, රත් තුරු මැඳ දිසි පුන් සඳ සේ-**

517. **පියුම් ඉළු වට කළ රත් පියුමක් සේ, පෙති මැඳ වැඳ සිපි කෙසුරු සළා සේ, කෙසුරන් පිරි වැරු රන් කෙමියක් සේ, සඟ පිරිවැරු මුනි සොඳ සේ බබළයි.**

රත් පැ කම්බලයෙකින් වට කැරුණු රත් කණුවක් සෙයින් (ද), රත් තෙළුම් වනය මැදට පැමිණි රත් නැව සෙයින් (ද), රත් පැ පළිඟු මැද්දේ දිලියෙන ගිනි කඳ සෙයින් (ද), රත් පැ තාරකා පෙළ මැද්දේ දිලෙන පුන් සඳ සෙයින් (ද), පියුම් වනයෙක් වට වූ රත් තෙළුම් මලක් සෙයින් (ද), පෙති මැද්දට වැදී සිටිනා කෙසුරු සුළියක් සෙයින් (ද), කෙසුරින් වට වුණු (තෙළුම්) බටුවක් සෙයින්(ද) සඟන වීසින් පිරිවරන ලද මුනි තුමා මනා වැ බබළ යි.

වටා හිඳිනා සඟන රත් පලසක් වැන්නෝ යි,
එ සඟන මැද වැඩැ හිඳිනා මුනි රත් කණුවක් වැනියි.

වටා හිඳිනා සඟන (රත්) තෙළුම් වනයක් වැන්නෝ යි,
එ සඟන මැද වැඩැ හිඳිනා මුනි එ තෙළුම් වන මැද වූ රත් නැවක් වැනි යි.

වටා හිඳිනා සඟන රත් පළිඟු වැන්නෝ යි,
එ සඟන මැද වැඩැ හිඳිනා මුනි ගිනි කඳක් වැනි යි.

වටා වැඩැ හිඳිනා සඟන රත් පැ තරු පෙළක් වැන්නෝ යි,
එ සඟන මැද වැඩැ හිඳිනා මුනි පුන් සඳ වැනි යි.

වටා හිඳිනා සඟන (රත්) තෙළුම් වනයක් වැන්නෝ යි,
එ සඟන මැද වැඩැ හිඳිනා මුනි (රත්) පියුමක් වැනියි.

වටා හිඳිනා සඟන (රත්) තෙළුමෙකැ පෙති වැන්නෝයි.
එ සඟන මැද වැඩැ හිඳිනා මුනි පියුම් පෙති මැද කෙසුරු සුළිය වැනියි.

වටා හිඳිනා සඟන තෙළුමේ කෙසුරු සුළිය වැන්නෝ යි,
එ සඟන මැද වැඩැ හිඳිනා මුනි කෙසුරු සුළිය මැද ඇති (තෙළුම්) බටුව වැනි යැ.

එක් මැ අරුතැ 'සේ' යනු අට පළෙකැ එළි වැටට සිටැ වූ සැටි හෝබනේ නො වේ.

පියුම්එ වට කළ රත් පියුමක් සෙසු පියුමට වෙසෙස් වැ පෙනෙතියි කො සිතියැ හැකි.

පෙත්තෙන් වට වූ කෙසරු සළාව ද වෙසෙසින් මතු වී නො පෙනෙ යි.

එ අයුරු උපමා පළමු දැක්වුණු උපමා සෙයින් වෙසෙස් නො වේ.

518. **සුරිඳුන්නේ මිණි කිරුළින් පුද ලත් මුනිඳුන්නේ සවනක් රස් විහිදෙත් පහ පල බිත් එ මැ වැදූ දිලියෙන්නේ සත් රුවනින් නො කළත් කළ වැන්නේ.**

(සක් දෙව් රජුන් ගේ මැණික් වොටුන්නෙන්, පූජා ලැබූ මුනි රජුන් ගේ සය වනක් රස් විහිදෙන කල්හි පහයේ පලත් බිතුත් ඒ (රස්) මැ වැදී දිලෙන්නේ සත් රුවනින් නො කළත් (එයින්) කළා මෙනී.

519. **විදුලි සහස් සේ සොඳවා රන් පලු, ඉඳු දුනු සුවහස් සේ දද, බඳවා අස්සේ සිදුරු නො වැ ගඟ වැසුවං මෙන් නැව් පසු පස්සේ යොදවං ලී.**

විදුලිය දහස් ගණන් සෙයින් දිස්නා රන් පත් තිරු ද, ලක්ෂ ගණන් දෙව් දුනු වැනි කොඩි ද බඳවා අතර ඉඩ නො සිටින්නට ගඟ වැසුවා සෙයින් නිසි නැව් එකකට එකක් පසු පසු වැ සිටිනා පිළිවෙළට සලස්වා -

සිදුරස්සේ = සිදුරු අස්සේ

'ලී යැ' යනු විරිත නිසා 'ලි යැ' යි වී.

520. **මෙ ලෙසින් නැව් එක රගට සදමින් රජ සෙන් හැම පිරිවරට සලසා ගඟ දියට කර පමණක් බසිමින් මුනිඳුන් වැඳැ රජ මේ ලෙසට කී.**

මේ කියූ අයුරු නැව් එක් ආකාරයට සරසා ·සියලු රජ සෙන් පිරිවර පිණිසැ යොදවා, ගඟේ කර වටක් දියට බැසැ බුදු රදුන් වැඳැ රජ මෙ සේ කී යැ.

'ඉක්බිති බිම්බිසාර රජ්ජුරුවෝ කර වටක් පමණ දියට බැසැ දෙහොත් මුදුනේ තබා ගෙනැ "ස්වාමිනි යම් තාක් වැඩැ මදුරන සේක් ද ඒ තාක් මෙහි මැ වෙසෙමි" යි දන්වා නැව යවා තුමූ නැවැත්තා හැ.'

යනු බුත්සරණයේ එයි.

පැදියේ අග 'ට' යනු 'ටා' යි වූයේ සඳැස නිසා යි.

521. **සම මෙත් මුනි එ රදුන් රටැ හැම උවදුරැ දුරැ කොටැ මෙ තැනට වඩනා මම පෙම වඩමින් ඔබ ගුණ සිහි කොටැ කොටැ නුවරට නො ගොසින් ඉඳිමැ' යි කී.**

'(සියල් සතුනට) සම වූ මෙත් ඇති බුදු රජු එ රජුන් ගේ රටේ සියලු උවදුරු දුරු කොටැ මේ තැනට වැඩැ වදාරන කල් මම් නුවරට නො ගොස් ඔබ ගේ ගුණ සිහි කරමින් ප්‍රේමය වඩ වඩා (මෙහි මැ) ඉඳිමි' යි කී යැ.

522. **එ කෙණෙහි සඟ පිරිවර මුනි දැකුමට ලඟ දිව නග කැල පෙණ කැල පෙනුණෙ. මන දඟ වන සුරඟන රඟ සැදුණේ. ගඟ සුදු රත් පිපි පියුමෙන් සැදුණේ.**

එ සැණයේ සඟන පිරි වැරූ බුදුන් දක්මට ලං වූ දිව්‍ය නාග සමූහයා ගේ පෙණ කැලෑව පෙනුණේ යැ. සිත බැඳෙන්නා වූ දෙව් ලියන් ගේ රැඟුම් ඇති වූයේ යි ගඟ පිපුණා වූ සුදු නෙළුම් මලිනුත් රතු නෙළුම් මලිනුත් සැරැහුණේ යැ.

523. **ලොවට සෙත කරනුව එ සුගත වඩිති අසා සක්විති රජ සැපත සැපත් වූ මෙන් සිත සතොස්වා-**

ලෝකයාට සෙත් කරනු පිණිසැ ඒ බුදුන් වැඩැ වදාරනවා යැයි අසා චක්‍රවර්ති රාජ සම්පත් පැමිණියා මෙන් සිත සතුටට පමුණුවා-

524. **කප් කෙළ සුවහසේ බුදුනැ යන නම මෙ ලෙසේ නො ඇසෙසි. එ බැ සේ අප මෙ සේ සිටිනු නො සෙදෙසි.**

'කල්ප කෝටි ලක්ෂයෙකිනුත් බුදුන් යැ යන නම මෙ අයුරින් නො ඇසේ. එ ඇසිල්ලේ අප මෙ අයුරින් සිටින එක සරි නැතියි.

## ඈ. විසල් පස සැදුම

'මොක් සිරි දෙන මුනිඳුන් ගේ      උපතකි
කප් කෙළ සිය දහසෙකිනුත්      නොලදැකි'
යි මෙ හිමියෝ මැ වදළ හ ලෝවැඩ සඟරාහෙන් (32).

525. **මුනි සඳ වඩින්නෙන් සිතැ මෙත් කුළුණෙකින්-නේ මෙ අප නරයන්නේ කළ මහත් පිනෙකැ පලදුන්නේ.**

මුනි උතුමා වැඩැ වදරන්නේ සිතේ මෛත්‍රී කරුණා-වෙකිනි. මේ අපේ මිනිසුන් ගේ (පෙරැ) කළා වූ මහත් වූ පිනෙකි පලදුන්නේ.

526. **දුක් වුන්නෝ අපි යැ, දුරැ ලන්නෝ උතුමෝ යැ, වඩින්නෝ බුදුහු යැ, පෙර ගමන නො කරන්නෝ කවුරැ?**

දුක් විඳියෝ අපි වෙමු, (එ දුක්) දුරු කරන්නෝ උතුමෝ යැ, වැඩැ වදරන්නෝ බුදුහු වෙති (ඔවුන් වහන්සේ) පෙරට ගමන් නො කරන්නෝ කවුරු ද?

521. **එ බැවින් අප වෙතට වඩනා තිලෝගුරු හට මහ පුදක් අප හෙ බල පමණට නිසි කොටැ කරම් හ යි-**

ඒ නිසා අප කරා වැඩැ වදරන තුන් ලෝ ඇදුරු තුමහට මහත් වූ පූජාවක් අපේ සවියේ තරමට සුදුසු වන නියායෙන් සදා කරමු යි-

528. **තුන් සිය යොදුන් රට නුවර උන් දන රැස් කොටැ මුනි පුදයට කරන මග නිසි කොටැ සරහනට යොදැ.**

තුන් සියක් යොදුන් වූ රටේ ද නුවරෙහි ද උන්නා වූ මිනිසුන් රැස් කරවා මග සැරැසිම සුදුසු පරිද්දෙන් කරන්නට යොදවා-

529. **අප හිමියෝ අපට නිවනට මග සැරැහූ යැ, එ වැනි සුගතිඳු හට මග සදනු මෙ අප හට අරුම කිමැ-**

අපේ හිමි තුමෝ අප උදෙසා තිවතට මහ සැදූ වේයි, එ අයුරු (දුයක් කළ) සුගත් තුමාණන් උදෙසා මග සැරැසීම අපට කවර නම් අරුමයෙක් ද? (කියා-)

530. **එ පුරෙහි පටන් කොට ගං අතරට තුන් යොදුන කණු මුල් කැට දමා බෙර ඇස සේ මැ සම කොට තනා-**

එ (විසල්) පුරෙන් පටන් ගෙන ගං (ඉවුර) අතරට ඇති තුන් යොදුන කණු මුල් (ගල්) කැට ඉවත් කොට බෙර ඇස සෙයින් සම තල කොට සද-

531. **වැලි එවැ බිම අතුට රිදී පට සේ සුදු කොටැ මනැ ළෙ පිටැ ඇම තැනැ රන් රිදී මිණි වැට පහන් ලං-**

වැලි දමා බිමැ අතුරමින් රිදී පටක් සේ සුදු කොටැ, පාර දෙ පැත්තේ සියලු තැනැ රන් වැට පහන් රිදී වැට පහන් මිණි වැට පහන් තංවා-

532. **බිගු දුල් මුමන ගත් සුවඳ ඇති අපමණ කුසුම් මග දෙරණ පුරවා තනා ඇම තැනැ මැ අතරණ කැරැ-**

දුල් බැදැ ගත් මී මැස්සන් ගුමු තද දෙන්නා වූ, පමණක් නැති මල් පාරේ බිමැ පුරවා සියලු තැනැ මැ අතුරුවා පිළියෙළ කොටැ-

533. **නන් පුන් කුඹු තබා, බඹ දිගු කැණ් ඔලඹා රන රඹ සිටුවා අතුණු නො තබා මල් කැන් ලඹා-**

නො එක් විදියේ පුන් කලස් තිබා, බඹය දිග කැන් ලඹ දෙන රන් රඹ ගස් සිටුවා, අතරක් නැරැ මල් කැන් ලඹ දෙවා-

'ලඹ දෙන' යන අරුතෙහි 'ඔලඹා' යනු යෙදූ සේ මනහර නො වේ. 'බඹය' යන අරුතෙහි 'බඹා' යනු යෙදීම ද එ අයුරුයි. 'ලඹ දෙවා' යන අරුතෙහි නම් 'ඔලඹා' යනු මඳක් ඉවැසියැ හැකි.

534. **සුදු පට වට ඇඳ, රන් කලශෙ කෙහෙලි බැඳැ**
**මග සොඳේ සරසා සත් දහස් සත් සියක් සත් නිරිඳෝ-**

(වට තිර හැටියට) සුදු රෙදි හාත් පසින් ඇඳ, රන් රිදී කෙහෙලි කොඩි බැඳැ මනා සේ පාර සරහා සත් දහස් සත් සිය සත් රජහු තුමූ-

සුඳේ = සුදු
සෝඳේ = සොඳට

535. **මී වදයෙහි ගඳට ඉව් කොටැ දුවන බිඟු මෙන්,**
**තද ගිම් කලැ දියට විලට දිවෙන ගජ සෙන් ලෙසින්-**

මීවදයේ ගඳ ඉව කරමින් එයට දුවන්නා වූ මී මැස්සන් සෙයින් (ද) දැඩි උෂ්ණසුම පවත්නා (නියං) කල්හි දිය පිණිසැ විලකට දිව එන ඇත් සෙන් සෙයින් (ද)-

536. **මස් ගැසූ ගොදුරට දිවැ එන මසුන් විලසට**
**යාගෙහි කිරිබතට එක විටැ දිවැ එන බමුණන් ලෙසින්-**

මසකු ගොදුරු ගැසූ හඬ අසා එ කරා දිවැ එන්නා වූ මසුන් සෙයින් (ද), යාග පූජායෙහි කිරි බත් පතා එක් වට මැ දිවැ එන්නා වූ බමුණන් මෙන් (ද)-

537. **දන් දිමට දොර හල ද, සත් රුවන් පිරි ගෙට**
**ඔවුන් ඔවුන් පසු කොටැ දිවැ එන දිළිඳුන් විලසට-**

දන් දෙනු පිණිසැ දොර හැරැ තිබුමත් සත් වගේ රුවන් පිරී ඇති ගෙට උන් උන් පසු කෙරෙමින් දිවැ එන දිළිඳු දනන් සේ (ද)-

538. **තුන් යොදුන මැ තොසෙ තුන් පියවරින් යන**
**සේ මහ පිරිස සමගැ එ මැ සේ ගං තෙරට ගොසින් වැඳූ-**

තුන් යොදුන මැ සතුට නිසා තුන් පියවරින් යන්නා සේ මහ පිරිස් කැටි වැ එ ඇසිල්ලේ ගඟ බඩට ගොස් වැදී-

මහ පිරිසේ = මහ පිරිස

539. **එන බුදු රස් බලා කමල් විල් පිපෙන සේ**
**වෙසෙසින් තුටු වැ ලං සිටි දෙසට ඉස ලා මුනී නැමැදැ-**

එන්නා වූ බුදු රස් දැකැ තෙළුම් විල් පිපෙන්නා සේ විශේෂයෙන් සතුටට පත් වී (බුදුන්) සිටි පැත්තට හිස නමා බුදුන් හට නමස්කාර කොටැ-

'කමල්' යනු 'කමලා' යි යොදන පමණට ගත් කරුවාණන් සැහැසි වූයේ එළි බලයෙනි.

540. **මහ පුද කාට ඇටියෝ, රුසිරින් සුරන් සැපියෝ, මුනි ගුණ දූවැටියෝ වඩන මුනි දෙසැ බලා සිටියෝ.**

මහත් වූ පූජා කරන කැමැත්ත ඇතියෝ, රූ සපුයෙන් හෙවත් රූප සම්පත්තියෙන් දෙවියන් බඳු වූවාහු, මුනිඳුන් ගේ ගුණ (සිතේ) වෙළී ඇති තැනැත්තෝ වැඩැ වදුරන්නා වූ බුදුන් දෙසැ බලා සිටියෝයි.

පළමු (534) පැවැසුණු 'සත් දහස් සත් සිය සත් තීරිඥෙ' යන්න හා සබඳි.

අටිය (ආසාව) ඇත්තේ 'ඇටි' යි.

කට (කරනු) ඇටියෝ කටැටියෝ යි.

541. **අහසැ විදු මෙන් සිටැ සුර සෙන් කරන පිදු මෙන් (යුතු වැ) එ තෙරැ සිටි නරනිඳුන් යෙදුමෙන් නැව් සෙනග පැදුමෙන්-**

අහසේ විදුලිය සෙයින් සිටැ දෙව් සෙන් (දිව්‍ය සේනාවන්) කරන්නා වූ පූජයෙන් යුතු වැ, එ හොඬේ සිටිනා රජුන් ගේ, නියෝගයෙන් නැව් සෙනඟ කරන පැදීම නිසා-

542. **රස් වතුරේ දූවැටි නරන් රන් රූ සැටි කරමින් මුනිඳුන් පිහිටි නැව නිවන් පුර සේ මැ අවුත් ගොඩ දිටි.**

රස් නමැති වතුරේ (නැත්නම් මහ වතුරක් වන් රස් කඳේ) දූවැටුණා වූ මිනිසුන් රනින් කළ රූ බඳු කරවමින් මුනි රජුන් වැඩැ හිඳිනා නැව නිවන් පුරය මැ බඳු වැ අවුත් ගොඩ දුටුයේ සී (හෙවත් ගොඩට ළඟාවූයේ යි).

සේ මැ වුත් = සේ මැ අවුත්

**543. නරනිඳුහු එ මැ විටැ ගල පමණක් දියට බැසැ නැව ගොඩට ඇඳැ ගෙනැ එ ගොඩට බුදුන් බාවා ගත් හ.**

රජහු තුමූ එ විග සේ කර වටක් දියට බැසැ නැව ගොඩට ඇඳැ ගෙනැ එ ගොඩට බුදුන් බස්වා ගත් හ.

**ඉ. ගඟ තරණය**

**544 මිණි බර කිරුළු විලසට පිය නිරිඳු සිරසට (පත්) කාළදේවල රුසින් මුඳුනට මල් වට බවට පත්.**

මිණියෙන් හෙවත් රුවනින් බර වූ වොටුනු සිරින් පිය රජු ගේ හිසට පැමිණියා වූ, කාළදේවල රුසියාණන් ගේ හිස් මුඳුනෙහි තුබූ මල්ගුළා හෙවත් වට කොටැ තැනූ මල් කලප් බවට පැමිණි-

ඒ කියේ (මේ සිරි පා) පිය රජු රුවන් කිරුළු දරන්නා සේ හිසින් දරූ බව හා, කාළදේවල රුසියාණන් ගේ හිස් මුඳුනේ මල් ගුළා සෙයින් රැඳුණු බවත් යැ.

සිදුහත් කුමරුන් උපන් බව අසා එ ද ඔවුන් දක්නට පැමිණි කාළදේවල තවුසනට කුමරුන් දක් වූ පිය මහ රජ තෙමේ පුතු ලා එ තවුසන් වඳවන්නට තැත් කරත් මැ ඔවුන් ගේ සිරි පා එ තවුසන් ගේ ජටා මතැ රැඳුණේ යි. ඒ යැ 'කාළදේවල රුසින් මුඳුනට මල් වට බවට පත් විණි' යි කියේ.

එ දිනේ ද පිය රජ තෙමේ පුතු වැන්දේ යි.

'සුද්ධෝදන රජ්ජුරුවෝ............'මම නුඹ වහන්සේ උපන් දා කාළදේවල නම් සෘෂින් ගේ තලල් මැද නුඹ ගෙ තෙල සිරි පතුල් දෙක පෙනී ගිය ප්‍රාතිහාර්ය දැකැ සතුටු වැ එ ද ද මේ සිරි පතුල් දෙක තලල් තබා වැන්දෙමි. ඒ මා ගේ පළමු වන වැඳීම යැ. නව ද නුඹ පස් මැසි කලැ වප් මඟුල් කරන ද දඹ ගස මුලැ දී කළා වූ ප්‍රාතිහාර්යය දැකැ සතුටු වැ එ දත් මේ සිරි පතුල් දෙක වැන්දෙමි (මෙහි 365 පැදිය). ඒ මා ගේ දෙවන වැඳීම යැ. අද........ මේ තුන්

වත වැදීම යැ" සි කිය කියා......... බුදුන් පා පිට මැ වැදැ පෙරළී ගිය හැ.' සි පිය නිරිඳු සිරසට...... මෙ සිරි පා පත් සැටි කියසි පූජාවලිය.

545. **කොසොල් රද රද හස තුටු කළ පිපි පියුම් ලෙස, දනපල් ඇතු සිරසැ එ ගැ කිරි සිඳුරැ පා ඇසැ පැ.**

කොසොල් රජු නැමැති රාජ හංසයා සතුටට පත් කළ පිපුණා වූ නෙළුම් මලේ හැටි (පැ) දන පල් ඇතු සිරසැ එ ගැ කිරි සිඳුරැ පා ඇසැ පැ–

හංසයෝ නෙළුම් මල් පැණි බී තුටු වෙති. කොසොල් රජ බුදුන් ගේ සිරි පා නැමැදැ සැදැ බැති දක්වන්නෙකි. ඒ ප්‍රසේන ජිත් (පසේනදි) කොසොල් රජ රාජහංසයෙක් නම් බුදුන් ගේ සිරි පා ඒ රාජ හංසයාට තොස දෙන පියුම වෙයි.

එ ද, දමනය වූ ද දන පල් ඇතු ගේ හිසේ ගැ ඇත් ගුරු පාත්‍රයේ සැටි මිනිසුන් ගේ ඇසෙහි ඇත්දේයි හෙවත් ඇසට දැක්වූයේයි බුදුන් ගේ සිරි පා. දමනය වූ ඇතා බුදුන් ගේ සිරි පා වඳින් මැ ඔහු ගේ හිසේ ඇත් ගුරු පිරි පාත්‍රයෙකින් ගුරු පිරියම් කැරෙන්නා සේ පෙනේ පා කැලුම් උගේ හිසේ ගැටෙන.

දනපාලයා නම් අජාසත් රජු ගේ 'නාලාගිරි' නම් ඇතායි. දෙව්දත් තෙරුන් ගේ බසට නැමුණු අජාසත් රජු ගේ අනුදැනුම පිටැ ඇත් ගොව්වෝ එ ඇතු රා පොවා මද නංවා කොහොලින් ඇනැ කුප්වා බුදුන් නස්නට එ තුමන් වඩනා පෙර මගට යැවූ හ. ඇත් තෙමේ දැමුණේයි, බුදුන් සිරි පා වැඳැ දහමේ හික්මුණේයි.

'මිනිස්සු ඒ පෙළහර දැකැ සකොබ මුහුදු හඬ සෙයින් ගුගුළ හැ. සෙණ හඬ සෙයින් අපොළා පී හැ. ඔහු සොම්නස් වැ තත් අබරණ ඉසැපී හැ. එ අබරණින් ඇතු සිරුරු පිළිසන් වියැ. එ තත් පටන් ගෙනැ නාලාගිරි ධනපාල නම් වියැ.'

යනුයෙන් නාලාගිරියා ධනපාල වූ පරිදි ගුරුළු දැමි ඇදුරෝ පවසති (අමා: ව: 238).

546. **උසින් තම හට වැඩි කෙනකුන් නැතිසි එඩි කාල, රිවි සඳ කිරණ මැඩි, එ බඳු රා අසුරිඳු ගෙ මන් මැඩි.**

උසින් තමා හට වැඩි තරම් වත කෙනෙක් නැත්තා හ යි අහංකාර වූ, ඉරේ හඳේ රස් මැඩැ ලූ, එ අයුරු උස මහත අබිමන් ඇති රාහු නම් අසුරිඳු ගේ උඩඟු බව මිරිකා දැමූ-

'රාහු නම් අසුරිඳු උස සාර දහස් අට සියක් යොජනැ, ඔහු බා අතුරු එක් දහසක් යොජනැ. බොල සසියක් යොජනැ. හිස නව සියක් යොජනැ. නළල තුන් සියක් යොජනැ. බැම අතුරු පනස් යොජනැ. නැහැ තුන් සියක් යොජනැ මුව දෙ සියක් යොජනැ. ගැඹුරු තුන් සියක් යොජනැ. අතුල් පතුල් පළල තෙ සියක් යොජනැ. ඇඟිලි පර්ව පනස් යොජනැ. මෙ සේ වූ රාහු අසුර බුදුන් ගේ මහත් අසා "ලෝකයෙහි මට වඩා මහත් කෙනෙක් නම් ඇද්ද" යි බුදුන් කරා නො එළැඹෙයි සෙසු අසුරන් බුදුන් ගෙ මහත් කියන් කියන් "ඔස ඔහු ගේ මහත් හෝ මා ගේ මහත් හෝ බැලූව මැනැවැ" යි බුදුන් කරා ගියේ.

බුදුහු ඔහු එන බව දැනැ "සතර ඉරියව්යෙන් කුඩා ඉරියව්යෙක් කවර හො" යි අවජනාහු හෝනා ඉරියව් කුඩා සේ දැකැ "හෙවැ ඔහු දක්කුව මැනැවැ" යි සිතා "අනඳ මෙහි හෝනා දූයක් අතොට ලා" යි වදාළ හැ "මැනැවැ වහන්සේ" යි මහ තෙරහු හැඳක් ඇරැ තබා යහන් සැළැසූ හු. බුදුහු සිංහ ශය්‍යායෙන් පා මත්තෙහි පා තබා ගෙනැ එහි වැඩැ හොත් හැ. රාහු අසුරිඳු අවුදු එ මැ දවස් උපන් ළදරුවකු පත්ලක් සේ මෙළෙක් වූ පියුම් රා මිණි වන් රස් විහිදුනා අට තුරාසියක් මඟුල් ලකුණු පිරිවර ලද්දූවි දහස් තිම් නැබ සියෝ සක් ලකුණෙන් විසිතුරු පතුල් දිටි. එ සඳැ බුදුහු "කුමක් බලයි අසුරා" යි වදාළ හැ "තොප පත්ලෙහි කෙළවර බලමි" යි කී හැ. "තෝ හව අග් දක්වා නැගී මා පත්ලෙහි කෙළවර බළහි නම් දක්නට නො තිස්සෙහි" යි

වදාළෝ. එ බස් අසා රාහු අසුරිඳු වැඩැ හොත් බුදුන් මුහුණ බලනුයේ තුබ මුදුනෙහි සිටි පුන් සඳක් බලන මිනිසක්හු සෙයින් බැලී යැ. “මේ ලෝකයෙහි තොප වහන්සේට වැඩි මහත් කෙනෙක් නම් නැති” යි පැහැදැ, වැඳැ සරණ ගියේ.’

ගුරුළුගෝමි ඇදුරන් ‘රා අසුරිඳු මත් මැඩි’ අයුරැ පවසන්නේ එ සැටියෙනි (අමා: ව: 262–263).

තව ද විසිතුරු පූජාවලියේ එකුන් විසි වන පිරිසිඳුම බලා දත්තේයි.

547. **තමා සන් දූරැ, මොලොක් ගුණයෙන් දුරැ ගලට ද, ළදක් සිත් පිත් දුරැ නොයෙක් ගිරි තුරැ පවා වඳවන-**

තමා ගේ ලකුණ දූරුවා වූ, මොළොක් ගුණය නැති ගලට පවා හුදක් සිතක් පිතක් නැති ගිරි තුරු ද වඳ-වන්නා වූ-

මෙහි ‘තමා ගේ’ යි කීයේ සිරි පත්ලේ යි.

ගල මෙළෙකින් තොර වූවෙකි. එ සේ වූ ගල ද පවා මේ සිරි පා ලකුණ දරයි නම් මිනිස්සු ඒ වඳිති පුදති. මිනිසුන් එ වඳිනු පුදනු කවර අසිරි ද? ගස් ද එය වඳියි. කන්ද එ හැම පිටින් සිතක් පිතක් නැති එකෙකි. ගස් ද සිත් පිත් නැති දෑයයි. එ සේ මුළුමනින් සිත් පිත් නැති කඳු ගස් ද මේ මෙළෙකක් නැති ගල වඳී. ඇයි? එය වඳවන නිසා. කවරෙක් ද ඒ වඳවන්නා? සිරි පා යැ කිමෙකින් ද ඒ වැඳැවීම කරවන්නේ? එ ගල දරන සිරි පා ලකුණෙනි.

මේ සමනොළ සඳහමින් පවසන ලද්දෙකි. (201–202 යන පැදි ද විමසා බලන්නේ යි).

548. **මෙරට දික් කළ හොත් නැමි ගෙනැ සිටැ උසුලන, දියතට සක්විති බව මැ ලොවට පැ-**

මෙර ගලට දිගු කළ හොත් එය නැමී සිටැ ගෙනැ උසුලන්නා වූ, ලොවට චක්‍රවර්ති බව මැ සක් (චක්‍ර) ලකුණෙන් ලෝ වැසියාට පෙන් වූ (216 වන පැදිය බලැන්නැ).

'සක් රුවන හැරිය ද
එ සක් ලකුණෙන් මන න ද
ඇසිරු සාලෙව් සොඳ
සරණ දෙරණතට දිගු කළ සඳ'

යනු සිරි රගල් හිමියෝ වදරති (කා: සේ: i. 97)

549. **ගලැ වුව එරී යන, පුදුනැ වුව රළ නො මැඩෙන හැම ලකුණෙන් සොබන, සුපිපි සත් බුමු පියුම් පිටැ යන.**

(දූසි වූ) ගලේ වුව ද එරී යන්නා වූ, (මොලොක් වූ) පුලුනේ වුවත් රළ මිරිකෙන්නේ නැති, සියලු සුබ ලකුණෙන් හොබනා වූ, මනා වැ පිපුණු සත් මාලේ නෙළුම් මල් මතු පිටින් යන්නා වූ-

550. **බඹ සුර නර මුදුන් විලැ පිපි පියුම් සිරි දුන්, සිඹුමැලි වන, නඳුන් සිරි පා මුනිඳුන් දෙරණ තබන-**

බඹුන් ගේත් දෙවියන් ගේත්, මිනිසුන් ගේත් හිස් මුදුන් නැමැති විලේ පිපුණු නෙළුම් මලේ සිරිය දුන් වූ, මුදු මෙලෙක් වූ, සිත් තුටු කරන්නා වූ සිරි පා බුදු රදුන් බිමැ ඔබා වදරත් මැ-

බඹ සුර නරන්ගේ මුදුන් විලක් මෙන් ද, සිරි පා එ විලේ පිපිණු නෙළුම මෙන් ද සැලැකැවීමෙන් අහවත්නේ බඹුන්, සුරන්, නරන් බුදුන් ගේ පා වැඳි බවයි.

ඊ. සුබ නිමිති

551. **බව ගිම් හැරැ එ රටැ වස්වන 'දහම් වැස්සට සැක දුරු කොටැ එ මැ විටැ ලොවට පාන පෙර නිමිති සේ-**

සංසාර දුක් තැමැති ගිමත දුරු වත පරිද්දෙන් එ රටේ දී වස්වත දහම් වැස්සට සැක දුරු කරමින් එ වේලේ මැ ලෝ වැසියාට පෙන්වන පෙර නිමිති පරිද්දෙන්-

මේ කියත්තට පටත් ගත්තේ බුදුන් මෙ ගොඩැ සිරි පා ඔබත් මැ වැස්ස පටත් ගත් හැටියි.

552. **දුබ්බික් දුකට මුල බව තද රිවි කිරණ මැ යැ. එ බැවින් ඒ මෙ විටැ දෙරණට වැද්ද නො දෙමිසි යනු සෙ-**

'සා බියෙන් යුත් දුකට මූල (නම්, බිමට) බැස්සා වූ දැඩි ඉර අව්ව මැයි. එ නිසා මෙ කල්හි එය බිමට වැදීමට නො දෙම්' කියන්නා සේ-

553. **නිල් පැහැ කාවද ගෙනැ, මහ ගිරි දුදුළු පැනැ ගෙනැ දිවෙන මහ සෙන් මෙන් නුබ වසා ගන අඳුරු කොටැ ගෙනැ -**

නිල් පාට වම් හෙවත් සන්නාහ ලා ගෙනැ, මහත් වූ ඉක්මැවීමට අමාරු (දුර්ග) කඳු පැනැ ගෙනැ දිවැ එන මහ (යුද) සෙන් සෙයින් අහස වසමින් වැසි අඳුරු හෝ ඝන වූ අඳුරු කොටැ හෝ ගන්මින්-

554. **'අප මුනිඳු වැඩි දෙසැ කුණු රුස නො තිබියැ යුතු යැ, (එ ඉවතැ) දමව'සි කියන ලෙසැ ගන ඝොසින් දස දෙස පුරා ගෙනැ-**

'අපේ මුනි තුම වැඩැ වදාළ දෙසේ කුණු ගොඩවල් නො තිබියැ යුතු යි, ඒ (කුණු රුස්) බැහැර ලව' යි කියන්නා සේ වැසි ඝෝෂායෙන් දස අත පුරා ගන්මින්-

555. **යක් සෙනඟ විදිනට දෙවියන් ඇරැ ගත් දුනු රඟ, නන් පැහැ තරඟ ගත් ඉඳු දුනු රුසින් සුර මඟ සඳ-**

යක් සෙන් විදිනු පිණිසැ දෙවියන් අතට ගත් දුනු වැනි වූ, නො එක් පාට රළ හැරැ ගත්තා වූ දේදුනු සමූහයෙන් අහස සරහා-

556. **අප හිමි මුනි පුදට සිකි නල රඟන රැඟුමට හල මල් ඇඳිලි විලසට නුබ නැඟෙන කොක වැල සඳ–**

අපේ ස්වාමි මුනි තුමාට පූජා පිණිසැ මොනරුන් නැමැති නළුවන් (නාටකයන්) රඟුම් දක්වමින් කරන තැවුමට දැමූ මල් ඇඳිලි පරිද්දෙන්, අහසට නගිනා කොක් සමූහයා සරහා–

මල් ඇඳිලි නම් මල් අතින් යැ.

වැසි පෙරට මොනරු නටති. කොක් සමූහයෝ අහස් නගිති.

මලැඳිලි = මල් ඇඳිලි.

557. **මුනි පුදයට ලකුළු දිව සළු විදු පත් කරන සේ ගන කුළු පළා ගෙනැ හෙන විදුලි දළු හෙළි කැරැ–**

බුදුන් පිදීමක් හැටියට සැරැහූ දිව්‍ය සළු දිගැ හැරැ ලන්නා සේ වලා කුළු පළා ගෙනැ වැටෙන්නා වූ විදුලි දළු පළ කරමින්–

558. **නැබුළු හිම වන පෙනැ ගිරි කුළු ඉපිලැ නැඟි මෙන් අඳුන් කුළු සේ කළු ගන කුළු නුබ වසා පතළේ යැ.**

මහත් වූ හිමවු වන පියෙසේ කඳු මුදුන් ඉපිලී හෙවත් උඩට එසැවී නැංගා මෙන්, අඳුන් කුළු සෙයින් කළු වූ වැසි වලා කුළු අහස වසා පැතිරියේ යි.

559. **වැසි වැසැ වතුරු වියැ. කුණප කුණු හැම දුරු වියැ, එ පුර පිවිතුරු වියැ, එ වර නො එක් තුරු ලිය ද අකුරු වියැ.**

වැසි වැසීමෙන් ජලගැල්ම ඇති වැ බැසැ ගියේ යි. මළ සිරුරුත් කැලි කසළත් යන සියල්ල දුරු වූයේයි. එ පුර දෙසින් හෙවත් කිලිටි බැවින් මිදුණේයි (=පවිත්‍ර වූයේයි), එ විටැ සියලු ගස් වැල් දළු මොට්වූ සහිත වූයේයි.

දකුරු = ද අකුරු.

560. **විල් වාපි ගං හෝ ද නො හැර පුරවාපි, මහ ගිම් නිවා පි, සතුන් සිත සතොස කරවා පි.**

විල්, වැව්, ගං, හෝ (එකකුත් නැර සියල්ල) පුරවා ලූයේයි, දැඩි ගිමත නිවා දැමී, සතුන් ගේ සිත තොස් සහිත කරවා ලූයේයි.

561. **සෙනග සහ මහ රජ ගණ තම තමා බල පමණ අපමණ නන් පුද වතින් සඟ ගණ සහ මුනිඳු පුදා-**

සේනාව සහිත මහ රජ සමූහයා තම තමනට පිළිවන් හැටියට (මෙ තෙකැයි) පමණ නැති නො එක් විදියේ පූජා බඩුවලින් සඟ පිරිස සහිත බුදු රජු පුදා-

562. **සුර බඹ සෙන් සමග මන රග පුද යොද යොදා අතර මගැ සැතැපී තුන් දවසෙකින් පුර ලගැ වූ යැ.**

සුර බඹ සෙන් සමඟ මන රඟ පුද යොද යොදා අතර මඟැ සැතැපී තුන් දවසෙකින් පුර ළඟැ වූ යැ.

(උභ තුමූ) දෙව් බඹ සෙනඟ ද හා එක් වැ සිතට තොස දෙන පූජාවන් සලස සලසා, අතර මඟැ සැතැපුම් ගන්මින් (ගොස්) තුන් දවසෙකින් පුරට ළං වූවෝයි.

## 17. විසල් වාසල් අසල්

### අ. සෙන

563. **මුනිඳු පුර වෙතැ වන, පුද කොටැ සුර සෙනග එන උන් දැකැ සිත බිය වැ යක් සෙන් නො සිටැ දස අතැ දිවූ.**

බුදු රජු පුරයට ළං වන් මැ (එ තුම හට) පූජා පවත්ව-මින් දෙව් පිරිස් පැමිණෙන විටැ ඔවුන් දැකැ සිතට බිය ගන්මින් යක්ෂ සේනාවෝ එහි නො සිටැ දස අතේ දිවූ හ.

564. **යකුන් පිසසුන් යන, හැම රෝ දුක් පසුන් වන මුනිඳුන් බුදු සසුන් නිසා මිනිසුන් සුව පත් වැ යන-**

යකුනුත්, පිසසුනුත් (පුර හැර දුරැ වැ) යන් මැ රෝ දුක් සපුරා සුන් වූ කල්හි මුනි රජුන් ගේ බුදු සසුන නිසා මිනිසුන් සුව පත් වී යන් මැ-

පිසස් හු (පිශාචකයෝ) ද යක් ගණයට මැ ඇතුළත් සිත් මත් බූත වෙසෙසකට අයත් වෙත්. මස් රුස්නෙත් උත් ගට එ නම වී.

565. **එ පුර මැඳ සුව දහස් රිවි සඳ පත් මෙන් එ සඳැ දිගු එළි කැරැ සුගතිඳු සඳ පුර දොරට පැමිණැ-**

එ පුර මැදට හිරු ලක්ෂයක් සඳ ලක්ෂයක් පැමිණියා සේ දිගුත් එළි කරමින් මුනි උතුමෝ පුරෙහි වාසලට වැඩැ වදරා-

566. **තම හට මෙහෙ පතා කළ පින් කමින් සැපත්, නිති පතා වෙතැ සිටි, අනඳ තෙරිඳු සඳ අමතා-**

තමන් වහන්සේට මෙහෙවර කිරීම පතා කළා වූ පිනින් පැමිණියා වූ, නිබඳ වැ ළඟැ සිටි ආනන්ද මහ තෙරිඳු තුමන් අමතා (=ආමන්ත්‍රණය කොටැ)-

567. **යක් බූ පිසස් කළ උවදුරැ දුරැ කළ කෙළ සුවහසක් සක්වළැ නො හැරැ අණ සක නිති පතළ-**

යක්ෂයන්, බූතයන්, පිසසුන් කළා වූ උවදුරු දුරු කළ කෝටි ලක්ෂයක් සක්වළෙහි අණ සක නිතින් පතළා වූ-

568. **මෙ ලොවැ සත සෙතට පස් වා දහසට පවතින රුවන් මහ සුත පුරැ පිරිතට ඒ තෙරිඳුට කියා-**

මෙ ලොවේ සතුන් හට සෙත් පිණිසැ යෙදී අවුරුදු පස් දහසක් පවත්නා රතන මහා සූත්‍රය පුරයේ පිරිත් දෙසීම පිණිසැ ඒ තෙරිඳුන් හට වදරා-

රතන සූත්‍ර බලය මෙ ගත් කරුවාණන් ගේ සිතට තදින් කා වැදුණු එකෙකි. පැවැසූ හ, හස් අස්නේත්:-

'අණ සක නිති පතල - කෙළ සුවහසක් සක්වලැ
රුවන් පත් තිසෙහි කළ ගුණ වේසෙස් කොට
රුවන් සුතුර පිරුවා සියදහස් වට
නො හැරැ කීකරු කැරැ-හැම සුරවරන් තම හට
ස තන ලොවට සෙත දෙන ඒ යති රදුට
තැවිත තැම්දැ මේ ලෙසින් සැල කරව සිට'

**569. මිණි පයැ දිය පුරා සපුරා මෙ පිරිත දෙසා එ දිය ඉසැ මෙ පුර ඉදුරා පිරිත් කරවයි කියා-**

මැණික් පාත්‍රයේ දිය පුරවා එ හැම පිරිත් මැ මෙ පිරිත දෙසා එ දිය ඉසීමෙන් නියතින් මැ මේ පුර අරක් ගත්වයි කියා-

පිරිත් කිරීම නම් කෙම් (ක්ෂේම) කීරීමයි.

**570. මුනිඳු සඳ සිටි සඳැ නිරිඳෝ මන නඳ වෙමින් නො මඳ සිවුරඟ සෙන් ඇරැ ගෙනැ එ පුරෙහි මහ පුද යොද-**

(පිරිත් කරවයි කියා) මුනි උතුමා සිටි කල්හි රජහු තුමූ සිත් සිතොස් වෙමින් එ පුරේ බොහෝ වූ (ඇත්, අස්, රිය, පා බල යන) සතර අඟින් යුත් සෙන් ඇරැ ගෙනැ මහත් වූ පූජා විධාන කොටැ-

## අං. පුර සැදුම්

**571. රජස නො නැඟෙන ලෙසැ, රිවි රස බිමැ නො හෙන ලෙසැ දෙ පස සිතියම් කළ මා ඇගි වතින් නිසි ලෙසැ සොයා-**

දූලි නො නැඟෙන නියායෙන් ද, ඉර අව්ව බිමට නො වැටෙන නියායෙන් ද, දෙ පැත්ත සිතියම් කළා වූ බොහෝ අගනා පිළියෙන් සුදුසු පරිදි සෙවිලි කොටැ-

**572. විදු ලෙසට ලඹ මල්, බිමැ සුදු මල් පට සඳ පුර මහ වේ දෙ පිටැ රන් රිදී මිණි වැට පහන් ලා-**

එල්ලෙන්නා වූ මල් (දම්) විදු ලිය සෙයින් සඳ, බිමැ සුදු මල් ගොනා කළ (මල් ඇතිරිලි) පට සඳ, පුරේ මහ වීදිය දෙ පැත්තේ රන් (වැට) රිදී (වැට) මිණි වැට පහන් තිබා- (531. බලන්නැ)

**573. පුර පෙරහර සකස් කැරැ නො සරස් සරහා බුදුන් සහ සඟ රැස් ඇතුළු නුවරට වඩා ගෙනැ ගොස්-**

පුරේ පෙරහර පිළියෙළ කොටැ නො පමා වැ සරහා බුදුන් සහිත සඟ පිරිස ඇතුළු නුවරට වඩා ගෙනැ ගෙසින්-

**574. මැති යුත් සත් දහස් සත් සිය සත් නිරිඳුන් ඉඳිනා, දිගු පුළුල ඇති සුරිඳු විජයොත් පායැ සිරිගත්-**

ඇමැතියන් සහිත වැ සත් දහස් සත් සිය සත් රජුන් හිඳිනා, දිග පළල ඇති, සක් දෙව් රජු ගේ විජයොත් පහයේ සැටි ගත්තා වූ-

'රන් පහයෙක් එහි සත් සිය යොදුනුසය
තුන් සිය යොදුන් දිග ලෙළ දෙන දද රුසය'

යන්නෙන් විජයොත් පාය සඳහති ගුත්තිල ද කව් කරුවෝ (476).

**575. මෙර අගේ සුරන් ලෙසැ පල අගේ රන් දද ලෙළෙන, නුබැ සිතියම් රගේ මිණි කොත් කිරණ පැතිරි-**

මහ මෙර අගැ දෙවියන් ලෙසට පෙනෙමින් පියැසි අගැ රන් දද ලෙළ දෙන, අහසේ සිත්තම් ලෙසින් පෙනෙනට මැණික් කොත්හි කාන්තිය පැතුරුණු-

සිරි රහල් හිමියෝ පල අගැ ලෙළෙන රන් දද සුරගනන් බඳු කොටැ දකිති. එයින් සැඳැහෙයි, පරෙවි අස්නේ:-

'ත ර පහ අගැ අඹළ කලද්‍යේ කොනේයා
හ ර ගිරි හිසින් හුණු සුර ගඟ වනේයා
තොර නොවැ ලෙළෙන රන් දද පල වෙනේයා
සු ර ගන එ ඟග බැසැ කෙළිතිසි සිනේයා'(16)

**576. හිර සඳ රන් කිරුළු මුඳුනැ දුන් සත සිත නඳුන් කළ නුවර මැදූ නිරිඳුන් මහ පාය-**

හිරු සඳු දෙදෙනා රන් කිරුළැ මුඳුනේ ඇල්වූ මැණික්හි අයුරු පෙන් වූ, සතන් ගේ සිතට තොස ඇති කළ, නුවර මැද්දේ වූ, රජුන් ගේ මහ පාය-

මේ පාය රත් කිරුළක් මෙන් ද, හිරත් සඳත් එ කිරුළේ මුදුන් මැණික් මෙන් ද පෙනේ තම හිරු සඳු දෙදෙන මුදුනේ ගැටෙන පමණට එය උස් බව පළ වෙයි. කිරුළකට මුදුන් මිණි එකක් මිසැ දෙකෙක් නො වේ. ඉර මුදුන් මිණි සිරි දෙන්නේ දවාලට යි. සඳ එ කරන්නේ රැට යි.

577. **වැඳූ සිහි සුර සිඳු ගඟ පිරිසුදු සුදු වියන් බැඳැ රන් තරු මැඳූ දිලෙන මල් බලඹු, මුතු ලැලින් නඳ කැරැ.**

(ඇතුළතට) වැදී සිටියා වූ අහස් ගඟ සේ වූ කිලුටක් නැති සුදු වියන් බැඳැ (එ වියනේ අල්ලන ලද) දිලියෙන රන් තරු මැද්දේ එල්ලන ලද මලින් හා මුතු ලැලින් ද සිත් පිනවන අයුරු කොටැ (සරහා)

(512 වැන්න බලනු)

578. **උදුරා ගත් රිවි රස් එව් ගන අඳුර දුරු ලන නෙත් පැහැරැ ඇරැ ගත් රන් පට තිරෙන් අවට අවුරා.**

(ඉරෙන්) ශලවා ගත් ඉරු රස් මැනි ගන වූ අඳර දුරු කරන, ඇස් පැරැ ගත් රත් වස්ත්‍ර තිරයෙන් හාත් පස අවුරා–

ඇස් අත් අතකට යොමු වියැ නො දී එ දෙසට මැ ඇඳූ ගත්තා හෙයින් නෙත් පැහැරැ ගත් බව පැවැසිණි.

ගනඳර, පැහැරැ යනු එළි නිසාත්, විරිත නිසාත් ‘ගනඳරු, පැහැරා’ යි යෙදිණි.

579. **සිවු දූ ගඳ කලල් නිල් බිමැ පිරිබඩ ගෙනැ සිතියම් කළ නිමල් මන කල් අනැගි බුමු තුරුණු ලා.**

(කොකුම්, යොන් සුජ්, තුවරලා, තුරුක් තෙල් යන) සිවු වගේ සුවඳින් කළ කලල් නිල් වූ (ගෙ) බිමේ පිරිබඩ ගෙනැ, සිත්තම් කොටැ ඇති පිරිසුදු, සිත් ඇදූ ගත්තා, අගය පමණ නො කළැකි බිම් ඇතිරිලි එළා–

580. **ලෙල මුතු ලැල් නො මද බඳ සේසතින් මන නඳ අසුනක් මුනි සඳ ඉඳින ලෙසැ එ මඩු මැදූ සඳ-**

ලෙළ දෙන්නා වූ මුතු ලැල් බොහො කොටැ බැන්ද වූ සේ සතින් සිත් තුටු කරන ආසනයක් බුදුන් වැඩැ ඉඳිනා නියායෙන් එ මඩුව මැද්දේ පනවා-

මෙහි 'මඩු' යි කීයේ පායට තො වැ පාය තුළැ පිරිත් පිණිසැ සදන ලද මඩුවටයි (අද වහරේ ගැමියෝ මීට 'පිරිත් මණ්ඩප්පය' යැයි කියති).

## ඈ. පුර වැදුම්

581. **සක් රුවන ලදුවා ලෙසැ තම සිත පුබුදුවං පිරිසුදු ගුණෙන් මුනිඳු අස්නෙහි වඩා හිඳුවා-**

චක්‍ර රත්නය ලැබුවා සේ තමන් ගේ සිත පුබුදුවා ගෙනැ පිරිසුදු වූ ගුණයෙන් යුතු වී බුදුන් (ඒ) අසුනේ වඩා හිඳුවා.

(523 වැන්න ද බලන්නැ)

582. **සිතු මිණ ඉදිරි කැරැ මිණි ගණ පෙළ සදනා මෙන් සත සිත පිය කරණ රහත් සඟ ගණ වඩා හිඳුවා-**

චින්තා මාණික්‍යය පෙරට තිබා මැණික් සමූහය පෙළ ගසා සදන්නා සේ සතුන් ගේ සිතේ ප්‍රීතියට කාරණ වූ රහත් සඟ පිරිස වඩා හිඳුවා-

583. **නිරිඳෝ තමන් මිණි කිරුළු දෙ සිළිලින් සරණ මුඳුන දෙ කැරැ දේ අත තබා මුනිඳු වැඳැ උන්නෝ යැ.**

රජහු තුමූ තමන් ගේ සිළු මිණි හෙවත් ඔටුණු අගැ මැණික් කාන්තිය නැමැති දියෙන් (බුදුන් ගේ) සිරි පා සෝද දෙහොත් මුදුන් බැඳැ බුදුන් වැඳැ උන් හ.

නළල බිමැ පිහිටුවා පා වැඳීම කළ බවයි 'මිණි දේ සිළිලින් සරණ දේ කැරැ' යන්නෙන් ඇඟැ වූයේ.

මෙ ඇසෙන ගිරා අස්නෝ:-

'තමන් සිළු මිණි දේ
සිලිලින් සබය කර දේ' (138)

යන්නත්, ගුත්තිල දා කවේ.-

'පළන් අබරණ දේ
සිලිලින් සබය කැර දේ' (244)

යන්නත් සිහි පත් වනු ඇති.

584. **රන් මිණි මුතු පබළු අබරණ පැළැඳා, නිසි කසී සළු ඇඳා සුලකුළු රජ ඇමැති මුළු පසෙකැ උන්නෝ යැ.**

රන්, මැණික්, මුතු පබළු යන දෑයින් කළ පළඳනාවන් ලා ගෙනැ, (තමනට) සුදුසු කසී සළු ඇඳා මනා වැ සැදුණු රජාමාත්‍ය සමූහයෝ පැත්තෙකැ උන්නෝ යැ.

585. **සව් සතර නිපුණෝ, සුර ඇදුරු සෙයින් දැපුණෝ, කුල සිරිතැ දැමුණෝ බමුණෝ මුනිඳු වැඳා උන්නෝ යැ.**

සියලු ශාස්ත්‍රයෙහි සමත් වූ, සුරන් ගේ ගුරු වූ බෘහස්-පතියා මෙන් එඩි සහිත වූ, කුල සිරිතට අනු වැ විනීත වූ බමුණෝ බුදුන් වැඳා උන්නෝ යැ.

'වෙද වෙදඟ නිපුණෝ
සතර පිළිබිඹු දැපුණෝ
දිය වැඩෙහි දැමුණෝ
පසෙකැ උන්නු යැ පෙරෙවි බමුණෝ' යි

ගුත්තිල දා කව බමුණන් සඳහයි (245).

586. **දෙනෙන් සුපිහිටියෝ, යෙසෙන් නො කිළිටියෝ, සිටු තනතුරෙහි සිටියෝ බුදුන් වැඳා එක් පසෙකැ සිටියෝ.**

නො සැලෙන හෙවත් වැය පිණිසැ නො ගන්නා ධනය ඇති, යසසින් කිලිටි නුවූ, සිටු තනතුරේ පිහිටියාහු බුදුන් වැඳා එක් පැත්තෙකැ සිටියෝ යි.

මෙ ධනයෙන් සුපිහිටි සිටුවරයෝ 'අමිත භෝගී' නම් ගණයට අයත් වෙත්.

'යසින් නො කිලිටියෝ
ලොවැ කප් තුරු සෙ සිටියෝ
වාද ඇසියටියෝ
උත්තු සිටු තනතුරු පිහිටියෝ' යි

ගුත්තිල ද කව සිටු වරත් සඳහයි (246).

587. **තැනෙකැත් නො ලස් වූ, මුනි රු දකු මැ තොස් වූ සෙනග හිස් වූ තැන් නො කොටැ මහ වතුරු සේ රැස් වූ.**

එක් තැනෙකැ දු පමා නුවූ, බුදුන් ගේ රුව දැකීමෙහි තුටු වූ සෙනඟ සිස් තැන් ඇති නො කොටැ හෙවත් ඉඩක් නො තිබා මහ වතුරු සෙයින් රැස් වූ හ

වතුරු නම් ගලන දිය යි.

588. **දිව සෙනගත් අවුත් සක්වල ගිරින් ඇතුලත් අහසත් අට දිගත් මදකුත් අතුරු නො හැර රැස් වූ යැ.**

දෙව් සෙනග ද අවුත් සක්වල ගිරින් ඇතුලතැ අහසත් (සතර දිග යැ, සතර අනුදිග යැ යන) අට දිගුනුත් යම් තමකට ද අතර ඉඩක් නො තිබා රැස් වූ හ.

589. **සියුම් ඉදි කටු මුන ඔබා ලන පමණක් තැනැ සැට සැත්තැ බැගින් එ මුරු ගණ සියුම් වෙස් ගෙනැ සිටිය හ.**

(ඉතා) සියුම් වූ ඉදි කටු මුනක් පොවා ලන පමණ ඉඩක් ඇති තැනැ ඒ දෙව් සමූහයෝ සියුම් වෙස් ගෙනැ හැට දෙන හැත්තෑ දෙන බැගින් සිටිය හ.

590. **පිරි පිරි වට තුන් පවුරෙකින් වට කල එ පුර අවට යතිඳුන් ගොස් මොනවට පිරිත් පැන් ඉසි සඳෙහි-**

(දියෙන්) පිරුණා වූ අගළින් පිරි වැරුණු හෙවත් වටා (දිය පිරුණු අගල ඇතුළතැ) පවුරු තුනෙකින් වට කරන ලද එ පුර හාත් පසැ සරමින් තෙරිඳුන් මතා සේ පිරිත් පැන් ඉසීම කළ කල්හි-

**591. එ පිරිත් පැන් ඇගට වැදැ එ මැ විටැ ලෙඩ රෝග කිසි නො සිටැ දුරු වන නිදු පුබුදිනැ ලෙසින් නැගැ සිටැ-**

ඒ පිරිත් පැන් ඇගේ වැදී ලෙඩ දුක් කිසිත් නො රැඳී දුරු වත් මැ නිදු පුබුදිනා සෙයින් නැඟී සිටැ-

**592. එ පුරවර දනයෝ එ වර සැරැසී පිරිවර ඇර ගෙනැ තෙරිඳුන් සහ ගොසින් ඇතුළු පුර වර වන්නු යැ.-**

ඒ උතුම් පුරේ ජනයෝ එ විටැ සැරැසී පිරිවර (ද) සමගැ තෙරිඳුන් කැටි වැ ගොස් ඇතුළු පුර වරට වැදුණෝ යැ.

**593. අනඳ තෙර හිමි සඳ නුවරුන් සමගැ වැදැ මුනිඳුන් සිරි සරණ වැඳැ එ සබ තුළැ එක් පසෙකැ උන් සඳැ.**

අනඳ තෙර හිමි තුමා නුවරැ දනන් හා (ඇතුළු පුරවරට) වැදී බුදුන් ගේ සිරි පා වැඳැ එ සබ හල තුළැ එක් පැත්තෙකැ උන් කල්හි.

අැ. දෙසුම්

**594. රැස් වූ මහ පිරිසැ සිතැ අදහස තම දිව ඇස යොදමින් වෙන වෙන මැ සොළොස් රඟෙකින් තතු ලෙස බලා-**

(එ තන්හි) රැස් වූ මහ පිරිසේ (දනන් ගේ) සිතේ අදහස තමන් වහන්සේ ගේ දිව ඇස යොමු කොටැ වෙන් වෙන් වශයෙන් දහසය විදියකට ඇති පවත් පරිදි බලා වදාරා-

| | | | | | |
|---|---|---|---|---|---|
| මොහු | ගේ | සිත | රාග | සහිත | යැ |
| ,, | ,, | ,, | ද්වේෂ | ,, | ,, |
| ,, | ,, | ,, | මෝහ | ,, | ,, |
| ,, | ,, | ,, | රාග | ,, | නො වෙයි. |
| ,, | ,, | ,, | ද්වේෂ | ,, | ,, |
| ,, | ,, | ,, | මෝහ | ,, | ,, |
| ,, | ,, | ,, | සංක්ෂිප්ත | | යැ |
| ,, | ,, | ,, | වික්ෂිප්ත | | ,, |
| ,, | ,, | ,, | අමහද්ගත | | ,, |
| ,, | ,, | ,, | මහද්ගත | | ,, |
| ,, | ,, | ,, | සෝත්තර | | ,, |
| ,, | ,, | ,, | අනුත්තර | | ,, |
| ,, | ,, | ,, | සමා හිත | | ,, |
| ,, | ,, | ,, | අසමා හිත | | ,, |
| ,, | ,, | ,, | විමුක්ත | | ,, |
| ,, | ,, | ,, | අවිමුක්ත | | ,, |

යන සොළොස් අයුරිනි සිත් විමසා බැලීම කොටැ වදරත්තේ.

595. **දත් කෙසරු බර රැඳි, දිලි දිව් කෙමින් මන හර, මුව තඹර පොබයා මුදු දෙරණ අඹර අතර සුවඳ කැරැ-**

දත් නැමැති කෙසරු රැසින් යුත් වූ, දිලියෙන්නා වූ දිව නැමැති බටුයෙන් සිත් ඇදගන්නා, ශ්‍රී මුඛය නැමැති නෙළුම් මල පුබුදුවමින් මුළු මහත් පොළොවත් අහස් කුස ඇතුළතත් සුමිහිරි ගඳින් යුත් කොටැ-

මේ උපමාව තන් අයුරු අඩු වැඩි කම සහිත වැ නො එක් තැනැ දක්නා ලැබේ.

**'සුරක්ත වූ ජිහ්වාධාතු නැමැති කෙමි ඇති, දන්ත ධාතු නැමැති කෙසරු ඇති, සුරක්ත වූ ඔෂ්ඨ ධාතු නැමැති පත්‍ර ඇති,** සද්ධර්ම නැමැති මධු බිත්දු ඇති **ශ්‍රීමත් වූ මුඛ පද්මය විවෘත කොටැ** බැණැ නැගි **බසින් දිවූ** සුවඳ ගඳින් **සියලු බණ පිරිස සුවඳ කුඩක් සේ කොරෙමින්'** යැයි පූජාවලිය පවසයි.

'දසතග කෙසරූ රූඳි
ලවනත් පත් පෙළින් සැදි
ගහනත් කෙමි වොරැඳි
එ හිමි වුවනත තඹර සිරි ලදී' යි

සිරි රහල් හිමියෝ වදූරති (කා: සේ: vi. 4)

දෙරණඹරතුර = දෙරණ අඹර අතුර.

596. **මහ දඹ ගස සලා, සියලු පල රස අවුලා ගෙනැ අම රස යොදා ලොවට නිසි ලෙසැ බෙදා දෙනා මෙන්** -

(දඹ දිවට සලකුණ වූ) මා දඹ ගස සොල්වා (බිමැ වැටුණු) රසවත් පල සියල්ල අවුලා ගෙනැ අම රස මුසු කොටැ ලෝ වැසියාට සුදුසු පරිද්දෙන් බෙදා දෙන සේ-

පසළොස් යොදුන් කඳ වට ඇති, පනස් යොදුන් අතු පසක් ඇති දඹ දිවට සලකුණ වූ මාදම් ගසේ පල මහ දීය කල පමණ වෙතියි යෙති (බුත්).

597. **දෙරණ පෙරලා යට මතු කොටැ ඒ රස රැස් කොටැ මිහි රසට වැඩි වන එ මිහි රස ලෙම් හට දෙනා ලෙසින්** -

පොළොව උඩු යටි කොටැ පෙරළා එහි (යටි පැත්තේ වූ) රස එක් කොටැ (බිගුත් බැඳි) මීයේ පැණි රසට ද වැඩියෙන් මිහිරි වූ ඒ මිහි (පොළෝ) රස ලෝ වැසියා හට දෙන්නා සේ.

(596-597 යන පැදි දෙකේ ඇති උපමා සියලු බණ දහම් පොත්හි දක්නට ලැබෙනුයෙන් ඉතා පළ යි).

මිහි (පොළෝ) රස දූත් මිනිස්සු නො හඳුනති. ආදි පොළොව අමා බඳු මිහිරි රස පිඩක් වැ පැවැත්තේ යැයි ද මිහි පිට වසන්නවුන් ගේ තෘෂ්ණාව වැඩෙත් වැඩෙත් එහි රස පිරිහී ගියේ යැයි ද, දූනුත් එහි යටි පිටැ පළමු සේ මැ රසින් යුතු යැයි ද යෙති ලෝක විස්තර කරුවෝ. කවුරු දනිත් ද?

598. **සවනැ මී බිඳු වන්, ජන සිතැ අමා රස බඳු සිණිඳු බඹ ගොස කැරැ මුනි සඳු රුවන් මහ සුත දෙසන-**

කනට මී පැණි බින්දු වැනි වූ, දනන් ගේ සිතට අමා රස වැනි වූ සිනිඳු බ්‍රහ්ම ඝෝෂාව කෙරෙමින් මුනි උතුමා රතන මහා සූත්‍රය දෙසන කල්හි-

බඹ ගොස පලමු සඳහන් විණි (409).

599. **එ විටැ සුර නර දෙසූ දහමම පැහැදි එක විටැ සුවාසූ දහසක් මැ නිවනට පැමිණිය හ.**

එ වේලේ බඹහු ද, දෙවියෝ ද, මිනිස්සු ද දෙසන ලද දහමේ පැහැදී අසූහාර දසක් දෙන මැ එක් වට නිවන් දුට හ.

600. **මුනි සඳු ලොව රැකැ මෙ මැ සුතන සතියෙකැ දෙසන නිවන් දැකැ තුටු සත අට අසූ පන්සියයක් දහසෙකැ.**

මුනි උතුමා ලෝකාරක්ෂාව වන පරිදි මේ සූත්‍රාන්තය මැ සතියක් මුළුල්ලේ දේශනා කරත් මැ නිවන් දැක්මෙන් සතුටු වූ සත්හු පන්ලක්ස අසූ අට දහස් දෙනෙකි.

දහම් ඔවා:-

601. **මෙ ලෙසින් මුනි ලොවට දෙ ලොවට පිහිට වැ සිටි යැ. ඉන් සැබැවින් තොපට හැම විටැ පිළිසරණ එ මුනි මැ යැ.**

මේ (ඉහතින් කියන ලද) පරිද්දෙන් මුනි (උතුමා) ලෝකයාට දෙ ලොවට පිහිට වැ සිටියේ යි. එ හෙයින් ඇත්තේ හැටියට තොපට සියලු වේලේ පිහිට ඒ මුනි (තුමා) මැ යි.

602. **ඉන් එ බුදුන් වඳුව, උන් ගුණ සාදව පහදුව, උන් සරණට වදුව, ඔවුන් සදහම් අසව, පුරුදු ව.**

ඒ නිසා ඒ බුදුන් වඳුව, ඔවුන් වහන්සේ ගේ ගුණ සමූහයට පැහැදෙව, ඔවුන් වහන්සේ ගේ සරණ වඳුව, ඔවුන් වහන්සේ සරණ යව (බුද්ධං සරණං ගච්ඡාමි යි), ඔවුන් වහන්සේ ගේ සදහම් අසව, (එ) පුරුදු කරව.

603. **සසර දුක් දැකැ විරත වැ උන් කළ වැඩ සිතව, මිස දිටු කිලුටැ පතිත වැ නො ගොස් උන් දැකුමට පතව.**

සංසාරයේ දුක දැකැ (එහි) නො ඇලී ඔවුන් වහන්සේ කළ වැඩ සිතව, මිසදිටු නැමැති කිලුටේ වැටී නො ගොස් ඔවුන් වහන්සේ (බුදුන්) දක්නට පතව.

මෙහි 'උන් දැකුමට' යැයි කීයේ සැ සී මුනි උතුමන් නො වැ බුදු බව ලත් උතුමන් සඳහා යි. දැන් පැතුවාට සැ සී මුනිඳුන් දකිනු නො ලැබියැ හැකි යි.

604. **පෝ දවසැ පේ වෙව, පන්සිල් දිවි ලෙසැ රකුව, දස අකුසල් නො කොටැ නිති දස පින් කිරිය වත් පුරව.**

පේ වන දවසට පේ වෙව හෙවත් පෝය දට අට සිල් රකුව. පන්සිල් පණ සෙයින් රකුව, දස අකුසල් නො කොටැ දස පින් කිරිය වත් පුරව.

දිවි නැසුම
සොරකම
පර අඹුන් සෙවුම යන
කයින් සිදු වන අකුසල් තුනත්
බොරු කීම
කේලාම් කීම
පරුස බස් බිණීම
වැඩ නැති බස් කීම යන
බසින් සිදුවන අකුසල් හතරත්
දළ ලොබ
වැනැසුම් සිතිවිල්ල
මිස දිටුව යන සිතින් සිදුවන අකුසල් තුනත් දස අකුසල් වේ.

උතුරුමූළ ඇත්තෝ එකොළොස් පවක් දකිති.

දන්, සිල්, බවුන්, පින් දෙනු, පින් අනු මෝදනා, බණ අසනු, බණ දෙසනු, පිදියැ යුත්තන් පුදනු, සරණාගමනය, බුදුන් ගුණ සිහිකිරීම, යන දසය දස පින් යැ.

සිරි රහල් හිමියෝ දෙලොස් පිනක් වදරති.

605. **තුන් සිත මැ පිවිතුරු කැරැ විසිතුරු පුද වතින් දතු, දළ දා, පිළිම, බෝ තුරු නිරතුරු පුද කරව.**

(මුල්, මැදි, අග යන) තුන් සිත මැ පිරිසුදු කොටැ විසිතුරු වූ පූජා වස්තුවෙන් ධාතු, දළ දා, පිළිම, බෝ තුරු නිබඳ පූජා කරව.

'දතු, දළ දා' යි කීම එ තරම් හැඩ නො වේ. දළ දා ඇ සෙසු දා යි මේ කියන්නේ. සෙසු දා දා ගජ්ජි වේ.

606. **හිත අහිත සත වෙතැ කුලුණු මෙත් සිත වඩමින් සගමොක් සැපත දෙන මුනිඳුන් දෙසූ පිළිවෙතැ පවතු.**

(තමා හට) හිතවත් වූ ද, අහිතවත් වූ ද සතුන් කෙරේ කරුණා මෛත්‍රී සිත දියුණු කරමින්, දෙව් ලෝ සැපත, නිවන් සැපත දෙන්නා වූ බුදු රදුන් දෙසූ ප්‍රතිපත්තියෙහි පවතුව.

607. **මෙ ලෙසින් හැම දවසැ හැම පින් නිසි ලෙසැ පුරා එන දවසැ බුදු වන මෙතේ මුනි රජ තුමන් දැකැ තොසැ-**

මේ අයුරින් සියලු දිනැ සියලු පින් සුදුසු පරිදි (කොටැ) පුරා ගෙනැ (එහි බෙලෙන්) මතු පැමිණෙන දවසේ බුදු වන මෛත්‍රී බුදු රජ තුමන් දක්මින් සතුටින් යෙදී-

608. **නො මඳ පුද කොරෙමින් බණ අසා උන් සසුන් වැදූ, හැම කෙලෙසුන් පසිඳැ නිවන් පුර වැදැ සැනැසී වසව.**

බොහෝ පූජා (සත්කාර) කොටැ බණ අසා උන් වහන්සේ ගේ සස්නේ ඇතුළු වැ (මහණ වී) සියලු පව් නසා නිවන් පුරට වැදී සැනැසී වසව.

ගත් කරු පවතා:-

**609. සමත ඇස් මුනිඳු පිරිණිබි වසැ පටන් ලද අවුරුදු දෙදහස් පසළොසක් ගෙවුණු සඳ, දිය ගොස් පැතිරි බුවනෙක බුජ නිරිඳු සඳ සිරි ලකැ රජ අබිසෙව් ලද පිරි වස් තුනෙකි-**

සියල්ල දන්නා (දිව) ඇස් ඇති මුනි රජු පිරිනිවුණු අවුරුද්දේ සිටැ ලැබූ අවුරුදු දෙ දහස් පසළොසක් ගෙවී ගිය කල්හි, ජය ගොස පැතිරි බුවනෙකබා රජ තුමා සිරිලක් දිවේ රජු හැටියට අබිසෙස් ලබා පිරුණා වූ තුන් වන හවුරුද්දෙහි-

එයින් පල වන්නේ බුදුන් පිරිනිවි වසින් දෙදහස් පසළොස ගෙවෙත විටැ බුවනෙක බා රජු අබිසෙස් ලබා තුන් වස පිරුණු බව යි.

**610. දිනැ දිනැ නො අඩු, මහ හර දින පුද පැවැති, දන මන රඳන සිරින් සර ගෙ උයන් සැදි, වැජැඹෙන, පසිඳු මහ රයිගම් පුර අතර බබළනා, සොඳුරු විදගම මහ වෙහෙර-**

දින පතා අඩුවක් නැති, සිත්කලු බුදු පුද පැවැත්තා වූ, දනන් ගේ සිත් රැඳී පවත්නා, සැපතින් සරු ගෙවතු සැදී සිටිනා, උසස් වැ පෙනෙමින් පවත්නා වූ පසිදු වූ මහ රයිගම් පුර තුළැ බබළන්නා වූ, මනා වූ විදගම මහා විරයේ-

**611. කිත් යස කොත් දස දික් දිගු යටි අගැ බඳ මෙත් මහනෙත් පාමුළැ මහ තෙරිඳු සඳ, සෙත් කළ මුනිඳු සඳු ගුණ කව් පෙදෙන් බැඳැ නඳ මෙ ද සත් වැඩ පිණිසැ මෙත් සිතින් කෙළෙ-**

කීර්ති ප්‍රශංසා නැමැති කොඩි දස දිග නැමැති දික් වූ රිටි අගැ බැඳි ඇති, මෛත්‍රෙය නම් වූ මහ නෙත් පාමුළැ මහ තෙරිදු තුමා (ලොවට) ශාන්තිය කළා වූ මුනිදු සදු ගේ ගුණ, කව් පැදියෙන් බදිමින් සිත් පිනවන්නා වූ මෙය ද (ලෝක) සත්ත්වයාට වැඩ සිදුවනු සඳහා මෛත්‍රී සහගත සිතින් කෙළේ.

# අතිරේකය

(1) 'ජඩ තිවටුන් නිසා
බුදුනැයි නමක් පවසා' (30)

ඒ කීයේ,

පූරණ කසුබු
කකුද කසයින්
අජිත කෙස් කම්බලී
නිගටතත පුත්
සජය බේලට්ටි පුත්
මක්කලී ගෝසාල.

යැයී සඳහන් කරන ලද දසුන් කරුවන් (දර්ශන වාදීන්) සඳහන් කිරීමට යි. ඒ එක් එක් තැනැත්තා ගේ සිරිත පිළිබඳ වැ පූජාවලියේ සඳහන් දය ඔවුන් සඳහන් පැදි විතර කිරීමේ දී දක්වන ලදී. එ හෙත් එ පුවත් ඉදුරා ඇදැහීම මැදහත් සිතින් තතු විමසන්නවුනට නො කළ හැකි වෙයි. ඒ කවර තැනැත්තකු ගේ වුවත් සිරිත ගෙනැ හැර දක්වීමේ දී සියලු අතින් ඔහු නිගන්තා පරිදි එ පවසා ඇති බව ඉතා පළ වැ පෙනෙන්නෙකි. අපේ බුදුනු ගත් කරුවන් කෙරේ පැවැති දරුණු වූ දුබල බවක් හැටියට පෙනෙන්නේ සිය දසුනට වෛතස් වූ දසුන් පළ කරන්නවුන් ගේ දසුනේ ඇති අඩු පාඩු හෝ දහමට නො එකඟ බව හෝ දක්වා එය බිඳැ හෙළනු වෙනුවට එ දසුන පළ කළ තැනැත්තාත් එය ගත් තැනැත්තවුනුත් නො සැහෙන පරිදි නිගැනැ එයින් මැ සෙසු සියල්ල ගසා වසා දමන්නට ඉදිරි පත් වීමයි. එයින් ඔවුන් හට පිළිකුල් වූ බොරු ඇදූ බාන්නට සිදු වන බව ඔවුන් දතුවත් එ බොරු පෙනෙන පමණට සිය දසුන් මඟැ බටුවන් ගේ නැණ ඇස් පැයී නැති සෙයක් ඔවුන් ඇදැහූ

හෙයින් එ අයුරු බොරු ගොතා පැවැසීමෙහි ඔවුන් විළි නුවූ බව පෙනේ. මෙ සිරිත අදත් බුදුනු පැවිදි දතන් කෙරේ ඇති බව පළ පවතෙකි. එ කරුණින් මැ බුදුනු දතන් ගෙන් වැඩි දෙනකු මොහො අඳරේ ගැලී අඳ වැ සිටිනා බව කියැ හැකියි. අවට විමැසීමක්, ඇත්ත නැත්ත පිරික්සා බැලීමක් නැති වැ තමන් කියන සියල්ල මුඳුනින් ගන්නා පමණට බුදුනුවන් නුවණින් බාල කිරීම පැවිදි දතන් මෙ තෙක්දු නො අත් හළ බව ඔවුන් රජ දහම පිළිබඳ කටයුත්තේ වැදී මිනිසුන් මුළා කරවන සැටි බලන විටැ පෙනී යනවා ඇති. ඒ බුදුරදුන් ගේ දසුනේ අනෙක් පිටයි

'පඤ්ඤවතස්සායංධම්මෝ නායංධම්මෝ දුප්පඤ්ඤ-වතස්ස' යැයි වදරන ලද උතුමාණ කෙනකුන් ගේ දහමක් රට වැසියාට වටහවන විටැ ඇමට පළමු කළ යුතු වන්නේ එ දහම වටහා ගැනීමට හැකි වනු පිණිසැ රට වැසියා නැණවතුන් බවට පැමිණැවීමයි, ඒ මිසැ බර පමණක් හගිනා ගොනුන් පිටේ රන් රුවන් පටවන්නා සේ නුනුවණ දතන් හට නැණවතුන් ගේ දහම් පැටැවීම නො වේ. ඒ ඒ දසුන් කරුවා ගේ දසුන දක්වා එහි නිසරු බව පෙන්වනවා වෙනුවට ඒ දසුන් කරුවා හෙළා බිණීමෙන් වැඩෙක් නො වේ. බුදු රදුන් විසින් කොටැ වදරන ලද්දේ මිස දිටුවන් ගේ දිටුව බිඳීම මිසැ ඔවුන් නිගැනීම නො වෙයි.

බමුණන් ගේ වේද දහමට ඉඳුරා වෙනස් වූ හෝ එයින් බිඳී ආයෙන් මඳ විසින් වෙනස් වූ හෝ දසුන් පළ කරමින් ඇවිදි නන් අයුරු දසුන් කරුවෝ බුදු රදුන් ගේ අවදියේ දී දඹ දිවේ බොහෝ වූ. බුදු රදුන් විසින් මැ සලකා බලන ලද (මිස දිටු නම් වූ) හරයක් නැති දසුන් දෙ සැටක් වූ බව සඳහන් වෙයි සැලැ කියැ යුතු පමණට එකිනෙකින් වෙනස් නුවූ එ දෙ සැට ද දස ගණයෙකැ ලා සඳහන් කරනු ලැබේ. එ අයුරු දසුන් ඇති කොටැ ගෙනැ හෝ දූනැ ගෙනැ හෝ ඒ පළ කරමින් සිටියවුන් ගෙන් සදෙනෙකි, ඒ බුදුවරුන් හැවියට සඳහන් කරන ලද සදෙනාත්. ඔවුන් ගෙන් නිගට-

නතපුත් නැමැත්තා ගේ දෙසුම්හි දිටු තෙෂිය තුන් සැටෙක් සඳහන් වෙයි. එ ද 'ක්‍රියා වාද, අක්‍රියා වාද, අඥන වාද, විනය වාද යැයි සිවු ගණයෙක්හි ඇතුළත් වේ. මහා වීර නම් වූ නිගටනත පුත් තෙමේ පබල 'ක්‍රියාවාදියෙකි' කෙස් කම්බලී අජිත තෙමේ පසිදු 'අක්‍රියාවාදියෙකි.' ඔහු ගේ ඒ වාදය 'ලෝකායතික හෙවත් 'චාර්වාක' දසුන් ගණයට අයත් වේ. 'අඥනවාද' ඇත්තෙකි බෙලට්ටි පුත් සජය තෙමේ. බුදුනුවෝ ඒ දසුන 'වික්ෂේපවාද' ගණයෙහි ලා සලකති.

බුදුනුවන් මෙ තිවට ඇදුරන් වෙසෙසින් සඳහන් කරන්නේ ඔවුන් සදෙන බුදු රදුන් ගේ අවදියේ දී දඹ දිවේ පසිදු වැ වුසූ හෙයිනි. ඔවුන් ගෙන් නිගටනත පුත් (නිගණ්ඨ-නාත පුත්ත) නම් මහා වීර තෙමේ විසල් පුරේ රජ දරුවනට නෑ සබඳ කම් ඇත්තෙකි. වයසින් ඔහු බුදු රදුනට මඳක් වැඩි මහලු වූ සෙයෙකි සැලැකෙන්නේ. ඔහු තම දසුන පිළිවිදීමට දෙළොස් වසක් පදන් වැර වැඩූ බව ජෛන පොත්හි සඳහන් වෙයි. ජෛනයෝ නම් (ජින යැයි පළ) නිගටනත පුතු (මහා වීරයා) ගේ දසුන ගත්තෝ යි. ඔහු විසින් පිළිවිදු දෙසන ලද්දේ ඔහුට පෙරැ සිටි 'පාර්ශ්ව' නම් ඇදුරු දෙසු දසුන මැ යි. එ ඇදුරු අඩු ගණනේ මහා වීරයාට අවුරුදු දෙසිය පනසකට පෙරැ සිටි දසුන් කරුවෙකි. පාර්ශ්වයා ගේ සිවු සික පනත මහා වීර තෙමේ පන් සික පනතක් කොටැ දෙසී.

පාණාතිපාත, අදත්තා දන, මුසා වාද, යන තුන් සික එ දෙ දෙනාට එක් සේ පොදු වෙයි. බිරියක ඇතුළු ලෙව් වූ කිසිත් නො සෙවුනා සේ පැනැවුණු පාර්ශ්වයා ගේ 'අපරිගෘහ' සික මහා වීර තෙමේ 'බඹසර රැක්ම යැ, පිළියක් මිසැ ලෙව් වූ කිසිත් හිමි කොටැ නො ගැන්ම යැයි දෙ බෑ කොටැ පන්සික පිළියෙළ කොටැ ගත්තේයි.' මහා වීරයාත් ඔහු ගේ සවුවෝත් සුදු පිළි සෙවුම් කළ හ. අන් කිසි වතක් ගැන්ම උනට අකැප වී.

අනේකාන්ත වාද ගණයට අයත් නිගණ්ඨනාථ පුත් වාදය නියතයෙන් බුදුනු දසුනින් මිසැ කටට ආ අං දූය කිමෙන් හෝ නිගණ්ඨනාථ පුතුන් නිගැතැ බිණීමෙන් හෝ යට පත් කරනු නො හැකියි. දියෙහි ඉතා සියුම් ප්‍රාණීන් විසීම, පැලෑටි ඈ සියල්ල දිවි සහිත බව පැවැසීම මෙ දසුනේ පිහිටියවුන් විසින් අදහනු ලැබේ. කෙ සේ හෝ වේවා නිගණ්ඨ-නාථ පුතු ගේ වාදය වේද දහමින් වෙනස් වූ දඹ දිවට ආවේණික දසුන් අසරින් පහළ බව පළ වැ මැ පෙනෙයි.

බුදු රදුන් ගේ අවදියේ වුසූ දසුන් වදුරන්නවුන් අතුරෙහි නිගණ්ඨනාථ පුතු ඈරුණා ම ඔහු ළඟට පසිදු තැනැත්තා වූයේ මක්ඛලී ගෝසාල තෙමෙයි. හෙ තෙමේ දිගම්බර ගණයට අයත් ආජීවක නිකායේ ඇදුරෙකි. උණ දඬක් අතැ ඇති වැ ඇවිදිනා පිරිවැජි කොටසට ඔහු අයත් බව 'මක්ඛලී' (මස්කරින්) යන්නෙන් පළ වෙයි. ඔහු මුලින් නිගණ්ඨනාථ පුතු ගේ සවුවකු වැ සිටැ පසු වැ සිය ඇදුරු කෙරෙන් බිඳී ගිය බවත්, මහා වීර නම් වූ නිගණ්ඨනාථ පුතු ගේ දුව ගේ පතියා වැ සිටි බවත් සඳහන් වෙයි. එක් අතෙකින් හෙ තෙමේ බුදුනු පිළේ දෙවි දතුට සම බව කියැ හැකියි. ඔහු විසින් ඇති කරන ලද සස්නේ සවුවෝ 'ආජීවක' යන නමින් සඳහන් වෙති. පසු කලැ ගත් කරුවෝ මක්ඛලී ගෝසාල-යාට පළමු එ දසුන පළ කළ 'නන්ද වච්ඡ' 'කිස සංකිච්ච' යන ඇදුරන් දෙදෙනකු ද සඳහන් කරති. මේ සස්න මෙ දවසේ අතුරුදහන් වූ වෙකි. එ හෙත් බුදු රදුන් ගේ අවදියේ දී එය සැලැකියැ යුතු පමණට පැතිරැ පැවැත්තේ ය.

ගෝසාල දසුන 'සංසාර විසුද්ධි' නියාය ඇසිරින් පහළ කරන ලද්දෙකි. එයින් අඟවනු ලබන්නේ සසරින් මිදීම සසරේ සියලු අත් බව් ඇසිරින් සසර සැරි සැරීමෙන් කොටැ ගත යුතු බවයි. ආදි මිසර දනන් ගේ, ඇදැහීමේ යම් නම් ලෙසෙක් මෙහි දක්නා ලැබේ. මිනිසා ගේ දුකටත්, එ දුකින් මිදීමටත් වෙසෙස් කරුණු ඇතියි ගෝසාල තෙමේ නො

ඇදූහී. මිනිසා ගේ වෑයමින් ගැලැවීම ලැබැ ගත හැකි බවක් නො ඇදූහු හෙ තෙමේ සියලු ප්‍රාණීහු ඉරණම නො ඉක්මැ-වියැ හැක්කෝ යැයි සැලැකී. අවිදූ හෝ විදූ හෝ සියල්ලත් එක් සේ සසරේ සැරි සරනු නියත බවත් සංසාර චක්‍රයේ සරු අවසනැ එ කෙළවර වන බවත් හෙ තෙමේ ඇදූහී. එ ගමන කොට කිරීමට හෝ දික් කිරීමට හෝ මිනිස් වෑයමෙකින් නො හැකි වන බවයි ඔහු ගේ ඇඟීම. සසර හූ වටක් සෙයින් බැමීමක් ඇති එකක් බවත් සියලු දෙන මැ එහි සියලු මඟ ගෙවියැ යුතු බවත් හෙ තෙමේ දෙසී. ඔහු ගේ සසර අපට අසත්නට ලැබෙන 'වාසනා චක්‍රය' බඳු යි.

පූරණ කසුබු තෙමේ 'අක්‍රියා වාද' ඇත්තෙකි. මිනිස-කුට සතුන් නැසීම, සොරකම ඈ නො හොබනා කම් නිසා පව් සිදු වීමත්, දන් සිල් ඈ පිළිවෙතින් පින් සිදු වීමත් හෙ තෙමේ නො ඇදූහී. ලොවැ සියලු සතුන් තසා ඉස් ගෙඩි ගොඩක් ගැසුවත් මිනිසකුට එයින් පව් නො සිදු වේ යැ යනුයි ඔහු ගේ ඇඟීම වූයේ. ඔහු ගේ දසුන බෙහෙවින් 'චාර්වාක'යන් ගේ දසුන බඳු වී.

අජිත කෙස්කම්බලියා ගේ දසුන යම් යම් කරුණු නිසා යවන (ග්‍රීක) දසුන් කරුවන් ගේ දසුන් හා සම වෙතත් තවත් කරුණු අතින් ඉන් ඉඳුරා වෙනස් ද වේ. කුසල් අකුසල් යැයි දෙකක් නැති බව පවසන හෙ තෙමේ දෙව් ලෝ ඈ සුව දෙන තැන් ඇති බව හෝ ඉඳුහ බල ඇත්තවුන් සිටිනා බව හෝ නො අදහයි. සිරුර සතර මහා භූතයන් ගේ සංයෝගයෙන් ඇති වූ බවත් මරණයේ දී ඒ භූතයන් වියෝ වන බවත් හෙ තෙමේ පවසයි. එ ලොවක් ගැනැ කතා කිරීම වැඩකට නැතියි කියන හෙ තෙමේ නැණවතුන් සේ මැ මෝඩයනුත් එක් මැ අයුරින් නස්නා බවත් ඉන් ඔබ්බේ ඉපැදීමක් නැති බවත් අදහයි. එ අදහස අනුවැ 'සත්ත්වයා මළා ඉවරයි. නව දිවියෙකැ කතා විසුළුයි' යනු අදහන්නට සිදු වේ.

'නපි පුඤ්ඤෙ ය පාවෙ² වා
නපි ලෝ²යෙ ඉඹ්වරේ
සරීරස්ස විණාසේණං
විණාසෝ² හෝ²ති දේහිණෝ²

පත්තේ²යං කසිණේ ආයා
ජේ බාලා ජේ ය පණ්ඩියා
සන්ති පිච්චා න තේ සන්ති
නපි සත්තෝ²ව්වා ඉයා' (සූයාගද)

යනුයි ඔහු ගේ දසුන. එය ඇතුළත් වන්නේ උච්ඡේද වාද ගණයට යි.

කකුද කසයිතයා ගේ දසුන නිගටනත පුත් දසුන් කරුවන් ගේ 'ශ්වේතාම්බර' ගණයේ ඇදුරෝ නිසරු කොටැ දක්වති. එය අයත් වන්නේ 'අශාස්වත' ගණයටයි, ඔහු ගේ දසුනේ හැටියට සුව දුක් වෙයිනින් නො වෙනස් වන මහා භූතයෝ² සත් දෙනෙක් වෙත්.

'සන්ති පඤ්ච මහා භූයා
ඉහ්මේගේසිං ආහියා
ආයඡට්ඨා පුණෝ² ආහු
ආයා ලෝ²ගේ යසා සඑ

දුහඕ න විනස්සන්ති
නෝ² ය උප්පජ්ජඒ අසං
සව්වේවි සව්වහා භාවා
නියත්තී භාවමාගයා' (සූයාගද)

යනු කී හෙයින් අවසනැ සිරුර එ සප්ත මහා භූතයනට බෙදී යෙයි.

දඹ දිවේ දසුන් වදළවුන් ගේත් හෙල්ලේන (ග්‍රීක) විත්තැණ අරුත් වාදීන් ගේත් උනුනට ඇති සම බව වෙසෙසින් පෙනෙන්නේ කකුද කසයිතයා ගේත් හෙල්-ලේන 'එම්පෙදොක්ල'යා ගේත් දසුන් සමයා බලන විටැයි.

පොළෝ, දිය, ගිනි, සුළං, සුව වෙයිත, දුක් වෙයිත, ජීවය යන මොවුන් ගේ සමවායෙන් ලෝ පැවැත්ම වන බවයි කකුද කසයිනයා කියන්නේ. මොහු ගේ භූතයෝ බෙහෙවින් මැ 'එම්පෙදොක්ලයා' ගේ භූතයනට සම වෙත්. එම්පෙදොක්ලෙයයා කකුද කසයිනයා ගේ භූතයන් ගෙන් මූල් සිවු දෙනට ඇල්ම හා වෛරත් එක් කොටැ ලෝක යාත්‍රාව දක්වයි. එ ඇදුරෝ දෙ දෙනා මැ සකස් සිරුරු කූප සහිත වන බව අනුදනිත්. දෙ දෙන මැ මූල ධාතූන් වන භූතයන් ගේ වැය නො වීම් අනුදනිත්. එ හෙත් කකුද කසයිනයා සසරේ සැරි සැරීම අදහයි. එම්පෙදොක්ලෙයා ඒ නො අදහයි.

සංජය බේලට්ඨි පුත්‍ර ගේ දසුන 'වික්ෂේපවාද' ගණයට අයත් වෙයි. අජාසත් රජ තෙමේ මේ දසුන් කරුවා 'මෝඩ මැ මෝඩ, අවිදු මැ අවිදු මිනිසා' යනුයෙන් සඳහන් කරයි. 'සාමඤ්ඤඵල' සුතුරේ හැටියට ඔහු මිනිසා ගේ සිත පිළිබඳ වැ විතාරනු ලබන පැනයකට නියත උත්තරයක් දීමට මැළි වූ බවෙක් පළ වෙයි. මිනිසා ගේ සිත පිළිබඳ වැ ඔහු විසින් නියත උත්තරයක් නො දෙන ලද පැන දසයෙක් එහි සඳහන් වෙයි. බුදු රදුන් විසිනුදු උත්තර නො දෙන ලද පැන ඇත්තේයි. එ හෙත් බේලට්ඨි පුත්‍ර සැලැකූ අයුරින් නො වෙයි බුදු රදුන් ඒ පැන සලකා වදාළේ. නිකම් කල් මරන එ පැන පිණිසැ කාලය අපතේ හැරීම, එ පැන මිනිසා ගේ වැඩි දියුණුවට කරුණු නො වනුයෙන් නිරර්ථක යැ' යනුයි බුදු රදුන් එ පැන අරබයා දෙසූයේ.

කකුද කසයින්, අජිත කෙස් කම්බලී යන ඇදුරෝ ලොව පිළිබඳ වැ ඔවුන් ගේ දසුන අනුවැ ලෝ සදාකාලික යැ (සබ්බං අත්ථි) සදා කාලික නො වේ යැ (සබ්බං නත්ථි) යි ශාස්වත වාදී වැ හෝ උච්ජේද වාදී වැ හෝ සිය අදහස පළ කළහ. මක්කලී ගෝසාලයා සියල් දැයැ පවත් පෙරැ නිශ්චිත යැ, පෙරැ නිශ්චිත නුවූ කිසිත් නැත්තේ යැ,

(සබ්බං පුබ්බෙ කත හේතු සබ්බං අහේතු පච්චයා) යි ඇදූහී. කිසි ඇදුරෙක් සැප දුක දෙක මිනිසා ගේ හෙවත් තමා ගේ මැ ක්‍රියාවත් නිසා හෝ වෙන යම් යම් හේතුන් නිසා හෝ (සුඛදුක්ඛං පරකතං) වන්නේයි සැලැකූ. තව ද අයෙක් මිනිස් දිවියේ අරුත නම් සුව විඳීම (කාමේසු කාම-සුඛල්ලිකානුයෝගෝ) සිරුර තැවීම (අත්තකිලමථානු-යෝගෝ) යන දෙකින් පිරිසිඳැ දතයුතු සේ සැලැකූ හ. නිගණ්ඨනත පුත් තම හට පුරුදු අනේකාන්තවාද (ස්‍යාද් වාද) නයින් පැන විසැඳී. බුදු රදුන් එ පිණිසැ ගෙනැ ඇරැ පෑ වදාළේ 'පටිච්චසමුප්පාද' යයි. පූරණ කසුබු, අජිත කෙස් කම්බලී, මක්කලී ගෝසාල, සඤ්ජය බෙලට්ඨි පුත් යන මොවුන් ගේ දසුන් බිඳීමෙහි බුදු රදුන් ගෙනැ ඇරැ පෑ වදාළේ 'මජ්ඣිමා පටිපදා' වයි.

(2) 'ගෙනැරැ බමුණන් කරව ලෝ වැඩ' (134)

ඒ කීයේ වේදය දත් ඇදුරන් ගෙන්වා යාග හෝම කැරැවීමටයි.

බමුණෝ නම් ඇදුරෝයි. වේදය දත්තෝ, වේදයේ කී නියා යාග හෝම කරනු දත්තෝ, වේද මතුරු දපා දෙවියන් යදින්නට දත්තෝ ඌ තුමූ වෙති.

ගහයන් පිදීම
ගිනි දෙවියා පිදීම
යාග කිරීම

යන පිළිවෙත් තුනටයි ඔවුන් වෙසෙසින් මෙහි කැඳැවියැ යුතු බව සඳහන් වූයේ.

ආදී ලෝ වැසියෝ ඇසට නො පෙනෙන සබා දහම් පවත් ද ඇසට පෙනෙන අහසේ තරු ද, නිල් වන් අහස් මඬල ද දෙවියන් කොටැ තැකූ හ. පෙනුම්, දූකුම්, පුදා, පඬුරු ඈ දූයින් බලවතුන් පහදවා කරුණා අවසරය ලබා ගන්නා සේ මේ දෙවියන් ද පුදෙත් පඬුරෙන් පහන් කරවා

ගත හැකි යැයි සිතූ මිනිස්සු දෙවියන් අඳුනත්තවුන් ලා ඒ ඒ දෑය දෙවියනට පිළිගත්වා සෙත ලබා ගත්තට තැමුණෝ යැ.

නුබැ වසන දෙවියනට බිමැ වසන දනන් දෙන දන් පමුණුවන්නා හැටියට ඇඳුරන් තිල කොටැ ගත්තේ ගිත්නයි. විලඳ රුසක් දෙවියන් වලඳවනු රිසි වූ විටැ එ විලඳ රුස ගිත්තට ලමින් දෙවියනට කැප කරන ගිත්නෙන් නැඟෙන දුම දෙවියනට එහි රසය අස්වයි. එ අසුරින් හෝම පුද පැවැත්වීම ලොවේ පළ පවතෙක් වී. එ ගමන් දෙවියන් ගේ ගුණ, තෙද යස ඉසුරු සමත් කම් ගති පැවැතුම් සඳහමින් මතුරු දූපීම යාගයයි. දඹදිවේ මේ අසුරු පුද පළ වූයේ වයඹ දිගින් සුදු වගේ දනන් එහි වන් පසුයි. හෙල්ලේන (පසු වැ ග්‍රීක) රෝම, ක්‍රෙත, ලූදි, ඊර, ඈ දනෝ වෙසෙසින් මේ පුද සිරින් පවත්වන්නෝ වූ. බමුණෝ එහි දු මේ පිළිවෙත් පළ කළ හ. දෙවියනුත් පුද පවත්වන තරයනුත් අතරු ගනුදෙනුව කරවන්නා වූ ගිත්න ද පසු වැ දෙව් ගෙණෙහි ලා සලකන ලදී. පසුවට ගිනි දෙවියන් පිදීම බමුණන් ගේ කුල සිරිතක් බවට පත් වූයේයි.

(3) 'එ මැ මහ දෙවිඳු හෝ
නො හොත් සිව ලිංගය හෝ' (162)

මහ දෙවිඳු (මහ දෙව් රජු) යනුයෙන් මෙහි සඳහන් වූයේ මෙහෙසුරු තෙමේ යි. 'ශිව' යනු ද මහ ඉසුරුට නමෙකි. ශිවයා ගේ ලකුණ හෙවත් හන 'ශිව ලිංගය' යි. එ සිව (ශිව) දෙවියා ගේ රූ වෙසෙසත් පවතන් බුදු ගුණ අලංකාරයෙහි සඳහන් වෙයි.

බමුණන් ගේ දහමේ හැටියට ඇති වීම, වැඩීම, නැසීම යන තුන් පවත ගුණ විසින් සත්ත්ව, රජස්, තමස් යන්නෙන් ද, මූර්ති විසින් බ්‍රහ්ම, විෂ්ණු, ඊශ්වර යන්නෙන් ද අඳුන්වන ලදී. පසුවට පසුවට ඇඳුරෝ මූර්ති විසින් දක්වන ලද ගුණ තරන් ඡේ වෙසෙන දෙවියන් ගේ ගණයෙහි ලා එකකට

වැඩියෙන් අනෙක බලවත් සේ සලකවමින් වැඳුම් පිදුම් කරන්නට වූ. එයින් 'තමෝ' ගුණය මැ වූ මෙහෙසුරු හෙවත් ශිව මූර්තිය උස් කොටැ සලකන්නෝ 'ශෛවයෝ' යි පළ වූහ. උෟ තුමූ ශිව මූර්තිය මිනිස් පවතින් සිරුරු සහිත කොටැ (ඒ වදන් මත් දෙවියාට) පිය බදක ද සලසා දී කෛලෙස් ගිරි මුදුනේ වස්වා වැඳුම් පිදුම් කරන්නට වූ, ඒ තමා 'මහ දෙවියා'. ඔහු ගේ පියාවයි හිමාලය පර්වත රජු ගේ දූ වූ උමාව. ස්කඳ කුමරුත් ගණ දෙවියාත් එ දෙ මහල්ලන් ගේ දරුවෝ යි. පර්වත රජයා ගේ දූ වූයෙන් 'පාර්වතී' යනු ද උමාවට නමෙකි. ශිව දෙවියා යෝගියෙකි හෙවත් යෝගාවචර තවුසෙකි. පෙවෙත සිගීම යි.

එයින් කියැවිණි:-

රාමාද්භූවය මේදිනිං ධනපතේර්බීජං බලාල්ලාංගලං
ප්‍රේතේශාත්මහිසං තවාස්ති වෘෂභඃ ඵාලං ත්‍රිශූලං තව.
ශක්තාහං තව චාන්තදානකරණේ ස්කන්ධෝස්ති
ගෝරක්ෂණේ
ඛිණ්ණාහං හර භික්ෂයා කුරුකෘෂිං ගෞරීවචඃ පාතු වඃ.

(රාමයා ගෙන් බිමක් ද, කුවෙරයා ගෙන් බිජුවට ද, බලයා ගෙන් නඟුල ද, යමයා ගෙන් මීමා ද ඉල්ලාගනුව. ඔබේ ගොනා ද ඇති, ඔබේ තිසුලවිය උදැල්ල වෙයි. ඔබට ඇඹුල එවීම මට ද හැකියි. හරකුන් රැකැ බලාගැන්මට කඳ කුමරු සිටියි, ගොවි තැනක් කරන්නැ, ඔබේ හිඟා කෑම මට තිත්ත වී ඇති' යි පාර්වතිය කී වදන් තොප රකිවා) යි.

පසුවට පසුවට ඇදුරෝ ශිව හන (ලිංගය) තන්හි තන්හි පිහිටුවා වැඳුම් පිදුම් කිරීමට පටන් ගත්හ. තව ද කල් යත් යත් මා- පිය ගුණය සලකා ශිව හන සමඟැ උමාව ගේ යෝනි ලකුණ ද පිහිටුවා අමුතු විදියේ වැඳුම් පිදුම් කරන්නට වූ. උමා යොන් හන පස් ගෝ රසින් පුරා මහ පෙරහරින්

ශිව හන වැඩම කරවා එහි ගන්වා ඉතිරු යන පස් ගෝ රස මිඳ මඳ දිවේ ගා ගෙනැ මිහ පිත් සිඳු කොටැ ගැන්මෙන් සුව පත් වීමයි එයින් කැරුණේ. එයිනි:-

‘අයකු පිළිකුල් වන
අයකු සිතු රු එඩවන’ (172)

යනු කියැවුණේ.

(4) ‘අනඟ රුව දැවියා’ (161)

මහ ඉසුරු හිමවු පියෙසේ පසෙකැ දැඩි තව කමේ යෙදී දැහැන වඩමින් හින්දූ දී හිමවු පවු රජු ගේ දූ වූ උමාව උදේ සවසැ ඔහු වෙතැ අවුත් අවට ඇමැදීම්, පැන් ගෙනවුත් තැබීම් ඈ වත් සපයා මලින් ඔහු පුදා වැඳැ යාමට පුරුදු වැ සිටියා. ඉසුරු තෙමේ ඇය නො ද බැලී, නො ද දිටි.

එ දවස්හි ලක් දිවේ තාරක නම් අසුර රජු දෙවියනට මහ කරදරයක් වූයෙන් ඔහුට නො මැරෙන වර දුන් බඹු ලා එ වර ඉවත් කැරැවීමට සුරිඳු ගේ අනුදැන්ම පිටැ සුරගුරු පෙරට කොටැ දෙවියන් ගේ නියොජුවෝ බඹ විමනට ගියහ.

බඹ තෙමේ උන් ගේ දුක් ගැනැවිලි අසා තමා විසින් දෙන ලද වරයක් ඉවත් කිරීමේ තමා ද සමත් නො වන බව පවසමින් තාරකයා නැසීමට උපායක් ද පැවැසී. මෙහෙසුරුට දා වැ උමාව කුසින් පුතකු උපනොත් එ පුතුට තාරකයා නසනු හැකි වන බව පැවැසීමයි බඹු දුන් උවදෙස.

එ උවදෙස ඇසූ සක් දෙව් රජු ගේ ඇනැවීමෙන් අනඟ තෙමේ දුනු හී සරු ගෙනැ අවුත් අඹ ගසක් මුවායේ සිටැ පාර්වතිය වත් සපයා පෙරළා යන්නට වදින් මැ මහ ඉසුරුට ‘සම්මෝහන’ හිය විදැ හළේ යි. එ ඊ පහරින් කැළැඹුණු මහ ඉසුරු කරුණු විමසත් මැ බිය නිසා දුනු දියට

අත දුන් වන මැ සැලෙමින් අනඟා සිටියෙන් තමා ගේ දළ ඇසින් ඔහු දෙසැ බැලී, අනඟ. තෙමෙ එ තැනැ මැ අළු වූයේයි.

හි පහරින් මූළා වැ ඇවිදිනට බට මහ ඉසුරට සත් රුසිවරයෝ මඟුල් කපු කම් කොටැ පාර්වතිය ලැබැ දුන්හ. ඒ මඟුලෙහි සරසවිය මහ ඉසුරු යුවළට දුන් තුති පත තමා ලොවේ මුල් මැ තුති පත.

පාර්වතිය පාවා ගත් මහ ඉසුරු මල්සරු (අනඟා) නැති විටැ ඉන් වැඩක් නැතියෙන්, බඹුගේ ද ආරාදනය ඇති වැ අනඟයා අඩ සිරුරු කොටැ මැවී. පාර්වතිය ඔහු නිසා කඳ කුමරු වැදූ.

(5) 'තෙදියතැ උවිඳු මය
නැත වෙන කෙනෙක් එ සමය' (175)

ඒ වතාහි වෙනු (විෂ්ණු) දෙවියා අදහන්නවුන් (වෛෂ්ණවයන්) නිගන්නා පිණිසැ මූල පිරු සැටියි. රජෝගුණය මූර්තිමත් කොටැ (ගත් ගත්වා) ඇඳූහිමට ගන්නා ලද විෂ්ණු දෙවියා අදහන්නවුන් ගේ ගණන ලක් දිවේ ඉතා මහති. මෙ දෙවියා (සුදෙව් දනන් ගේ) යාවේ තුමන් සෙසින් ලොව පුරා වැඩැ සිටිනියි කියන බසයි 'තෙදිය තැ උවිඳු මැ යැ' යන්නෙන් පළ කැරුණේ.

මේ දෙවියා පිළිබඳ විසිතුරු පවත් පුරාණ කතාවත් හි මිසැ ඉපැරැණි වේදයන්හි සඳහන් නො වෙයි. දස අවතාර-යෙකින් යුතු යැයි කියන විෂ්ණු දෙවියා ඒ ඒ අවතාර-යෙන් පෙනී සිටැ කරන ලද සමත් කම් පුරාණ කතාවත්හි සඳහන් වෙයි. එ දස අවතාරයන් ගෙන් ලක් දිවේ ඉතා පසිදු 'රාම' අවතාරයයි. එ අවතාරයෙන් සිටියැ දී ඔහු ගේ පියාව වූ සීතාව ලක් දිවැ වුසු රාවණ රජු විසින් පැරැ ගෙනැ එන ලදැයි සඳහන් වනුයෙහි අන් ඇමට වැඩියෙන් රාම අවතාරය මෙහි පසිදු. ලක් දිවේ

(බුදුනු හෝ වූ) කුමර දස් නම් සිහළ කිවිසා විසින් වෙනුට පුද පැසැසුම් විසින් කරන ලද 'ජානකීහරණ' නම් මහ කවේ කතා වස්තුව ද රම සීතා කතා පුවතයි.

දඹ දිවේ නම් රම අවතාර සේ මැ 'කෘෂ්ණ' අවතාරය ද ඉතා පසිදුයි. එහි 'ජයදේව' නැමැත්තකු විසින් කරන ලද ගීත ගෝවින්දයෙන් කැරෙන්නේ කෘෂ්ණ අවතාරය පැසැසිමයි රම පුවත පිළිබඳ 'රාමායණය' බුදුනුවන් විසින් නො කියැවියැ යුතු, වැඩ නැති එකක් බව:-

'රාමායණ බරත
ඈ තුලු දෙඩුම් මුල් යුත
කීමුත් බස් නිරත
යුතු වැ දෙ අගින් නියම් නියවත'

යන්නෙන් සිරි රහල් හිමියෝ මදුරති. ඒ එ සේ වතුදු,

'ඈම තැනැ උවිඳු ඈත'

යනු කීවා සේ සිරි ලක් දිවේ පන්සලක් පන්සලක් පාසා උවිඳු සිටිනු පෙනේ

මත්ස්‍ය, ඉදිබු, ඌරු, නරසි, කුරු, රාමචන්ද්‍ර, බලරාම, කෘෂ්ණ, බුද්ධ, කල්කී යැයි විෂ්ණු දෙවියා ගේ දස අවතාරය දක්වීමේ දී බුදුනුදු පවා විෂ්ණු අවතාරයක් හැටියට සලකවන්නට වෛෂ්ණවයන් සිතූ බව පෙනේ.

දශ අවතාරය විසිතුරට දක්වා ඉක්බිති එ දශ අවතාරයෙන් කැරුණු දූය:-

වේදානුද්ධර තේ ජගන්නිවහතේ
භූගෝලමුද්බිභ්‍රතේ
දෛත්‍යාං දාරයතේ බලිං වලයතේ
ක්ෂත්‍රක්ෂයං කුර්වතේ
පෞලස්ත්‍යං ජයතේ හලං කලයතේ
කාරුණ්‍යමාතන්වතේ
ම්ලේච්ඡාංමූර්ච්ඡයතේ දශාකෘතිකතේ
කෘෂ්ණාය තුභ්‍යං නමඃ

(වේදයන් උදරයි, ලොව වහවයි, භූගෝලය දරයි, අසුරා දරණය කරයි, බලියා රවටයි, කැත්තන් ගෙවයි, රවුළා දිනයි, නගුලිස දරයි, කුලුණ පතුරුවයි, මිලක්කයන් මුස පත් කරයි. දස අයුරු කළ කෘෂ්ණයා වූ ඔබට නම කැරුම් වේවා) යි ගීත ගෝවින්ද කරුවෝ කියති.

බුදු ගුණ අලංකාරයෙහි මහ දෙවියාත් විෂ්ණු දෙවියාත් පමණක් සඳහන් වීමෙන් පෙනෙන්නේ වීදගම හිමියන් ගේ අවදියේ ලක් දිව පුරා ශෛවයනුත් වෛෂ්ණවයනුත් ඉස් මතු වෙමින් සිටි බව. ජයවද්දනපුර අසැ කොත්තගං තොටින් එ තෙර වූ තැනැ මැ පවා ඉසුරු කෝවිලක් වූ බව සැලළිහිණි අස්නේ සඳහති.

# ජාතක කතා

මග බෝසතුන් පැරුම් බිම්හි ලා දක් වූ දන් සිල් ඈ ගුණයන්හි මහිමය පළ කරන ගමන් ජාතක කතා තුදුසෙකැ නම් සිහිපත් කරවති බුදුගුණ අලංකාර කතුවරයාණෝ. එයින් මුලට මැ සඳහන් වන්නේ:-

## ( 1 )

‘අප මුනි සස කලේ
දුන් දනට නො වැ සස ලේ
දෙවිඳු ඈඳි සස ලේ
දනුත් පවතී යැ සිසි මඩලේ’ (343) යැයි

### සස දවසී (316)

බුදු රදුන් දෙව්රම් වෙහෙර වැඩැ වසන ආදියේ දී බුදු පාමොක් සඟනට සිවු පස දනක් ගහපතියකු විසින් පිළිගන්නු ලැබීම මුල් කොටැ ගෙනැ මෙ දව වදළ බවයි ජාතක ‘පොතින් පළ වන්නේ’. එහි සැකෙවි පුවත මෙ සේයි:-

යට ගිය දවසැ බරණැස් නුවරේ බඹදත් නම් රජකු රජ කම් කරමින් සිටියැ දී අප මහ බෝසතාණෝ සාවකු වැ ඉපැදී හිමවු පියෙස බද වන රොදෙකැ වෙසෙති. එ දවසැ එක් සිවලෙක් ද, වඳුරෙක් ද මස්කාවෙක් ද ඒ සාවාණන් හා මිතුරු වැ එ තුමන් ගෙන් ඔවදන් අසමින් දැහැමි වැ වෙසෙත්. එක් දවසෙකැ අහස දෙසැ බැලූ සාවාණන් හට සෙට පෙහෙවස් විසියැ යුතු දිනය යැයි සඳේ කලා අනුවැ පෙනී ගියේයි. එ හෙයින් එ සා තුමෝ යහළුවන් තිදෙන හට එ බව පවසා සිල් රැක්මේ අනුසස් පළ කොටැ ඔවදන් දී සිල් රක්නවුන් දන් පතා ආවනට දන් දීමේ අගය සිතැ තබා ගත යුතු බව අඟවා යැවූ.

පෙහෙ වස් වැ සිල් රැකීමේ අනුසස් මිතුරාණන් ගෙන් අසා දත් යහළුවෝ තිදෙන එ පිණිසැ සැරැසී අහර සපයා තිබා පසු ද පෙහෙ වීම ඇරැඹූ. සා (බෝසත්) තුමෝ දන් ඉල්ලා ආ කෙනකුන් හට තමන් බුදුතා තණ දනට දීමෙන් වැඩක් නො වන බව සලකා එ වන් යදියකු අව සිය ඇඟැ මස් දනට දෙමියි සනිටුහන් කොටැ ගෙනැ රැය ගෙහෙන් ගෙවා පොහො ද පෙහෙ වස් ඉටා රක්නට බට හ.

එ වේලේ සක් දෙව් රජු ගේ පඬු ඇඹුල් ගල් අසුන රත් වූයෙන් එයට කරුණු කිමැයි ලොව බැලූ එ දෙව් රජුට මහ සතුන් ගේ දන් අදිටන් බෙලෙන් එ වූ බව පෙනිණි බෝ සත් සාවාණන් ගේ දන් අදිටන පිරික්සා එය ලොවට පළ කරන්නට සිතූ සක් දෙව් රජ තෙමේ සා ගින්නෙන් පෙළෙන ජරපත් බමුණු මහල්ලකු ගේ වෙසින් මිනිස් ලොවේ පෙනී පළමු වැ මස් කාවා වෙතැ ගොස් බුදිනා දූයක් ඉල්ලා සිටියේයි. මස් කාවා තම හට අහර පිණිසැ ගං තෙරින් ගෙනැ අවුත් තබා ගත්නා ලද ලේල් මසුන් එ බමුණාට පිළිගන්වන්නට සැරැසිණි. බමුණා එ පිණිසැ පසු ද එන බව කියා නික් මැ ගොස් සිවිලා දූකැ පළමු සෙයින් අහරක් පැතී සිවලා ද තම හට දවාලේ දනට අසල් පැලෙකින් ගෙනවුත් තබා රැකි පැලැහූ තල ගොය් මසුත් දී කිරිත් දෙන්නට සැරැසිණි. එ ද පසු දට කල් තිබා වඳුරා වෙතට ගිය බමුණා උගෙන් ද බුදිනා දූයක් පැතී. වඳුරැ තෙමේ තම හට එ දිනැ අහර පිණිසැ පළමු දවසේ ගෙනවුත් තිබා ගත් අඹ ඔහුට පිළිගැන්වී. එ ද පිළිගැන්ම පසු දට කල් දූමූ බමුණා සාවාණන් වෙතැ ගොස් බුදිනට දූයක් ඉල්ලා සිටියේ යි.

සා බෝසත් තුමෝ බමුණු දූකැ සොම්නසට පැමිණැ තමා ගේ දන් අදහස මුදුන් පත්තේ යැ යි ඔහු පසසා තම ඇඟැ මසින් ඔහු පවරමින් ඇඟැ මස පලහා දෙනු පිණිසැ දර රැස් කොටැ ගිනි මැළයක් දල්වන සේ ඔහුට පැවැසූ. සක් බමුණා ද ඉදුහ බලයෙන් ගිනි මැළයක් දල්වා සාවාණන් හට

දැක්වූ හ. සාවාණෝ තමන් ගිනි වැදූ මළ ඉක්බිති පැලැහුණු මස් බුතට බමුණාට පවසා ඇඟැ වූ මැක්කන් ඇ කුඩා සතුන් රැකෙනු පිණිසැ ඇඟැ කිලි පොළා ගසා දමා ගින්නට පිනූ හ. ඒ ගින්න ඔවුන් ගේ සිරුරට හිම මෙන් සිහිල් පහස් දුන්නා මිසැ ඇඟැ රෝම කූපයකුත් හුණු නො කෙළේයි. මහ සත් තුමෝ එයට කරුණු කිමැයි බමුණු පිළි විසිය හ. ‘මම් බමුණෙක් නො වෙමි. සක් දෙව් රජ වෙමි. ඔබ ගේ දන් අදහස පිරික්සිමට වතිමි’යි පැවැසූ සක් දෙව් තෙමේ එ සියල්ලනට පළ වැ පෙනෙනුවට බෝ සත් සාවාණන් ගේ රුව සඳ මඬලේ සිත්තම් කොටැ බෝ සතාණන් එ වන රොදෙහි මැ කුස තණ ඇතිරියෙකැ සතප්වා පෙරළා තමා වසන දෙව් ලොවට මැ ගියේයි.

එතැන් පටන් යහළුවෝ සිවු දෙන දිවිහිමියෙන් සිල් රක් මින් එ වන ගෙළේ මැ වුසූ.

## ( 2 )

‘වටු වැ ද උන් තැනේ
මෙ කපැ ගිනි නො ගනී යැ එ වනේ’ (244)

### වට්ටක ජාතකය (35)

මගද රටේ සැරි සරන අතරැ එහි අට ගත් ළැව් ගින්නක් නිසා ඇති වූ බියෙන් බුදු රදුන් ද නො බලා පලන්නට බට පැවිද්දන් රැසක් අරබයා එ තන්හි දී මැ දෙසන ලද්දෙකි මේ ජාතකය.

යට ගිය දවසැ අප බෝසත් තුමෝ මගද රටේ පළමු සඳහන් කරන ලද වන පියසෙහි වටු වැ උපන් හ. බිජු වටින් එළි දුටු වටු පැටියාණන් රැක්මේ යෙදුණු වටු දෙ මහල්ලෝ තුඩින් ගොදුරු ගෙනැ අවුත් කවමින් ඒවෙනේ නො එක් තැනැ සැරූ හ. බෝසත් වටු පැටියාණන් හට පියා විදා අහසට නැඟීම හෝ පා නහා ඔබැ මොබැ යාම හෝ හැකි වන්නට පළමු එ වෙනේ ළැවු ගින්නෙක් ඇති වූයේයි. ළැව් ගිනි ඇති වීම එ වන පියෙසට අමුත්තෙක් නොවී.

බුර බුරා පැනැ නැඟෙමින් වනයේ ගස් වැල් දව දවා පතිරා එන ළැව් ගිනි හඬ ඇසූ එ වෙනෙහි සත්තු මරණ බියෙන් තැති ගෙනැ අන් පියෙස් බලා පැලැ හ. වටු දෙ මහල්ලෝ ද මරණ බිය දරා සනාවට වඩා මහත් වූයෙන් දෙ බෝසත් වටු පැටියාණන් කැදැල්ලේ මැ පියා පියාඹා පැලැ ගිය හ.

කර දිගු කොටැ ඇතැ මැතැ බැලූ බෝසතුන් හට ළැව් ගිනි කඳ වනය කා දමමින් එන බවත්, සියලු සතුන් දිවි තිසා පැලැ බවත්, තමන් තනි වූ බවත් පෙනිණි එ කල්හි එ මහසත් තුමෝ:-

'ළැව් ගින්න වනය දවමින් එයි, සියලු සත්තු පැලැ ගිය හ. මගේ දෙගුරුහු ද මා දමා පැලැ ගියෝයි. ඉදින් මට පියා පත් විදා ළන්නට සවියෙක් වී නම් මට ද පියාඹා පැලැ ගැළැවෙන්නට හැකියි. පා නඟන්නට පිළිවන් කමෙක් ඇත් නම් ඔබට ගමන් කොටැ ගැළැවෙනු හැකියි. එ කිසිත් බැරි මට ඇත්තේ දහම පිළිවිඳි පෙරා බුදු උතුමන් ගේ වදනෙහි යම් සැබැවෙක් වේ නම් එහි පිහිට පමණයි. මම් එ අදහමි. එහි සැබැවි බෙලෙන් මෙ ගින්න පසු බසීවා'යි සස් (සත්‍ය ක්‍රියා) කළෝ. එ සස් කිරීමේ බෙලෙන් නැවැත්තා වූ ගින්න සොළොස් අතක් තන් පසු බැසැ නිවී ගියේයි. එ සස් (සත්‍ය කියායේ) බලය තව තෙක් පවත්නේ වෙයි. එ හෙයින් එ වටු පැටි බෝසතුන් වුසූ තැනැ මෙ කප තෙක් ගිනී නො දැල්වෙයි.

(3)

පුරුක් බට බඹුවල
දැනුත් නැත්තේයැ උත් උත්වල' (245)

## නළපාන ජාතකය (20)

මේ ජාතක කතාව බුදු රදුන් නළපාන විල අසල් කේතක වෙනෙහි වැඩැ වසන කල්හි කොසොල් රට මැදින් පිඩු සිඟා වඩිත් දී දෙසන ලද්දේ යි.

තළ පාත විලේ දිය නෑ පැමිදි උතුමත් ඉදි කටු කොපු පිණිසැ එ විල අසැ බට දඬු ගෙනැ එහි පුරුක් නැති සේ දැකැ එ බුදු රදුන් හට දැක්වූයෙන් එයට කරුණු විසිනි මෙ පවත වඳුරත්නට සිදු වූයේ.

යට ගිය දවසේ තළ පාත විල බද පියෙසෙහි මහ වනයෙක් වී. බෝසතාණෝ එ වෙනෝ වඳුරු රජ වැ ඉපැදී අසූ දහසක් වඳුරන් රක්නාහු 'යහළුවෙනි, මෙ වෙනෝ විස පල අටගන්නා රුක් ඇති, දිය රකුසුන් වසන විල් ඇති. එ හෙයින් මා නොවිතාරා මීට පෙරැ බිඳූ පුරුදු නැති වගෙකැ පල කිදීමක් හෝ නුපුරුදු විලෙකැ දිය බීමක් හෝ නො කරවු යැ'යි සිය පිරිසට ඔවා දුන් හ. වඳුරෝ ද යහපතැයි ගිවිස්සා හ.

එක් දවසෙකැ වනයේ ඔබැ මොබැ සරන වඳුරු මුළ තළ පාත විල පිහිටි තැනට පැමිණැ පැන් පවසින් පෙළුණත් බෝ සතුන් එනු බලමින් සිටිය හ. මදෙකින් එ හි පැමිණි බෝසතාණෝ පැන් නො බොන්නට කරුණු කිමැයි උන් විතාරා දැනැ ඔවුන් පසසා විල වටා ගොස් අවට පිරික්සා විලට බටුවන් ගේ මූන් විලින් ගොඩ නැගුණවුන් ගේ පියවර සටහන් නො දැකැ එකතින් මේ දිය රකුසකු වසන තැනැයි දැනැ පිරිසට එ පවත් පැවැසූ.

එ වේලේ දියේ මතු පිටට වන් දිය රකුසා විලට බැසැ පැන් බොන සේ වඳුරනට කී යැ. ඔහු දිය රකුසා බව දත් බෝසතාණෝ දියට බටුවන් මැ අල්ලා කන්නට ඌට වර ඇති බව ඌ මැ විතාරා දැනැ 'අපි විලින් පැනුන් බොමු, තට අප අල්ලා කන්නට වර ඇති සරියටත් නො එමු'යි පවසා බට දඬක් ගෙන්වා ගෙනැ තමන් පුරන දස පැරුමන් සිහි කොටැ මෙහි පුරුක් නැති වේවා යි ඉටා පිඹැ ලූ හ. එ විටැ එහි සියලු පුරුක් සිදී තනි සිදුර ඇති වූයේයි. එය එක් වඳුරකුට දී තව බට දඬක් ගෙනැ 'එ සේ පිඹැලූහ. එ අයුරින් අසූ දහසක් බට දඬු පිඹීමට කල් ගත වන බව දුටු බෝසතාණෝ විල වටා ගොස් එ විල් තෙර සියලු

බට, පුරුක් රහිත වේවා යි අදිටන් කළහ. ඒ එසේ වියැ. මේ කප නො ගෙවෙන තෙක් මැ එ විල වටා බට ගස්හි පුරුක් ඇති නො වේ

(සඳේ සා ලපය, වටු වැ උන් තැනැ ගිනි නො ඇවිලීම, ඝටීකාරයා ගේ ගෙය වූ තැනට වැසි නො වැටීම, නළපාන විල අසැ බට ගස්හි පුරුක් ඇති නො වීම යන සතර කප මුළුල්ලේ පවත්නා බව යෙති)

එ අයුරින් පුරුක් නැති වූ බට දඬු ගෙනැ ඉන් විලේ දිය උරා බී වඳුරෝ දිය රකුසුට නො හසු වැ ගිය හ.

## (4)

'එමෙකා තම                    මරත
ඔහුට මහ පැ කෙළේ මහ මෙත' (246)

### මහා කපි ජාතකය (516)

බුදු රදුන් වේළුවනයේ වැඩැ වසත් දී දෙව්දතු ගේ ගල් පෙරළීම අරබයා මේ ජාතකය දෙසන ලද්දේ යි.

යට ගිය දවසැ බරණැස් නුවරැ බ්‍රහ්මදත්ත නම් රජු රජකම් කරත් දී කසී රටැ ගමෙකැ ගොවිතැන් කරන බමුණෙක් කුඹුර සා පියා ගොනුන් මුදා හැරැ උදැල්ලෙන් කලල් පෙරළීමේ යෙදිණි. ඒ ඒ පඳුරේ දළු කඩා කමින් කෙමෙන් ඈතට ගිය ගොන්නු මහ වනයට වැදුණෝ යි. සවස් වූ බව දුටු ගොවියා උදැල්ල පසෙකැ තිබා ගොනුන් දක්නට ගියේ උන් නො දැකැ සෝ පත් වැ වනයේ ඔබැ මොබැ උන් ගිය තැන් විමසා ඇවිදැ ඉබේට මැ මෙන් හිමවු පියෙසට වනි. එහි දී මං මුළා වැ අහරක් ද නැති වැ සත් දවසක් ඇවිද්දේ තිණ්ඩුක ගසක් දැකැ පල නෙළා බුදිනු සිතා එ ගසට නැගිණි. පය ලුහුටා යාම නිසා එ ගසින් සැට රියන් ගැඹුර නරා වළ කට වැටුණු හෙ තෙමේ එහි දස දිනක් ගෙවී.

එ දවසැ වඳුරු යෝනියෙහි ඉපිදැ සිටි මහ සත්‍වාණෝ පල වැලු බුදිමින් ඇවිදිනාහු ඔහු දැකැ මෙත් සිත උපදවා ඉණැ ලණුවක් බැඳැ ගෙනැ තරා වලට පැනැ ඔහු ගොඩ නගා ඉන් වූ දැඩි විඩාව නිසා විපතක් පැමිණෙන බලවයි ඔහුට පවසා මඳක් නින්දට බට හ.

මිනිස් තෙමේ නිදන්නා වූ වඳුරාණන් දැකැ 'මූ මරා මස් කකා යෙමි'යි සිතා ගලක් ගෙනැ හිසැ පහළේ යි. වඳුරාණන් ගේ හිසේ සම ගැලැවී මුණ වසා වැටිණි. පිබිදුණා වූ වඳුරාණෝ එල්ලෙන සම් පොත්ත අතින් වහවමින් රුකකට පැනැ 'මූට මා මහ නො පැ වහොත් මේ වනෙහි මුළා වැ ඇවිදැ නස්සී'යි මෙත් කොටැ එක් අතෙකින් සම් පොත්ත වහවමින් තුන් ගාත්‍රයෙන් අත්තෙන් අත්තට පැනැ ගස් මතින් මැ යෙමින් ඔහුට ගම් පියෙසට යන මහ පෙන්නූ හ.

## ( 5 )

'කෙළේ සම මෙත මැ සත් මැසි වැ ද (247)

## චූල්ල ධම්මපාල ජාතකය (358)

බුදු රදුන් වේළුවනෙහි වැඩැ වසත් දී දෙව්දත් බෝසතුන් මරන්නට යාම මුල් කොටැ මේ දෑව දෙසන ලදී.

යට ගිය දවසේ මහා ප්‍රතාප රජු බරණැස් නුවර රජ කරමින් සිටියැ දී බෝසත් තුමෝ එ රජු ගේ අග මෙහෙසුන් චන්ද්‍රා බිසොවුන් කුසින් ඉපිදැ 'ධම්මපාල'යැ යි නම් කරන ලද හ. සත් මැසි වියේ සිටි එ කුමරුන් සුවඳ පැනින් නාවා විසිතුරුවට සරසා දරු සනායෙන් උදම් වූ මවු තොමෝ පුතුන් හා කෙළිමින් හුන් හ එ කල්හි එ තැනට රජ තෙමේ පැමිණියේ යි. පුතු සනහා කෙළිමින් සිටි මවුන් හට සිය හිමි රජු දුටු සැණින් නැගී සිටැ වත් සපයන්නට සඳහන් මඳ වියැ. එ දුටු රජ තෙමේ 'පුතු ලැබීමෙන් උදම් වූ මෝ තොමෝ දැන් මැ මා පිදුරු ගසක් පමණටත් ගණන් නො ගතු. මූ වැඩුණු පසු මැය මා සිටිනා

බවකුත් සඳහන් නො කරනු ඇති' යි කිපී 'දැන් මැ පුතු මරවමි' යි සිතා පෙරළා ගොස් සිහසුන් අරා හිඳැ වද කරු ගෙන්වා 'යව, අග බිසොවුන් ගේ ගබ ගෙට ගොස් ඇගේ පුතු ගෙනැ එව'යි අණ දිනි. වද කරු තෙමේ ගොස්,. රජු කොපින් පෙරළා ගිය බව් දැනැ පුතු ළෙහි හොවා ගෙනැ වළප්නා මවුන් ගේ පිටට පහරක් දී දරුවා උදුරා ගෙනැ අවුත් රජුට දැක්වී. එ විටැ රජු පුවරුවක් ගෙන්වා පුතු එ මත්තේ හොවන්නට අණ කෙළෙත් වද කරුවා එ ද කෙළෙයි. චන්දාදේවී එහි පැමිණැ වළප්මින් සිටිය හ. එ විටැ රජතෙමේ කුමරුගේ අත් සිඳැලන්නට අණ දිනි. 'මහ රජ මා පුතා ළදරුවෙකි. සත් මැසි වූ හේ තෙමේ කිසිත් නො දනී. යම් කිසි වරදෙක් වී නම් ඒ මා අතැ මිසැ ඔහු අතැ නොවේ එ හෙයින් මගේ අත් සිඳුවනු මැනැ'යි වැළපුණු. එ හෙත් රජ තෙමේ වද කරුට දැඩි අණ දී ළදරුවා ගේ අත් සිඳැවී. ළදරුවාණෝ හැඬීමක් වැලැපීමක් නැති වැ පැරුම් බෙලෙන් වෙයින සහා ගත්හ. මවු තො මෝ වළප්මින්, කපන ලද අත් සිය උකුළ මතැ තිබා ගතු. ඉක්බිති වැ දෙ පයද එ සෙයින් මැ සිඳුවන ලදී. ඉක්බිති මවු තොමෝ කපන ලද පා උකුළ මත රඳවා ගෙනැ අත් පා නැති දරු කොටය තම හට දෙන සේ ඇයැදියා. ඉක්බිති ළදරු හිස ද ගසා දමවා පෙති ගැස්වී. වළප් ගත් මවු තොමෝ සොවින් මැඩී එතැනැ මැ මළා. පොළොව විවර වැ ගිනි දැලි පැනැ නැඟී රජු වෙළා ගෙනැ ගියේයි.

## (6)

'ඇස් උපුට දුන්නේ
සිතෙයි පිරි සන්තොසැ මැ දුන්නේ' (248)

### සිවි ජාතකය (499)

බුනි රජුන් දෙවීරමැ වැඩැ වසත් දී අසම දනක් මුල් කොටැ ගෙනැ මේ දව දෙසන ලදී.

යට ගිය දවසැ සිවී රටැ අරිට්ඨ පුරයේ සිවි නම් රජු වසත් දී මහ බෝසත් තුමෝ එ රජුට පුත් වැ ඉපිද 'සිවි කුමාරයෝ' යැයි පසිදු වැ වසත්නාහු සුදුසු කලැ තක්සලා නුවරැ දිසා පාමොක් ඇදුරු කෙරෙන් සිප් සතර හදරා දැනැ යුවරද තන් පත් වැ වැසැ පිය රජු ඇවෑමෙන් මහ රජ තන් පත් වැ දනපති වැ වසත්නාහු දවසැ සය ලක්ෂයක් දන දන හට දනට දෙති. එ තුමෝ අට වැනි, තුදුස් වැනි පසළොස් වැනි දිනයන්හි දන් හල් බැලීමේ ගොස් දන් දෙන්නා බලා සොම්නස් වෙති.

එ සෙයින් වසන එ තුමෝ එක් පසළොස්වක් දිනෙකැ සිහසුන් අරා හිඳ තමා ගේ දන් ගැනැ සලකන්නාහු බැහැරි දෑයින් මා දනට නුදුන් වතෙක් නැති, මගේ සිරුරින් යමක් දෙන්නට ලැබුණොත් මැනැවැ' යි ඇස් ඉස් මස් ලේ දන් දීමේ දෙළක් ඇති කොටැ ගත් හ. එ සෙයින් සලකා දන්හල් බැලීමට යන්නා වූ එ තුමෝ සරහන ලද ඇතු පිටැ නැඟී නික්මුණාහු ය.

ඔවුන් ගේ අදහස දත් සක් දෙව් රජ තෙමේ එ පිරික්සා බලන පිණිසැ අඳ බමුණු වෙසක් මවා ගෙනැ පැමිණැ ඇස් දන් ඉල්ලා සිටියේ යි. මහසත් තුමෝ ඔහු මාළිගයට කැඳවා ගෙනැ ගොස් මහ සෙනෙවි ආදීන් වළක්වත් දී මැ 'සල්ල කත්තු' වෙදු ගෙන්වා ඇස් ගෙඩි උදුරවා සක් බමුණුට දුන්හ. සක් දෙව් තෙමේ එ ගෙනැ දෙව් ලෝ ගියේයි.

අඳ වූ රජ තුමෝ 'අඳුනට රජ කමින් 'කවර වැඩ දැ'යි සලකා තව රැක්මේ යන පිසි අඟවමින් රියැදුරන් ගෙන්වා තමන් වන උයන් ගෙනැ ඇරලා මුව ද්‍යෝනා පිණිසැ එකකු රැඳියැ දී, වැදෑ හෝනා තැනට යන්නට කණ වැලක් බඳැ යවු යැයි කීහ. නිරිඳුන් රියෙන් ගෙනැ යනු නො රිසි වූ උඟ තුමූ රත් සිවිගෙයෙකින් වඩා ගෙනැ ගොස් එ ගෙන් මැ පොකුණු තෙරැ රඳවා, අවට රකවල් ලවා උවටන් කළහ.

එ කල්හි සක් දෙව් රජු ගේ සල අසුන රත් වූයෙන් කරුණු කිමැයි ලොව බැලූ දෙව් රජ තෙමේ රජුන් ගේ පවත් දැකැ මිනිස් ලොවට බැසැ එ තුමාණන් ගේ ඇස් ගළි අටගන්නට සලස්වා සියලු පුර වැසියන් හට තමා දක්වා ඔවුන් බල බලා සිටියැ දී මහ බෝසතුන් ගේ දන් පැරුම් බල පළ කරවමින් පසසා තමා වසන දෙව් ලොවට මැ ගියේයි. බෝ සතාණෝ සිවි නුවර වැසියන් ගේ දන් සිත වඩවමින් ඔවුන් හට දන් අනුසස් පළ කොට දක්වා දන් දීමෙහි නිරත කරමින් වුසූ හ.

## ( 7 )

'පුණු යකු ගෙනැ දමන<br>
විදුරු පඬි කලැ එ සුගත' (249)

### විදුර ජාතකය (545)

මූනිඳුන් දෙව්රම් වෙහෙර වැඩැ වසන අවදියේ දී නැණ පැරුම මුල් කොටැ දෙසන ලද්දේ යි මේ ජාතකය.

කුරු රටේ ඉඳිපත් නුවර ධනඤ්ජය කෝරව්‍ය රජුට අරුතින් දහමින් අනුශාසනය කිරීමෙහි 'විධුර පණ්ඩිත' වැ වුසූ හ. අප මහ බෝසතාණෝ එ පඬි තුමා ගේ ඔවදන් අනුවැ දන් දීම් සිල් රැකීම් ඈ පින් කම්හි යෙදෙන ධනඤ්ජය කෝරව්‍ය රජ තෙමේ පෙහෙවස් සමාදන් වූ දිනෙකැ බවුන් වැඩීමට මාළිගය සුදුසු නැතියි ඔවස් සලකා උයනෝ රැඳීමට ගියේ යි. ගියඅත් බැවේ දී එ රජු හා එක් වැ පින් කිරීමෙන් සක් දෙව් රජ සැපත ද, නා ලෝ රජ සැපත ද, ගුරුළු රජ සැපත ද ලැබැ සිටි සක් දෙව් තෙමේ ද, වරුණ නම් නා රජ තෙමේ ද ගුරුළු රජ තෙමේ ද ඒ මැ සලකා ධනඤ්ජය කෝරව්‍ය රජු 'ගේ උයනට පැමිණියහ. ඔවුනොවුන් දැකැ සිල් පවත් ගැන කතාවට බට එ රජහු තුමූ තමන් තමන් ගේ සිල් උතුමැයි විවාදයක් ඇති කොටැ ගෙනැ එ විසඳනු පිණිසැ විදුර පඬි තුමන් කැඳ වූ. පඬි තුමෝ සිවු දෙන ගේ සිල් එක් සම බව පෙන්නා දුන්හ. එයින් සතුටට පත් රජහු තුමූ පඬිඳුන් හට තුටු පඬුරු පුද ගියහ. වරුන නා රජු පිදූයේ තමා ගලැ පැළැඳි මිණි රුවනයි.

සිය හිමියා ගේ ගෙලේ මැණික නැති බව දුටු, එ වරුණ නා රජු ගේ බිසෝ විමලා නොමෝ ඔහු විතාරු ඇම පවත් අසා දැනැ විදුර පඬිදුන් ගෙන් දහම් ඇසීමට දොළක් ඇති කොටැ ගත්තී සිය හිමියාට එ පවසා මන දොළ පුරා ගන්නට ඉඩ නො ලැබෙන බව දැනැ හොර ලෙඩ ගෙනැ පිරිවර නැඟිනියන් හට එ පවත් පවසා හොත්තී යැ. විමලාව ඇසැ දක්නට නැතියෙන් කරුණු කිමැයි විමැසූ නා රජ තෙමේ විදුර පඬිදුන් ගේ හද මස් බිදීමේ දොළින් පෙළී ඇය ඔත්පළ වූ බව දති.

වරුණ තෙමේ විමලාවට දැඩි ඇලුම් ඇත්තෝ වේ. එ හෙයින් ඇය සුව පත් කරවා ගනු පිණිසැ පඬිදුන් ගේ හද මස ලබන්නේ කෙ සේ දැයි සිතන්නා වූ ඔහු ගේ සිත දැඩි සේ පෙළෙන්නට වූයේයි. පිය රජු බැහැ දැකැ යන්නට සැරැසී පැමිණි නා රජු දූ ඉරන්දතිය පියා ගේ සිත තැවෙන සේ දැකැ කරුණු කිමැයි දන්නට ඔහු විතාළී යැ. සිය අඹුව කෙරේ ලොල් වූ නා රජ ඇති පවත් පවසා පඬිදුන් ගේ හද මස යමකු ලා ගෙන්වා දුන හොත් ඇයට ඔහු හා බැඳෙනට වර දෙන බව ද කී යැ.

පියකුට නො වටිනා වදන් දුවට පැවැසූ ඔහු ගේ බස් ඇසූ ඉරන්දති නොමෝ නිසි පරිදි සැරැසී හිමවු පියෙසට පැමිණැ මිහිරි සරින් ගී ගයමින් මල් අස්තෙකැ වැතිරැ පෙනෙනට වූ. වෙස්සවණ (වෙසමුණු) යක් රජු ගේ සෙනෙවිරද්, ඔහු බෑන පූර්ණක නම් යක් තෙමේ ඇය දැකැ ඇගේ රුවට විසි වූයේ විදුර පඬිදුන් ගේ හද මස ලැබැ දෙන්නට පොරෙන්දු වූයේයි.

ධනඤ්ජය කෝරව්‍ය රජ තෙමේ දූ කෙළියෙහි ලොල් සිත් ඇත්තෙකි. එ හෙයින් පූර්ණක තෙමේ රජගහා නුවරට නුදුරේ 'වේපුල්ල' නම් කඳු පියෙසේ වූ කුම්භාණ්ඩයන් ගේ අගනා 'චිත්‍ර' මැණිකක් ගෙනැ ගොස් රජුට පෙන්නා දූ කෙළියෙහි රජු තම්වා ගෙනැ එහි යෙදී රජු පැරැදැවී,

සියල්ල පැරැදි ඉක්බිති රජ තෙමේ පූර්ණකයා ගේ සැලැකැවීම අනු වැ අවසනට, තම අනුශාසකයා වූ විදුර පඬි රුවන ඔට්ටුවට ඉදිරි පත් කොටැ දූ කෙළැ පැරැදියේයි.

පඬි රුවන දිනුමට අත් කොටැ ගත් පූර්ණක තෙමේ එ ගෙනැ නික්මියේ පණ පිටින් පඬිඳුන් ගෙනැ යාමට වඩා ඔවුන් මරා හද මස ගෙනැ යනු සුදුසු යැයි අඳුන් ගිර මුදුනට නැගී ඔවුන් මරනට නො එක් උපා යොදා අවසනැ සැට යොදුන් ගිරක් මවා එ මුදුනට ගෙනැ ගොස් හිස යටි කුරැ කොටැ බිමැ හෙළී බිමැ හෙන්නා වූ බෝසත්හු හෙත අතරතුරේ දී දූනට මෙ තෙක් හිතිමි, මෙ තෙක් හිතිමි'යි ගණන් දත්හ. අවසනැ බිමැ හෙන්නට පළමු පූර්ණකයාට කතා කොටැ ඔහුට 'සාධු තර ධර්මය' දෙසීමට කල් අවසර ලැබැ ගෙනැ එ දෙසා ඔහු පැහැද වූ හ. පැහැදුණු පූර්ණකයා 'නාග මාණවිකාව ගෙන් මට කම් නැති' යි පඬිඳුන් පෙරළා ගොස් ලීමට රිසි වූයේ යි. පඬි උතුමෝ එයට නො නැමී ඔහු ද හා නා ලොවට ගොස් දහම් දෙසීමෙන් විමලාව ගේ රිසිදු පුරා, ඉරන්දතිය ලැබැ දීමෙන් පූර්ණකයා ගේ මන දෙළ ද සපුරා පෙරළා ඉඳිපත් නුවරට පැමිණියහ.

## ( 8 )

'සියතින් කපා දළ
දුන්නෙ සියතින් සවන් පැහැ දුළ' (250)

### ඡද්දන්ත ජාතකය

බුදු රදුන් දෙව්රමැ වැඩැ වසත් දී මෙහෙණක උදෙසා මේ ජාතකය දෙසන ලදී.

මහ බෝසතාණෝ සදත් (ඡද්දන්ත) දහතලාව (විල) බද පියෙසේ සදත් ඇත් කුලේ ඉපිදූ අට දහසක් ඇතුනට නායක වැ චුල්ල සුභද්දා යැ මහා සුභද්දා යැයි ඇතිනියන් දෙදෙනකු රක්මින් පන් සියයක් පසේ බුදුනට උවටැන් කෙරෙමින් වෙසෙති. සුදු පැහැයෙන් බබලන, රත් පැ පා

සතරත් මුහුණත් ඇති එ ඇත් රජුනට අට අසුරියන් උස එක් සිය විසි රියන් දිග කඳ ඇත්තේ යැ. පස ළොරියන් වට තිස් රියන් දිග දෙ දළින් සවනක් රස් පැතිරේ. එ ඇත් රජුන් මහා සුභද්දාවනට වැඩි සතාව දක්වතියි සිතින් ඉසාව (ඊර්ෂ්‍යාව) දරු වෙහෙසට පත් චුල්ල සුභද්දා තොමෝ ඇත් රජුන් පන් සියයක් පසේ බුදුන් පොකුරු මී මුසු නෙළුම් දලී, පල ඈ දෑ වළඳවත් දී තමන් විසින් වෙනෙන් නෙළා ගෙනැ එන ලද පල වැළ ඔවුන් වහන්සේ වළඳවා ලූ චුල්ල සුභද්දා තොමෝ 'මෙ පිනින් මද්‍ර රජ කුලේ ඉපිද නිසි වයසට පත් සඳැ බරණැසැ රජුට අග මෙහෙසිනිය වෙම්වා, එ විටැ එ රජු ගේ ඇසට පිය කරු වැ ඔගේ රිසියක් ඔහු ලා කරවන පමණට ඔහු මන වඩන්නිය වැ, විස පෙවූ ඊ සහිත කොටැ වැද්දන් එවා මෙ ඇතු නස්වා මුගේ දෙ දළ ගෙන්වමි'යි පැතූ. එ සෙයින් පැතූ ඕ නො කා නොබී සිටැ නැසී මද්‍ර රජුට දූ වැ ඉපිද සුභද්දා යැයි නම් ලබා කෙමෙන් වැඩී බරණැස් රජුට අග මෙහෙසිනිය වැ සොළොස් දහසක් බිසෝවරුනට නායක වූ

රජු ගේ හිත තමා තතු වූ පසු ඕ තොමෝ හොරට ලෙඩ වූ අයුරක් අඟවා යහනේ හොත්තී යැ. ඇය නුදුටු රජ තෙමේ 'සුභද්දාව කොහි දැ'යි සෙස්සවුන් විතාරා ඇය ලෙඩ වැ හෝනා පවත් අසා වහා ඇගේ ගබ ගෙට වැදැ පිට පිරිමැදැ ලෙඩට කරුණු විතාළේයි. ඕ තොමෝ තමා ගේ සිත දෙළෙකින් පෙළෙන බවත් එය පසිඳැ ලීම උගහට බවත් පවසා රජු විසින් 'කම් නැති, කෙසේ හෝ පසිඳිමි, කියවයි පවසන ලදින් 'එ සේ නම් ඔබ ගේ රටේ සිටිනා තාක් වැද්දන් රැස් කැරවුම මැනැවී, එ විටැ මම් එය පවසමි'යි කීව. රජ තෙමේ ඇය කී පරිදි සැට දහසක් වැද්දන් රැස් කරවා මෙහෙසියට එ පවත් පැවැසී. ඕ තොමෝ ඔවුන් පිරික්සා බලා සෝනුත්තර නම් එක් හැඩි දැඩි, ඇතුන් පස් දෙනකුට පමණ කය බල ඇති එකකු තිල කොටැ ගේනැ රජු ගේ අනුදැන්ම ඇති වැ ඔහු ගෙනැ මාළිගයේ සත් වන මතු මහලට නැගී උතුරු පැත්තේ කවුළුව හැර එ පැත්ත ඔහුට

දක්වමින් එ පැත්තේ පියසෙකැ සවනක් රස් විහිදෙන දළ ඇතකු තමා සිතෙන් දුටු බව පවසා, බෝසතුන් ගේ සියලු ලකුණුත් ඔවුන් වසන තැනැ ලකුණුත් සිතෙන් දක්නා ලද. ඇතු ගෙන් ඔහු වසන තැනත් ලකුණු හැටියට කියා දී එ ඇතු නසා දෙ දළ ගෙනැ දෙන්නට හැකිදැයි ඔහු විචාළා.

වැදි තෙමේ එය කරනට හැකියැයි පැවැසී. එ හෙයින් ඕ ගමනට සැදී සත් දිනෙකින් පෙරළා එන්නට යවා, නො එක් කම් කරුවින් ලා වැද්දා ගේ ගමනට ඇවැසි උවාරණ, අවි ආ දිය කරවා මහත් වූ සම් පහියෙකැ ලැවූවා යැ. සත්වන දවසේ සෝනුත්තරයා වත් විටැ ඕ තොමෝ උවාරණ මල්ල ඔහුට දී රටැ ඉම තෙක් ඔහු රියෙන් ඇරලැවූ. රටේ ඉම පැනැ රිය පෙරළා යැවූ වැදි තෙමේ ඔබ්බේ සතලොස් වගෙකැ බිම් පියෙස් පසු කෙරෙමින් ගොස් සත් හවුරුදු සත් මස් සත් දිනෙකින් බෝසත් ඇත් රජුන් වසන වන පියෙසට පැමිණියේ සදත් දහ තළාවේ දිය කෙළියට වත් ඇත් රජු සෙසු ඇතුන් දිය කෙළැ ගොඩ නැඟී නො එන තුරු රැඳී සිටිනා තැන දැනැ එහි වළක් කණිමින් පෝරු අතුරු එහි කට වසා ඊයක් නික්මීමට සුදුසු පමණට සිදුරක් පෝරු පියනේ කොටැ වළ තුළැ සැඟී සිටැ ඇත් රජු විදීමට සැරැසී සියලු උවාරණ ගෙනැ සිවුරෙකින් සියල් සිරුර වසා ගෙනැ වළ පත්ලට බැසැ සිටියේයි.

දිය කෙළියට වත් ඇත් රජහු පළමු කොටැ දිය නා ගොඩැ නැඟී සෙසු ඇතුන් දිය කෙළැ ගොඩ නැඟී එනු බලමින් සිටියහ. එ විටැ වළ තුළැ වූ වැද් තෙමේ පෝරු සිදුරින්, විස පෙවූ හීයක් විදැ ඇත් රජ තුමන් ගේ නැබ තුවාල කොළේයි. විස හී පහරින් වෙයින ලත් ඇත් රජාණෝ හඬ නැගූ හ. එයින් කැලැඹී දිවැ වත් ඇත්තු ද මහා සුභද්දාව ද සතුරු සොයා දක්නට වනයට වැදුණෝයි. තමා විදි සතුරු පුවරු අතුරු වසන ලද වළෙහි වියැ යුතු බව දත් බෝසතාණෝ ඔහු ගෙනැ සුනු විසුනු කරනු පිණිසැ පෝරු ඉවත් කළ හ. එ හෙත් වැද්දා ප්‍රෙරෙව් සිවුර දුටු

විගසැ මහ බෝසතුන් ගේ කොව අතුරු දත් වූයේයි. එ උතුමෝ දළ පිණිසැ වැද්දකු තමන් නො නසන බව දැනැ කවර හෙයින් තෝ මට මෙ විපත කෙළෙහි දැ යි උහු විචාළ හ. වැදි තෙමේ එ තුමනට සියලු පවත් පැවැසී. එයින් 'චූල්ල සුභද්දාව' ගේ පවත සිහි පත් වූ බෝ සතාණෝ තමා ගේ දළ කැපීමට වැද්දා නො සමත් බව දක්මින් ඔහු ලා කියත සොඬට ළං කරවා එය දළ මුලට ගන්වා ඇදැ ඇදැ යත යතා දළ කපා දුන්හ.

ඉක්බිති ඔහු කො පමණ කල් ගෙවා ද එහි ආයේ යනු (ඔහු මැ විචාරා) සත් හවුරුදු සත් මස් සත් දවසෙකින් බව දැනැ සවතක් රස් විහිදුනා දෙ දළෙහි බෙලෙන් සත් දිනෙකින් බරණැසට යන්නට ලැබෙන සේ ඉටා ඔහු යවා පිරවර ඇතුනුත් මහා සුභද්දාවත් පෙරළා පැමිණෙන්නට පළමු බෝසත් ඇත් රජාණෝ මළහ.

වැදි තෙමේ බරණැට ගොස් සුභද්දා මෙහෙසනට තමා විසින් ඇත් රජුන් නසන ලද බව පවසා දළ දෙක පායේයි. දළ දුටු විටැ පෙර අත් බැවේ සිය සැමියා ගේ පවත් සිහි කළ ඕ තොමෝ ද සොවින් පෙළී මළා.

(9)

'ඇත ද දිව විස තෙද
රැහැණි නො වැ සිල් මැ රැක්කෝ වෙද' (251)

**සංඛපාල ජාතකය** (244)

මේ ජාතකය බුදු රදුන් සැවැත් නුවර වැඩැ වසන් දී පොහෝ දිනැ වත් පිළිවෙත් අරබයා දෙසන ලද්දේ යැ.

යට ගිය දවසැ අප මහසතාණෝ මගද රටේ රජගහා නුවර රජු ගේ අග මෙහෙසන කුසැ ඉපිදැ දුය්‍යෝධන යන නමින් පසිදු වැ තක්සලා නුවර දිසා පාමොක් ඇදුරු තුමන් ගෙන් සිප් සතර දැනැ සිය පිය රජු රජය තමනට පවරා තපසට ගියෙන් රජ තන් පත් වැ වසන්නාහු තව රක්නා

පියා දැක්මට ගොස් එ තවසුත් හට උවටනට පැමිණැ සිටී සංඛපාල නා රජු දැකැ පැහැදී සිය පුරැ ගොස් දන් දීම් ඈ නො එක් පින් කම් කොටැ එයින් සැවැ නා ලොවේ ඉපිදැ 'සංඛපාල' යන නමින් පසිදු වැ එහි රජ තන් පත් වූහ.

නා ලොවේ රජ සැපත් විඳැ එහි කලකිරී මිනිසත් බව ලබන රිසින් සිල් රක්නට බට එ තුමාණන් හට නා ලොවැ වෙසෙසින් එය නො කළ හැකි සේ පෙනී ගියෙන් එ දීනැ සිටැ නා ලොව හැරැ මිනිස් ලොවට අවුත් වණ්ණ පෙණ්ණා නදියෙන් නුදුරේ මහ මහටත් පිය මහකටත් අතරේ වූ තුඹසක් වටා දරණ ලා ගෙනැ සිල් රක්නට පටන් ගත් හ. එ සෙයින් සිල් රක්නා එ තුමෝ එක් දවසෙකැ 'මගේ හම රිසියෝ වෙත් නම්, මගේ හමත් ඇඟැ මසත් රිසියෝ වෙත් නම් එ ලැබැ ගනිත්වා'යි දන් අදහසින් තුඹස මතු පිටට නැගී හොත්තා හ. එ සෙයින් හෙමැ සිල් රැකීමට බට එතුමෝ අඩ මසැ තුදුස් වැනි පසළොස් වැනි දිනයන් එහි ගෙවීමටත් එක් එක් පසේ (අඩ මසේ) පළමු වන දිනට පෙරළා නා ලොවට යන්නටත් පුරුදු වූහ.

සක්පල් නා රජුත් සිල් රක්මින් තුඹස මත්තේ හෝනා එක් දිනෙකැ මස් බිදීමෙ ලොල් වැ අතින් අවි දරා වනයේ ඇවිදැ කිසිදු මසක් නො ලදින් පෙරළා එන අසල් ගම් වැසි සොළොස් දෙනකු ගෙන් යුත් දඩ වැදි මුළෙකැ මිනිස්සු එ තුමන් දුටහ. 'අද අපට තල ගොයි පැටියකු පවා දක්නට නො ලැබුණු හෙයින් මේ නා රජු මරා මස් බුදුමූ'යි ඌ තුමූ සිතුහ එ සේ වුව ද මහත් වූ නා රජු ඇල්වීමට බිය වූ ඌ තුමූ තමන් විසින් අල්ලාගනු ලැබුවත් වැඩි වෙහෙසක් නො දරා මැ එ තුමනට මිදී යාමට හැකි බව සලකා 'අපි දරණ ගසා හොත් මෙ නා රජුට හොවින් දී මැ තියුණු හුලින් ඇනැ සිදුරු කිරීමෙන් ගත දුබල කොටැ අල්ලා ගනුමූ'යි හුල් අවි ගෙනැ ළංවී ගත්හ. ඔවුන් ගේ පා හඬ ඇසූ නා රජාණෝ හිස නඟා ගිනි මෙන් දුළුන නුවන් අයා බලා එන්නා වූ ඔවුන් දක්මින් 'අද මා ගේ දන් පැරුම මුදුන් පත් කොටැ ගත හැකියි. මොවුන් මගේ සිරුර සිඳැ තුවාල

රුසක් ඇති කලත් නො සැලී සියලු වෙයිත ඉවසා සහම්’යි සිල් බිඳෙතියි බියෙන් කර බා හිස සඟවා ගෙනැ හොත්හ.

මැද්දේ හුලින් ඇනැ බෝ සතුන් ගේ සිරුර අට තැනෙකින් විදූ මේ රුහැනින් අවුණා අට තඩෙකින් බෝ-සතුන් උසු ලා ගෙනැ යන්නට වූ. එ වේලේ බෝසත් නා රජුන් ගේ හිස පහතට එල්ලා වැටෙන්නට වූයෙන් උණු තුමූ සිහින් කැවිටි හුලෙකින් නැහැ විදූ වේ රුහැනක් අවුණ හිස ඉහළට නඟා බැඳැලූහ. ඔවුන් නා රජුන් ගෙනැ යත් මැ විදේහයේ මියුලු නුවර වැසි ආළාර නම් වූ කෙත් වත් හිමියෙක් සුව පහස් දෙන රියෙකැ නැඟී හිඳැ ගැල් පන්සියයක් පදවා ගෙනැ යන්නේ ඔවුන් පෙරට පැමිණියේයි. හෙ තෙමේ ඔවුන් සොළොස් දෙනා ගෙන් එක එකාට ගොනකු බැගින් ද රන් මිල අතලොස්ස අතලොස්ස ද අඳිනා පොරෝනා සළු ද, ඔවුන් ගේ අඹුවනට පළඳිනු පිණිසැ අබරණ ද දී නා රජුන් එ දුකින් මුදවා ලූයේයි.

මුදනු ලැබූ බෝසතාණෝ පෙරළා නා ලෝ වැදැ සිය මාළිගයට ගොස් නො පමාවැ මැ මහ පිරිවරින්, ආළාරයා ගේ ගෙට පැමිණැ නා ලෝ සැපත් වනමින් ගී ගැයුම් කොටැ ඔහු ද කැවි වැ නා ලොවට ගියහ. එහි දී එ තුමෝ ආළාරයාට ගරු බුහුමන් කෙරෙමින් නාග මාළිගයේ රඳවා ගෙනැ නාග කන්‍යාවන් තුන්සියක් දෙනකු ද පාවා දී දිව තය් සැපත් වැළැඳැ වූ. මහත් සිරි සරින් වසක් නය් මාළිගයේ වුසූ ආළාර තෙමේ ඉක්බිති ‘යහළුව, මම් තව වෙස් රිසියෙම්’යි බෝ සතුනට පවසා තවුස් උවාරණ ගෙනැ නා විමන පියා හිමවු පියෙස් වන්නේ තවුස් පැවිද්දෙන් සිල් රක්මින් එහි විසී.

වස් අවදියේ බරණැසට පැමිණි හෙ තෙමේ එහි රජුට සිල් අනුසස් දෙසා පහදවා වස් සිවු මස ගෙවෙත් මැ පෙරළා හිමවතට ගියේ තපස් රුකැ ආයු කෙළවර බඹ ලොවැ උපනි. සක්පල් නා රජ තුමෝ ද පෝයැ පේ වෙමින් දිවි තෙක් සිල් රැක්කාහ. බරණැස් රජ තෙමේ ද පින් කම්හි නිරත වී.

## ( 10 )

'මඟ ජනක වැ පවර
තැසුණු තුරු දුකැ පල බර'

### මහ ජනක ජාතකය (539)

මේ ජාතකය බුදු රදුන් දෙව්රම් වෙහෙර වැඩැ වසත් දී අබිනික්මන අරබයා දෙසන ලද්දේ යැ.

යට ගිය දවසැ විදේහයේ මියුලු නුවර මහා ජනක රජු රජකම් කරත් දී ඔහුට අරිට්ඨ ජනක යැ, පෝල ජනක යැයි පුත්තු දෙදෙනෙක් වූ. රජ තෙමේ වැඩි මහලු පුත් අරිට්ඨ ජනක කුමරුට යුවරජ තනතුර දී බාල පුත් පෝල ජනකයාට සෙන්පති තනතුර දුන්නේසි. පිය රජු ගේ මරණින් පසු රජ තන් පත් අරිට්ඨ ජනක තෙමේ සිය මලු යුව රජ තනතුරේ සිටැ වී. එක් දිනෙකැ වහල් දස්සෙක් පැමිණැ රජු මරණ රිසියක් යුව රජු ගේ සිතේ ඇති බව පැවැසී. රජු එය නො ඇදූහුවත් දිගින් දිගට මැ එය අසන්නට ලැබුණෙන් (රජ තෙමේ) සැක පිටැ යුවරජු ගන්වා යදමින් බඳවා මාළිගයට තුදුරේ වූ ගෙයෙකැ සිර අඩස්සියේ රඳවා රැකැ බලා ගැන්මට සෙබළකු ද සිටැ වී. පෝල ජනක තෙමේ ඉදින් මම් මගේ සොහොවුරාට සතුරෙක් වීම් නම් මා බඳ යදම් ලිහිල් නො වේවා, සිර ගෙහි දොර නො හැරේවා! ඉදින් මම් මගේ සොහොවුරාට සතුරෙක් නොවීම් නම් මා බැඳි යදම් ලිහිල් වේවා, සිර ගෙහි දොර තො වැසේවායි සස් (සත්‍ය ක්‍රියා) කෙළේයි. එ විගසැ ඔහු බැඳි යදම් සිඳී බිඳී ගියේ යැ. සිර ගෙහි දොර විවර වියැ. කුමර තෙමේ ඉන් නික්මී රට ඉමේ ගමකට ගොස් එහි විසුම් ගති. ඔහු ඇඳිනැ දත් ගම් වැසියෝ ඔහුට සේවය කළහ. රජුට ඔහු ගන්වනු බැරි විණි. කෙමෙන් රට ඉම බඳ පියෙස ඔහු නතු වූයේසි. ඉක්බිති හෙ තෙමේ 'පෙරැ මා මගේ සොහොවුරුට සතුරු නො වූවත් දැන් මම් ඔහු ගේ සතුරෙක්මි' යි මහත් බල පිරිසක් ගෙනැ මියුලු නුවර බලා ගමන් කොටැ එ අසැ කඳවුරු බැඳැ ගත්තේ යැ. පෝල ජනක කුමරු පැමිණී

පවත් ඇසූ පුර වැසියන් ගෙන් අයෙක් ඇතුන් ඈ වාහන සතුන් ද ගෙනැ ඔහු ගේ පසට ගියෝ යැ. සෙසු නො එක් පුර වැසියෝ ද ඔහුට එක් වූහ. එ විටැ හෙ තෙමේ 'පෙරැ මම් ඔබේ සතුරෙක් නො වීමි, එ හෙන් ඇත්තට මැ දූන් ඔබට සතුරු වෙමි. සේසත හෝ මට පවරන්නැ, යුද හෝ කරන්නැ' යි රජුට අසුන් යැවී.

එ අසුන් අසා සටතට සැරැගි තක්මෙත රජ තෙමේ අග මෙහෙසියට සුබ පතා 'පියාවෙනි යුදෙහි ජය පරාජය කල් තිබා නො කීයැ හැක්කැ. ඉදින් යුදෙහි මට නපුරෙක් පැමිණියේ නම් ඔබ ගේ කුසේ වූ දරුවා රැකැ බලා ගන්නැ' යි කියා ගියේයි. පෝල ජනක කුමරු ගේ සෙබළෝ සටනෙහි නො පමා වැ රජු නසා පූහ. රජු මළ පවත් ඇසූ මෙහෙසි තොමෝ ඇගේ රන් ඈ අත් සරු දූය පැසෙකැ ලා එ මත්තේ කඩක් අතුරා ඊ පිටැ සහල් අතුරා කිලිටි පිළි හැඳැ විරූ වෙසක් ගෙනැ පැස හිසින් දරා අඹවිලාගේ නික්මැ ගතැ. පුරැ වැසියෝ ඇය අඳුනා ගැන්මේ අපොහොසත් වූ. උතුරු වාසල් දෙරින් නික්මැ ගත් ඕ තොමෝ මින් පෙරැ කිසිදු වරෙකැ එ තෙක් දුරැ ගොස් පුරුදු නැති හෙයින් දිගුන් විමසා දූන්මේ අපොහොස් වූ යැ. කාලචම්පා යැයි පුරක් ඇති බව පෙරැ අසා දූනැ සිටියෙන් ඕ තොමෝ එක් තැනෙකැ හිඳැ ගෙනැ, කාලචම්පාවට යන කිසිවෙක් ඇත් දූයි දුටු දුටුවන් විතාරන්නට වූ.

ඇය කුසැ දරුවා මහ බෝසතාණන් වූයෙන් එ තුමන් ගේ පැරුම් බෙලෙන් සක් දෙව් රජු ගේ අස්න රත් වූයේයි. කරුණු කිමැයි ලොව බැලූ සක් දෙව් රජ තෙමේ පිළිසන් රියක් මවා ගෙනැ එහි යහනක් ද පනවා මහලු, මිනිසකු ගේ වෙසින් එ රිය පදවා ගෙනැ මෙහෙසිය හිඳිනා නිවෙස අසලින් යන්නේ කාලචම්පාවට යන්නෝ වෙත් දූයි හඬ ගෑ යැ. එ ඇසූ මෙහෙසිය මම් එහි යමි පියාණෙනි යි කිව. 'එ සේ නම් අම්ම, රියට නැඟැ යහනේ හුනමැනැවි' යි කියා ඇය එහි නැඟෙන්නට දූරි හෙයින් බැරි යැඹි කියනු අසා

සක් දෙව් රජ තෙමේ තම අනුසසින් ඇය රියට නංවා ගෙනැ රිය පැදැවි. රියට නැඟැ එහි වූ යහනේ හොත් මෙහෙසිය නින්දට වැටුණා යැ. දෙව් බෙලෙන් තිස් යොදුනක් මඟ ගෙවා රිය පැදැවූ සක් දෙව් රජ තෙමේ ගං තෙරකට පැමිණැ 'අම්ම, රියෙන් බැසැ පැන් නහා යළි රියට නැඟැ එහි ඇති කැවුම් කා සැනැපෙන්නැ' යි පැවැසී. මෙහෙසිය ද කී සේ කොටැ යළිදු යහනේ සැතැපුණු නැතැත්තී සවස් වන විටැ චම්පා පුර දෙර, පවුර, මුර ටැම් ගේ ඈ දකැ 'මේ කි නම් පුරෙක් දැයි සුරිඳු විතාළා යැ. 'අම්ම, මේ චම්පා පුරැ' යි සුරිඳු පැවැසී. පියාණෙනි, ඔබ කුමක් කියති ද? අපේ පුරේ සිටැ චම්පාවට සැට යොදුනෙක් නො වේ දැ' යි ඕ පැවැසූ. 'එ සේ යැ, මම් එල්ල මඟක් දන්මි' යි පවසා සුරිඳු තෙමේ දකුණු දෙර අසැ මෙහෙසිය බස්වා 'අම්ම, මගේ ගම තව ඔබ්බෙහි යැ'යි පවසා ගොස් අතුරුදහන් වූයේයි.

මෙහෙසි තොමෝ පුර වැදූ එක් හලෙක්හි ඉඳැ ගත්තී යැ. එ වේලෙහි වේද මතුරු පිරිවත, චම්පා පුර වැසි බමුණු ඇදුරෙක් තමා ගේ අතැවැසියන් පන්සිය දෙනකු සමඟ දිය නහන්නට යනුයේ හලෙහි හිඳුනා නෙත් කලු මෙහෙසිය දිටි. මෙහෙසිය ගේ ගබැ වූ දරුවාණන් ගේ පින් බෙලෙන් ඇය කෙරේ කරුණා සිතක් බමුණාට පහළ වූයේ යැ. මෙහෙසියට සිය නඟකට මෙන් ඇලුම් කළ බමුණු තෙමේ අතැවැසියන් පිටනැ සිටියැ දී හලට පිවිසැ 'නඟ, ඔබ කිනම් ගමැ වසති දැ'යි මෙහෙසිය විතාළේ යැ. 'මම් මියුලු නුවරැ අරිට්ඨජනක රජු ගේ අග මෙහෙසිය වෙමි' යි ඕ පිළිවදන් දුනු.

'ඔබ මෙහි ආයේ?'

'රජ තෙමේ පෝල ජනකයා විසින් නසන ලද්දේ යැ. බියට පත් මම් මෙ තෙක් බිහි නුවූ මගේ දරුවා රැකැ ගන්නා පිණිසැ මෙහි ආමි.'

'ඔබ ගේ කිසි නෑ කෙනෙක් මෙ පුරේ වෙසෙත් ද?'

'කිසිකෙනෙක් නො වෙති පියාණෙනි.'

'තො තැවෙන්න, මම් පසිදු පරපුරෙකින් එන උතුරු දිගැ බ්‍රාහ්මණයෙක්මි. පසිදු සමත් ඇදුරෙක්මි, මම් ඔබ මගේ නගක සේ රක්මි. මට ඔබේ සොහොවුරා යැයි කියන්නැ. එ සේ කියා මා පා වැලැඳැ වැලපෙන්නැ'.

බමුණා ගේ බස් ඇසූ මෙහෙසිය මහත් කොටැ හඬා වැලැපුණු. එ විටැ බමුණා ගේ අතැ වැසියෝ දිවැ අවුත් කරුණු විමැසූ 'මෝ මගේ බාල් මැ නගා යැ. මා බැහැර සිටි අවදියේ දී උපන් හෙයින් තො දිටිමි' යි බමුණා පැවැසී. 'අනේ ඇදුරු තුමාණෙනි, දුක් තො වන්නැ, දූන් ඉතින් අවසනැ ඇය දක්නට ලැබුණ තො වැ' යි සිසුවෝ පැවැසූ.

එ විටැ බමුණු තෙමේ පිළිසත් රියක් ගෙන්වා මෙහෙසිය එහි නංවා සිය ගෙට යවන්නේ 'මෝ මගේ නගා යැ, මැය පිළිබඳ සියල්ල කරන සේ මගේ බිරියට පවසව් යැ'යි මෙහෙ කරුවනට අණ කොටැ නහන්නට ගියේ යි. බමුණා ගේ බිරි තොමෝ මෙහෙසියට නහන්නට උණු පැන් සපයා දී සැතැපෙන්නට යහනක් පනවා දුන්නා ඇය එහි සැතැප්පූ.

දිය නෑමට ගිය බමුණා එය කොටැ පෙරළා නිවසට පැමිණියේ සිය නගා හැටියට මෙහෙසි කැඳවා ඇය හා එකට අහර බිදූ ඇය රැකැ බලා ගන්නට වූයේ යැ. මෙහෙසි තොමෝ සුදුසු කල් පැමිණි විටැ පුතකු වැදූ. මහ බෝසතුන් වූ එ පුතණුවෝ සිය පියා ගේ පියා නමින් 'මහජනක යැ' යි නම් කරනු ලැබූ. කෙමෙන් වැඩෙන්නා වූ එ කුමරුවෝ බමුණු පැටියන් හා කෙළින්නාහු ඔවුන් විසින් කණවැන්දඹුව ගේ පුතැයි බෙණෙනු ලැබැ එ තො ඉවසා උන් හට තො එක් වර පහර දුන්හ. අවසනැ ඒ නින්දා බස තො ඉවසන්නා වූ කුමරුවාණෝ සිය පියා කවරෙක් දැයි තො එක් වර මව විමැසූ. ඕ තොමෝ බොරු බස් පවසමින් තො එක් වර පුතණුවන් රැවැටූ. එ හෙත් ඈම ද එ තො තුළ හැකි බව් දුටු ඕ තොමෝ අවසනැ සියලු පවත් තො සඟා එළි කොටැ පැවසූ. එ තැන් පටන් එ කුමරුවෝ කණවැන්දඹුවගේ පුතැයි බමුණු පැටියන් කියන බස් අසා තො තිපුණා හ.

සිරුරු සවියෙන් ද රුවින් ද යුතු වැ වැඩී සොළොස් වයසට පත් මහා ජනක කුමරුවාණෝ 'ම පියා සතු රජය උදුරා ගනිමි'යි සිතා 'අම්ම, ඔබ වෙතැ මිල ඇති ද? නැති නම් මම් වැපාරයෙන් මිල උපයා ම පියා සතු රජය අල්ලා ගනිමි'යි මවට පැවැසූ. 'ම පුතැ, මම් සිස් අතින් ආමි යි නො සිතන්නැ. මා ගෙතැ වත් රන්, රුවන්, මුතු, විදුරු ඈ අත්සරු දනය ඇති. රජය අල්ලා ගැනීමට ඒ පමණ වෙයි. එ ගෙනැ රජය උදුරා ගන්නැ. වැපාරයට නො බසින්නැ' යි මව් තොමෝ පැවැසූ. 'එ සේ නම් එ දනය ගෙනැ එන්නැ. මම් එයින් අඩක් පමණක් ගෙනැ "සුවණ්ණ භූමියට" ගොස් මහත් දනයක් උපයා රජය ගන්නෙමි' යි කුමරුවාණෝ කිහ. 'පුතැ මුහුදින් දියුණුවට පැයෙන මං ඉතා මඳ යැ, විපත් බොහෝ යි. එ හෙයින් මුහුදින් නො යන්නැ. ඔබට රජය ගන්නට පමණට ද වඩා දනය ඇති නො?' යි මෙහෙසි තොමෝ පැවැසූ එ හෙත් කුමරුවාණෝ එ ගමන යා යුතු මැ යැ යි පවසා මවට ආ සිරි පතා නික් මැ ගොස් නැව් නැංගේ යැ. එ දිනේ මැ පෝලජනක රජු ගේ කයට රෝ දුකක් වැදී යහනින් නො නැගියැ හැකි පරිදි එ රජ ලෙඩ වූයේ යි.

මහ ජනක කුමරුන් නැගුණු නැවේ තවලම් පිරිස් සතෙකැ දනන් හා සතුනුන් වූයෙන් නැවට එ බර ඉසිලියැ නො හැකි විණි. නැව් පත්ලේ පුවරු ගැලැවී යාමෙන් නැවට දිය පිරී එය ගිලා බැස්සේ යැ. බොහෝ මිනිස්සු ද සත්තු ද මස් කැසුබ් මුළට බත් වූ හ. මහසත් තුමෝ සෙස්සවුන් සේ හැඬුම් වැලපුම් දෙවියන් යැදුම් නැති වැ බඩ පුරා අහර බිඳූ සිරුරේ සකුරුත් ගිතෙලුත් තවර ගෙනැ සළු තෙලින් තෙමා දැඩියේ සිරුරේ ඔතා ගෙනැ කුඹ ගසට පිට දී සිටැගත් හ. නැව ගිලෙත් මැ කුඹ ගස කෙළින් සිටියේ යි. මහසත් කුමරුවාණෝ කුඹ ගස මුඳුනේ සිටැ මියුලු නුවර පිහිටි දෙසට මුහුණ ලා මහත් වෙයින් දුරට පිනූහ. මස් කැස්බනට ගොදුරු වූවන් ගේ ලෙයින් රත් පැහැ වූ දිය ඇති, මස් කැස්බන් මුළු දී ගැවසෙන්නට වූ සුරියෙන්

ඔබ්බෙහි එක්සිය සතලිස් රියනක් දුරින් වූ දිය තලය පිටැ වැටී සිටැ ගත් හ, දුරට පිනූ මහසත් තුමෝ. එ දවසේ මැ පෝලජනක රජ තෙමේ මෙළේ යි. මුහුදු රළ පිටැ සත් දිනක් පිනීමේ යෙදුණු මහසත් තුමෝ යළිදු ගොඩ බිම දැකැ කර දියෙන් කට සෝද ගෙනැ උපවාසයෙහි යෙදුණා හ.

එ දවස් මුහුදට අරක් ගන්නට සිවු දෙවියන් ගෙන් පැවැරුණ 'මණිමේඛලා' නම් දෙව් දූ තොමෝ කිසි යම් කරුණක් නිසා පමා වැ සතියකට පසු මුහුදට බැල්ම හෙළුවා වෙරළට බට මහ බෝසතුන් දැකැ තමා අතින් වූ පමා දෙස මකා ගන්නා පිණිසැ එ මහතාණන් ළැමින් උසුලා ගෙනැ ගොස් මියුලු නුවරැ අඹ උයනේ මඟුල් සල් වට හොවා එතුමනට අරක් ගන්නා සේ උයන රක්නා දෙව් දූතට අණ කොටැ ගියා.

පෝල ජනක රජුට 'සීවලි දේවී' නම් දුවක මිසැ පුතකු නුවූයෙන් මළ රජු ගේ වදන් පරිදි එ සීවලීය ගේ සිත පහදවනට සමත් එකකුට රජය පැවැරීමේ වෙහෙස ගත් පෙරෙවියා සහිත ඇමැත්තෝ අඹ උයනේ මඟුල් සල් වටැ හොත් මහාජනක කුමරුන් දැකැ ලකුණු පිරික්සා රජ බවට පත් කොටැගත් හ. මහා ජනක බෝසතාණෝ සීවලීය තමහට මෙහෙසී බව්හි සිටුවා මියුලු නුවරෙහි රජ තන් පත් හ.

එ තුමෝ 'කාලචම්පා'යෙන් සිය මවත් බමුණාත් ගෙන්වා අදර බුහුමන් දක්වූ හ. ඉතා නැණවත් වැ රජ කම් කිරීමට බට මහ ජනක තිරිඳුන් කෙරේ පුර වැසියන්, ඇමැති ගණාත් සීවලී මෙහෙසනත් දක්වූ අදර ඉතා මහත් වී. පසේ බුදුවරයටනට දන් දෙමින්, දස රජ දම් නො කඩ කෙරෙමින් රජ කම් කරන්නා වූ එ තිරිඳුන් නිසා සීවලී මෙහෙසි තොමෝ පුතකු වැදූ. ඒ පුත් තෙමේ 'දීඝාවු කුමාර' යන නම ලැබුයේ යි. වැඞි විය පත් එකුමර තෙමේ පිය තිරිඳුන් විසින් යුවරද තනතුරෙ සිටුවන ලදී.

දවසෙකැ මහා ජනක නිරිඳුන් ගේ උයන් පල්ලා තන් මියුරු පල වැලත් මල් රැසකුත් රජ මාළිගයට ගෙනැ ආයේ යි. එ දූය දැකැ සොම්නස් වූ රජ තුමෝ උයන් පල්ලාට අදර බුහුමන් දක්වා පහන් බව ඇඟැවූ. ඉක්බිති තමන් උයන නැරැඹිමට එන බව පවසා උයන පිළියෙළ කොට තිබන්නට යයි රජ තුමෝ උයන් පල්ලාට කී හ. හේ කී නියා උයන් වත් සපයා උයන සරහා ලී යැ. රජ තුමෝ ඇතු පිටැ පතවන ලද අස්න අරා සපිරිවරින් උයනට සැපත් වූ.

උයන් දොර කෙරේ පලා වත් පැහැයෙන් බබළනා හොබනා අඹ රුක් දෙකෙක් වී. එයින් එකක් පල නො දරා ද අනෙක මිහිරි පෙලෙන් බර වැ ද පැවැත්තේ යැ. එ තෙක් නිරිඳුන් පල වැළ බිදීමක් නො කළ හෙයින් පිරිවර දනෝ පල නෙළීමේ සිත නුදුන් හ. උයනට පිවිසෙන්නා වූ රජ තුමෝ අඹ අඹරුකින් පලක් නෙළා වළඳන්නට වූ හ. අඹ පැණි දිවැ වැකෙන්නා හා මැ දෙවියන් විඳින්නා වූ රසට හුරු මිහිරි රසෙක් රජුට දැනිණි. එ හෙයින් රජ තුමෝ 'පෙරළා එන ගමන් තව ද පල කිහිපයක් බුදිමි' යි සනිටු-හන්කොටැ ගත් හ.

නිරිඳුන් අඹ ඉඳුල් කළ බව දත් විගසේ මැ ඇමැතියන් ගේ සිටැ ඇත් ගොවුවන් තෙක් සියල්ලෝ එ ගසින් මැ අඹ නෙළ නෙළා බුදින්නට වූ හ. පසුවට පැමිණියාහු පල නො දැකැ ගසේ අතු බිඳැ බිඳැ කොළ සිඳැ සැපූ හ. අවසැනැ එ අඹ රුක කොළ රිකිලි අතු ද නැති නිකම් අඹ කණුවක් බවට පත්තේ යැ. පල නො දරූ රුක ඉඳු නිල් මිණි කන්දක් සෙයින් දිලි. 'දිලී පැවැත්තේයි, පෙරළා එන්නා වූ රජ තුමෝ එ දැකැ එයට කරුණු කිමැයි ඇමතියන් විතාළ හ. 'ඔබ වහන්සේ මුල් පලය ඉඳුල් කළ බව දුටු පිරිවර දනෝ එහි සියල්ල නෙළා ගත් හ' යි ඇමැතියෝ පිළිවදන් දුන් හ. 'එ හෙත් මේ අනෙක් අඹ රුකින් කොළයක් වත් එහි පැහැය වත් අඩු වී නැත්තේ?' යි රජ තුමෝ පැවැසූ. 'එයට

භාතියක් නුවූයේ එහි පල නැති හෙයින් නො වැ' යි ඇමැතියෝ කී හ. එයින් රජ තුමන් ගේ සිත දූඛියේ කැලැඹිණි.

'මේ රුක එහි දුලන සුනිල් පැහැයැ පවත්වා ගෙනැ සිටිතේ එහි පල නො අට ගත් හෙයිනි එ හා එක් ළහැ සිටි රුක සිදී බිදී විකල වැ ගියේ එහි වූ පල නිසායි. මේ රජය පල බර රුක බඳුයි. තව පෙවේත පල නො ගත් රුක බඳු යි. බිය පැමිණෙන්තේ තමා සතු කිසිත් නැත්තාට නො වැ සැපත් ඇත්තාටයි. පල බර රුකින් ඉදුරා වෙතස් වූ පල නො හට ගත් රුක බඳු වන්නෙමි මමත්. මගේ සියලු යසස අත් හැර දමා මම් ලෙවි පවතින් ඇත් වැ තව පෙවේතට බසිමි' යි සිතින් සනිටුහන් කොටැ ගත් රජ තුමාණෝ රට රැක්මේ කටයුතු සෙන්පතියාට පවරා පැවිදි පෙවෙතින් මාළිගයේ මතු මාලෙහි සිටු මසක් වැසැ ඉක්බිති පැවිදි වෙස් ගෙනැ මාළිගයෙන් බැසැ නික්මැ පස්සෙහි එන්නා වූ සීවලිය රුදැවීමේ නො එක් උපා යොදා බැරී මැ තැනැ අතර මගැ සිහි සත් නැති වැ හොත් ඇයට නො පෙනෙන පරිදි වල් වැදී ගොස් හිමවු පියෙසේ තව කම් කළ හ.

## ( 11 )

'මුව රද වැ මුනි විරු
විදූ විදූ දිවෙත තරවිරු
වැටුණා වළැ ගැඹුරු
බලා ගොඩැ ලා කෙළේ බිය දුරු' (253)

### සරභමිග ජාතකය (483)

යට ගිය දවසැ බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජු රජ කම් කරමින් සිටියැ දී මහ බෝසත් තුමාණෝ මුව යෝනි-යෙහි ඉපිදැ මෙතෙහි වෙසෙති. මුව දඩ යාමෙහි ලොල් වූ බ්‍රහ්මදත්ත රජ තෙමේ සවි බල ඇති පිරිමියෙකි. එක් දිනෙකැ ඇමැති ගණයා පිරිවරා මුව දඩ ගිය එ රජ තෙමේ

'යමකු සිටි තැනින් මුවෙක් පැනැ දිවී නම් ඌට එ සේ යන්නට ඉඩ දුන් තැනැත්තා මේ මේ දඬුවම් විඳිමට සුදුස්සේ යැ'යි ඇමැතියනට පැවැසි. ඇමැතියෝ 'රජු සිටිනා දෙසට මැ මුවන් පලවා හරිමු' යි බැණැ ගත් හ. එ සේ බැණ ගෙනැ වල් ගැසිම පටන් ගත් කල්හි මුලින් මැ පැනැ දිවෙන්නට පැමිණියාහු බෝසත් මුවාණෝ යි. තුන් වරක් වත ලැහැබ වටා දිවූ එ මුවාණන් හට සෙසු ඇම පසින් ඇමැතියන් වැට බැන්දූ සේ සිටිනා හෙයින් රජු සිටිනා පසින් මිසැ අනෙක් පසෙකින් පැනැ යන්නට නො හැකි බව පෙනී ගියේ යැ. එ හෙයින් එ මුවාණෝ රජු සිටි පැත්තෙන් පැලැ ගිය හ. රජ තෙමේ ද පැනැ යන මුවාණන් හට ඊයක් විදැ හලේ යි. එ වගේ මුවෝ ඊ පහර මඟ හරවා ගැලැවී පැලැ යාමේ සමත්තු වෙති. එ හෙයින් බෝසත් මුවාණෝ රජු ගේ ඊ පහරට නො හසු වැ පැනැ දිවූ. රජු සිතා ගත්තේ තමන් විදි ඊය මුවාණන් ගේ සිරුර කා ගෙනැ ගියා මැ යැ කියා යි. එ හෙත් ඇමැතියන් උන් උන් කියා ගන්නා වදන් ඇසූ රජ තෙමේ 'මුන් මට සිනා සෙනවා නො වැ'යි සිතට දිරිය උපදවා අතින් කඩුව ගෙනැ මුවාණන් පසු පස්සේ ලුහු බඳවා දිවූ. මුවාණෝ ද රජුට හසු නො වී දුවන්නාහු මඟ වතයට වැදී පෙර මහැ රුක් මුලක් දිරා යාමෙන් ඇති වූ තිස් රියනක් ගැඹුරට දිය පිරුණු සැට රියන් නරා වළක් තණ ඇසෙන් මුවා වැ ඇති බව ඉවෙන් දැනැ එය මඟ හැරැ දිවූ. එල්ල මගින් මැ දිවූ රජ තෙමේ එ නරා වළට වැටුණේ යි.

පස්සේ දිවැ ආ රජු ගේ අඩි ගැස්ම නො ඇසුණෙන් පසු හැරී බැලූ මුව තුමෝ රජු නරා වළෙහි වැටෙනට ඇතියි පෙරළා අවුත් බලා ගැඹුරට දිය පිරී ඇති නරාවළේ හී ගොඩ නැඟෙනට නො හැකි වැ දඟලන රජු දුට හ. එ හෙයින් මුවාණෝ නරා වළ අද්දරැ සිටැ 'හා, මහ රජ බිය නො වන්නැ, මම් ඔබ වළින් ගොඩ නඟමි'යි පවසා තීර වැ පිහිටි ගල් ඇති පසෙකැ ගලක් මත්තේ සිටැ රජු වළින් ගොඩ නංවා පත්සිල් දී පිටැ හිඳුවා ගෙනැ මහ වලින් ඔබ්බට ගෙනැ ගොස් රජ පිරිස ඇති සරියේ බස්වා පෙරළා වනැ වන් හ.

( 12 )

'වානර සෙන් සමග
ගඟින් එ තෙරැ වැ යන්ට කෙළෙ මඟ' (254)

## මහා කපි ජාතකය (407)

මේ ජාතකය බුදු රදුන් දෙව්රම් වෙහෙරැ වැඩැ වසන අවදියේ නෑ දනන් හට වැඩ සැලැසීම අරබයා දෙසන ලද්දේ යැ.

යට ගිය දවසැ බරණැස් නුවරැ බ්‍රහ්මදත්ත නම් රජු රජ කරමින් සිටියැ දී මහසත් තුමාණෝ වඳුරු යෝනියෙහි ඉපිද අසූ දහසක් වඳුරනට නායක වැ හිමවත් පියෙසේ වෙසෙති. එහි ගං ඉවුරේ අතු වෙළෙප පතරින් සැදි, පත් ගත වූ, සිහිල් සෙවණ දෙන අඹ රුකෙක් ගිරි කුළක් සෙයින් පෙනෙමින් පවතී. දෙව් ලෝ වැසියන් විඳුනා රසට සුවඳට හුරු රසින් සුවඳින් යුත් එ ගසේ පල මා දිය කළ පමණට මහත් වේ. එ ගසේ එක් අත්තෙකැ පල බිමට වැටෙයි. තවත් අත්තෙකැ පල ගඟට වැටෙයි, අතු දේකෙකැ පල කෙළින් මැ මහ (ගස්) කඳේ ගැටී වැටෙයි, සිය පිරිසන් කැටි වැ මෙ ගසේ අඹ බුදිමින් සිටිනා වඳුරුණෝ 'මෙ ගසින් ගඟ දියෙට වැටෙන පල නිසා කිසි යම් දිනෙකැ විපත් පැමිණෙනු නියතියි සලකා එ ගඟ පැත්තේ අඹ ගැට අවදියේ දී බිදීමටත් මල් සිඳැ දැමීමටත් තම පිරිසේ වඳුරනට නියෝ කළ හ. එ සේ වුවත් දිමිති කදල්ලක් තුළැ වී අසූ දහසක් වඳුරනට නො පෙනී රැකුණු අඹයෙක් ඉදී නැටියෙන් ගිලිහී ගඟැ දියට වැටුණේ පා වී අවුත් එ දවසැ ගඟැ දිය කෙළියට පැමිණැ ගඟේ ඉස්මත්ත පසිනුත් ගඟ පහළිනුත් දැල් බඳවා දිය කෙළියෙහි බඹ දත් රජු යෙදී සිටියැ දී ඉස්මත්ත පැත්තේ දැලෙහි රැඳුණේ යැ.

රජු දිය කෙළැ සවසැ ගිය ඉක්බිති දැල් ලිහීමට පැමිණි කුඩ වැද්දෝ අඹය දැකැ එය කිමෙක් දැයි නො දැනැ රජුට ගෙනැ ගොස් දැක්වූ හ. 'මේ කිනම් වගෙකැ ඵලයෙක් දැ'යි

රජ තෙමේ උත් විතාළේයි. 'අපි නො දනුමු දේවයිනි'යි උඟ පිළිවදන් දුත් හ 'මෙය කවුරු ද දන්නෝ'යි යළි තමන් පිළිවිසි රජුට 'වන වැසියෝ දනිති'යි උඟ පිළිවදන් දුත් හ. රජ තෙමේ වන වැසි දනන් ගෙන්වා එය කි නම් වගෙකැ පලයෙක් දැයි උත් විතාළේ යැ. උඟ තුමූ එය අඹ පලයක් බව පැවැසූ. රජ තෙමේ එ අඹය කපා පළමු කොටැ වන වැසියන් කවා තමා ද බිඳු ඇමැතියනට ද කොටසක් දිනි. එ අඹ රසින් රජු ගේ සියල් සිරුර පිනා ගියේ යි එහි ගුණය දවස මුළුල්ලේ පැවැත්තේ යි.

අඹ රසින් සතුටට පත් රජ තෙමේ එ අඹ ගස ඇත්තේ කොහි දැයි වන වැසියන් විතාරා එය හිමවත් පසැ ගං ඉවුරෙක්හි ඇති බව අසා පහුරු බදවා ඇඳවමින් ඒ මතැ නැගී වන වැසියන් පෙන්වනු ලැබූ මඟ ඔස්සේ යතුරු කෙළේ යැ. සුදුසු කල්හි සියල්ලෝ අදහස් කරන ලද තැනට පැමිණිය හ. වන වැසියෝ රජුට අඹ ගස පෙන්නූ හ රජ තෙමේ පහුරු රඳවා සහ පිරිවරින් අඹ ගස මුලට ගමන් කොටැ එ ගස සෙවණේ යහනක් පිළියෙළ කරවා ගෙනැ එහි අඹ රස විඳිමින් දවස් ගෙවන්නට පටන් ගති අරක් ගෙනැ සිටියෝ අඹ රුක් සෙවණේ සිවු දිගැ ගිනි මැළ දල්වා සිටැ ගත් හ. රකවලැ සිටියවුන් නින්දට වැටුණු පසු බෝසත් වඳුරණන් සහිත වඳුරු මුළෙහි සියල්ලෝ මැදියම් රැයෙහි ගසින් ගසට මාරු වෙමින් අඹ ගසට පැමිණැ අත්තෙන් අත්තට පනිමින් අඹ බුදින්නා හ. රැයෙකැ පිබිදි රජ තෙමේ අඹ බුදිනා වඳුරන් දැකැ රකවලෙහි සිටියවුන් පුබුදුවා 'මෙ අඹ බුදිනා වඳුරනට පැලැ යා නො දී අරක් ගනිව්. ඔවුන් වට ලා සිටැ විදැ මරව්' යැයි අණ දුන්නේයි අරක් ගත් දුනු වාවෝ 'මැනැවි දේවයන් වහන්සැ'යි සැරැසී සිටැ ගත් හ. එ ඇසූ වඳුරෝ මරණ බියෙන් සැසැලී එ පවත් නායක වඳුරණන් හට සැළ කළහ. 'කම් නැති, නොපි නො බව් යැ'යි ඔවුන් අස්වැස්වූ වඳුරු නයුවෝ ඉහළ අත්තකට නැගී එයින් ගඟ දෙසට විහිදි අත්තෙකැ අග තෙක්

ඛඩ ගා ගොස් මහත් වෙයින් පැනැ දුනු සියයක් දුරින් වූ ගඟේ එ හා ඉවුරට බට හ. එහි දී වේ වැලක් සිඳැ ගෙනැ එහි කොනක් එ තෙර ගසෙකැ බැඳැ එහි සිටැ අඹ ගසට දුර දුනු සියයත්, ගස වටා යවනට ඇති දිග පමණක් සලකා එ තෙක් දිගට සිටිනට එ වේ වැල ඉඟැ බැඳැ ගෙනැ පෙරළා අඹ ගසට පිනූ වදුරු නයුවාරනත් හට තමන් ඉඟ වටා යැවූ වැල් පටේ දිග ගණිත් ගන්නට අමතක වීම නිසා වැලෙහි දිග වැල් පිළ පිණිසැ මඳක් අඩු බව පෙනී ගියේ යැ. එ හෙයින් ඒ අඩුව සිය සිරුරින් පිරිමසන්නට සිතූ වදුරු නයුවාණෝ දැතින් අඹ අත්ත දැඩියේ ගෙනැ හෙයක් මතු පිටින් මෙන් සිය කය මතු පිටින් ගොස් වේ වැලට පැමිණැ එ ඔස්සේ ගඟින් එ තෙර වන්නට පිරිවර වදුරනට සන් දුන් හ. එ වේලෙහි පිරිවර වදුරෝ බෝසතුන් පිට සෙමෙන් සෙමෙන් මඩිමින් අත් වැලට නැඟී ගඟින් එ තෙර වූ හ.

දෙව් දත් වදුරු තෙමේ බෝසතුන් නැසීමට වරක් පත පතා මුදුන් අත්තේ ඇලී බලා සිටැ සියලු වදුරන් ගිය පසු බෝසතුන් පිටට පැනැ වසට ඕඳැ ගෙනැ දිවැ පී යැ. බෝසත් තුමාණෝ එයින් උපන් මහත් දුක් වෙයින ඉවසා සහමින් වසට බුන් හෙයින් පෙරළා පිනිය නො හී අඹ අත්ත දැතින් ගත් වන මැ රුය ගෙවූ හ.

පහන් වූ විටැ ගසේ වඳුරන් නැති නියාවත් බෝසත් වඳුරාණන් දුක් විඳිනා නියාවත් දුටු රජ තෙමේ ‘මෙ වැනි උතුම් සතුන් නැසෙනු නො දියැ යුතු යැයි පහුර මැත් කොටැ එ මත්තේ මැසි නංවා වඳුරාණන් ගසින් බාවා ගෙනැ කසා වතක් පොරවා, ගඟැ දියෙන් නහවා, සකුරු මුසු පැන් පොවා, සහස්‍රපාක තෙල් ගල්වා සිරුරු පිරිමැද්ද, තෙලි සම් ඇතුළ යහනෙකැ සතප්වා මිටි අස්නෙකැ තමා හිඳැ කරුණු විචාළේ යැ. මහසතාණෝ රජුට දහම් දෙසා අවසනැ මළ හ. රජ තෙමේ මහත් හරසරින් මහසත් වඳුරාණන් ගේ සිරුර දවා එ දැවූ තැනැ සැයක් බඳවා එය මලින් පහනින් පිදී.

## ( 13 )

'මහ ඔසු පඬි වැ පෙර
දිනි යැ දඹ දිවැ රජුන් එක වර' (255)

### මහා උම්මග්ග ජාතකය (546)

මේ ජාතකය බුදු රදුන් දෙව්රමැ වසත් දී නැණ පැරුම අරබයා දෙසන ලදී.

යට ගිය දවසැ විදේහයේ මියුලු නුවර 'වේදේහ' නම් රජු රජ කම් කරත් දී අප මහ බෝසතාණෝ මියුලු නුවර බඳ නැගෙනහිරි යව මැදුම් ගමැ සිරිවඩ්ඩක නම් සිටාණන් නිසා ඔවුන් ඇඹෙණියන් සුමනා දේවීන් කුසැ පිළි සිඳැ ගෙනැ සුදුසු කලැ මහ ඔසුවක් අතින් ගෙනැ බිහි වූයෙන් 'මහඔසු' කුමාරයෝ යැ යි පසිදු වැ නුවණෙහි අරුම පළ කරමින් වැඩුණා හ. වෙසෙසින් ඔවුන් ගේ නැණ පතළ වූයේ පැන විසැඳීම් මගිනි.

| | | |
|---|---|---|
| 1. | මාංශ | ප්‍රශ්නය |
| 2. | ගොන් | ,, |
| 3. | ගැට හූ පළඳනා | ,, |
| 4. | හූ වැටි | ,, |
| 5. | පුත්‍ර | ,, |
| 6. | ගෝළ කාළ | ,, |
| 7. | රථ | ,, |
| 8. | දඬු | ,, |
| 9. | ශීර්ෂ | ,, |
| 10. | අහි | ,, |
| 11. | කුක්කුට | ,, |
| 12. | මණී | ,, |
| 13. | වැදීමේ | ,, |
| 14. | ඕදන | ,, |
| 15. | වාලුක | ,, |
| 16. | තළාක | ,, |
| 17. | උය්‍යාන | ,, |

යැයි පැන සතළොසෙකින් නුවණ පසිඳු වූ පසු වේදේහ රජ තෙමේ මෙ පඬි කුමරුවන් තව ද පැනයක් ඇති වන නියායෙන් අස්නක් යවා තමන් වෙතැ කැඳැවී යැ. එහි දී ඇති වූ (18) ගදුබු පැනයෙන් රජු ගේ පළමු පඬිවරයන් වූ සේනක, පුක්කුස, කා වින්ද, දේවින්ද යන පෙරෙවියන් ගේ නුවණ මහිමය බාල වූයෙන් රජ තෙමේ මහ ඔසු පඬිවරයන් තමන් වෙතැ රඳවාගනී. එ තැන් සිටැ පළමු පෙරෙවියන් ගේ යට පත් වීමත් තමන් ගේ ඉස්මතු වීමත් පිණිසැ නුවණ මහිමය පෙන්වන පැන ගණනාවක් මැ මෙ පඬිඳුන් හට විසඳන්නට සිදු වූයේයි. (19) පොකුණේ ප්‍රශ්නය, (20) කටුසු ප්‍රශ්නය, (21) සිරි කාළකණ්ණි ප්‍රශ්නය යන ප්‍රශ්න තුනේ දී සේනකාදීන් ගේ අගය බොහෝ අඩු වියැ. පින්ගුත්තර නම් වූ සිසුවකුට තක්සලාවේ දිසා පාමොක් ඇදුරු විසින් පාවා දෙන ලද දියැණියන් ඒ කාළකණ්ණියා උදුම්බරා (අත්තික්කා) ගසෙකැ රඳවා පැලැ ගියෙන් වේදේහ රජුට මෙහෙසිය වැ 'උදුම්බරා දේවිය' යන නමින් පසිඳු වැ සිටියැ දී ඇය නිසා ඇති වූ පැනයෙකි 'සිරි කාළකණ්ණි ප්‍රශ්නය.' එය විසැඳූ පසු උදුම්බරා දේවිය ගේ සිත මහ ඔසු පඬි තුමන් කෙරේ පහන් වූයෙන් ඇය ගෙන් 'මල්' තනතුරැ ද ලැබිණි.

ඉක්බිති රජු විසින් ඇති කරන ලද (22) මෙණ්ඩක (එළු) ප්‍රශ්නය, (23) සිරි මන්ද ප්‍රශ්නය යන දෙ පැනය විසැඳූ පසු මහ ඔසු පඬිඳුන් ගේ යසස වෙසෙසින් මහත් වූයේයි. එ වකට සොළොස් වියට පත් වැ සිටි පඬිතුමෝ උදුම්බරා දේවිය ගේ ඇඟීම අනුවැ ගිහි වැසි වන්නට තැම්, සුදුසු බිරියක විමසා ඇවිදැ උතුරැ යවමැදුම් ගමේ පැරණි සිටු කුලයෙකින් පැවැතා ආ 'අමරා' නම් කුමරියක පාවා ගත් හ. ඒ කුමරිය ගේ ගෙට යාම ද (24) ඡන්නපථ නම් පැනයක් විසැඳීම විසින් කැරිණි. විවා මඟුලෙහි රජ දේමහල්ලෝ මැදහත් වැ මහ උළෙළ පැවැත් වූ හ.

ගිහි වැසි වීමෙන් ඉක්බිති සේනකා දී සිවු දෙන රජු ගේ සිළුමිණ, රන් මාලය, පලස, රන් මිරි වැඩි සඟළ යන දැය සොරා ගෙනැ මහ ඔසු පඬිඳුන් ගේ ගෙට සොරා වද්දවා

සොරකම ඔවුන් පිටැ ලූයෙන් පඬිදුන් හට පුර හැරැ ගොස් බට ගිරි යව මැදුම් ගමේ කුඹල් කම් කරමින් වසන්නට සිදු වූයේයි. එ දවසැ දෙව් දුවක සිවු පැනයක් ගොතා රජු විචාරා රජුටත් සේනකාදීන් හටත් එ විසඳනු නො හැකි වූයෙන් (25) බජ්ජෝපත පැනය යැයි ගැටලුවක් විසඳ මහ ඔසු පඬිදුන් ගේ නැණින් විසැඳියැ යුතු පැන සෙස්සවුන් අතින් දන්නට බැරි බව දූත් වූයෙන් රජ තෙමේ යළි පඬි තුමන් පුරට ගෙන් වී. එ ඉක්බිති දෙව් දුව ගේ සිවු පැනයක් එකට යෙදූ (26) භූරි ප්‍රශ්නය විසැඳූ පඬි තුමෝ, ඉක්බිති වැ තමන් පිරිහෙළන අදහසින් සේනකාදීන් ඇති කළ (21) පඤ්චපණ්ඩිත ප්‍රශ්නය විසඳ සේනකාදීන් ගේ රහස් එළි කිරීමෙන් ඔවුන් ගේ සියලු බල පිරිහෙළා ඔවුන් දළ උදුරන ලද සපුන් බඳු කළහ.

එයින් ඉක්බිති රජු ගේ මහ පෙරෙවි, මහ සෙනෙවි තන් ලත් පඬි තුමෝ රට රැකුම් පිණිසැ යෙදියැ යුතු උපායොදමින් පුර අරක් ගන්වා සතුරනට මුහුණ පෑමට සැරසුණා හ. සෙසු සියල්ලට වැඩියෙන් ඔවුන් ගේ කටයුතු පිළිවෙළේ උසස් වැ බැබැලුණේ 'චරපුරුෂ' මෙහෙයයි. මේ අවදියේ දී උත්තර පඤ්චාල රටේ කම්පිල්ල නුවරෙහි බ්‍රහ්මදත්ත රජු එ රජු ගේ අග පෙරෙවි කේවට්ට නම් බමුණා ගේ උවදෙස් පරිදි දඹ දිවැ සියයක් රටැ රජුන් නතු කොටැ වස ලූ රා ජය පානය හැටියට බොන්නට සැලැස්සීමෙන් ඔවුන් නසන්නට ගත් තැත ගිරවකු චරපුරුෂ කිරියායෙහි යොදවා කල් තිබා දත් තෙන් මෙ පඬි තුමෝ එය ව්‍යර්ථ කරවා, බ්‍රහ්මදත්ත රජු ගේත් අගැ මුල නො දූතැ ජය පානයට සිත දුන් රජුන් ගේත් උදහසට බඳුන් වූ හ.

එ සියලු රජුන් අවුත් මියුලු නුවර වටලා ගත්තෙන් පඬි තුමෝ තමා ගේ නැණ මහිමය දක්වා ඔවුන් පලවා හැරිය හ.. කේවට්ට පෙරෙවියා ද මහ නිගාවට පත් කරන ලද්දේ යි.

එයින් කලකට පසු එහි පළි ගන්නට සිතූ කේවට්ට බමුණා ගේ උවදෙස් පරිදි වේදේහ රජුට බ්‍රහ්මදත්ත රජු තම දියණියන් පාවා දෙන්නට කැමැත්ත දන්වා එවූයෙන්

රංගයෙන් රත් වූ නුනුවණ රජු එහි ගොස් සතුරන් අතට පත් වනු නො වැළැක්වියැ හැකි බව දුටු පඬි තුමෝ තම ගිරවා යවා ඇති තතු දැනැ පළමු කොටැ සිය රජුට මාළිගා ගොඩ නැංවීමට යැයි උත්තර පංචාල රටට ගොස් ගංතෙර සිටැ බ්‍රහ්ම දත්ත රජු ගේ මාළිගයට උමං කණවා, එහි ගිය වේදේහ රජු සතුරු රජු විසින් වට ලනු ලැබූ කල්හි බ්‍රහ්ම-දත්ත රජු ගේ මෙහෙසියත්, දුවත්, මවත්, පුතුත් උපායෙන් උමඟට බාවා ගෙන්වා ගෙනැ, රජ දුව වේදේහ රජුට පාවා දී සෙසු තැයන් තිදෙන ද එ රජු සමඟැ මියුලු නුවරට යැවූ හ.

ඉක්බිති සිය නැණ මහිමයෙන් රජ දුව සිය රජුට ලබා දුන් පරිදිත්, සෙසු නෑයන් ද ඇය සමඟින් මියුලු නුවරට යැවූ පරිදිත් කියා බ්‍රහ්ම දත්ත රජු ගේ එඩි බා, ජය පාන පුවතේ ඇත්ත එළි කොටැ සෙසු රජුන් පහදවා පෙරළා සිය නුවරට ගිය පඬි තුමෝ බ්‍රහ්මදත්ත රජු ගේ මෙහෙසියත්, මවත්, පුතුත් පෙරළා සිය පුරට යවා මහත් ඉසුරු විඳිමින් සිටැ වේදේහ රජු මළ ඉක්බිති බ්‍රහ්ම දත්ත රජු වෙතැ විසීමට ගිය හ. එහි දී පිරිවැජියක ලා 'දිය රකුසු' පැනය යැයි පළ පැනය රජු විචාරවා එ රජු ගේ සිතේ තමත් කෙරේ කසටක් නැති බව සැක හැර දත් හ.

(වැඩි විතර උම්මග්ග ජාතක පොතින් දත්නේ යි).

## ( 14 )

'සීලව රද වරදු' (256)

### මහා සීලව ජාතකය (51)

මේ ජාතකය බුදු රදුන් දෙව්රම වැඩ වෙසෙත් දී උකටලී බැයකු උදෙසා දෙසන ලදී.

යට ගිය දවසැ බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ කෙනකු රජ කම් කරමින් සිටියැ දී අප මහ බෝසතාණෝ එ රජු අග මෙහෙසිය කුසැ පිළිසිඳැ සුදුසු කලැ බිහි වැ සීලව

කුමාරයෝ යැයි පසිදු වූහ. පිය රජු ඇවෑමෙන් රජ තන් පත් වැ දැහැමින් රජ කම් කරන්නට වූ එ තුමෝ මහා සීලව යැයි පසිදු වැ නුවර සතර දොර යැ, නුවර මැදැ යැ, රජ ගෙය අසැ යැයි සතැනෙකැ දන් හල් තංවා යදියන් සතප්වනට වූ.

එ රජුන් ගේ ඇතොරේ වරද කොටැ හසු වූ ඇමැත්තෙක් තෙමේ එ තුමන් විසින් පුරින් නෙරනු ලැබැ කොසොල් රටට ගොස් එහි රජු ගේ සිත ගෙනැ වසයි. ඉක්බිති දවසෙකැ එ සොර ඇමැතියා බරණැස් පුර සහිත කසී රට ගැන්ම නිතැතින් කළ හැකි බව් කොසොල් රජුට පැවැසී. ඒකා තමා උගුලෙකැ අසු කරන්නට පැමිණි චරයෙකැයි සිතූ කොසොල් රජ තෙමේ තුන් වත වර දක්වාත් ඔහු ගේ බස් පිළිකෙව් කෙළේ යැ. ඉක්බිති ඔහු ගේ කීම පරිදි කසී රටේ ගම් පහරින්නට තුන් වරක් මිනිසුන් යවා ඔවුනට එහි නිරිඳුන් උදහස් නො වදළ බව දැනැ සොර ඇමැතියා ගේ බස් පරිදි බල සෙන් ගෙනැ බරණැස ගන්නට නික්මියේ යි.

කවර සතුරු රජකු වුවත් පරදවන්නට සමත් - මුළු මහත් දඹ දිවැ රජුන් මැඩැ ලීමෙහි සුදුසු බල පිරිසකුත් සෙනෙවි මඬුල්ලකුත් ඇමැති මඬුල්ලකුත් තම හට ඇති බව දැනැ දැනැ දු මහා සීලව රජහු සටනට සැරැසීමෙහි අදහසක් නො කළ හ. සතුරන් සිය පුරට එනු ඇසූ ඇමැතියෝ සටනට සෙන් මෙහෙයවනු පිණිසැ නිරිඳුන් ගෙන් වර පැතූ හ. රජ තුමෝ සටනට යනු එපා කොටැ ඇමැති ගණයා පිරිවරා මාළිගයෙහි උන්හ. කිසිදු බාදවක් නැති වැ පුරට වන් කොසොල් රජ තෙමේ මහා සීලව රජුනුත් ඇමැති ගණයාත් ගන්වා පිටිතල හයා බඳවා අමු සොහොනට යැවී.

අමු සොහොනට යවන ලද සීලව රජ තුමෝත් ඇමැති ගණයාත් හිස් පමණක් එළියට සිටින්නට කර වටක් වළ කැණැ එහි වළලනු ලැබූ හ. එ රජුන් මැදැ ද, ඇමැතියන් දෙ පසේ ද ඒ සෙයින් සිටුවා පස් ගැසූ කොසොල් රජු ගේ

මිනිස්සු සෙනු කටයුතු සිවලුනට තිබා ගිය හ. රැයේ සොහොනට වන් සිවල්ලු රජුන් ඇමැතියනුන් බුදින්නට සැරසුණ හ. ඔවුන් දුටු රජත් ඇමැතියෝත් එක් වට මහත් කොටැ හඬ නැඟූ හ. එ හඬ ඇසූ සිවල්ලු සොහොන් බිමේ කවුරුන් හෝ සැඟැවී සිටිතියි බිය ගෙනැ පැලැ දිවැ පසු බලා කිසිවකු ලුහු බැඳැ එන සෙයක් නො පෙනුණෙන් පෙරළා වන්හ. එ විටැ දු රජත් ඇමැතියෝත් මහත් කොටැ හඬ නැඟූ හ. සිවල්ලු පළමු සේ මැ පැලැ දිවැ එ සෙයින් මැ පෙරළා පැමිණිය හ. තුන් වන වරට ද හඬින් බිය වැ පැලැ දිවැ ලුහු බැඳැ එන්නවුන් නුදුටු සිවල්ලු 'මෙ හඬ මරුට කැප වූ දනන් ගේ වියැ යුතු යැ' යි සලකා රජු ගේත් ඇමැතියන් ගේත් කැ ගැසීම ගණන් නො ගෙනැ ඔවුන් බුදින්නට ළං වූ හ.

නායක සිවලා රජුන් සමීපයට පැමිණියේ යි. උඟු එන්නා දුටු රජ තුමෝ උඟුට ගල දෙන්නට සැරසෙන්නා සේ බෙල්ල ඇල කොටැ සිවල් නායකයා ගේ උගුරැ දඬ දත් දෙ ඇන්දෙන් යහඬුවෙකින් මෙන් සිර කොට්ැ ගත් හ. මරණ බියෙන් තැති ගත් නායක සිවල් තෙමේ මහත් කොටැ හඬක් තැංවී. උගේ මර හඬ ඇසූ සිවල්ලු සිය නයුවා මිනිසකු විසින් අල්ලා ගනු ලැබුයේ වනැයි තැති ගෙනැ පැනැ දිවූ.

තිරිඳුන් ගේ දත් උගුලින් ගැලැ වෙන්නට වැර වඩමින් සිවල් නායකයා ඇති සවියෙන් එ අතට මෙ අතට පනින් පනින් රජ තුමන්ගේ ගල වටා ගසන ලද පස් බුරුල් වූයේ යි. එ විටැ රජ තුමෝ සිවලු යන්නට හැරැ මහත් වූ සිරුරු සවිය මෙහෙයවා එ අතට මෙ අතට ඇල වෙමින් ඇඹැරැවී මඳක් බුරුල ලබා දෑත මුදා ගත්හ. ඉක්බිති වළේ පස් ගැටියට දෙ වැල මිට දී වළින් ඉල්පී පවතින් නැගුණු වලා කඩක් සේ ගොඩට පිනුවාහු සිය ඇමැතියන් අස්වස්වමින් ඔවුන් වටා ඇති පස් බිඳැ බිඳැ සියල්ලවුන් නංවා ගත් හ.

එ වේලෙහි, රකුසන් දෙදෙනකුට අයත් දෙ පියෙ-සෙකැ ඉම වූ එ සරියේ ලන ලද මිනියක් නිසා එ රක්සන් දෙදෙනා ගේ දබරයෙක් ඇති වූයේ යි. එහි 'විනිස දූහැම් වැ

දෙන්නට සම්තා නම් මහා 'සීලව රජ යැ' යි බැණැ ගත් රකුසෝ දෙදෙන මිනිය රජ තුමන් ඉදිරි පිටට ගෙනැ අවුත් ලා එය දැහැමි වන පරිදි බෙදා දෙන සේ අයැදා සිටීය හ.

'ඇත්තෙන් මැ යහළුවෙති, මම එය කොටැ දෙමි. එ හෙත් මම් ඇඟැ වැකුණු කසළින් යුතු වෙමි. එ හෙයින් පළමු කොටැ දිය නහා පිරිසුදු වී සිටියැ යුතු යැ' යි නිරිඳු තුමෝ පැවැසූ. එ වේලේ රකුසෝ දෙදෙන රජය පැහැරැ ගත් කොසොල් නිරිඳුට නහන්නට පිළියෙළ කොටැ තුබූ සුවඳ පැන් තමන් ගේ ඉදුහ බලයෙන් එහි ගෙනැ ආ හ. රජ තුමන් ඉන් දිය නැ ඉක්බිති රකුසෝ සැහැසි නිරිඳුට පිළියෙළ කොටැ තුබූ සළු පිළි ගෙනැ වත් හ. එ සළු පිළි-යෙන් නිරිඳුන් සැරැසෙත් මැ රක්සෝ සිවු දැ ගඳ සුවඳ සුනු කරඬුව එහි වැඩූ හ. රජ තුමන් පහසින් ගතින් මැ උඟ තුමූ නන් වගේ කුසුම් මිණි තල් වැට පිටැ වඩා තුබූ රන් කරඬු-වෙකින් ගෙනැ ආ හ. එ තුමන් මල් පැළැඳැ සැරැසෙත් මැ රක්සෝ තුමූ තමන් ගෙන් සිදු වියැ යුතු තව ද මෙහෙයෙක් වේ දැයි නිරිඳුන් විනාළ හ. තමා සයින් පෙළෙන බව රජ තුමෝ පැවැසූ.

එ අසා නික්මුණු රකුසෝ සොර රජුට පිළියෙළ කොටැ තුබූ මියුරු අහර ගෙනැ ආ හ. ඒ එක් වැ මැ රකුසෝ සොර රජු පිණිසැ වූ රන් කළ, රන් විත, සුවඳ පැන් යන සියල්ල ද ගෙනැ ආ හ. රජ තුමෝ අහර බිදැ පැන් වඩා අත කට සෝදා ගෙනැ, රක්සන් විසින් පෙරැ සෙයින් මැ වඩන ලද බුලත් සැපීමෙන් එ කටයුතු අවසන් කළ හ. එ විටැ රක්සෝ තමන් විසින් කළ යුතු තව ද යමක් ඇති දැයි නිරිඳුන් පිළිවිසියහ. 'සොර රජු ගේ කොට්ටය යටැ ඇති මඟුල් කඩුව ගෙනැ ආ යුතු යැ'යි රජ තුමෝ පැවැසූ. රක්සෝ එ ද කළ හ. එ විටැ රජ තුමෝ මළ මිනිය සරි සරියේ දෙ කඩ කොටැ කඩුවෙන් කපා රක්සනට බෙදා දී කඩු තලය සෝදා ගත් හ.

මිනිය බිදීමෙන් තොස පත් රකුසෝ කළ ගුණ සැලැකීම් විසින් තම හට කළ හැකි දයෙක් ඇති දැයි රජ තුමන් විතාළේ යි. 'තොප ගේ ඉදුහ බලයෙන් මා සොර රජු ද්‍රෝහී ගබ ගෙහින් මගේ ඇමැතියන් ඔවුන් ඔවුන් ගේ ගෙහින් ගෙනැ ගොස් දමව්' යැයි රජ තුමෝ පැවැසූ. රක්සෝ 'මැනැවැ' යි එ ද කළ හ. රජ තුමෝ සිය සිරියහන මත්තේ නිදුකින් සැතැපී නිදි සුව විඳුනා සැහැසි රජු බලා ඔහු ගේ බඩ හරහා කඩුයේ තො පිටින් පහරක් ගැසූ. එයින් බිය පත් වැ පිබිදී තැගී සිටි සැහැසි රජ තෙමේ සියල් රජ සිරින් දිලි දිලී මහා සීලව රජුන් එ තැනට ආයේ කෙ සේ දැයි එ තුමන් විතාළේ යැ. එ තුමෝ සියලු පවත් උහුට පැවැසූ. එයින් සිත වෙතස් වූ කොසොල් රජ තෙමේ 'අහෝ උතුමාණෙනි, මිනිස් බව ලැබීමට පින් ඇති වූ මම මිනී මස් බුදුනා රක්සන් පමණට දු ඔබේ ගුණ දැන්මේ නැණින් තොර වීමි' යි මින් ඉදිරියට මහා සීලව රජ තුමන්ට සතුරු වැ නැගී නො සිටිනා බවට කඩුව ඉදිරි පත් කොටැ දිවුරා නිරිඳුන් කමා කරවා ගෙනැ එ තුමන් සිරි යහනේ සතප්වා තමා මිටි ඇඳෙකැ සැතැපී පසු ද පහන් වූ ඉක්බිති බෙර හසුරුවා සියල්ලන් රැස් කරවමින් මහා සීලව නිරිඳුන් ගේ ගුණ පළ කොටැ එ තුමනට රජය පවරා පෙරළා ගියේ ද්‍රෝහී වූ ඇමැතියට සුදුසු දඬුවම් පැමිණැවී.

මඟුල් ලකුණ

'සියටක් රුවිනුදු
මෙ වැනි රිය සක් දෙකෙකි දෙ පතුල' (273)

'දෙ පත්ල මැද පිහිටි සක් ලකුණු දෙසා දුටු හ. එකී එකී චක්‍රය සිසාරා සිටි දෙ දහසක් දැවි දැකැ දැවි වටා සිටි රේඛා දැකැ අතරතුරෙහි ඡිද්‍ර මුඛ ලක්ෂණ දැකැ පෙළ මල් රැසක් සේ තුබූ,

සිරිවස දෙක යැ,
ස්වස්තික ,,
නඳ වට ,,

| | |
|---|---|
| සොවැකි | දෙක යැ, |
| අවතංස | ,, |
| වඩමන් | ,, |
| භද්‍ර පීඨ | ,, |
| ප්‍රාසාද | ,, |
| මඟුල් තොරණ | ,, |
| සේසත් | ,, |
| මඟුල් කඩු | ,, |
| තාලවෘන්ත | ,, |
| පිල් කලප් | ,, |
| චාමර | ,, |
| තලල් පට | ,, |
| මිණි රුවන් | ,, |
| සුමන දම් | ,, |
| නීලෝත්පල | ,, |
| ශ්වේතෝත්පල | ,, |
| රත් පියුම් | ,, |
| හෙළ ,, | ,, |
| පුන් කලස් | ,, |
| පූර්ණ පාත්‍ර | ,, |
| කිරි මුහුදු | ,, |
| නිල් ,, | ,, |
| ප්‍රවාල සාගර | ,, |
| ස්වර්ණ ,, | ,, |
| සක්වළ ගල් | ,, |
| හිමාලය ,, | ,, |
| මෙර ,, | ,, |
| හිර විමන් | ,, |
| සඳ ,, | ,, |
| පූර්ව විදේහ දිවයින් | ,, |
| පශ්චිම ,, | ,, |
| උතුරුකුරු ,, | ,, |

| | | |
|---|---|---|
| ජම්බු ද්වීප | | දෙක යැ, |
| සප්ත රත්න | | ,, |
| සපිරිවරින් සිටිනා චක්‍රවර්තීන් | | දෙදෙනා යැ |
| දක්ෂිණාවෘත්ත ශඞ්ඛ | | දෙක යැ |
| ස්වර්ණ මත්ස්‍ය යුගල | | ,, |
| චක්‍රායුධ | | ,, |
| සප්ත මහා ගංගාවෝ | | දෙදෙනා යැ |
| ,, ,, සීදන්ත සාගර | | දෙක යැ |
| යුගන්ධර | පර්වත | ,, |
| ඊෂ ධර | ,, | ,, |
| කරවීක | ,, | ,, |
| සුදර්ශන | ,, | ,, |
| නේමින්ධර | ,, | ,, |
| විනතක | ,, | ,, |
| අශ්ව කර්ණ | ,, | ,, |
| අනවතප්ත | විල් | ,, |
| ඡද්දන්ත | ,, | ,, |
| කර්ණමුණ්ඩ | ,, | ,, |
| රථකාර | ,, | ,, |
| සිංහප්‍රතාප | ,, | ,, |
| මන්දාකිනී | ,, | ,, |
| කුණාල | ,, | ,, |
| ගරුඩ රාජයෝ | | දෙදෙනා යැ |
| සුංසුමාරයෝ | | ,, |
| මඟුල් ධ්වජ | | දෙක යැ |
| පතාක | | ,, |
| ස්වර්ණ පර්මිත | | ,, |
| ,, සිවිකා | | ,, |
| චල් විදුනා | | ,, |
| කෛලාස කූට | | ,, |
| සිංහ | රාජයෝ | දෙදෙනා යැ |
| ව්‍යාඝ්‍ර | ,, | ,, |

| | | | |
|---|---|---|---|
| වලාහක අශ්ව | රජයෝ | දෙදෙනා යෑ | |
| උපෝෂථ හස්ති | ,, | ,, | |
| වාසුකී නම් නාග | ,, | ,, | |
| හංස | ,, | ,, | |
| වෘෂභ | ,, | ,, | |
| ස්වර්ණ මකර | ,, | ,, | |
| ,, නෞකාවෝ | ,, | ,, | |
| සුරභි ධේනුවෝ | | ,, | |
| කිම්පුරුෂයෝ | | ,, | |
| කින්නරාංගනාවෝ | | ,, | |
| සඳ කිඳුරෝ | | ,, | |
| පුරවි කෙවිල්ලෝ | | ,, | |
| මයූර රජයෝ | | ,, | |
| ක්‍රෞඤ්ච ,, | | ,, | |
| චක්‍රවාක ,, | | ,, | |
| ජීවංජීවයෝ | | ,, | |
| චාතුර් මහා රාජික | දෙව් ලෝ | දෙක යෑ | |
| තවු තිසා | ,, | ,, | |
| යාම | ,, | ,, | |
| තුෂිත | ,, | ,, | |
| නිර්මාණ රති | ,, | ,, | |
| පරනිර්මිත වසවර්ති | ,, | ,, | |
| රූපාවචර වූ බ්‍රහ්මපාරිෂද්‍ය බඹ ලෝ | | ,, | |
| බ්‍රහ්ම පුරෝහිත | නම් | ,, | ,, |
| මහා බ්‍රහ්ම | ,, | ,, | ,, |
| පරිත්තාභ | ,, | ,, | ,, |
| අප්‍රමාණාභ | ,, | ,, | ,, |
| ආභස්සර | ,, | ,, | ,, |
| පරිත්තසුභ | ,, | ,, | ,, |
| අප්‍රමාණසුභ | ,, | ,, | ,, |
| ශුභකීර්ණ | ,, | ,, | ,, |
| වේහප්ඵල | ,, | ,, | ,, |

| | | | |
|---|---|---|---|
| අසඤ්ඤසත්ත | නම් | බඹලෝ | දෙක යැ |
| අවිහ | ,, | ,, | ,, |
| අතප්ප | ,, | ,, | ,, |
| සුදස්ස | ,, | ,, | ,, |
| සුදස්සී | ,, | ,, | ,, |
| අකනිෂ්ඨක | ,, | ,, | ,, |

යන මේ දෙසිය සොළොසක් මගුල් ලකුණු...' (පූජා:) (දෙ පත්ලේ දෙ සිය සොළොස එක් පත්ලේ එක් සිය අට–අට උතුරු සියය– වේ).

උ ර ගු න් ගේ ගතැ දුහුලින් රුස්වූ
මොනරුන් ගේ පිල් කලඹින් පිස්වූ
......... ......... ......... .........
ගි ජි ඳු න් ගෙනැ වත්කළ කර පොකුරින්
කෙසරුන් ගිම් දුරු වූ දිය දහරින්
(320-324)

එ අයුරු අසිරි සස ද කවි කරුවෝ ද මෙ හැටි පවසති:–

වතතුරේ ගජන්
කුඹු පිළු ඇනුණු කටු දැකැ
බහසුරු හැරු තියගින්
සැනැහී පිඹැ තල තුඩින්

බුජඟ ළ දැදුරන්
හිඳුවා තම පෑණ පිටුහි
සුතනැරු කරු අරවා
රඟොත පියක්හු ගිත් කෙළෙ

ගිරි පිටැ අවුයේ
නැවෙත ගිලන් උරු දැකැ
සිකි කැන් පෙම් බැඳැ සිතින්
සෙවණ කෙළෙ පිල් මඬලින්

සිසාල මූව කරා
දූකැ වැල් මලක් නො සරස්
කැපී වැදූ දූවැ දතින්
බැහැවී සදුල් වදලින්

සල පලු විදු බඳ
ගජ ගුම් ගුම් වන ගත
වනග රොත් කබබ මුතු
තව සඳල දුරු දූනැවී

ළඳරුවනදහර
දරණෙහි හොවා මල ලීය
සිය කම්හි නිකුතුවෝ
තත්හි තත්හි නිසැකයෝ

ගල් කුළු කුඹු සියත්
පියැලී පෙරා පළත්තේ
සෙණ සී එ කල් නො හිණී
රුදු ගිරි ගිජිඳු මුඳුනේ

පණ වැනැසුම් හැරා
වනසර අරණහර බිඳු
තම දිවි සෙ දිවි හිමින්
සතු වග රැකි මෙත් සිතින්'

(වනය තුළැ ඇතුන් ගේ හිස පිටැ ඇනුණු කටු දක්මින් සිංහයා තමාගේ නිය අගින් ඇරා කුවින් සුළං පිඹැ සැනැසී යැ.

තයා තමා ගේ පෙණය පිටැ මැඩියන් ඉඳුවා පුතුන් ගෙනැ කරට නංවා සෙල්ලමට නටන පියකු සේ සෙල්ලම් කෙළේ යැ.

මොනර සමූහ ගල් පිටැ අවුවෙන් තැවෙන ලෙඩ නයින් දූකැ සිතේ සතායෙන් පිල් වල්ලෙන් සෙවණ කළ හ.

කොපියා මුවා ගේ බෙල්ල වටා පැටැලුණු වැල් පුඩුවක් දැකැ විගසට ලැහැබින් එළියට අවුත් දිවැ ගොස් දතින් එය කැපී යැ.

සැලෙන දළු තැමැති විදුලිය බැඳුණු, ඇතුන් ගේ ගිගුම තැමැති ගොස ඇති, වනය තැමැති වැසි වලාව ලැව් ගිනි පුපුරු තැමැති රත් ඉඳු ගොවුවන් මතු වන අලුත් කුස තණ බිම් ඇති කෙළෙ යැ- ලැව් ගින්න දිරු දූය මිසැ වනයේ තණ ද නො දැවී-

වැදි ගැනු ළදරුවන් පිඹුරු දරණේ සතප්වා සැක නැති වැ තම තමන් ගේ කට යුතු පිණිසැ ඒ ඒ තැනැ නික් මැ ගියහ.

හෙණ තැමැති සිංහයා ගල් මුදුන් තැමැති ඇත් ඔළු සිය ගණන් පෙරළ පළන්නේ වුව ද, එ කල්හි මණ ගල් තැමැති ඇත් රජු මුදුනේ නො වැටිණි.) (233—239)

මෙ කියති මුවදෙව් දා කවිකරුවෝ:—

තුඹස් නො වනෙ කල්
පෙරළ සේ ගොර බුජගමා
රුසිරු මොනර පියා ගැබැ
ගත හුණුසුමැ පුළුද්දේ (= සස 235)

පැනට බට සිඟලු
බිය නො ගැණැ නික්මැ ගුහෙන්
නිහිය ඩැහැ අග තගුලේ
නළ කෙළියැ ගඳ ගගුලේ

සුළඟිනි වෙවුලන
මුව පොල්ලනට පෙම් කොටැ
එ වැ තමා දළ දරණ
සැතැගී දර තුස්මින්

සස ලා රත් ලිය
විදු අවුල් ගල් වෙලෙහෙත්
තො හිණ රුදු මිහිඳු සෙණ
මෙදෙතද දඬැත් මුදුනේ

ගෙතැ ගිනු තිහිය
මල දූ කදට හි යෙහෙත්
වලගතැහෙහි කබර
බෙණෙමිත් සොද බොළඳ බස්

රිසි සේ ඇවිදියෝ
මුවෝ වලගත හසරෙහි
යෙහෙත් පැනුරමිනුලේ
මුව ලමිති තඹ පල්ලේ

දූකැ සමහ කුරුරු
රිවි තෙදිති ලෙඩ මැඩිය්ත්
සැතැප්වී බුජහමා
පෙණ සත් සෙවණෙහි තමා

නු උපුල ලෙල විපුල්
සුපුල් ගත සා සහගුම්
බිඟු වැළ සියෝ සත් පත්
රුක් මෙදෙතද ගද ගිජිඳු

ලකුළු හිවි ගත සා
පෙණ පෙළ වල් බුජහමා
තො ගත් ලැව් ගිති ගුරුළු
කුරුරු දල කිඳු පසුරින්.

(එ කල්හි තපුරු වූ නයා සිත් පිය කරන මොනර පියා පත් තුළැ ගත උණුසුමෙහි ලොබ වූයේ තුඹස් තො වැදුණේ යැ.

කකුළුවා දිය බීමට බැස්සා වූ සිවලා ගැතැ බිය ගණිත් තො ගෙතැ බිලයෙත් අවුත් නගුටේ අග සෙමෙත් කොතහා සුවද වත් ගඟුලේ සෙල්ලම් කෙළේ යැ.

පිඹුරා සුළඟට සැලෙන මුව පැටියන් හට සත්‍යෙයන් දරණ වැලින් අවුරා තුටු වෙව් සැනැස්වී යැ.

තපුරු වූ සෙණය නැමැති සිංහයා විදුලිය වැළ මැ යැ. රත් වැලින් අකුල් ගැසුණු වැහි වලා නැමැති කුළින් වනය නැමැති මදයෙන් තෙත් ඇතු පිටට නො පිනී.

වැදි ගැනු දිවි දෙනුන් ගේ බෙල්ල සෙමෙන් අල්ලා ගෙනැ යහපත් වූ බොළඳ බස් කිය කියා ඇගේ තිත් ගණන් කළ හ.

මුබෝ වගුත්-ව්‍යාශ්‍රැත්-යන මං ගැනැ සැකක් නැති වැ උල් පනිත් දිය උරා බොමින් ළා දළයේ මුව තිබ තිබා බුදිමින් කැමැති පරිද්දෙන් ඇවිද්දේ යැ.

තයා දැඩි අවුවෙන් ලෙඩ - ක්ලාන්ත- වූ මැඩියන් දුටු හැටියේ මැ තම පෙණය නැමැති කුඩයෙන් සෙවණ දී සැතැප් වූහ.

මදයෙන් තෙත් ගඳ ඇතා ගුම් ගත් මී මැස්සන් සහිත, ලෙළ දෙන, මතා වැ පිපුණු මල් ඇති අතු බොහෝ වූ රුක් අත්තන ගස් නො ඉදිරී.

ලැව් ගින්න නැමැති ගුරුළා, පැතුරුණු අතු නැමැති පෙණ පෙළ සැරසු වනය නැමැති නයා තපුරු වූ ගින්න නැමැති නිය පදුරින් - ඩැහැ - නො ගත්තේ යැ ) 155 - 163.

'මන්දතු තර දෙව්
පසන් කිත් දිය කදින් කළ දෙව්' (343)

ඒ මහා සම්මත රජු පිත් රෝජ නම් රජ ද × × × × × × ඔහු පිත් වර රෝජ නම් රජ ද × × × ඔහු පිත් කල්‍යාණ නම් රජ ද × × × ඔහු පිත් වර කල්‍යාණ × × × ඔහු පිත් උපෝසථ නම් රජ ද × × × ඔහු පිත් මහ මන්ධාතු නම් චක්‍රවර්ති රජ මහත් වූ ආඥ තේජස් ඇති විය. ඔහු වමත හැකුළුවා දකුණතින් අත් පොලසන් දී අ.කාශය බලා 'දෙවියෙනි මට මිනිස් ලොවැ සම්පත් නො කැමැත්තේ යැ.

මාගේ ආඥාවක් ඇත් නම් මට දිව්‍ය සම්පත් දෙව' යි හඬ ගා කී කලැ සියලු දෙවියෝ සුළංගත් මහ වනයක් සේ වෙවුලා වෙන වෙන සත් රුවන් වැසි වස්වා වට සතිස් යොදනක් මානයේ දණ පමණ, කටි පමණ රුවන් ගොඩවල් පුරත්තා හු යැ. එ රජ මෙ සේ මිනිස් ලොවැ බොහෝ කලක් සුව විඳැ එ මැ ආත්මභාවයෙන් දෙව් ලොව තැගී සතිස් ශක්‍ර කෙනකුන් ගේ ආයු පමණින් එක් සිය විසි නව කෙළැ සැට ලක්ෂයක් හවුරුදු දිව්‍ය සම්පත් විඳැ නැවැතැ එ මැ ආත්මභාවයෙන් මිනිස් ලොවට බැසැ ඒ ඇතුළු වැ අසංඛ්‍යයක් හවුරුදු මැ රාජ්‍යය කෙළේ යැ. (පූජා:)

'මහා සුදසුන් රජුන් ගෙන් ඉහබි' (344)

'ඔහු (සුදර්ශන නම් රජු) පින් මහා සුදර්ශන නම් චක්‍රවර්ති රජ ද සත් රුවන් මැ යැ වූ දෙලොස් යොදුන් මහනුවරෙකැ දී අසංඛ්‍යයක් අවුරුදු රාජ්‍යය කෙළේ යැ' (පූජා:)

මෙ රජු අප මහ බෝසතුන් මැ වූ බවත් මෙ රජු වුසූ කුසාවතිය බුදුන් පිරිනිවි 'කුසිනාරාව' බවත් මහා සුදස්සන සූත්‍රයෙන් පෙනේ.

'පසිදු මුව දෙව් රජුන් ගෙන් දිලි' (345)

'සගර නම් රජු පින් මඛාදේව නම් රජෙක් විය. ඒ රජ ද ලක්ෂ දෙ පනස් දහසක් අවුරුදු ආයු වළඳා මිහුලු නුවරැ ඉඳැ රාජ්‍ය කරන කලැ පළමු වන නර කෙස ඕ හට පහළ වියැ. එ රජ නර කෙස දැකැ අතින් ලකුණු උපදවා නර කෙස පැ කැපුවාට ගම්වර දී තමා ගේ මඛාදේව නම් පුතුට රාජ්‍යය දී මහණ වැ මඛාදේව නම් උයනැ දී සුවාසූ දහසක් හවුරුදු තපස් කොටැ බ්‍රහ්ම ලෝකයෙහි උපන. එ රජහු පටන් මහා සම්මත වංශ නම් පෙරැළී මඛාදේවවංශ නම් වියැ.........' (පූජා).

'පවර නිමි නිරිඳු ගෙන් සුපිහිටි' (346)

මියුලු පුරේ රජ වූ මෙ තෙමේ පැහ විසැදීමේ දෙව් ලෝ පවා ගොස් ආයේයි. තර කෙස දුටු පසු ව දූක් වූ කපුවාට ගම් වර දී තපසට අභ උයන් ගිය මෙ රජු එ සිරිත මුලින් පිරූ මුව දෙව් රජු මැ බවයි නිමි ජාතකයෙන් පළ වන්නේ.

'කුසා රජ පරපුරින් සැපැමිණි' (347)

'මුව දෙව්' වංශය ඔකාවස් (ඔක්කාක) වංසය බවට පෙරළුණු පසු පහළ වූ මෙ රජු ගේ පවත් කුස දයෙන් දක්නට හැකි.'

'එ රම් රජු ගෙන් සසිරිමත් වූ' (348)

මෙ රජ තෙමේ ද (ප්‍රථම) ඔක්කාක වංසයෙහි උපනෝ වෙයි. ජාතක පොතේ බරණැස් පුර දශ රථ රජු ගේ පුතු හැටියට ද, රාමායණයේ අයෝධ්‍ය පුරේ දශ රථ රජු ගේ පුතු හැටියද සඳහන් වන මෙ රජ තෙමේ බෝසතුන් හැටියට අඳුන්වනු ලබයි, ජාතක කතා පුවතින්. වෙන් දෙවියා ගේ අවතාරයක් හැටියට අඳුන්වනු ලබයි රාමායන පුවතින්. ජාතක කතා පුවතේ රාවණ යුදයෙක් සඳහන් නො වේ.

'ඔකාවස් පරපුරින් පරසිදු' (349)

මේ කීයේ තුන් වන ඔක්කාක රජු ගෙන් වන දෙ වන ඔකාවස් පරපුරයි. මෙ රජු ගේ පරපුරිනි කිඹුල්වත් පුර රජ පෙළ පහළ වූයේ.

බුදු ගුණ අලංකාරයේ

# වස්ත්‍ර බීජය

---

## ගංගාරෝහණ කථා

(බුත්සරණයෙන් ගන්නා ලදී)

තව ද, එක් සමයයෙක්හි **විශාලාමහනුවර** නානා ප්‍රකාර වූ වේශයෙන් හා භූෂණයෙන් යුක්ත වූ, සම්පත්තියෙන් අනූන වූ, යෞවනයෙන් උද්දාම වූ, රූපයෙන් මනෝහර වූ, කුලයෙන් අනින්දිත වූ, විද්‍යායෙන් ප්‍රසිද්ධ වූ, සැරසුම්හි තන් වැසි වූ, කෙළියෙහි විදග්ධ වූ, සත්‍යයෙහි ස්ථිර වූ, ප්‍රේමයෙහි තිබොරු වූ, අභ්‍යන්තරබාහිරාඞ්ගකාර්‍ය්‍යයෙහි ප්‍රමාදයක් නැත්තා වූ, ගෑනුන් හා පිරිමින් විසින් ගැවැසී ගත්තේ යැ.

සියලු දේශයෙහි සමෘද්ධි සාරය නාක් එක් තැන්හි කොටැ මවා ලූවාක් සේ නානා දේශයෙහි වූ අනේක ප්‍රකාර වස්තුයෙන් ‘අසෝ වස්තුව මෙහි නැතැ’යි නො කියත පරිද්දෙන් කපුරු, කස්තුරු, සඳුන්, කලුවැල්, ලමහ, තකුල්, පට පිළි, දේවාඟ, රත් රන්, රිදී, මුතු, මැණික්, ආදි වූ නොයෙන් සාර වස්තුයෙන් සම්පූර්ණ යැ.

**අඤ්ජනකූටපර්වතය** සේ උස් වූ, මහත් වූ, ජාතියෙන් භද්‍ර වූ, සත්ත්වයෙන් දෙවසත්වාදි උත්තමසත්ත්ව ඇති, දශා හෙයින් චතුර්ථ දශා ඇති, ශෝභායෙන් චතුර්ථ ශෝභා යෙහි පවත්නා වූ, විනීත කැමින් තපස්වින් වැනි වූ, කෝපයෙන් අශනිපාතයක් සේ නො වළකා ගත හැක්කා වූ, ක්‍රියායෙන්, උත්තම වූ, සන්නාහ්‍ය කර්ම, ඖපවාහ්‍ය කර්ම-යෙහි දක්ෂ වූ, වහ්නි දක්ෂ, වහ්නි පරඝාත, පාණිපරඝාත වේණුපරඝාතාදි වූ නානා ප්‍රකාර පරඝාතයෙන් හික්මවන ලද්දා වූ, ශාස්ත්‍රෝක්ත විධියෙන් ග්‍රාම්‍ය කරන ලද, හස්තීන්ගේ කුඤ්ච නාදයෙන් ගැවැසී ගත්තේ යැ.

තව ද දේශ හෙයින් සින්ධුදේශාදි උත්තම දේශයෙහි උපන්නා වූ, වර්ණ හෙයින් ජාති හෙයින් සත්ත්ව හෙයින් ප්‍රකෘති හෙයින් කිසි දෝෂයක් නැත්තා වූ, පඤ්චධාරායෙහි ඉතා ශික්ෂිත වූ, රළ සේ අනවරතයෙන් දිවෙන්නා වූ පනන්නා වූ අශ්වයන් ගේ හේෂාරවයෙන් ඒක කොලාහල යැ.

එසේ මැ නානා ප්‍රකාර වර්ණකම්බල අතුළා වූ, නඟන ලද ධ්වජපතාකා ඇති, විනීත වූ අශ්වයන් යෙදූ දේව රථ යැ, පුෂ්‍ය රථ යැ, සංග්‍රාමික යැ, පුරපරිසෞතික යැ යනාදි නොයෙක් රථයෙහි චක්‍ර නාදයෙන් නිරන්තර යැ.

පුඹුනාවුන්ගේ තුඬින් නක්මුණු, එහි රජ කරන රජ දරුවන්ගේ මූර්තිමත් කීර්ති බඳු වූ, අතිධවල දක්ෂිණාවෘත්ත සංඛ නාදයෙන් ඒකනාද යැ.

සන්තුෂ්ට වූ ස්ත්‍රී පුරුෂයන්ගේ නානා ප්‍රකාර මඞ්ගලයෙහි හා නෘත්‍ය ගීත වාද්‍ය ප්‍රසඞ්ගයෙහි ගසන ලද මිහිඟු බෙරෙහි ගම්භීර ධීර නාදයෙන් ශ්‍රවණරමණීය යැ, ප්‍රවීණ වූ වීණාකාරයන්ගේ වීණාස්වරයෙන් සාඩම්බර යැ. දේශීය මාගී දෙක්හි සුශික්ෂිත වූ වංශකාරයන් විසින් පුඹුනා ලද වංශ නාදයෙන් මනෝහර යැ, ලය මානයෙහි දක්ෂ වූ තාළ ධරයන් විසින් ප්‍රයෝග කරන ලද තාළයෙහි ශබ්දයෙන් දුරු කරන ලද උත්කණ්ඨා ඇත්තේ යැ.

තන්හි තන්හි ගෙහි ගෙහි දෙරු දෙරු දේවාලයයෙන් දේවාලයයෙහි නටන්නා වූ ස්ත්‍රීන්ගේ නෘත්‍යයෙන් පුරුෂයන් සිත් ගන්නේ යැ. පුරුෂයන්ගේ නෘත්‍යයෙන් ස්ත්‍රීන් සිත් ගන්නේ යැ. කාමද්වේෂයට මතුරන මන්ත්‍ර බඳු වූ ස්ත්‍රීන් ගේ මධුර ගීතයෙන් පුරුෂයන්ගේ කන්හි අමා නමන්නේ යැ. පුරුෂයන්ගේ ගීතයෙන් ස්ත්‍රීන්ගේ කන්හි අමා නමන්නේ යැ.

'මේ මධුරාහාර අනුභව කරව, මේ මධුර වූ පානීයය බොව' යි මෙ සේ හඬ ගහන වචනයෙන් සා පිපාසා ඇත්තවුන්ගේ කන්හි දරිද්‍රය හරනේ යැ.

සුවාසූ දහසක් කුළින් ගැවැසී ගත් හිමාලය පර්වතය සේ උස් වූ ධවල වූ අනේක ප්‍රකාර වූ ප්‍රාසාදශතසහස්‍රයෙන් හොබනා ලද්දේ යැ. නො එක් හංස චක්‍රවාකාදි වූ ජලචර පක්ෂීන් ගේ මනෝහර ක්‍රීඩායෙන් යුක්ත වූ, පියුම්හි මී බී මත් බමර පිය රැවින් මධුර වූ, අනවරතයෙන් පිපී සිටිනා පස් වණක් පියුම් ඇති, මන්ද මාරුතයෙන් සොලොවන ලද පද්මෝත්පලයෙන් වගුළ අභිනව රේණු නැමැති කුංකුමයෙන් අංගරාග ගත්, ගිමට සතුරු වූ, ක්‍රීඩාවට නිධාන වූ, දිය මැදින් අවුත් වෙලළු ගැසෙන්නා වූ රළින් මැ බලන්නවුන්ගේ සිත් දෙම්නස් නාක් තමා අතින් ගෙනැ ගොඩට ගසන්නාක් වැනි වූ, වෙරළෙහි සුදු වැලි තලායෙන් සංසාර මූඛය නිරුපද්‍රව වන පිණිසැ පාන් වලි දුන්නාක් වැනි වූ, තෙරෙහි ලතා මණ්ඩපයෙහි හිඳැ හඬන්නා වූ රාජහංස නැමැති වන්දීන් විසින් අනවරතයෙන් ස්තුති කරන ලද්දා වූ නො එක් පොකුණින් හා වලින් ගැවසීගත්තේ යැ.

වසන්තකාලයා ගේ අවත් බිම් වැනි වූ, බමරුනට කුල පරපුර වූ, මොනරුනට නෘත්‍ය ශාලා වූ, නො එක් ජාතියෙහි මුවනට ක්‍රීඩා ගොෂ්ඨිස්ථාන වූ, ලතායෙන් වෘක්ෂයට යන වෘක්ෂයෙන් ලතාවට යන බමරුන්ගේ මධුර වූ නාදයෙන් අනවරතයෙන් සන්තෝෂ ගායනා පවත්වන්නාක් බඳු වූ, මනුෂ්‍ය ලෝකයෙහි ඇති නාක් පුෂ්ප ජාති යැ, ඵල ජාති යැ, යන මේ එක් කොටැ සැමතුම් ගන්නා තැන් බඳු වූ, නො එක් වැලි මළුයෙන් නො එක් ලිය මඬුයෙන් නොඑක් ධරාගෘහයෙන් නොඑක් හැල්ලෙන් නො එක් පතසින් නො එක් විලින් ඇළින් හොබනා වූ සිය දහස් ගණන් උයනින් ශක්‍රයාගේ නන්දන වනයට ස්පර්ධා කරන්නේ යැ.

සියලු සත්ත්වයන් දරුවන් කොටැ සිතන්නා වූ රජ දරුවන් විසින් යුක්ත යැ. 'අප ගේ ස්වාමි මධ්‍යස්ථය හැ. අප ගේ ස්වාමි නැයනට නිෂ්ඨුරය හැ. අප ගේ ස්වාමි දුෂ්ට නිග්‍රහ ශිෂ්ට පරිපාලන දෙකට මැ සැරැහී සිටිය හැ.

අප ගේ ස්වාමි සත්‍යවාදී හ. අපගේ ස්වාමි ත්‍යාගී හ. අප ගේ ස්වාමි උදාර වූ පරාක්‍රම ඇත්තා හ. අප ගේ ස්වාමි ශස්ත්‍ර ශාස්ත්‍ර දෙක්හි සමර්ථය හ. අප ගේ ස්වාමි ස්වමණ්ඩල පරමණ්ඩල කාර්‍ය්‍යාකාර්‍ය්‍යයෙහි විභාග දන්නා හ. අප ගේ ස්වාමි ඇත් පිටැ අස් පිටැ රථ පිටැ ඉතා ශික්‍ෂිතය හ. කෝප- යෙහි යමයා වැන්න හ. කීර්තියෙන් සඳු වැන්න හ. ලෝ වැස්සනට සුව දී තුමූ සුව අනුභව කෙරෙති.’ මෙ සේ අනවරතයෙන් තමන් ගේ ස්වාමින් ගේ ගුණ කිය කියා මත් වැ මත් වැ ඇවිදුනා වූ, භය පක්‍ෂපාත දෙකින් යුක්ත වූ රාජ සේවකයන් ඇත්තේ යැ.

සියලු සත්ත්වයන් ගේ අන්‍යායනිවාරණය පිණිසැ ස්ථානාස්ථානයෙහි පිහිටුවන ලද, ලොවට මවුපියන් සේ සිටියා වූ සතර අගතියට නො ගිය සභ්‍යයන් විසින් පිහිටි ධර්‍මාධිකරණ ඇත්තේ යැ. සද්ගුරුන් ගේ උපදේශයෙන් මනා වැ පවත්නා වූ ක්‍ෂුද්‍රවිද්‍යාවන් හා මහා විද්‍යාවන් ගේ පැලැඹුම් ඇති නොයෙක් විද්‍යාශාලා ඇත්තේ යැ.

එහි වාරයෙන් වාරයෙහි රජ කරන රජ දරුවෝ සත් දහස් සත් සිය සත් දෙනෙකැ. ඔවුන් වසන්නා වූ එ තෙක් මැ ප්‍රාසාද ඇත්තේ යැ. එ තෙක් මැ කූටාගාර ඇත්තේ යැ. එ තෙක් මැ පුෂ්පාරාම ඵලාරාම ඇත්තේ යැ. එ තෙක් මැ පොකුණු ඇත්තේ යැ.

මෙ සේ සමෘද්ධ වූ දිව්‍ය පුරයට ස්පර්ධා කරන්නා වූ මේ විශාලා නම් මහ නුවර කාලාන්තරයෙකින් දුර්භික්‍ෂයෙක් ඇතිවී යැ. මෙ සේ දුර්භික්‍ෂ ඇති වූ කල්හි සම් කාලයෙහි පළමු කොටැ ගෝ කුර වියැළි යන්නා සේ, පළමු කොටැ අනාථ වූ දිළිඳු වූ ජනයෝ මළ හ. ඒ මළා වූ මනුෂ්‍යයන්ගේ කුණප ගන්ධයෙන් යක්‍ෂයෝ අවුත් ඒ නුවරට වන් හ. මෙ සේ පළමු ඇති වූ දුර්භික්‍ෂභය ද, මත්තෙහි යක්‍ෂභය ද ඇති වන්නා හා මැ නැවැතැ බොහෝ සේ මිනිස්සු මියැ යන්නට වන් හ. මෙ සේ කුණප ගන්ධයෙන් එ නුවර පිරී ගිය කල්හි

සත්ත්වයනට අහිවාතක නම් රෝගයෙක් ඇති වී යැ. මෙ සේ දුර්භික්ෂ භය යැ, අමනුෂ්‍ය භය යැ, රෝග භය යැ යන මේ තුනින් එ නුවර සඞ්කාරයෙන් උපද්‍රුත වී යැ.

ඉක්බිති මෙ කී තුන් භයින් පීඩිත වූ සියලු නුවර වාසීහු රාජාඞ්ගණයෙහි රැස් වැ මහත් කොටැ හඬ ගැසූ හැ. ඒ අසා රජ්ජුරුවෝ 'මේ කිමෙක් දැ?' යි විචාළ හැ. නගරවාසීහු ද 'ස්වාමිනි! මේ නුවරැ දුර්භික්ෂ භය යැ, අමනුෂ්‍යභය යැ, රෝග භය යැ, යන මේ මහත් වූ තුන් භයෙක් ඇති වී යැ. මෙයට පළමු සත් වන රාජ පරම්පරාව දක්වා මෙ සේ වූ තුන් භයෙක් නො උපන් විරී යැ. ක්ෂෙත්‍රයෙහි ශස්‍ය නැති වී යැ. වැව් අමුණුවලැ දිය නැති වී යැ. අහස්හි වැසි නැති වී යැ. කොටු ගෙවලැ පිරූ ධාන්‍යසඞ්චය නැති වී යැ. බිමැ තණ නැති වීයැ. තලු තෙමන පමණක් පැන් නො ලබන්නා වූ, තොලු ගානා පමණක් තණ නො ලබන්නා වූ, සියලු චතුෂ්පාද ජාතීහු මියැ වැගිරැ ගිය හැ. දෙරැ දෙරැ මිනී යැ. ගෙයි ගෙයි විලාමැ. ඇසැ ඇසැ කඳුළු යැ. සිතැ සිතැ ශෝක යැ. තන් තන්හි මිනී බෙර හා අවමඞ්ගල්‍ය කාහල යැ. ගෙහි ගෙහි කණ්ඨගත ප්‍රාණ වැ හොත්තා වූ අනාථ සත්ත්වයන් ගේ බැගෑ පත් හඬ යැ. පවුරින් පිටතැ සියලු භූමිය මිනී මත්තෙහි මිනියෙන් පවුර හා සම වැ උස් වී යැ. ප්‍රාණ රක්ෂා කොටැ ගනුම්හ යි සියලු ධනධාන්‍ය හා, බන්ධුවර්ගයා හැරැ පියා භිත්ති බිඳැ ගෙනැ නික්මෙන්නා වූ ජනයා ගේ සංඛ්‍යා නැතැ. සියලු ජම්බුද්වීපයෙහි උපද්‍රව තාක් හැම හැකිළී මෙ නුවරෙහි රැස් වූවාක් වැන්නැ. අපි හැම දෙන සතුටු කඳුලෙහි රස නො දනුම් හැ. ශෝකයෙන් තොරැ වූ ලයක් නො ලබම් හැ. දිව්‍ය ස්ත්‍රීන් හා සමාන වූ ස්ත්‍රීන් ගේ ශරීරයෙහි ලේ මස් නැති වැ ඇට සම් මාත්‍රයක් තුබූ හෙයින්, ඔහු හැම ගෙයි ගෙයි යකින්නන් වැන්න හැ. මේ වූ තුන් උපද්‍රවය අසා සියලු දේශාන්තර වාසීන් ගේ උපසර්පණයක් නැති වැ ගිය හෙයින්, දෙශාන්තරයෙන් එන්නා වූ අමුතු පඬුරෙකැ රස නො දනුම් හැ. 'අද මර යැ' යන භයින් ආතුර වූ චිත්තයෙන්,

කාමානුභවතෘෂ්ණාවෙක් නම් දුරින් දුරු වී යැ. කාමාස්වාද විගමනයෙන් අප ගේ දරු මුනුබුරු පරම්පරාව පිරිහෙන්නට වනැ. එ හෙයින් මැ, මේ රජධානියෙහි එ සේ ගහන වූ මිනිස්සු දූන් ගැණැගත හැක්කා සේ ඉතා විරල වැ ගිය හැ. මර නෙමේ 'විශාලා මහනුවර මිනිසක්හු තබා ලා ඔබ්බෙහි මිනිසුන් අල්වම් දූ?'යි ප්‍රතිඥ කළාක්හු වැන්නැ. පෙරැ සම්පත්තින් විශාල වූ මේ නුවර දූන් විපත්තින් විශාල වී යැ. පෙරැ ධර්මිෂ්ඨ වූ රජ දරුවන් දවසැ මෙ සේ වූ භයක් මෙ සේ වූ විපත්තියක් නුදුටු විරූම්හ'යි කියා, තමන් අං කටයුතු දූත්වූ හැ.

එබස් ඇසූ රජ්ජුරුවෝ සියලු නුවර වැස්සන් සන්ථාගාරයෙහි රැස් කරවා, 'ලොවට විපත්ති නම් රජ දරුවන් ගේ අධර්මිෂ්ඨ කැමින් වන්නේ යැ. ඉදින් මෙ ලෙස විපත්ති වීමට කාරණ වූ කිසි අධර්මිෂ්ඨ කමෙක් ඇත් නම්, තෙපි හැම දෙන මැ පරීක්ෂා කොටැ කියව'යි කී හැ.

ඉක්බිති නගර වාසීහු හැම දෙන මැ රැස් වැ ගෙනැ ලෝක සම්පත්ති, ලෝක විපත්ති දෙක රජ්ජුරුවන් ගේ ධර්මාධර්ම දෙකින් වන්නේ යැ. රජු ධර්මිෂ්ඨ කල්හි උන්ගේ රක්ෂාවෙහි සිටියා වූ දේවතාවන් ආදි සියල්ලෝ මැ ධර්මිෂ්ඨ වන්නා හ. හිර සඳ දෙ දෙන ද රජ දරුවන් රාජධර්ම මාර්ගයෙහි පවත්නා කල්හි තුමූ ද තමන් ගේ මාර්ග නො ඉක් මැ පවත්නාහු යැ. සියලු කර්මජ රූපයක් රක්නා ජීවිතේන්ද්‍රියය සේ, සියලු සත්ත්වයන්ගේ රක්ෂාව රජ දරුවන් පිළිබඳ යැ. ශුද්ධාෂ්ටකයෙහි සෙසු රූපයන් ඇත ද, ද්‍රව ගුණය ආපෝ ධාතුවෙන් මැ පවත්නා සේ, සත්ත්ව ලෝකයෙහි අනන්ත සත්ත්වයන් ඇත ද, රජ්ජුරුවන් ගේ කරුණායෙන් මැ සියලු සත්ත්වයන් ගේ ළය සැනැහී තිබෙන්නේ යැ. මෙ සේ ලොවට බොහෝ උපකාර වූ ස්වාමිකුලයෙහි උපන් අප ගේ ස්වාමි මේ සා විපත්තියක් වන පරිද්දෙන් කවර දෝෂයක් කළ සේක් දෝ හෝ? යි පරීක්ෂා කරන්නෝ, අප ගේ ස්වාමි මහා කුලීන හෙයින් හා දෛවය යැ බුද්ධිය යැ සත්‍යය යැ යන මෙයින්

සම්පන්න හෙයින් හා, ඤුතවෘඬයන් කී පරිද්දෙන් පවත්නා හෙයින් හා, ධර්මිෂ්ඨ හෙයින් හා, සත්‍යවාදී හෙයින් හා අවිසංවාදක හෙයින් හා, කෙළෙහි ගුණ දන්නා හෙයින් හා, බොහෝ අවගුණයන් අතුරෙහි ගුණ මාත්‍රයක් මැ ගන්නා හෙයින් හා, උත්සාහ සම්පන්න හෙයින් හා, අභිමත වූ කාර්‍ය්‍ය සාධාගැන්මෙහි දක්ෂ හෙයින් හා, කීවා කරන අමාත්‍යයන් ඇති හෙයින් හා; ඉන්ද්‍රිය විජයයෙන් යුක්ත හෙයින් හා, කිසි රජ දරුවනට සුදුසු වූ ගුණයෙකින් හීන නො වෙනි යි පානබ්‍යසන යැ, ස්ත්‍රීබ්‍යසන යැ, මෘගයා-බ්‍යසන යැ, ද්‍යූතබ්‍යසන යැ යනාදි වූ සප්තවිධ ව්‍යසනයෙන් දුරු වැ සිටියා හැ. ත්‍යාග යැ, සත්‍ය යැ. ශෞර්‍ය්‍ය යැ යන මහා ගුණ තුනට ජීවිතය සතර වනු කොටැ සේ රක්‍ෂා කරන්නා හැ. හිරු නැංග ද, ගුහාවට වන්නා වූ අන්‍ධකාරය නො නස්නා සේ, ලොවැ චණ්ඩ වූ බලවතුන් බොහෝ වුව ද, මොවුන් ආශ්‍රය කළා වූ අනාථයෝ නො තැසී මැ සිටිය හැ. ශාලි රක්ෂාව පිණිසැ කෙත්වත්හි ලවන් නෙළන්නා සේ, ශිෂ්ටයන්ගේ රක්‍ෂාව පිණිසැ දුෂ්ඨ නිග්‍රහ කරන්නා හැ. වරා අතුරෙහි නැඟි හැල් පත උදුරන්නා වූ මලය වැස්සන් සේ, අධර්‍මය රක්ෂා කොටැ ධර්‍මයට හිංසාවක් නො කරන්නා හැ. වැව් පත්ලෙහි දිය පුරා උඩත් තව දිය ගන්නා සේ, සත්ත්වයා සුව පත් කොටැ තුමූ සුව පත් වූහැ. මල් පෙති නො බිඳැ මී බොන බමරක්හු සේ, යෙහෙන් ලෝ වැස්සන් නො මිරිකා අය ගන්නා හැ. ඇසින් දක්නා රූප කනින් දක්නට නියෝග නො කරන්නා සේ, සත්ත්වයා සුදුසු කටයුත්තෙකැ මුත් නුසුදුසු කට යුත්තෙකැ නො යොදන්නා හ. කරයෙන් තැබුව මනා අන්දම් වැයෙන් පොරොවෙන් නො තබන්නා සේ, ක්‍ෂුද්‍රයන් හා කළ මනා කටයුතු මහතුන් හා නො කරන්නා හ. ඡත්‍රයෙන් වැළකෙන්නා වූ වැස්සට අතුල් හිසැ තබන්නවුන් සේ, මහතුන් කළමනා කටයුතු ක්‍ෂුද්‍රයන් ලවා නො කරවන්නා හැ. දවසක් මුළුල්ලෙහි තැවූ ය-කබල්හි ලූ කිහිඹියන් සේ, අඹුවන් දරුවන් නැති යහන්හි මිනිසුන් නො හෙවූ විරූ හැ. ශරත් සමයෙහි දිලියෙන්නා වූ

සූර්‍ය්‍ය මණ්ඩලය ඇස හකුළුව හකුළුවා බලන්නා සේ ලෝකාර්‍ථයක් තකා ද පරස්ත්‍රීන් බලත් නම්, ඇස හකුළුව හකුළුවා මැ බලන්නා හැ. මවුන් ගේ සෞභාග්‍යයෙහි රාගෝත්පත්තියක් නො වන්නා සේ, පරස්ත්‍රීන් ගේ සෞභාග්‍යයෙහි රාගෝත්පත්තියක් නො කරන්නා හැ. දියෙහි ලූ නැව් දිය නො උකා රැකෙන්නා සේ, ධනීන් කෙරෙහිත් උන් ගේ ධන නො ගැනැ පවැත්තා හැ. දත් මැද අන්තයෙහි දූවටු දඩ නිරපේක්ෂ වැ දමන්නා සේ, පුරුෂයා ලවා ප්‍රයෝජන කරවා ගෙනැ නිරපේක්ෂ වැ, අත් හැරැ නො පියන්නා හැ. වෙත වෙත කරලෙහි තුබූ වී එක් කොටැ ගෙහි රැස් කොටැ බොහෝ කරන්නා සේ, හැම සත්ත්වයන් සිතැ ඇති සන්තෝෂ තමන් ලෙහි බහා ලා බොහෝ කළ හැ. පුත්‍ර ප්‍රේම ඇති මව ප්‍රසව වේදනා ඉවසන්නා සේ, සත්ත්වයා කෙරෙහි කළ ස්නේහයෙන් තමන් ගන්නා ආයාසය සරු නො කළ හැ. මහ නැව් පස්සෙහි යන ගල්වතක් සේ, පූර්‍වරාජධර්‍ම පෙරදැරි කොටැ තුමූ ඒ අනුවැ පැවැත්තා හැ. කුස පිරෙන පිණිසැ මියෙහි ආහාර තබන්නා සේ ලෝ වැස්සන් සමෘධ කරන පිණිස තුමූ මැ ධන සඤ්චය කළ හැ. විල්හි පියුම් මී බොන රාජහංසයකු සේ, ධන ඇති ඇත්ත වූන්ගේ ගෙහි මැ තබා තමා මැ එයින් ප්‍රයෝජන වින්ද හැ. ඇත් හට ගොයම් පිණිසැ කුඹුරු ඇත්ත වූන් හඬව හඬවා ගොයම් ද ගන්නා සේ එකකු හට ඉෂ්ට පිණිසැ එකක්හු ගේ ධනය හැරැ එකකු හට නො දෙන්නා හැ. ආකාශයෙහි තරු වසා වලා කුළු ඉඳුවන පවනක් සේ, අනුන්ගේ ගුණ වසා නො ගුණ නො ලූ හැ. පිරිමැසූ නෙතැත්තවූ මැරූ ද යෙහෙන් නිදන මතැතක්හු සේ, තමනට දුක් ගත්තවුන් මරා සුව නො වින්ද හැ. 'මේ දස් කම කොටැ ලා අද මා ගේ දරිද්‍රය හැරැ ගනිමි'යි ආ තැනැත්තවූ හඬව හඬවා ගෙට නො යවන්නා හැ. අතු කපා මොර කන්නා සේ ලෝ වැස්සා නසා ප්‍රයෝජන නො ගන්නා හැ. ශුඩ කරන පිණිසැ මල සිඳෙන පමණක් රත් රත් දවන්නා සේ, සත්ත්වයා ගේ අශේෂ පමණක් මැ සන්තාප කරන්නා හැ. මුහුද වඩ දිය

නැති විටැ මැ කළපුයෙහි දිය නැති වන්නා සේ, සත්ත්වයා හට සුව නැති දු මැ තමන් සිතැ සුව නැති කළ හැ. ගැලෙ යෙහෙන් තබා, තමා බිමැ පෙරළී දුක් ගන්නා ගැල් සක සේ, සත්ත්වයා යෙහෙන් සිටුවා තුමූ දුක් ගත් හැ. ෂඞ්වේන්ද්‍රියයන් වෙත වෙත ගන්නා වූ ආලම්බනයෙහි රස විඳුනා වූ සිතක් සේ, සත්ත්වයන් වෙත වෙත ලද්දු වූ සම්පත්තියෙන් තුමූ සුව වූන් හැ. දුත්තෙහි දූඩි කැමිත් ශරය දුරු හෙන්නා සේ තමන් ගේ දූඩි කැමිත් සත්ත්වයන් දුරු නො කළ හැ. වෘක්ෂයෙහි මූලය ස්ථිර වැ පිහිටි පිහිටි සේ ගසැ අග සලෙළ වන්නා සේ, සත්ත්වයා ස්ථිර වැ පිහිටි පිහිටි සේ තුමූ සලෙළ වූ හැ. නුවර රක්ෂාවට පවුර ස්ථිර කරන්නා සේ, ලොවට රක්ෂා පිණිසැ තමන් ස්ථිර කළ හැ. ඇතු සොඬින් ඉකැ වූ පැන් මුඛය අනුභව කරන්නා සේ, තමන් සඤ්චය කළ ධනය ලෝ වැස්සන් ලවා අනුභව කැරූ වූ හැ. මල් නො ගෙනැ පල දෙන්නා වූ දිඹුල් රුක් සේ, කාරණ නිරපේක්ෂ වැ මැ ලෝ වැස්සනට සුව දෙන්නාහු යැ. වෙහෙල්ල තෙමා ගෙනැ බස්නා ජල ප්‍රවාහය සේ, අනාථයන් තෙමා කරුණා වතුරු පැවැත් වූ හැ. අශුචි භූමියත් පියුම් වනයත් නො හැරූ හමන්නා වූ පවන් සේ, රජ පුත්‍රයන් කෙරෙහි දු චණ්ඩාලයන් කෙරෙහි දු සම වැ සිත් පැවැත් වූ හ. දවස් පතා උදය රේඛාව නො හැරූ නැඟෙන හිරු සේ, තමන් ගේ ධර්ම රේඛාව නො හැරූ පැවැත්තා හැ. හිරු රැසින් වන්නා වූ තැවුලියට වඩා ප්‍රයෝජන මැ බොහෝ වන්නා සේ, තමන් ගේ ආඥයෙන් කරන සන්තාපයට වඩා ප්‍රයෝජන මැ බොහෝ කළ හැ. විකාරයට මැ වඳුරන් වඩන්නා සේ, චපලයන් චපල කමට මැ රක්ෂා කළ හැ. පැන් පිරුණු කළය නො සොල්වා තබන්නා සේ, ගුණෙන් පිරුණු ධීරයන් නො සොල්වා මැ රක්ෂා කළ හැ. මෙ සේ හෙයින් අප ගේ ස්වාමීන් ගේ කිසි දෝෂයෙක් නැතැ’යි කියා නිශ්චය කොටැ ගොස්, ‘ස්වාමීනි! අපි හැම කැටි වැ පරීක්ෂා කරනමෝ, මේ සා මහත් විපත්තියට කාරණ වූ කිසි දෝෂයක් නුදුටුම හැ’යි කියා දන්වූ හැ.

ඉක්බිති, රජ්ජුරුවෝ ඒ උපද්‍රවයන් සන්හිඳුවන පිණිසැ නොයෙක් බලි කර්ම යැ, දේවතාරාධනා යැ යන විධි කොටැ ද, ඒ උපද්‍රවයන් සන්හිඳුවාගත නුහුණ හැ. ඉක්බිති සමහර කෙනෙක් කිරි පිරුණු බුරුලු තිබියැ දී හඟ ගෙනැ කිරි දෙනා සේ, කරුණායෙන් පිරුණු සර්වඥයන් වහන්සේ වැඩැ හින්දැ දී, උන් වහන්සේ ගේ නම නො කියා '**කාකුද කාත්‍යායන**' නම් එක් සර්වඥ කෙනෙක් ඇතැ. ඔවුන් අව හොත්, මේ උපද්‍රව සන්හිඳෙයි, කී හැ. සමහර කෙනෙක් ඔවුන් වළකා, අඳුරු නිසා පහන් අවුළුවන්නට තෙල් ගන්නා පිණිසැ වැලි මලු තෙලියන්හි ලූවා සේ, 'මේ උපද්‍රව සන්හිඳුවන පිණිසැ **අජිත කේසකම්බලී** මෙයට ගෙන්වුව හොත් යහපතැ'යි කී හැ. එ සේ කියන්නවුන් වළකා සමහර කෙනෙක් වසන් කෙළියට සාවුන් හං පෙර මඟ බලා හිඳිනා සේ, '**මක්ඛලිගෝසාල** නම් බුදුන් මෙයට වැඩිය හොත්, මේ උපද්‍රව සන්හිඳෙයි' කීහ එ සේ කියන්නවුන් වළකා සමහර කෙනෙක් හැල් බත් පතා හකුරු වපුරන්නා සේ, '**නිගණ්ඨනාථපුත්‍ර** නම් සර්වඥ කෙනෙක් ඇතැ. උන් මෙයට ගෙනාව හොත්, මේ උපද්‍රව සන්හිඳෙයි' කී හැ. ඔවුනුදු වළකා සමහර කෙනෙක් ගිතෙල් පිණිසැ ඔටු කිරි අලළන්නා සේ, **සඤ්ජය බෙලට්ඨිපුත්‍ර** නම් සර්වඥ කෙනෙක් ඇතැ. ඒ බුදුන් මෙයට ගෙනාවොත්, මේ උපද්‍රව සන්හිඳෙයි' කී හැ. ඔවුනුදු වළකා වියතුන් හඳුනන සමහර කෙනෙක් මල් ගන්නා පිණිසැ අහසට පැන් දමා ලූවා සේ '**පූරණකාශ්‍යප** නම් එක් සර්වඥ කෙනෙක් ඇතැ. උන් මෙයට ගෙනාව හොත්, මේ උපද්‍රව සන්හිඳෙයි' කී හැ.

මෙසේ අඥනයන් කැටි වැ තමන් තමන් ගේ මත කියා කියා නිමැ වූ කල්හි, එ වැනි භයක් සන්හුන මනා කල්හි, කෙළ ලක්ෂයක් සක්වළැ ආඥ පවත්නා වූ එකි එකී ගාථායෙන් යුක්ත වූ අද දක්වා සිහි කළ සියලු සත්ත්වයන්ගේ සියලු භය සන්හිඳුවන්නා වූ රතනසූත්‍රයක් වැනි ධර්මරත්නයක් ලොවැ පහළ වුව මනා කල්හි, පස් වා දහසක් මුළුල්ලෙහි

සියලු සත්ත්වයනට සියලු උපද්‍රව දුරු කරන ධර්ම නැමැති ඖෂධ මහා වෘක්ෂයක් ලොවැ මුල් බට මනා කල්හි, ශක්‍ර බ්‍රහ්මාදි දේවතාවන් ගේ පා බිම්හි දු පහළ මනා කල්හි, සුවාසු දහසක් ප්‍රාණීන් එක හෙළා අමාමහ නිවන් දුට මනා කල්හි, එ තන්හි හුන් පිරිසින් සමහර කෙනෙක් නැඟී, 'මහ රජ, මොවුන් හැම දුන්වූයේ "අපට මෙ යේ වූ තුන් උපද්‍රවය මඳ යැ" යි කියා නැවතැ මෙ කී සඳෙනා විසින් මේ මත්තෙහි උපද්‍රව ගණනක් වඩනා පිණිස යැ. ඉදින් ඉඳුරු මැ මේ උපද්‍රවයන් සන්හිඳුවනු කැමැත හොත්, අප කියන්නකුදු ඇසුව මැනවැ යි ගිම් නිවා බන්නා ආකාශ ගඞ්ගා ප්‍රවාහයක් සේ, සියලු සත්ත්වයන්ගේ සන්තාප නිවන්නා වූ සද්ධර්ම නමැති ගඞ්ගා ප්‍රවාහයට උඩු ගං වැ සිටියා වූ එක් වියතාණ කෙනෙක් ඇතැ. මේ උප-ද්‍රවය සන්හිඳුවනු පිණිස ඔවුන් ගෙන් වුව මැනැවැ'යි කී හැ. නැවැතැ කියන්නෝ, 'මහ රජ, මෙ කී සඳෙනා බුදු බවට උහුළු ගන්වන්නා වූ නිවටුන් බව මුත්, තුමූ බුදු නො වෙති. අප දන්වන සවාමිදරුවාණෝ වූ කලී වොටුන්හෙහි නිමාම් වැ සිටියා වූ අග්‍ර මාණික්‍යයක් සේ ශාක්‍ය කුලයට මුදුන් පත් වැ සිටියා හැ. තමන් පිළිසිඳැ ගත් මඟුලෙහි සියලු ප්‍රේත ලෝකය ආලකමඬු නම් දිව්‍ය රාජධානිය සේ සා පිපාසා දුක් නැති කොටැ සවසථ කළ හැ. දුකින් අතුරු නැත්තා වූ අට මහ නරකය විත්ත ප්‍රබය පුරා වූ අට මහ නිධානයක් සේ, සුවයෙන් නිරන්තර කළ හැ. නරකයෙහි සත්ත්වයන් මුවෙහි ලා වූ, ය වට අමා වට කළ හැ. ඝෝර වූ අසිපත්‍ර වනය නන්දන වනය කළ හැ. සොළොසඟුල් කටු ඇති හිඹුල් රුක් නරකය සත්ත්වයනට කප් රුක් කළ හැ. කපක් මුළුල්ලෙහි තැපී ගියා වූ ලොහො දියෙන් පිරුණු වෙතරණී ගඞ්නාව පස් වනක් පියුමින් ගැවසී ගත්තා වූ ආකාශ ගඞ්ගාව කළ හැ. ලොහො දියෙන් පිරුණු ලොහො කුඹු නරකය අභිමතාර් සාධන්නා වූ භද්‍රකුම්භ කළ හැ. නව යොදුන් බොල ය කබල පලා ගෙනැ පිටනැ සියක් යොදුන් තන්හි පවත්නා වූ, සුවාසු දහසක් යොදුන්

තන්හි පවත්නා වූ සුවාසූ දහසක් යොදුන් ගැඹුරැ මහා සමුද්‍ර ජලය එක පැහැර නමා කර නමා ලුව හොත්, දුරු දී මැ පිති බිඳක් සේ වියළුවා පියන්නට සමර්ථ වූ, මහා ගින්නෙහි ආදි කල්පයෙහි පටන් නැවී පියා තුබූ යකබල සියක් දවස් දියෙහි ලා සහා ගන්නා වූ යපල්ලක් සේ සිහිල් කළ හැ. අවීචි මහා නරකයෙහි දණ පමණ වතුරැ යන පරිද්දෙන් සත්ත්වයන් සතහා වැසි වැස්වූ හැ. සියක් යොදුන් සිටැ කර දික් කළමුත් අතුණු බහන් පිටැත් වැ යන පරිද්දෙන් ඉතා පිළිකුල් වූ දුගීන්ධ ඇති අසූචි මහ නරකය, අඩක් පිපී, මුව රඳින් පිරී සිපි පරසතු මදුරු මල් ගබක් සේ ඒක සුගන්ධ කළ හැ. තුන් ගවු පමණ සත්ත්වයා ගේ සම් හා මස් හා නහර හා ඇට විදූ ඇට මිදුලු කන්නා වූ ගිජු ලිහිණියන්ගේ භයඞ්කර වූ නාද පුරවි කෙවිල්ලන් ගේ හඬ සේ මිහිරි කළ හැ. යකබලින් පිටනැ සියක් යොදුනෙහි සිටැ බැලූමන් ඇස් පිපිරු පලා යන තරම් රළු වූ අවීචි මහ නරකයෙහි ගිනි සිළු මැදට වන්නා වූ සත්ත්වයන් රක්තෝත්පල ගර්භයට වන් මත් බමරුන් සේ සැනසූ හැ. සත්ත්වයන් සුනු කරන පිණිසැ සංඝාත මහානරකයෙහි නැංගා වූ, නැගී මුදුන්හි හෙත්නා-වූ ලෝදිය ධාරා ඇති මහා පර්වත, හිසින් එන්නා වූ ගඟුල් හැලි ඇති ක්‍රීඩා පර්වත සේ සිත්කලු කළ හැ. තපස් මුළුල්ලෙහි ආලෝකයෙක්හි රස නො දන්නා වූ ලෝ ඇඳිරි මහ නරකයෙහි අන්ධකාර විජයයට දස දහසක් සක්වළැ හිර සඳ එක විටැ වැදූ කියා සේ, එක විටැ මැ මහා ආලෝක පැවැත් වූ හැ. එ මැ ලෝකාන්තර නරකයෙහි චක්‍රවාට පර්වත පාර්ශ්වයෙන් ගිලිහී ලෝක සන්ධාරක උදකයෙහි හී පෙණ කඳු පිරි යන සත්ත්වයන්, සත් රුවන් අතලෙහි සිටැ නන්දා පුෂ්කරිණියට පැනැ ඇනැහෙන කුසි පුරයෙහි දෙවියන් සේ කළ හැ නව දෙරින් වැදූ සිඳලු ශරීරය පුටපාක-යක් සේ තවන හළුවෙන් ගැවැසී ගන්නා වූ කුක්කුලනරක-යෙහි පැසෙන සතුන්, ආකාශ ගඞ්ගාවෙහි ජල ධාරනීනා ඇනැ ගස්ව ගස්වා වෙරළැ වැලි තෙලෙහි හෙවැ නිදන්නා වූ

රාජහංසයන් සේ මිහිරි නිඳි නිඳැ වූ හැ. නයින් හා ගුරුළුන් යහළු කම් ගැත්වූ හැ. බළලුන් හා මීයන් එක කෙළි මඬුලෙහි කෙළි රස දතැ වූ හැ. ඇතුන් ගේ පොකුරගින් ඉස්නා ජලකර්ණිකායෙන් සිංහයන් ඇඟැ විඩා දුරු කළ හැ. සිංහ ධෙනුන් ගේ තනයෙහි කිරියෙන් ඇත් පොවුවන් පෙවූ හැ. ඇතින්නන් ගේ කිරි සිංහ පෝතකයන් පෙවූ හැ. නයින් ගේ පෙණ ගබ් තමැති සේ සත් යටැ මඬුවන් සතපා හිවූ හැ. ස්නේහයෙන් අසුන් හා මීවුන් හා ඔවුනොවුන් ඇඟ ලෙවැවූ හැ. මුවන් ගේ අඟින් දිවියන් ගේ කර කැස්වූ හැ. කවුඩන් හා බකමූණන් හා බොහෝ කලෙකින් ප්‍රේමයෙන් ඔවුනොවුන් මුහුණ බැලැවූ හැ. සියලු සතුන් ගේ ශරීරයෙහි ඇති වූ අසාධ්‍ය වූ ව්‍යාධියනට තමන් උපන් මඟුලින් මැ පිළියම් කළ හැ. තමන් සියලු සංසාරයෙහි වක් හරනට පූර්වනිමිත්ත පාතා සේ, කුදුන්ගේ වක්‍ර වූ ශරීරයෙහි හැද මරා ඉදි කළ හැ. සියලු සත්ත්වලෝකයාට දිව ඇස් දෙන බවට පූර්වනිමිත්ත පාතා සේ, ජාත්‍යන්ධයනට ඇස් දුන් හැ. එ සේ මැ සියලු සත්ත්වයනට දිව කන් දෙන්නට පූර්වනිමිත්ත පාතා සේ, බිහිරනට කන් දුන් හැ. සියලු සත්ත්වයනට සතර ඍද්ධිපාද දෙන්නට පූර්වනිමිත්ත පාතා සේ, පිළුනට පා දුන් හැ. ධර්මයට ගොළු වූ සියලු සත්ත්වයන් ලවා සුවාසූ දහසක් ධර්ම ස්කන්ධය හදාරවන්නට පූර්වනිමිත්ත පාතා සේ, ගොළුවනට බස් දුන් හැ. එක් ලක්ෂ අට සැට දහසක් යොදුන් මහ මෙර තමන් පිළිසිඳැගත් කිඹුල්වත් පුරය දිශාවට වැඳුම් ගන්වා පූ හැ. සප්තකුල පර්වතයන් ලවා සේලනිඟා කෙළවා පූ හැ. වෙසතුරු අත් බව්හි සත් ඉඩක් හඩා විඩා වැ ගියා සේ මියෙන් නො බැණැ හොත්තා වූ මහ පොළොව, මනැනක්හු මැඩැ ලූ හුණ පඳුරක් සේ, දිය පොළොවෙහි පවත් නෙනැ එක පැහැර ගුගුරුවා පූ හැ. එක පැහැර ලුණු කර වූ මහා සාගර ජලය ශක්කර බහා ලා කකාරා ගත් කිරි ඇතිළියක් සේ මිහිරි කළ හැ. පස් වනක් පියුම් පිපුණා වූ පර්වත භිත්ති හා සඳන් දහ තළා හා වාද කැරැ වූ හැ. මල්හි රස නො දන්නා වූ

දිඹුලෙහි පිපි මල් පරසතු මඳුරු මල් හා එක් කොටැ දෙඹියන් මුදුනෙහි පැලැඳැවූ හැ. වැසි නැති වැ මැ පොළොව බිඳැ ගෙනැ නැගෙන තාඹ තල් කඳ සා ජල ධාරායෙන් සියලු ලොවට ශාන්ති ජලය දුන් හැ. බඹ ලොව හා දෙව් ලොව හා මිනිස් ලොව හා යන තුන් තන්හි මැ සම්පත්තියෙන් වෙනසක් නො කළ හැ. තමන් ගබ් ගත් මඟුලෙහි මැ සියලු සත්ත්වයන් නිවන් සුවයට ගබ් ගැන් වූ හැ. දස දහසක් සක්වළැ සඳ මඬුලු හා හිරු මඬුලු තමන් ගේ මඟුලට නැගු ජේසත් සේ කිඹුල්වත් පුරයෙහි තමන් ගෙදෙර ආකාශ-යෙහි රැඳැවූ හැ. තමන් මතු වස්වත්නා වූ ධර්මාමෘතවර්ෂාවට පූර්වනිමිත්ත පානා සේ, මුළු සක්වළැ පොකුරු වැසි වැස්වූ හැ. ගුණෙන් සිස් වූ සසර තමන් ගේ කරුණායෙන් පිහිට ලබන්නා සේ, නිරාලම්බ වූ ආකාශයෙහි මල් වියන් බැඳැවූ හැ. කසුබු සම්මා සම්බුදුන් වහන්සේ පිරිනිවි තැන් පටන් ගෙනැ නො පිඹැ තුබූ විජයෝත්තර ශඞ්ඛය, ශක්‍රයා ලවා තමන්ගේ ගෙදෙර පිඹැවූ හැ. හෙළ කුඹ ගත් මහ බඹු තමන් ගේ රාජාඞ්ගණයෙහි ඔකඳ කෙළි කෙළැවූ හැ. දෙවියකු වැදැ ගෙනැ හොත, ඕ හට තුන් කෙළ සැට ලක්‍ෂයක් හවුරුද්දට ආයු දී ලති. මිනිසකු වැදැ ගෙනැ හොත, එක් සිය විසි හවුරුද්දට ආයු දී ලති. මුහුණ බලා සතුටු වැ හුන් බඹමුහුණන් ගේ ප්‍රසාදයට පසේ බුදුන් අග කෙරෙති. තමන් ගේ සවුවන් ලවා අවීචි මහා නරකයෙහි ගිනි නිවා වැසි වස්වා වතුර නෙළවති. දීපංකර පාද මූලයෙහි අත්පත් නිවන් හැරැ, අපට ශාන්ති පිණිසැ සංසාර රාක්‍ෂසයා කටැ හුණ හැ. දූන් බෝ මැඬැ වැඩැ හිඳැ සවාසන සර්ව ක්ලේශයන් නසා බුදු වැ නිරුපධිශේෂ නිර්වාණධාතුයෙන් පිරිනිවන් පානා පැ, දෙ තිස් කුණප කොටසින් යුක්ත වූ පඤ්චස්කන්ධ-භාරය දෙ තිස් මහා පුරුෂ ලක්‍ෂණයෙන් සාධා පිළිකුල් පැවි කොටැ ගෙනැ, එ බර උසුලා, ගම් නියම් ගම් රාජධානියෙහි ඇවිද සත්ත්වයනට වැඩ කරන්නා හැ. තමන් වසන විහාරය දිශාවට නැගූ පය නැවැතැ සතර අපාය දිශාවට නැගී යා නො දෙන්නා හැ. තමන් දිශාවට නැගු අඩ නැවැතැ අනුන්

දිශාවට නැගියැ නො දෙත්තා හැ. තමත් ගේ විහාරයෙහි තණ ගැටක් නෙළා පියන්නට දික් කළ අත නැවැතැ අනුන් දිශාවට සිහන පිණිසැ දික් කට නො දෙත්තා හැ. තමන්ගේ ශ්‍රීපාදයට නැමූ හිස නැවැතැ අනිකක්හු ගේ පාද මූලයට නැමියැ නො දෙත්තා හැ. තමත් දිශාමට නැමූ සිත නිවන් රස පුරා දෙත්තා හැ. තමත් බලා සතුටු කඳුළු ගත් ඇසට දුකින් වන කඳුළක් වැද්දැ නො දෙත්තා හැ. තමත් ගේ ගුණයට සාධුකාර ගත්තවුන් ගේ තුඬට කිසි ශෝක විලාපයක් වැද්දැ නො දෙත්තා හැ. තමත් ගේ බස් ඇසූ කනට 'අනුව, බඳුව, ගනුව, මරව' යනාදි බස් වැද්දැ නො දෙත්තට තුමූ මැ එහි රකවල් ගත්තා හැ. තමන් ගේ ගුණ සිහි කිරීමෙත් ලොමුදහ ගත් ශරීරය සසර පමණින් හයින් ලොමුදහ ගත නො දෙත්තා හැ. මර හට වඩා බලවත් හැ. සසරට වඩා මහත් හැ. පසේ බුදුනුදු නො වියත් කළ වියත් හැ. මේ ආදි වූ අනන්ත ගුණයෙන් සම්පූර්ණ වූ ශාක්‍යසිංහ වූ දශබලධර වූ අනාවරණඥාන ඇති චතුවෛශාරද්‍ය විශාරද වූ, අවීචියෙහි පටන් ගෙනැ භවාග්‍රය දක්වා භවාග්‍රයෙහි පටන් ගෙනැ අවීචිය දක්වා, සියලු ලෝවැස්සන් ගත්තා වූ **'ඉති පි සෝ භගවා අරහං සම්මාසම්බුද්ධෝ විජ්ජාචරණසම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ පුරිසධම්මසාරථි සත්ථා දේවමනුස්සානං බුද්ධෝ භගවාති. සෝ ඉමං ලෝකං සදේවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදේවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවේදේති. සෝ ධම්මං දේසේති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියෝසානකල්‍යාණං සාත්ථං සව්‍යඤ්ජනං කේවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසේති. සාධු බෝ පන තථා රූපානං අරහතං දස්සනං හෝති'** යන කීර්ති ඝෝෂයෙන් දශ දිග්භාගය ඒකකෝලාහල කැරුවූ හැ. කරුණායෙන් ලෝකෝත්තර වූ ප්‍රඥායෙන් අසාධාරණ වූ මෛත්‍රීයට කුලදේවතා වූ ස්වාමි දරුවාණ කෙනෙක් ලෝකයෙහි ඉපිදූ වදාළ සේකැ. ඒ ස්වාමිදරුවාණන් ගේ ශ්‍රී පාදය මෙ නුවරට දික් කළ හොත්

ඒ ශ්‍රී පාදය පිළිගන්නට තැඟෙන්නා වූ ආශ්චර්‍ය්‍යපද්මයෙහි සුගන්ධයෙන් මැ මේ කුණප ගන්ධ නාක් පැටි වැ යන්නේ යැ. ඒ සවාමිදරුවාණන් ගේ හිසට කුඩ ගෙනැ ආ මහා බ්‍රහ්මයෝ යැ, සක් පිඹැ ගෙනැ ආ ශක්‍රයෝ යැ යන මහේශාඛ්‍ය දේවතාවන් ගේ සන්නිපාතයෙන් මේ මනුෂ්‍ය මාංස භක්ෂණය කරන්නා වූ භූත පිශාචයෝ තුමූ මැ තම හට ප්‍රලය වන්නා හැ. උන් පිරිවරා ආ වැසි වලා දෙවියෝ මැ ශතපටල සහස්‍රපටලයෙන් මහා වැසි වස්වා, මේ මුළු නුවර සෝධා ශුද්ධ කරන්නාහු යැ. එ සේ හෙයින් ඒ ධර්‍මචක්‍රවර්ති ස්වාමීන් වහන්සේ මැ අප ගේ දුක් නිවන පිණිසැ මෙයට වඩා එන්නා කැමැත්තම්හ' යි දැන්වූ හැ.

එ සේ කියන්නවුන් ගේ බස් හැම දෙන මැ 'යහපතැ'යි ගිවිසැ, දූත් ඒ සවාමිදරුවාණන් වහන්සේ කොයි වැඩවසන සේක් දැ?' යි විචාළ හැ.

එසමයයෙහි සම්‍යක් සම්බුඩයන් වහන්සේ වස් එළැඹෙන කාලය ආසන්න වූ හෙයින්, තමන් වහන්සේ ගේ ප්‍රථම දර්ශනයෙහි මැ ධර්මදේශනා අසා එක් ලක්ෂ දස දහසක් බ්‍රාහ්මණ ගෘහපතීන් හා සමඟ අමා මඟ නිවන් දුටු බිම්බිසාර රජ්ජුරුවනට ප්‍රතිඥ දී, රජගහා නුවර නිසා වේළුවන මහා විහාරයෙහි වැඩැ වසන සේකැ. එ පවත් ඇසූ විශාලා මහ නුවරැ වසන්නා වූ ලිච්ඡවි රජදරුවෝ, බිම්සර රජ-වරුන් හා සමඟ බණ අසා සෝවාන් වූ මහාලි නම් ලිච්ඡවි කෙනකුන් හා පුරෝහිතයන් ගේ පුතණුවන් හා කැඳවා, තෙපි බොහෝ පඬුරු සරහා ගෙනැ රජගහා නුවරට ගොස් පඬුරු පැ දී ලා, අප ගේ රාජ්‍යයට වූ තුන් උපද්‍රවයන් කියා ලා, සර්‍වඥයන් වහන්සේ වැඩියැ හොත් මූත් ඒ තො සන්සිඳෙන බව කියා, රජ්ජුරුවන් ගිවිස්වා ගෙනැ, සර්‍වඥයන් වහන්සේ වඩා එව' යි යැවූ යැ. ඔහු ඒ පඬුරු ගෙනැ ක්‍රමයෙන් ගොස් රජගහා නුවරට වැදැ, රජ්ජුරුවන් දැකැ, ගෙනැ ගිය පඬුරු දී, එ පවත් දන්වා, සර්‍වඥයන් වහන්සේ අප ගේ නුවරට වඩනා පිණිසැ ආරාධනා කළ මැනැවැ' යි දැන්වූ හැ.

පෙර මේ සර්‍වඥයන් වහන්සේ බෝධිසත්ත්‍ව භූමියෙහි සිටි කලැ පවා ජම්බුද්වීපයෙහි එක් සියක් රජ දරුවෝ ඔවුන්ගේ ධර්‍ම දේශනායෙහි පෙළැඹී, පූර්‍ණක නම් යක්‍ෂ සේනාධිපතිහු ඔවුන් හැර ගෙනැ ගිය කල්හි, ඔවුන් ගේ විරහය ක්‍ෂමා කොටැ ගත නො හී, 'සත් දවසක් ඇතුළතැ අප ගේ පණ්ඩිතයන් නුදුටුමෝ නම්, ගිනි වැද මියම් හැ' යි සැරසුණා හැ. බෝධිසත්ත්‍ව භූමියෙහි විධුර පණ්ඩිත වැ සිටියා වූ ස්වාමිදරුවාණන්ගේ ධර්‍මයෙහි රස දත් පෘථග්ජන රජදරුවන් පවා, ඔවුන් ගේ විරහය ක්‍ෂමා කොටැ ගත නො හී, ගිනි වදුම් හැ යි කියන කලැ, දුන් සවාසන සකල-ක්ලේශයන් නසා බුදු වූ ස්වාමි දරුවාණන් ගේ ධර්‍මදේශනා අමා මහ නිවන්හි රස දත්තා වූ මේ රජ්ජුරුවෝ තමන් ගේ නුවරින් සර්‍වඥයන් වහන්සේ වඩා යන්නට අනුදනිති යනු කවර නම් බසෙක් ද? එ සේ හෙයින් 'තොපට නුගුණෙකැ'යි කියා තුමූ එ බස් නො අනුදත් හැ.

ඉක්බිති එ බස් ඇසූ මහාලි ලිච්ඡවි රජ්ජුරුවෝ බිම්සර රජ්ජුරුවන් උපේක්‍ෂක වූ බව දැනැ, මේ රජ්ජුරුවන් නො අනුදත් හෙයින් 'කිම් ද? පරදුඃඛයෙහි කම්පා ඇත්තෝ සර්‍වඥයන් වහන්සේ මුත් නැත්තෝ වෙත් දැ' යි සිතා වැඩැහුන්නා වූ වේළුවන විහාරයට ගොස් ශ්‍රීපාදය වැඳැ සිටි කල්හි, සර්‍වඥයන් වහන්සේ ආගන්තුකයනට සුදුසු මධුර කථා කොටැ වදරා, ආ කම් කිම් දැ' යි විචාරා වදළ කල්හි, 'ස්වාමීනි, විශාලා මහ නුවර දුර්භික්‍ෂ භය යැ, යක්‍ෂ භය යැ, රෝග භය යැ යි තුන් භයෙක් ඇති වී යැ. ඒ භයින් පීඩිත වූ විශාලා මහ නුවර ලිච්ඡවී රජදරුවන් ප්‍රධාන කොටැ ඇත්තා වූ සියලු පර්‍ෂද, "මේ උපද්‍රව කෙ සේ ඝත්හිදුවමෝ දැ" යි මන්ත්‍රණය කොටැ නො එක් පරිද්දෙන් ප්‍රතිකාර කොටැ නො සන්සිඳෙන හෙයින් මෙ කී තුන් භයට ස්වාමීන් ඇතුළු වූ තුනුරුවන් සරණ කොටැ දුට හැ. එ හෙයින් පරාර්‍ථය පිණිසැ සන්නද්ධ වූ ස්වාමි දරුවාණන් කරුණායෙන් වැඩැ වදරන් කලැ'යි දැන්වූ හැ.

ඉක්බිති සර්වඥයන් වහන්සේ ඔවුන්ගේ බස් අසා 'මා ඔබ ගිය කල්හි කෙ සේ වූ අර්ථ සිද්ධියෙක් වේ දෙහෝ' යි පරීක්ෂා කොටැ වදාරන සේක්, 'මා විශාලා මහ නුවරට ගොස් රත්න සූත්‍රය දෙසූ කල්හි, ඒ රත්න සූත්‍රයෙහි එකි එකී ගාථායෙන් වන්නා වූ ආරක්ෂාව කෙළ ලක්ෂයක් සක්වළැ පැතිරැ සිටුනේ යැ. ඒ සූත්‍රය දේශනා කොටැ අන්තයෙහි සුවාසූ දහසක් ප්‍රාණීනට අමෘත මහා නිර්වාණය සිද්ධ වන්නේ යැ, ඒ තුන් භය සන්සිඳෙන්නේ යැ' යි දැකැ වදාරා, ඔවුන් ආරාධනා කළ ගමන අනුදැනැ වදාළ සේකැ. එක සත්ත්වය-කුට වත් වන ඉෂ්ට තකා දික් කළ අතක් වක් නො කරන තුරු ගොස් බඹ ලොවැ පැනී යන්නා වූ මහා පුරුෂයාණන් වහන්සේ, දැන් මෙ තෙක් සත්ත්වයනට වන ඉෂ්ට තකා එයට වැඩම අනුදනිති යනු කවර ආශ්චර්යයෙක් ද?

ඉක්බිති බිම්සර රජ්ජුරුවෝ සර්වඥයන් වහන්සේ ආරාධනාව ඉවසා වදාළ බව අසා, සර්වඥයන් වහන්සේ කරා ගොස්, 'ස්වාමීනි, විශාලාවට වැඩම අනුදැනැ වදාළේ ඇද් දැ යි' විචාරා, 'එසේ යැ මහරජ,' යී වදාළ කල්හි 'ස්වාමීනි, එ සේ වුව හොත්, මා වඩනා මඟ සරහා ලන තුරු හැම්මී වදාළ යහපතැ' යි දන්වා, රජගහා නුවර හා ගංගාව හා දෙ මැදැ පස් යොදුනක් පමණ මඟ එක පැහැරැ සම කරවා, යොදු-නෙහි යොදුනෙහි විහාර කරවා, 'ස්වාමීනි, ඉතිඹ වඩනා කලැ' යි දැන්වූ හැ.

ඉක්බිති සර්වඥයන් වහන්සේ ස්වාර්ථයෙහි කළ නිරපේක්ෂ-තායෙන් පරාර්ථයෙහි කළ අභිලාෂයෙන්, පරදුඃඛයෙහි කළ අනුකම්පායෙන්, පුරුදු වැ ආ ධාර්මිකත්වයෙන්, 'මෙ තැන්හි සතර පස නුව ගේ ලැබෙති' යි සිතා, එක් තැනෙක්හි නො කළ ආශායෙන්, හුදු සත්ත්වයනට මැ වැඩ පිණිසැ මැ පවත්නා වූ කායවාඞ්මනඃප්‍රයෝගයෙන්, 'විශාලා මහ නුවරැ දුඃඛිත වූ සත්ත්වයන් ගේ සතුටු මුහුණක් බලා පුව' යන මන දෙළින් පන්සියයක් භික්ෂූන් වහන්සේ පිරිවරා මඟට පිළිපන් සේකැ.

ඉක්බිති රජ්ජුරුවෝ, ඒ ඒ විහාර අතුරෙහි සම්බුදුයන් වහන්සේ වඩනා පස් යොදනක් පමණ මහෙහි පය ඔබා ලූ කලැ දණ දක්වා එරී යන පමණින් පස් වනක් පියුමින් ගෙබියා වූ නො එක් ජාතියෙහි සුවඳ මල් ඉස්වා, ධවජ, පතාක, කෙහෙල් තොරණ යැ, පුණ් කලස යැ ගනාදීන් මහ සඳ බුදුන් වහන්සේට සේ සත් මත්තෙහි සේ සත් බැගින් දෙ සේ සතක් ධරා, එකි එකී භික්‍ෂූන් වහන්සේට එකි එකී ශ්වේතච්ඡත්‍ර බැගින් ලවා, ගඳ දුම් මල් පහන් ආදීන් පූජා-කරන්නාහු, දවසින් දවසැ එකි එකී විහාරයෙහි වස්වා, පන්සීයක් පරිවාරයෙන් යුක්ත වූ සවාමීනට දවස් පතා මහ දන් දී පස් දවසෙකින් ගංතෙරට වඩා ගොස්, එ තැන්හි සිටැ වඩනට සුදුසු වූ හොරු හගුළු ඉදි කරන්නාහු, 'සවාමි-දරුවෝ තමන් කෙරෙහි කළ කරුණායෙන් ගංතෙර දක්වා වැඩි සේකැ. මේ මාගේ ආඥා පවත්නා තැන්හි මා ශක්ති පමණින් පූජා කොටැ වඩා ආමි. ඉතිබ්බේ තමනුත් වඩනා මහැ කළමනා කටයුතු කොටැ සුදුසු පූජාසත්කාර ගෙනැ අවුත් තමන් ගේ නුවරට සවාමිදරුවාණන් වහන්සේ වඩා ගොස් අභිමතාර්ථය සැධුව මැනැවැ'යි හසුන් දූන් හැ.

ඒ අසා විශාලා මහ නුවරැ ඇත්තෝ 'අප ගේ උපද්‍රව දුරු කරන්නට වඩනා සවාමිදරුවන්ට කරන පූජා අපට මැ අවශ්‍ය බව මුත්, තමනට කවර අවශ්‍යයෙක් දැ? අප වුත් දුක් වූ නියාවට ද, එයට සුදුසු වූ වහලක් කවර ද ලබමෝ ද්දෝ හෝ යි අප ගත් සිතිවිලි වූ නියාවට ද, 'සම්බුදුයන් වහන්සේ වැඩි සේකැ' යන බස අසා අපට වූ සතුටු නියාවට ද සුදුසු කොටැ අප ශක්ති පමණින් පූජා කෙරෙම් හැ'යි විශාලා මහ නුවර හා ගඞ්ගාව හා දෙ මැදැ තුන් යොදනක් පමණ බිම එක පැහැරැ සම කොටැ, සම්බුදුයන් වහන්සේට කුඩ මත්තෙහි කුඩ සතරක් හා, සෙසු පරිවාර භික්‍ෂූන් වහන්සේ කෙරෙන් එකි එකී වහන්සේ කෙනකුන් දැට කුඩ මත්තෙහි කුඩ දෙක බැගින් මෙ සේ පූජා සරහා ගෙනැ, දවසක් මුළුල්ලෙහි සයින් සිටි වස්සා දුරැ එන මව් දෙන අභිමුඛයට යුහු වැ දිවෙන්නා සේ ද, මී වදයෙක්හි ඉව ඇසූ බමරුන්

එ තැනට වේගයෙන් ඔවුනොවුන් පරයා දිවැ ගන්නා සේ ද, සම්යෙන් සන්තප්ත වූ හසතීන් ප්‍රසන්න වූ මධුර වූ අති ශීතල වූ ජලය ඇති, වන විලට මධ්‍යාහ්න සමයයෙහි දිවැ ගන්නා සේ ද, පිපාසිත වූ වැසි ලිහිණියන් මේඝ නාදය අසා මේඝ කූටයට උන්මුඛ වැ දිවැ ගන්නා සේ ද, මස් ගැසූ තෙතට එක හෙළා දිවැ ගත් මහා මස් කැලක් සේ ද, පද්මයෙහි සුගන්ධය අසා පියුම් විලට දිවැ ගන්නා වූ රාජ හංස කැලක් සේ ද, සත් රුවන් පිරුණු බිලයෙහි දොර හැරී ගිය ශබ්දය අසා ඒ දිගට උන්මුඛ වැ දිවැ ගන්නා වූ දරිද්‍ර වූ ධනාර්ථින් සේ ද, චුම්බක පාෂාණ මුඛයට හැසී යන්නා වූ ලෝහ ධාතු සේ ද, වෙහෙල්ලට දිවැගන්නා වූ ජල ප්‍රවාහයක් සේ ද, කිරි බර තනයෙන් යුක්ත වැ එන්නා වූ මවුන් අභිමුඛයට දිවෙන්නා වූ කුමාරයන් සේ ද, නිධාන තුබූ තැනට බස්නා අරළුවක් සේ ද, මධුර වූ දිව්‍ය රූපාදි ආලම්බනයට දිවෙන්නා වූ චක්ෂුරාදි ඉන්ද්‍රියයන් සේ ද, සගෞරව වැ සස්නේහ වැ සාභිලාෂී වැ දිවෙමින්, බුදුන් වැඩි බව කියන්නට නික්මුණාක් මෙන් ගඟ පැනැ ගෙනැ මෙ තෙරෙහි පැනී ගියා වූ සවනක් ඝන බුදු රස් දක්මින් මැ, දුටු දුටු තන්හි මැ වැඳැ පෙරළෙමින්, සොම්නස්හි ගැලෙමින්, 'අප ගේ මනෝරථය පිරිණැ' යි යන හඞියෙන් තුන් යොදනක් පමණ තැන් තුන් පියවරෙකින් නික්මෙන්නා සේ යුහු වැ අවුත් තමන් ගේ සීමායෙහි ගඞ්ගා තීරයෙහි රැස් වැ එ තෙරැ වැඩැ හුන් ස්වාමි දරුවාණන් දිශාවට වැඳැ ගෙනැ හොත් හැ.

ඉක්බිති බිම්සර රජ්ජුරුවෝ හොරු දෙකක් එක් කොටැ බැඳැ එහි මණ්ඩපයක් කරවා විචිත්‍ර වූ කුසුමයෙන් ඒ මඩුව සදා සත් රුවන්මය වූ බුද්ධාසනයක් පැනැවූ හැ. ඉක්බිති සර්‍වඥයන් වහන්සේ තමා ගේ රශ්මීන් රැඳී ගිය යුගන්ධර පර්‍වත මස්තකයට පැනැ නැඟී තරුණ සූර්‍ය මණ්ඩලය සේ දිලියෙමින් පැනැ වූ ආසනයෙහි වැඩැ හුන් සේක. භික්ෂූන් වහන්සේ ද නැවට නැඟී සර්‍වඥයන් වහන්සේ පිරිවරා වැඩැ හුන් සේක. ඉක්බිති බිම්බිසාර රජ්ජුරුවෝ ද කරවටක් පමණ දියට බැසැ දෙහොත් මුදුනෙහි තබා ගෙනැ

‘ස්වාමීනි! යම් තාක් වැඩ වදාරන සේක් ද, ඒ තාක් මෙහි මැ වෙසෙමි’ යි දන්වා නැව යවා තුමූ නැවැත්තා හ. ඉක්බිති සම්බුදුයන් වහන්සේ ද යොදුනක් පමණ තැන් ගඞ්ගායෙන් වැඩ **විශාලා** මහනුවර වාසීන් ගේ හිමට පැමිණි සේක. ඉක්බිති විශාලා මහ නුවර **ලිච්ඡවි** රජදරුවෝ ද, ‘අප ගේ දුක් නැති කරන පිණිස කරුණායෙන් වැඩියා වූ ස්වාමිදරුවනට පෙර ගමන් කරම් හ’යි කර වටක් පමණ දියට ගොස් නැව ගොඩට ඇද සම්බුදුයන් වහන්සේ ගොඩට බහා ගත් හ.

ස්වාමිදරුවන් නැවින් බැස ශ්‍රී පාදය ගොඩ ස්පර්ශ කළ විට මැ, ‘තමන් වහන්සේ ගේ සිතින් රාග නමැති කුණපයක් වත් ද්වේෂ නමැති කුණපයක් වත් මෝහ නමැති කුණපයක් වත් නො ගෙන වැඩියා වූ ස්වාමිදරුවන් ගේ එබඳු වූ අටතුරු සියක් මඞ්ගල **ලක්ෂණයෙන්** යුක්ත වූ, කුමාර කාලයෙහි පවා ‘වඳවන්නට යැ’ යි ගෙන ගිය **කාළදෙවලයන් ගේ** මුදුනෙහි සැතැපී ගියා වූ, ඒ ආශ්චර්‍ය දුටුවා වූ **ශුද්ධෝදන** රජ්ජුරුවන් ගේ මුදුනට මුදුන් මල් වූ, ස්වාමිදරුවන් ගේ ගුණයෙහි ප්‍රසන්න වූ **කොසොලයන්** තමන් ගේ මුහුණ තබා සනහා නො විඩා වූ, කිපී දිවැ ගෙන ආවා වූ **අඞ්ගුලිමාලයන්** අන්තයෙහි ස්වාමිදරුවන් ගේ ධර්මය අසා වැදගෙන හොත් කල්හි ඔහු ගේ සිත පහළ වන්නා වූ ලෝකෝත්තර ධර්ම නමැති චන්ද්‍රෝදයයට උදයසන්ධ්‍යාරාගයක් බඳු වූ රත් පැහැයෙන් උජ්ජ්වලිත වූ, මරන්නට මෙහෙයූ තන්හි වැද ගෙන හොත්තා වූ **ධනපාලයා ගේ** මුදුන්හි සිඳුර ගල්වා ඉතිරි කළ සිඳුර මලා දෙකක් බඳු වූ, රාත්‍රියක් මුළුල්ලෙහි උපක්‍රම කොට කිසි උපද්‍රවයක් කොට ගත නො හී අන්තයෙහි වැද ගෙන හොත්තා වූ **ආලවක** නැමැති රාජ හංසයා විසින් සුඹුනා ලද රක්ත පද්මයක් බඳු වූ, **කිඹිරගුරු දණ** ගිනි වළු පළා ගෙන තැඹි පියුමින් පිළිගන්නා ලද්දා වූ, මෙරට දික් කළ හොත් එක් ලක්ෂ අට සැට දහසක් යොදුන් පමණ මහ මෙර තම හට නැමී අවුත් පිළිගන්නා වූ, සියක් තල පමණ ප්‍රපාතයකට දික් කළ හොත් ඒ කඹුරු සමක් සේ පිරී, බෙර ඇසක් සේ සම වැ

පිළිගන්නා වූ අනවරතයෙන් වඳනා වූ **ශක්‍රයා** ගේ පරසතු මඳරු මල් දම්හි රෙහෙණුයෙන් නිරන්තරයෙහි රැඳී තිබෙන්නා වූ, **බ්‍රහ්මයාගේ** මුදුනෙහි පිහිටා එයට 'උත්තමාංගය' යන නම සාථක කළා වූ, සාරසංඛ්‍ය කප් ලක්‍ෂයක් මුළුල්ලෙහි 'අසත් පුරුෂයන් කරා යෙමි' යි දික් නො කළා වූ, සත්පුරුෂයන් කරා එළැඹැ නො විඩා වූ, මුළු ලොවට මුදුන් මල් වූ, ඒ ශ්‍රීපාදය පහරන බිමැ කුණපයක් තිබෙන බව සුදුසු නො වන්නේ වේ ද?' යි කියා ගර්ජනා කරන්නාක්හු මෙන් ගම්භීර වූ නාද පවත්වන්නා වූ, සර්වඥයන් වහන්සේ වඩුත් මැ **විශාලා** මහනුවරැ තුන් උපද්‍රව විදිනට දේවතාවන් ගත් ගත් දුනු බඳු වූ ඉන්ද්‍රචාපයෙන් ගැවසී ගත්තා වූ, **විශාලා** වාසීන්ගේ සිත්හි ශෝකය කඩ කඩ කොටැ කපා හරනට **වැසි වලා** දෙවින් ගත්තා වූ කඩු බඳු වූ අනන්ත වූ විජ්ජුල්ලතායෙන් හොබනා වූ, ගොඩෙහි ශ්‍රීපාදය තුබූ විටැ මැ සර්වඥයනට වැසි වලා දෙවින් දුමූ කුසුමාඤ්ජලියක් සේ ආකාශ මණ්ඩලයෙහි විසිරැ ගිය කොක් පෙළින් යුක්ත වූ මහා මේඝයෙක් නඟා, තෙමෙනු කැමැත්තන් තෙමා, නො තෙමෙනු කැමැත්තන් නො තෙමා වැසැ, දණක් පමණ, උඩු කලවයක් පමණ, හිණ මසක් පමණ වතුරැ හෙළා සියලු රාජධානියෙහි කුණප තාක් සෝධා ගංගායෙහි ලාපී යැ.

ඉක්බිති සියලු **විශාලා** පුරයෙහි භූමිභාගය පරිශුද්ධ වී යැ. ඉක්බිති **ලිච්ඡවී** රජදරුවෝ මෙ මැ සලකුණින් තමන්ගේ මනෝරථය සිඩ වන බව දැනැ නියත කොටැ උපන් සොම්නසින් ස්වාමීන් වඩා යන්නාහු, යොදනෙහි යොදනෙහි මහා පූජායෙන් වාසය කරවමින් මහ දන් දී තුන් දවසෙකින් තමන් ගේ නුවරට වඩා ගිය හැ. එ සමයෙහි 'සියලු භය සන්සිඳුවන්නා වූ **රත්නසූත්‍රය** ලොවට පහළ කරන්නට යැ යි වඩනා වූ ස්වාමිදරුවන් ගේ බුඩ විලාශය බලමි' යි සැරැහී දෙ දෙව් ලොවැ දේවතාවන් හා සමඟ **ශක්‍රදේවේන්ද්‍ර** ද අවුත් වඩනා පෙර මහැ රැස් වී යැ. ඉක්බිති මහේශාක්‍යදේවතාවන් රැස් වන් රැස් වන් චන්ද්‍රෝදයයට බිඳෙන්නා වූ අන්ධකාරය සේ යක්‍ෂයෝ බිඳී පලන්නට පටන් ගත් හැ.

ඉක්බිති ස්වාමිදරුවෝ **සවස්** වේලෙහි නුවර දෙරට පැමිණ, මුළු ලොව සතහමින් වැඩ සිට, **හංසජාතියෙහි** මලැ බැඳී සිටියවුනට තමන් නො බැඳී සිට, දිවි දී තමන් වහන්සේට වූ උපද්‍රව දුරු කළා වූ, **රන් වන් කකුළු** වැ ඉපිද තමන් වහන්සේට උපද්‍රව කළා වූ කපුටුවා හා සර්පයා හා තලින් ගෙන, ගිය ජීවිතය පෙරළා දෙවා මිත්‍ර ධර්මය රක්‍ෂා කළා වූ, **පුණ්ණජාතකයෙහි** බොහෝ විශ්වාසයක් තබා පියා උරයෙන් උරය සැවුණු මාත්‍රයට තමන් වහන්සේ අතින් ගම්වර පසෙක, මිඹියෝ සියයෙක, ගෙරි සත් සියයෙක යනාදීන් නොයෙක් උපකාර ලද්ද වූ, තමන් වහන්සේ අස් වැ ඉපැද සත් රජ්ජුරු කෙනකුන් සාධා අන්තයෙහි ප්‍රාණ පරිත්‍යාග කොට රාජ්‍යදානයෙන් උපකාර කළා වූ, මෙ සේ ජාති ජාතියෙහි පුරුදු වූ ගුණ ඇති දූත් මේ අන්ත්‍යජාතියේ තමන් වහන්සේට උපස්ථාන කරන්නවුන් කෙරෙහි අග්‍ර වූ බහුශ්‍රැතයන් කෙරෙහි අග්‍ර වූ, තමන් වහන්සේ වදළ සුවාසූ දහසක් ධර්මස්කන්ධ නැමැති භාණ්ඩාගාරය නො නසා රක්‍ෂා කොට සිටියා වූ ධර්මභාණ්ඩාගාරික වූ, තමන් වහන්සේ මරන්නට හළ **ධනපාලයා** අභිමුඛයෙහි ප්‍රාණය පරිත්‍යාග කොට සිට පොළොව පෙරළා පස්සෙහි තබා පියන තුරු පසු නො බටුවා වූ, ස්නේහයෙන් හා පක්‍ෂපාත කමින් යුක්ත වූ **අනඳ මහ** තෙරුන් වහන්සේ කැඳවා, මහානුභාව ඇති මහ රජක්හු තමා පස්නෙහි සිටි මූඛ්‍යයෝධයක්හු අතට තමා ගේ ආයුධය දී ඔහු ලවා ශත්‍රුසේනාව බිඳුවන්නා සේ, තමන් වහන්සේ නුවරින් පිටත වැඩ සිට, තමන් වහන්සේ වදළා වූ සද්ධර්ම නැමැති ආයුධය ඔබට දී, ඔබ ලවා මැ මේ තුන් උපද්‍රවය දුරු කරවා ස්ථානෝචිත වූ කටයුතු දන්නා ස්වාමිදරුවෝ 'තමන් වහන්සේත් නො වැඩ, අග්‍ර ශ්‍රාවකයන් දෙ දෙනා වහන්සේ ඇතුළු වූ සෙසු ක්‍ෂීණාශ්‍රවයන් වහන්සේ වරුන්ද කෙරෙන් ද එක් කෙනකුනුදු නො යවා, සියලු නිත්‍ය පරිවාර පන්සියයක් දෙනා වහන්සේ අතුරින් ලද ගුණයෙන් හැම දෙනා වහන්සේට

අඩු වූ, ගඳකිළිය හැමැඳා ලා හිඳිනා වහන්සේ කෙනෙකුත් ලවා ඒ උපද්‍රවයන් සන්සිඳුවා වදාළ සේක' යන කීර්තිය කල්පාන්තස්ථායි කරන පිණිස, 'ආනන්දය තෝ මේ **රත්න සූත්‍රය** ඉගෙන **ලිච්ඡවි** රාජ කුමාරයන් හා සමඟ මේ **විශාලා** මහ නුවර තුන් පවුරු වළල්ල ඇතුළෙහි ඇවිද **පිරිත් බණ**' යි වදාළ සේක.

ඒ අසා සකල ලෝකයට ආනන්දකර වූ **ආනන්ද** මහා ස්ථවිරයන් වහන්සේ සර්වඥයන් වහන්සේ විසින් වදාළ ඒ **රත්න සූත්‍රය** ඉගෙන, එ මැ ස්වාමීන් ගේ ශෛලමය වූ **සතර වරම්** මහ රජදරුවන් දුන් පාත්‍රයෙන් පැන් හැර ගෙන නුවර දොරකඩ සිටි සේක්, එ මැ සර්වඥයන් වහන්සේ **සුමේධ තාපස** කාලයෙහි කළා වූ ප්‍රණිධානයෙහි පටන් රැස් කළා වූ නොයෙක් ගුණ සම්භාරය සිහි කොට, 'මාගේ ස්වාමිදරුවෝ සමතිස් පැරුම් නැමැති මහා සාගරය පිහිනා ගොඩ දක්මී' යන මහා පරාක්‍රමයෙන් **දීපඞ්කර** පාද මූලයෙහි දී පිනුවෝ සාරාසංඛ්‍ය කප් ලක්‍ෂයක් මුළුල්ලෙහි නො හැර පීනා අනන්තයෙහි බෝ මැඩ, **වජ්‍රාසන** නැමැති සුපටුන් ගොඩට පැන නැඟී සසර සයුරෙහි තෙර පත් වැ, අසාධාරණ වූ පාරමිතායෙහි කුළු ගත් හ. අඞ්ගපරිත්‍යාග යැ, ජීවිත පරිත්‍යාග යැ යනාදි වූ පඤ්ච මහා පරිත්‍යාග කරන්නෝ ඒ ගන්නවුන් හැර ගනුත් 'මාගේ යැ' යන ලෝභය බලත්, තමන්ගේ 'දී පුව මැනැව' යන ලෝභය මැ එයට ද වඩා බලවත, එයට ද වඩා පඤ්ච මහා පරිත්‍යාග කළ හ. ලෝකාර්ථචර්‍යා ආදි වූ ත්‍රිවිධ අර්ථ-චර්‍යායෙන් ශූන්‍ය වූ ජාතියක් බලු වැ ද, වටු වැ ද, කවුඩු වැ ද නො ලත් හ. මුහු කළා වූ ඵලය අඟ අත්තෙන් බිමැ ගී බිමැ සිටියවුනට ප්‍රයෝජන සැදුවා සේ පශ්චිම භවයෙහි **තුෂිත** භවනයෙන් ච්‍යුත වැ මනුෂ්‍ය ලෝකයෙහි ඉපිද සියලු සත්ත්වයනට ප්‍රයෝජනවත් වූ හ. සඳ නැඟෙන කලැ සියලු ආකාශ මණ්ඩලය ආලෝක කොට ගෙන නැඟෙන්නා සේ, තමන් මව් කුසින් බිහි වන කලැ සියලු දස දහසක් සක්වළ එක පැහැර ආලෝක කොට ගෙන උපන් හ. **යශෝධරාවන්** වහන්සේ ප්‍රධාන කොට ඇති

සතලිස් දහසක් අන්තඃපුර ස්ත්‍රීන් විසින් හෙබියා වූ කිඹුල්වත් පුරය වැනි පුරයක් හැරපියා යන්නාහු, මිනිස් වෙස් ගත් යකින්නන් විසින් ගැවැසී ගත්තා වූ යක්‍ෂ පුරයක් හැර පියා යන්නා සේ නැඟී ගිය හැ. සහවුරුද්දක් මුළුල්ලෙහි මහා වීර්ය කරන්නෝ කෙළ දහසක් ඇතුන් රඳවා ලන්නට සුදුසු වූ ඒ සා මහත් කාය බලය තමන්ගේ එක ශරීරය මත රඳවා ගත නො හෙත පරිද්දෙන් සියලු කාය ශක්තිය ගෙවා වීර්ය කළ හැ. බෝධි මණ්ඩලයෙහි වජ්‍රපර්‍ය්‍යඞ්කයෙහි වැඩැ හිඳැ මරහු ලුහුබඳවන්නෝ මරහු දුටු ඉතිරියන් දිවෙන්නා සේ තමන් දුටු මරහු ලුහුබැඳැ වූහැ. ඉක්බිති සහස්‍ර රශ්මීන් යුක්ත වූ සූර්යා ගේ උදය ලත් යුගන්ධර පර්වතය සේ, අනන්තාපරිමාණ ගුණයෙන් විශිෂ්ට වූ සර්වඥතාඥනය ලදින් මෝහාන්ධකාර විධ්වංසනය කළ හැ. නවසත්තාවාසයෙහි දුක් දුරු කරන්නා වූ නව ලෝකෝත්තර ධර්මයන් සියලු ලොවට තමන් බෙදා දෙන පරිද්දෙන් පළමු කොටැ ලදහ' යි මෙ සේ සර්වඥයන් වහන්සේ ගේ අනන්තාපරිමාණ ගුණයන් සිහි කොටැ, 'මෙ සේ වූ ගුණ ඇති මහා පුරුෂයාණන් වහන්සේ ගේ ගුණ මහිමයැ එල්බැ ගෙනැ යැ, මා මේ පිරිත් බණන්නේ' යි නුවරට වැදැ තුන් පවුරු වළල්ල ඇතුළෙහි රාත්‍රිය මුළුල්ලෙහි පිරිත් බිණූ හැ

ඔවුන් පළමු වන ගාථායෙහි 'යං කිංචි' යන පදය සෙල්වූ විටැ මැ යම් කිසි යක් කෙනෙක් නැති වූ හැ යම් කිසි දුබියෙකුත් නැති වී යැ. තුන් වන ගාථාලුයෙහි පටන් රිදී බුබුළු වැනි ඉසිනා පිරිත් පැනින් විසුරුණු ජල බිඳු රෝගීන් ශරීරයෙහි හෙත්නට වනැ. සර්වඥයන් වහන්සේ වැනි ලෝකස්වාමි කෙනකුන් ශාන්ති පිණිසැ වදළ සූත්‍රයක් වුව, ඉගෙනැ ගෙනැ පිරිවහන්නන් අනඳ මහ තෙරුන් වහන්සේ වැනි වියත් කෙනෙකුන් වුව, පැන් ඉස්නා පන්සාලිස් හවුරුද්දක් ස්වාමීන්ගේ ශ්‍රී හස්තයෙන් පිරිමසා අහර බළදන්නට තිසි වූ පාත්‍රයක් වුව, ස්වාමිදරුවාණන්

ඒ පිරිත් බැණැ ඉසුත් ඉසුත් මියැ යන්නට හොත් රෝගීහු අනුන් වෙහෙසන්නට මළ වෙස් ගෙනැ හොත්තවුන් ක්‍ෂණක්‍ෂණයෙහි සිසී නැඟි සිටිනා සේ, ක්‍ෂණයෙහි නැඟී සිටැ, තෙරුන් වහන්සේ පිරිවරා ගෙනැ වඳිමින්, 'ස්වාමීනි, සියලු සත්ත්වයන් ගේ දුක් හරන ස්වාමිදරුවෝ මො බැ වැඩි දෑ ද? ගැත්තවුන් විඳිනා දුක් ස්වාමිදරුවාණන් ඇසට පැණිනි ද?' යනාදි වූ මිහිරි බස් බෙණෙමින්, තමන් ගේ දුක් දුරු කළා වූ ඒ සර්‍වඥයන් වහන්සේ සිහි කොටැ **'නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස'** යි දෙහොත් මුදුනෙහි තබා ගෙනැ විඳිමින්, එ මැ විටැ මැ ඇති වූ කාය බලයෙන්, එ මැ විටැ මැ ඇති වූ ශරීර පුෂ්ටියෙන්, එ මැ විටැ මැ ඇති වූ මුඛ ශෝභායෙන් එ මැ ශරීරයෙන් නො මියැ මැ දේවතා වූවන් සේ, පිළී හිස සිසාරමින්, අපොළමින්, කොක් සන් ගසමින් මහ තෙරුන් වහන්සේ සිසාරා ගත් හැ.

**'යං කිංචි විත්තං'** යන පදයෙහි පටන් ගෙනැ ඉසැ ලූ දිය බිඳු ඇඟැ හෙත් හොත්, පළමු පලනා යකුන් හා කැටි වැ නො පැලැ සාහසික කොටැ සිටි යක්‍ෂයෝ වෛතරිණී ගඞ්ගායෙහි ජල බින්දු ඉසී ගිය නරකයේ සත්ත්වයන් සේ වෙවුලමින් පස් පස් බලමින් පිට හඹමින් ඔවුනොවුන් ගත නො ගී එක හෙළා දිවැ ගත්හැ. ඔවුනට වාසල් දොර නො සෑහිණැ. එ විටැ කෝලුමක් සා පමණ තැනින් සැත්තැ අසූ දෙනකුන් නැඟී යන පමණ සියුම් අත් බව් නො මැවූ හැයි නො සිතමි. එ සේ වුව ද තමන් පලන්නට මහ දොර නො සෑහෙත් පවුරු බිඳැගෙනැ පදනම් බිඳා ගෙනැ හිස් ලූලූ දිගැ පැලැ හැ. සියලු භය ද ඔවුන් හා කැටි වැ ගියේ යැ. එ සේ දුක් පත් වූ **විශාලා** මහ නුවර අසුරයන් ජය ගෙනැ වැදෑ ගිය දේවතාවන් විසින් ගැවසී ගත්තා වූ **තව්තිසා** භවනය සේ එක පැහැරැ සැදී ගියේ එ වැනි ලෝක ශාන්තියෙන් නො වේ නම්, ඒ ස්වාමි දරුවාණෝ වැඩැහුත් තැනින් ශ්‍රීපාදය තහත දෑ ද? යං කිංචි

විතානං' යනාදි වූ එ නෙක් ගාථා බැඳැ අනඳ මහ තෙරුන් වහන්සේට උගන්වන දෑ ද? තමන් වහන්සේ වළඳන්නා වූ පාත්‍රය උන් වහන්සේ අතට දී වදාරන දෑ ද? එ සේ හෙයින්, 'ලෝවැස්සන් සුවපත් කරම් හැ'යි දුක් ගත්තවුන් මෙ තෙක් ශාන්ති නො කරත්, අනෙක් කවුරු කෙරේද්ද?

මෙ සේ උඩ අපොළන දෙවියන් විසින් හා, බිමැ අපොළන මිනිසුන් විසින් හා, කටැ කටැ සාධුකාරයෙන් හා ආකාශයෙහි දිව්‍ය භේරියෙන් හා, භූමියෙහි මනුෂ්‍ය භේරියෙන් හා ආකාශයෙහි දිව්‍ය ගීතයෙන් හා, භූමියෙහි මනුෂ්‍ය ගීතයෙන් හා ආකාශයෙහි දිව්‍ය නෘත්‍යයෙන් හා, භූමියෙහි මනුෂ්‍ය නෘත්‍යයෙන් හා, සියලු අහස් පොළෝ දෙක නිරන්තරවැ ගිය කල්හි, ජය පුරයකට වදනා මහ රජක්හු සේ සවාමිදරුවෝ ඉන්ද්‍ර කීල පැනැ ගෙනැ ඇතුළට වන් හ. ඉක්බිති ඖෂධ තෙල් ඉසැ ලූ ක්‍ෂණයෙහි නිල් වූ මූහුදු දිය මැඩැ ගෙනැ දිවෙන්නා වූ මහ ගිනි කඳක් සේ නිල් වූ බුදු රැස් මත්තෙහි දිවැ ගන්නා වූ රන් වන් පැහැ මිශ්‍ර වූ රත් පැහැ කඳෙක් සියලු නුවර පුරා ගෙනැ සක්වළ මුව විට දක්වා දිවෙන්නට වනැ. පිරිත් පැනට දිවෙමින් සිටි යක්හු, පස්සෙහි දිවෙන්නා වූ ඒ රස් දකිමින්, මුහුණින් හිඟි දිවෙමින් සක්වළ ගලැ පැනැ ගෙනැ ඇනැ වැගිරැ ගිය හැ යි සිතමි. අතරතුරෙන් දිවන්නා වූ නානා ප්‍රකාර වූ රශ්මිජ්වාලයෙන් සියලු නුවර සදමින් **ලිච්ඡවි** රජදරුවන් සදා නිමැ වූ සන්ථාගාරයෙහි මනෝඥ වූ සප්තරත්නමය වූ බුඩාසන මස්තකයෙහි වැඩැ හුන් සේකැ. ස්වාමිදරුවන් ආසනයෙහි වැඩැ හිඳින්නා හා මැ ශ්‍රමණ බ්‍රාහ්මණ රජකුමා-රාදි නානා ප්‍රකාර වූ පිරිස් බුදුන් පිරිවරා එහි මැ හුන් හැ. ශක්‍ර දේවේන්ද්‍රයා ද තමන් ගේ දෙ දෙව් ලොවැ දේවතාවන් හැරැ ගෙනැ සුදුසු තැනෙක්හි හිඳැගතැ. ඉක්බිති තෙරුන් වහන්සේ සියලු නුවර පිරිත් කොටැ රෝගයෙන් මිදී තමන් වහන්සේ පිරිවරා ගත් මහ ජනයා ගෙනැ අවුත් 'ස්වාමීනි, ස්වාමින් වහන්සේ ඇතුළු වූ රත්නත්‍රයෙහි බලයෙන් ජීවිත

ලද්දා වූ ගැත්තෝ ස්වාමීන් වහන්සේ වඩිති' යි ඒ පිරිස් වඳවා තමන් වහන්සේ ද ශ්‍රීපාදය වැඳ එකත් පස් ව වැඩ හුන් සේක. සර්වඥයන් වහන්සේ හුන්නා වූ පර්ෂද් බලා ස්ථානෝචිත ධර්ම දේශනාවක් පරීක්ෂා කොට වදුරු සම්ප්‍රාප්ත වූ පර්ෂදට ඒ මැ **රත්නසූත්‍රය** දෙසා වදාළ සේක. දේශනා පර්‍යවසානයෙහි සුවාසූ දහසක් ප්‍රාණීහු එක පැහැර අමෘත මහා නිර්වාණයට වන් හ.

මෙ සේ තැගු තැගු පියවරින් සිතූ සිතූ සිතින් කළ කළ දෙයින් වන් වන් තන්හි සිටි සිටි තන්හි හුන් හුන් තන්හි සියලු උපද්‍රව පහ කොට සියලු ශාන්ති ඇති තාක් තමා ලෙව් ලොවුතුරු සැපත් දී සියලු ලොව සනහන්නා වූ මාගේ මැ ළයක් වැනි, මාගේ මැ ඇසක් වැනි, මට මැ පිහිට වූ, මට මැ රක්ෂා ස්ථාන වූ **බුදුන් සරණ යෙමි යි බුත් සරණ යා යුතු.**

# වදන් වැල

සන්දි වූ වදන් බිඳෑ දක්වා ඇති. විබත් වෙත් කළ තැනැ + මේ ලකුණ යොදා ඇති. සත් නම් (සංඥා නාම) කළු අකුරින් ඇඟෑ වේ. '×' යන ලකුණ යොදා ඇත්තේ පදය දෙවරක් යෙදුණු බව අඟැවීමටයි. උදා: අප × = අප අප. වැඩිවාර ගණනක් එක මැ පැදියෙකැ එක වදන යෙදී ඇති විට වාර ගණන උඩින් දක්වා ඇති උදා: $109^2$.


අක් 275
අක (-පවු) 163
අකුරු 158
අකුසල් 604
අග 140, 285, 347, 364, 385
අගළ 11, 83
අඟනන් 52
අඟනෝ 94, 97
අගලකුත් (අගලක් දු) 213
අං 320
**අජපාල** 397
**අජිත** (**කෙස්කම්බලි**) 125
අට 264, 311, 400, 446, 588
අටඟ (අට අඟ) 97, 204
අටතුරු (අට උතුරු) 311
අටලොස් 409
අටාසූ (අට අසූ) 600
අවියෝ 500
අටු 63
අඩ
(-සඳ) 160
අඩක් 159
අඩු 206, 275, 366, 388, 399
610
අණ 567
අත් (-බැවෙහි) 195
අත්වර (අත්වරු) 276, 391
අත 152, $189^2$, 279, 308,
498, 563
අතට 174, 400
අතර 405, 562, 610
අතට 530
අතරණ 532
අතරමින් (අත් අරමින්) 525
අතරේ 242
අතැ × 88
අතැඹුල (අතැ ඇඹුල) 263
අතින් 260, 278, 339, 486
අතිනේ 504
අතු 49
අතුට 531
අතුරින් 434
අතුරු 83, 279, 479, 533
අතුරෙහි 249

අතෙකින් 261
අද 500
අදනා 316
අදම් 105
අදම්වු (අදම් ඉවු) 216
අදමින් 408
අදරා 408
අදරින් 3
අදහම් 56
අදහම 106
අදහමට 107
අදහමින් 106
අදගස 441, 594
අදහසි 105
අදහා (-ගනිති) 376
,, (-ගෙනැ) 421
අදිටනින් 245
අදින 86
අදනය 452
අදනේ 453
අදවා 512
අදුන් 558
අඳුන් සක් 357
අදුරු 4, 553
අත් 138, 144, 167, 375
අත්දමන්ද 178
අත්දමන්ඤෙ 194
අතඟ 161
අතත ?31
අතතපිරියත් (අනත් අපිරියත්) 211
අතදර 411
අනඳ 566, 598
අනැඟි (න ඇඟි) 579
අනුත්තර (න උත්තර) 267
අනුත් (අත් උත්) 54, 66, 199
අනුමැතිය 439
අනුවණ (න නුවණ) 132
අනුවණින් (න නුවණ + ඉන් 270
අනුව්‍යංජන 305
අනෙක් (න එක්) 139
අනේ 372
අනෝමා 393
අනෝලෝකිත (න අවලෝකිත) 230
අප 112, 152, 185, 228, 228 233, 243, 372, 274, 280 302, 433, 494, 524, 525 527[2], 529, 534, 556
අප × 509
අපමණ (න පමණ) 3, 22 220, 424, 494, 532, 561
අපවාදේ 493
අපා 310, 323
අපි 526
අබරණ 469, 534
අබළුව (අබ පළුව) 210
අබියෙස 176
අබිසෙස් 417
අඹර 136
අඹා 375
අඹු (-දරුවන්) 258
අම 138, 221, 407, 596

අමතා 566
අමතාරය (අමත ආරය) 420
අමා 312, 314, 598
-වට (වැස්වූ) 314 (ගුළි) 314
අමාවට (අමායාවට) 314 (ආමයට) 314
අමායා 358
අය 47, 97, 99, 233
අයකු 100, 172[2]
අයට 136
අයදින 4 6
අයුරා 55
අයුරු 45, 374, 375, 376, 420, 446, 495
අයුරේ 352
අයෙක් 98, 487, 488, 490 494
අයෙකි 164
අර 273
අරණේ 321
අරතර 323
අරබයා 426
අරමුණු 57
අරහ 262
අරහාදි (අරහ ආදි) 424
අරි 3
අරුණු 393
අරුම 529
අල 283, 433
අලී 26
අලු
-යමු 406
අව 4, 344, 348, 352
-බිය අඳුරු 4
අවට 84, 454, 578, 590
අවරණ 424
අවා 43, 199, 484
අවි 25, 167, 313, 469
අවියක් 260
අවුත් 79, 80, 84, 142, 150, 415, 471, 478, 479, 588
අවුරා 578
අවුරුදු (=හවුරුදු) 148
අවුලින් 316
අවුලා 596
අස්නක් 510, 511
අස්නෙහි 581
අස්නේ 515
අස්වා 428
අස 181
අසංකයකට 259
අසන 50, 222, 330, 493
අසමසම 406
අසරණ 494
අසල 141
අසව 50, 602
අසා 65, 163, 171, 184, 261, 330, 332, 339, 414, 434, 441, 442, 523
අසාලා 10
අසිපත් 313
අසු 390
අසුත් 439
අසුතක් 580
අසුර 25, 229, 362

අසුරිඳු (අසුර ඉඳු) 546
අසුවෙකැ 305
අසෙකි (=අසැකි) 239
අහර 111, 138
අහරට 142
අහරදහසින් 407
අහරෙණින් 292
අහස 240, 338
අහසට 556
අහසක් 205, 588
අහසැ 588
අහසින් 329
අහිත 607
අළලන 183
ආ 67, 350, 432
ආදර 487
ආයු 208
ආරුදනා 440
ඇඟි 436, 514, 571
ඇඟ 97, 241, 285
ඇඟට 591
ඇඟැ 284
ඇඟිලි 279
ඇට 85, 151
ඇණැවූ 322
ඇත් 55, 178
ඇත්තේ 235, 287, 289
ඇත (අසම්:) 179, 251
(=ඇතැ) 224
(ඇත් ද?) 179
ඇතත් 9
ඇතා 233
ඇතැ 167
ඇති 3, 21, 38, 59, 90, 91, 101, 114, 116, 118, 124, 124, 163, 164, 177, 182, 199, 263, 323, 366, 382, 433, 484, 487
ඇතියෙන් 264
ඇතිරිලි 514
ඇතු 66, 73, 545
ඇතුන් 238
ඇතුළට 281
ඇතුළත් 295, 588
ඇතුළත 210
ඇතුළු 89, 410, 592
ඇද්ද (=ඇත් ද) 178, 331
ඇද 302
ඇදුරකු 274
ඇදුරන් 89
ඇඳැ 534
-ගෙනැ 543
ඇඳි, 243, 296
ඇඳුමට 373
ඇම 21, 32[2], 43, 74, 88,115 118, 119, 126, 162, 170, 211, 221, 237, 240, 267, 316, 317, 318, 410, 531, 532
ඇමැක්තත් 116
ඇරැ 324, 416
-ගෙනැ 47, 366
ඇරැවූ 323
ඇරෙයි 216

ඇල් 277
ඇවිදින 205
ඇවිදින 160
ඇඹුරු 43
ඇස් 188², 248, 301, 371
ඇස 52, 215, 240, 320, 446
472, 530, 545
ඇසි 301
ඇසුවා 178
ඇසුවෝ 162, 192
ඇසූ 103, 370, 383
ඇසෙයි 212
ඇසේ 221
ඇ 237
ඉක්බිති 439
ඉගෙනැ 261
ඉග (=ඉගැ) 254
ඉගැ 379
ඉගුල් 275
ඉටත් 401
ඉතා 110, 356, 383
ඉතිති 154
ඉතිරී 30
ඉදි 589
ඉදිරි 183, 276, 481, 582
ඉද (=ඉදැ) 180
ඉදැ 401
ඉදින 210, 574
ඉදිති 69, 165, 217
ඉදින 580
ඉදිනෙත් 35
ඉදිමැයි 525
ඉදු 360
-දුනු 519, 555
-නිල් 300, 375, 458
ඉදුරත් 57
ඉදුරා 569
ඉදුවර 512
ඉදුවරට 371
ඉන් 14², 110, 172, 237,
515, 601, 602
ඉපිල (=ඉපිලැ) 88, 558
ඉපිලී 87
ඉපිලෙන 468
ඉඹුල් 315
ඉමෙක් 20
ඉරිදු 286
ඉරැ 318
ඉව 535
ඉවත් 472
ඉවත (=ඉවතැ) 416
ඉවතෙකින් 261
ඉවසන 53
ඉස් 241, 247
ඉස්තේ 515
ඉස්බක් 446
ඉස්වා 422
ඉස 306, 488, 539
ඉස (=ඉසා) × 87
ඉසැ 569
ඉසි 590
ඉසුරින් 32, 42, 80
ඉසුරු 144, 340, 342
ඉසුරට 173

ඉසොරු 390
ඉහිල් 419
උ (=උෟ) 193, 194, 195, 196
උක් 95
උගත් 184
උගහට 383
උගුරු 292
උගුරින් 159
උඩ 232, 285
උඩු 399
උඩෙළි (උඩ එළි)
–පත 232
උණු 302
උතුම් 2, 242
උතුමැයි 331
උතුමෙක් 361
උතුමෙක 146
උතුමෞ 165, 199, 526
උතුරක් 236
උතුරුකුරු 32
උතුරුමා 427
උතුළේ 462
උදක් 7, 8, 138, 547
උදය 117
උදු 452
උදුරු 56, 65, 578
උදුල (=උදුළ) 186
උදෙසා 139, 157, 171
උන් (උන්නා වූ) 42, 81, 90, 152, 200, 244, 245, 416, 528, 593
(ඔවුන්, ඔවුන් ගේ) 42[2], 105, 139, 151, 164, 200[2], 201[3], 230, 245, 312, 321, 335[3]
–ගේ 42, 104
උත්තෞ 583, 584, 585
උත්මතු 379
උනුන් (උන් උන්) 35, 90
උනුනට (උන් උන් හට) 27
උපත 307
උපතකුත් (උපතක් දූ) 239
උපතින් 341
උපදෙස් 373
උපන් 114, 146, 155, 245, 301, 315, 362, 368
උපන්නේ 248
උපන 139
උපමා 144
උපුට 248
උපුරමින් 25
උපුල්වන 315
උමයඟන (=උමය අඟන) 159
උමා 165
උයන්
ගෙ– 34, 601
උයනේ 414
උරගුන් 320, 321, 322, 470
උර 15
උරයෙන් 15
උරෙහි 287
උවදුරින් 433.
උවදුරු 84, 89, 129, 136, 144, 510, 521, 567.

උවදුරේ 101
උවම් 379, 380
උවමක් 375
උවමෙක් 187
උවිඳු (උප ඉඳු) 175, 179
උවිඳුන් (උප ඉඳු + උන්) 176
උවින්ද (උප ඉඳු + අං) 178
උස් 241, 276, 294, 295, 431
උසට 287
උසින් 546
උසුලන 376, 548
උසේ 216, 447
උෂ 100
එ 8, 9, 11, 15, 17, 18, 28, 31, 34, 36, 38, 77, 78, 80 84, 85, 89, 104, 106, 107 108, 109$^{2}$, 112, 113, 120$^{2}$ 121, 134, 136, 139, 140, 142, 143, 150, 151, 155, 162, 163$^{2}$, 170, 175, 181, 184, 187 189, 191, 197, 202, 205, 208$^{2}$, 215, 216 220, 222, 224, 225, 236$^{2}$ 237, 238, 244, 249, 254$^{2}$ 260, 264. 269, 270, 301, 304, 311, 312$^{2}$, 319, 321, 326, 329$^{2}$, 332$^{2}$, 340, 351, 352, 354, 355, 359, 362, 362, 367, 386, 388, 390, 391, 392, 393, 395, 402, 412, 413, 414, 417$^{2}$, 430, 431, 432, 434, 436, 437$^{2}$, 441, 443, 444, 489, 504, 606, 510, 518, 521, 524, 527, 529, 530, 538, 541, 543$^{2}$, 546, 551, 552, 559$^{2}$, 565$^{2}$, 569, 570. 580 589, 590, 591$^{2}$, 592$^{2}$, 593, 597$^{2}$, 599, 601, 602 (පසිදු අරුතැ) 348, 355, 508, 523, 545
–තෙරැ 180
එක් 84, 233, 371, 375, 586, 593
එක 21, 31, 84, 110, 208, 212$^{2}$, 213, 214, 218, 229, 239, 255, 257, 272, 277, 284, 285, 290, 293, 318$^{2}$, 319, 322, 327, 336 421, 459, 480, 520, 536, 699
එකක් 375
එකකු
–ගේ 66
එකකුට 66
එකඟ (එක් අඟ) 99
එකලු (එක් අලු) 476
එකුත් (එක් උතු) 399, 407
එකෙළි (එක් එළි) 213
එඩි 546
එක් × 475
එත 393, 407, 563
එති 501
එතී (එතියි) 162
එන 536, 539, 607

එම්බල 237
එමෙකා (එ මැ එකා) 139
එයින් ( එ ද) 139
එයින් 55, 111, 153, 167, 253, 335, 336, 337, 413
එයිනැ (එයින් යැ) 181 (එයින් = එ + ඉන්)
එයිණහනැ (එයින් අහනැ)106
එරී 549
එල්ලා 513
එව 32
එවැ 531
එහි 21, 29, 35, 65
එළි 1, 377, 565
-පත 232
ඒ 67, 111, 130, 135, 179, 205, 245, 331, 353, 552, 565
ඔකඳ 372
ඔකඳින් 8
ඔකාවස් 349
ඔටු 183
ඔතප් 166
ඔද 398, 489
ඔප් 282
ඔබ 119, 521
ඔබා 589
ඔලඹා 533
ඔවුන් 43, 45, 76, 101, 113, 132, 193, 199, 204, 334, 335, 602
ඔවුනොවුන් (ඔවුන් ඔවුන්) 77, 537
ඔසලෝයා 505
ඔසු 20
ඔසුපත් 315
ඔහු 67, 68, 150, 166, 170, 171, 183[4], 189[2], 190[2], 191, 192, 193, 196, 213, 217, 221, 241, 259, 330, 339[2], 342, 352
-ගෙ 192
ඔහුට 67, 168, 182, 246
කකුද කසසින් 124
කට 234, 299
කටැටියෝ (කට ඇටියෝ)540
කටියෙහි 289
කටු 315, 446, 472, 589
කටුලින් 313
කඩුවෙකින් 394
කඩ 88, 134, 288[2], 485
කඩුපුලින් 209
කත 165
කතක් 369
කතරින් 269
කතා 158
කඳ 219, 242, 271[2], 378, 403, 457, 516
කඳට 289, 632
කඳවුර 431
කඳින් 343
කඳෙක් 462
කඳෙහි 287
කන් 222, 298

-කළු 20, 44
කන්තක 390
කතට 212
කප් 207, 217, 219, 334, 354, 356, 403, 524
කපා 250, 394
කපෑ 244
කපු 280
කපුටන් 323
කපුරු 96
කබල්
 ය-317
කබල 81
කම් 67, 102, 237, 313, 377
 -කරු 247
කම්පා 454
කමක් 91
කමලා 539
කමලින් 229
කමින් (=කාලා) 151
කමින්
 පින්-566
කමෙක් 70[2]
කයත් 290
කර (බෙල්ල) 291, 320, 378 520
කර (අත) 324
 -රස 206
 -වැල් 316
කරණ 395, 582
කරණය (=කරණ) 25
කරත 161, 247, 411, 451, 465, 466, 467
කරතුදු 256
කරත්තෝ 326
කරත 58, 64, 72, 77, 116, 128, 153, 160, 171, 173, 175, 218, 290, 312, 455, 456, 458, 541, 557
කරනු 133, 183, 308
කරනුව 523
කරම්භ 527
කරමින් 508
කරලෑ 63
කරව (ප්‍රශ්න අරුතැ) 134
 (අණ) 510, 605
 -පි (කියා) 569
කරවති 64, 70
කරවත 158, 305, 508
කරවමිති 445
කරවා 329, 429, 510, 511
 -පි 560
කරළු (=කැරළු) 373
කරින් 159
කරුණක් 74
කරුණු 120
කල් 316, 317, 367, 405
 මත-273, 367, 419, 579
කල්හි 263
කල 141, 155[2], 237, 239[2], 245
 මත-273
කලට 109
කලදේ 534

කලබ 370
කලබක් 453
කලබින් 320
කලල් 513, 579
කලං 495
කලා 137, 166, 170, 182, 209, 249, 372, 382, 535 .
–සි 449
කලි 78
කලු
කන්–20, 44
කලෙක (=කලෙකා) 156, 166
කලෙකා 78
කලෙකැත් 306
කලෙකිත් 157
කලේ 243
කවි 98, 491, 611
කව (ළිදි) 32, 154.
කවද 553
කවර 119
කවුරු 44, 376, 525
කවුළු 279
කස්තුරු 96
කසී 584
කසුන් 369
කළ 1, 2, 7, 11, 29, 59, 68, 70, 76, 83, 112, 115, 124 126, 129, $133^{2}$, 135, 145, 186, 189, $190^{2}$, 211, 240 245, 279, 306, 307, 308, 341, 345, 346, 349, 358, 361, 377, 378, 379, 387, 390, 432, 479, 509, 516, 517, 518, 525, 545, 546, 548, 566, $567^{2}$, 571, 576, 579, 590, 603, 611
කළ × 214
කළත් 518
කළපුව 69
කළම්බා 423
කළමිස (කළ අමිස=ආමිස) 430
කළ යුරු (කළ අයුරු) 10
කළැකි (කළ හැකි) 11, 140, 235, 380
කළැයි 155, 166, 172
කළු 377, 558
කළොත් 374
කාලදේවල 544
කැට 530
කැටි 503
කැණහිලුත් 82
කැත් 114, 504
කැඳවා
–ගෙනැ 510
කැන් 135, 328, $533^{2}$
කැමැති (කම් ඇති) 19, $116^{2}$, 156, 439, 490 491
කැර (=කැරු) 405
කැරැ $2^{2}$, 4, 108, 122, 147, 156, 176, 178, 251, 257, 268, 311, 327, 341, 362, 377, 381, 391, 396, 410, 420, 424, $431^{2}$, $460^{2}$, 461

476, 482, 520, 532, 542, 551, 557, 565, 573, 577, 582, 583, 595, 598, 605
කැරැවූ 323, 325
කැරුමෙන් 102
කැල 5222
කැස්වූ 320
කැළැඹි 344
කි 137, 166
කිකිණි 24, 30, 419
කිත් 343, 611
කිදු 206
කිපුණෙන් 108
කිපෙන 16
කිඹුල්වත් 350
කිඹුල්වත 350
කිම් 168, 172, 382
කිමැ 155, 157, 200, 529
කිමින්දෙ 194
කිමෙකැ 102
කිමෙකින් 194
කියත් 259, 333
කියතත් 333
කියතැයි 265
කියති 262, 265, 266, 267, 491
කියන 27, 32, 37, 129, 185 222, 235, 299
කියනු 200
කියනුව 5
කියම් 5
කියම්‍හි 5, 379
කියමින් 154
කියමු 381
කියයි 130, 136, 163, 176, 300, 332
කියව 112, 120, 202
කියා 438, 439, 444, 478, 568
කියැ 235, 300
කියැවියැ 3?5
කියු 120
කියූ? 130
කිරණ 345, 349, 506, 546, 552, 575
කිරණය 28
කිරණිනුදුල්ලා (කිරණින් උදුල්ලා) 513,
කිරි 183, 185², 500
–පිඬු 498, 399, 407
–බතට 536
(ඇත් අරුතැ) 545
කිරිය 604
කිරුළින් 518
කිරුළ 503, 544, 576, 583
කිලිටි 391
කිලිටියෙන් 500, 586
කිලුට 173
කිලුටක් 455
කිලුටු 196, 353, 603
කිවත් 178, 244
කිවයි 376
කිවියරු 43
කිවිවරන් 6
කිවූ 90, 112

කිස 64
කිසි 3, 17, 35, 74, 91, 102, 113, 165, 260, 455, 591
කිසිවකු 81
කිසිවෙකුට 238
කී 112, 115, 129, 136, 162, 175, 189, 259, 332, 336, 337, 338, 364, 433, 520, 521, 569
කීකරු 116
කුඩ 485, 486, 502
කුණප 559
කුණු 141, 554, 559
කුඤ්ච (කුංච) 31, 466
කුදු 278
කුඹු 317, 374, 376, 447, 553
කුමක් 381
කුමකට 372
කුමට 143, 179
කුමන්දසි 202
කුමන්දෝ (කුමන් ද හෝ) 194
කුමන 371, 373
කුමරු 388
කුර 30, 151
කුල 39, 41, 60, 155, 329, 340, 352, 385, 585
-ගිරි 503, 596
-දෙව් 343[2]
කුලගතන් (කුල අගතන්) 368
කුලන් 19
කුලඹර (කුල අඹර) 358
කුලයෙකැ (=කුලයෙකැ) 146
කුලැ 368
කුලි 26
කුලුණු 1, 58, 199, 606
කුලුණින් 270
කුලුණෙකිත්තේ 525
කුලෙන් 114
කුලෙහි 342
කුස 64, 332
-තණ 400
(=කුසැ) 359, 368
කුසල් 422
කුසලින් 139
කුසා 347
කුසැ × 87
කුසින් 460
කුසුම් 452, 475, 487, 532
කුසුමින් 47
කුසෙහි 367
කුළු 557, 558[2]
කෙ 22, 61[2], 76, 144, 170, 209, 334, 339, 370, 380, 384
කෙණෙහි 301
කෙණේ 321, 562
කෙත්
-වත් 92
පිත්-172, 323
කෙතෙහි 422
කෙතකුන් 3, 139
කෙතකුන්තේ 306

කෙතකුතට (කෙතකුත් හට) 356
කෙනෙක් 99, 124, 175, 186, 198, 535, 546
කෙනෙකැති (කෙනෙක් ඇති) 123, 125, 126, 127, 128
කෙනෙකි 152
කෙම් 287
කෙමින් 595
කෙමියක් 517
කෙරෙන් 169
කෙරෙති 58, 74, 106, 141, 227
කෙරෙතී (කෙරෙතියි) 50, 144
කෙරෙමි 7
කෙරෙමින් 46, 507, 608
කෙරෙයි 277, 331
කෙරෙහි 37
කෙලෙස් 2
කෙලෙසඳරට (කෙලෙස් අඳරට) 437
කෙලෙසරයනුත් (කෙලෙස් අරයන් දු) 262
කෙලෙසුත් 123, 223, 410, 416, 499, 608
කෙලෙසෙව් (කෙලෙස් එව්) 394
කෙවිලි 299
කෙස් 394
කෙසරුන් 324²
කෙසුරින් 517
කෙසුරු 517, 595
කෙහෙල්ලෙන් 448
කෙහෙලි 24, 345, 534
කෙළ 208, 219, 238, 347, 403, 524, 567
(=කෙළු) × 470
කෙළුවු 321
කෙළි 14, 99, 313, 320, 321 327
කෙළිත 26
කෙළිත 14, 29, 34
කෙළිමින් 321
කෙළී 14
කෙළෙ 239, 254, 507, 611,
කෙළෙන් 271
කෙළේ 246, 247, 252, 253, 266, 440, 462
කො 11
– වේ 13
කොට (කොටැ) 67, 68, 72, 84, 112, 118, 146, 212, 259, 262², 265, 266, 274 289², 331, 355², 360, 371, 373, 377, 399², 401 413², 437, 443, 454², 463 481, 483, 503, 509², 510 527, 528², 530, 531, 532 537², 597²
,, × 521
කොටැ 53, 59, 107, 115, 168, 295, 300, 307 375, 390, 563, 587

–ගනිති 72
–ගෙනෑ 553
කොඩි 486, 502
කොත් 13, 41, 385, 575, 611
කොත 425
කොත් කොත්වලැ 513
කොමලත (කොමල අත) 375
කොසොල් 545
කොලෙෘ් 497
කොලෙෘ්යා 505
ගඟ 204, 254, 297, 316², 427, 503, 519, 520, 522²
ගඟක් 490
ගඟට 399
ගඟින් 254, 393
සුර–161
ගඟුල් (ගඟ උල්) 488
ගං 92, 444, 508, 530, 538, 560
ගජ 16, 31, 51, 483, 535²
ගජන් 55
ගණ 3, 127, 217, 218, 220, 222, 223, 224, 470, 478, 479, 483, 485, 506, 561², 582²
ගණන් 249
ගණිත 241
ගත් 18, 21, 29, 49, 73, 121, 159², 174, 189, 313², 317, 327, 336, 336, 337, 352, 392, 396, 456, 472, 475, 476, 534, 532, 555, 574, 578
දිවැ–473, 477
නික්මැ–480
,, × 502
ගත්තත් 55
ගත්තේ 181
ගත 42, 210, 165, 230, 251, 320, 373, 471
(=ගතැ) 283
ගතඹරින් (ගත් අඹරින්) 159
ගතැ × 88
ගති
දිවැ–459
ගතින් 278
ගතිතල (ගතින් අල) 211
ගතෙව් (ගත් එව්) 386
ගතෙහි 78
ගද
ය–181
ගදයුදය (ගද ආයුදය) 181
ගද 486, 579
ගදට 535
ගදැත් (ගද ඇත්) 378
ගත්තවුත් 49
ගත්තෙෘ්යා 486
ගත්මින් 513
ගන 18, 309, 311, 317, 374, 328, 553
(මැසි) 554, 557, 558
ගනදර (ගන අඳර) 318
ගනදරු (ගන අඳරු) 578
ගනදරේ (ගන අඳරේ) 36

ගනික් 104
ගනිති 47, 138, 236
 අදහා-376
ග්ඛී 244
ගනුත 455
ගනුව 9
ගප් 277
ගමකට 150
ගමට 397
ගමත් 466
ගමත 526
ගමතට 451, 480
ගමනිත් 369
ගමනොත (ගමන් ඔත) 108, 226
ගමෙකැ 110
ගරැ 45
ගල 249, 543
ගලට 547
ගලැ 549
ගලෙකැ 173
ගවර 60
ගවු 101, 366²
ගස්වා 428
ගස 596
ගසා 154
ගසැ 149
ගහ 135
 -පතියෙන් 104
ගහයෙන් 138
ගළ 29
ගළපායා 511
ගා 295
ගාතා 93
ගැට 23
ගැණැ
 -ගත 101
ගැත්වූ 321
ගැනුමට 144
ගැඹර 6
ගැඹුරැති (ගැඹුර ඇති) 7
ගැඹුරැ 83, 253
ගැල් 501
ගැලැ 46
ගැලැවිම 384
ගැවැස්වියැ 310
ගැවැසි 33
ගැසූ 536
ගැ 545
ගෑනු (-දු) 156
ගැමෙක් 97
ගිගිරි 30
ගිජිඳු (ගජ ඉඳු) 250
ගිජිඳුන් (ගජ ඉඳු + උන්) 26, 324, 466
ගි
 -තෙලෙහි 210
ගින්තෙත 131
ගිනි 63, 68, 87, 88, 148, 154 155, 198, 244, 311, 312, 315, 317², 516,
 - දෙවි 153
 -දෙවිය 145
 - දෙවියා 156, 157

–දෙවියාට 135, 148, 149
ගිම් 2, 52, 309, 324
ගිමන් 422
ගිය 92, 95, 96, 149, 151
ගියෙ 180
ගිරි 11, 61, 187, 202, 216, 218, 229, 241, 319², 450, 454², 464, 488, 547, 5 3, 558
කුල–503, 506
ගිරින් 588
ගිරෙක් 187
ගිලනුන් 86
ගිලි 26
ගිලෙන 25
ගිහි 387
ගිහිණි 12, 347
ගී 20, 325
ගුගුරුවා 421
ගුණ 6, 8, 38, 43, 54, 59, 115, 121, 146², 176, 184, 188, 190, 193, 203 215, 271. 329, 330, 331, 332, 333, 334, 335, 336², 337, 338², 339, 356, 423, 424, 425, 472, 475, 491, 493, 494, 521, 540, 602, 611
–මුහුදින් 8
ගුණට 121
ගුණමා (ගුණ අමා) 9
ගුණය 264, 337
ගුණයෙකැ 248
ගුණයෙන් 124, 125, 267, 547
ගුණැති (ගුණ ඇති) 3
ගුණෙන් 344², 432, 581
ගුරු 198, 269, 282, 354, 435, 527
–වර 147
ගුරුළු 174
ගුරුළුන් 322
ගුළි 301²
ගෙ
–උයන් 34, 601
(=ගේ) 527, 547
ගෙට 67, 232, 537
ගෙණ 330
ගෙන් (වි) 79, 86, 91, 131, 123, 137, 342, 344, 345, 346, 347, 348, 496
ගෙන (=ගෙනැ) 48², 62, 63, 74, 84, 19, 134, 158, 163, 170, 177, 204, 249, 256, 260, 317, 324², 501, 589
ගෙනත් (ගෙනැ අවුත්) 398
ගෙනවුත් (ගෙනැ අවුත්) 497
ගෙනැ 395, 417, 430, 475, 476, 489, 496², 553, 596
අදහා–491
ඇරැ–366
කැඳවා–510
කොටැ–553
නැමී–548
වඩා–573
„ × 462

ගෙතැරැ (ගෙතැ ඇරැ) 400
ගෙතැවිත් (ගෙතැ ඇවිත්) 149
ගෙයැ × 328
ගෙයි × 86, 94, 156
ගෙල 141
ගෙවා 382, 406
ගෙහි 66, 387
ගේ (වි) 66, 82, 104, 119, 209, 230, 235, 288, 290, 293, 297, 301², 320, 322, 323⁴, 333, 381. 433, 494, 509²
ගොඩ 7, 215, 272, 542
ගොඩට
එ–543
ගොඩැ 246, 253, 258, 468
,, × 85
ගොත් 38, 504
ගොතිත් 432
ගොදුරට 536
ගොදුරිත් 224
ගොත්
-මස් 154
ගොතකු 149
ගොතා 151, 152
ගොර 160
ගොවුවත් 55
ගොස් 30, 151, 217, 346, 400, 407, 440, 508, 510, 573, 590, 603, 609
ගොස 465, 474, 598
ගොසා 409
ගොසින් 81, 252, 363, 397, 408, 437, 521, 538, 554, 592
ගොළුවත් 325
ගෝ 95
ගෝතම 312, 432
චරණ 264
ජඩ 130, 131
ජන 305
ජය 345
–කොත 425
–බෙර 428
ජයසේන 350
ජරා 78
ජවත් 57
ටැඹ 516
ටැඹයා 426
ත 175
තකා 389
තණ 400
තණක් 93
තත්තේ 181
තතු 90, 266, 332, 441, 594
තද 492, 535, 552
තදින් 396
තදිනි 258
තන් 26², 40², 410
තන්හි 237
තනතුරැ 354, 356
තනතුරෙහි 586
තනතුරේ 352
තනා 185, 446, 530, 532

තපස් 132
තපෝ 124, 125
තබත 550
තබතත් 220
තබත්තෝ 503
තබා 41, $65^2$, $153^2$, 183, 209, 533, 583
තබාලා 81
තඹර 195, 595
තඹරට 122
තඹරු 415
තඹසිළුත් 393
තම 70, 103, 147, 157, $203^2$, 246, 256, $306^2$, $807^2$, 308, 329, 362, 364, 439, 440, 462, 471, 474, 499, 546, 566, 581, 583, 594
,, × 561
තමත් 141, 142, 224, 268, 416, 425, 428, 434
තමා 50, 67, 72, 73, 167, 202, 365, 424, 429, 432, 547
තමායා 358
තර 72, 285, 421
එ–393
තරඟ 17, 285, 459, 555
තරඟේ 297, 575
තරම් 34
තරමින් 25
තරු 127, 577
තරුණ 22
තල්
—මැට 228
තල 310, 325
තලු 346
තව 126, 177
තවත් 136, 163
තවිරමින් 463
තවසර 252
තවුසන් 16
තවුස් 127
තවුසන් 411, 412
තහවුරු 374
තළිය 399
තළියෙකින් 398
තාක් 84
තාළමටා 325
තැත් 7, 478
තැන් 200, 328, 587
තැන්නේ (=තැනැ) 79
තැන $32^2$, 85, 211
(=තැනැ) 74, 126, 227, 589
× (=තැනැ ×) 222, 491, 505
තැනට 521
තැනැ $16^2$, 21, $23^2$, $25^2$, $85^2$ 149, 179, 240, 284, 319, 333, 462, 497, 531, 532
තැනින් 497
තැනෙකැත් 587
තැනේ 244
තැවැරු 43
තැවිලි 196
තැවී 72

ති 198, 269, 354, 425, 527
–මද 26
–ලෝ 185
තිදැස 76
තිඹං 26, 148, 156, 165, 533
තිඹිය 182
තිඹියැ 554
තිඹු 85
තිබෙයි 433
තිර 71, 72, 512
–සර 286
–සරණ 424
තිරිසන් 326
තිරෙන් 578
තිල 211
තිස් 392
තිසුලවි (ති සුල් අවි) 157, 167
තිසෙක් 294
තිසෙකැ 304
තිළී 14, 488
තුටු 55², 57, 76, 126, 142, 232, 339, 362, 410, 413, 457, 474, 493, 539, 545, 600
තුඩ (=තුඩැ) × 299
තුඬු 292
තුඩෙකින් 296
තුති 31, 125, 299, 329, 385
තූතු 379
තුදුසත් (තුදුස් අත්) 401
තුන් 209, 231, 263, 266, 290, 328, 361, 366, 367², 411, 412, 422, 528, 530, 538², 562, 590, 605
තුනට 373
තුනු 377
තුනුවගින් (තුනු අගින්) 386
තුනෙකින් 89
තුනෙහි 609
තුඹු 110, 285
තුමන් 607
තුඹුල් 315, 402, 419
තුර 400
තුරඟ 17, 82, 506
තුරඟුන් 26, 232, 466
තුරට
බෝ–401
තුරු (තරු) 240, 461, 481, 516
(ගස්) 19, 17, 74, 92, 93, 106, 202, 207, 229, 252, 304, 305, 319, 321, 447, 468, 475
පසඟ– 31, 82, 471, 493
තුරේ 352
තුල් 315, 381²
තුළු 593
තෙ 175, 208
–මඬුලු 452
–රුවන් 4
තෙක් 152, 239, 331, 521
තෙකැ 22
තෙකුදු (තෙක් දු) 8
තෙත 58

තෙද 180, 251
තෙදණිත් (තෙද අණිත්) 39
තෙදැති (තෙද ඇති) 125
තෙදිත් 126, 357
තෙපි 152
තෙපුල් 103, 122
තෙපුලෙත් 32, 322, 330, 364, 426
තෙර 147, 254[2], 269, 593
පර– 6, 336
(=තෙරු) 395
එ–395
තෙරට 196, 444, 509, 538
තෙරටා 508
තෙරු 541
එ–180
තෙරිඳු (තෙර ඉඳු) 566
–සඳ 611
තෙරිඳුට (තෙර ඉඳු හට) 568
තෙරිඳුත් (තෙර ඉඳු+උත්) 592
තෙල් 75
තෙලි 296
තෙලියත (තෙල් යත) 133
තෙලෙහි
ගි–210
තෙවුනා 96
තෙසු 368
තොප 75, 152, 509[2]
තොපට 112, 601
තොර 328
තොරණය 28
තොලු 93
තොස් 309, 687
තොස්තෝ 515
තොස 328, 607
තොසිත් 363, 405
තොසේ 48, 109, 417, 538
තෝ 181
තෝරු 386
ද (=?) 11, 22, 76, 119, 136, 137, 144, 163, 166, 168, 170, 172, 177, 179, 180, 182, 209, 334, 371, 373, 374, 380, 381, 382, 418
(= ත්) 48, 61, 104[2], 109, 110, 156, 201[3], 217, 234, 244, 247, 251[3], 258, 264[2], 288, 310, 392, 446, 537, 547, 560, 611,
දක්වමි 8
දක්වත 450
දක්වා 289, 298, 362, 411, 416, 424, 438, 439
දකිත් 233
දකින 219, 221, 406
දකුරු (ද අකුරු) 559
දග 277, 316, 522
(කෙණ්ඩා) 277, 280
දඩ (= දඩැ) 288
දඹු 62, 392
දඹුවල (= දඹුවලැ) 215

දණ 278, 379, 447
දත් 38, 62, 134, 169, 190, 261, 266, 294², 295, 296, 995
දද 14, 171, 486, 512, 519, 576
දන් 24², 41, 356, 507, 537,
දත්නත් 62
දත්නෝ 193⁴
දත්තෝයා 486, 492
දත්වත 449
දත්වයි 122
දත්වා 445
දන 48, 49, 64, 65, 68, 69, 105, 111, 118, 157², 171, 294, 313, 325, 328
දනට 118, 241, 243, 258, 501
දනන් 48, 49, 62, 74, 98, 115, 150, 33ළ, 379
දනන්නේ 306, 307
දනපල් 545
දනයන් 290
දනයෝ 592
දනවත් 48
දනවතුන් 65
දනවත 313
දනවු 105
දන 185
දනැතත් (දන ඇතත්) 61
දනිති 194
දනී (=දනිති) 181
දනෝ 169, 485, 491
දඹ 596
දඹ දිව් 84
දඹ දිවට 385
දඹ දිවැ 255
දම් 45, 348 418
-රජ 431
දමත 249
දමති 62, 494
දමත 62
දමනය 268
දමවයි 554
දමා 9, 96, 403, 404, 530
දමින් 487
දමිනෝ 453, 512
දරණ 174
දරණු 318
දරණේ 321
දරැ 342
දරැවන් 496
අඹු-268
දලවුල් (දල අවුල්) 316
දවස් 404
දවස 604, 607²
(=දවසැ) 115, 219, 240, 403
දවසක් 7
දවසෙක (=දවසෙකැ) 148
දවසෙකින් 562
දවසේ 170
දවස් 67
දස්සෝ 100

දස 45, 233, 237, 318, 319, 326, 327², 334, 338, 348, 354, 387, 394, 402², 461, 464, 493, 551, 563, 604², 611
-පැරුමත් 354
දසට (දස අට) 210
දසත (දස අත) 289
දසබල 239, 245
දහම් 49, 56, 203, 204, 213, 233, 257, 271, 410, 422, 423, 425, 426, 427, 428, 429, 431, 551
දහමට 259
දහමින් 271
දහරින් 324
දහරේ 17
දහස් 33, 37, 217, 227, 257, 368, 391, 411, 464, 534, 565, 574
දෙ- 639
දහසක් 7, 234, 414,
දස- 318, 326, 327
දහසකට 238
දහසට 568
දහසෙක් 599
දහසෙකැ 600
දහසෙකින් 273
දහසේ
දස-319
දළ 88, 250, 277, 282, 297, 425
-දා 605
දළැ 122, 160
දළු 557
දා (ජාතක) 857
(දිනැ) 267, 359, 412
(කැපීම) 66
(දැවී) 92
දළ- 297, 605
දාතු 605
දාතුවෙනි 453
දාවල් 27
දැ (සි) 339
දැක්මට 399
දැක්වී 441
දැක (=දැකැ) 600
දැකැ 104, 105, 147, 165, 258, 325, 386, 389, 404, 438, 477, 499, 500, 603, 607
,, × 21, 44, 284, 382
දැකැප්පුවෝ 498
දැකුමට 479, 505, 522, 603
දැකුමැ 587
දැකි 70², 91, 107, 260, 401
දැත් 379
දැත්වී 270, 403
දැත (=දැතැ) 501
-ගෙතැ 505
දැතැ 106, 115, 235, 261, 270, 364, 411, 507
-ගත 249, 263, 332
-ගෙතැ 27, 266, 494, 505
දැති 91

දූතුන් (දූත් දු) 100, 243, 245
දූතුදු (දූත් දු) 156
දූනෙත 115
දූනෙයි 167
දූනෝ 244
දූපුණෝ 585
දූබි 344
දූමුණෝ 585
දූය (=ඥදය) 116
දූයදුන් (දූ අඳ + උන්) 325
දූයි 81, 202²
දූරු 45, 547
දූල් 23, 279, 311, 315, 317, 419, 532
දූලි 283
දූවැටි 141, 346, 542
දූවැටියෝ 540
දූවැටී 121
දූවැටියෝ 161
දූසමන් 615
දූසි 100
දූවැටි 62
දූ 282, 576
දූනෙන් 99
දික් 275, 308², 451, 548, 611
දිග 298, 400
දිගට 302, 448
දිගත් (දිගු අත් 588
දිගත (දිගු අත) 18, 230, 233², 363, 465, 468
දිගතැ (දිගු අතැ) 30
දිගැ 423
දිගැටි 894
දිගැසිත් (දිගු ඇසිත්) 363
දිගිත් 290
දිගු 43, 214, 274, 346, 390, 392, 455, 463, 473, 511, 565, 574, 611
-බිත් 476
-බිත 43
දිගෙහි 387
දිගේ 297
දිටි 236, 542
දිටු 196
මිස-204, 422, 603
දිඩ 485
දිත 62², 190², 610
,, (දිතැ) × 610
දිතත 16
දිතසුන් (දිති අසුන්) 508
දිතැ × 117, 206
දිතිඳ (දිතැ ඉදු + අං) 357
දිතිදු (දිතැ ඉදු) 206, 473
දිති යැ 260
දිතෙහි 362
දිතෝ 414, 458, 504
දිඹුල් 74
දිඹුලෙහි 171
දිමුත් 476, 477
දිය (ජය) 41, 609
(ජල) 28, 48, 69², 83, 92, 93, 101, 140, 177, 285, 242, 283, 303, 312, 316, 817, 324, 336, 843, 421,

433, 454, 468, 569²
(ලොව) 288, 440
දියට 174, 535, 543
දියවා 520
දියත 204, 223, 231, 349
දියතට 548
දියතැ 175, 865, 426, 459, 460
දියතෙහි 267
දියවර 154
දියලේ (දිය අලේ) 204
දියැ 41, 205, 468
දියැඳ (දිය ඇඳ)171
දියුණක් 93
දියෙහි 205
දිළි 23, 33, 73, 126, 274, 314, 345, 369, 418, 456, 503, 507, 511, 516, 595
දිළියෙත්තේ 518
දිළිහෙත 420
දිලෙත 469
දිලෙති 39²
දිලෙත 302, 380, 577
දිලෙසි 304
දිව් 595
දිව 31, 174, 207, 215, 227², 221, 222, 229², 251², 278, 328, 398, 460², 522, 557, 588
දිවකුරු 239
දිවඳුත් (දිවා අඳ + උත්) 323
දිවයිත 32
දිවයිතැ 319
දිවා 5, 420
දිවැ 298, 473, 536
–ගත් 477
–ගති 459
දිවැස් (දිව ඇස්) 404
දිවැස (දිව ඇස) 186, 594
දිවි 118, 282
දිවියත් 320
දිවි 460, 461, 463, 464
දිවූ 563
දිවෙත (දිවැ එත) 100
දිවෙත 535², 536, 537, 553
දිසි 78, 240, 273, 337
දිළිඳුත් 537
දිළුණු 23
දී 67, 268, 397, 430, 438, 470
යා–150
දීමට 537
දු 202, 256
දුක් 46, 47, 53, 55, 91, 103, 111, 120, 135, 186, 163², 171, 177, 192, 198, 199, 200, 201, 203, 258, 307, 308, 311, 312, 326, 439, 492, 494, 526, 564, 603
–බික් 78, 91, 103, 535
දුක 52
දුකක් 238
දුකට 102, 103, 191, 525
දුකුලවු 87
දුකෙක් 35, 78

දුකෙකි 91, 93
දුකෙහි 207
දුගී 61, 86, 143
දුට 379
දුටු 63, 203, 284, 406
දුටුදුටුවන් 360, 372
දුටුදුටුවනට 374
දුටුමෙන් 191²
දුන් 75, 80, 142, 148, 201, 240, 241², 242, 243, 320, 325, 377, 393, 398, 400, 411, 500, 576²
දුන්නෙ 250
දුන්නෙහි 70
දුන්නේ 248², 307, 525
දුනු 555
 දෙව්-519, 555
දුප්පත් 68
දුම් 479, 486
දුර 97
දුරකට 480
දුරු 70, 182, 270, 324, 492, 526, 577
දුරුරු (දුරු ඇරු) 134, 223, 378
දුරින් 115, 567
දුරැ 2, 36, 69, 70, 113, 129, 144, 253, 262, 318², 405, 460, 521, 547², 551, 559, 567, 591
දුලද 137
දුලබ 95
දුවන 253
දුසිරි 38, 98, 125, 425
දුසිරී (=දුසිරි) 173
දුහඹ 99
දුහුලින් 320
දුළ 506
 පැහැ-279
දෙ 9, 197, 215, 221, 228, 272, 273, 276, 278², 287², 294², 298, 308, 366, 381, 391, 446, 447, 449, 471, 489, 531, 571, 601, 609
 –දහස් 609
 –පට 452
 –පිට 572
 –සැට 422
දෙක 132, 166, 293
දෙකක් 284
දෙකෙකි 273
දෙටුවන් 39
දෙන 466, 469
දෙනි 66, 67
දෙදරවා 429
දෙදෙන් 18
දෙන්ට 202
දෙන්නේ 306², 307, 492
දෙනු 19, 41, 74, 118, 131, 143, 325, 501, 596, 597, 606
දෙනතුල් (දෙන අතුල්) 51
දෙනු 355
දෙනෙත් 586

දෙමැයි 552
දෙමිත් 47
දෙය 19, 145
දෙයක් 51, 139
දෙයකට 505
දෙයි 136
දෙරණ 218, 220, 235, 333, 352, 472, 597
දෙරණට 451, 552
දෙරණතැ 30
දෙරණඹරතුර (දෙරණ අඹර අතුර) 595
දෙරණය 28
දෙරණැ 469, 450
දෙව් 44, 108, 482
දෙවඟන (දෙව් අඟන) 221
දෙවති 68, 199
දෙවත 24, 199
දෙවා 299
දෙවි 343
(සේදූ) 343
කුල-343
තර-343
දෙවිඳු (දෙව් ඉඳු) 243, 347
දෙවිඳුට (දෙව් ඉඳුට) 208
දෙවින්දේ (දෙව් ඉඳු + ඕ) 225
දෙවියන් 15, 3', 78, 180, 555
දෙවියනට 343
දෙවියා 161
දෙවියෝ 106², 138, 1 1, 142, 164, 229
දෙවෙනි 36
දෙස් 188²
දෙස 95, 306², 327, 338, 416, 461, 461, 540, 554²
දෙසට 200
දෙසත 212, 598
දෙසත 213, 234, 291
දෙසව 410, 539
දෙසං 409, 416, 569
දෙසැ 188
දෙසින් 12
දෙසියැ 203
දෙසුයෙන් 266
දෙසූ 408, 599, 606
දෙසේ 52, 60, 221, 402
දේ 112
දේයං 308²
දෛඩවාලිය 309
දේමිනස් 307
දේමිනසක් 260
දේමිනසින් 67
දේර 28, 207, 328, 391, 439, 537
දේරගුළු (දේර අගුළු) 214
දේරට 565
දේරැ 24, 143
,, × 86
දේරින් 24, 143
දේරෙහි 28, 207
දේස් 17, 167, 168, 182, 422
දේස 9
දේසං 113
දේහොත (දේ හත) 469

දෙලොස් 293
ඳෙ 370
(ද හෙ) 372
(තුන් අරුත්) 588
-නා 353
ඳෙනා 185, 352
නගති 225
නගුට 151
නංවා 425
නට 121
නටති 490
නටන 98, 170
නටවන 98
නත 174
නතු 107
නද 329, 465, 466², 469
නදට 234
නඳ 234, 457, 500, 570, 577, 611
මන-304, 342, 421, 580
නඳවා 511
නඳු 267
නඳුන් 550
නඳුන් 576
නන් 22², 24, 313², 325, 513², 533, 555, 561
නන්දන 313²
නපුර 150
නපුරැයි 96
නම් 5², 9, 38, 98, 123, 125, 127, 132, 138, 141, 164, 264, 270, 312, 350, 351, 369, 388, 393, 398, 417, 420, 432², 436
(=හොත්) 432
නම්වා 365
නම 4, 262, 307, 383, 428, 524
නමක් 130
නමට 44
නමඳිම් 1
නමින් 124, 126, 269, 353, 358, 361
නමිත 128
නමිතේ 504
නය 229, 251, 522
නර 44, 140, 143, 341, 382, 550
-ඉසුරු 438
-දෙව් 343
-විරු 253
නරකය 311
නරන් 331, 341, 362, 413, 542
නරනිඳු (නරන් ඉඳු) 256, 417
නරනිඳුන් (නරන් ඉඳු + උන්) 355, 541
නරනිඳුහු (නරන් ඉඳු හු) 37, 543
නරනින්ඳේ (නරන් ඉන්ඳු + ඕ) 503
නරපා 507
නරඹති 217
නරඹන්නේ 525

තරඹා 233, 363
තරයත් 128, 182, 322, 471
තරයත්තේ 525
තරවරු 415
තරෝ 141
තල 226, 402
තලඹල (තල අඹල) 24
තව 2, 387, 424
තවත්වත්තේ 473
තවතති 199
තවහම් (තව කම්) 458
තස්වා 422
තසනි 49, 56
තසා 49
තහර 87, 88, 291
තහරු (=තහර) 292
තහරුට (තහර ඇට) 187
තළ 556
තළල් 302
තළල 298
තළු 98, 170
තා 174, 185
-දේ-535
තාදේ 31³, 493
තැඟැ 121, 122, 591
තැඟි 401, 450, 458
තැඟී 390
තැඟු 41, 484, 485
තැඟෙත 272
තැඟෙන 117, 488, 556, 571
තැංඟ 61
තැණ 1, 146², 147, 264, 270, 329
තැණවත් 169
තැණැති (තැණ ඇති) 59, 491
තැණිත් 270, 403, 461
තැත් 21
තැත්තේ 245
තැත (=තැතැ) 18, 99², 153³, 335², 375
(=තැත්තම්) 153, 167, 179, 198, 205, 210
තැතවසර (තැත් අවසර) 86
තැතැ 21
තැති 20, 79, 92, 93, 94, 97², 98, 102, 109, 150, 153, 156, 175, 186, 187², 199, 243, 267, 326, 333, 366, 371, 379, 498², 546
තැතිසි 131
තැතියෙන් 113
තැබ 273
තැඹුරු 89
තැඹුළු 558
තැමැ (තැමැදි) 306
තැමඳ (=තැමැඳැ) 200
තැමැඳැ 90, 539
තැමි 40, 216, 232, 278
තැමියැ 306
තැමී 40, 216, 232, 278
-ගෙතැ 548
තැව් 501, 511, 519, 541
තැව 48, 516, 542, 543
තැවතත් (තැවතැ ද) 339

නැවැත්වූ 348
නැවැති 38, 98, 125, 389, 480
නැවිත් 147
නැසි 206
නැසුණු 252
නැසුවෙෆ් 152
නික්මැ 481
-ගත් 480
නික්මිණි 457
නික්මුණු 458
නික්මෙත 465
නික්මෙනු 491
නිකට 294
නිකසළ 139, 186, 279, 282, 327
නිකුත් 234, 450, 461, 477 483
නිගණ්ඨනාතපුත් 126
නිත්ත 79
නිතර 15, 18, 59, 61
නිති 17, 28, 58, 59, 98, 116, 156, 238, 323, 366, 430, 566, 604
නිතියෙන 73, 74, 128
නිතියෙහි 65
නිතොර 334, 429, 507
නිතොරු 56
නිතොරේ 36, 101
නිදත් 366
නිදා 591
නිදි 321
නිත්දා 178
නිනාදේ 31
නිපුණෝෆ් 585
නිබොරු 376
නිබොරුවට 118
නිම 273
නිම්මත් 338
නිමල් 579
නිමල 273
නිමැවි 261
නිමි 356
නිමිති 551
නිය 234, 345
නියගිත් (නිය අගිත්) 387
නියතා 158, 356
නියතැයි 265
නියතින් 278
නියම 259, 266, 331
නියමිති 47
නියමෙන් 70
නියළී 14
නිරංජන 305
නිරතුරු 315², 354, 460, 605
නිරයට 308
නිරයත් 317
නිරයේ 318
නිරි 314, 316
නිරිඳු (නර ඉඳු) 346, 435, 436, 437, 441, 44, 478, 544
-සඳ 421, 609
නිරිඳුන් (නර ඉඳු + උන්) 35, 107, 113, 117, 332, 342, 345, 574, 576
නිරිඳෙක් (නර ඉඳු + එක්)

341, 350
නිරිඳෞ (නර ඉඳු + ඔ) 120, 339, 434, 436, 534, 570, 583
නිරින්දේ (නර ඉන්දු + ඔ) 195
නිල් 285, 300, 303, 458, 473, 553, 579
ඉඳු-303, 371, 458
නිවට 121, 143
නිවටුන් 121, 130
නිවටෝ 131
නිවන් 123, 197, 396, 409, 416, 417, 429, 542, 600, 608
නිවන 198
නිවනට 529‘ 599
නිවා 148
නිවී 154
නිස්පල 239
නිස්සෝ 100
නිසග 140
නිසරු 155, 460, 483
නිසල 46, 59, 327
නිසා 49, 130, 163; 171, 179, 564
නිසි 50, 100, 114, 168, 175, 203, 219, 262, 330, 443, 501, 509, $510^{2}$, 514, 527, 528, 571, 584, 596, 607
නිසියහ 44
නිහඬ 29
නීති 38, 116
නුකුලන් 60
නුග 397, 455
නුගුණ 54, 113, 346
නුදුටු 188, 336, 338, 370
නුදුටුයෙන් 75
නුදුටුවෝ 191
නුදුරු 334
නුබ 105, 235, 310, 338, 465, 372, 380, 420, 470, 553, 558
නුබැ 469, 479, 575
නුමුත් 21, 475
නුමුසු 39
නුවණ 153, 220, 237, 333
නුවණැති (නුවණ ඇති) 115
නුවණැතියෙනි (නුවණ ඇති + එනි) 9
නුවණින් 406
නුවන් 197, 457, 476
නුවනින් 50
නුවර 15, 72, $80^{2}$, 256, 417
නුවරට 80, 418, 435, 510, 521, 573
නුවරු (=නුවරූ) 415
නුවරූ 78, 528, 576
නුවරැ 89
නුවරැන් 103, 593
නුවරෙක් 10
නුවරෙහි 81, 439
නුවරෝ 113
නූ (නුවූ) 275
නෙක් 120, 502, 504

නෙත 325
,, × 231
නෙතට 203, 383, 385
නෙතැ × 286
නෙතැති (නෙත ඇති) 303
නෙතින් 260
නෙලෙනි 513
නේ 406
නො 6, 8, 17, 26, 35, 39, 40, 41, 44, 46, 47, $48^{2}$, 49, 50, 51, 53, 54, 55, 56, 58, $62^{2}$, 63, $64^{2}$, $66^{2}$, $67^{2}$, 69, 70, $74^{2}$, 76, 77, 84, 91, 99, 102, 106, 108, 109, $110^{2}$, 116, 120, $134^{2}$, 138, 139, 140, 142, 138, 152, 154, 156, 162, 164, 165, 168, $169^{2}$, 171, 173, 178, 180, 181, 182, $188^{4}$, $189^{5}$, $190^{5}$ 192, $193^{2}$, 194, 202, 203, $206^{2}$, 213, 232, 235, 236, 237, 238, 239, 243, $244^{2}$, $251^{2}$, 255, 258, 260, $261^{2}$, 262, 266, 272, $278^{2}$, 283, $284^{2}$, 287, 290, 291, 294, 295, 296, 300, $306^{2}$, 307, $308^{2}$, 318, 344, 351, 361, 362, 370, 379, $380^{2}$, 381, $382^{2}$, 387, 388, 389, 392, 394, 396, 398, 399, 404, 406, 407, 409, 411, 412, 430, 433, 434, 450, 455, 465, 466, 479, 485, 491, 493, 495, 498, 499, 500, $502^{2}$, 505, 508, 518, 519, 521, 522, $524^{3}$, 526, 533, 549, 552, 554, 560, 563, 567, $571^{3}$, 573, 583, 586, 587, 588, 591, 603, 604, 608, 610
-කොත් 481, 547
නොයෙක් (නො එක්) 12, 19, 27, 92, 95, 145, 148, 219, 445, 468, 547
නොයෙක (නොයෙක්) 166
නොකලැකි (නො කල හැකි) 3
පට 448, 452, 463, 512, 514, 531, 534, 572, 578
පටන් 239, 242, 289, 530, 609
පටල 305
පටී 453
පඬි 249, 255
පඬුරු 47, 436, 438
පණ 25, 322
පත් 6, 118, 136, 174, 295, 313, $314^{3}$, 385, 402, 474, 484, 502, 516, 344, 557, 564, 565
අසි-313
පත 18
උඩෙළි (උඩ එළි)-232
එළි-232
පතඟ 380

පතර 147, 393
පතව 603
පතල 1, 567
පතලේ 204, 462, 558
පතා 133, 158, 356, 566²
පතෑ 283
පතිත 603
පතුරුවති 54
පතුරුවා 37, 427
පතුල් 272, 381
පතුල 273, 274, 276
පතෙහි 433
පද 122, 195, 201, 202, 345, 423, 499
පදමින් 487
පදරුත් (පද අරුත්) 263
පදරුත (පද අරුත) 1
පදෙව් 343
පදෙවියා 161
පඳුරින් 024
පත්
–සිල් 604
–ගත් 418
පත්සිය 442
පත්සියක් 411, 600
පත්සියයක් 485
පතත 506
පතවා 514
පතසක් 399
පතසින් 407
පබඳින් 396
පබසර 463
පබළු 12, 458, 584
පමණ 3, 34, 68, 140, 154, 211, 235², 240², 290, 333, 395, 584
පමණක් 93, 447, 520, 543, 589
පමණට 68, 383, 527
පමණින්, 270, 329, 509
පමා 9
පය 201, 279, 459
පයට 211
පයැඳු (පය ඇඳු) 300
පර 52, 95, 147, 196
–තෙර 6, 336
–වැඩ 426
පරපුර 340
පරපුරින් 357, 349, 350
පරයා 241, 293
පරසිද්ධේ 504
පරසිදු 19, 114, 124, 349, 361, 437
පල 49, 74, 132, 153, 155, 157, 172, 195, 237, 252, 259, 355, 412, 455, 457, 486, 504, 518, 525, 596
පලක් 365
පලගක් 289
පලගේ (පල අගේ) 575
පලස් 274
පලසින් 516
පලසෙකින් 456
පලහා 151

පලා (=පැලැ) 495
පලු 275, 519
පලෙක 352
පව් 131, 123, 168, 262
පවත් 104
පවත්වත්වත් 474
පවති 30
පවතිත් 37
පවතිති 59, 60
පවතින 46, 115, 166, 569
පවතිනෙ (පවතිත් එ) 299
පවතී 237,243
පවතු 606
පවත් 107, 108, 475
පවනක් 60, 467[3]
පවනිත් 309
පවර 10, 123, 209, 216, 252, 346, 350, 368, 385, 388, 431, 442
පවරු 507
පවස 177
පවසත 233
පවසති 113
පවසා 6, 184
පවා 76, 547,
පවුර 431
පවුරිස් (පවුරු ඉස්) 83
පවුරු 11, 83, 418
පවුරෙකිත් 590
පවුරෙහි 72
පස් 17, 57, 98, 220, 241, 257, 337[2], 367, 444, 568
පස්සේ 519
පස 446, 571
පසඟ (පස් අඟ) 31, 474
පසත් 343
පසව 53
පසස්වා 428
පසලොස් 264
-වක් 609
පසාකර 405
පසැ 276, 449, 471, 569
පසිඳ (පසිඳැ) 608
පසිඳැ 123
පසිදු 128, 147, 223, 345, 610
පසිත් 57
පසු 62, 190, 288, 831, 360, 390, 398, 482, 483[2], 519, 537
පසුත් 564
පසුරු 4
පසෙකැ 584, 586, 593
පසේ 221, 215, 447, 489
පහ 13, 33, 86, 120, 867, 419, 511, 518, 531
පහණ 201
පහදු 200, 224
පහදුව 602
පහත් 24, 227, 280, 300, 801, 304, 335, 380, 397, 392, 393, 572
පහතෙක් 187
පහතේ 512
පහය 33

පහළ 189, 424
පළ 176, 418
පළඳින 160
පළත් 469, 494
පළලින් 290
පළා
–ගෙනැ 537
පළොල් 418
පළොලින් 229
පා 280, 287, 507, 545, 550,
පාදේයා 308
පාන (ක්‍රි:) 551
පාතෙව් (පාතා එව්) 79
පාය 576
පායා 511[2]
පායැ 574
පාළිය
පෙළ–507
පැටි 346
පැටියෝ 584
පැතිරැ 464
පැතිරි 575
පැතිරී 30
පැතිරේ 36
පැතුවෝ 98
පැදුමෙන් 541
පැන් 177, 590, 591
පැනැ 254
–ගෙනැ 461, 553
පැනෙන 287
පැමිණැ 565
පැමිණි 107, 347, 355
පැමිණියහ 599
පැරුමත් 354, 394
පැලැඹෙන 164
පැවැත්වූ 348
පැවැත (=පැවැතැ) 153
පැවැතැ 350
පැවැති 38, 39, 117[2], 145, 263, 403, 404, 439, 610
පැවැසියැ 209, 334
පැවැසී 179
පැවැසූ 103, 257, 331
පැහැ 12, 13, 18, 159, 228, 275, 291, 298, 871, 419, 460, 461, 462, 468, 553, 555
පැහැදූ 259
පැහැදී 35, 168, 599
පැහැපත 375
පැහැය 86
පැහැයක් 371
පැහැයෙන් 455
පැහැර (=පැහැරැ) 15
පැහැරැ 578
පැහැස (පැහැසැ) 461
පැහැසි 105
පැළ 400
පැළැඳැ 584
පැළැඳි 13
පැළැත්දේ 503
පෑ 279, 298, 381, 545
පෑතුරැ (පෑ අතුරැ) 296
පෑදේ 493

පැදේ (යා) 308
පිට 201
(=පිටැ) 174, 272, 276, 302, 390, 401, 431, 454, 488, 572
×136
පිටත් 295
පිටතට 463
පිටැ 287², 363, 401, 451, 484, 549
පිටි 276
පිටිනි 501
පිඩු 399, 407
කිරි-898, 399
පිණිස 66², 369, 461, 611
පිණිසේ 52
පිත් 352, 547
පිතු 365
පිදුමෙන් 541
පිදුමයි 170
පිදුවොත් 162
පින් 114, 131, 132, 146, 173, 358, 388, 422, 442, 486, 566, 604, 607
(=පින) 376
-කෙත් 223
පින 190²
පිනක් 8
පිනවන 198, 505
පිනවා 514
-ලියැ 515
පිනැති (පින් ඇති) 19
පිනි 148, 329
පිනු 180
පිනෙකි 525
පිපි 310
පිපුණෙ 319
පිපෙයි 214
පිඹැ 466
පිඹිති 225
පිඹිය (පිඹි යැ?) 182
පිය 23, 90, 247, 301, 309, 322², 352, 544, 582
පියකරු 286, 274, 438
පියවර 209
පියවරක් 363
පියවරින් 538
පියා 470
පියුම් 23, 214, 281, 451, 549, 550
පියුමක් 517
පියුමින් 522
පියුම්ළු (පියුම් ඉළු) 516, 517
පියුමෙහි 63
පියෙනි 338
පියොවුරු (පිය ඔවුරු) 374, 376
පිරි 119, 124, 185, 199, 340, 388, 415, 447, 496, 514, 537, 590, 609
(=අගල) 599
පිරිත් 569, 590, 591
පිරිත 569
පිරිතට 568

පිරිතිරි (පිරී ඉතිරි) 28
පිරිදෙව් 306
පිරිනිවි 609
පිරිබඩ 496, 513, 579
පිරිමදිති 217
පිරිමදිතේ 278
පිරියම් 283
පිරිවර 218, 219
පිරිවරටා 520
පිරිවැරු 517²
පිරිස 90, 213, 91
පිරිසට 481
පිරිසිඳ (=පිරිසිඳැ) 329
පිරිසුදු 114, 124, 258
පිරිසුදුවා 581
පිරිසේ 528
පිරී 30
පිරුණු 22, 23, 32, 59, 235, 264, 287, 288², 293
පිරු 83
පිල් 12, 320, 496
පිවිටු 121
පිවිතුරු 559
පිස්වූ 320
පිස (=පිසැ) 404, 146
පිසස් 567
පිසසුන් 561
පිසිත 467
පිසී 110
පිසේ 109
පිහිටක් 102
පිහිටි 97, 99, 207, 289, 281², 315
පිහිටෙත (පිහිට එත) 207
පිළු × 86
පිළිකුල් 172
පිළිකුල 141
පිළිකුලි 88
පිළිගනියැ 216
පිළිගෙනැ 421
පිළිම 605
පිළිමල් 27
පිළිමිණි 516
පිළිරු 43
පිළිවත් 202
පිළිවිසැ 478
පිළිවිසි 330
පිළිවෙත 396, 606
(පිළිවෙතැ) 99
පිළිවෙතැ 397
පිළිවෙළ 19, 403
පිළිසඳර 438
පිළිසරණ 3, 601
පිළිසිඳැ
–ගෙනැ 359
පිහිට 601
පිහිටි පිළී 488
පිළු 325
පුට 9
පුණු 219
පුත් 351
පුද 128, 133, 145, 149, 155, 161, 166, 168, 171, 172, 173, 175², 227, 327, 445,

449, 489, 497, 503, 504, 507, 508, 509[2], 517, 540, 561, 562, 563, 570, 605[2], 608, 610
-සිරි 183
මහ-149
පුදත් 527
පුදට 143, 150, 175, 272, 479, 556
පුදන 148, 364
පුදන්තෝ 502
පුදන 157
පුදමින් 487
පුදසට 225, 486, 488, 489, 528, 557
පුදයෙකි 153
පුදවා 135
පුදා 4, 148, 200, 201, 561
පුදෙන් 153, 157
පුදෙහි 430
පුත් 206, 349, 357, 372, 516, 33
පුප 310
පුබුදිත 591
පුබුදුවා 581
පුම්බා 423
පුර 11[2], 14, 15, 18, 28, 30, 339, 340, 31, 409, 417, 422, 422, 429, 542, 559, 562, 563, 565[2], 568, 572, 573, 590, 608, 610
පුරට 84, 259, 355, 435, 440
පුරටා (=පුරට) 508
පුරත 63
පුරම් 8
පුරඹර (පුර අඹර) 14
පුරයෙන් 479
පුරව 604
පුරවර 239, 592[2]
පුරවා 429, 532
පුරවි 234, 239
පුරා 56, 292, 354, 356, 447, 569[2], 607
-ගෙතැ 354
පුරැ 444
පුරිස් 291
පුරිසදම්සාරති 268
පුරුක් 11
පුරුදු 114, 349, 604
පුරෙක් 11
පුරෙහි 351, 360, 530, 570
පුරේ 17, 36, 101, 352
පුල් 60, 207, 229, 418
පුලුත් 402
පුලුතක් 280
පුලුතැ 549
පුවත් 104, 339
පුවතර 69
පුහුදුත් 45
පූරණ කසුබු 123
පුළුලැති (පුළුල ඇති) 511, 574
පුළුවුත් 339
පෙණ 322, 470, 522
පෙත 58, 558

පෙති 281, 459[2], 460, 517
පෙදෙන් 611
පෙදෙසේ 48
පෙත්වා 387, 425
පෙනෙතට 276
පෙනෙයි 231
පෙම් 35, 77, 314
-කෙළි 321
පෙම 521
පෙමින් 47
පෙර 4, 112, 117, 288[2], 341, 389, 391
(=පෙරළ) 6, 411
පෙරට 482
පෙරහර 218, 328, 449, 573
පෙරහරින් 445
පෙරළ 47, 90, 96, 109, 139, 145, 146, 155, 184, 219, 240, 323, 406, 578
පෙරළෙමින් 246
පෙරෙවැ 456
පෙරේමය 284
පෙළ 481, 506, 582
,, × 511
පෙළහර 411
පෙළින් 23, 419
පේ 604
පේත 312
පොකුණු 23, 34, 418
පොකුරින් 324
පොතෙකින් 261
පොද 167
පොබයන 467
පොබයා 426, 585
පොවන 73, 177
පොළමින් 280
පොළොව 241, 421
දිය-454
පොළොවෙහි 337
පෝ 359, 604
බග 271
බගවත් 271
බජනය 271
බට 84, 413, 552
බටුවෝ 191
බඩ (කුසය) 134, 596
(අයිතෝ) 596
(භාණ්ඩ) 596
බඩග (බඩ අග) 216
බඩු 46, 489, 501
බණ 184, 192, 212, 313
බණසා (බණ අසා) 608
බත් 61
බතට 536
බඳුන් 41
බඳ 129, 304, 319, 421, 448, 473, 580, 611
බඳවා 512, 519
බඳැඳිලි (බඳ ඇඳිලි) 122
බඳින 160, 458
බඳු 114, 142, 339, 349, 349, 361, 433, 452, 515, 546, 598
බන් 18, 24, 26, 513

බන්දනයෙන් 328
බබලන 12, 54, 126, 127, 384, 386, 453, 610
බබලයි 517
බඹ 195, 217, 222, 230, 268, 286, 331, 333, 341, 346, 355, 362, 364, 370, 498, 409, 413, 419, 445, 481², 550, 562, 598, 599
-සර 97, 374
-සුරතරන් 331
බඹයන් 290
බඹහු 225, 378, 395
බඹා 374, 533
බඹුන් 409, 423
බමුණකු 400
බමුණන් 134, 137, 153, 536
බමුණු 104, 146², 157
බමුණෝ 585
බයංකාර 5
බර 252
බරණ 22
බරණැස 237², 244, 411, 486, 509², 527, 561
බලත් 85, 169
බලන 52, 230
බලති 52
බලන 231
බලව 75, 375
බලවත් 313, 484
බලා 40³, 99, 151², 253, 257, 285, 400, 477, 539, 540'
-ගෙනැ 491, 495
බලි 85
බලු 82
බව 326², 364²
(සසර) 45,191, 196, 198, 200, 258, 269, 311, 412, 494, 499, 551
බුදු-498
රජ-548
-සිදු 4
බවගෙහි (බව අගෙහි) 387
බවට 314, 485, 544
බවයෙන් 168
බස් 103, 153, 163, 171, 188², 190, 192², 222, 265 300, 322, 434, 488
බස 42, 50², 90, 95, 115, 181, 197, 212, 299, 332, 441
,, × 87
බසට 40, 136, 329
බසසා (බස් අසා) 113, 120, 130
බසැ 121,193
බසින් 208, 320, 385
බසිනෙළි (බසින් එළි) 122
බසිමින් 520
බහයි 197
බහා 282
බහු
-රූ 490
බළලුන් 323

බළෞ් (ය) 505
බා 152, 178
බාතා 329
බාවා 543
බැගැ 88
බැගිත 589
බැණවූ 322
බැති 59
බැතින් 487
බැඳ (බැඳැ) 77, 149, 180, 490, 500, 514, 611
බැඳැ 80, 157, 224, 258, 365, 436, 449, 453, 584, 577
-ගෙතැ 491
බැඳි 18
බැඳී 35, 168², 430²
බැදුණෙන් 384
බැඳුමෙන් 412
බැත්දෙ 195, 499, 503
බැබැළි 303
බැබැළී 14
බැම 302
බැල්මක් 260
බැලුවන් 186, 276, 326
බැවින් 75, 112, 134, 271, 304, 527, 552
බැවිත 111
බැවිනි 94
බැවිනෙවිට (බැවින් එ විටැ)
බැවෙහි
අත්-195
බැසා 9, 192, 543
බැහැරට 213
බිඟු 23, 47, 532, 535
බිජු 204, 211, 422
-වට 173
බිත් 473, 518
දිගු-476
බිත 43, 392
බිතු 13, 83
බිඳ 329
(බිඳැ) 336, 351
බිඳක් 8
බිඳැ 347, 402
බිඳු 140, 433, 598
බිම 58
-402
බිම්බා 423
බිම්සර 415, 435, 436, 438, 442
බිම 309, 319, 515
බිමැ 46, 205², 492, 531, 571, 572, 579
බිය 2, 4, 43, 89, 182, 199, 253, 313, 323, 348, 424, 450, 563
බියකර 86
බියකරු 315
බියෙකි 91
බියෙකුත් 79
බියෙන් 35, 95
බිලි 85
බිලියෙන් 316
බිසෙව් 609

බිසොවුන් 359
බිසෝ 386
බිහි 26, 359
-වන 147
බීගිරන් 325
බීත 312
බුදු 43, 123, 124, 125, 127, 128, 184,² 244, 270, 311, 312, 314, 326, 329, 342, 336, 337, 338², 356, 364, 406, 411, 424, 432, 461, 468, 477, 47 , 497 498², 539, 50, 564, 607
**බුදුගුණ අලංකාරය** 5
බුදුන් 75, 129, 230, 235, 239, 304, 311, 312, 326, 333, 478, 491, 543, 573, 586, 602
බුදුන්නේ 248
බුදුනැ (=බුදුන් යැ) 130, 132
බුදුනැයි (බුදුන් යැ යි) 524
බුදුහු 526
බුබුලක් 303
බුමු 214, 451, 549
බුමුතුරුණු (බිම් + උ අතුරුණු) 579
**බුවනෙක බුජ** 609
බුහුටි 236, 394
බූ 567
බෙදූ 196
බෙදුමෙන් 274
බෙදුමයෙන් 271
බෙර 86, 215, 291, 428, 444, 465, 472, 530
බෙල්ලකු 182
බෙහෙදක් 307
බොහ 65, 73, 111, 255, 500
බොරු 115, 137, 144, 145, 152.
බොරුනත (බොරු අනත) 179
බොරුවෙන් 134
බොල් 309
බොලට 276
බොහෝ 162, 244
බෝ 605
-තුර 600
-තුරට 401
බෝසත් 344
ම (=මැ) 2812, 362², 406
(=මා) 337, 338
-බස 181
-ගේ 119
**මක්ඛලිගෝසාල** 128
මකා 41, 477
මග (මැ අග) 496
**මගද** 212, 437
මඟ 97, 98, 204, 215, 246, 254, 259, 412, 428, 443, 444, 446, 448, 467, 489, 496², 528, 529², 532, 555, 562
-පෙලෙන් 198
මඟැ 109, 531

,, ×85
මඟුල් 531
මට 337
මඩනා 549
මඩල 52, 293, 302
මඩලට 213, 320, 322, 481
මඩලෙව් (මඩල එව්) 514
මඩලේ 243
මඩවා
–ලියා 309
මඬිත 133
මඬු 580
මඬුලු 20, 452
මත 393
මතු 379, 389, 404, 597
–මහල් 419
මතුරා 137, 383, 432
මතෙකින් 261
මිද
නි–26
මදට 469
මද 77, 163, 177, 220, 242, 251, 260, 292, 351, 388, 398, 475, 500, 570, 580, 608
මදකුත් 295, 296, 326, 500,
මදකුදු 433
මදු 412
මදින් 8
මදිනි 2:8
මන් 25, 351, 369, 429, 546
මන්දුනු 343
මන 277, 505, 522, 570, 610
-කල් 317, 367, 419, 579
-කල 273
-නඳ 304, 342, 421, 580
-රඟ 161, 257, 562
-රඟේ 297, 301
-හර 15, 76, 138, 275, 328, 368, 378, 456, 595, 610
මනා 96
මනෝරංජන 305
මම 521
මර 88, 260, 402
මරණට 208
මරන 246
මරු 52², 151
මරා 54, 81, 84, 207, 429
මල් 74, 171, 215, 227, 310², 319, 418, 419, 467,² 468, 469, 512, 513², 514, 517, 531, 544, 569, 572², 575, 576, 582, 583, 584, 597
මල 68
මලවුල් (මල් අවුල්) 317
මලැඳිලි (මල් ඇඳිලි) 556
මලි 345²
මලින් 229, 447
මලෝලඹු (මල් ඔලඹු) 577
මලු 133
මව 53, 257
මවන 312
මවු 356

මස් 94, 150, 151, 154, 241, 277, 287, 289, 536
මස (මසැ) 359
මසින් 149
මසින් 468, 536
මහ 4, 6, 15, 19, 25, 33, 58, 101, 114, 118, 128, 146, 161, 197, 203, 218, 220², 221, 225, 246², 286, 311, 814, 328, 336, 338, 356, 364, 395, 415, 417, 427, 430, 437, 445, 455, 478, 481, 508, 510, 511², 527, 535, 540, 553², 560, 561, 566, 568, 570, 572, 576, 587, 594, 596, 598, 610, 611
-තන් 40
-මෙර 241
-සත් 114
මහබසු 255
මහජනක 252
මහඹින් (මහ හඹින්) 309
මහණ 395
මහණව (මහ අණව) 395
මහත් 16, 91, 129, 256, 339, 348, 385, 354
මහත 425, 449
මහඳෙවිඳු (මහ දෙව් ඉදු) 162
මහදෙවියා 161
මහ නෙත්පාමුල 611
මහරසිගම් 610
මහල් 367
මතු-419
මහලු 160
මහවත් 472, 478
මහවත 396, 416, 447, 449, 471
මහාලි 436
මහිම 362
මහිමය 175, 200, 498
මල 83
මා 336
(=මහ) 436, 514, 571
මායා 358
මායා 358, 359
මාර 9, 13, 145
මැ 21, 41², 42⁴, 44, 48, 52, 57, 58, 67, 87, 97, 106, 116, 117, 132, 162, 175², 180, 191, 192, 193², 194, 195, 196, 205, 208, 216, 282, 236, 247, 248, 251, 256, 263, 307, 312, 318, 319², 329, 351, 361, 370, 387, 390 402, 407, 417, 436, 458, 472, 485², 489, 492, 494, 496, 497², 501, 502, 503, 510' 518, 524, 530, 532, 538, 542, 543, 548, 551, 552, 591, 592, 599, 600, 601, 605
මැණික 300
මැඩු (=මැඩැ) 29, 82, 299

මැඩැ 465, 473
මැඩි 546
මැඩිගත් 321
මැති 90, 431, 433, 574, 584
මැතිඳු (මැති ඉඳු) 136, 163, 329, 332, 390, 434
මැතිඳෙක් (මැති ඉඳු එක්) 121 130, 136, 163, 176, 184
මැතිඳේ (මැති ඉඳු + ඕ) 104
මැතින් 130
මැතිවරන් 119
මැද 380
(මැදු) 127², 372, 514, 516, 565, 577, 580
මැදහත් 37, 38
මැදළ (මැදු අළ) 282
මැදු 184, 302, 327, 490, 515, 516², 517, 576
මැදුලා (මැදු ලා) 62
මැදි 35
මැදුම් 397
මැය 379
මැවී 370, 372
මැවුමට 371
මැවූ 375
මැස්සකු 255
මැස්සෝ 100
මැසි 247, 338, 375
මිට 400
මිටි 232, 278, 294, 295
මිණ 12, 13, 24, 28, 30, 36, 228, 285, 303
සිතු- 2.8, 582
මිණි 347, 392, 458, 482², 503, 506, 512, 513², 514, 517, 531, 544, 569, 572, 575, 576, 582, 583, 584,
මිතුරු 427
මිදී 168
මින් 46, 245, 379
මිනියෙන් 83
මිනිසකු 246
මිනිසත් (මිනිස් අත්) 326, 485
මිනිසුන් 564
මිනී 86
මියුරස 312, 325
මියුරැසි 299
මියුරු 398
මිස 64²
-දිටු 204, 423, 602
මිසක් 50, 138, 205, 210
මිසැ 11, 186, 213, 238
මිහි 272, 863, 454, 545, 597, 598
(මඩු) 597
මිහියන් 323
මිහිරු (මිහි ඉරු) 401, 451
මිහිවුන් 322
මී 65, 95
මුගටින් 321
මුන් 199
මුත 87
මුතන් (මුත් අත්) 410

මුතු 12, 24 513, 514, 577, 580, 584
මුදම් 408
මුදවා 135, 510
මුද 200, 412
මුදුන් 345
මුදුනට 225
මුදුනත 230, 500, 583
මුදුනතැ 419
මුදුනතැඳිලි (මුදුනතැ ඇඳිලි) 503
මුදුනැ 576
මුදුනැඳිලි (මුදුනැ ඇඳිලි) 195, 224
මුත් 131, 133, 134, 370, 372, 373, 374, 375, 377, 381, 383
මුත 589
මුනි 4, 9, 131, 133, 185, 187, 192, 193, 194, 195, 205, 210, 215, 218, 220, 222, 224, 236, 237, 242, 243, 250, 253, 264, 265, 269, 275, 278, 279, 286, 291, 296, 300, 415, 431, 439, 440, 456, 462, 471, 472, 474, 486, 487, 488, 489, 493, 495, 496, 499, 500, 504, 505[2], 507, 508, 517, 521
–රජ 607
–සඳ 191, 216, 234, 238, 271, 304, 414, 451, 509, 525, 580
–සඳු 209, 223, 225, 227, 240, 293, 297, 301, 598
–සඳු ගෙ 292, 298, 299, 303
–සඳුවා (=සඳුට) 508
–සඳුන් 233
මුනිඳා (මුනි ඉඳු + ආ) 268
මුනිඳු (මුනි ඉඳු) 1, 8, 232, 277, 282, 284, 285, 288, 295, 305
–සඳ 268, 570
–සඳු 443, 452
මුනිඳුට (මුනි ඉඳුට) 198, 214, 225, 228, 262, 266, 272, 274, 276, 280, 281, 283, 287, 289, 294, 302, 313, 354, 435, 440, 444, 483, 484, 503, 509, 514
මුනිඳුන් (මුනි ඉඳු + උන්) 111, 185, 191, 233, 290, 380, 332, 339, 494, 510, 515, 520, 550, 564, 593, 606
මුනිඳු න්ගේ (මුනි ඉඳු + උන් ගේ) 518
මුනිඳුනට (මුනිඉඳු + උන් ට) 544
මුනිඳුනා (මුනි ඉඳු නා) 226
මුනුබුරු 342
මුමන 532

මූරු 589
මූල් 190, 312, 403, 472, 530
මූල 71, 544
මූලට 400
මූලින් 135, 277
මූලුපුලේ (මූල් උපුලේ) 204
මූව 73, 253, 312, 595
මූවට 314
මූවන් 470
මූවදෙව් 345
මූසු 39, 103
මුහුද 180, 536
මුහුදක් 7
මුහුදු 310
මුහුදින් 8
මුහුල 370
මූළු 212, 221, 231, 236, 290, 298, 310, 327, 344, 364, 371, 385, 410, 421, 432, 584, 595
මෙ 4, 6, 9, 22, 45, 67, 77, 79, 82, 96, 101, 102², 103, 107, 113, 114, 122, 123, 127, 129², 130, 132, 136, 142, 154, 156, 158, 163, 164, 166, 173, 180, 181, 182, 184, 185, 203, 217, 219, 224, 228, 236, 239, 242, 244², 261, 272, 278, 304, 309, 328, 329, 331, 336, 337, 340, 361, 371, 381, 382, 385, 417, 433, 435, 443, 444, 448, 457, 485, 508, 509, 520, 521, 524², 525, 529, 552, 568, 569², 600, 601, 607, 611,
මෙත් 37, 58, 109, 427, 521, 506, 611
මෙක් (ම. නෙ) 611
මෙත 246, 247, 425, 525
මෙතට 314
මෙතින් 260
මෙතේ 607
මෙන් 1, 14, 19, 35, 46, 58, 62², 63, 65, 70, 73, 77, 78, 80, 99², 187, 206⁴, 228, 291, 317, 318 322, 327, 329, 369, 420, 456, 507, 519, 523, 535, 539, 540, 553, 565, 602, 588, 596
මෙන 69
මෙනේ 44
මෙර 2, 187, 216, 241, 319, 456, 503, 506
මෙරගේ (මෙර අගේ) 575
මෙරට 548
මෙරම් 116
මෙහි 95
මෙහෙ 62, 566
මෙහෙයා 510
මෙහෙවර 378
මෙහෙසුන් 369
මෙහෙසුරු 165

මෙළෙක 298
මේ 89, 133, 176[2], 177, 179, 326, 330, 332, 386, 408, 520
මොක් 191, 194, 199, 201, 202, 224, 259, 383, 492, 606
මොතරැත් 320, 466
මොතවට 167, 291, 377, 503, 590
මොවුත් 371, 380, 384
මොහඳුරැ (මොහො අඳුරැ) 403, 404, 405
මොහු 492
මොළොක් 275, 280, 375, 543
ය 164, 244
-කබල් 317
-ගඳ 174
-ගඳැසුදය (ගඳ ආසුදය) 181
-වට 314
(=යැ) 5, 39, 97, 284[2]
යක් 80, 553, 563, 567
යකිත්තත් 94
යකු 249
යකුත් 91, 268, 564
යට 280, 311, 597
යටගැ (යටි අගැ) 611
යටි 276, 346
යත් × 487, 502, 504
යත 210, 216, 465, 564[2]
යතත් 366
යති 109, 142
යතිඳුත් (යති ඉඳු + උත්) 590
යත්ට 254
යන 21, 44, 47, 50, 70, 95, 109, 128, 131, 220, 258, 331, 382, 417, 434, 448, 481, 482, 483, 495, 496, 524, 538, 549[2], 552,
යනු 143, 145, 414
යනෙන (යන එන) 17
යම් (=යම) 81, 141
යම (=යමැ)
අලු-406
පෙර-408
මැදි-404
-පල් 313, 316
යමක් 10
යවා 410
යවයි 435
යස 66, 306, 611
-ළිය 346
යසස 113, 387
යසසින් 349, 353, 357, 361
යසෝදර 369
යසෝදරා 388
යහතට 174
යහපත් 265
යා 67, 180
-දී 150
යාග 135, 144 158
යාගෙහි 636
යාවකයතට 143

යැ 22, 40, 42[3], 80, 86, 87, 88, 90, 95, 100, 101, 112, 129, 131, 135, 138, 154, 175[2], 193[2], 194, 195, 196, 215, 218, 219, 220, 222, 230, 236, 237, 241, 242, 243, 245, 255, 261, 262, 266, 267, 269, 276[2], 271, 272, 275, 278, 280, 281, 283, 287, 289, 293, 294. 295, 296, 297, 299, 300, 301, 319, 322, 341, 352, 361, 365, 417, 435, 497, 526[2], 529, 546, 552, 554, 558, 592, 569, 583, 584, 585, 588, 592, 601

යැදමින් 408

යැදියතට 19, 240, 241

යැපෙයි 292

යැවූ 436

යි 6, 7, 8, 21, 22, 75, 80[2], 81, 95, 112, 129, 132, 143, 150, 154, 167, 183, 262, 266, 267, 33[, 339, 408, 410, 417, 435, 485, 510, 527, 546. 569,

යුග 277, 380

යුගට 379

යුත් 37, 146, ග358, 504[2], 574

යුත 350

යුති 19

යුතු 2, 379, 554

යුදත් 179

යුවළැස (යුවළ ඇස) 300

යුවළැසේ (යුවළ ඇසේ) 382

යෙත් 22

යෙත 132

යෙතැයි 265

යෙති 200, 263, 467, 508

යෙද්ද (යෙත් ද) 384

යෙදී 430

යෙදු (යෙදූ) 247

යෙදුමෙකින් 541

යෙදෙයි 524

යෙම් 308

යෙයි 213, 232[4]

යෙසෙන් 586

යෙහෙකි 161

යෙහෙන් 77, 41

යොදති 50, 51

යොදත 392, 443

යොදනතරු (යොදන අතරු) 445

යොදනෙකැ 311

යොදනෙකි 414

යොදමින් 90, 594

යොදවා 510, 519

යොදා 144, 412, 525, 562[2], 570, 596

යොදුන් 7, 366, 525

යොදුන 530, 538

යොදුනුසැත (යොදුන් උස ඇත) 249

රකවරණට (රක් අවරණට) 72[2]

රකිති 165
රකිත 118, 119, 156
රකිතඳුරු (රකිතා අඳුරු) 61
රකිනා 64, 66, 132, 152
රකිනු 40
රකිතෙව් (රකිතා එව්) 31, 59
රකිමින් 46
රකුම 604
රඟ 140, 160, 169, 257, $277^{2}$ 285, 318, 325, 380, 501, 522, 535, 549
–මඬුලු 20
මත–164, 257, 562
රඟකුත් 169
රඟටා 520
රඟන 20, 169, 556
රඟය (රඟ යැ) 164
රඟින් $337^{2}$, 386
රඟෙකින් 594
රඟේ 293, 301, 575
මත–297
රජ 33, $38^{2}$, 39, 45, 77, 90, 102, 112, 116, 184, 256, 257, 347, 348, 350, 353, 360, 361, 363, 368, 520, 523, 51, 584, 609
–දම් 431
–දරුවෝ 484
–මහවත 18
–සිරි 351
–සෙන් 49, 502, 520
–මුනි–607
රජකු 434, 450
**රජඟහා** 413, 437
රජතුමෙකි (රජ උතුමෙකි) 358
රජස් 283
රජස 570
රජු 293, 348, 539, 482, 485
රජුට 266, 426
රජුන් 77, 104, 255, 344, 345, 351
රජෙක් 351,352
රඟ 459
රට 100, 501, 510, 521, 528, 551
(=රටැ) 371, 437
රටට 107
රටැ 433
රටිනී 501
රත් 274, 310, 314, 317, 456, $460^{2}$, $516^{4}$, 517, 522
රත 18
රතතර 393
රතැඟිලි (රත් ඇඟිලි) 275
රතු 302
රද 247, 253, 256, 389, 475, 545
–හස 545
රදු ගෙ 288
රදුන් 75, 107, 521
රදූ (රජ දූ) 538
රඳන 283, 346, 610
රන් 12, 13, 18, 24, 28, 39,

44, 68, 272, 282, 289
රතැකිලි (රත් ඇකිලි) 26
රඹ 378, 447
රඹා 533
රම් 180, 348
රය (=රැයැ) 5, 420
රව 393
රස් 230, 285, 297, 303, 393, 408, 457, 469, 462, 463, 468, 473, 477[2], 514, 518, 539, 542, 573
රස 95, 138, 193, 206, 231, 292, 300, 324
රසට 597
රසඳුන් (රස අඳුන්) 325
රසැතිළි (රස ඇතිළි) 327
රසින් 39, 407
රසිති 452
රසිනුදුල (රසින් උදුල) 211
රහත් 442, 582
රහතන් 410, 515
රහසත් (රහසැ දු) 262
රළ 29, 402, 489, 506, 549
රා (රාග) 167, 168, 172, 182
(අසුරිඳු) 546
රාහුල 388
රැක්කේ 251
රැක්මට 167
රැක (=රැකැ) 148, 166, 600
රැකැ 56, 69, 61, 105, 142
රැකුමදහසේ (රැකුම් අදහසේ) 53
රැගත් (=ඇරැගත්) 57, 159, 454, 474, 486, 487, 555, 578
රැගත (=ඇරැ ගත) 251
රැගෙන (=ඇරැ ගෙනැ) 73, 148
රැගෙනැ (=ඇරැ ගෙනැ) 172, 185, 210, 438, 439, 494, 270, 579, 592
රැගෙනේ (=ඇරැ ගෙනැ) 414
රැඟුමට 556
රැවි 478
රැඳි 595
රැඳුණු 140
රැඳූ 452
රැස් 145, 151, 320[2], 404, 528
රැස 64, 177, 240, 334, 365, 446, 461
රැසට 461
රැසින් 14, 458[2], 555
රැහැණි 251
රැළි 488
රැ 27, 31, 36
රිදී 461, 531, 572
රිය 82, 273, 289
රියනක් 210, 303
රිවි 52, 117, 187, 217, 347, 352, 385, 393, 477, 546, 551, 565, 571, 578
-සඳහු 109
රිසි 21, 105, 110, 143, 284, 330, 382

රිසියහ 44
රිසිතිමති (රිසිත් ඉමති) 98
රැ (=රෑ) 97
රැක 201
රැකි 156, 389
රැඳුරැ 389
රැජු 16, 25, 256, 347
රැව 161, 203, 238, 282, 286$^{2}$ 369, 382, 383, 386, 413, 499, 500
රැවට 294, 377, 401, 451, 463
රැවටං (රැවට) 325
රැවත් 4$^{2}$, 33, 482
**රැවන් මහ සුත** 568, 598
රැවත 581
රැවතට 482, 537
රැවතිත් 518
රැවැති (රැව ඇති) 490
රැවිත් 385
රැවිතුදුල (රැවිත් උදුල) 273
රැවෙව් (රැ එව්) 282
රැසිත් 544
රැසිරි 335, 340
රැසිරිත් 358, 384, 476, 540
රැසිරැ 15
රැසිරෙති 94
රැ 44, 164, 231, 381, 495, 502, 542, 587
බහු-490
රෙදි 85
රෙද 377
රෙත් 30, 47
රෙත 497
රෙතිත් 497
රෙතේ 402
රෝ 61, 181, 564
රෝග 79, 598
රෝමය 284
ල 130
ලක් 220
ලක 609
ලකල 279, 282
ලකුණැත්තේය (ලකුණ ඇත්තේය) 281
ලකුණු 304
ලකුණෙත් 311, 548, 549
ලකුළු 557
ලත් 57, 73, 161, 343, 347, 385, 504, 518
,, × 479
ලත 224, 246, 466, 467
ලද්දේ 504
ලද 57, 123, 125, 127, 149, 264, 268$^{2}$, 326, 42, 351$^{2}$, 436, 457, 609$^{2}$
ලදි 373
ලදිත් (ලබ්ධියෙත්) 396
ලදිනී 154
ලදුවං 580
ලත්තෝ 526
ලත්තෝඝා 486, 492
ලත 54, 66
ලබ 512
ලබත 128, 157, 354

ලබනුව 183
ලබම් 183
ලබමී (ලබමියි) 67
ලඹ 459, 572
ලඹා 533
ලම් 258
ලයි 163, 182, 270
ලස් 404, 587
ලසා 120, 171, 409, 434
ලසැති (ලස ඇති) 201
ලසිත් 508
ලා 63, 100, 133, 253, 282, 401, 452, 531, 572, 579
වැ- 539
ලැබ (=ලැබැ) 370
ලැබැ 186, 222, 223, 404, 509
-ගෙනැ 220, 231
ලැබෙත 389
ලැබෙනු 383
ලැබෙයි 131
ලැල් 419, 513, 580
ලැලි 24
ලැලිත් 577
ලිඟු 172
ලිංගය 162
ලිච්චවි 38
ලිය 20, 92, 97, 468, 559
යස-346
ලියත් 165, 368, 490
ලියැ 518
වඩවා-309
ලියෝ 496
ලීමෙකින් 373
ලුණට 150
ලුණු 150, 177
ලුව 48
ලූ 100, 280, 320, 398, 503
ලෙඩ 156, 307, 439, 591
-දුක් 136
ලෙඩට 207
ලෙණ 61, 450
ලෙයට 242
ලෙව් 597
ලෙවත් 57, 137, 197, 430, 457
ලෙස 56, 66, 90, 176[2], 177, 212, 219, 300, 306, 332[2], 334, 335, 338, 441, 445, 446, 454, 471, 594, 596, 604, 607
(=ලෙසැ) 115
ලෙසග (ලෙසැ අග) 307
ලෙසට 102, 117, 136, 203, 266, 272, 280, 283, 325[2], 360, 377, 435, 448, 4.6, 572
ලෙසටා (=ලෙසට) 325
ලෙසැ 38, 50, 140, 175, 287, 353, 354, 395, 406, 434, 457, 493, 495, 571[2], 575, 580, 581
ලෙසින් 15, 16, 29, 47, 64, 76, 103, 107, 274, 286, 296, 297, 304, 328, 329,

330, 340, 350, 370, 385, 426, 433, 491, 508, 520, 535, 536, 537, 591, 597, 601, 607
ලෙසිනි 96
ලෙසිනෝ 453
ලෙසේ, 803², 524
ලෙහොනු 7
ලෙහෙයක් 255
ලෙල 580
ලෙළෙන 575
ලේ 94, 243
ලොබ 34, 381, 383, 505, 537
ලොම් 285, 302
ලොලා 495
ලොව 53, 76, 79, 166, 261, 266, 327, 328, 333, 353, 361, 362, 600
ලොවග (ලොව අග) 484
ලොවට 1, 47, 72, 102, 108, 111, 112, 131, 137, 142, 145, 157, 162, 170, 173, 186, 199, 203, 228, 236, 331, 341, 364, 395, 416, 424, 425, 523, 548, 551, 596, 601²,
ලොවැ 19, 45², 107, 128², 140, 144, 142, 147, 153, 156, 178, 180, 21 , 217, 221, 222, 230, 238, 263, 309, 310, 328, 345, 346, 350, 366, 366, 381, 385, 427, 432, 463, 468
ලොවැති (ලොවැ ඇති) 36
ලොවැඳිරි (ලොව් ඇඳිරි) 318
ලොවුතුරු (ලොව් උතුරු) 2
ලොවේ 313
ලෝ 52, 73, 134, 185, 198, 269, 290, 313, 317, 354, 358, 435, 441, 527
කි-185
-වැඩ 134
ලෝකවිදූ 266
ලෝකුඹු 317
ව (=වැ) 37, 286², 287, 393³, 395², 603²
(=වෙව) 602
වග 37, 110, 314, 326, 469
වට 11, 100², 274, 277, 280, 291, 302, 33, 311, 314, 373, 456, 480, 503, 512, 515, 516, 517, 534, 544, 590
ය-314
වටා 83
වටිනි 501
වටී 36
වටු 244
වටොර (වට උර) 378
වඩ 69
වඩන 134, 215, 441, 443, 471, 472, 493, 506, 540
වඩනට 449
වඩනා 435, 439, 480, 521

වඩනුව 440
වඩමින් 521, 606
වඩවන 172, 300
වඩවා
-ලියැ 309
වඩා 41, 334, 452, 478
-ගෙනැ 573
-හිඳුවා 581, 582
වඩතී (වඩතියි) 442, 478, 523
වඩින්නේ 525
වඩින්නෝ 526
වඩින 227
වඩිනා 527
වණ 322
වත් 8, 41, 92, 104, 311², 317, 436, 472, 604
සිල් 88
(වැත්=වැද) 97
වත්කල 324
වත්මත් 405
වන 109, 143, 189², 314, 375, 379, 468, 471, 563, 564, 591
වනු 18, 102, 179
වනේ 204
වපුරන 158, 173
වපුළේ 204
වයස (වයසැ) 365
වයසෙහි 22
වර 80, 391, 559
(=වරු) 218, 255, 269, 291 318², 411, 456, 592
වරගත (වර අගත) 20, 22, 340
වරද 40, 68
වරදෙක් 119
වරල් 458
වරලස 370
වරලැ (වරල යැ) 87
වරු 51
වරු 256
වරින් 411
වල් 226
වල 245
වලගිනි (වල් අගිනි) 154
වලපිත 247
වලා 54, 467, 473
වලැ 150
වව 604
වස් 609
වස්දඹු 465
වස්වති 108
වස්වන 551
වස්වා 422
වස්සකු 301
වස (වසැ) 609
වසක් 387
වසත් 367
වසන 115, 298
වසව 608
වසවා 515
වසා 54, 83, 163, 377, 382, 452, 553, 558,
-ගෙනැ 456, 473

වසාලා 81
වසිතත් 110
වසී 110
විළු 215, 250, 253, 272
වළඳ 399
වළුවු 285
වළුකත 137
වළැ 60
වළිත් 246
වා 257, 268
(=වැ) 427[2]
වාතර 254
වාපී 568
වාසල් 418
වාහතෙත් 160
වැ 9, 60, 62, 71[2], 93, 107, 109, 110[2], 118, 192, 142, 147, 177, 180, 208, 232[2], 243, 244, 245, 246, 247, 248, 250, 251[2], 252, 253, 254, 255, 276, 277, 291, 294, 296, 305, 318[2], 327, 342, 359, 404, 406, 431, 434, 450, 466, 479, 481, 482, 483[2], 484, 490, 503, 519, 563, 564, 601
-ගෙතැ 303
වැකි 17, 188
වැජැඹි 344, 377
වැජැඹෙති 217
වැජැඹෙත 222, 610
වැට 24, 392, 512, 531, 572
තල්-228
වැටි 236, 394
වැටුණා 253
වැටෙත 249
වැඩ 52, 65, 66, 102, 110, 116, 134, 166, 288, 426, 441, 480, 485, 603, 611
වැඩක් 137, 178
වැඩැ 400, 413, 414, 426, 580
-හිඳුවා 515
වැඩි 188, 209, 267, 275, 489, 546, 554, 597
වැඩියෝ 423
වැඩුණු 88
වැඩෙක් 170
වැද්දවුට (වැද්දහුට) 250
වැද්දා 306, 307, 553
වැද (=වැදා) 123, 326, 437, 490, 577, 593, 608
වැදා 108, 174, 232, 272, 281[2], 308, 312, 335, 443, 468, 477, 508, 517, 518, 520, 538, 591
වැදී 150
වැඳ (=වැඳැ) 129, 93
වැඳැ 162, 166, 208, 236, 415, 498, 499, 500, 503, 583, 585, 586
වැඳි 189, 224
වැන්දේ 194, 195
වැත්තැ 7, 32, 84, 140, 158, 173, 188, 185, 231

වැත්තේ 518
වැත්තෝ 506
වැතැපුමට 167
වැනි 17, 67, 81, 83, 94[2], 95, 96, 118, 133, 155, 171, 224, 272, 273, 371, 378, 529
වැර 6
වැරැල්ලෙන් 448
වැරැලි 88
වැල්
කර–316
වැලක් 254
වැලැඳ (වැලැඳැ) 247
වැලි 58, 133, 446, 531
වැස්වියැ 310[3]
වැස්සට 551
වැස්සත් 73
වැස්සෝ 100
වැසැ 148, 559
වැසි 92, 105, 108, 109, 110, 115, 310
වැසියන් 14, 34
වැසුණු 405
වැසුවා 519
වැසේ 215
වැළ 127, 174, 461, 516, 556
වැළැකෙන 51
වැළැඳු 201, 407
වි 87, 95, 312
විකුම් 450
විකුමට 118
විකුමැති (විකුම් ඇති) 116
විකුමෙන් 351
විජ්ජාචරණ 264
විජයොත් 574
විට (=විටැ) 72, 84, 119, 121, 208, 212, 213, 214[2], 272, 282, 435, 437, 510, 536, 551, 552, 591, 599[2], 601
විටැ 107, 390, 543
විතර 18, 64, 255
විතරකට 64
විතරට 213, 471
විතරැති (විතර ඇති) 366
විද්දෑ 254
විද්‍යෝතමිතේ 504
විද (=විදෑ) 251
විදත 470
විදමින් 408
විදසුන් 223
විදහා 468
විදු 459, 463
විදෑ × 253
විදි 70, 250
විදිනට 555
විදු 27[2], 206, 541
විදුනා 226[2]
විදුරසුන් (විදුරැ අසුන්) 401
විදුරැ (පබ) 249
විදුරැ 286, 296
විදුලි 519, 557
විද (=විදැ) 457
„ × 77

විඳැ 258
–ගතිති 65
විදිති 46, 53
විඳින 71, 171
විඳිනා 177, 236
විඳිනු 308
විඳුනා 226
විත්ද 172
විත්දේ 195, 499, 503
විපතැ 92
විමනි 491
විමත් 108
විමතෙව් (විමත එව්) 419, 445
විමසා 113, 120, 405, 441, 454
විය (=වියැ) 559
වියකලි (වි යැ අකලී) 78
වියත් 290[2]
වියතැ 92
වියතුත් 385
වියන් 577
වියනිත් 310
වියනෙව් (වියන එව්) 473
වියතේ 512
වියවුල් 309, 311
වියැ (වි යැ) 314, 315, 316, 318
වියෝ 106
විරත 603
විරැ 253[2], 296
විල් 418, 539, 560
විල 207
විලකුට 535
විලසට 281, 383, 481, 482, 536, 544
විලසා 49, 54
විලසින් 49, 54, 451, 458
විලැ 550
විලිපිලි 78
විලුඹට 274
විලුඹැ 274
විලෙහි 65
විස 251
විසම 107, 110
විසල් 414, 418
විසල් 442, 508
විසාලා 10, 81
විසි 387
විසිතුරැ 144, 231, 438, 605
විසිත් 117, 279
විසිරැ 315
විසිරෙන 469
විසී 367, 387
විසුමට 367
විසුරැණු 23
විසුරැවත්වත් 476
විසුවෝ 192
විසුළු 164
විහාරය 420
විහිදන 292
විහිදු 409
විහිදී 13, 28, 228, 285
විහිදෙන් 518
විළිත් 165
වී 10, 23, 63, 92[3], 158, 269;

270, 271, 272, 278, 295, 327[4], 328[4], 341, 350, 352, 353, 361, 491
වීණා 465
වීදුගම 610
වුත් (=අවුත්) 512
වුත්තෝ 526
වුව 69, 549[2]
වුවත් 216, 480
වුවත් 372
වුවතත 233
වූවොංවූ (වූව ඔහු) 369
වුහුවූ 469
වූ 21, 39, 99, 141, 320[2], 322[2], 323[2], 343, 348[2], 351, 357[2], 358, 398, 523, 562, 587[2], 588, 594
වූයෙන් 262
වූයේ 137
වෙ 70, 180, 251
(=වේ ද?) 91
වෙණ 234
වෙත් 57, 314, 502
වෙත (=වෙතැ) 1, 58, 416, 563, 606
වෙතට 410, 527
වෙතැ 35, 53, 90, 105, 120, 152, 165, 220, 222, 223, 224, 308[2], 323[2], 474, 496, 499, 566
වෙතැයි 492
වෙති 32, 39, 45, 55, 104, 105, 106, 138, 145, 156, 164, 191[2], 192[2], 196[4], 489
වෙතී (වෙති යි) 129
වෙත් 12[2], 39, 113, 179
වෙන 27[2], 63[2], 175, 205, 210, 407
,, × 111, 227, 396, 501, 591
වෙනසේ 383
වෙනිත් 497[2]
වෙමින් 27, 90, 434, 570
වෙයි 149, 167, 188, 189, 234, 276, 279, 284, 288, 290
වෙර 80, 255, 323
වෙවුල්ලා (වෙවුල්වා) 513
වෙස් 32, 164, 170, 589
වෙසක් 539
වෙසිත් 363
වෙසෙස 115, 176, 219, 332, 377, 403
වෙසෙසා 54
වෙසෙසින් 82, 117, 239, 363, 407, 450, 458, 483, 508
වෙසේ 431
වෙහෙර (=වෙහෙරැ) 431, 610
වෙහෙරට 440, 443
වෙහෙරා (=වෙහෙර) 443, 507
වෙහෙරින් 507
වෙහෙලුත් 320
වෙහෙස 177
වෙළපා යා 511
වෙළී 14

වේ 13, 134, 144, 165, 215, 216, 241, 254, 294, 374, 572
  -මතුරු 137
වෛතරණී 316
වේවයි (වේවායි) 494
වේළුවන 420, 443

ස

ස (=6)
  -සග 257
  -සගය 164
  -සගින් 386
සක් (චක්‍ර) 18, 82, 273, 413, 453, 466, 548, 580
  (ශක්‍ර) 208, 225, 343, 482
  (ශඞ්ඛ) 182, 225, 295, 465
සක්වළ 11, 186, 211, 218, 235, 319, 327, 454, 458, 464, 588
  (=සක්වළු) 568
සක්වළතුර (සක්වළ අතුර) 318
සක්වළු 336, 344
සක්විති 842, 360, 363, 389, 528, 568
සක්හි 29
සක (චක්‍රය) 46, 567
  (ශාක්‍ය) 585
සකස් 573
සකස 359
සකසා 184, 409
සකුණේ 447
සග 140, 199, 224, 383, 454, 492, 606
  ස-257
සගපවග (සග අපවග) 193, 428
සගය 164
  ස-164
සගු 10, 75
සගින්
  ස-386
සගෙහි 387
සඟ 8, 217, 218, 219, 220, 222, 223, 224, 413, 431, 483, 485, 506, 507, 517, 561, 573, 582
සඟටන් 437
සඟත 414
සඟරු 349
සඟහු 221
සඟිති 5
සජය බෙල්ලට්ඨි පුත් 127
සටහන් 172
සත් (=7) 11[2], 33[3], 37[3], 214, 292, 247, 363, 365, 367, 407, 451, 518, 537
  (සත්ත්ව) 37, 186, 314[2], 316, 326, 611
  (මත්‍රා) 43,
  මහ-114
  සේ-225, 482[2]
සත්තං 269
සත්තේ 181

සත 1, 3, 46, 61, 63, 71, 96, 126², 133, 153, 165, 189, 191, 212, 221, 224, 232, 257, 258, 259, 266, 300, 309, 310, 315, 381, 409, 422, 493, 514, 568, 576, 582, 590, 600, 606,
සතක් 33
සතකු 267
සතකුට 480
සතගේ (සත් අඟය) 119
සතතං 356
සතත් 40, 64, 269, 366, 410, 423
සතත 124, 126, 133
සතතට 203
සතපං 197, 560
සතර 118, 147, 239, 297, 310, 585
සතරක් 274
සතරණ (සතර අණ) 235
සතරෙක් 366
සතරෙහි 114
සතලිස් 368
සතලිසෙකි 294
සතං 158
සතාරය 4:0
සතින් 51
සේ-580
සතියක් 407
සතියෙකැ 600
සතු 152
සතුටු 63, 355
සතුන් 58, 70, 408, 560
සතුන්නේ 79, 307
සතුරන් 29
සතුරු 427
සතොංස්වං 422, 523
සතොංස 28, 300, 560
(=සතොංසැ) 315
සතොංසං 434
සතොංසින් 250, 508
සතොංසේයං 489
සද 213
සදත් 376, 483
සදන 459, 582
සදනු 529
සදනුව 478
සදමිත් (ස දමිත්) 408, 487
(සරහමිත්) 520
සදවං 512
සදහම් 2, 234, 291, 335, 416, 602
සඳ 447, 448, 471, 555, 556, 572, 580
සදිසි 33, 187
සදිසියහ 44
සඳ 349, 372², 414, 446, 461, 461, 481, 495, 514, 516, 546, 565
අඹ-160
තෙරිඳු-566, 611
තරනිඳු-417
නිරිඳු-421, 437, 609

මුනි-191, 216, 234, 238,
264, 271, 414, 451, 509,
525, 580
මුනිඳු-268, 304, 570
සුගතිඳු-563
හිමි-129
ල-385
(=සඳැ) 77, 123, 127, 137,
234, 304, 312², 326, 329,
336², 340, 388, 398,
436, 593, 609
සඳලු (සඳ අලු) 23
සඳහු
රිවි-109
සඳු 267, 357
සඳැ 39, 151, 391, 416, 421,
480, 570
සඳිනි 258
සඳු 293, 318, 576
මැනි-433
මුනි-209, 225, 227, 240,
293, 297, 301, 443, 452,
598, 600
සඳුගෙ
මුනි-292, 298, 299, 303
සඳුන්
මුනි-233
සදෙකි 590
සත් 18, 389, 547
සත්තාප 68
සත්තොස 248
සතහසේ 53
සතහා ලු 324
සජ 160
සපයා 509
සපිරි 36, 252, 495
සපිරැ 43
සපු 459
සපුරා 445, 569
සබ 184, 593
සබය 583
සබයට 122
සබව 169
සබා 425
සම්පතෙක් 21
සම්බුදු 432
සම්බුදුනැ 263
සම්මත 341
සම්මා 263
සම 37, 60, 110, 175, 215,
247, 267, 279, 289, 295,
427, 467, 521, 530
සමඟ 254, 412, 469, 538,
562, 595
සමඟැ 412
සමගිත් 337, 386, 442
සමගේ 119
සමත 205, 210
සමතැස් (සමත, ඇස්) 609
සමවත් 430, 472
සමහරු 501
සමුදු 412
සමුදුර 11, 147, 174
සයක් 396

සයුරම (සයුර අම) 327
සයුරැ 29
සයුරේ 17, 101, 242, 381
සර 6, 15, 76, 97, 136, 209, 231, 275, 291, 340, 460, 610
පිත්-442
සරණ 25, 189, 194, 196, 415, 494, 593
ති-424
සරණට 602
සරණත 1, 231
සරද 353
සරමින් 25
සරය 70
සරස් 151, 573
සරසා 534
සරසේ 60
සරහතට 528
සරහනු 444
සරහමැයි 443
සරහමින් 512, 573
සරු 340, 445
සරි 11, 45, 80, 187², 198, 300, 358, 370, 379, 384
සරැ 53
සරෙක් 187
සල් 12, 19, 146, 414, 418, 496
සල්වා 218, 255, 478
සලති 226, 228
සලසයි 177
සලසා 120, 130, 409, 520
සලා 596
සලෙල 70, 71
සව් 1, 34, 36, 79, 114, 147, 347, 361, 406, 585
සවන් 9, 197, 250, 408, 457
(සර්වඥ) 457
සවන 506
සවනක් 211, 240, 464, 518
සවනින් 50
සවු 432
සස් 66, 109, 110, 270
සිවු-409
සස්නේ 515
සස්වා 428
සස 243
-ලේ 243
සසග 97
සසද 271
සසර 192², 395
සසරට 121, 427
සසරැ 2, 212, 603
සසරින් 384
සසරෙහි 169
සසිරිමත් 348
සසුන් 564, 608
සහ 395, 490, 507, 561², 573, 592
සහතොස 90
සහස් 519
සළා 462

(=කලා) 400
සළ 159, 471, 557, 584
සා 87, 312,
සාරසැකි (සාර අසැකි) 334
සාලා 10
සාවුත් 321
සැක 405, 551
සැකිලි 85
සැට 208, 249, 589
දෙ-423
,, × 391
සැටක් 410
සැටි 542
සැටියෞ 540
සැඩ 61, 91
සැත්තැ 589
සැතැපි 174
සැතැපී 562
සැතැපුවෞ 498
සැතැපෙත 210
සැදූහෙත් 197
සැදි 13, 231, 432, 610
සැදිණි 27, 34, 458
සැදියත් 34
සැදී 35, 470
සැදුණු 481, 482
සැදුණේ 522[2]
සැදුම් 342
සැදෙත 469
සැදෙයි 215
සැඳැ (=සැඳැ) 460
සැනැහි 608
සැතැහුණු 123
සැප 52, 57, 69, 79, 140, 193
199, 201, 257, 397, 492,
509
සැපත් 21, 389, 523
සැපත 191, 197, 224, 341,
389, 471, 523, 606
සැපතට 102, 360
සැපතමා (සැපත් අමා) 73
සැපතා 566
සැපතැයි 499
සැපතින් 22, 57
සැපැමිණැ 360
සැපැමිණි 12, 89, 101, 102,
228, 347
සැපැමිණියේ 509
සැපෙත් 69
සැබැවින් 76, 601
සැම 549
සැරැහි 592
සැරැහු 529
සැලෙත 108
සැව (-පිළිසඳෙහි) 404
සැසැ 447
සිකි 556
සිහත 99
සිහමතකට 308
සිහා 149
සිට (=සිටැ) 145, 148, 225,
276, 319, 451, 448, 591[2]
සිටැ 121, 122, 123, 142, 176,
208, 228, 230, 250, 278,

303, 363, 365, 397, 400, 444, 469, 476, 4 0, 491, 496², 563
-ගත් 479
-ගත 470
සිටෑපුමෝ 498
සිටි 22, 48, 71, 119, 168, 233 276, 277, 281, 285,² 295, 296, 328, 321, 352, 454, 456, 477, 495, 539, 541², 517, 566, 570, 576
සිටිත 15
සිටිති 16, 48, 61, 71, 220, 221
සිටින 238, 281
සිටිනු 524
සිටිතේ 284
සිටිය 601
සිටියහ 589
සිටියෙන් 284
සිටියෝ 500, 540, 586
සිටී 257, 286, 291
සිටු 586
සිටුවා 426, 449, 511, 512, 533
සිත් 13, 35, 41, 43, 55, 57, 229, 339, 479, 502, 504², 547
සිත 38, 48, ;8, 61, 63, 71, 96, 99, 107, 173, 189², 221², 223, 224, 232, 256, 257, 335, 344, 389, 392, 416, 422, 425, 450, 493, 495, 514, 515², 523, 560, 563, 576, 581, 582, 594, 605, 606
සිතට 307, 360
සිතටත් 105
සිතතිත් (සිත් අතිත්) 260
සිතත 6
සිතව 603
සිතා 149, 150, 443, 523
සිතාලා 81
සිතැ 103, 172, 309, 323², 333, 410, 429, 499, 525, 598
සිතිත් 37, 56, 59, 60, 69, 80, 182, 389, 487, 611
සිතිතවුත් (සිතිත් අවුත්) 474
සිතියම් 463, 571, 575, 579
සිතු
-මිණ 582
-මිණි 228
සිතෙහි 284, 394
සිදු 2, 69, 116, 124, 157, 166, 170, 257
සිදුරස්සේ (සිදුරැ අස්සේ) 519
සිදුරැ 296
සිදුහත් 361
සිඳැ
(=සිඳැ) 201, 247, 312, 497
සිඳු 4, 48, 140, 187, 194, 206 423, 489, 506, 576
සුර-512
සිඳුරැ 545
සිඳෙත 63, 69

සිත්ඥෙ 499
සිතා 99
සිතිඳු 226, 472, 598
සිප් 347
සිමිත්ඥෙ 499
සිය 13, 35², 37, 40, 141, 165, 212, 217, 270, 311²
සියත් 280, 292
සියටක් (සිය අටක්) 273
සියතිත් (සිය අතිත්) 256
සියපත් 311
සියල් 22, 263, 309
සියල්ලෙන් 448
සියලු 186, 211, 212, 596
සියුම් 283, 589
සියුමැලි 550
සියෙන් 12, 13
සිර 71, 161
සිරට 241, 319
සිරස 365, 464, 545
සිරසට 544
සිරසින් 117
සිරසේ 216, 303, 319
සිරි 10, 21, 36, 76, 77², 209, 226, 231, 252, 313, 317, 377, 387, 388, 460, 499, 503, 505, 511, 550², 574, 576, 593, 609
පුද-183
රජ-351
සිරින් 41, 112
සිරිතැ 585
සිරින් 10, 28, 357, 384, 610
සිරිනි 34
සිරිමත් 311
සිරිරින් 457, 477
සිරිසිලු (සිරි ඉසුලු) 20
සිරුර 4, 56
සිරුරට 307
සිරුරු 292
සිරුරින් 159
සිරුරේ 17, 242
සිල් 97, 251, 256, 356, 431, 604
-වත් 98, 169
සිල 298
සිලිලින් 583
සිලිලොත් (සිලිල් ඔත්) 317
සිලුටු 373
සිව 162
සිවි 283
සිවි 248
සිවු 101, 131 141, 142, 270, 327, 349, 389, 401, 579
සිවුර 395, 455
සිවුරඟ 570
සිසාරති 488
සිසි 243
සිහි 118, 89, 196, 307, 429, 521
-කොට (=කෝටැ) 112
සිහින් 275
සිහිත 376
සිහිනඟු (සිහින් අග) 277

සිහිලඹයා (සිහිල් අඹ-යා) 426
සිහිලස 131
සිහිලැල් (සිහිල් ඇල්) 309 316, 317
සී 288, 450
සීත 312
සීතාව 179
සීලව 256
සීහහනු 351
සුගත් 455²
සුගත 249, 523
සුගතැයි (සුගත් යැයි) 265
සුගතිඳු (සුගත් ඉඳු) 5, 443, 529, 565
සුජාතා 398
සුත 598
සුතත (සුත් අත) 600
සුතත් 40
සුතුර 568
සුදසුත් 369
සුදු 124, 226, 297, 349, 361, 446, 461, 473, 485, 512, 522, 531, 572, 577
සුදුසු 103
සුදෙවුන් 359
සුධෙ 534
සුධේනා 353
සුධේනා 3631
සුත් 369
සුත්දර 265
සුනු 476
සුනෙර 218, 454
සුපිපි 451, 549
සුපිරිසුදු 361
සුපිහිටි 346
සුපිහිටියෝ 586
සුබ 311, 370, 399
සුබැයි 330
සුබැසියහ 44
සුර 15, 76, 77, 138, 142, 193, 222, 228, 268, 297, 315², 316, 331, 333, 352, 353, 362, 364, 882, 413, 474, 479, 482, 507, 511, 541, 550, 555, 562, 563, 576, 599
–ගඟින් 161
–තුරු 19
–බඹුන් 423
–සිඳු 612
සුරඟන (සුර අඟන) 20, 868, 476, 522
සුරඟනන් (සුර අඟනන්) 94
සුරත් 455
සුරන් 33, 105, 108, 109, 891², 540, 575
සුරනැ (සුරන් යැ) 143
සුරඹ (සුර අඹ) 479
සුරඹුන් (සුර අඹුන්) 502
සුරැදුරු (සුර ඇදුරු) 585
සුරිඳ (සුර ඉඳු + අා) 357
සුරිඳු (සුර ඉඳු) 226
සුරිඳුන් (සුර ඉඳු + උන්) 45, 75

සුරිඳුන්නේ (සුර ඉඳු + උන් ගේ) 518
සුලකුළු 584
සුලඹ 95
සුව 71, 307, 310, $430^{2}$, 564
සුවඳ 56, 97, 467, 475, 476, 479, 513, 595
සුවඳැති (සුවඳ ඇති) 310, 532
සුවඳැල් (සුවඳ ඇල්) 158
සුවඳින් 328
සුවඳිනි 96
සුවපත් 74
සුවහස් 208, 227, 318, 519, 565
සුවහස (සිය දහස) 219, 334, 403, 464
සුවහසක් 354, 356, 567
සුවහසේ 447, 524
සුවාසු (සිවු අසු) 7
සුවිසල් 367, 419
සුවිසාලා 10
සුසැදිණි 12
සුසිරි 119
සුවිසි (සිවු විසි) 259, 403
සෙ 101, 127, 180, 263, 552, 577
සෙණ 10
සෙන් 186, 268, 504, 511
සෙත 1, 75, 108, 123, 135, 142, 145, 162, 183, 202, 204 223, 342, 523
සෙතට 568
සෙතළු (සෙත අළු) 250
සෙතැත (සෙත ඇත) 131
සෙත් 15, $16^{2}$, 17, 18, 25, 31, 76, 80, 82, 228, 229, 254, 260, 313, 347, 402, 415, 469, 474, 490, 502, 535, 541, 553, 562, 563, 570
රජ-520
සෙතඟ 25, 101, 417, 477, 505, 541, 555, 561, 587
සෙතඟක් 588
සෙතඟට 482, 483
සෙතෙහස 322, 323
සෙබෙන් 121
සෙබෙහි 39, 130, 176
සෙමෙන් 32
සෙසින් 26
සෙවණක් 93
සෙවණට 397
සෙවණැල්ලෙන් 397
සෙවණේ 321
සෙවියෝ 106
සේ 4, 16, 22, 39, 41, 48, 51,$^{2}$, $55^{2}$, $53^{3}$, $60^{2}$, $61^{4}$, $71^{4}$, 74, 76, 77, 97, 98, $109^{2}$, 113, 12[illegible], 132, 141, 144, $170^{3}$, 1[illegible]2, 184, $205^{3}$, $207^{4}$, 209, 215, $216^{2}$, 217, 221, $237^{2}$, 275, 279, 284, 296, 302, 303, 304, 310, $319^{3}$, 334, 380, $382^{2}$, 384,

402, 413, 417[2], 443, 455, 457, 461, 463, 472, 484[2], 490[2], 516[4], 517[4], 519[2], 524[2], 530. 531, 538[2], 542, 551, 557, 558, 580, 587
–සත් 225
සේනාණි 397
සේයා (=සේ) 489
සොඬනුකා (සොඬින් උකා) 73
සොඳ 60, 303, 342, 398, 436, 457, 486, 490, 497, 514, 517
සොඳවා 135, 510, 511, 519
සොඳින් 8
සොඳුරු 10, 94, 265, 277, 296, 428, 460, 463, 495, 610
සොඬේ 534
සොබන 126, 549
සොගත 363
සොයා 399, 571
සොළොස් 594
සොළොසඟුලින් (සොළොස් අඟුලින්) 315
සෙර් 88
හකුළුවා 52
හට 3, 18, 51, 67, 68, 111, 145, 167, 174, 182, 212, 266, 294, 369, 443[2], 444, 483, 485, 527, 529, 546, 566, 597
හඬ 29, 82[2], 86, 88, 234, 299[2], 465, 466
හඬවා
–ලියැ (=ලි යැ) 309
හත් 159
හනු 293[2]
හමන 60
හමයි 107
හය 30
හර
මත–15, 138, 372, 382, 368, 456, 596, 610
හරක් 160
හරවා 429
හල්
දම්–418
පත්–418
විදු–27
හලි 24
හවුරුදු 396, 604
හස 65
රද–545
හසල 17
හසලේයා 505
හසුන් 369
හළ 302, 327, 328, 39, 394, 537,556
හැකි 101, 209, 235, 240, 300, 334, 373
හැකිලි 26
හැම 16, 63, 72, 82, 131, 179, 222, 267, 269, 283,

285, 304, 307, 319², 329, 326², 328, 333, 336, 355, 362, 366, 378, 406, 453, 458, 462, 464, 502, 520, 521, 559², 601, 607², 608
හැර (=හැරැ) 76, 252, 368, 405
හැරතුරැ (හැරැ අතුරැ) 588
හැරැ 58, 84, 116, 18², 362, 387, 389, 399, 402, 406, 551
හැරි (=හළ) 155
හැල් 56
හැලි 474, 483
හි 26
හික්මෙන 17
හිඟුලින් 281
හිත 606
හිදැ 365
හිඳුවං 515², 581, 582
හිමි 2, 335, 454
හිම 288
-වත 558
හිමවතැ 319
හිමි
-සඳ 219, 362, 444, 593
හිමියෝ 529
හිරි 11, 166, 296, 375
හිරැ 61, 576
හිවලුන් 321
හිවූ 216
හිස් 188, 587
හිසට 51
හී 288, 332
තො-180
හීනයක් 51
හුය 377
හෙත් × 177
තො-482
හෙත්තෝයා 492
හෙන 16, 364, 488, 557, 571
හෙබි 344
හෙසරවන 466
හෙළ 418
හෙළි 327
හේ 180
හෙන් (නම්) 129; 162, 208, 518
හෝ 92, 162², 232, 560
ළ
-සඳ 388
ළග (=ළගැ) 380, 522, 562
,, × 316
ළඳ 490, 497, 500
ළදරැ 495
ළඳ 388, 398
ළඳුන් 386
ළිහිණි 470
ළෙයි 63



